බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 37

සූත්‍රාන්තපිටකයෙහි

එක්තිස්වැනි ග්‍රන්ථය

අපදාන පාළි

ද්විතීය භාගය (I කාණ්ඩය)

ඛුද්දකනිකායෙහි

පසළොස්වැනි ග්‍රන්ථය

ලංකා බෞද්ධමණ්ඩලයෙහි ආරාධනාවෙන්

දෙමටගොඩ ජයශේඛරාරාමාධිපති
රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති
තලල්ලේ සිරි ධම්මානන්ද නායක ස්ථවිරයන්වහන්සේ
විසින් කරන ලද
සිංහල පරිවර්තනයෙන් යුක්ත යි.

ශ්‍රී ලංකා ජනරජය මඟින් ප්‍රකාශිත යි.

බු: ව: 2520

ක්‍රි: ව: 1977

Buddha Jayanti Tripitaka Series, Volume XXXVII

THE THIRTY-FIRST BOOK

IN

THE SUTTANTAPITAKA

KHUDDAKANIKAYA

BOOK 15

APADĀNA PĀLI

PART II

WITH THE SINHALESE TRANSLATION

BY

The Venerable Pandita (M.A)
TALALLE SIRI DHAMMĀNANDA NĀYAKA THERA
Jayasekhararama — Dematagoda

PUBLISHED

UNDER THE PATRONAGE

OF

THE REPUBLIC OF SRI LANKA

B. E. 2520

C. E. 1977

සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

අපදාන පාළි

දුතියො භාගො

(1 ඛණ්ඩො)

සූත්‍රාන්තපිටකයෙහි කුදුගත්සඟිය

අපදාන පාළි

ද්විතීය භාගය

(1 කාණ්ඩය)

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

පටුන

1. සංස්කාරක නිවේදනය ix
2. ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය xi
3. පාළි හෝඩිය xiii
4. සංකේත නිරූපණය xv
5. විෂය සූචි xvii
6. පෙළ හා පරිවර්තනය ... ... 2 - 417
7. ගාථාදිපාද සූචි 419
8. සංඥානාම සූචි 441

සංස්කාරක නිවේදනය

සූත්‍රාන්ත පිටකයෙහි කුද්දගත් සඟියට අයත් ඛුද්දක පාඨාදි පසළොස් ග්‍රන්ථයන් කෙරෙහි තෙළෙස් වැන්න වූයේ අපදාන පාළි යයි. එය බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලායෙහි 36, 37 ග්‍රන්‍ථ වශයෙන් පළ කරවීමට සම්මත විය. එයින් අපදාන පාළියෙහි ප්‍රථම භාගය 1961 දී මුද්‍රණයෙන් පළ විය.

ලඞ්කා බෞද්ධ මණ්ඩලයේ ආරාධනය පරිදි කොළඹ දෙමටගොඩ ජයශෙඛරාරාමාධිපති ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත තලල්ලේ ධම්මානන්ද නායකස්ථවිරයන් වහන්සේ විසින් අපදානපාළිය සිංහල භාෂායෙන් සපුරා පරිවර්තන කරන ලද්දේ ය. ප්‍රථම භාගය මුද්‍රණයට පැමිණි සමනන්තරව මැ මෙම ද්විතීය භාගය ද එක්තරා මුද්‍රණාලයකට භාරදී තිබිණ. එහි ‘යසත්ථෙරාපදානය’ මුද්‍රණය වූ පසු අප නො දන්නා කවර හෙතුවකින් හෝ මුද්‍රණය නැවති ලිඛිත වූ අත් පිටපත් එකකුදු සොයා ගත නොහෙන සේ වැනසී ගියේ ය. එහෙයින් ‘යසත්ථෙරාපදානයෙහි’ පටන් නැවත පරිවර්තන කරන්නට සිදුවිය. මුල දී මෙහි සිංහල පරිවර්තනය ලියූ තලල්ලේ ධම්මානන්ද නායකස්ථවිරයන් වහන්සේට ම මේ සඳහා අයදුම් කළ නමුදු උන්වහන්සේට මේ කාර්‍ය්‍යයෙහි ව්‍යාපෘත වීමට අවකාශ නොවූයෙන් විද්‍යොදය පිරිවෙන්හි ආචාර්‍ය්‍ය ශාස්ත්‍රපති විද්‍යා විශාරද, රාජකීය පණ්ඩිත වෙඩරුවේ සිරි අනොමදස්සී නායකස්ථවිරයන් වහන්සේ එම පරිවර්තන කාර්‍ය්‍යය භාරගත්හ. එය ධර්මකාමීන්ගේ ප්‍රීතියට හෙතු වෙති සිතම්හ.

අපදානපාළි ද්විතීය භාගය එක් මැ ග්‍රන්ථයක් ලෙස මුද්‍රණය කළ යුතුව ඇත ද ග්‍රන්ථ පරිහරණ පහසුව සලකා සපනස් වන යසවර්ගයෙන් ථෙරාපදානය අවසානය දක්වා ද්විතීය භාගයේ පළමු වන කාණ්ඩය ලෙස ද, ථෙරී අපදානය දෙවැනි කාණ්ඩය ලෙස ද ප්‍රකාශයට පැමිණෙනු ඇත.

තවද මුද්‍රිත වැ ඇති බොහෝ අපදානපාළි ග්‍රන්ථයන්හි යසවර්ගාවසාන-යෙහි ‘රට්ඨපාල, උපවාන’ යන අපදාන දෙක යොද ඇත ද, අපදානපාළි-යෙහි අටළොස් වැනි රට්ඨපාල ථෙරාපදානය ද දෙවිසි වැනි උපවාන ථෙරාපදානය ද (ප්‍රථමභාග – 112, 124 පිටු) නො වෙනස් වැ යෙදී ඇති හෙයින් ඒ අපදාන දෙක නැවත නොයෙදූ බව සලකනු මැනැවි.

මුද්‍රණයෙහි අවසානය නො දක අනාථ වැ තුබූ මේ ග්‍රන්ථ භාගය ද සංස්කෘතික සහකාර අධ්‍යක්ෂ සෝමපාල ජයවර්ධන මහතාණන්ගේ කටයුතු සංවිධානයත් තිසර මුද්‍රණාලයාධිකාරීන්ගේ සහයොගයත් හෙතු කොටගෙන මෙසේ ප්‍රකාශයට පැමිණීම ශාසනොදයකාමීන්ගේ ප්‍රමොදයට හේතු වේ යයි සිතම්හ.

"සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා"

මේවගට - ශාසනොදයකාරී
ලබුගම ලඞ්කානන්ද ස්ථවිර
ත්‍රිපිටකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක

1977, ජුලි 10,
ත්‍රිපිටක කාර්‍ය්‍යාලය
මහානායක වාරිකාරාමය,
115, විජේරාම මාවත,
කොළඹ 7.

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

උපදේශක:

මහරගම වටයවත්තපාර-ශ්‍රී චන්ද්‍රශෙඛරාරාමාධිපති අග්‍රමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

සභාපති:

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි (භික්ෂු විශ්වවිද්‍යාලයෙහි) අධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, රාජකීය පණ්ඩිත කෝදාගොඩ ශ්‍රී ඤාණාලොක දක්ෂිණ ලඞ්කාවෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

ප්‍රධාන සම්පාදක:

මොල්ලිගොඩ, ප්‍රවචනොදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය, ත්‍රිපිටක වාගීශ්වර, විමලකීර්ති ශ්‍රී රාජකීය පණ්ඩිත, ලබුගම ලඞ්කානන්ද ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභාවෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

සම්පාදක:

කිරුළපන පූර්වාරාම, නාරාහේන්පිට අභයාරාම යන විහාරද්වයාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දැල්ලේ සිරි පඤ්ඤාලොක ශ්‍රී කල්‍යාණිසාමග්‍රීධර්ම මහාසඞ්ඝසභාවෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල, සුධර්මාරාමාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ සිරි අනොමදස්සී බටහිර දිශාවෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ - මාකඩවර විහාරාධිපති රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සිරි සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශොකාරාමාධිපති රාජකීය පණ්ඩිත කරඳන සිරි පඤ්ඤාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

ලේඛක

කොළඹ, බෞද්ධාලොක මාවතෙහි බෞද්ධාලොක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල - කොළඹ පළාතේ ප්‍රධානසඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

පාළි හෝඩිය

THE PALI ALPHABET

IN SINHALA CHARACTERS

VOWELS

අ a ආ ā ඉ i ඊ ī උ u ඌ ū එ e ඔ o

CONSONANTS

ක ka	ඛ kha	ග ga	ඝ gha	ඞ ṅa
ච ca	ඡ cha	ජ ja	ඣ jha	ඤ ña
ට ṭa	ඨ ṭha	ඩ ḍa	ඪ ḍha	ණ ṇa
ත ta	ථ tha	ද da	ධ dha	න na
ප pa	ඵ pha	බ ba	භ bha	ම ma

ය ya ර ra ල la ව va ස sa හ ha ළ ḷa ං ṃ

ක ka	කා kā	කි ki	කී kī	කු ku	කූ kū	කෙ ke	කො ko
ඛ kha	ඛා khā	ඛි khi	ඛී khī	ඛු khu	ඛූ khū	ඛෙ khe	ඛො kho
ග ga	ගා gā	ගි gi	ගී gī	ගු gu	ගූ gū	ගෙ ge	ගො go

CONJUNCT - CONSONANTS

ක්ක kka	ඤ්ඤ ñña	ත්‍ර tra	ම්ඵ mpha
ක්ඛ kkha	ණ්හ ṇha	ද්ද dda	ම්බ mba
ක්‍ය kya	ඤ්ච ñca	ද්ධ ddha	ම්භ mbha
ක්‍රි kri	ඤ්ඡ, ñcha	ද්‍ර dra	ම්ම mma
ක්ව kva	ඤ්ජ, ñja	ද්ව, dva	ම්භ mbha
ඛ්‍ය khya	ඤ්ඣ ñjha	ධ්ව dhva	ය්ය, ය්‍ය yya
ඛ්ව khva	ට්ට ṭṭa	න්ත nta	ය්හ yha
ග්ග gga	ට්ඨ, ට්ඨ ṭṭha	න්ථ ntha	ල්ල lla
ග්ඝ ggha	ඩ්ඩ ḍḍa	න්ද nda	ල්‍ය lya
ඞ්ක ṅka	ඩ්ඪ ḍḍha	න්ධ ndha	ල්හ lha
ග්‍රා grā	ණ්ණ ṇṇa	න්න nna	ව්හ wha
ඞ්ඛ ñkha	ණ්ට ṇṭa	න්හ nha	ස්ස ssa
ඞ්ග ñga	ණ්ඨ ṇṭha	ප්ප ppa	ස්ම sma
ඞ්ඝ ṅgha	ණ්ඩ ṇḍa	ප්ඵ ppha	ස්ව sva
ච්ච cca	ත්ත tta	බ්බ bba	හ්ම hma
ච්ඡ ccha	ත්ථ ttha	බ්භ bbha	හ්ව hva
ජ්ජ jja	ත්ව tva	බ්‍ර bra	ළ්හ ḷha
ජ්ඣ jjha		ම්ප mpa	

ා ā ි i ී ī ු u ූ ū ෙ e ො o

සංකේත නිරූපණය

සීමු - සීහලක්ඛර මුද්දිත - අපදාන පාළි

මජසං - මරම්ම - ඡට්ඨ සඞ්ගීති - පිටක පොත්ථකං

සයා - සයාමක්ඛර මුද්දිත - අපදාන පාළි

PTS - Pali Text Society - Edition

ඛුද්දකනිකායෙ - අපදානපාළි

දුතියභාග - විසයසූචි

විසයානි — පිට්ඨඞ්කා

41. මෙත්තෙය්‍යවග්ගො 2 - 56

1.	තිස්සමෙත්තෙය්‍යත්ථෙරාපදානං	2— 6
2.	පුණ්ණකත්ථෙරාපදානං	6— 8
3.	මෙත්තගුත්ථෙරාපදානං	8— 12
4.	ධොතකත්ථෙරාපදානං	12— 16
5.	උපසීවත්ථෙරාපදානං	16— 24
6.	නන්දකත්ථෙරාපදානං	26— 28
7.	හෙමකත්ථෙරාපදානං	28— 34
8.	තොදෙය්‍යත්ථෙරාපදානං	34— 40
9.	ජතුකණ්ණිත්ථෙරාපදානං	42— 48
10.	උදෙනත්ථෙරාපදානං	50— 56

42. භද්දලිවග්ගො 58 - 86

1.	භද්දාලිත්ථෙරාපදානං	58— 62
2.	එකඡත්තියත්ථෙරාපදානං	62— 68
3.	තිණසූලකඡදනියත්ථෙරාපදානං	68— 72
4.	මධුමංසදායකත්ථෙරාපදානං	72— 74
5.	නාගපල්ලවකත්ථෙරාපදානං	74— 76
6.	එකදීපියත්ථෙරාපදානං	76— 78
7.	උච්ඡඞ්ගපුප්ඵියත්ථෙරාපදානං	78
8.	යාගුදායකත්ථෙරාපදානං	80— 82
9.	පත්ථොදනදායකත්ථෙරාපදානං	82— 84
10.	මඤ්චදායකත්ථෙරාපදානං	84— 86

43. සකිංසම්මජ්ජකවග්ගො 86 - 114

1.	සකිංසම්මජ්ජකත්ථෙරාපදානං	86— 88
2.	එකදුස්සදායකත්ථෙරාපදානං	88— 92
3.	එකාසනදායකත්ථෙරාපදානං	92— 96
4.	සත්තකදම්බපුප්ඵියත්ථෙරාපදානං	96

විසයානි			පිට්ඨඞ්කා
5. කොරණ්ඩපුප්ඵියත්ථෙරාපදානං	...	...	98
6. සතමණ්ඩදායකත්ථෙරාපදානං	...	...	98—100
7. එකධම්මසවණියත්ථෙරාපදානං	...	...	100—104
8. සුචින්තිතත්ථෙරාපදානං	...	...	104—108
9. සොවණ්ණකිඞ්කණියත්ථෙරාපදානං	...	...	108—110
10. සොණ්ණ කොන්තරිකත්ථෙරාපදානං	...	...	112—114

44. එකවිහාරියවග්ගො 114 - 128

1. එකවිහාරියත්ථෙරාපදානං	...	...	114—116
2. එකසඞ්ඛියත්ථෙරාපදානං	...	...	116—118
3. පාටිහීරසඤ්ඤකත්ථෙරාපදානං	...	...	118
4. ඤාණත්ථවිකත්ථෙරාපදානං	...	...	120
5. උච්ඡුඛණ්ඩිකත්ථෙරාපදානං	...	...	120—122
6. කලම්බදායකත්ථෙරාපදානං	...	...	122
7. අම්බාටකදායකත්ථෙරාපදානං	...	...	122—124
8. හරීතකදායකත්ථෙරාපදානං	...	...	124—126
9. අම්බපිණ්ඩියත්ථෙරාපදානං	...	...	126—128
10. ජම්බුඵලියත්ථෙරාපදානං	...	...	128

45. විභීටකවග්ගො 130 - 144

1. විභීටකමිඤ්ජියත්ථෙරාපදානං	...	...	130
2. කොලදායකත්ථෙරාපදානං	...	...	130—132
3. බිල්ලඵලියත්ථෙරාපදානං	...	...	132
4. හල්ලාතකදායකත්ථෙරාපදානං	...	...	134
5. උත්තලිපුප්ඵියත්ථෙරාපදානං	...	...	134—136
6. අම්බාටකියත්ථෙරාපදානං	...	...	136
7. සීහාසනිකත්ථෙරාපදානං	...	...	136—138
8. පාදපීඨියත්ථෙරාපදානං	...	...	138—140
9. වෙදිකාරකත්ථෙරාපදානං	...	...	140—142
10. බොධිඝරියත්ථෙරාපදානං	...	...	142—144

46. ජගතිදායකවග්ගො 144 - 156

විසයානි			පිට්ඨඞ්කා
1. ජගතිදායකත්ථෙරාපදානං	...	...	144
2. මොරහත්ථියත්ථෙරාපදානං	...	...	146
3. සීහාසනවීජකත්ථෙරාපදානං	...	...	146—148
4. තිණුක්කාධාරකත්ථෙරාපදානං	...	...	148
5. අක්කමනදායකත්ථෙරාපදානං	...	...	148—150
6. වනකොරණ්ඩියත්ථෙරාපදානං	...	...	150
7. එකඡත්තියත්ථෙරාපදානං	...	...	150—152
8. ජාතිපුප්ඵියත්ථෙරාපදානං	...	...	152—154
9. පට්ටිපුප්ඵියත්ථෙරාපදානං	...	...	154
10. ගන්ධපූජකත්ථෙරාපදානං	...	...	156

47. සාලකුසුමියවග්ගො 156 - 170

1. සාලකුසුමියත්ථෙරාපදානං	...	...	156—158
2. චිතකපූජකත්ථෙරාපදානං	...	...	158
3. චිතකනිබ්බාපකත්ථෙරාපදානං	...	...	158—160
4. සෙතුදායකත්ථෙරාපදානං	...	...	160
5. සුමනතාලවණ්ටියත්ථෙරාපදානං	...	...	160—162
6. අවණ්ටඵලියත්ථෙරාපදානං	...	...	162
7. ලබුජදායකත්ථෙරාපදානං	...	...	158—164
8. පිලක්ඛඵලදායකත්ථෙරාපදානං	...	...	164
9. සයංපටිභාණියත්ථෙරාපදානං	...	...	166—168
10. නිමිත්තබ්‍යාකරණියත්ථෙරාපදානං	...	...	168—170

48. නළමාලියවග්ගො 170 - 186

1. නළමාලියත්ථෙරාපදානං	...	...	170—172
2. මණිපූජකත්ථෙරාපදානං	...	...	172—174
3. උක්කාසතිකත්ථෙරාපදානං	...	...	174—178
4. සුමනවීජනියත්ථෙරාපදානං	...	...	178
5. කුම්මාසදායකත්ථෙරාපදානං	...	...	178—180
6. කුසට්ඨදායකත්ථෙරාපදානං	...	...	180
7. ගිරිපුන්නාගියත්ථෙරාපදානං	...	...	180—182
8. වල්ලිකාරඵලදායකත්ථෙරාපදානං	...	...	182
9. පානධිදායකත්ථෙරාපදානං	...	...	182—184
10. පුලිනචඞ්කමියත්ථෙරාපදානං	...	...	186

49. පංසුකූලවග්ගො 186—220

විසයානි		පිට්ඨඞ්කා
1.	පංසුකූලසඤ්ඤකත්ථේරාපදානං	186—188
2.	බුද්ධසඤ්ඤකත්ථේරාපදානං	188—190
3.	භිසදායකත්ථේරාපදානං	192—194
4.	ඤාණත්ථවිකත්ථේරාපදානං	194—198
5.	චන්දනමාලියත්ථේරාපදානං	198—202
6.	ධාතුපූජකත්ථේරාපදානං	202—204
7.	පුලිනුප්පාදකත්ථේරාපදානං	204—208
8.	තරණියත්ථේරාපදානං	208—212
9.	ධම්මරුචිත්ථේරාපදානං	212—214
10.	සාලමණ්ඩපියත්ථේරාපදානං	216—220

50. තිකිඞ්කණිපුප්ඵවග්ගො 220—238

1.	තිකිඞ්කණිපුප්ඵියත්ථේරාපදානං	220
2.	පංසුකූලපූජකත්ථේරාපදානං	220—222
3.	කොරණ්ඩපුප්ඵියත්ථේරාපදානං	222—224
4.	කිංසුකපුප්ඵියත්ථේරාපදානං	224
5.	උපඩ්ඪදුස්සදායකත්ථේරාපදානං	224—226
6.	ඝතමණ්ඩදායකත්ථේරාපදානං	226—228
7.	උදකදායකත්ථේරාපදානං	228
8.	පුලිනථූපියත්ථේරාපදානං	228—234
9.	නළකුටිදායකත්ථේරාපදානං	234—236
10.	පියාලඵලදායකත්ථේරාපදානං	236—238

51. කණිකාරවග්ගො 238—254

1.	තිකණිකාරපුප්ඵියත්ථේරාපදානං	238—244
2.	එකපත්තදායකත්ථේරාපදානං	244—246
3.	කාසුමාරියඵලදායකත්ථේරාපදානං	246
4.	අවටඵලියත්ථේරාපදානං	246—248
5.	වාරඵලියත්ථේරාපදානං	248
6.	මාතුලුඞ්ගඵලදායකත්ථේරාපදානං	248—250
7.	අජෙලිඵලදායකත්ථේරාපදානං	250
8.	අමොදඵලියත්ථේරාපදානං	250—252
9.	තාලඵලදායකත්ථේරාපදානං	252
10.	නාළිකෙරදායකත්ථේරාපදානං	252—254

52. ඵලදායකවග්ගො 254-268

විසයානි			පිට්ඨඞ්කා
1. කුරඤ්ජියඵලදායකත්ථෙරාපදානං	...	...	254—256
2. කපිත්ථඵලදායකත්ථෙරාපදානං	...	...	256
3. කොසුම්භඵලදායකත්ථෙරාපදානං	...	...	256—258
4. කෙතකපුප්ඵියත්ථෙරාපදානං	...	...	258
5. නාගපුප්ඵියත්ථෙරාපදානං	...	...	258—260
6. අජ්ජුනපුප්ඵියත්ථෙරාපදානං	...	...	260
7. කුටජපුප්ඵියත්ථෙරාපදානං	...	...	262
8. ඝොසසඤ්ඤකත්ථෙරාපදානං	...	...	262—264
9. සබ්බඵලදායකත්ථෙරාපදානං	...	...	264—268
10. පදුමධාරකත්ථෙරාපදානං	...	...	268

53. තිණදායකවග්ගො 270 - 290

1. තිණමුට්ඨිදායකත්ථෙරාපදානං	...	...	270
2. මඤ්චදායකත්ථෙරාපදානං	...	...	272
3. සරණාගමනියත්ථෙරාපදානං	...	...	272
4. අබ්භඤ්ජනදායකත්ථෙරාපදානං	...	...	274
5. සුපටදායකත්ථෙරාපදානං	...	...	274—276
6. දණ්ඩදායකත්ථෙරාපදානං	...	...	276
7. ගිරිනෙලපූජකත්ථෙරාපදානං	...	...	276—278
8. බොධිසම්මජ්ජකත්ථෙරාපදානං	...	...	278—282
9. ආමණ්ඩඵලදායකත්ථෙරාපදානං	...	...	282
10. සුගන්ධත්ථෙරාපදානං	...	...	284—290

54. කච්චානවග්ගො 292 - 346

1. මහාකච්චානත්ථෙරාපදානං	...	...	292—296
2. වක්කලිත්ථෙරාපදානං	...	...	296—302
3. මහාකප්පිනත්ථෙරාපදානං	...	...	302—308
4. දබ්බත්ථෙරාපදානං	...	...	308—314
5. කුමාරකස්සපත්ථෙරාපදානං	...	...	314—318
6. බාහියත්ථෙරාපදානං	...	...	318—326
7. කොට්ඨිතත්ථෙරාපදානං	...	...	326—330
8. උරුවෙලකස්සපත්ථෙරාපදානං	...	...	330—336
9. රාධත්ථෙරාපදානං	...	...	336—342
10. මොඝරාජත්ථෙරාපදානං	...	...	342—346

55. භද්දියවග්ගො 348 - 396

විසයානි			පිට්ඨඞ්කා
1. ලකුණ්ටකභද්දියත්ථෙරාපදානං	...	...	348—352
2. කඞ්ඛාරෙවතත්ථෙරාපදානං	...	...	352—356
3. සීවලිත්ථෙරාපදානං	...	...	356—362
4. වඞ්ගීසත්ථෙරාපදානං	...	...	362—370
5. නන්දකත්ථෙරාපදානං	...	...	370—374
6. කාළුදායිත්ථෙරාපදානං	...	...	374—378
7. අභයත්ථෙරාපදානං	...	...	378—384
8. ලොමසකඞ්ගියත්ථෙරාපදානං	...	...	384—388
9. වනවච්ඡත්ථෙරාපදානං	...	...	388—390
10. චූළසුගන්ධත්ථෙරාපදානං	...	...	392—396

56. යසවග්ගො 396 - 416

1. යසත්ථෙරාපදානං	...	...	398—400
2. නදීකස්සපත්ථෙරාපදානං	...	...	402
3. ගයාකස්සපත්ථෙරාපදානං	...	...	402—404
4. කිම්බිලත්ථෙරාපදානං	...	...	404
5. වජ්ජිපුත්තත්ථෙරාපදානං	...	...	406
6. උත්තරත්ථෙරාපදානං	...	...	406—412
7. අපරඋත්තරත්ථෙරාපදානං	...	...	412
8. භද්දජිත්ථෙරාපදානං	...	...	414—416
9. සීවකත්ථෙරාපදානං	...	...	416

සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

අපදානපාළි

දුතියො භාගො

සුත්තන්තපිටකෙ ඛුද්දකනිකායෙ

අපදානපාළි

දුතියො භාගො

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

401. තිස්සමෙත්තෙය්‍යත්ථෙරාපදානං*

3891. පබ්භාරකූටං නිස්සාය **සොභිතො** නාම තාපසො,
පවත්තඵලං භුඤ්ජිත්වා වසති පබ්බතන්තරෙ.

3892. අග්ගිං දාරුං ආහරිත්වා උජ්ජාලෙසිං අහං තදා,
උත්තමත්ථං ගවෙසන්තො බ්‍රහ්මලොකූපපත්තියා.

3893. **පදුමුත්තරො** ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
මමුද්ධරිතුකාමො සො ආගච්ඡි මම සන්තිකෙ.

3894. "කිං කරොසි මහාපුඤ්ඤ දෙහි මෙ අග්ගිදාරුකං,
අහමග්ගිං පරිචරෙ තතො මෙ සුද්ධි හෙහිති."[1]

3895. "සුභද්දකො ත්වං මනුජෙ දෙවතෙ ත්වං පජානසි,
තුවමග්ගිං[2] පරිචර හන්ද තෙ අග්ගිදාරුකං."

3896 තතො කට්ඨං ගහෙත්වාන අග්ගිං උජ්ජාලයී ජිනො,
න තත්ථ කට්ඨං පජ්ඣායි පාටිහීරං[3] මහෙසිනො.

3897. "න තෙ අග්ගි පජ්ජලති ආහුතී තෙ න විජ්ජති,
නිරත්ථකං වතං තුය්හං අග්ගිං පරිචරස්සු මෙ."

3898. "කීදිසො සො[4] මහාවීර අග්ගි තව පවුච්චති,
මය්හම්පි කථයස්සෙ'තං උභො පරිචරාමසෙ."

---

* මෙත්තෙය්‍යත්ථෙරාපදානං, සීමු. 1. හොහිති, මජසං.
2. තුවං අග්ගිං, මජසං. 3. පාටිහෙරං, මජසං. 4. තෙ, සහං.

සූත්‍රාන්තපිටකයේ ඛුද්දකනිකායෙහි

අපදානපාළි

ද්විතීය භාගය

—ඃ—

ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදුරජානන්වහන්සේට නමස්කාර වේවා.

401. තිසසමෙත්තෙය්‍ය සථවිරාවදානය

3891. ශිලාපර්වතකූටයක පබ්භාරයක් ඇසුරු කොට සොභිත නම් තවුසෙක් ස්වයංපතිතඵල අනුභව කොට කඳු අතරෙහි වෙසේ.

3892. මම එකල්හි ගිනි ද දර ද ගෙණවුත් උත්තමාර්ථය සොයමින් බඹලොව ඉපදීම සඳහා එය දැල්වීමි.

3893. ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ පදුමුත්තර බුදුරජ තෙම මා සසරදුකින් ගොඩලනු කැමැත්තේ මාගේ සමීපයට වැඩියේ ය. (වැඩ මෙසේ ද වදාළේය:)

3894. "මහපිනැත්තාණෙනි, කුමක් කරහි ද? ගිනි හා දර මට ද දෙව. මම ද අග්නිපරිචරණය කරන්නෙමි. එයින් මාගේ ශුද්ධිය ද වන්නේ ය".

3895. "මනුජය, මුබ සුභද්‍ර වෙහි. දෙවිය, මුබ දනිහි. මුබ අග්නිපරිචරණය කළ මැනව. මේ ගිනි හා දර මුබට ය" යි තවුසා කීය.

3896. ඉක්බිති බුදුරජ තෙම දර ගෙණ ගිනි දැල්වී ය. එහි ඒ දර නො දැල්විනි. ඒ බුදුරජුන්ගේ ප්‍රාතිහාර්‍ය්‍යයකි.

3897. "තාගේ ගින්න නො දැල් වේ. තාගේ යාගයෙක් නැත. තාගේ ව්‍රතය නිරර්ථක ය. මාගේ ගිනි පුදව" යි බුදුහු වදාළහ.

3898. "මහාවීරයන් වහන්ස, ඔබගේ ඒ ගින්න (ගිනිපිදුම) කෙබඳු යි කියනු ලැබේ ද, මට ද මෙය කියනු මැනව. අප දෙදෙන ම ගිනි පුදමූ" යි තවුසා කීය.

3899. "හෙතුධම්මනිරොධාය කිලෙසසමනාය ච,
ඉස්සා මච්ඡරියං හිත්වා තයො එතෙ මමා'හුතී."

3900. "කීදිසො ත්වං මහාවීර කථං ගොත්තො'සි මාරිස,
ආචාරපටිපත්ති තෙ බාළ්හං ඛො මම රුච්චති."

3901. "ඛත්තියම්හි කුලෙ ජාතො අභිඤ්ඤා පාරමිං ගතො,
සබ්බාසවපරික්ඛීණො නත්ථිදානි පුනබ්භවො."

3902. "යදි බුද්ධොසි සබ්බඤ්ඤු පභඞ්කර තමොනුද,
නමස්සිස්සාමි තං දෙව දුක්ඛස්සන්තකරො තුවං."

3903. පත්ථරිත්වා, ජිනචම්මං නිසීදන මදාසහං,
නිසීද නාථ සබ්බඤ්ඤු උපට්ඨිස්සාමහං තුවං.

3904. නිසීදි භගවා තත්ථ අජිනම්හි සුවිත්ථතෙ,
නිමන්තයිත්වා සම්බුද්ධං පබ්බතං අගමාසහං.

3905. ඛාරිභාරඤ්ච පූරෙත්වා තින්දුකඵලමාහරිං,
මධුනා යොජයිත්වාන ඵලං බුද්ධස්ස'දාසහං.

3906. මම නිජ්ඣායමානස්ස පරිභුඤ්ජි තදා ජිනො,
තත්ථ චිත්තං පසාදෙසිං පෙක්ඛන්තො ලොකනායකං.

3907. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
මම'ස්සමෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

3908. "යො මං ඵලෙන තප්පෙසි පසන්නො සෙහි පාණිභි,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

3909. පඤ්චවීසතික්ඛත්තුං සො දෙවරජ්ජං කරිස්සති,
සහස්සක්ඛත්තුං රාජා ච චක්කවත්තී භවිස්සති.

3910. තස්ස සඞ්කප්පමඤ්ඤාය පුබ්බකම්මසමඞ්ගිනො,
අන්නං පානඤ්ච වත්ථඤ්ච සයනඤ්ච මහාරහං.

3911. පුඤ්ඤකම්මෙන සංයුත්තා නිබ්බත්තිස්සන්ති තාවදෙ,
සදා පමුදිතො චායං භවිස්සති අනාමයො.

3912. උපපජ්ජති යං යොනිං දෙවත්තං අථ මානුසං,
සබ්බත්ථ සුඛිතො හුත්වා මනුස්සත්තං ගමිස්සති.

3913. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදානපාරගූ,
සම්බුද්ධමුපගන්ත්වාන අරහා සො භවිස්සති."

3899. දුඃඛධර්මයන්ගේ හෙතුනිරොධය, කෙලෙස් සන්හිඳුවීම, ඊෂ්‍ර්‍යාමාත්සර්‍ය්‍යයන් හැර ලීම යන මේ තුණ මාගේ යාග ගින්නය'' යි (බුදුරජ තෙම වදාලේය:)

3900. "මහාවීරයන් වහන්ස, මුබ කෙබඳු වූවෙක් වෙහි ද? නිදුකාණෙනි, (ඔබ) කිනම් ගොත්‍ර ඇත්තෙහි ද? මුබගේ ආචාර ප්‍රතිපත්ති දැඩි සේ මට රුචි කෙරේ'' යි.

3901. "මම ක්‍ෂත්‍රිය කුලයෙහි උපන්නෙම් වෙමි. අභිඥවන්ගේ පරතෙරට ද ගියෙම් වෙමි. සියලු ආශ්‍රවයන් ක්‍ෂය කෙලෙමි. දැන් නැවත ඉපදීමෙක් ද නැතැ'' යි (බුදුරජ තෙම වදාලේය.)

3902. සර්‍වඥයන් වහන්ස, නිර්‍වාණාලොකය කරන්නවුන් වහන්ස, (මොහ නමැති) අඳුර දුරු කරණ උතුමානන් වහන්ස, ඉදින් මුබ බුදු වෙහි නම් (විශුද්ධි) දෙවයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර කරන්නෙමි. මුබ දුක් නැති කරන්නෙහි ය''.

3903. (එසේ කියා) මම අඳුන්දිවිසම අතුරා (බුදුරජුන්හට) හිඳීමට දුනිමි. (මෙස් ද කීමි:) ලොකනාථයන් වහන්ස, වැඩ හිඳිනු මැනව. සර්‍වඥයන් වහන්ස, මම ඔබට උවටැන් කරන්නෙමි'' යි.

3904. භාග්‍යවත් තෙමේ මොනොවට අතුළ අඳුන්දිවිසමෙහි වැඩ හුන්නේ ය. මම සම්බුදුරජුන් පවරා පර්‍වතයට ගියෙමි.

3905. පිරිකරකද පුරවා තිඹිරිගෙඩි ගෙණ ආමි. මම ඒ ගෙඩි මී සමග යොදා බුදුරජුන්හට දුනිමි.

3906. සර්‍වඥ තෙම මා කලපනාවෙහි යෙදී සිටියදී (ඒ දනය) වැළඳිය. බුදුරජුන් දෙස බලමින් එහි දී සිත පැහැදවීමි.

3907. ලොකයාගේ පූජාවන් පිළිගැනීමට සුදුසු වූ පදුමුත්තර බුදුරජ තෙමේ මාගේ ආශ්‍රමයෙහි සිඳ මේ ගාථාවන් වදාළ සේක:

3908. "යමෙක් පැහැදුනේ සියතින් ඵලයෙන් මා සන්තර්පණය කෙළේ ද, හේ (කවරෙක්දැයි) මම කියන්නෙමි. කියන්නාවූ මාගේ වචනය අසවු.

3909. හෙතෙම පස්විසිවරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. දහස්වරක් සක්විති රජ වන්නේ ය.

3910. පූර්‍වකර්මයෙන් සමන්‍වාගත වූ ඔහුගේ අදහස දැන මාහැඟි ආහාර ද පාන ද වස්ත්‍ර ද සෙනසුන් ද.

3911. කුශලකර්මවිපාකය හා යෙදුනාහු එකෙණෙහි උපදනාහුය. හැමකල්හි මෙතෙම නීරොග වූයේ ප්‍රමුදිත වූයේ ද වන්නේ ය.

3912. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යොනියක උපන්නේ ද, ඒ සියලු තන්හි සුව ඇතිව මිනිසත් බවට පැමිණෙන්නේ ය.

3913. හෙතෙම වෙද හදාරන්නා වූ මන්ත්‍ර දරන්නා වූ වෙදත්‍රයෙහි පරතෙරට ගිය (බමුණෙක්ව) සම්බුදුරජුන් වෙත එළඹ රහත් වන්නේ ය.'' (කියාසි).

3914. යතො සරාමි අත්තානං යතො පත්තොස්මි විඤ්ඤුතං,
භොගෙ මෙ ඌනතා නත්ථි ඵලදානස්සිදං ඵලං.

3915. වරධම්මමනුප්පත්තො රාගදොසෙ සමූහනිං,
සබ්බාසවපරික්ඛීණො නත්ථිදානි පුනබ්භවො.

3916. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

3917. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

3918. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා තිස්සමෙත්තෙය්‍යො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

තිස්සමෙත්තෙය්‍යත්ථෙරස්ස අපදානං පඨමං.

402. පුණ්ණකත්ථෙරාපදානං

3919. පබ්භාරකූටං නිස්සාය සයම්භූ අපරාජිතො,
ආබාධිකො ගරු බුද්ධො[1] වසතී පබ්බතන්තරෙ.

3920. මම අස්සමසාමන්තා පනාදො ආසි තාවදෙ,
බුද්ධෙ නිබ්බායමානම්හි ආලොකො උපපජ්ජථ.[2]

3921. යාවතා වනසණ්ඩස්මිං අච්ඡකොකතරච්ඡකා,
ව්‍යග්ඝා[3] ච කෙසරී සබ්බෙ අභිගජ්ජිංසු තාවදෙ.

3922. උප්පාතං තමහං දිස්වා පබ්බතං[4] අගමාසහං,
තත්’ද්දසාසිං සම්බුද්ධං නිබ්බුතං අපරාජිතං.

3923. සුඵුල්ලං සාලරාජංව සතරංසිංව උග්ගතං,
වීතච්චිකංව අඞ්ගාරං නිබ්බුතං අපරාජිතං.

3924. තිණං කට්ඨඤ්ච පූරෙත්වා චිතකං තත්’කාසහං,
චිතකං සුකතං කත්වා සරීරං ඣාපයිං අහං.

3925. සරීරං ඣාපයිත්වාන ගන්ධතොයං සමොකිරිං,
අන්තලික්ඛෙ ඨිතො යක්ඛො නාමමග්ගහී තාවදෙ.

3926. යං පූරිතං[5] තයා කිච්චං සයම්භුස්ස මහෙසිනො,
පුණ්ණකො නාම නාමෙන සදා හොහි[6] තුවං මුනෙ.[7]

1. ආබාධිකො ච සො බුද්ධො, මජසං. 2. ආසි තාවදෙ, ස්‍යා උදපජ්ජථ, මජසං.
3. වාළා, මජසං. 4. පබ්භාරං, මජසං. 5. තං පූරිතං, ස්‍යා.
6. සදා හොසි, ස්‍යා. 7. මුනි, සීමු.

3914. යම් තැනක පටන් මාගේ අත්බව සිහි කෙරෙම් ද, යම් තැනක පටන් නුවණැති බවට පැමිණියෙම් වෙම් ද, (ඒ මේ කාලය තුළ) මාගේ භොගසම්පත්තියෙහි අඩු බවෙක් නැත. ඵලදානයාගේ මේ විපාක යි.

3915. උතුම් වූ සසුනට පැමිණියෙම් රාගද්වෙෂයන් වැනසීමි. සියලු ආස්‍රවයන් ක්ෂය කොළෙම් වෙමි. දැන් නැවත ඉපදීමෙක් නැත.

3916. මා විසින් ක්ලෙශයෝ දවන ලදහ. හැම භවයෝ නසන ලදහ. හස්තිරාජයකු සේ බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

3917. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් ස්වාගත විය. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

3918 සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මේ අයුරින් අයුෂ්මත් තිස්සමෙත්තෙය්‍ය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක.

තිස්සමෙත්තෙය්‍ය ස්ථවිරාවදානය පළමු වැනි යි.

402. පූර්ණක ස්ථවිරාවදානය

3919. සියල්ල තෙමේ ම අවබොධ කළා වූ පස්මරුන් දිනූ ගුණගරු වූ පසේබුදුහු හටගත් ආබාධ ඇත්තාහු පර්වතකූට පබ්භාරයක් ඇසුරු කොට පර්වත අතරෙහි වැඩ වෙසෙන සේක.

3920. එකෙණෙහි මාගේ අසපුව හාත්පස මහත් වූ නාදයෙක් විය. බුදුන් පිරිනිවන් පානා කල්හි ආලොකය පහළ විය.

3921. එකෙණෙහි මුළු වනලැහැබෙහි වලස් වෘක කළුහිස්වලස් ව්‍යාඝ්‍ර සිංහ යන සියලු සත්ත්වයෝ නාද කළාහු ය.

3922. මම ඒ භූතවිකෘතිය දැක (බුදුරජුන් වැඩ විසූ) පර්වතයට ගියෙමි. එහි දී පිරිනිවි අපරාජිත වූ සම්බුදුරජුන් දිටිමි.

3923. සුපිපි සල්රුකක් වැනි, උදා වූ හිරු වැනි, පහ වූ සිළු ඇති ගිනි අඟුරු (රැසක්) වැනි පිරිනිවියා වූ බුදුරජුන් (උදෙසා)-

3924. මම එහි තණ ද දර ද පුරවා චිතකයක් කෙළෙමි. ඒ චිතකය මැනැවින් කොට (බුද්ධ) ශරීරය දැවීමි.

3925. සිරුර දවා සුවඳ දිය ඉස්සෙමි. එකෙණෙහි අහසෙහි සිටි යක්ෂයෙක් මට නමක් තැබීය:

3926. "සියල්ල තෙමේ ම අවබොධ කරගත් බුදුරජුන්ට යම් (ආදාහන) කෘත්‍යයක් තා විසින් සම්පූර්ණ කරණ ලද ද, මුනිවරය, ඔබ හැමකල්හි නමින් පූර්ණක නම් වෙව" යි.

3927. තම්හා කායා චවිත්වාන දෙවලොකං අගච්ඡහං,
තත්ථ දිබ්බමයො ගබ්භො අන්තලික්ඛෙ පවායති[1]

3928. තත්‍රාපි නාමධෙය්‍යං මෙ පුණ්ණකො'ති අහූ තදා,
දෙවභූතො මනුස්සො වා සබ්බකප්පං පූරයාමහං.

3929. ඉදං පච්ඡිමකං මය්හං චරිමො වත්තතී[2] භවො,
ඉධාපි පුණ්ණකො නාම නාමධෙය්‍යං පකාසති.

3930. තොසයිත්වාන සම්බුද්ධං ගොතමං සක්‍යපුඞ්ගවං,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

3931. එකනවුතෙ ඉතො කප්පෙ[3] යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි තනුකිච්චස්සිදං ඵලං.

3932 කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවා පරික්ඛීණා විහරාමි අනාසවො.

3933. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

3934. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා පුණ්ණකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

පුණ්ණකත්ථෙරස්ස අපදානං දුතියං.

403. මෙත්තගුත්ථෙරාපදානං

3935. හිමවන්තස්ස අවිදූරෙ[4] අසොකො නාම පබ්බතො,
තත්ථා'සි අස්සමො මය්හං විස්සකම්මෙන[5] මාපිතො.

3936. සුමෙධො නාම සම්බුද්ධො අග්ගො කාරුණිකො මුනි,
නිවාසයිත්වා පුබ්බණ්හෙ පිණ්ඩාය මං උපාගමි.

3937. උපාගතං මහාවීරං සුමෙධං ලොකනායකං,
පග්ගය්හ සුගතපත්තං[6] සප්පිතෙලෙන පූරයිං[7].

3938. දිස්වානහං බුද්ධසෙට්ඨෙ සුමෙධෙ ලොකනායකෙ,
අඤ්ජලිම්පග්ගහෙත්වාන භීයො[8] හාසං ජනෙසහං.

3939. "ඉමිනා සප්පිදානෙන චෙතනාපණිධීහි ච,
දෙවභූතො මනුස්සො වා ලභාමි විපුලං සුඛං.

3940. විනිපාතං විවජ්ජෙත්වා සංසරාමි භවාභවෙ,
තත්ථ චිත්තං පණිධිත්වා ලභාමි අචලං පදං."

1. අන්තලික්ඛා පවස්සති, මජ්සං. 2. වත්තන්තෙ, මජ්සං.
3. එකනවුතිතො කප්පෙ, මජ්සං. 4. හිමවන්තස්සාවිදූරෙ, මජ්සං.
5. විසුකම්මෙන, සීමු. 6. සුගතං පත්තං, සීමු. සුභකං, පත්තං PTS.
7. සප්පිතෙලං අපූරයිං, මජ්සං. 8. භිය්‍යො, මජ්සං.

3927. මම ඒ අත්බැවින් ච්‍යුතව දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි. එහි අහසෙහි දිව්‍යමය සුවඳ හමයි.

3928. එකල්හි එහිදී ද මාගේ නම 'පූර්ණක' නම් විය. දෙව් වූයේ ද මිනිස් වූයේ ද (මාගේ) අදහස් සම්පූර්ණ කරමි.

3929. මේ මාගේ (සසරෙහි) අවසානය යි. (දැන් මේ) අන්තිම භවය පවතී. මෙහි දී ද පූර්ණක නාමය ප්‍රකාශ වේ.

3930. ශාක්‍යකුලශ්‍රෙෂ්ඨ වූ ගෞතම බුදුරජුන් සතුටු කොට සියලු ආශ්‍රවයන් (ප්‍රහාණපරිඥ වශයෙන්) දැන ආශ්‍රව රහිතව වෙසෙමි.

3931. මෙයින් එක් අනූවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, ඒ හෙතුවෙන් දුගතියක් නො දනිමි. ශරීරාදාහන කෘත්‍යයාගේ මේ විපාක යි.

3932. කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. අනාශ්‍රව වූයෙම් වෙසෙමි.

3933. බුද්ධශ්‍රෙෂ්ඨයන් වෙත පැමිණීම ඒකාන්තයෙන් මට ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

3934. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මේ අයුරින් ආයුෂ්මත් පූර්ණක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

පූර්ණක ස්ථවිරාවදානය දෙවැනි යි.

403. මෛත්‍රගුස්ථවිරාවදානය

3935. හිමවතට නුදුරෙහි අසෝක නම් පර්වතයෙක් විය. එහි මට විශ්වකර්මයා විසින් මවන ලද ආශ්‍රමයෙක් විය.

3936. අග්‍රකාරුණික වූ සුමෙධ නම් සර්වඥ මුනි තෙමේ පෙරවරුයෙහි හැඳ පොරවා මා වෙත පිඬු පිණිස එළඹියේ ය.

3937. එළඹියා වූ මහාවීර වූ ලොකනායක වූ සුමෙධ බුදුරජුන් (දැක) සුගතපාත්‍රය ගෙණ ගිතෙලින් පිරවීමි.

3938. මම ලොකනායක වූ සුමෙධ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ කෙරෙහි එය පිළිගන්වා ඇඳිලි බැඳගෙණ වැඩියක් ම සතුට ඉපදවීමි. (මෙසේ ද පැතීමි)

3939. "මේ ගිතෙල් දන හෙතු කොට ගෙණ ද චිත්තප්‍රණිධියෙන් හෙතු කොට ගෙණ ද දෙව් වූයේ හෝ මනුෂ්‍ය වූයේ හෝ මහත් වූ සැප ලබමි.

3940. දුගතිය හැර කුදු මහත් භවයෙහි සැරිසරමි. එහි සිත පිහිටුවා අමෘතපදය ද ලබමි" (කියායි).

3941. “ලාභා තුය්හං සුලද්ධං තෙ යං මං අද්දක්ඛි බ්‍රාහ්මණං,[1]
මම දස්සනමාගම්ම අරහා ත්වං භවිස්සසි.

3942. විස්සත්ථො හොහි මා භායි අධිගන්ත්වා මහායසං,
මමං හි සප්පිං දත්වාන පරිමොක්ඛසි ජාතියා.

3943. ඉමිනා සප්පිදානෙන චෙතනාපණිධීහි ච,
දෙවභූතො මනුස්සො වා ලභසෙ විපුලං සුඛං.

3944. ඉමිනා සප්පිදානෙන මෙත්තචිත්තවතාය ච,
අට්ඨාරසෙ කප්පසතෙ දෙවලොකෙ රමිස්සසි

3945. අට්ඨතිංසතික්ඛත්තුඤ්ච දෙවරාජා භවිස්සසි,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

3946. එකපඤ්ඤාසක්ඛත්තුඤ්ච චක්කවත්තී භවිස්සසි,
චාතුරන්තො විජිතාවී ජම්බුසණ්ඩස්ස[2] ඉස්සරො.

3947. මහාසමුද්දෙව'ක්ඛොභො දුද්ධරො පථවී යථා,
එවමෙව ච තෙ භොගා අප්පමෙය්‍යා භවිස්සරෙ.”

3948. සට්ඨිකොටි හිරඤ්ඤස්ස චජිත්වා[3] පබ්බජිං අහං,
කිං කුසලං ගවෙසන්තො බාවරිං උපසඞ්කමිං.

3949. තත්ථ මන්තෙ අධීයාමි ඡළඞ්ගං නාම ලක්ඛණං,
තමන්ධකාරං විධමං උප්පජ්ජි ත්වං මහාමුනි.

3950. තව දස්සනකාමොහං ආගතොම්හි මහාමුනි,
තව ධම්මං සුණිත්වාන පත්තො'ම්හි අචලං පදං.

3951. තිංසකප්පසහස්සම්හි සප්පිං බුද්ධස්ස' දාසහං,
එත්ථන්තරෙ නාභිජානෙ සප්පි විඤ්ඤාපිතං මයා[4],

3952. මම සඞ්කප්පමඤ්ඤාය උප්පජ්ජති යදිච්ඡකං,
චිත්තමඤ්ඤාය නිබ්බත්තං සබ්බෙ සන්තප්පයාමහං.

3953. අහො බුද්ධො අහො ධම්මො[5] අහො නො සත්ථුසම්පදා,
ථොකං හි සප්පිං දත්වාන අප්පමෙය්‍යං ලභාමහං.

3954. මහාසමුද්දෙ උදකං යාවතා නෙරුපස්සතො,
මම සප්පිං උපාදාය කලභාගං න එස්සති[6].

1. බ්‍රාහ්මණ, මජසං. 2. ජම්බුමණ්ඩස්ස, මජසං.
3. චත්වා, න, සීමු දත්වාන, ස්‍යා. 4. සප්පිං. විඤ්ඤාපිතං මයා, මජසං.
5. අහො බුද්ධා අහො ධම්මා, මජසං. 6. න හෙස්සති, මජසං. හිස්සති, ස්‍යා.

3941. යම් හෙයකින් බ්‍රාහ්මණ වූ (නසන ලද පව් ඇති) මා දුටුයේ ද, (එය) ඔබට ලාභයකි. ඔබ විසින් මැනැවින් ලබන ලද්දකි. මාගේ දර්‍ශනයට පැමිණ ඔබ රහත් වන්නෙහි ය.

3942. විශ්වාසය ඇත්තෙක් (අස්වැසුනෙක්) වන්න, බිය නො වන්න. මට ගිතෙල් දී මහත් යශස් ලබා ජාතියෙන් ද මිදෙන්නෙහි ය.

3943. මේ ගිතෙල් දන හෙතු කොට ගෙණ ද, චිත්තප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද මුබ දෙව් වූයේ ද මිනිස් වූයේ ද මහත් සුව ලබන්නෙහි ය.

3944. මෛත්සිතින් යුතු ව කළ මේ ගිතෙල් දන හෙතු කොට ගෙණ අටළොස්සිය වන හෙවත් එක්දහස්අටසිය වන කපෙහි දෙව්ලොව සිත් අලවා වසන්නෙහි ය.

3945. අටතිස් වරක් දෙව්රජ වන්නෙහි ය. මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් (මෙතෙකැයි) ගිණිය නො හැකි ය.

3946. එක්පණස් වරක් සිවුමහදිවයින් හා සිවුසයුරු කෙළවර කොට ඇති පෘථිවියට අධිපති වූ (සතුරු රජුන්) ජයගන්නාසුලු වූ ජම්බුද්වීපයට ඊශ්වර වූ සක්විතිරජ වන්නෙහි ය.

3947. යම් සේ මහසයුර නො කැලඹිය හැකි ද මහපොළොව නො සෙල්විය හැකි ද ඔබගේ භොගසම්පත්හු ද පමණ කළ නො හැක්කානු වෙති.''

3948. මම සැටකෙළක් අගනා හිරණ්‍ය හැර දමා කුසල් කුම්ය යි සොයමින් බාවරී වෙත එළඹියෙමි.

3949. එහි මම මන්ත්‍ර ද ෂඩඞ්ගලක්ෂණශාස්ත්‍රය ද හදාරමි. මහා මුනීන් වහන්ස, මුබවහන්සේ ඝනාන්ධකාරය විධ්වංසනය කරමින් ලොව පහළ වූ සේක.

3950. මහාමුනීන් වහන්ස, මුබවහන්සේගේ දර්‍ශනය කැමැත්තෙන් මම පැමිණියෙම් වෙමි. මුබ වහන්සේගේ ධර්‍මය ද අසා අමෘතපද සඞ්ඛ්‍යාත නිවණට පැමිණියෙම් වෙමි.

3951. මම තිස්දහස් කපකට පෙර බුදුරජුන්හට ගිතෙල් දුනිමි. මේ අතරතුර මා විසින් විනවන ලද (වචනයෙන් ලබා ගන්නා ලද) ගිතෙලක් ගැණ නො දනිමි.

3952. මාගේ අදහසට අනුව ඉදින් කැමැති කැමැති දෙය පහළ වේ ද, සිත දූන ගෙණ මෙත් පහළ වූ එයින් මම සියල්ලන් සන්තර්පණය කරමි.

3953. බුදුරජ තෙම ආශ්චර්‍ය්‍යය. ධර්‍මය ද ආශ්චර්‍ය්‍යය. අපගේ ශාසනා-සම්පත්තිය ද ආශ්චර්‍ය්‍ය ය. බුදුරජුන්හට ගිතෙල් මඳක් දී එය අපමණ ව ලබමි.

3954. මෙරුපර්‍වත පාර්‍ශ්වයෙහි ඇති මහසමුදුරෙහි දිය යම් පමණ ද මාගේ ඒ ගිතෙල් හා සසඳන කල්හි එය දෙතිසෙන් කොටසක් වූ (කලභාගයකට) ද නො පැමිණෙන්නේ ය.

3955. යාවතා චක්කවාළස්ස කරීයන්තස්ස[1] රාසිතො,
මම නිබ්බත්තවත්ථානං ඔකාසො සො න සම්මති.

3956. පබ්බතරාජා හිමවං පවරොපි සිලුච්චයො,
මමානුලිත්තගන්ධස්ස උපනිධිං[2] න හෙස්සති.

3957. වත්ථං ගන්ධඤ්ච සප්පිඤ්ච අඤ්ඤඤ්ච දිට්ඨධම්මිකං,
අසඞ්ඛතඤ්ච නිබ්බානං සප්පිදානස්සිදං ඵලං.

3958. සතිපට්ඨානසයනො සමාධිඣානගොචරො,
බොජ්ඣඞ්ගභොජනො අජ්ජ[3] සප්පිදානස්සිදං ඵලං.

3959. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවා පරික්ඛීණා විහරාමි අනාසවො.

3960. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

3961. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **මෙත්තගුත්ථෙරො** ඉමා ගාථායො අභාසිත්ථාති.

මෙත්තගුත්ථෙරස්ස අපදානං තතියං.

404. ධොතකත්ථෙරාපදානං

3962. ගඞ්ගා **භාගීරථී** නාම හිමවන්තා පභාවිතා,
හංසවතියා ද්වාරෙන අනුසන්දති තාවදෙ.

3963. **සොභිතො** නාම ආරාමො ගඞ්ගාකූලෙ සුමාපිතො,
තත්ථ **පදුමුත්තරො** බුද්ධො වසතෙ ලොකනායකො.

3964. තිදසෙහි යථා ඉන්දො මනුජෙහි පුරක්ඛතො,
නිසීදි තත්ථ භගවා අසම්භීතො'ව කෙසරී.

3965. නගරෙ **හංසවතියා** වසාමි[4] බ්‍රාහ්මණො අහං,
ඡළඞ්ගො නාම නාමෙන එවන්නාමො මහාමුනි.

3966. අට්ඨාරසසිස්සසතා පරිවාරෙන්ති මං තදා,
තෙහි සිස්සෙහි සමිතො ගඞ්ගාතීරං උපාගමිං.

3967. තත්ථද්දසාසිං සමණෙ නික්කුහෙ ධොතපාපකෙ,
භාගීරථිං තරන්තො'හං[5] එවං චින්තෙසි තාවදෙ.

1 කාරයන්තස්ස, ස්‍යා. කයිරන්තස්ස, PTS. 2. උපනිධං, සීමු.
3. බොජ්ඣඞ්ගජනනො, ස්‍යා. 4. අහොසිං, ස්‍යා. 5. තරන්තොහං, ස්‍යා.

3955. මට පහළ වන්නා වූ වස්ත්‍ර මුළුසක්වළෙහි ම රැස් කරණ කල්හි ද එයට ඒ අවකාශය නො පොහොනේ වේ.

3956. ඉතා උස් වූ හිමවත් පර්වතරාජයා පවා මා අලෙව් දුන් සුවඳ විලෙවුන් හා උපමාවකට පමණ නො වන්නේ ය.

3957. වස්ත්‍ර ද සුවඳ ද ගිතෙල් ද මේ අත්බැව්හි දී ම ලබන ලද අසංස්කෘත නිර්වාණය ද ඇත්තෙම් වෙමි ගිතෙල් දනෙහි මේ විපාක යි.

3958. අද මම සතිපට්ඨානසයනය ද, සමාධිධ්‍යානගොචරය ද බොධ්‍ය-ඞ්ගභොජනය ද ඇත්තෙම් වෙමි ගිතෙල් දන්හි මේ විපාකයි.

3959. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. සර්වාශ්‍රවයෝ ක්‍ෂය කරණ ලදහ අනාශ්‍රව වූයෙම් වෙසෙමි.

3960. බුද්ධශ්‍රෙෂ්ඨයන් වෙත පැමිණීම මට ස්වාගත ම විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

3961. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මේ අයුරින් ආයුෂ්මත් මෙත්තගු ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

මෙත්තගු ස්ථවිරාවදානය තෙවැනි යි.

404. ධොතක ස්ථවිරාවදානය

3962. හිමවතින් ප්‍රභූත භාගිරථී ගඞ්ගා තොමෝ (ගඞ්ගානදිය) එකල්හි හංසවතී නගරද්වාරයෙන් ගලා බස්නී ය.

3963. ගංඉවුරෙහි මැනවින් කරණ ලද ශොභිත නම් ආරාමයෙක් විය. එහි ලොකනායක වූ පදුමුත්තර බුදුරජ තෙමේ වැඩ වෙසෙයි.

3964. තව්තිසාවෙහි දෙවියන් සහිත ශක්‍රයා මෙන් මනුෂ්‍යයන් විසින් පිරිවරණ ලද භාග්‍යවත් තෙමේ එහි අභීත කෙශරසිංහ රාජයකු මෙන් වැඩහුන්නේ ය.

3965. මම හංසවතී නගරයෙහි බමුණෙක් ව වෙසෙමි. නමින් ඡලඞ්ග නම් වෙමි. එනම් ඇති මහමුනිවරයෙක් වෙමි.

3966. එකල්හි අටළොස් සියක් (-එක්දහස් අටසියයක්) ශිෂ්‍යයෝ මා පිරිවරත්. ඒ ශිෂ්‍යයන් විසින් පිරිවරණ ලදුයෙම් ගඞ්ගාතීරයට එළඹියෙමි.

3967. එහි දී කොහොන්කම් පිරහිත දෙවා හල පව් ඇති ශ්‍රමණයන් වහන්සේ දිටිමි. (උන්වහන්සේ) භාගිරථී ගඟ තරණය කරණ කෙණෙහි මම මෙසේ සිතීමි.

3968. “සායං පාතං තරන්තා’මෙ බුද්ධපුත්තා මහායසා,
විහෙසයන්ති අත්තානං තෙසං අත්තා විහඤ්ඤති.

3969. සදෙවකස්ස ලොකස්ස බුද්ධො අග්ගො පවුච්චති,
නත්ථි මෙ දක්ඛිණෙ කාරං ගතිමග්ගවිසොධනං.

3970. යන්නූන බුද්ධසෙට්ඨස්ස සෙතුං ගඞ්ගාය කාරයෙ,
කාරාපෙත්වා ඉමං කම්මං සන්තරාමි ඉමං භවං.”

3971. සතසහස්සං දත්වාන සෙතුං කාරාපයිං අහං,
සද්දහන්තො “කතං කාරං විපුලං මෙ භවිස්සති.”

3972. කාරාපෙත්වාන තං සෙතුං උපෙසිං ලොකනායකං,
සිරසි අඤ්ජලිං කත්වා ඉදං වචනමබ්‍රවිං.

3973. “සතසහස්සස්ස වයං කත්වා[1] කාරාපිතො මයා,
තවත්ථාය මහාසෙතු පටිගණ්හ මහාමුනි.”

3974. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

3975. “යො මෙ සෙතුං අකාරෙසි පසන්නො සෙහි පාණිහි,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

3976. දරිතො පබ්බතාතො[2] වා රුක්ඛාතො[3] පතිතොප’යං,
චුතොපි ලච්ඡතී ඨානං සෙතුදානස්සිදං ඵලං.

3977. විරූළ්හමූලසන්තානං නිග්‍රොධමිව මාලුතො,
අමිත්තා නප්පසහන්ති සෙතුදානස්සිදං ඵලං.

3978. නාස්ස චොරා පසහන්ති නාතිමඤ්ඤන්ති ඛත්තියා,
සබ්බෙ තරිස්සතාමිත්තෙ සෙතුදානස්සිදං ඵලං.

3979. අබ්භොකාසගතං සන්තං කඨිනාතපතාපිතං,
පුඤ්ඤකම්මෙන සංයුත්තං න භවිස්සන්ති වෙදනා.

3980. දෙවලොකෙ මනුස්සෙ වා හත්ථියානං සුනිම්මිතං,
තස්ස සඞ්කප්පමඤ්ඤාය නිබ්බත්තිස්සති තාවදෙ.

3981. සහස්සස්සා වාතජවා සින්ධවා සීඝවාහනා,
සායං පාතං උපෙස්සන්ති සෙතුදානස්සිදං ඵලං.

3982. ආගන්ත්වාන මනුස්සත්තං සුඛිතො’යං භවිස්සති,
ඉහාපි[4] මනුජස්සෙව හත්ථියානං භවිස්සති.

1. දත්වා, මජසං, 2. පබ්බතතො, මජසං. 3. රුක්ඛතො, මජසං.
4. වෙහාසං, මජසං.

3968. "මහත් කීර්ති ඇති මේ බුද්ධපුත්‍රයෝ සවස්හි ද උදයෙහි ද මේ ගඟ තරණය කරන්නාහු තමන් වෙහෙසට පමුණුවත්. ඔවුන්ගේ ආත්මභාවය පෙළෙයි.

3969. දෙවියන් සහිත ලොකයා අතුරෙන් බුදුරජ තෙම අග්‍රයයි කියනු ලැබේ. දක්ෂිණාර්හයන් කෙරෙහි (කළ) සසර ගමන්මග පිරිසිඳු කරණ පින්කමකුදු මට නැත

3970. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට ගඟෙහි හෙයක් කරන්නෙම් නම් ඉතා මැනැවි. මේ පින්කම කරවා මේ භවය තරණය කරමි යි.

3971. මා විසින් කරණ ලද පින්කම මහත්ඵල වන්නේ යයි අදහමින් මම ලක්ෂයක් දී හෙයක් කරවීමි.

3972. ඒ හෙය කරවා ලොකනායක බුදුරජුන් වෙත එළඹියෙමි. සිරසෙහි ඇඳිලි බැඳ මේ වචනය ද කීමි:

3973. "මහාමුනීන් වහන්ස, මා විසින් ලක්ෂයක් වැය කොට ඔබ වහන්සේ උදෙසා මහත් වූ හෙයක් කරවන ලදී. ඒ පිළිගණු මැනව" යි.

3974. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ පදුමුත්තර බුදුරජ තෙමේ භික්ෂුසඞ්ඝයා මැද හිඳ මේ ගාථාවන් වදාළේය:

3975. "යමෙක් පහන් වූයේ සියතින් මට හෙයක් කරවූයේ ද, මම හේ (කවරෙක්දැයි) පවසන්නෙමි. එසේ පවසන්නා වූ මාගේ වචනය අසවු:

3976. මෙ තෙම කඳුරකින් (=පර්වතවිවරයකින්) වේවයි පර්වතයකින් වේවයි ගසකින් වේවයි ගිලිහුනේ නමුදු (ඉන්) ගිලිහුනේ ම පිහිට ලබන්නේ ය. සෙතුදායකයාගේ මේ විපාක යි.

3977. වැඩිගිය මුල්සමූහය ඇති නුගගසක් වාතය බලයෙන් උදුරා නො දමන්නාක් මෙන් පසමිතුරෝ (මොහු) නො මැඩලත්.

3978. මොහුගේ (දෙය) සොරු බලයෙන් පැහැර නො ගනිත් රජ-වරු මොහුට අවමන් නො කරත්. සියලු පසමිතුරන් ජය ගන්නේ ය. සෙතුදායකයාගේ මේ විපාක යි.

3979. එළිමහනකට ගියේ නමුදු දැඩි අව්වෙන් තැවුනේ නමුදු ඒ සෙතුදානමය පුණ්‍යකර්මයෙන් යුත් මොහුට (දුක්) වේදනාවෝ නො වන්නාහු ය

3980. දෙව්ලොවෙහි හෝ මිනිස්ලොවෙහි හෝ මැනවින් නිර්මිත හස්තියානයක් ඔහුගේ අදහස් පරිදි එකෙණෙහි පහළ වන්නේ ය.

3981. වාතවෙගයෙන් දුවන ශීඝ්‍රවාහන වූ දහසක් සෛන්ධවයෝ උදය සවස වෙත එළඹෙන්නාහු ය. සෙතුදායකයාගේ මේ විපාක යි.

3982. මෙ තෙම මිනිසත්බවට පැමිණ සැපවත් වන්නේ ය. මෙහි මිනිස්කල්හි ද ඔහුට හස්තියානයක් වන්නේ ය.

3983. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන[1] සත්ථා ලොකෙ භවිස්සති.

3984. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සත'නාසවො.”

3985. අහො මෙ සුකතං කම්මං ජලජුත්තමනාමකෙ,
තත්ථ කාරං කරිත්වාන පත්තො'හං ආසවක්ඛයං.

3986. පධානපහිතත්තොම්හි උපසන්තො නිරූපධි,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

3987. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

3988. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

3989. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං..

ඉත්ථං සුදං ආයස්මා **ධොතකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ධොතකත්ථෙරස්ස අපදානං චතුත්ථං.

405. උපසිවත්ථෙරාපදානං

3990 හිමවන්තස්ස අවිදූරෙ **අනොමො** නාම පබ්බතො,
අස්සමො සුකතො මය්හං පණ්ණසාලා සුමාපිතා.

3991. නදී ච සන්දතී තත්ථ සුපතිත්ථා මනොරමා,
අනූපතිත්ථෙ ජායන්තී පදුමුප්පලකා බහූ.

2992. පාඨීනා පාවුසා මච්ඡා වලජා මුඤ්ජරොහිතා,
මච්ඡකච්ඡපසඤ්ඡන්නා නදිකා සන්දතෙ සදා.

3993. තිමිරා පුප්ඵිතා තත්ථ අසොකා ඛුද්දමාලකා,
පුන්නාගා ගිරිපුන්නාගා සම්පවන්ති මමස්සමං.

1. ගොත්තෙන, මජසං.

3983. කල්පලක්ෂයකින් මතුයෙහි ඔක්කාක වංශයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

3984. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිත කලාක් වැනි වූ ඖරස බුද්ධපුත්‍ර වූ මෙතෙම සියලු ආස්‍රවයන් (ප්‍රහාණපරිඥා වශයෙන්) දැන ආස්‍රව රහිතව පිරිනිවන් පාන්නේය'' යී.

3985. පදුමුත්තර බුදුරජුන් කෙරෙහි මා විසින් මැනැවින් කරණ ලද කර්මය ආශයවර්ජයකි. උන්වහන්සේ කෙරෙහි බුහුමන් කොට මම ආස්‍රවක්ෂය සඞ්ඛ්‍යාත නිවණට පැමිණියෙම් වෙමි.

3986. කාය - ජීවිත දෙක්හිත් අපෙක්ෂා රහිත වූයෙම් වීර්‍ය්‍යී කිරීමෙහි යෙදුනෙම් වෙමි. සන්හුන් වූයෙම් උපධිරහිත වූයෙම් ඇතකු මෙන් බැදුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

3987. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් ස්වාගත විය. පැමිණෙනලද ත්‍රිවිද්‍යාවෝ ඇත්තාහ මා විසින් බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

3988. මාගේ කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. සියලු ආස්‍රවයෝ ක්ෂය වූහ. දැන් පුනර්භවයෙක් නැත.

3989. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුසසුන කරණ ලදි.

මේ අයුරින් ආයුෂ්මත් බොතක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යී.

බොතක ස්ථවිරාපදානය සිවුවැනි යි.

405. උපසීව ස්ථවිරාපදානය

3990. හිමවතට නුදුරෙහි අනොම නම් පර්වතයෙක් විය. මට එහි මැනැවින් කළ අසපුවෙක් විය. මනා කොට කටයුතු නිම වූ පන්සලක් ද විය.

3991. එහි මනා වූ කුඩා තොටු ඇති මනොඥ වූ නදියක් ගලා බසී. ඒ කුඩා තොටුවල බොහෝ පද්මොත්පලයෝ හට ගනිත්.

3992. පාඨීන නම් මත්ස්‍යයෝ (=පෙටියෝ) ද පාවුස නම් මත්ස්‍යයෝ (=ලූල්ලු) ද වලජ නම් මත්ස්‍යයෝ (=වලයෝ) ද මුඤ්ජ නම් මත්ස්‍යයෝ (=මොද්දු) ද රොහිත නම් මත්ස්‍යයෝ (=රෙහෙරු) ද යන මසුන් හා කැසුබුවන්ගෙන් ගැවසීගත්තා වූ නදිය හැමකල්හි ගලා බසී.

3993. එහි තිමිරය, අසොකය, බුද්දමාලක (කුඩාමල් ඇතිගස්) ය පුන්නාග (දොඹය) ගිරිපුන්නාග (කඳුවල වැවෙන දොඹ) ය යන මේ වෘක්ෂයෝ පිපී ගියාහු මාගේ අසපුවෙහි සුවඳ පතුරුවත්.

3994. කුටජා පුප්ඵිතා තත්ථ තිණසූලවනානි ච,
සාලා ච සළලා තත්ථ චම්පකා පුප්ඵිතා බහූ.

3995. අජ්ජුනා අතිමුත්තා ච මහානාමා ච පුප්ඵිතා,
අසනා මධුගන්ධී ච පුප්ඵිතා තෙ මමස්සමෙ.

3996. උද්දාලකා පාටලිකා යූථිකා ච පියඞ්ගුකා,
බිම්බිජාලකසඤ්ඡන්නා සමන්තා අඩ්ඪයොජනං.

3997. මාතඞ්ගවා[1] සත්තලියො පාටලී සින්දුවාරකා,
අඞ්කොලකා බහූ තත්ථ තාලකුටා ච[2] පුප්ඵිතා.

3998. සෙලෙය්‍යකා බහූ තත්ථ පුප්ඵිතා මම අස්සමෙ,
එතෙසු පුප්ඵමානෙසු[3] සොභන්ති පාදපා බහූ,
සමන්තා තෙන ගන්ධෙන වායතෙ මම අස්සමො.

3999. හරීතකා ආමලකා අම්බා ජම්බූ විභීටකා,[4]
කොලා භල්ලාතකා බිල්ලා ඵාරුසකඵලානි ච.

4000. තින්දුකා ච පියාලා ච මධුකා කාසුමාරියො,[5]
ලබුජා පනසා තත්ථ කදලී බදරීඵලා.[6]

4001. අම්බාටකා බහූ තත්ථ වල්ලිකාරඵලානි ච,
බීජපූරසපාරියො[7] ඵලිතා මම අස්සමෙ.

4002. ආළකා ඉසිමුග්ගා ච තතො මොදඵලා බහූ,
අවටා පක්කභරිතා පිලක්ඛුදුම්බරානි ච.

4003. පිප්ඵලී මරිචා තත්ථ නිග්‍රොධා ච කපිත්ථනා,
උදුම්බරකා බහවො කණ්ඩපක්කා ච පාරියො [8]

4004. එතෙ චඤ්ඤෙ ච බහවො ඵලිතා අස්සමෙ මම,
පුප්ඵරුක්ඛාපි බහවො පුප්ඵිතා මම අස්සමෙ.

4005. ආලුවා ච කළම්බා ච බිළාලී තක්කලානි ච,
ආලකා තාලකා චෙව විජ්ජන්ති අස්සමෙ මම.

4006. අස්සමස්සා'විදූරෙ මෙ මහාජාතස්සරො අහු,
අච්ඡොදකො සීතජලො සුපතිත්ථො මනොරමො.

4007. පදුමුප්පලා බහූ තත්ථ පුණ්ඩරීකසමායුතා,
මන්දාලකෙහි සඤ්ඡන්නා නානාගන්ධසමෙරිතා.

---

1. මාතඞ්ගරා, මජ්සං. මාතකාරා, සසා. මාතඞ්ගා වා, PTS.
2. තාලකූටයී ච, මජ්සං. 3. පුප්ඵජාතෙසු, මජ්සං.
4. අම්බජම්බුවිභීතකා, මජ්සං. 5. කාසුමාරයො, මජ්සං
6. චබදරීඵලා, සසා. PTS. 7. චිරසංරසපාකා ච, සසා.
8. කණ්ඩුපණ්ණා ච හරියො, මජ්සං.

3994. එහි පිපී ගියා වූ කෙලිඳ වෘක්‍ෂයෝ ද බෝලිද්දවනයෝ ද, සාලවෘක්‍ෂයෝ ද, එසේ ම පිපී ගියා වූ සලල (=හොර) වෘක්‍ෂයෝ ද චම්පක (සපු) වෘක්‍ෂයෝ ද එහි බොහෝ වෙති.

3995. පිපී ගියා වූ කුඹුක් ද යොහොඹු ද උක්ගස් ද, පිපී ගියා වූ පියා ගස් ද, මධුගන්ධි වෘක්‍ෂයෝ ද මාගේ අසපුවෙහි බොහෝ වෙති.

3996. ඇසළය පළොල්ය සීනිද්දය පුවඟුය රත්කරව්ය යන මේකී වෘක්‍ෂයන්ගෙන් මාගේ අසපුව හාත්පස අඩයොදුනක් තන්හි වැසී ගියේ ය.

3997. පිපුණා වූ මාතඬගව නම් වෘක්‍ෂයෝ ද, සත්පෙති දෑසමන් ද පළොල් ද නික ද රුකඟුන ද තාලකූට නම් වෘක්‍ෂයෝ ද එහි බොහෝ වූහ.

3998. මාගේ ඒ අසපුවෙහි පිපුණා වූ ගල්මල් ද බොහෝ ය. මේ වෘක්‍ෂයෝ පිපෙන කල්හි බෙහෙවින් හොබිත්. ඒ සුවඳින් මාගේ අසපුව හාත්පස සුවඳ හමයි.

3999. අරළු, නෙල්ලි, අඹ, ජම්බු, බුළු, ඩෙබර, බදුලු, බෙලි, බොරළුදමුණු යන මේ වෘක්‍ෂයන්ගේ ඵල ද,

4000. තිඹිරි, පියල්, වැල්මී, කාසුමාරිය, දෙල්, කොස් කෙසෙල්, ඩෙබර යන මොවුන්ගේ ඵලයෝ ද එහි බොහෝ වෙති.

4001. ඇඹරැල්ල, වල්ලිකාර ඵලයෝ ද එහි බොහෝ වෙති. ලපනාරඟ, සපාරිය මේ වෘක්‍ෂයෝ ද මාගේ අසපුවෙහි පල ගන්නාහු වෙති.

4002. ආලක, ඉසිමුගග (=වනමුං), යලි මොදඵල යන මොහු එහි බොහෝ වෙති. හාත්පස වූ පුලිල දිඹුල් ද යන මේ වෘක්‍ෂයෝ ඵල හරිත වූවාහු ය.

4003. තිප්පිලි, මිරිස්, නුග, දිවුල්, දිඹුල්, කණ්ඩපක්ක, පාරිය මේකී වෘක්‍ෂයෝ එහි බොහෝ වෙති.

4004. මේ වෘක්‍ෂයෝ ද තවත් බොහෝ වෘක්‍ෂයෝ ද මාගේ අසපු-වෙහි පල ගන්නාහු වෙත්. මාගේ අසපුවෙහි බොහෝ මල් ගස්ද, පිපුනාහු වෙත්.

4005. ආලුව, කලම්බ, බිලාලි, තක්කල, ආලක, තාලක, යන අල දෑ ද මා අසපුවෙහි වෙත්

4006. මාගේ අසපුවට නුදුරෙහි පැහැදි සිසිල් දිය ඇති මනා තොට ඇති සිත්කලු සවයංජාත විලෙක් විය.

4007. සුදුනෙළුම් හා රතුනෙළුම් හා උපුල් එහි බොහෝ ය. මදුරු ගස්වලින් වැසී ගිය නඩාගය නොයෙක් සුවඳ හමයි.

4008. ගබ්භං ගණ්හන්ති පදුමා අඤ්ඤෙ පුප්ඵන්ති කෙසරී,
ඔපුප්ඵපත්තා තිට්ඨන්ති පදුමකණ්ණිකා[1] බහූ.

4009. මධු භිසම්හා සවති ඛීරං සප්පි මුළාලිභි,
සමන්තා තෙන ගන්ධෙන නානා ගන්ධසමෙරිතා.

4010. කුමුදා අම්බගන්ධි ච නයිතා දිස්සරෙ බහූ,
ජාතස්සරස්සානුකූලං කෙතකා පුප්ඵිතා බහූ.

4011. සුඵුල්ලා බන්ධුජීවා ච සෙතවාරී සුගන්ධිකා,
කුම්භිලා සුංසුමාරා ච ගහකා තත්ථ ජායරෙ.

4012. උග්ගාහකා අජගරා තත්ථ ජාතස්සරෙ බහූ,
පාඨීනා පාවුසා මච්ඡා වලජා[2] මුඤ්ජරොහිතා.

4013. මච්ඡකච්ඡපසඤ්ඡන්නා අථො පපටකෙහි ච,
පාරෙවතා රවිහංසා කුකුත්ථා[3] ච නදීචරා.

4014. දින්දිභා චක්කවාකා ච චම්පකා ජීවජීවකා,
කලන්දකා උක්කුසා ච සෙනකා උද්ධරා බහූ.

4015. කොට්ඨකා සුකපොතා ච කුලීරා[4] චමරා බහූ,
කාරෙණියො[5] ච තිලකා උපජීවන්ති තං සරං.

4016. සීහා ව්‍යග්ඝා ච දීපී ච අච්ඡකොකතරච්ඡකා,
වානරා කින්නරා චෙව දිස්සන්ති මම අස්සමෙ.

4017. තානි ගන්ධානි සායන්තො භක්ඛයන්තො ඵලානහං,
ගන්ධොදකං පිවන්තො ච වසාමි මම අස්සමෙ.

4018. එණීමිගා වරාහා ච පසදා ඛුද්දරූපකා,
අග්ගිකා ජොතිකා චෙව වසන්ති මම අස්සමෙ.

4019. හංසා කොඤ්චා මයූරා ච සාලිකා පි ච කොකිලා,
මඤ්ජරිකා බහූ තත්ථ කොසිකා පොට්ඨසීසකා.

4020. පිසාචා දානවා චෙව කුම්භණ්ඩා රක්ඛසා බහූ.
ගරුළා පන්නගා චෙව වසන්ති මම අස්සමෙ.

1. පදුමාකණ්ණිකා, මජසං. 2. බලජා, මජසං. 3. කුක්කුත්ථා, සතා.
4. තුලියා, මජසං. 5. කාසෙනියා, සතා.

4008. පද්මයෝ ගැබ් ගණිති. ඇතැම් පද්මයෝ පිපෙත්. (ඇතැම් පියුම්හි) පිපුනා වූ පත්‍රයෝ වෙති. පද්ම කර්ණිකාවෝ ද බොහෝ වෙති.

4009. නෙළුඹලමලින් මී ද නෙළුම්දඬුලින් කිරි හා ගිතෙල් ද වැගිරේ. නොයෙක් සුගන්ධ වහනය වූවාහු හාත්පස සුවඳින් යුක්ත ය.

4010 කුමුදු සුවඳ ද අඹමල් සුවඳ ද හමන වාතයෝ විද්‍යමාන වෙති. ස්වයංජාත විල් ඉවුරෙහි පිපුණු වැටකේ ගස් බොහෝ ය.

4011. මැනවින් පිපුනු සුවඳවත් බඳුවද ද, සෙතවාරිපුෂ්පයෝ ද වෙති. කිඹුලෝ ද (සු - සු හඬ නගමින් දිය මතුපිට සැපින් දිය බුබුළු නංවන්නා වූ) ගැටකිඹුලෝ ද, ජලජ චණ්ඩ සත්ත්වයෝ එහි හටගනිති.

4012 - 4013. උඩට මතුවී ගොදුරු ඩැහැගන්නෝ ද පිඹුරෝ ද ඒ විලෙහි බොහෝ වෙති. (එය) පෙපියෝ, ශූල්ලු, වලයෝ, මොද්දු, රෙහෙරු, මෙකී මසුන් හා කැසුබුවන්ගෙන්ද ගැවසී ගත්තේ ය. යලි හුණපුපුලන්ගෙන් ද (එ විල) ගහණය. පරෙවියෝ, රවිහංසයෝ, කුකුත්ථක නම් පක්ෂීහු, නදීචර නම් පක්ෂීහු,

4014. කිරලපක්ෂීහු සක්වා ලිහිණියෝ, චම්පක පක්ෂීහු, (ජීව - ජීව යන අනුකරණයෙන් හඬන) ජීවජීවක පක්ෂීහු, ලෙහෙනු, උක්කුස නම් වූ කබරුස්සෝ, සෙනක නම් වූ උකුස්සෝ, උඬර නම් වූ පක්ෂීහු ද එහි බොහෝ වෙති.

4015. කොට්ඨක නම් පක්ෂීහු, සුව (=ගිරා) පොතකයෝ, කකුළුවෝ, සෙමරු යන මෙකී සත්ත්වයෝ ද එහි බොහෝ වෙති. කාරෙණිය, තිලක යන මොහු ද එ විල ඇසුරු කොට ජීවත් වෙති.

4016. සිංහයෝ, ව්‍යාඝ්‍රයෝ, දිවියෝ, වලස්සු, කොක්නහවෝ, කරබාතා වලස්සු, වඳුරෝ ද මාගේ අසපුවෙහි පැණෙත්.

4017. මම ඒ සුවඳ ආඝ්‍රාණය කරමින් එලවගී බුදිමින් සුවඳ දිය පානය කරමින් මාගේ අසපුවෙහි වෙසෙමි.

4018. එණිමෘගයෝ, හූරෝ, පසදමෘගයෝ, (ඔවුනට වඩා කුඩා ස්වරූප ඇති) බුද්දරූපකයෝ, අග්ගික, ජෝතික නම් සත්ත්වයෝ ද මාගේ අසපුවෙහි වෙසෙත්.

4019. හංසයෝ, කොස්වාලිහිණියෝ, මොණරු, සැලලිහිණියෝ, කොවුලෝ, මඤ්ජරික නම් සත්ත්වයෝ ද, බකමුහුණෝ පොට්ඨසීස නම් පක්ෂීහු ද එහි බොහෝ වෙත්.

4020. පිසාචයෝ, අසුරයෝ, කුම්භාණ්ඩයෝ, රකුසෝ ද බොහෝ වෙති. ගුරුළෝ ද සර්පයෝ ද මාගේ අසපුවෙහි වෙසෙත්.

4021. මහානුභාවා ඉසයො සන්තචිත්තා සමාහිතා,
කමණ්ඩලුධරා සබ්බෙ අජිනුත්තරවාසනා,
තෙ ජටාභාරභරිතා[1] වසන්ති මම අස්සමෙ.

4022. යුගමත්තඤ්ච පෙක්ඛන්තා නිපකා සන්තවුත්තිනො,
ලාභාලාභෙන සන්තුට්ඨා වසන්ති මම අස්සමෙ.

4023. වාකචීරං ධුනන්තා තෙ ඵොටෙන්තා’ජිනචම්මකං,
සබලෙහි උපත්ථද්ධා ගච්ඡන්ති අම්බරෙ සදා.[2]

4024. න තෙ දකං ආහරන්ති කට්ඨං වා අග්ගිදාරුකං,
සයඤ්ච උපසම්පන්නා පාටිහීරස්සිදං ඵලං.

4025. ලොහදොණිං ගහෙත්වාන වනමජ්ඣෙ වසන්ති තෙ,
කුඤ්ජරාව මහානාගා අසම්භීතාව කෙසරී.

4026. අඤ්ඤෙ ගච්ඡන්ති ගොයානං අඤ්ඤෙ පුබ්බවිදෙහකං,[3]
අඤ්ඤෙ ච උත්තරකුරුං සකං බලමවස්සිතා,[4]
තතො පිණ්ඩං ආහරිත්වා පරිභුඤ්ජන්ති එකතො.

4027. සබ්බෙසං පක්කමන්තානං උග්ගතෙජාන තාදිනං,
අජිනචම්මසද්දෙන වනං සද්දායතෙ තදා.

4028. එදිසා තෙ මහාවීර සිස්සා උග්ගතපා මම,
පරිවුතො අහං තෙහි වසාමි මම අස්සමෙ.

4029. තොසිතා සකකම්මෙන විනීතාපි සමාගතා,
ආරාධයිංසු මං එතෙ සකකම්මාභිලාසිනො,
සීලවන්තො ච නිපකා අප්පමඤ්ඤාසු කොවිදා.

4030. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
සමයං සංවිදිත්වාන උපගච්ඡි විනායකො.

4031. උපගන්ත්වාන සම්බුද්ධො ආතාපී නිපකො මුනි,
පත්තං පග්ගය්හ සම්බුද්ධො භික්ඛාය මමුපාගමි.

4032. උපාගතං මහාවීරං ජලජුත්තමනායකං,
තිණසන්ථරං පඤ්ඤාපෙත්වා[5] සාලපුප්ඵෙහි ඔකිරිං.

4033. නිසීදෙත්වාන[6] සම්බුද්ධං හට්ඨො සංවිග්ගමානසො,
ඛිප්පං පබ්බතමාරුය්හ අගරුං අග්ගහිං අහං.

---

1. ජටාභාරභරිතාව, මජ්ඣසං. ජටාභාරභරිතා ච, ස්‍යා. 2. තදා, මජ්ඣසං.
3. පුබ්බවිදෙහකං, ස්‍යා. PTS. 4. බලමපස්සිතා, ස්‍යා. PTS.
5. පඤ්ඤපෙත්වා, මජ්ඣසං. 6. නිසාදෙත්වාන, මජ්ඣසං. නිසීදිත්වාන, ස්‍යා.

4021. මහත් අනුභාව ඇති සන්හුන් සිත් ඇති එකඟ වූ, පැන්-කෙන්ඩි දරන්නා වූ අඳුන් දිවිසම් උතුරුසළු කොට හඳින්නා වූ ඒ සියලු සෘෂීහු දළඹුලු බිරින් යුතු වූවාහු මාගේ අසපුවෙහි වෙසෙත්.

4022. වියදඬු පමණ දුර බලන්නා වූ ප්‍රාඥ වූ ශාන්ත පැවැතුම් ඇති ලාභ - අලාභ දෙකින් ම සමසේ සතුටු වන්නා වූ (සෘෂීහු) මාගේ අසපු-වෙහි වෙසෙත්.

4023. වැහැරි සිවුරු කම්පා කරවමින් අඳුන් දිවිසම් පොළා හරිමින් ස්වකීය ධ්‍යානබලයෙන් සවිරබවට පත් ඔහු හැම කල්හි අහසෙහි යෙති.

4024. ඔහු දිය හෝ දර හෝ ගිනිගානාදඬු හෝ ගෙණ නො එති. ඒ දිය ආදීහු තෙමෙ ම ඔවුන් ලඟට පැමිණියාහු වෙති. ප්‍රාතිහාර්‍ය්‍ය-යාගේ මේ විපාක යි.

4025. ඔහු ලෝහො දෙණක් ගෙණ කුඤ්ජර නම් වූ මහාහස්ති රාජ-යන් මෙන් ද, නිර්භීත කෙශරසිංහයන් මෙන් ද වනමැදෙහි වසත්.

4026. (මේ සෘෂීන්ගෙන්) ස්වකීය ධ්‍යානබලයෙහි වශී වූ ඇතමෙක් අපරගොයානයට යෙත්. ඇතමෙක් පූර්වවිදෙහයට යෙත්. ඇතැ-මෙක් උතුරුකුරු දිවයිනට යෙත්. ඒ ඒ තැනින් පිඬු ගෙණවුත් සියලු දෙන ම එකතුව වළඳත්.

4027. උග්‍ර වූ තෙද ඇති තාදිගුණ ඇති එසේ අහසින් යන්නා වූ සියලු සෘෂීන්ගේ අඳුන් දිවිසම් හඬින් එකල්හි වනය හඬ නගන්නාක් මෙන් වෙයි.

4028. මහාවීර්‍ය්‍යයන් වඩන්ස, උග්‍රතපස් ඇති මෙබඳු ශිෂ්‍යයෝ මාගේ (අසපුවෙහි වෙති.) ඔවුන් විසින් පිරිවරන ලද මම මාගේ අසපුවෙහි වෙසෙමි.

4029. ස්වකීය (ධ්‍යානකාර්‍ය්‍යයෙන් තුස්වූ සිල්වත් වූ ප්‍රාඥ වූ (මෛත්‍රී කරුණා මුදිතා උපෙක්‍ෂා යන) අප්‍රමාණ්‍ය ධර්මයන් විෂයයෙහි දක්‍ෂ වූ. සියකම්හි ඇලුනාවූ එක් රැස්වූ ශිෂ්‍යයෝ මා සිත් ගන්නාහු ය.

4030. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ විනායක වූ පදුමුත්තර බුදුරජ තෙම සුදුසු කල් දැන එතැනට එළඹියේ ය.

4031. එළඹ කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුතු වූ ප්‍රාඥ වූ මෞනගුණ ඇති සර්වඥ තෙමේ පාත්‍රය ගෙණ පිඬු පිණිස මා වෙත වැඩියේ ය.

4032. (එ සේ) වැඩියා වූ පදුමුත්තර බුදුරජුන්හට තණ ඇතිරියක් පණවා සල්මල් විසිර වීමි.

4033. සම්බුදුරජුන් වඩා හිඳුවා ප්‍රීතියෙන් පිනා ගියෙම් ප්‍රීති යෙන් ම සැලෙන සිත් ඇත්තෙම් වහා පර්වතයට නැගී මම අගිල් රැස් කොට ගතිමි.

4034. කුම්භමත්තං ගහෙත්වාන පනසං දෙවගන්ධිකං,
ඛන්ධෙ ආරොපයිත්වාන උපගච්ඡිං විනායකං.

4035. ඵලං බුද්ධස්ස දත්වාන අගරුං අනුලිම්පහං,
පසන්නචිත්තො සුමනො බුද්ධසෙට්ඨං අවන්දහං.[1]

4036. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
ඉසිමජ්ඣෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

4037. “යො මෙ ඵලඤ්ච අගරුං ආසනඤ්ච අදාසි මෙ,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

4038. ගාමෙ වා යදි වා’රඤ්ඤෙ පබ්භාරෙසු ගුහාසු වා,
ඉමස්ස චිත්තමඤ්ඤාය නිබ්බත්තිස්සති භොජනං.

4039. දෙවලොකෙ මනුස්සෙ වා උපපන්නො අයං නරො,
භොජනෙහි ච වත්ථෙහි පරිසං තප්පයිස්සති.

4040. උපපජ්ජති යං යොනිං දෙවත්තං අථ මානුසං,
අක්ඛොභභොගො හුත්වාන සංසරිස්සත’යං නරො.

4041. තිංස කප්පසහස්සානි දෙවලොකෙ රමිස්සති,
සහස්සක්ඛත්තුං රාජා ච චක්කවත්ති භවිස්සති.

4042. එකසත්තතික්ඛත්තුඤ්ච දෙවරජ්ජං කරිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

4043. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

4044. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,[2]
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරිස්සත’නාසවො.”

4045. සුලද්ධලාභො ලද්ධො මෙ යො’හං අද්දක්ඛිං නායකං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4046. ගාමෙ වා යදි වා’රඤ්ඤෙ පබ්භාරෙසු ගුහාසු වා,
මම සඞ්කප්පමඤ්ඤාය භොජනං හොති මෙ සදා.

4047. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො‘ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4048. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4049. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **උපසීවො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

උපසීවත්ථෙරස්ස අපදානං පඤ්චමං.

---

1. අවන්දිහං, මජසං. 2 උපසීවො නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො, සයා.

4034. කළයක් පමණ වූ දිව්‍යමය සුවඳ ඇති (ඉඳුනු) කොස් ගෙඩියක් ද කරෙහි තබා ගෙණ බුදුරජුන් වෙත එළඹියෙමි.

4035. මම බුදුරජුන්හට ඒ ඵලය පිළිගන්වා අගිල් ද ආලෙප කෙළෙමි. මම පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙමි බුද්ධශ්‍රෙෂ්ඨ-යන් වහන්සේ වැන්දෙමි.

4036. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ පදුමුත්තර බුදුරජ තෙම සංඝයා මැද හිඳ මේ ගාථාවන් වදාළේ ය:

4037. "යමෙක් මට මේ (කොස්) ඵලය ද, අගිල් ද, ආසනය ද, දුන්නේ ද, හේ (කවරෙක්දැයි) මම තොපට කියමි. එසේ කියන්නා වූ මාගේ වචනය අසවු:

4038. ගමෙහි හෝ යලි අරණෙහි හෝ පබ්භාරයන්හි හෝ ගුහාවන්හි හෝ වසන මොහුගේ සිත් දූන බොජුන් උපදී.

4039. මේ මිනිස් තෙම දෙව්ලොව හෝ මිනිස්ලොව උපන්නේ භොජනයෙන් ද වස්ත්‍රයෙන් ද පිරිස තෘප්ත කරන්නේ ය.

4040. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යොනියක උපදී නම් නො කැලඹුනු භොගසම්පත් ඇත්තේ ව මෙ මිනිස් තෙම සසර සැරි-සරන්නේ ය.

4041. (මෙ තෙම) කප් තිස්දහසක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේ ය. දහස් වරක් සක්විති රජ වන්නේ ය.

4042. එක්සැත්තෑ වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. (මොහු ලබන) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණින් වශයෙන් ගිණිය නො හැකිය.

4043. මෙයින් කල්ප ලක්‍ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

4044. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනි වූ ඖරස බුද්ධපුත්‍ර වූ (මෙ තෙම) සියලු ආස්‍රවයන් (ප්‍රහාණපරිඥෙ වශයෙන්) දූන ආස්‍රව රහිතව වසන්නේ ය."

4045. ඒ මම ලොකනායකයන් වහන්සේ දිටිමි. මා විසින් මැනැවින් ලැබියයුතු ලාභය ලබන ලදී. ත්‍රිවිද්‍යාවෝ පැමිණෙන ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4046. ගමෙහි හෝ යලි අරණෙහි හෝ පබ්භාරයන්හි හෝ ගුහාවන්හි හෝ මා කැමැත්තට අනුව හැම කල්හි මට බොජුන් පහළ වේ.

4047. මා විසින් කෙලශයෝ දවන ලදහ හැම භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ අනාස්‍රව ව වෙසෙමි.

4048. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4049. සිවු පිළිසිඹියාවෝ ද, අෂ්ට විමොක්‍ෂයෝ ද, ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්ගේ සසුන කරණ ලදී.

මේ අයුරින් ආයුෂ්මත් උපසීවස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

උපසීවස්ථවිරාවදානය පස්වැනි යි

406. නන්දකත්ථෙරාපදානං

4050. මිගලුද්දො පුරෙ ආසිං අරඤ්ඤෙ කානනෙ අහං,
පසදං මිගමෙසන්තො සයම්භුං අද්දසං ජිනං.[1]

4051. අනුරුද්ධො නාම සම්බුද්ධො සයම්භූ අපරාජිතො,
විවෙකකාමො සො ධීරො වනමජ්ඣොගහී තදා.

4052. චතුදණ්ඩෙ ගහෙත්වාන චතුට්ඨානෙ ඨපෙසහං,
මණ්ඩපං සුකතං කත්වා පදුමපුප්ඵෙහි ඡාදයිං.

4053. මණ්ඩපං ඡාදයිත්වාන සයම්භුං අභිවාදයිං,
ධනුං තත්ථෙව නික්ඛිප්ප පබ්බජිං අනගාරියං.

4054. පබ්බජිතස්ස අචිරං[2] ව්‍යාධි මෙ උපපජ්ජථ,
පුබ්බකම්මං සරිත්වාන තත්ථ කාලකතො අහං.

4055. පුබ්බකම්මෙන සංයුත්තො තුසිතං අගමාසහං,
තත්ථ සොණ්ණමයං ව්‍යම්හං නිබ්බත්තති යදිච්ඡකං.

4056. සහස්සයුත්තාහයවාහිං දිබ්බයානමධිට්ඨිතො,
ආරුහිත්වාන තං යානං ගච්ඡාමහං යදිච්ඡකං.

4057. තතො මෙ නීයමානස්ස දෙවභූතස්ස මෙ සතො,
සමන්තා යොජනසතං මණ්ඩපො මෙ ධරීයති.

4058. සයනෙ'හං තුවට්ටාමි අච්චන්තං[3] පුප්ඵසන්ථතෙ,
අන්තලික්ඛා ච පදුමා වස්සන්ති[4] නිච්චකාලිකං.

4059. මරීචිකෙ ඵන්දමානෙ තප්පමානෙ ච ආතපෙ,
න මං තාපෙති ආතාපො මණ්ඩපස්ස ඉදං ඵලං.

4060. දුග්ගතිං සමතික්කන්තො අපායා පිහිතා මම,
මණ්ඩපෙ රුක්ඛමූලෙ වා සන්තාපො මෙ න විජ්ජති.

4061. මහිසඤ්ඤං අධිට්ඨාය ලොණතොයං තරාමහං,
තස්ස මෙ සුකතං කම්මං බුද්ධපූජායිදං ඵලං.

4062. අපථම්පි[5] පථං කත්වා ගච්ඡාමි අනිලඤ්ජසෙ,
අහො මෙ සුකතං කම්මං බුද්ධපූජායිදං ඵලං.

4063. පුබ්බෙනිවාසං ජානාමි දිබ්බචක්ඛු විසොධිතං,
ආසවා මෙ පරික්ඛීණා බුද්ධපූජායිදං ඵලං.

4064. ජහිතා පුරිමා ජාති බුද්ධස්ස ඔරසො අහං,
දායාදො'මහි ච සද්ධම්මෙ බුද්ධපූජායිදං ඵලං.

1. අහං, මජසං. 2 න චිරං පබ්බජිතස්ස, මජසං. 3. අච්ජන්තො, මජසං.
4. වස්සන්තො, මජසං. 5. අබ්භමහි, ස්‍යා

406. නන්දක ස්ථවිරාපදානය

4050. පෙර මම මහවෙනෙහි වැද්දෙක් වීමි. පසද මෘගයකු සොයන්නෙම් සියල්ල තෙමේ ම දත් බුදුරජුන් දිටිමි.

4051. පස්මරුන් දිනූ, ස්වයංභූ ප්‍රාඥ වූ අනුරුද්ධ නම් සම්බුදු තෙම විවේක සැප කැමැත්තේ එකල්හි වනමැද පිවිසියේ වේ.

4052. මම (දඬු සතරක් එක් කොට කෙලවරකින් බැඳ සාදා ගත්) චතුදණ්ඩය ගෙණ දඬු සතර තැනක පිහිටන සේ (දිග හැර) තැබීමි. මැනැවින් මඬුවක් ද කොට නෙළුම් මල් වලින් වැසීමි.

4053. ඒ මඬුව (නෙළුම්මලින්) වසා බුදුරජුන් වැන්දෙමි. දුන්න එහි ම තබා ශාසනයෙහි පැවිදි වී මි.

4054. පැවිදි වී නො බෝ කලකින් මට රොගයෙක් විය. පූර්ව කර්මය සිහිපත් කොට මම එහි කලුරිය කෙළෙමි.

4055. (ඒ පසේබුදු රජුන්හට කුටිය පිදීමේ) පූර්වකර්මය හා යෙදුනෙම් මම තුෂිත දිව්‍යලොකයෙහි උපනිමි. එහි කැමති දෑ ලැබෙන රුවන්මුවා විමනක් පහළ වේ.

4056. ඉටුයේ ම දහසක් අසුන් උසුලන දිව්‍යයානය පහළ වෙයි. මම ඒ දිව්‍යයානයට නැගී කැමති තැනකට යෙමි.

4057. ඒ යානයෙන් ගෙණ යනු ලබන්නා වූ දෙව් වූ ම මා හාත්පස යොදුන් සියක් තන්හි මට මණ්ඩපයක් දරයි.

4058. මම නිති මල් අතුළ යහනෙහි නිදමි. නිරතුරුව ම අහසිනු දු නෙළුම්මල් වැසි වසී.

4059. මිරිඟු සැලෙන අව් පහරන කල්හි දු ඒ අව් මා නො තවයි. මණ්ඩපදානයාගේ මේ විපාක යි.

4060. දුගතිය ඉක්මවූයෙම් වෙමි. අපායෝ මට වසන ලදහ. මණ්ඩපයෙහි හෝ වෘක්ෂමූලයෙහි හෝ හුන්නා වූ මට සන්තාපයෙක් නො වේ.

4061. පෘථිවි සංඥාව ඉටා මම මහසයුර තරණය කරමි. ඒ මා විසින් මැනැවින් කරණ ලද කර්මඵලය යි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4062. නො මග ද මග කොට අහසෙහි යෙමි. මා විසින් මනා කොට කරණ ලද කර්මය ආශ්චර්‍ය්‍ය යි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4063. පෙර විසූ කඳපිළිවෙල දනිමි. දිවැස පිරිසිදු කරණ ලදී. මාගේ ආස්‍රවයෝ ක්ෂය කරණ ලදහ. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4064. පුරිම ජාතීනු හරණ ලදහ. බුදුරජුන්ගේ ඖරස පුත්‍රයෙක් වීමි. සද්ධර්මයෙහි දායාද (=උරුමය ඇත්තෙක්) වෙමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4065. ආරාධිතො'ම්හි සුගතං ගොතමං සක්‍යපුඞ්ගවං,
ධම්මද්ධජො ධම්මදායාදො බුද්ධපූජායිදං ඵලං.

4066. උපට්ඨිත්වාන සම්බුද්ධං ගොතමං සක්‍යපුඞ්ගවං,
පාරඞ්ගමනියං මග්ගං අපුච්ඡිං ලොකනායකං.

4067. අජ්ඣිට්ඨො කථයී බුද්ධො ගම්භීරං නිපුණං පදං,
තස්සාහං ධම්මං සුත්වාන පත්තොම්හි ආසවක්ඛයං

4068. අහො මෙ සුකතං කම්මං පරිමුත්තොම්හි ජාතියා,
සබ්බාසවපරික්ඛීණො නත්ථිදානි පුනබ්භවො.

4069. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො' ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4070. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4071. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා නන්දකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

නන්දකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.

407. හෙමකත්ථෙරාපදානං

4072. පබ්භාරකූටං නිස්සාය අනොමො නාම තාපසො,
අස්සමං සුකතං කත්වා පණ්ණසාලෙ වසී තදා.

4073. සිද්ධං තස්ස තපොකම්මං සිද්ධිපත්තො සකෙ බලෙ,
සකසාමඤ්ඤවිඤ්ඤාතො ආතාපී නිපකො මුනි.

4074. විසාරදො සසමයෙ පරවාදෙ ච කොවිදො,
පට්ඨො භූමන්තලික්ඛම්හි උප්පාතම්හි ච කොවිදො

4075. වීතසොකො නිරාරම්භො අප්පාහාරො අලොලුපො,
ලාභාලාභෙන සන්තුට්ඨො ඣායී ඣානරතො මුනි.

4076. පියදස්සී නාම සම්බුද්ධො අග්ගො කාරුණිකො මුනි,
සත්තෙ තාරෙතුකාමො සො කරුණාය ඵරී තදා.

4077. බොධනෙය්‍යං ජනං දිස්වා පියදස්සී මහාමුනි,
චක්කවාළසහස්සම්පි ගන්ත්වා ඔවදතෙ මුනි.

4078. මමුද්ධරිතුකාමො සො මමස්සමමුපාගමි,
න දිට්ඨො මෙ ජිනො පුබ්බෙ න සුතො පි ච කස්සචි,

4065. ශාක්‍යකුලශ්‍රෙෂ්ඨ වූ ගෞතම බුදුරජුන් ආරාධනය (=සතුටු) කෙළෙමි. ධර්මයට ධජයක් වූයෙමි ධර්මයට දැයාද වෙමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4066. ශාක්‍යකුලතිලක වූ ගෞතම බුදුරජුන් උවටැන් කොට බුදුරජුන්ගෙන් නිවන්මග විචාළෙමි.

4067. (මා විසින්) ආරාධිත වූ බුදුරජ තෙම ගැඹුරු වූ සියුම් වූ නිර්වාණපදය වදාළේ ය. මම උන්වහන්සේගේ ධර්මය අසා ආශ්‍රවක්ෂය සඞ්ඛ්‍යාත නිවනට පැමිණියෙමි.

4068. මා විසින් මැනැවින් කරණ ලද කර්මය ආශ්චර්ය යි. (නැවත සසරෙහි) ඉපදීමෙන් මිදුනෙම් වෙමි. ක්‍ෂය කළ සියලු ආශ්‍රවයන් ඇත්-තෙම් වෙමි. දැන් නැවත ඉපදීමෙක් නැත.

4069. කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත් රජකු මෙන් බැඳුම් සිඳ අනාශ්‍රව ව වෙසෙමි.

4070. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත පැමිණීම මට ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4071. සිවු පිළිසිඹියාවෝ ද, අෂ්ට විමොක්‍ෂයෝ ද, ෂඩභිඥාවෝ ද, සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මේ අයුරින් ආයුෂ්මත් නන්දක ස්ථවිරයන් වහන්සේ මේ ගාථා-වන් වදාළ සේක් යි.

නන්දකස්ථවිරාපදානය සවැනි යි.

407. හෙමකස්ථවිරාපදානය

4072. එකල්හි අනොම නම් තවුසෙක් තෙම පර්වතප්‍රාන්තයක් ඇසුරු කොට මනා අසපුවක් කොට ඒ පන්සලෙහි විසී ය.

4073. ඔහුගේ තපොකර්මය සිද්ධිප්‍රාප්ත ය. ස්වකීය ධ්‍යානබලයෙහි ද සිද්ධිප්‍රාප්ත ය. ස්වීය ශ්‍රාමණ්‍ය ගුණයෙන් මැඩ පවත්වන ලද කෙලෙස් ඇත්තෙක. කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තෙක. ප්‍රාඥයෙක. සංවරයෙක.

4074 විශාරදයෙක. ස්වසමය පරසමයාන්හි දක්‍ෂයෙක. පොළො-වෙහි හා අහසෙහි ප්‍රකට වූවෙක. උත්පාත ශාස්ත්‍රයෙහි දක්‍ෂයෙක.

4075 එකල්හි පහ වූ ශොක ඇති ආරම්භ රහිත වූ ස්වල්පාහාරයකින් යැපෙන ලොල්බව නැති ලාභාලාභ දෙක්හි (සමව) සතුටු වන ධ්‍යානයෙහි ඇළුනා වූ මොනෙය්‍ය ගුණ යුතු,

4076. සර්වඥ වූ අග්‍රකාරුණික වූ පියදස්සී නම් බුදුරජ තෙම සත්ත්වයන් (සසර සයුරින්) එතෙර කරනු කැමැත්තේ මහාකරුණාව පැතිර වී ය.

4077. පියදස්සී බුදුරජ තෙමේ ධර්මාවබොධයෙහි සමතකු දැක සක්-වළ දහසකට වුව ද ගොස් (ඒ විනෙයජනයනට) අවවාද කරයි.

4078. ඒ බුදුරජ තෙම මා සසර සයුරින් ගොඩ ලනු කැමැත්තේ මාගේ අසපුවට වැඩියේ ය. මා විසින් (ඊට) පෙර බුදුරජ තෙම නො දක්නා ලදි. කිසිවකුගෙන් (උන්වහන්සේ ගැන) නො අසන ලද්දෙම් ද වෙමි.

4079. උප්පාතා සුපිනා මය්හං ලක්ඛණා සුප්පකාසිතා,
පඨව්‍යා භූමන්තලික්ඛම්හි නක්ඛත්තපදකොවිදෙ.

4080. සො'හං බුද්ධස්ස සුත්වාන තත්ථ චිත්තං පසාදයිං,
භුඤ්ජන්තො[1] වා නිසින්නො වා සරාමි නිච්චකාලිකං.

4081. මයි එවං සරන්තම්හි භගවාපි අනුස්සරි,
බුද්ධං අනුස්සරන්තස්ස පීති මෙ හොති තාවදෙ.

4082. කාලඤ්ච පුනරාගම්ම උපෙසි මං මහාමුනි,
සම්පත්තෙපි න ජානාමි අයං බුද්ධො මහාමුනී.

4083. අනුකම්පකො කාරුණිකො පියදස්සී මහාමුනි,
සඤ්ජානාපෙසි අත්තානං අහං බුද්ධො සදෙවකෙ.

4084. සඤ්ජානිත්වාන සම්බුද්ධං පියදස්සිං මහාමුනිං
සකං චිත්තං පසාදෙත්වා ඉදං වචනමබ්‍රවිං:

4085. "අඤ්ඤෙ[2] පීඨෙ ච පල්ලඞ්කෙ ආසන්දීසු නිසීදරෙ,
තුවම්පි සබ්බදස්සාවී නිසීද රතනාසනෙ"

4086. සබ්බරතනමයං පීඨං නිම්මිනිත්වාන තාවදෙ,
පියදස්සිස්ස මුනිනො අදාසිං ඉද්ධිනිම්මිතං.

4087. රතනෙ ච නිසින්නස්ස පීඨකෙ ඉද්ධිනිම්මිතෙ,
කුම්භමත්තං ජම්බුඵලං අදාසිං තාවදෙ අහං.

4088. මම හාසං ජනෙත්වාන පරිභුඤ්ජි මහාමුනි,
තද චිත්තං පසාදෙත්වා සත්ථාරමභිවාදයිං.

4089. පියදස්සී තු භගවා ලොකජෙට්ඨො නරාසභො,
රතනාසනමාසීනො ඉමා ගාථා අභාසථ:

4090. "යො මෙ රතනමයං පීඨං අමතං ච ඵලං අදා,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

4091. සත්තසත්තති කප්පානි දෙවලොකෙ රමිස්සති,
පඤ්චසත්තතික්ඛත්තුඤ්ච චක්කවත්තී භවිස්සති.

4092. ඡත්තිංසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

4093. සොවණ්ණමයං රූපිමයං පල්ලඞ්කං සුකතං බහුං,
ලොහිතඞ්කමයං[3] චෙව ලච්ඡති රතනාමයං.

1. තිට්ඨන්තො, මජසං. 2. සබ්බෙ, සයා. 3. ලොහිතඞ්ගමයං, මජසං.

4079. මට උත්පාතය, සුපිනය, ලක්ෂණය යන මේ ශාස්ත්‍රයෝ මැනවින් ප්‍රකාශිතයහ. මම පොළොවෙහි හා අහසෙහි පතළ වූවෙක් වෙමි. නක්ෂත්‍ර පදයන්හි ද දක්ෂ වෙමි.

4080. මම බුදුරජුන්ගේ (තොරතුරු) අසා උන්වහන්සේ කෙරෙහි සිත පැහැද වීමි. අනුභව කරන්නේ ද, හුන්නේ ද, නිතිකල් (උන්වහන්සේ ම) සිහි පත් කරමි.

4081. මෙසේ මා උන්වහන්සේ සිහි කරණ කල්හි බුදුරජාණන් වහන්සේ ද මා සිහි කළ සේක. බුදුරජාණන් වහන්සේ සිහිපත් කරන්නාවූ මට එකෙණෙහි ප්‍රීතිය ඇති විය.

4082. නැවත සුදුසු කාලය ද එළඹ බුදුරජ තෙම මා සමීපයට වැඩියේ ය. (එසේ) වැඩි කල්හි දු "මේ මහාමුනි වූ බුදුරජ තෙමේ" ය යි මම නො දනිමි.

4083. (සත්ත්වලොකයට) අනුකම්පා කරන්නා වූ, කාරුණික වූ පියදස්සී මහාමුනි තෙම "මම දෙවියන් සහිත ලොකයෙහි සම්බුද්ධ වෙමැ" යි තෙමේ ම දැන්වීය.

4084. මහාමුනි වූ 'පියදස්සී' බුදුරජුන් ය යි හැඳින සිය සිත පහදවා මේ වචනය කීමි:

4085. අන්‍යයෝ පුටුවෙහි ද පලඟෙහි ද දික්සඟලාහි ද හිඳිත්. සියල්ල දක්නා වූ බුදුරජාණන් වහන්ස (ඔබ ද) රුවන් අසුනෙහි හිඳිනු මැනව.

4086. මෙසේ කියා එකෙණෙහි සියල්ල රුවන්මුවා පුටුවක් මවා ඍද්ධියෙන් නිර්මිත වූ ඒ පුටුව පියදස්සී බුදුරජුන්හට දුනිමි.

4087. ඍද්ධියෙන් නිර්මිත කරණ ලද රුවන්පුටුවෙහි වැඩ හුන් (බුදුරජුන්හට) එකෙණෙහි මම කළයක් පමණ වූ ජම්බුඵලයක් දුනිමි.

4088. බුදුරජ තෙම මාගේ සතුට උපදවමින් (එය) වැළඳීය. එකල්හි සිත පහදවා ශාස්තෘන් වහන්සේ වැන්දෙමි.

4089. ලොකජ්‍යෙෂ්ඨ වූ, නරශ්‍රෙෂ්ඨ වූ රුවන් අසුනෙහි වැඩහුන්නා වූ පියදස්සී භාග්‍යවත් තෙමේ මේ ගාථාවන් වදාළේ ය:

4090. "යමෙක් මට රුවන්මුවා පුටුවක් ද, අමා වැනි (දඹ) ඵලයක් ද දුන්නේ නම් හේ (කවරෙක් දැයි) කියන්නෙමි. කියන්නා වූ මාගේ වචනය අසවු:

4091. (මෙ තෙම) සත්සැත්තෑ කපක් දෙව්ලොව සිත් අලවා වසන්නේ ය. පන්සැත්තෑ වරක් සක්විති රජ ද වන්නේ ය.

4092. දෙවෙන්ද්‍රව දෙතිස් වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. ලබන්නා වූ ප්‍රදෙශරාජ්‍යය (මෙතෙකැයි) ගණන් වශයෙන් ගිණිය නො හැකිය.

4093. රන්මුවා වූ ද රිදීමුවා වූ ද පියුම්රාගමිණිමුවා වූ ද රුවන්මුවා වූ ද මැනැවින් කළ පර්‍යඞ්ක ලබන්නේ ය.

4094. චඞ්කමන්තම්පි මනුජං පුඤ්ඤකම්මසමඞ්ගිතං,
පල්ලඞ්කානි අනෙකානි පරිවාරිස්සරෙ තදා.

4095. කූටාගාරා ච පාසාදා සයනඤ්ච මහාරහං,
ඉමස්ස චිත්තමඤ්ඤාය නිබ්බත්තිස්සන්ති තාවදෙ.

4096. සට්ඨිනාගසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
සුවණ්ණකච්ඡා මාතඞ්ගා හෙමකප්පනවාසසා[1].

4097. ආරූළ්හා ගාමණීයෙහි තොමරඞ්කුසපාණිහි[2],
ඉමං පරිචරිස්සන්ති රතනපීඨස්සි'දං ඵලං[3].

4098 සට්ඨිඅස්සසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
ආජානීයාව ජාතියා සින්ධවා සීඝවාහිනො.

4099. ආරූළ්හා ගාමණීයෙහි ඉල්ලියාචාපධාරිහි[4],
තෙපි'මං පරිචරිස්සන්ති රතනපීඨස්සිදං ඵලං.

4100 සට්ඨිරථසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
දීපා අථොපි වෙයග්ඝා සන්නද්ධා උස්සිතද්ධජා.

4101. ආරූළ්හා ගාමණීයෙහි චාපහත්ථෙහි වම්මිහි,
පරිවාරෙස්සන්ති'මං නිච්චං රතනපීඨස්සිදං ඵලං.

4102. සට්ඨිධෙනුසහස්සානි දොහඤ්ඤා පුඞ්ගවූසභෙ,
වච්ඡකෙ ජනයිස්සන්ති රතනපීඨස්සි'දං ඵලං.

4103. සොළසිත්ථිසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
විචිත්තවත්ථාභරණා ආමුත්තමණිකුණ්ඩලා.

4104. අළාරපම්හා හසුලා සුසඤ්ඤා තනුමජ්ඣිමා,
පරිවාරෙස්සන්ති මං නිච්චං රතනපීඨස්සිදං ඵලං.

4105. අට්ඨාරසෙ කප්පසතෙ ගොතමො නාම චක්ඛුමා,
තමන්ධකාරං විධමෙත්වා[5] බුද්ධො ලොකෙ භවිස්සති.

4106. තස්ස දස්සනමාගම්ම පබ්බජිස්සතකිඤ්චනො[6],
තොසයිත්වාන සත්ථාරං සාසනෙ'භිරමිස්සති.

4107. තස්ස ධම්මං සුණිත්වාන කිලෙසෙ ඣාපයිස්සති,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො.

4108. විරියං මෙ ධුරධොරය්හං යොගක්ඛෙමාධිවාහනං,
උත්තමත්ථං පත්ථයන්තො සාසනෙ විහරාමහං.

4109. ඉදං පච්ඡිමකං මය්හං චරිමො වත්තතෙ භවො,
සබ්බාසවපරික්ඛීණො නත්ථි දානි පුනබ්භවො.

1. හෙමකප්පනිවාසසා, සීමු සයා
2. ඉල්ලියාචාපධාරීහි, මජ්සං
3. රතනපිඨස්සිදං, මජ්සං.
4. චාපහත්ථෙහි වම්මිහි, සීමු.
5. විධම්ත්වා, මජ්සං.
6. පබ්බජිස්සති'කිඤ්චනො, මජ්සං

4094. පුණ්‍යකර්මය සහ යෙදුනා වූ සක්මන් කරන්නා වූ මේ භික්ෂුව එකල්හි බොහෝ පර්ෂත්කයෝ පිරිවරත්.

4095. කූටාගාරයෝ ද, ප්‍රාසාදයෝ ද, මාහැඟි සයනාසනයෝ ද මොහුගේ සිත දැනගෙණ මෙත් එකෙණෙහි පහළ වෙත්.

4096 - 4097. ඇතුන්ගේ පා විදිනා තොමර හා අකුසු (=හෙන්ඩු) ගත් අත් ඇති ග්‍රාමණීන් (ගම්ප්‍රධානයන්) විසින් නැගුනු සියලු අලඞ්කාරයෙන් සරසන ලද සැටදහසක් ඇත්තු ද හෙම්මුවා දැලැස් ආදී වූ ආභරණ ඇති ඇත්තු ද මොහු පිරිවරත්. රත්නපීඨ දූතයාගේ මේ විපාක යි.

4098 - 4099. කරපාලිකායෙන් උපලක්ෂිතව දුනු දරණ ග්‍රාමණීන් (ගම්ප්‍රධානයන්) විසින් නැගුනු ජන්මයෙන් ම ආජානීය වූ ශීඝ්‍රවාහී සෛන්ධව වූ සැට දහසක් අශ්වයෝ ද මොහු නිතර පිරිවරත්. රත්නපීඨ දූතයාගේ මේ විපාක යි.

4100 - 4101. දුනු ගත් ඇත් ඇති, සන්නාහසන්නද්ධ වූ, ග්‍රාමණීන් විසින් නැගුනු ඔසවන ලද ධජ ඇති සන්නද්ධ වූ දිවිසමින් වළඳන ලද රථ ද ව්‍යාඝ්‍රසමින් වළඳන ලද රථ දූයි මෙසේ සැට දහසක් රථයෝ මා නිතර පිරිවරත්. රත්නපීඨ දූතයාගේ මේ විපාක යි.

4102. දෙවීමට සුදුසු වූ සැටදහසක් දෙන්නු අතිශ්‍රෙෂ්ඨ වූ වස්සන් උපදවත්. රත්නපීඨ දූතයාගේ මේ විපාක යි.

4103 - 4104. මැනැවින් අලඞ්කාර කරණ ලද සොළොස් දහසක් ස්ත්‍රීහු විසිතුරු වස්ත්‍රාභරණ ඇත්තාහු, පලඳින ලද මිණිකොඩොල් ඇත්තාහු, දිග ඇසිපිය ඇත්තාහු, සිනා සහිත වූවාහු, සිහිනිඟ ඇත්තාහු නිරතුරුව ම මොහු පිරිවරන්නාහු ය. රත්නපීඨ දූතයාගේ මේ විපාක යි.

4105. මෙයින් අටළොස් සියවන කපෙහි පසැස් ඇත්තා වූ ගෞතම නම් බුදුරජ තෙමේ ගනඳුර නසා ලොව පහළ වන්නේ ය.

4106. උන්වහන්සේගේ දර්ශනය නිසා අකිඤ්චනව හෙවත් ධන රැස් කිරීම් නො මැතිව, පැවිදි වන්නේ ය. ශාස්තෲන් වහන්සේ තුටු කොට සසුනෙහි සිත් අලවා වසන්නේ ය.

4107. උන්වහන්සේගේ ධර්මය අසා කෙලෙස් නසන්නේ ය. සියලු ආස්‍රවයන් (ප්‍රහාණපරිඥා වශයෙන්) දැන ආස්‍රව රහිතව පිරිනිවන් පාන්නේ ය" (කියායි).

4108. යොගක්ෂේම සඞ්ඛ්‍යාත නිවන දක්වා මා උසුලාගෙන යන මාගේ ධූරවාහක ගවයා වීර්‍ය්‍යය යි. මම උත්තමාර්ථය වූ නිවන පතන්නෙම් සසුනෙහි වෙසෙමි.

4109. මේ මාගේ අවසානය යි. මේ පවත්නේ අන්තිමභවය යි, සියලු ආස්‍රව ක්ෂය කරණ ලදි. දැන් නැවත ඉපදීමෙක් නැත.

4110. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4111. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4112. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා හෙමකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

හෙමකත්ථෙරස්ස අපදානං සත්තමං.

සත්තරසමං භාණවාරං.

408. තොදෙය්‍යත්ථෙරාපදානං

4113. රාජාසි විජයො[1] නාම කෙතුමතිපුරුත්තමෙ,
සූරො වික්කමසම්පන්නො පුරමජ්ඣාවසී තදා.

4114. තස්ස රඤ්ඤො පමත්තස්ස අටවියො සමුට්ඨහුං,
ඔතාරා[2] තුණ්ඩිකා චෙව රට්ඨං විද්ධංසයුං තදා.

4115. පච්චන්තෙ කුපිතෙ ඛිප්පං සන්නිපාතෙස'රින්දමො,
භටෙ චෙව බලත්ථෙ ච අරිං නිග්ගාහයී තදා.

4116. හත්ථාරොහා අනීකට්ඨා සූරා ච චම්මයොධිනො,
ධනුග්ගහා ච උග්ගා ච සබ්බෙ සන්නිපතුං තදා.

4117. ආළාරිකා කප්පකා ච නහාපකා[3] මාලකාරකා,
සූරා විජිතසඞ්ගාමා සබ්බෙ සන්නිපතුං තදා.

4118. ඛග්ගහත්ථා ච පුරිසා චාපහත්ථා ච වම්මිනො,
ලුද්දා විජිතසඞ්ගාමා සබ්බෙ සන්නිපතුං තදා.

4119. තිධා පභින්නා මාතඞ්ගා කුඤ්ජරා සට්ඨිහායනා,
සුවණ්ණකච්ඡාලඞ්කාරා සබ්බෙ සන්නිපතුං තදා.

4120. ඛමා සීතස්ස උණ්හස්ස උක්කාරහරණස්ස[4] ච,
යොධාජීවා කතකම්මා සබ්බෙ සන්නිපතුං තදා.

1 රාජා අජිතඤ්ජයො, මජසං. රාජා විජිතජයො, ස්‍යා.
2. උත්තරා, ස්‍යා. ඔචරා, PTS. 3. න්හාපකා, මජසං.
4 උක්කාරුහරණස්ස, සීමු, මජසං.

4110. මා විසින් ක්ලේශයෝ දවන ලදහ. හැම භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ අනාස්‍රව ව වෙසෙමි. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

4111. බුද්ධශ්‍රෙෂ්ඨයන් වෙත පැමිණීම එකාන්තයෙන් මට ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

4112. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙ අයුරින් ආයුෂ්මත් හෙමක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

හෙමක ස්ථවිරාවදානය සත්වැනි සි.

සතළොස් වැනි බණවර සි.

408. තොදෙය්‍ය ස්ථවිරාවදානය

4113 කෙතුමතී නම් උතුම් නගරයෙහි විජය නම් රජෙක් විය. (හෙතෙම) ශූරය. වික්‍රමසම්පන්න ය. එකල්හි හේ (කෙතුමතී) පුරයෙහි අධිපති ව විසී ය.

4114. ප්‍රමත්ත වූ ඒ රජුගේ (-දුශීල අවස්ථාව දැන) වනචාරීහු නැගී සිටියහ. සිදුරු සොයන්නෝ ද මූඛරයෝ ද එකල්හි රට නැසූහ.

4115 රජ තෙම ප්‍රත්‍යන්තය කුපිත වූ කල්හි භටයන් ද බලසෙනඟ ද එකල්හි වහා රැස් කර වීය. සතුරට නිග්‍රහ ද කෙළේ ය.

4116. ඇතරුවෝ ද, බලඇණියෙහි වූවෝ ද, ශූරයෝ ද, පලිහ ගෙණ යුද කරන්නෝ ද, දුනුවායෝ ද, බලවත්හු ද සියල්ලෝ එකල්හි රැස් වූහ.

4117 අරක්කැමියෝ ද, කරනැවැමියෝ ද, දියවඩන්නෝ ද, මල්කරුවෝ ද, ශූර වූ ජයගත්තා ලද සඞ්ග්‍රාම ඇති සියල්ලෝ එකල්හි රැස් වූහ

4118 එකල්හි කඩු ගත් අත් ඇති පුරුෂයෝ ද, දුනු ගත් අත් ඇත්තෝ ද, සන්නාහසන්නද්ධයෝ ද, රෞද්‍ර වූ වැද්දෝ ද යන යුද දිනූ වීරයෝ සියලු දෙන ම රැස් වූහ.

4119. බඳින ලද රත්පොරොදුවලින් අලඞ්කාර කරණ ලද්දා වූ, ත්‍රිමදගලිත ඇත්තු ද, සැටවයස් වූ කුඤ්ජරයෝද ද, මේ සියල්ලෝ එකල්හි රැස් වූහ.

4120. යුදබිම ශීත, උෂ්ණ, කුණපහරණාදිය ඉවසන කෘතහස්ත වූ යොධාජීවයෝ (සෙබලු) සියල්ලෝ එකල්හි රැස්වූහ.

4121. සංඛසද්දං භෙරිසද්දං අථො උද්ධම[1]සද්දකං,
එතෙහි තෙ හාසයන්තා සබ්බෙ සන්නිපතුං තදා.

4122. තිසූලකොන්තමන්තෙහි කවචෙහි[2] තොමරෙහි[3] ච,
කොට්ටයන්තා[4] නිපාතෙන්තා සබ්බෙ සන්නිපතුං තදා.

4123. කිමෙවාත'නිසාමෙත්වා[5] ස රාජා අජිතං ජිනො,[6]
සට්ඨිපාණසහස්සානි සූලෙ උත්තාසයී තදා.

4124. සද්දං මානුසකා'කංසු අහො රාජා අධම්මිකො,
නිරයෙ පච්චමානස්ස කදා අන්තො භවිස්සති.

4125. සයනෙ'හං තුවට්ටෙන්තො සයාමි නිරයෙ තදා,
න සුපාමි දිවාරත්තිං සූලෙන තජ්ජයන්ති මං.

4126. කිං පමාදෙන රජ්ජෙන වාහනෙන බලෙන ච,
න තෙ පහොන්ති ධාරෙතුං තාසයන්ති[7] මමං සදා.

4127. කිං මෙ පුත්තෙහි දාරෙහි රජ්ජෙන සකලෙන ච,
යන්නූන පබ්බජෙය්‍යාහං ගතිමග්ගං විසොධයෙ.

4128. සට්ඨිනාගසහස්සානි සබ්බාලඞ්කාරභූසිතෙ,
සුවණ්ණකච්ඡෙ මාතඞ්ගෙ හෙමකප්පනවාසසෙ[8].

4129. ආරූළ්හෙ ගාමණීයෙහි තොමරඞ්කුසපාණිහි,
සඞ්ගාමාවචරෙ ධාතෙ[9] අනපෙක්ඛො විහාය'හං,
සකකම්මෙන සන්තත්තො නික්ඛමිං අනගාරියං.

4130. සට්ඨිඅස්සසහස්සානි සබ්බාලඞ්කාරභූසිතෙ,
ආජානීයෙ ච ජාතියා සින්ධවෙ සීඝවාහනෙ.

4131. ආරූළ්හෙ ගාමණීයෙහි චාපහත්ථෙහි වම්මිහි,
පහාසිත්වාන[10] තෙ සබ්බෙ නික්ඛමිං අනගාරියං.

4132. සට්ඨිරථසහස්සානි සබ්බාලඞ්කාරභූසිතෙ,
දීපෙ අථොපි වෙය්‍යග්ඝෙ සන්නද්ධෙ උස්සිතද්ධජෙ,
තෙ සබ්බෙ පරිහාරෙත්වා[11] පබ්බජිං අනගාරියං.

4133. සට්ඨිධෙනුසහස්සානි සබ්බා කංසූපධාරණා,
තායොපි[12] ඡඩ්ඩයිත්වාන පබ්බජිං අනගාරියං,

1. උතුජ, මජ්ඣං. උද්දට, ස්‍යා. උද්දම, සීමු. 2 තිසූලකොන්තිමන්තෙහි, මජ්ඣං.
3. කවචතොමරෙහි ච, මජ්ඣං. 4. කොට්ටෙන්තානං, සීමු.
5. කවචානිවාසෙත්වා, ස්‍යා. 6. අජිතඤ්ජිනො, ස්‍යා. අජිතඤ්ජයො, මජ්ඣං.
7 තාපයන්ති, මජ්ඣං. 8. හෙමකප්පනිවාසසෙ, මජ්ඣං.
9. ඨානෙ, මජ්ඣං. 10. පහාරෙත්වාන, මජ්ඣං.
11 පරිවජ්ජෙත්වා, ස්‍යා. 12. පාපිනො, ස්‍යා.

4121. සක්හඬ ද, බෙරහඬ ද, කාලම්හඬ ද යන මෙයින් ලොමුදැහැගන්වමින් ඔහු සියල්ලෝ එකල්හි රැස් වූහ.

4122. ත්‍රිශූලායුධය කුන්තායුධය මන්ත්‍රය යන මොවුන්ගෙන් ද, අයොමය සැට්ටවලින් හා තොමරයන්ගෙන් ද යුක්ත ව කොටමින් හෙලමින් සියල්ලෝ එකල්හි රැස් වූහ.

4123. ජය ගත නො හැකි යුද දිනූ ඒ රජ තෙමේ කවර දඬුවමක් කළයුතුදැයි (නීතීන්) අසා දැන එකල්හි සැට දහසක් ප්‍රාණීන් හුලෙහි තබවා ලී ය.

4124. "අහෝ, රජ තෙම නො දැහැමි ය. නිරයෙහි පැසෙන්නා වූ ඔහුගේ (ඒ දුකෙහි) අවසානය කවරදා වන්නේදැ'යි මිනිස්සු හඬ නැගූහ.

4125. එකල්හි මම යහනෙහි පෙරළෙමින් නිරයෙහි (මෙන්) සැත පෙමි. දිවා රෑ දෙක්හි නො නිදමි. මා හුලින් (=හුලතබන අයුරින්) තැයි ගන්වත්.

4126. ප්‍රමාද කාරණ වූ රාජ්‍යයෙන් ද, වාහනයෙන් ද, බලයෙන් ද කවර ප්‍රයොජන ද? ඒ සියල්ලෝ මා (නිරයෙන් වළකා) දරන්නට නො පොහොසත් වෙත්. හැම කල්හි මා තැති ගන්වත්.

4127. දරුවන්ගෙන් බිරියන්ගෙන් මුළුරජයෙන් හෝ මට ඇති ප්‍රයොජනය කිම? මම සුගතිමාර්ගය ශුද්ධකෙරෙම් නම් පැවිදි වන්නෙම් නම් ඉතා මැනවැයි සිතී ය.

4128 – 4129. ඇතුන්ගේ පා විදිත තොමර හා අකුසු (=හෙන්ඩු) ගත් අත් ඇයි ග්‍රාමණීන් (=ගම්ප්‍රධානයන්) විසින් තගිනු ලැබූ සියලු අලඞ්කාරයෙන් සරසන ලද සැටදහසක් ඇතුන් ද හෙම්මුවා පලස් ආදි වූ ආභරණ ඇති සඞ්ග්‍රාමාවචර ඇතුන් ද එතන්හි ම අපෙක්‍ෂා රහිත ව මම අත හැර සචකිය (මිනිසුන් හුල තැබීමේ) පාපකර්මයෙන් තැයි ගන්නෙම් අනගාරිය සඞ්ඛ්‍යාත සසුනෙහි (පැවිදි වීමට) නික්ම ගියෙමි.

4130 – 4131. දුනු ගත් අත් ඇති සන්නාහ සන්නද්ධ වූ ග්‍රාමණීන් (=ගම්ප්‍රධානයන්) විසින් නැගුනු ජන්මයෙන් ම ආජානීය වූ ශීඝ්‍රවාහී සෛන්ධව වූ සැට දහසක් අශ්වයෝ වෙත් නම් ඒ සියල්ල ද හැර දමා අනගාර්‍ය්‍ය සඞ්ඛ්‍යාත සසුනෙහි (පැවිදිවීමට) නික්ම ගියෙමි.

4132. ඔසවන ලද ධජ ඇති සන්නද්ධ වූ දිවිසමින් වළඳන ලද රථ ද ව්‍යාඝ්‍රසමින් වළඳන ලද රථදැයි මෙසේ සැටදහසක් රථයෝ වූවාහු ද, ඒ සියල්ල හැර දමා (අනගාර්‍ය්‍ය සඞ්ඛ්‍යාත) සසුනෙහි පැවිදි වීමි.

4133. (කිරි වැගිරෙන බැවින් නිතර ම බුරුලුවල) ලොහො බඳුන් දරන සියලු සැටදහසක් දෙන්නු වෙත් ද, ඒ දෙනුන් ද හැර දමා (අනගාර්‍ය්‍ය සඞ්ඛ්‍යාත) සසුනෙහි පැවිදි වීමි.

4134. සට්ඨිඉත්ථිසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
විචිත්තවත්ථාභරණා ආමුත්තමණිකුණ්ඩලා.

4135. අළාරපම්හා හසුලා සුසඤ්ඤා තනුමජ්ඣිමා,
තා හිත්වා කන්දමානායො පබ්බජිං අනගාරියං.

4136. සට්ඨිගාමසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
ඡඩ්ඩයිත්වාන තං රජ්ජං පබ්බජිං අනගාරියං.

4137. නගරා නික්ඛමිත්වාන හිමවන්තමුපාගමිං,
භාගීරථීනදීතීරෙ අස්සමං මාපයිං අහං.

4138. පණ්ණසාලං කරිත්වාන අග්ග්‍යාගාරං අකාසහං,
ආරද්ධවීරියො පහිතත්තො වසාමි අස්සමෙ අහං.

4139. මණ්ඩපෙ රුක්ඛමූලෙ වා සුඤ්ඤාගාරෙ ව ඣායතො,
න තු විජ්ජති තාසො මෙ න පස්සෙ භයභෙරවං.

4140. සුමෙධො නාම සම්බුද්ධො අග්ගො කාරුණිකො මුනි,
ඤාණාලොකෙන ජොතන්තො ලොකෙ උප්පජ්ජි තාවදෙ.

4141. මම අස්සමසාමන්තා යක්ඛො ආසි මහිද්ධිකො,
බුද්ධසෙට්ඨම්හි උප්පන්නෙ ආරොචෙසි මමං තදා.

4142. “බුද්ධො ලොකෙ සමුප්පන්නො සුමෙධො නාම චක්ඛුමා,
තාරෙති ජනතං සබ්බං තම්පි සො තාරයිස්සති.

4143. යක්ඛස්ස වචනං සුත්වා සංවිග්ගො ආසි තාවදෙ,
බුද්ධො බුද්ධොති චින්තෙන්තො අස්සමං පටිසාමයිං.

4144. අග්ගිදාරුඤ්ච ඡඩ්ඩෙත්වා සංසාමෙත්වාන සන්ථතං,
අස්සමං අභිවන්දිත්වා නික්ඛමිං විපිනා අහං.

4145. තතො චන්දනමාදාය ගාමා ගාමං පුරා පුර ,
දෙවදෙවං ගවෙසන්තො උපගච්ඡිං විනායකං.

4146. භගවා තම්හි සමයෙ සුමෙධො ලොකනායකො,
චතුසච්චං පකාසෙන්තො බොධෙති ජනතං බහුං.

4147. අඤ්ජලිම්පග්ගහෙත්වාන සීසෙ කත්වාන චන්දනං,
සම්බුද්ධං අභිවාදෙත්වා ඉමා ගාථා අභාසහං:

4148. “වස්සිකෙ පුප්ඵමානම්හි සන්තිකෙ උපවායති,
ත්වං වීර ගුණගන්ධෙන දිසා සබ්බා පවායසි.

4149. චම්පකෙ නාගවනිකෙ අතිමුත්තකකෙතකෙ,
සාලෙසු පුප්ඵමානෙසු අනුවාතං පවායති.

4134 - 4135. මැනැවින් අලඞ්කාර කරණ ලද සැටදහසක් ස්ත්‍රීහු විසිතුරු වස්ත්‍රාභරණ ඇත්තාහු පළඳින ලද මිණිකොඬොල් ඇත්තාහු දිග ඇසිපිය ඇත්තාහු සිනා සහිත වූවාහු සිහිනිඟ ඇත්තාහු (වෙත් ද), හඬත්තාවූ ඒ ස්ත්‍රීන් හැර සසුනෙහි පැවිදි වීමි.

4136. සියල්ලෙන් සම්පූර්ණ වූ සැට දහසක් ගම් ද ඒ රාජ්‍යය ද හැරපියා සසුනෙහි පැවිදි වීමි.

4137. මම නගරයෙන් නික්ම හිමවතට එළඹියෙමි. භාගීරථී ගංඉවුරෙහි අසපුවක් කෙළෙමි.

4138. මම පන්සලක් ද කොට ගිනිහල් ගෙයක් ද කෙළෙමි. මම පටන් ගන්නා ලද වීර්‍ය්‍ය ඇත්තෙම් (කාය ජීවිත නිරපෙක්‍ෂක ව) භාවනාවට යොමු කළ සිත් ඇත්තෙම් ඒ අසපුවෙහි වෙසෙමි.

4139. ලියමඬුවෙක්හි හෝ රුක්මුලක හෝ හිස් ගෙයක හෝ ධ්‍යාන කරන්නා වූ මට තැති ගැණීමෙක් නැත. බිය උපදවන අරමුණක් නො දකිමි.

4140. අග්‍රකාරුණික වූ මෛත්‍රෙය්‍යගුණ යුත් සුමෙධ නම් සර්‍වඥ තෙමේ ඥානාලොකයෙන් බබලමින් එකෙණෙහි ලොව පහළ විය.

4141. මාගේ අසපුව හාත්පස මහාසෘද්ධි ඇති යක්‍ෂයෙක් විය. (හෙ තෙම) බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ ලොව පහළ වූ කල්හි මට දන්වීය:

4142. "සුමෙධ නම් වූ පසැස් ඇති බුදුරජ තෙම ලොව පහළ විය. හෙතෙම සියලු ජනසමූහයා සසර සයුරින් එතර කරයි. ඔබ ද එතෙර කරවන්නේ ය" (කියා යි.)

4143. යක්‍ෂයාගේ වචනය අසා එකෙණෙහි (ප්‍රීතියෙන්) සැලුනෙම් වීමි. බුදුරජ, බුදුරජ යයි සිතමින් අසපුව පිළියෙල කෙළෙමි.

4144. ගිනි දර බැහැර කොට ඇතිරිලි පිළියෙල කොට තබා අසපුවට වැඳ මම මහවනයෙන් නික්මීමි.

4145. ඒ වනයෙන් සඳුන් ගෙණ ගමින් ගමට ද නගරයෙන් නගරයට ද විනායක වූ බුදුරජුන් සොයමින් (උන්වහන්සේ වෙත) ගියෙමි.

4146. එසමයෙහි ලොකනායක වූ සුමෙධ භාග්‍යවත් තෙමේ චතුස්සත්‍යය දෙශනා කරමින් බොහෝ ජනසමූහයාට ධර්මාවබොධය කරවයි.

4147. මම ඇඳිලි බැඳ හිසෙහි සඳුන් (තවරා සම්බුදුරජුන් වැඳ මේ ගාථාවන් කීමි:

4148. "දූසමන් පිපෙන කල්හි සමීපයෙහි (=අවට) සුවඳ හමයි. (එසේ ම) වීරයන් වහන්ස, ඔබ ගුණ සුවඳින් සියලු දිගුන් හමවති ය.

4149. සපු, නා කෝබු වැටකේ සල් යන මෙකී මල් පිපෙන කල්හි සුළඟ අනුව සුවඳ හමා යෙයි.

4150. තව ගන්ධං සුණිත්වාන හිමවන්තා ඉධාගමිං,
පූජෙමි තං මහාවීර ලොකජෙට්ඨ මහායස.

4151. වරචන්දනෙනා’නුලිම්පිං සුමෙධං ලොකනායකං,
සකං චිත්තං පසාදෙත්වා තුණ්හී අට්ඨාසි තාවදෙ.

4152. සුමෙධො නාම භගවා ලොකජෙට්ඨො නරාසභො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

4153. “යො මෙ ගුණෙ පකිත්තෙසි චන්දනඤ්ච අපූජයී,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

4154. ආදෙය්‍යවාක්‍යවචනො බ්‍රහ්මා උජු පතාපවා,
පඤ්චවීසතිකප්පානි සප්පභාසො භවිස්සති.

4155. ඡබ්බීසතිකප්පසතෙ දෙවලොකෙ රමිස්සති,
සහස්සක්ඛත්තුං රාජා ච චක්කවත්තී භවිස්සති.

4156 තෙත්තිංසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

4157. තතො චුතා’යං මනුජො මනුස්සත්තං ගමිස්සති,
පුඤ්ඤකම්මෙන සංයුත්තො බ්‍රහ්මබන්ධු භවිස්සති

4158. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදාන පාරගූ,
තිලක්ඛණෙන සම්පන්නො බාවරී නාම බ්‍රාහ්මණො.

4159. තස්ස සිස්සො භවිත්වාන හෙස්සති මන්තපාරගූ,
උපගන්ත්වාන සම්බුද්ධං ගොතමං සක්‍යපුඞ්ගවං.

4160. පුච්ඡිත්වා නිපුණෙ පඤ්හෙ භාවයිත්වාන අඤ්ජසං[1].
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සත’නාසවො.”

4161. තිවිධග්ගී නිබ්බුතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

4162. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4163. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4164. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා තොදෙය්‍යො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

තොදෙය්‍යත්ථෙරස්ස අපදානං අට්ඨමං.

1. මානසං, සතා.

4150. (එසේ ම) ඔබ වහන්සේගේ (ගුණ) සුවඳ ආඝ්‍රාණය කොට හිමවතෙහි සිට (මෙහි) ආමි. ලොකජ්‍යෙෂ්ඨයන් වහන්ස, මහත් යසස් ඇත්තානන් වහන්ස, මහාවීරයානන් වහන්ස, ඔබ වහන්සේ පුදමි.

4151. සුමෙධ නම් ලොකනායකයන් උතුම් සඳුනෙන් ආලෙප කෙළෙමි. එකෙණෙහි (ඒ බුදුරජ තෙම) සියසිත පහදවා නිශ්ශබ්දව සිටියේ ය.

4152. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ සුමෙධ නම් භාග්‍යවත් තෙමේ භික්ෂුසඞ්ඝයා මැද හිඳ මේ ගාථාවන් වදාළේ ය:

4153. "යමෙක් මාගේ ගුණ කීර්තනය කෙළේ ද, සඳුනෙන් පිදී ද, හේ කවරෙක්දැයි මම ප්‍රකාශ කරන්නෙමි (එසේ) පවසන්නා වූ මාගේ වචනය අසවු.

4154. (මෙ තෙම) සියල්ලන් විසින් පිළිගතයුතු වචන ඇත්තේ, ශ්‍රෙෂ්ඨ වූයේ, ඍජු වූයේ ප්‍රතාපවත් වූයේ වේ. පස්විසි කපක් මුළුල්ලෙහි ප්‍රභා සහිත වූවෙක් වන්නේ ය.

4155. කප් සවිසි සියයක් හෙවත් දෙදහස් හසිය කපක් මුළුල්ලෙහි දෙව්ලොව සිත් අලවා වසන්නේ ය. දහස් වරක් සක්විතිරජ වන්නේ ය.

4156. ශක්‍රදෙවෙන්ද්‍ර ව තෙතිස් වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. (ලබන්නා වූ) මහත් වූ ප්‍රදෙශ රාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නො හැකිය.

4157. මේ මිනිස් තෙමේ එයින් චුත වූයේ මිනිසත්බවට යන්නේ නම්, (මේ) පුණ්‍යකර්මය හා යෙදුනේ බ්‍රාහ්මණයෙක් වන්නේ ය.

4158. වේද හඳුරන්නා වූ, මන්ත්‍ර දරන්නා වූ වෙදත්‍රයෙහි පරතෙරට ගියා වූ ලක්ෂණත්‍රයකින් යුක්ත වූ බාවරී නම් බමුණෙක් වන්නේය.

4159. (මෙතෙම) ඒ බාවරි බමුණාගේ ශිෂ්‍යයෙක් ව මන්ත්‍රශාස්ත්‍රයෙහි පරතෙරට ගියේ ශාක්‍යකුලශ්‍රෙෂ්ඨ වූ ගෞතම බුදුරජුන් වෙත එළඹ-

4160. තියුණු ප්‍රශ්න විචාරා මාර්ගය වඩා සියලු ආස්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආස්‍රව රහිතව පිරිනිවන් පාන්නේ ය (කියායි)

4161. මාගේ ත්‍රිවිධාග්නීහු නිවී ගියහ. සියලු භවයෝ නසන ලදහ. සියලු ආස්‍රවයන් (ප්‍රහාණ පරිඥා වශයෙන්) දැන ආස්‍රව රහිතව වෙසෙමි.

4162. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත වූයෙම් වෙසෙමි.

4163. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

4164. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙහි මේ අයුරින් ආයුෂ්මත් තොදෙය්‍ය ස්ථවිරයන් වහන්සේ මෙ ගාථාවන් වදාළ සේක් යි.

තොදෙය්‍ය ස්ථවිරාවදානය අටවැනි යි.

409 ජතුකණ්ණිත්ථෙරාපදානං.

4165. නගරෙ හංසවතියා සෙට්ඨිපුත්තො අහොසහං,
සමප්පිතො කාමගුණෙ පරිවාරෙමහං තදා.

4166. තයො[1] පාසාදමාරුය්හ උබ්බිද්ධා ගෙහලඤ්ජකා[2]
තත්ථ නච්චෙහි ගීතෙහි පරිවාරෙමහං තදා.

4167. තුරියා ආහතා මය්හං සම්මතාලසමාහිතා,
නච්චන්තා[3] ඉත්ථියො සබ්බා හරන්ති යෙව මෙ මනො.

4168. වෙලාපිකා ලාමණිකා කුඤ්ජවාසී තිමජ්ඣිකා[4]
ලඞ්ඝිකා සොකජ්ඣායී[5] ච පරිවාරෙන්ති මං සදා.

4169. වෙතාලිනො කුම්භථූනී නටා ච නච්චකා බහූ,
නටකා නාටකා චෙව පරිවාරෙන්ති මං සදා.

4170. කප්පකා නහාපකා සූදා මාලාකාරා සුමාපකා,[6]
ජල්ලා මල්ලාති සබ්බෙව[7] පරිවාරෙන්ති මං සදා.

4171. එතෙසු කීළමානෙසු සික්ඛිතෙ කතුපාසනෙ,
රත්තින්දිවං න ජානාමි ඉන්දොව තිදසඞ්ගණෙ.

4172. අද්ධිකා පථිකා සබ්බෙ යාචකා වරකා බහූ,
උපගච්ඡන්ති තෙ නිච්චං භික්ඛයන්තා මමං ඝරං.

4173. සමණා බ්‍රාහ්මණා චෙව පුඤ්ඤක්ඛෙත්තා අනුත්තරා,
වඩ්ඪයන්තා මමං පුඤ්ඤං ආගච්ඡන්ති මමං ඝරං.

4174. පටකා ලටකා[8] සබ්බෙ නිගණ්ඨා පුප්ඵසාටකා,
තෙදණ්ඩිකා එකසිඛා ආගච්ඡන්ති මමං ඝරං.

4175. ආජීවකා විලුත්තාවී ගොධම්මා දෙවධම්මිකා,
රජොජල්ලධරා එතෙ ආගච්ඡන්ති මමං ඝරං.

4176. පරිවත්තකා සිද්ධිපත්තා[9] කොණ්ඩපුග්ගණිකා[10] බහූ,
තපස්සී වනචාරී ච ආගච්ඡන්ති මමං ඝරං.

4177. ඔඩ්ඩකා දමිළා චෙව සාකුළා මලයාළකා,
සබරා[11] යොනකා චෙව ආගච්ඡන්ති මමං ඝරං.

4178. අන්ධකා මුණ්ඩකා සබ්බෙ කොලකා සානුවින්දකා,[12]
ආරාවචීනරට්ඨා ච ආගච්ඡන්ති මමං ඝරං.

---

1. තතො, මජසං. 2. මහාභොගෙ වලඤ්ජකො, මජසං.
3. රඤ්ජන්ති, ස්‍යා. 4. වාමනිකා ස්‍යා. 5. කුඤ්ජවා සීහිමජ්ඣිතා, ස්‍යා.
6. සූපාසකා, මජසං. 7 ජල්ලා මල්ලා ච එතෙ සබ්බෙ, මජසං.
8. පටගා, මජසං. 9. පරිත්තකා සන්තිපත්තා, මජසං.
10. කොටපුත්තනිකා, මජසං. 11. සවරා, මජසං 12. සනුවින්දකා, මජසං.

409. ජතුකණ්ණී සථවිරාවදානය

4165. මම හංසවතී නගරයෙහි සිටුපුත්‍රයෙක් වීමි. එකල්හි මම (සියලු) කාමගුණයන්හි යෙදුනෙම් පිනායමි.

4166. ගෙවල් ලකුණු දත්තෝ (ප්‍රාසාදතුණක්) ගොඩනැගූහ. ඒ තුන්පනයට නැගී එකල්හි එහි නෘත්‍යයන්ගෙන් ද, ගීතයන්ගෙන් ද පිනායමි.

4167. මට කුළුතාලම් ආදියෙන් යුත් තූර්‍යයෝ වයන ලදහ. සියලු සත්‍රීහු නටන්නාහු මාගේ සිත පැහැර ගණිත් ම ය.

4168. පිළී භිස සිසාරන්නෝ ද අඟුටුම්පිතැටුම් නටන්නෝ ද, කුදු වූවන් මෙන් නටන්නෝ ද, සිහදෙනකගේ මෙන් මැද දෙදෙස පෙන්වමින් නටන්නෝ ද, උඩට මතුවෙමින් නටන්නෝ ද, උසුළු – විසුළු පාමින් නටන්නෝ ද හැම කල්හි මා පිරිවරත්.

4169. සනතාලම්පොට ගසන්නෝ ද, කුම්භද්‍රන නම් එක් මුහුණින් යුත් තූර්‍ය විශේෂය වයන්නෝ ද, (රූකඩ) නටවන්නෝ ද, නටන්නෝ ද යන මොහු බොහෝ වෙති. මෙසේ නැටුම් නටවන්නෝ හා නටන්නෝ හැම කල්හි මා පිරිවරත්.

4170. කරණැවැම්යෝ ද, දියවඩන්නෝ ද, අරක්කැමියෝ ද, මල්-කරුවෝ ද, මැකැච්ත් පසැට කෙළින්නෝ ද, පොර බදන්නෝ ද, මුෂ්ටි යුද්ධකරන්නෝ ද යන මෙකී සියල්ලෝ හැම කල්හි ම මා පිරිවරත්.

4171. (ශිල්පයන්හි) හික්මුනා වූ පලපුරුදුකම් ඇති මොවුන් ක්‍රීඩා කරණ කල්හි තව්තිසාවෙහි ශක්‍රයා මෙන් රෑ දාවල් නො දනිමි.

4172. දීඝිමාගීයට පිළිපන්නෝ ද, මගියෝ ද, යාචකයෝ ද (තැනක් නියමයක් නො මැතිව) ඇවිදින්නෝ ද යන බොහෝ වූ මොහු නිතර ඉල්ලමින් මාගේ ගෙට පැමිණෙත්.

4173. නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ ශ්‍රමණයෝ ද, බ්‍රාහ්මණයෝ ද, මාගේ පින වැඩි කරන්නාහු මාගේ ගෘහයට පැමිණෙත්.

4174. පටක ය, ලටක ය, පුපඵසාටක ය, තෙදණ්ඩික ය, එකසිඛ ය, යන සියලු තිගණ්ඨයෝ මාගේ ගෘහයට පැමිණෙත්.

4175. විලුත්තාවී ය, ගොඩමම ය, දෙවධම්මික ය. රජොජල්ලධර ය, යන මේ ආජීවකයෝ මාගේ ගෘහයට පැමිණෙත්.

4176. පරිවත්තක ය සිද්ධිපත්ත ය යන තවුසෝ ද, කොණ්ඩ, පුගග-ණික යන බොහෝ ව්‍රතචාරීහු ද මාගේ ගෘහයට පැමිණෙත්.

4177. ඔඩ්ඩක ය, දමිල ය, සාකුල ය, මලයාලක ය. සබර ය, යොනක ය යන මොහු මාගේ ගෘහයට පැමිණෙත්.

4178. අන්ධකයෝ ද, මුණ්ඩකයෝ ද, කොලකයෝ ද, සානුවින්දකයෝ ද, ආරාවචීනරට්ඨ්‍රිකයෝ ද යන මේ සියල්ලෝ මාගේ ගෘහයට පැමිණෙත්.

4179. අලසන්දකා පල්ලවකා බබ්බරා භග්ගකාරුසා,[1]
රොහිතා[2] චෙතපුත්තා ච ආගච්ඡන්ති මමං සරං.

4180. මාධුරකා කොසලකා කාසිකා[3] හත්ථිපොරිකා,
ඉසිණ්ඩා මක්කලා චෙව ආගච්ඡන්ති මමං සරං.

4181. චෙලාවකා අරම්මා ච ඔක්කලා[4] මෙසලා[5] බහූ,
ඛුද්දකා සුද්දකා චෙව ආගච්ඡන්ති මමං සරං.

4182. රොහණා සින්ධවා චෙව චිතකා එකකණ්ණිකා,
සුරට්ඨා අපරන්තා ච ආගච්ඡන්ති මමං සරං.

4183. සුප්පාරකා කිකුමාරු[6] මලයා[7] සොණ්ණභූමිකා,
වජ්ජී තාරු[8] ච තෙ සබ්බෙ ආගච්ඡන්ති මමං සරං

4184. නළකාරා පෙසකාරා චම්මකාරු ච තච්ඡකා,
කම්මාරා කුම්භකාරා ච ආගච්ඡන්ති මමං සරං.

4185. මණිකාරා ලොහකාරා සොණ්ණකාරා ච දුස්සිකා,
තිපුකාරා ච තෙ සබ්බෙ ආගච්ඡන්ති මමං සරං.

4186. උසුකාරා භමකාරා පෙසකාරා ච ගන්ධිකා,
රජකා තුන්නවායා ච ආගච්ඡන්ති මමං සරං.

4187. තෙලිකා කට්ඨහාරා ච උදහාරා ච පෙස්සිකා,
සූපිකා සූපරක්ඛා ච ආගච්ඡන්ති මමං සරං.

4188. දොවාරිකා අණීකට්ඨා වන්දිකා[9] පුප්ඵඡඩ්ඩකා,
හත්ථාරුහා හත්ථිපාලා ආගච්ඡන්ති මමං සරං.

4189. ආනන්දස්ස මහාරඤ්ඤො[10] පමත්තස්ස[11] අදාසහං,
සත්තවණ්ණෙන රතනෙන ඌනත්තං[12] පූරයාමහං.

4190. යෙ මයා කිත්තිතා සබ්බෙ නානාවණ්ණා බහුජ්ජනා,
තෙසා'හං චිත්තමඤ්ඤාය තප්පසිං රතනෙන'හං.

4191. වග්ගූසු භාසමානාසු වජ්ජමානාසු භෙරිසු,
සංඛෙසු ධමයන්තෙසු සකගෙහෙ රමාමහං.

1. ධම්මරනිග්ගමානුසා, මජසං 2. ගෙහිකා, මජසං,
3. කාලිඩගා, මජසං 4. ආරබ්භා, මජසං 5. ඔඤ්ඤුලා, මජසං.
6. කුමාරා, මජසං. 7. මල්ල, මජසං. 8. තඩගා, මජසං.
9. බන්ධිකා, මජසං. ගන්ධිකා, සයා. සන්දිකා, PTS.
10 ආනන්දස්ස නාම රඤ්ඤො, සයා. අරින්දමනාමරඤ්ඤො, PTS.
11 මමත්තස්ස, මජසං. සමග්ගස්ස, සයා. 12. ඌනත්ථං, මජසං.

4179. අලසන්දකයෝ ද, පල්ලවකයෝ ද, බබ්බරයෝ ද, භග්ගකාරු-සයෝ ද, රෝහිතයෝ ද, චේතපුත්තයෝ ද මාගේ ගෘහයට පැමිණෙත්.

4180. මාධුරකයෝ ද, කොසලකයෝ ද, කාසිකයෝ ද, හත්ථිපොරිකයෝ ද, ඉසිණ්ඩයෝ ද, මක්කලයෝ ද මාගේ ගෘහයට පැමිණෙත්.

4181. චෙලාවකයෝ ද, අරම්මයෝ ද, ඔක්කලයෝ ද, මෙඛලයෝ ද, ඛුද්දකයෝ ද, සුද්දකයෝ ද යන බොහෝ දෙන මාගේ ගෘහයට පැමිණෙත්.

4182. රෝහණයෝ ද, සින්ධවයෝ ද, චිතකයෝ ද, එකකණ්ණිකයෝ ද, සුරට්ඨයෝ ද, අපරන්තයෝ ද මාගේ ගෘහයට පැමිණෙත්.

4183. සුප්පාරකයෝ ද, කිකුමාරයෝ ද, මලයයෝ ද, සොණ්ණභූමිකයෝ ද, වජ්ජීහු ද, තාරාවෝ ද යන මේ සියල්ලෝ මාගේ ගෘහයට පැමිණෙත්.

4184. නළකාරයෝ ද, (රෙදි වියන) පෙසකාරයෝ ද, (සම් වැඩ කරණ) චම්මකාරයෝ ද, වඩුවෝ ද, කම්මාරයෝ ද, කුම්භකාරයෝ ද මාගේ ගෘහයට පැමිණෙත්

4185. (මිණිකම් කරණ) මණිකාරයෝ ද, (ලොහො කම් කරණ) ලොහකාරයෝ ද, (රන් කම් කරණ) සොණ්ණකාරයෝ ද, (රෙදි කම් කරණ) දුස්සිකයෝ ද, (ඊයම් කම් කරණ) තිපුකාරයෝ ද යන මේ සියල්ලෝ මාගේ ගෘහයට පැමිණෙත්.

4186. (ඊ කම් කරණ) උසුකාරයෝ ද, (ලියන වඩු කම් කරණ) භමකාරයෝ ද, (රෙදි වියන) පෙසකාරයෝ ද, (සුවඳ සාදන හෝ විකුණන) ගන්ධිකයෝ ද, (රෙදි සෝදන පොවන) රජකයෝ ද, (රෙදි මහන) තුන්න-වායෝ ද මාගේ ගෘහයට පැමිණෙත්.

4187. (තෙල් සාදන හෝ විකුණන) තෙලිකයෝ ද, (දර අදින) කට්ඨහාරයෝ ද, (ජලය අදින) උදකහාරයෝ ද, පණිවුඩ ගෙන යන), පෙස්සිකයෝ ද, (සූපසාදන) සූපිකයෝ ද, (සූප රකින) සූපරක්ඛයෝ ද මාගේ ගෘහයට පැමිණෙත්.

4188. (දොරටුපාල) දොවාරිකයෝ ද, බලඇණි රක්නෝ ද, (තුතිපැවසුම් කරණ) වන්දිකයෝ ද, (ගැබ්මල ආදිය බැහැර ලන) පුප්ඵ-ඡඩ්ඩකයෝ ද, (ඇතුන් පිට නගින) හත්ථාරුහයෝ ද, (ඇතුන් බලන) හත්ථිපාලයෝ ද මාගේ ගෘහයට පැමිණෙත්.

4189. ප්‍රමාදී වූ ආනන්ද මහරජුට මම ධනය දුනිමි. මම සත්රුවනින් ඔහුගේ අඩුබැව් පුරවමි.

4190. මා විසින් මෙහි පවසන ලද ඒ සියල්ලෝ නානා ජාතිවලට අයත් බොහෝ දෙන වෙති. මම ඔවුන්ගේ සිත් දැන රුවනින් සන්තර්පණය කෙළෙමි.

4191. මිහිරිවදන් කියන කල්හි බෙර වයන කල්හි සක් පිඹින කල්හි මම සවකීය ගෘහයෙහි සිත් අලවා වෙසෙමි.

4192. භගවා තම්හි සමයෙ පදුමුත්තරනායකො,
වසීසතසහස්සෙහි පරික්ඛීණාසවෙහි සො

4193. භික්ඛූහි සහිතො වීථිං පටිපජ්ජිත්ථ චක්ඛුමා,
ඔභාසෙන්තො දිසා සබ්බා දීපරුක්ඛො'ව ජොතති.

4194. වජ්ජන්ති භෙරියො සබ්බා ගච්ඡන්තෙ ලොකනායකෙ,
පභා නිද්ධාවතෙ තස්ස සතරංසීව උග්ගතො.

4195. කවාටන්තරිකායාපි පවිට්ඨෙන ච රංසිනා,[1]
අන්තොඝරෙ සුවිපුලො ආලොකො ආසි තාවදෙ.

4196. පභං දිස්වාන බුද්ධස්ස පාරිසජ්ජෙ අවොචහං,
නිස්සංසයං බුද්ධසෙට්ඨො ඉමං වීථිමුපාගතො.

4197. ඛිප්පං ඔරුය්හ පාසාදා අගමිං අන්තරාපණං,
සම්බුද්ධමභිවාදෙත්වා ඉදං වචනමබ්‍රවිං:

4198. අනුකම්පතු මෙ බුද්ධො ජලජුත්තමනායකො,
වසීසතසහස්සෙහි අධිවාසෙසි සො මුනි.

4199. නිමන්තයිත්වා[2] සම්බුද්ධං අභිනෙසිං සකං ඝරං,
තත්ථ අන්නෙන පානෙන සන්තප්පෙසිං මහාමුනිං.

4200. භුත්තාවිං කාලමඤ්ඤාය බුද්ධසෙට්ඨස්ස තාදිනො,
සතඞ්ගිකෙන තුරියෙන බුද්ධසෙට්ඨං උපට්ඨහිං.

4201. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
අන්තොඝරෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

4202. "යො මං තුරියෙහුපට්ඨාසි අන්නපානඤ්ච' දාසි මෙ,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

4203. පහූතභක්ඛො හුත්වාන සහිරඤ්ඤසභොජනො,
චතුදීපෙ එකරජ්ජං කාරයිස්සත' යං නරො.

4204. පඤ්චසීලෙ සමාදාය දසකම්මපථෙ තතො,
සමාදාය පවත්තෙන්තො පරිසං සික්ඛාපෙස්සති[3].

4205. තුරියසතසහස්සානි නාරියො[4] සමලඞ්කතා,
වජ්ජයිස්සන්ති'මං නිච්චං උපට්ඨානස්සිදං ඵලං.

4206. තිංසකප්පසහස්සානි දෙවලොකෙ රමිස්සති,
චතුසට්ඨික්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සති.

1. රංසිතා, මඡසං. 2. නිමන්තෙත්වාන, මඡසං. 3. සික්ඛාපයිස්සති, මඡසං.
4. භෙරියො, මඡසං.

4192. 4193. එසමයෙහි භාග්‍යවත් වූ ඒ පදුමුත්තර බුදුරජ තෙමේ ක්ෂය කල ආස්‍රවයන් ඇති රහත් භික්ෂූන් ලක්ෂයක් සමග වීථියට පිළිපන්නේ ය. පසැස් ඇති සම්බුදු තෙම සියලු දිගුන් ආලෝකවත් කරමින් ප්‍රදීප වෘක්ෂයක් මෙන් බබළයි.

4194. බුදුරජුන් වඩින කල්හි සියලු භෙරිහු වාදනය වෙත්. උදා වූ හිරු මෙන් උන් වහන්සේගේ රස් විහිදෙයි.

4195. කවුළු අතරින් පිවිසි රසින් ඇතුළු ගෙහි ද එකොණහි මහත් වූ ආලෝකයෙක් විය.

4196. මම බුදුරජුන්ගේ රස් දැක පිරිසට මෙසේ කීමි. (කෙසේ ද යත්?) "නිසැකව බුද්ධශ්‍රෙෂ්ඨ තෙම මේ වීථියට එළඹියේ ය" (කියා යි.)

4197. වහා පහයෙන් බැස ඇතුළු වීථියට ආයෙමි. සම්බුදු රජුන් වැඳ මේ වචනය ද කීමි:

4198. "පදුමුත්තර නම් වූ බුදුරජානන් වහන්සේ මට අනුකම්පා කරණ සේක්වා" යනුයි. ඒ බුදුරජතෙම ලක්ෂයක් රහතුන් සමග ඒ ආරාධනය පිළිගත්තේ ය.

4199. සම්බුදු රජුන් පවරා ස්වකීය ගෘහයට වැඩම කර වීමි. එහි ආහාරපානයෙන් බුදුරජුන් වැළඳවීමි.

4200. වළඳා අවසන් වූ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ (දැක) සුදුසු කලැයි දැන තාදීගුණ ඇති ඒ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට ශතාඞ්ගික තූර්‍ය්‍යයන්ගෙන් උවටැන් කෙළෙමි.

4201. ලෝකයාගේ පූජාවන් පිළිගන්නා වූ පදුමුත්තර බුදුරජ තෙම ඇතුළුගෙහි හිඳ මේ ගාථාවන් වදාළේ ය:

4202. "යමෙක් තූර්‍ය්‍යයන්ගෙන් මට උවටැන් කෙළේ ද, මට ආහාර පානයන් දුන්නේ ද, හේ (කවරෙක්දැයි) මම කියන්නෙමි. (එසේ) කියන්නා වූ මාගේ වචනය අසවු.

4203. රැස් කල සමපත් අනුභව කරන්නෙක් ව අමුරන් සහිතව බොජුන් සහිතව මේ මිනිස් තෙම සිවුමහදිවයිනෙහි එකාතපත්‍ර කොට රාජ්‍යය කරවන්නේ ය.

4204. පන්සිල් සමාදන් ව ඉක්බිති දශකම්පථයන් ද සමාදන් ව පවත්වමින් පිරිස හික්ම වන්නේ ය.

4205 මැනවින් අලඞ්කාර කරණ ලද සත්‍රිහු නිතර තූර්‍ය්‍යයන් ලක්ෂයක් වාදනය කරන්නාහු ය.

4206. කල්ප තිස්දහසක් දෙව්ලොව සිත් අලවා වසන්නේ ය. සූසැට වරක් ශක්‍රදෙවෙන්‍ද්‍ර ව දිව්‍යරාජ්‍යය කරන්නේ ය.

4207. චතුසට්ඨික්ඛත්තුං රාජා ච චක්කවත්තී භවිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

4208. කප්පසතසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

4209. උපපජ්ජති යං යොනිං දෙවත්තං අථ මානුසං,[1]
අනූනභොගො හුත්වාන මනුස්සත්තං ගමිස්සති.

4210. අජ්ඣායකො භවිත්වාන තිණ්ණං වෙදාන පාරගූ,
උත්තමත්ථං ගවෙසන්තො චරිස්සති මහිං ඉමං.

4211. සො පච්ඡා පබ්බජිත්වාන සුක්කමූලෙන චොදිතො,
ගොතමස්ස භගවතො සාසනෙ'භිරමිස්සති.

4212. ආරාධයිත්වා[2] සම්බුද්ධං ගොතමං සක්‍යපුඞ්ගවං,
කිලෙසෙ ඣාපයිත්වාන අරහා'යං භවිස්සති.

4213. විපිනෙ ව්‍යග්ඝරාජාව මිගරාජාව කෙසරී,
අභීතො විහරාම'ජ්ජ සක්‍යපුත්තස්ස සාසනෙ.

4214. දෙවලොකෙ මනුස්සෙ වා දලිද්දෙ දුග්ගතිම්හි වා,
නිබ්බත්තිං මෙ න පස්සාමි උපට්ඨානස්සිදං ඵලං.

4215. විවෙකමනුයුත්තොම්හි උපසන්තො නිරූපධි,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4216. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4217. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4218. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා ජතුකණ්ණිත්ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ජතුකණ්ණිත්ථෙරස්ස අපදානං නවමං.

1. ගොත්තෙන, මජසං. 2. ආරාධයිත්වාන, මජසං.

4207. සුසැට වරක් සක්විතිරජ වන්නේ ය. (ලබන) මහත් වූ ප්‍රදෙශ රාජ්‍යය ගණනින් වශයෙන් ගිණිය නොහැකි ය.

4208. මෙයින් කල්පලක්‍ෂයකින් මතුයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

4209. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යොනියක උපදින්නේ නම්, අනූන වූ භොග සම්පත් ඇත්තේ ම මිනිසත්බවට පැමිණෙන්නේ ය.

4210. වෙද හදුරන්නෙක් ව වෙදත්‍රයෙහි පරතෙරට ගියේ උත්තමාර්‍ථය වූ (නිවන) සොයමින් මේ පෘථිවියෙහි හැසිරෙන්නේ ය.

4211. කුශලමූලයෙන් මෙහෙයන ලද හෙතෙම පසුව පැවිදිව ගෞතම බුදුරජුන්ගේ සසුනෙහි සිත් අලවා වසන්නේ ය.

4212. මෙතෙම ශාක්‍යකුල ශ්‍රෙෂ්ඨ වූ ගෞතම බුදුරජුන් සතුටු කොට කෙලෙස් දවා රහත් වන්නේ ය.

4213. මහවනයෙහි ව්‍යාඝ්‍රයකු මෙන් ද, කෙශරසිංහ රාජයකු යකු මෙන් ද, අද ශාක්‍යපුත්‍ර වූ බුදුරජානන් වහන්සේගේ සසුනෙහි නිර්භීතව වෙසෙමි.

4214. දෙව්ලොව වුව ද මිනිස්ලොව වුව ද දිළිඳුබැව්හි හෝ දුගතියක හෝ මාගේ ඉපදීමක් නො දකිමි. (බුදුරජුන්ට) උවැටන් කිරීමේ මේ විපාක යි.

4215. සත්හුත් වූයෙම් උපධි රහිත වූයෙම් විවෙකයෙහි යෙදුනෙම් වෙමි. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වසමි.

4216. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ . ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4217. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

4218. සිවුපිළිසිඹියාවෝ ද, අෂ්ට විමොක්‍ෂයෝ ද, ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මේ අයුරින් ආයුෂමත් ජතුකණ්ණි ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සී.

ජතුකණ්ණි ස්ථවිරාපදානය නවවැනි සී.

410. උදෙනත්ථෙරාපදානං

4219. හිමවන්තස්ස අවිදූරෙ පදුමො නාම පබ්බතො,
අස්සමො සුකතො මය්හං පණ්ණසාලා සුමාපිතා.

4220. නදියො සන්දරෙ තත්ථ සුපතිත්ථා මනොරමා,
අච්ඡොදකා සීතජලා සුන්දරා[1] නදියො සදා.

4221. පාඨීනා පාවුසා මච්ඡා වලජා මුඤ්ජරොහිතා,
සොභෙන්තා නදියො එතෙ වසන්ති නදියා සදා.

4222. අම්බජම්බූහි සඤ්ඡන්නා කරෙරිතිලකා තථා,
උද්දාලකා පාටලියො සොභෙන්ති මම අස්සමං.

4223. අඞ්කොලකා බිම්බිජාලා මායාකාරී ච පුප්ඵිතා,
ගන්ධෙන උපවායන්තා සොභෙන්ති මම අස්සමං.

4224. අතිමුත්තා සත්තලිකා නාගා සාලා ච පුප්ඵිතා,
දිබ්බගන්ධං[2] සම්පවන්තා සොභෙන්ති මම අස්සමං.

4225. කොසම්බා සලලා නීපා අට්ඨඞ්ගා ච සුපුප්ඵිතා,
දිබ්බගන්ධං සම්පවන්තා සොභෙන්ති මම අස්සමං.

4226. හරීතකා ආමලකා අම්බජම්බු විභීටකා,
කොලා භල්ලාතකා බිල්ලා ඵලානි බහු අස්සමෙ.

4227. කලම්බා කන්දලී තත්ථ පුප්ඵන්ති මම අස්සමෙ,
දිබ්බගන්ධං සම්පවන්තා සොභෙන්ති මම අස්සමං.

4228. අසොකපිණ්ඩී චවරී[3] නිම්බරුක්ඛා ච පුප්ඵිතා,
දිබ්බගන්ධං සම්පවන්තා සොභෙන්ති මම අස්සමං.

4229. පුන්නාගා ගිරිපුන්නාගා තිමිරා තත්ථ පුප්ඵිතා,
දිබ්බගන්ධං සම්පවන්තා සොභෙන්ති මම අස්සමං.

4230. නිග්ගුණ්ඩී සිරිනිග්ගුණ්ඩී චම්පරුක්ඛෙත්ථ පුප්ඵිතා,
දිබ්බගන්ධං සම්පවන්තා සොභෙන්ති මම අස්සමං.

4231. අවිදූරෙ පොක්ඛරණී චක්කවාකූපකූජිතා,
මන්දාලකෙහි සඤ්ඡන්නා පදුමුප්පලකෙහි ච.

1. සන්දර, මජසං. 2. දිබ්බගන්ධා, සීමු. 3. අසොකපිණ්ඩිවාරී ච, මජසං.

410. උදේන සළුව්රාවදානය

4219. හිමවතට නුදුරෙහි පදුම නම් පර්වතයක් විය. එහි මට අසපුවක් මැනැවින් කරණ ලදි. පන්සල ද මැනැවින් නිමවන ලදි.

4220. මනා වූ තොට ඇති, මනොඥ වූ නදීහු එහි ගලා බසිත්. ඒ නදීහු හැම කල්හි පිරිසිදු දිය ඇත්තාහු ය. සිසිල් දිය ඇත්තාහු ය. සුන්දර ද වෙති.

4221. නදීන් හොබවන්නා වූ පාඨීන (පෙටියෝ) ද, පාවුස (ලුල්ලු) ද, වලජ (වලයෝ) ද, මුඤ්ජ (මොද්දු) ද, රොහිත (රෙහෙරු) ද, යන මත්ස්‍යයෝ හැම කල්හි නදියෙහි වසත්.

4222. අඹ දඹ රුක්වලින් වැසී ගිය නදිය ද, එසේ ම ලුනුවරණ තිලක (මදටය), උද්දාලක (ඇසළ), පාටලි (පලොල්) යන වෘක්ෂයෝ ද මාගේ අසපුව හොබවත්.

4223. පිපී ගිය අඞ්කොලක (රුක්ගුන), බිම්බිජාල, රත්කරවූ, මායාකාරී, මෙකී වෘක්ෂයන්ගේ සුවඳින් හමන වාතයෝ මාගේ අසපුව හොබවත්.

4224. මැනවින් පිපී ගිය අතිමුත්ත (යොහොඹු), සත්තලික (සත්පෙති දෑසමන්), නාග (නා), සාල (සල්) යන මොහු දිව සුවඳ විහිදුවමින් මාගේ අසපුව හොබවත්.

4225. කොසම්බ (කොසඹ), සලල (හොර), නීප (=කොලොම්), අට්ඨඞ්ග - වෘක්ෂයෝ පිපී ගියාහු දිවසුවඳ විහිදුවමින් මාගේ අසපුව හොබවත්.

4226. අරළු, නෙල්ලි, අඹ, දඹ, බුළු, ඩෙබර, බදුලු, බෙලි මෙකී ඵලයෝ අසපුවෙහි බොහෝ වෙති.

4227. කලම්බ (කොලොම්), කන්දලී (බිම් කෙහෙල්) ද එහි මාගේ අසපුවෙහි පිපෙත්. දිවසුවඳ විහිදුවමින් මාගේ අසපුව හොබවත්.

4228. අසොකපිණ්ඩී, වවරී, කොසඹ මෙකී වෘක්ෂයෝ පිපී ගියාහු දිවසුවඳ විහිදුවමින් මාගේ අසපුව හොබවත්.

4229. පුන්නාග (දෙඹ), ගිරිපුන්නාග මේ වෘක්ෂයෝ එහි පිපී ගියාහු දිවසුවඳ විහිදුවමින් මාගේ අසපුව හොබවත්.

4230. තිගගුණ්ඩි (සිරිතික), සපු මේ වෘක්ෂයෝ පිපී ගියාහු දිවසුවඳ විහිදුවමින් මාගේ අසපුව හොබවත්.

4231. අසපුවට නුදුරෙහි පොකුණ සක්වාලිහිණියන් විසින් හඬන ලද ය. හෙල්මැල්ලෙන් නොහොත් දියකන්දරයෙන්, විලපලායෙන්, පියුම් උපුල් මලින් ගැවසුනේ ය.

4232. අච්ඡොදකා සීතජලා සුපතිත්ථා මනොරමා,
අච්ඡා ඵලිකසමානා සොභෙන්ති මම අස්සමං.

4233. පදුමා පුප්ඵරෙ තත්ථ පුණ්ඩරීකා ච උප්පලා,
මන්දාලකෙහි සඤ්ඡන්නා සොභෙන්ති මම අස්සමං.

4234. පාඨීනා පාවුසා මච්ඡා වලජා මුඤ්ජරොහිතා,
විචරන්තා ච තෙ තත්ථ සොභෙන්ති මම අස්සමං.

4235. කුම්භීලා සුංසුමාරා ච කච්ඡපා ච ගහා බහූ,
ඔගුහා[1] අජගරා ච සොභෙන්ති මම අස්සමං.

4236. පාරෙවතා රවිහංසා චක්කවාකා නදීචරා,
දින්දිභා සාලිකා චෙත්ථ සොභෙන්ති මම අස්සමං.

4237. නයිතා අම්බගන්ධී ච කෙතකා තත්ථ පුප්ඵිතා,
දිබ්බගන්ධං සම්පවන්තා සොභෙන්ති මම අස්සමං.

4238. සීහා ව්‍යග්ඝා ච දීපී ච අච්ඡකොකතරච්ඡකා,
අනුසඤ්චරන්තා පවනෙ සොභෙන්ති මම අස්සමං.

4239. ජටාභාරෙන භරිතා අජිනුත්තරවාසනා,
අනුසඤ්චරන්තා පවනෙ සොභෙන්ති මම අස්සමං.

4240. අජිනානි ධරා එතෙ නිපකා සන්තවුත්තිනො,
අප්පාහාරා ච තෙ සබ්බෙ සොභෙන්ති මම අස්සමං.

4241. ඛාරිභාරං ගහෙත්වාන අජ්ඣොගය්හ වනං තදා,
මූලඵලානි භුඤ්ජන්තා වසන්ති අස්සමෙ සදා.

4242. න තෙ දාරුං ආහරන්ති උදකං පාදධොවනං,
සබ්බෙසං ආනුභාවෙන සයමෙවාහරීයති.

4243. චුල්ලාසීති සහස්සානි ඉසයෙත්ථ සමාගතා,
සබ්බෙව ඣායිනො එතෙ උත්තමත්ථගවෙසකා.

4244. තපස්සිනො බ්‍රහ්මචාරී චොදෙන්තා අප්පණාවතෙ,
අම්බරාවචරා සබ්බෙ වසන්ති අස්සමෙ තදා.

4245. පඤ්චාහං සන්නිපතන්ති එකග්ගා සන්තවුත්තිනො,
අඤ්ඤොඤ්ඤං අභිවාදෙත්වා පක්කමන්ති දිසාමුඛා.

1. ඔගහා, මජසං.

4232. පැහැදි දිය ඇති සිසිල් ජලය ඇති මනා තොට ඇති මනරම්පලිහු මෙන් පහැදිලි පුෂ්කරණී තොමෝ මාගේ අසපුව හොබවයි.

4233. එහි රත් පියුම්, හෙළ පියුම්, උපුල් ද පිපෙත්. හෙල්මැලියෙන් ගැවසී ගත් ඒ පුෂ්කරණී තොමෝ මාගේ අසපුව හොබවයි.

4234. පාඨීන, පාවුස, වලජ, මුඤ්ජ, රොහිත යන මත්ස්‍යයෝ එහි හැසිරෙමින් මාගේ අසපුව හොබවත්.

4235. කුඹසිල, සුංසුමාර යන චණ්ඩ ජලජ සත්ත්වයෝ ද, කැසුබුවෝ, ඔගුහ නම් සත්ත්වයෝ, අජගරයෝ ද බොහෝ වූවාහු මාගේ අසපුව හොබවත්.

4236. පරෙවි, රවිහංස, චක්‍රවාක, නදීචර, දින්දිභ (කිරලු), සාළික - මේ පක්ෂීහු මෙහි මාගේ අසපුව හොබවත්.

4237. නයිතා, අම්බගන්ධී, කෙතකී - මෙකී වෘක්ෂයෝ පිපී ගියාහු එහි දිවසුවඳ විහිදුවමින් මාගේ අසපුව හොබවත්.

4238. සිංහ, ව්‍යාඝ්‍ර, දිවි, වලස්සු, කොක්නහ, තරබාතාවලස්සු - මොහු මහවෙනෙහි හැසිරෙන්නාහු මාගේ අසපුව හොබවත්.

4239. අඳුන් දිවිසම් ඇ ජටාභාරයෙන් බර වූ තවුසෝ මහ වෙනෙහි හැසිරෙන්නාහු මාගේ අසපුව හොබවත්.

4240. මේ තවුසෝ අඳුන් දිවිසම් දරන්නෝ ය. ප්‍රාඥයෝ ය. සන්හුන් පැවතුම් ඇත්තෝ ය අල්පාහාර ඇති ඒ සියල්ලෝ මාගේ අසපුව හොබවත්.

4241. පිරිකර ඝඬ ගෙණ වනයට පිවිස මුල් හා ගෙඩි අනුභව කරන්නාවූ ඔහු එකල හැම ද අසපුවෙහි වසත්.

4242. ඔහු දර, පා දෝනා දිය නො ගෙණෙත්. සියල්ලන්ගේ අනුභාවයෙන් (ඒ දෑ තෙමේ ම) පැමිණෙයි.

4243. අසූහාර දහසක් සෘෂීහු මෙහි රැස් වූහ. මේ සියල්ලෝ ම ධ්‍යාන කරන්නෝ උත්තමාර්ථය වූ විමුක්තිය සොයන්නෝ ය.

4244. තපස්වී වූ බ්‍රහ්මචාරී වූ අජිණාවෘතයෙහි යෙදුනාවූ අහසෙහි හැසිරෙන්නා වූ (ඒ) සියල්ලෝ එකල්හි අසපුවෙහි වෙසෙත්.

4245. එකඟ වූ සන්හුන් පැවතුම් ඇති මොහු පස් දිනකට වරක් රැස් වෙත්. (රැස්ව) ඔවුනොවුනට වැඳ ඒ ඒ දිශාභිමුඛ වූවාහු යෙත්.

4246. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මානපාරගූ,
තමන්ධකාරං [1] විධමං උප්පජ්ජි තාවදෙ ජිනො.

4247. මම අස්සමසාමන්තා යක්ඛො ආසි මහිද්ධිකො,
සො මෙ සංසිත්ථ සම්බුද්ධං ජලජුත්තමනායකං.

4248. එස බුද්ධො සමුප්පන්නො පදුමුත්තරො මහාමුනි,
ඛිප්පං ගන්ත්වාන සම්බුද්ධං පයිරුපාසය [2] මාරිස.

4249. යක්ඛස්ස වචනං සුත්වා විප්පසන්නෙන චෙතසා,
අස්සමං සංසාමෙත්වාන නික්ඛමිං විපිනා තදා.

4250. චෙලෙව ඩය්හමානම්හි නික්ඛමිත්වාන අස්සමා,
එකරත්තිං නිවසිත්වා[3] උපගච්ඡිං විනායකං.

4251. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
චතුසච්චං පකාසෙන්තො දෙසෙසි අමතං පදං.

4252. සුඵුල්ලං පදුමං ගය්හ උපගන්ත්වා මහෙසිනො,
පසන්නචිත්තො සුමනො බුද්ධස්ස අභිරොපයිං.

4253. පූජයිත්වාන සම්බුද්ධං ජලජුත්තමනායකං,
එකංසං අජිනං කත්වා සන්ථවිං ලොකනායකං.

4254. යෙන ඤාණෙන සම්බුද්ධො වසතීධ අනාසවො,
තං ඤාණං කිත්තයිස්සාමි සුණොථ මම භාසතො.

4255. සංසාරසොතං ඡින්දිත්වා තාරෙසි සබ්බපාණිනො,
තව ධම්මං සුණිත්වාන තණ්හාසොතං තරන්ති තෙ.

4256. තුවං සත්ථා ච කෙතු ච ධජො යූපො ච පාණිනං,
පරායණො පතිට්ඨා ච දීපො ච දිපදුත්තම.[4]

4257. යාවතා ගණිනො ලොකෙ සත්ථවාහා පවුච්චරෙ,
තුවං අග්ගොසි සබ්බඤ්ඤු තව අන්තොගධාව තෙ.

4258. තව ඤාණෙන සබ්බඤ්ඤු තාරෙසි ජනතං බහුං,
තව දස්සනමාගම්ම දුක්ඛස්සන්තං කරිස්සරෙ.

4259. යෙ කෙචි මෙ ගන්ධජාතා ලොකෙ වායන්ති චක්ඛුම,
තව ගන්ධසමො නත්ථි පුඤ්ඤක්ඛෙත්තෙ මහාමුනෙ.

1. මහන්ධකාරං, සීමු. 2. පයිරුපාස, මජ්සං. 3 නිවාසෙත්වා, මජ්සං.
4 ද්විපදුත්තම, මජ්සං.

4246. සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය පදුමුත්තර නම් බුදුරජ තෙම එකෙණෙහි මොහඳුර දුරු කරමින් ලොව පහළ විය.

4247. මාගේ අසපුව සමීපයෙහි මහාසෘද්ධි ඇති යක්ෂයෙක් විය. හෙතෙම පදුමුත්තර නම් වූ බුදුරජුන්හට (මෙසේ) ප්‍රශංසා කෙළේ ය:

4248. "නිදුකානෙනි, මේ මහාමුනි වූ පදුමුත්තර නම් බුදුරජ තෙම ලොව පහළ විය. වහා ගොස් ඒ සම්බුදුරජුන් භජනය කරනු මැනව,, (කියා සි.)

4249. එකල්හි යක්ෂයාගේ වචනය අසා පැහැදි සිතින් අසපුව පිළියෙළ කොට තබා මහවනයෙන් නික්මුනෙමි.

4250. වස්ත්‍රය ගිනි ඇවිළගත් කල්හි මෙන් අසපුවෙන් නික්ම එක් රැයක් (මග) වැස බුදුරජුන් වෙත එළඹියෙමි.

4251. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ පදුමුත්තර බුදුරජ තෙම සිවුසස් පවසමින් අමෘතපදය දෙශනා කෙළේ ය.

4252. මනාව පිපුණු පියුමක් ගෙණ (බුදුරජුන් වෙත) එළඹ පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් මහර්ෂි වූ සර්වඥයන් වහන්සේට පිදීමි.

4253. පදුමුත්තර නම් වූ බුදුරජානන් වහන්සේ පුදා අඳුන්දිවිසම එකස් කොට ලොකනායක වූ තථාගතයන්හට සතුති කෙළෙමි:

4254. "යම් සර්වඥතාඥනයක් කරණ කොට ගෙණ සම්බුදු රජ තෙම ආස්‍රව රහිත ව මෙලොව්හි වැඩ වෙසේ ද, ඒ ඥනය කීර්තනය කරන්නෙමි. පවසන්නා වූ මාගේ වචනය අසවු.

4255. (ඔබ) සසර සැඩ පහර සපා සියලු ප්‍රාණීන් (සසරසයුරින්) එතෙර කෙරෙහි ය. ඒ සත්ත්වයෝ ඔබවහන්සේගේ ධර්මය අසා තෘෂ්ණාව නමැති සැඩ පහර තරණය කෙරෙත්.

4256. දිව්‍යපදෙනතම වූ බුදුරජානන් වහන්ස, ඔබ සත්ත්වයනට ශාස්තෘ වන සේක. කොඩියක් ධජයක් යාගස්ථම්භයක් වන සේක. ආරක්ෂාව වන සේක.

4257. ලෙව්හි යම්තාක් ගණප්‍රධාන වූවාහු සාර්ථවාහයෝ ය යි කියනු ලබද්ද, සර්වඥයන් වහන්ස, ඔවුනට ඔබ අග්‍ර වන සේක. ඔහු ඔබවහන්සේට ම ඇතුළත් වෙත්.

4258. සර්වඥයන් වහන්ස, ඔබ වහන්සේගේ නුවණ කරණකොට ගෙණ බොහෝ දෙන (සසර සයුරින්) එතෙර කරණ සේක. ඔහු ඔබවහන් සේගේ දර්ශනය නිසා දුක් කෙළවර කෙරෙත්.

4259. පසැස් ඇතියානන් වහන්ස, ලෙව්හි වෙ යම්කිසි සුගන්ධ ජාතයෝ හමත් නම්, මහාමුනීන් වහන්ස, පින්කෙත්හි වූ ඔබගේ ගුණ සුවඳ වැනි අනික් සුවඳෙක් නැත.

4260. තිරච්ඡානයොනිං නිරයං පරිමොචෙසි[1] චක්ඛුම,
අසංඛතං පදං සන්තං දෙසෙසි[2] ත්වං මහාමුනෙ.

4261. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

4262. "යො මෙ ඤාණං අපූජෙසි පසන්නො සෙහි පාණිහි,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

4263. තිංසකප්පසහස්සානි දෙවලොකෙ රමිස්සති,
සහස්සක්ඛත්තුං රාජා ච චක්කවත්ති භවිස්සති."

4264. සුලද්ධලාභං ලද්ධොම්හි තොසයිත්වාන සුබ්බතං,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

4265. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4266. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4267. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා උදෙනො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

උදෙනත්ථෙරස්ස අපදානං දසමං.

උද්දානං:

මෙත්තෙය්‍යො පුණ්ණකො ථෙරො මෙත්තගූ ධොතකො'පි ච,
උපසීවො ච නන්දො ච හෙමකො සත්තමො තහිං.
තොදෙය්‍යො ජතුකණ්ණී ච උදෙනො ච මහායසො,
තීණි ගාථාසතානෙත්ථ අසීති තීණි චුත්තරිං.

මෙත්තෙය්‍යවග්ගො එකචත්තාළීසතිමො.[3]

1 පරිමොචෙසි, ස්‍යා. 2. දෙසෙහි, ස්‍යා 3. එකචත්තාළීසමො, සීමු, මජසං.

4260. පසැස් ඇතියානන් වහන්ස, ඔබ තිරිසන් ගතිය ද, නිරය ද, දුරු කරණ සේක. මහාමුනීන් වහන්ස, ඔබ අසංඛත වූ ශාන්තපදය නොහොත් නිවන දෙශනා කරණ සේක. (කියා යි.)

4261. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ පදුමුත්තර බුදුරජ තෙම භික්ෂුසඞ්ඝයා මැද හිඳ මේ ගාථා වදාළ සේක:

4262. "යමෙක් තෙම පහන්වූයේ සියතින් මාගේ සම්බුද්ධඥානය පිදී ද, හේ (කවරෙක්දැයි) මම පවසන්නෙමි. පවසන්නා වූ මාගේ වචනය අසවු.

4263. (මෙතෙම) කල්පතිස්දහසක් දෙව්ලොව සිත් අලවා වසන්නේ ය. දහස් වරක් සක්විතිරජ වන්නේ ය" (කියා යි.)

4264. මම මනා ව්‍රත ඇති බුදුරජුන් තුටු කොට උතුම් ලාභයක් ලැබූයෙම් වෙමි. සියලු ආස්‍රවයන් ප්‍රහාණ කොට ආස්‍රව රහිත ව වෙසෙමි.

2465. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

4266. බුද්ධ ශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත මාගේ පැමිණීම යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4267. සිව් පිළිසිඹියාවෝ ද, අෂ්ට විමොක්ෂයෝ ද, ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මේ අයුරින් ආයුෂ්මත් උදෙන ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

උදෙන ස්ථවිරාපදානය දසවැනි යි.

උද්දානය.

මෙත්තෙය්‍ය පුණ්ණකථෙර මෙත්තගු ධොතක සහ,
උපසීව නන්ද හෙමක තොදෙය්‍ය ජතුකණ්ණි උදෙන ද,
ගී තෙසිය තෙ අසූවකින් එවග මෙහි කීයේ.

මෙත්තෙය්‍යවග්ගය එක්සාළිස්වැනි යි.

114 භද්දාලිත්ථෙරාපදානං

4268. සුමෙධො නාම සම්බුද්ධො අග්ගො කාරුණිකො මුනි,
විවෙකකාමො ලොකග්ගො හිමවන්තමුපාගමි.

4269. අජ්ඣොගහෙත්වා හිමවං සුමෙධො ලොකනායකො,
පල්ලඞ්කමාභුජිත්වාන නිසීදි පුරිසුත්තමො.

4270. සමාධිං සො සමාපන්නො සුමෙධො ලොකනායකො,
සත්තරත්තින්දිවං බුද්ධො නිසීදි පුරිසුත්තමො.

4271. ඛාරිකාජං[1] ගහෙත්වාන වනමජ්ඣොගහිං අහං,
තත්ථද්දසාසිං සම්බුද්ධං ඔඝතිණ්ණමනාසවං.

4272. සම්මජ්ජනිං ගහෙත්වාන සම්මජ්ජිත්වාන අස්සමං,
චතුදණ්ඩෙ ඨපිත්වාන[2] අකාසිං මණ්ඩපං තදා.

4273. සාලපුප්ඵං ආහරිත්වා මණ්ඩපං ඡාදයිං අහං,
පසන්නචිත්තො සුමනො අභිවන්දිං තථාගතං.

4274. යං වදන්ති සුමෙධොති භූරිපඤ්ඤං සුමෙධසං,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ.

4275. බුද්ධස්ස ගිරමඤ්ඤාය සබ්බෙ දෙවා සමාගමුං,
අසංසයං බුද්ධසෙට්ඨො ධම්මං දෙසෙති චක්ඛුමා.

4276. සුමෙධො නාම සම්බුද්ධො ආහුතීනං පටිග්ගහො,
දෙවසඞ්ඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

4277. “යො මෙ සත්තාහං මණ්ඩපං ධාරයී සාලඡාදිතං,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

4278. දෙවභූතො මනුස්සො වා හෙමවණ්ණො භවිස්සති,
පහූතභොගො හුත්වාන කාමභොගී භවිස්සති.

4279. සට්ඨිනාගසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
සුවණ්ණකච්ඡා මාතඞ්ගා හෙමකප්පනවාසසා.

4280. ආරූළ්හා ගාමණීයෙහි තොමරඞ්කුසපාණිභි,
සායංපාතො[3] උපට්ඨානං ආගමිස්සන්ති’මං නරං,
තෙහි නාගෙහි පරිවුතො රමිස්සති අයං නරො.

---

1 ඛාරිභාරං, මජසං. 2. ඨපෙත්වාන, මජසං. 3. සායපාතො, PTS.

411. භද්දාලි ස්ථවිරාවදානය

4268. මොනෙයාගුණ යුත් අග්‍රකාරුණික වූ ලොකාග්‍ර වූ සුමෙධ නම් සම්බුද්ධ තෙමේ විවෙක සුව කැමැත්තේ හිමවතට එළඹියේ ය.

4269 පුරුෂොත්තම වූ සුමෙධ නම් ලොකනායක තෙම හිමවතට පිවිස පලක් බැඳ වැඩ හුන්නේ ය.

4270. ලොකනායක වූ ඒ සුමෙධ බුදුරජ තෙම සමාධියට සමවැදුනේ ය. පුරුෂොත්තම වූ සම්බුද්ධ තෙම රාත්‍රිදවල් සතක් (සතියක්) එසේ වැඩ හුන්නේ ය.

4271. පිරිකර කද ගෙණ මම වනයට පිවිසියෙමි. එහි දී වතුරොඝයන් තරණය කළා වූ සම්බුදුරජුන් දිටිමි.

4272. මුස්න ගෙණ අසපුව හැමද වතුදණ්ඩය (=එකට බැඳ සාදා ගත් දඬුසතර) සිටුවා එකල්හි මණ්ඩපයක් කෙලෙමි

4273. මම සල්මල් ගෙණවුත් මඩුව සෙවෙනි කෙලෙමි. පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් බුදුරජුන් වැන්දෙමි.

4274 මහා ප්‍රාඥ වූ උතුම් නුවණැති යමකුට සුමෙධ යයි කියත් ද, ඒ සුමෙධ බුදුරජ තෙම භික්ෂුසඞ්ඝයා මැද හිඳ මේ ගාථාවන් වදාළේ ය.

4275. බුදුරජුන්ගේ හඬය යි දැන "තිසැකව ම පසැස් ඇති බුද්ධශ්‍රෙෂ්ඨ තෙම දහම් දෙසා" ය යි දෙවියෝ රැස් වූහ.

4276. ලොකයාගේ පූජාවන් පිළිගන්නාවූ සුමෙධ නම් සම්බුද්ධ තෙමේ දිව්‍යසමූහයා මැද වැඩ හිඳ මේ ගාථාවන් වදාළේ ය.

4277. "යමෙක් තෙම සල්මලින් සෙවෙනි කළ මඩුවක් සතියක් මුළුල්ලෙහි මා පිණිස දැරී ද, හේ (කවරෙක්දැයි) කියන්නෙමි. කියන්නා වූ මාගේ වචනය අසවු.

4278. මෙතෙම දෙව් වූයේ ද සුවර්ණවර්ණ වන්නේ ය. සම්පූර්ණ භොගසම්පත් ඇත්තේ ම කම්සුව අනුභව කරන්නෙක් වන්නේ ය.

4279-4280. ඇතුන්ගේ පා විදින තෝමර හා අකුසු ගත් අත් ඇති, ඇතරුවන් විසින් නගින ලද සියලු ආභරණයෙන් සරසන ලද සැට දහසක් ඇත්තු ද, හෙම් වැනි වත් හැඳ වූ රත්පොරොදු බැඳි ඇත්තු ද මේ මිනිස්හට උදේ සවස උවැටනට පැමිණෙන්නාහු ය. මේ මිනිස් තෙම ඒ ඇතුන් විසින් පිරිවරන ලදුව රමණය කරන්නේ ය.

4281. සට්ඨිඅස්සසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
ආජානීයා ව ජාතියා සින්ධවා සීඝවාහිනො.

4282. ආරූළ්හා ගාමණීයෙහි ඉල්ලියාචාපධාරිභි,
පරිවාරෙස්සන්තිමං නිච්චං බුද්ධපූජායිදං ඵලං.

4283. සට්ඨිරථසහස්සානි සබ්බාලඞ්කාරභූසිතා,
දීපා අථොපි වෙය්‍යග්ඝා සන්නද්ධා උස්සිතද්ධජා.

4284. ආරූළ්හා ගාමණීයෙහි චාපහත්ථෙහි වම්මිහි,
පරිවාරෙස්සන්තිමං නිච්චං බුද්ධපූජායිදං ඵලං.

4285. සට්ඨිගාමසහස්සානි පරිපුණ්ණානි සබ්බසො,
පහූතධනධඤ්ඤානි සුසමිද්ධානි සබ්බසො,
සදා පාතුභවිස්සන්ති බුද්ධපූජායිදං ඵලං.

4286. හත්ථී අස්සා රථා පත්ති සෙනා ච චතුරඞ්ගිනී,
පරිවාරෙස්සන්තිමං නිච්චං බුද්ධපූජායිදං ඵලං.

4287. අට්ඨාරසෙ කප්පසතෙ දෙවලොකෙ රමිස්සති,
සහස්සක්ඛත්තුං රාජා ච චක්කවත්ති භවිස්සති.

4288. සතානං තීණික්ඛත්තුඤ්ච දෙවරජ්ජං කරිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

4289. තිංසකප්පසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

4290. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරිස්සතනාසවො"

4291. තිංසකප්පසහස්සම්හි අද්දසං ලොකනායකං,
එත්ථන්තරමුපාදාය ගවෙසිං අමතං පදං.

4292. ලාභා මය්හං සුලද්ධං මෙ යමහඤ්ඤාසි සාසනං,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4293. නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
තව ඤාණං පකිත්තෙත්වා පත්තොම්හි අචලං පදං.

4294. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
සබ්බත්ථ සුඛිතො හොමි ඵලං මෙ ඤාණකිත්තනෙ.

4281-4282. කඩු හා දුනු දරන්නා වූ යොධාජීවයන් විසින් නගින ලද ජාතියෙන් ම ආජානීය වූ ශීඝ්‍රගාමී වූ සියලු අබරණින් සරසන ලද සැට දහසක් සෛන්ධව අශ්වයෝ මොහු නිතර පිරිවරත්. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4283. 4284. දුනු ගත් අත් ඇති සන්නාහ සන්නද්ධ වූ යොධාජීවයන් විසින් නගින ලද ඔසවන ලද ධජ ඇති සන්නද්ධ වූ දිවිසමින් වළඳන ලද රථ ද ව්‍යාඝ්‍රසමින් වළඳන ලද රථ දැයි මෙසේ සර්වාලඞ්කාරයෙන් සරසන ලද සැට දහසක් රථයෝ මොහු නිතර පිරිවරත්නාහු ය. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4285. සර්වාකාරයෙන් සම්පූර්ණ වූ ධනධාන්‍ය ඇති හැම අයුරින් ම මැනවින් සමෘද්ධ වූ සැට දහසක් ග්‍රාමයෝ හැම කල්හි පහළ වන්නාහු ය. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4286. ඇත් අස් රිය පාබල යන සිවුරඟ සෙනඟ මොහු නිතර පිරිවරත්. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4287. (මෙ තෙම) අටළොස් සියක් කප් මුළුල්ලෙහි දෙව්ලොවෙහි සිත් අලවා වසන්නේ ය. දහස් වරක් සක්විතිරජ වන්නේ ය.

4288. තුන්සිය වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. (මොහු ලබන) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නො හැකි ය.

4289. මෙයින් තිස්දහස් වන කපෙහි ඔක්කාක කුලයෙහි උපදනා නමින් ගෞතම නම් වූ ශාස්තෘ තෙම ලොව පහළ වන්නේ ය.

4290. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනි වූ ඖරස බුද්ධපුත්‍රයෙක් ව ආස්‍රව රහිත ව සියලු ආස්‍රවයන් (ප්‍රහාණ-පරිඥා වශයෙන්) දැන වාසය කරන්නේ ය.”

4291. මෙයින් කල්ප තිස් දහසකට පෙර ලොකනායක වූ බුදුරජුන් දිටිමි. (එදින පටන් අද දක්වා) මේ අතුරෙහි අමෘතපදය = නිවන සෙවීමි.

4292. යම් බුදුසසුනක් මම දැනගතිම් ද, එය මට ලාභයකි. මා විසින් එය මනා කොට ලබන ලදි. (මා විසින්) පැමිණෙන ලද ත්‍රිවිද්‍යාවෝ ඇතියහ බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

4293. පුරුෂශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා පුරුෂොත්තමයානන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා ඔබවහන්සේගේ සර්වඥතාඥානයට පසසා අමෘතපදය හෙවත් නිවනට පැමිණියෙම් වෙමි.

4294. දෙව් වූ හෝ මිනිස් වූ හෝ යම් යම් භවයක උපදිම් නම් හැම තන්හි සුව ඇත්තෙම් වෙමි. සර්වඥතාඥානයට පැසසීමෙහි මේ විපාක යි.

4295. ඉදං පච්ඡිමකං මය්හං චරිමො වත්තතෙ භවො,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4296. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4297. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4298. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා භද්දාලි ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

භද්දාලිත්ථෙරස්ස අපදානං පඨමං.

412 එකච්ඡත්තියත්ථෙරාපදානං

4299. චන්දභාගානදීතීරෙ අස්සමො සුකතො මම,
සුසුද්ධපුලිනාකිණ්ණො පණ්ණසාලා සුමාපිතා.

4300. උත්තානකූලා නදිකා සුපතිත්ථා මනොරමා,
මච්ඡකච්ඡපසම්පන්නා සුසුමාරනිසෙවිතා.

4301. අච්ඡා මයූරා දීපී ච කරවීකා ච සාලිකා,
කූජන්ති සබ්බදා එතෙ සොභයන්තා මම'ස්සමං.

4302. කොකිලා මඤ්ජුභාණී ච හංසා ච මධුරස්සරා,
අභිකූජන්ති තෙ තත්ථ සොභයන්තා මමස්සමං.

4303. සීහා ව්‍යග්ඝා වරාහා ච වකා[1] කොකතරච්ඡකා,
ගිරිදුග්ගම්හි නාදෙන්ති සොභයන්තා මමස්සමං.

4304. එණීමිගා ච සරභා භෙරණ්ඩා සූකරා බහූ,
ගිරිදුග්ගම්හි නාදෙන්ති සොභයන්තා මමස්සමං.

5305. උද්දාලකා චම්පකා ච පාටලී සින්දුවාරකා[2],
අතිමුත්තා අසොකා ච පුප්ඵන්ති මම අස්සමෙ.

4306. අඞ්කොලා යූථිකා චෙව සත්තලී බිම්බිජාලිකා,
කණ්ණිකා කණිකාරා ච පුප්ඵන්ති මම අස්සමෙ.

1. අච්ඡා, මජසං. 2. සින්දුවාරිකා, සීමු.

4295. මේ මාගේ පශ්චිම භවය යි. අවසන් භවය මේ පවතී. ඇතකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

4296. මා විසින් කෙලෙසයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4297. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත පැමිණීම මට ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4298. සිවු පිළිසිඹියාවෝ ද, අෂ්ට විමොක්ෂයෝ ද, ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මේ අයුරින් ආයුෂ්මත් භද්‍රාලි ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

භද්‍රාලි ස්ථවිරාපදානය පළමුවැනි යි.

412. එකඡත්‍රිය ස්ථවිරාපදානය

4299. චන්ද්‍රභාගා නදීතීරයෙහි මට ආශ්‍රමයක් මැනවින් කරණ ලදී. (එහි) සුදු වැල්ලෙන් ගැවසී ගත් පන්සලක් ද නිර්මිත කරණ ලදී.

4300. එහි නො ගැඹුරු ඉවුරු ඇති මනා වූ තොට ඇති මනොඥ වූ මත්ස්‍ය කැසුබුවන්ගෙන් යුත් 'සු - සු' හඬ නගමින් දිය බුබුළු උඩට නංවන සුංසුමාරයන් විසින් සේවිත ලද කුඩා නදියක් විය.

4301. වලස්සු, මොණරු, දිවියෝ, කොවුලෝ, සැලලිහිණි යන මොහු හැම කල්හි මාගේ අසපුව හොබවමින් නාද කෙරෙත්.

4302. මිහිරි හඬ ඇති කොවුලෝ ද, මධුර ස්වර ඇති හංසයෝ ද, යන මොහු එහි මාගේ අසපුව හොබවමින් නාද කෙරෙත්.

4303. සිංහ, ව්‍යාඝ්‍ර, හූරු, වෘක, කොක්නහ, කරබානා වලස්සු ද මාගේ අසපුව හොබවමින් ගිරිදුර්ගයෙහි නාද කෙරෙත්.

4304. එණිමෘග, සරභ මෘග, කැනහිල්, හූරු - ද මොහු බොහෝ දෙන මාගේ අසපුව හොබවමින් ගිරි දුර්ගයෙහි නාද කෙරෙත්.

4305. ඇසල, සපු, පලොල්, නික, යොහොඹු, අසොක - මේ වෘක්ෂයෝ මාගේ අසපුවෙහි පුෂ්පිත වූවාහු වෙත්.

4306. රුක්අගුන, සීනිද්ද, සත්පෙති දෑසමන්. බිඹුදල්, කණණික කිණිහිරි මොහු මාගේ අසපුවෙහි පුෂ්පිත වූවාහු වෙත්.

4307. නාගා සාලා ච සළලා පුණ්ඩරීකෙත්ථ පුප්ඵිතා,
දිබ්බගන්ධං සම්පවන්තා සොභයන්ති මමස්සමං.

4308. අජ්ජුනා අසනා චෙත්ථ මහානාමා ච පුප්ඵිතා,
සාලා ච කඞ්ගුපුප්ඵා ච සොභයන්ති මමස්සමං.

4309. අම්බා ජම්බූ ච තිලකා නිම්බා ච සාලකල්‍යාණී,
දිබ්බගන්ධං සම්පවන්තා සොභයන්ති මමස්සමං.

4310. අසොකා ච කපිත්ථා ච භගිනිමාලෙත්ථ[1] පුප්ඵිතා,
දිබ්බගන්ධං සම්පවන්තා සොභයන්ති මමස්සමං.

4311. කදම්බා කදලී චෙව ඉසිමුග්ගා ච රොපිතා,
ධුවං ඵලානි ධාරෙන්ති සොභයන්තා මමස්සමං.

4312. හරීතකා ආමලකා අම්බා ජම්බූ විභීතකා,
කොලා භල්ලාතකා බිල්ලා ඵලිනො මම අස්සමෙ.

4313. අවිදූරෙ පොක්ඛරණී සුපතිත්ථා මනොරමා,
මන්දාලකෙහි සඤ්ඡන්නා පදුමුප්පලකෙහි ච.

4314. ගබ්භං ගණ්හන්ති පදුමා අඤ්ඤෙ පුප්ඵන්ති කෙසරී,
ඔපත්තකණ්ණිකා චෙව පුප්ඵන්ති මම අස්සමෙ.

4315. පාඨීනා පාවුසා මච්ඡා වලජා[2] මුඤ්ජරොහිතා,
අච්ඡොදකම්හි විචරං සොභයන්ති මමස්සමං.

4316. නයිතා අම්බගන්ධී ච අනුකූලෙ ච කෙතකා,
දිබ්බගන්ධං සම්පවන්තා සොභයන්ති මමස්සමං.

4317. මධූ භිසම්හා සවති ඛීරසප්පි මුළාලිභි,
දිබ්බගන්ධං සම්පවන්තා සොභයන්ති මමස්සමං.

4318. පුලිනා සොභනා තත්ථ ආකිණ්ණා ජලසෙවිතා,
ඔපුප්ඵා පුප්ඵිතා සෙන්ති සොභයන්තා මමස්සමං.

4319. ජටාභාරෙන භරිතා අජිනුත්තරවාසනා,
වාකචීරධරා සබ්බෙ සොභයන්ති මමස්සමං.

4320. යුගමත්තමපෙක්ඛන්තා නිපකා සන්තවුත්තිනො,
කාමභොගෙ අනපෙක්ඛා වසන්ති මම අස්සමෙ.

1. සිරිමාලෙත්ථ, මජසං. 2 බලජා, මජසං.

4307. තා, සල්, හෙළ පියුම් මෙහි පිපියාහු දිවසුවඳ විහිදුවමින් මාගේ අසපුව හොබවත්.

4308. කුඹුක්, පියා, උක්, සල්, පුවඟු, මේ වෘක්ෂයෝ හටගත් මල් ඇත්තාහු මාගේ අසපුව හොබවත්.

4309. අඹ, දඹ, මදට, කොසඹ, සල්කලණ, මේ වෘක්ෂයෝ දිවසුවඳ විහිදුවමින් මාගේ අසපුව හොබවත්.

4310. හෝපළු, ශිවුළු ද, හගිනිමාල, මොහු මෙහි පිපී ගියාහු දිවසුවඳ විහිදුවමින් මාගේ අසපුව හොබවත්.

4311. රොපණය කරණ ලද කොලොම්, කෙසෙල්, එසේ ම සෘෂිමුද්ග (බොඩහමු) නම් ධාන්‍ය විශෙෂය - මොහු මාගේ අසපුව හොබවමින් නිතර ඵල දරත්.

4312. අරළු, නෙල්ලි, අඹ, ජම්බු, බුළු, ඩෙබර, බදුලු, බෙලි මෙකී වෘක්ෂයෝ මංගේ අසපුවෙහි ඵල දරත්.

4313 (අසපුවට) නුදුරෙහි මනා වූ තොට ඇති මනොඥ වූ හෙල්මැල්ලෙන් නොහොත් දිය කනඳරයෙන් හා විල්පලායෙන් ද, පියුම් හා උපුලින් ද ගැවසී ගත් පොකුණකි.

4314. මාගේ අසපුවෙහි ඇතැම් පද්මයෝ කැකුළු ගැබ් ගණිත්. සෙසු රේණු සහිත පද්ම ද පිපෙත්. ඇතැම් විහිදුනු පත් ඇති පද්ම කර්කණිාවෝ ද ප්‍රබොධ වෙත්.

4315. පාඨින, පාවුස, වලජ, මුඤ්ජ, රොහිත - මත්‍ස්‍යයෝ පැහැදී දියෙහි හැසිරෙමින් මාගේ අසපුව හොබවත්.

4316. නයිනා, අම්බගන්ධි මේ වෘක්ෂයෝ වාතය අනුව දිවසුවඳ විහිදුවමින් මාගේ අසපුව හොබවත්.

4317. නෙළුඹලින් මිනී ද නෙළුම්දූලින් කිරි හා ගිතෙල් ද වැගිරේ. දිවසුවඳ ද විහිදුවමින් මාගේ අසපුව් හොබවත්.

4318. එහි ජලයෙන් සෙව්නා ලද ආකීර්ණ වූ වැලිතලාවෝ ශොභ-නය. උඩට නැගුනු පුෂ්පයෝ පිපී ගියාහු මාගේ අසපුව හොබවමින් පවතීත්.

4319 අඳුන් දිවිසම් හැදි ජටාභාරයෙන් බර වූ වැහැරි සිවුරු දරණ සියලු (තවුසෝ) මාගේ අසපුව හොබවත්.

4320. වියදඬු පමණ දුර බලන්නා වූ ප්‍රාඥ වූ සන්හුන් පැවතුම් ඇති කම්සුව අනුභවයෙහි බලාපොරොත්තු නැති (තවුසෝ) මාගේ අසපුවෙහි වසත්.

4321. පරූළ්හකච්ඡනඛලොමා පඞ්කදන්තා රජස්සිරා,
රජොජල්ලධරා සබ්බෙ වසන්ති මම අස්සමෙ.

4322. අභිඤ්ඤාපාරමිප්පත්තා අන්තලික්ඛචරා ච තෙ,
උග්ගච්ඡන්තා නභං එතෙ සොභයන්ති මමස්සමං.

4323. තෙහි සිස්සෙහි පරිවුතො වසාමි විපිනෙ තදා,
රත්තින්දිවං න ජානාමි සදා ඣානසමප්පිතො.

4324. භගවා තම්හි සමයෙ අත්ථදස්සී මහාමුනි,
තමන්ධකාරං නාසෙන්තො උප්පජ්ජි ලොකනායකො.

4325. අථ අඤ්ඤතරො සිස්සො ආගච්ඡි මම සන්තිකං,
මන්තෙ අජ්ඣෙතුකාමො සො ඡළඞ්ගං නාමලක්ඛණං.

4326. බුද්ධො ලොකෙ සමුප්පන්නො අත්ථදස්සී මහාමුනි,
චතුසච්චං පකාසෙන්තො දෙසෙති අමතං පදං.

4327. තුට්ඨහට්ඨො පමුදිතො ධම්මන්තරගතාසයො,
අස්සමා අභිනික්ඛම්ම ඉමං වචනමබ්‍රවිං:

4328. "බුද්ධො ලොකෙ සමුප්පන්නො ද්වත්තිංසවරලක්ඛණො,
එථ සබ්බෙ ගමිස්සාම සම්මාසම්බුද්ධසන්තිකං."

4329. ඔවාදපටිකරා තෙ සද්ධම්මෙ පාරමිඞ්ගතා,
සාධූ' ති සම්පටිච්ඡිංසු උත්තමත්ථං ගවෙසකා.

4330. ජටාභාරභරිතා තෙ අජිනුත්තරවාසිනො,
උත්තමත්ථං ගවෙසන්තො[1] නික්ඛමිංසු වනා තදා.

4331. භගවා තම්හි සමයෙ අත්ථදස්සී මහායසො,
චතුසච්චං පකාසෙන්තො දෙසෙති අමතං පදං.

4332. සෙතච්ඡත්තං ගහෙත්වාන බුද්ධසෙට්ඨස්ස ධාරයිං,
එකාහං ධාරයිත්වාන බුද්ධසෙට්ඨමවන්දහං.

4333. අත්ථදස්සී තු භගවා ලොකජෙට්ඨො නරාසභො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

4334. "යො මෙ ඡත්තමධාරෙසි පසන්නො සෙහි පාණිහි,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

4335. ඉමස්ස ජායමානස්ස දෙවත්තෙ අථ මානුසෙ,
ධාරෙස්සති සදා ඡත්තං ඡත්තදානස්සිදං ඵලං.

1. ගවෙසන්තා, මජසං.

4321. වැඩී ගිය කිසිලි තිය ලොම් ඇති මැලියම් සහිත දත් ඇති දූවිලි සහිත හිස් ඇති රජස් දූලි වැකුණු (සිරුරු ඇති) මේ සියලු තවුසෝ මාගේ අසපුවෙහි වෙසෙත්.

4322. අභිඥාවන්ගේ පරතෙරට පැමිණි අහසෙහි හැසිරෙන්නා වූ ඒ මේ තවුසෝ අහසට නගිමින් මාගේ අසපුව හොබවත්.

4323. එකල්හි මම ඒ ශිෂ්‍යයන් විසින් පිරිවරන ලදුයෙම් මහ වෙනෙහි වසමි. හැම කල්හි ධ්‍යානයට සමවැදුනෙම් රෑදවල් නො දනිමි.

4324. එසමයෙහි ලොකනායක වූ භාග්‍යවත් වූ අත්ථදස්සී බුදුරජ තෙම සන්ධකාරය දුරු කරමින් ලොව පහළ විය.

4325. ඉක්බිති එක්තරා ශිෂ්‍යයෙක් මාගේ සමීපයට පැමිණියේ ය. හෙතෙම මන්ත්‍රයන් ද ෂඩංගය හා නාම ලක්‍ෂණයන් ද හදාරනු කමැත්තේ ය.

4326. "මහාමුනි වූ අත්ථදස්සී බුදුරජ තෙම ලොව පහළ විය. (උන්වහන්සේ) චතුස්සත්‍යය පවසමින් අමෘතපදය වූ නිවණ දෙශනා කරණ සේක." (යි කීය.)

4327. මම තුටු පහටු වූයෙම් ප්‍රමුදිත වූයෙම් ධර්මාන්තරගත සිත් ඇත්තෙම් අසපුවෙන් නික්ම මේ වචනය කීමි:

4328. "දෙතිස් මහපුරිස් ලකුණින් යුත් බුදුරජ තෙම ලොව පහළ විය. සියල්ලෝ එවු. සම්බුදුරජුන් වෙත යන්නෙමු" කියා යි.

4329. සදහම් පරතෙරට ගිය අවවාදයට අනුව කටයුතු කරණ උත්තමාර්ථය සොයන්නාවූ ඔහු යහපතැ යි එය පිළිගත්තාහු ය.

4330. ජටාබරින් බර වූ අඳුන් දිවිසම් හඳින ඔහු උත්තමාර්ථය වූ නිවන සොයමින් එකල්හි වනයෙන් නික්මුණාහු ය.

4331. එසමයෙහි මහත් යශස් ඇති අත්ථදස්සී භාග්‍යවතුන් වහන්සේ සිවුසස් පවසමින් අමෘතපදය වූ නිවන දෙශනා කරණ සේක.

4332. මම ශ්වෙතච්ඡත්‍රය ගෙණ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට දැරීමි. එක් දවසක් මුළුල්ලෙහි දරා බුද්ධශ්‍රෙෂ්ඨයන් වැන්දෙමි.

4333. ලොකජ්‍යෙෂ්ඨ වූ අත්ථදස්සී භාග්‍යවත් තෙමේ භික්‍ෂු සඞ්ඝයා මැද හිඳ මේ ගාථාවන් වදාළේ ය:

4334. "යමෙක් තෙම පැහැදුනේ සියතින් ඡත්‍රයක් දැරී ද, හේ (කවරෙක්දැයි) මම කියන්නෙමි. කියන්නා වූ මාගේ වචනය අසවු.

4335. දිව්‍යත්බවක හෝ මිනිසත්බවක හෝ උපදින්නා වූ මොහුට හැම කල්හි ඡත්‍රයක් දරන්නේ ය ඡත්‍රදානයාගේ මේ විපාක යි.

4336. සත්තසත්තතිකප්පානි දෙවලොකෙ රමිස්සති,
සහස්සක්ඛත්තුං රාජා ච චක්කවත්ති භවිස්සති.

4337. සත්තසත්තතික්ඛත්තුඤ්ච දෙවරජ්ජං කරිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

4338. අට්ඨාරසෙ කප්පසතෙ ගොතමො සක්‍යපුඞ්ගවො,
තමන්ධකාරං නාසෙත්වා උප්පජ්ජිස්සති චක්ඛුමා.

4339. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරිස්සතනාසවො.''

4340. යතො අහං කම්මමකං ඡත්තං බුද්ධස්ස ධාරයං,
එත්ථන්තරෙ න ජානාමි සෙතච්ඡත්තං අධාරිතං.

4341. ඉදං පච්ඡිමකං මය්හං චරිමො වත්තතෙ භවො,
ඡත්තධාරණමජ්ජාපි වත්තතෙ නිච්චකාලිකං.

4342. අහො මෙ සුකතං කම්මං අත්ථදස්සිස්ස තාදිනො,
සබ්බාසවපරික්ඛීණො නත්ථි'දානි පුනබ්භවො.

4343. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4344. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4345. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා එකඡත්තියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

එකඡත්තියත්ථෙරස්ස අපදානං දුතියං.

413. තිණසූලකඡදනියත්ථෙරාපදානං

4346. ජාතිජරඤ්ච මරණං පච්චවෙක්ඛිං අහං තදා,
එකකො අභිනික්ඛම්ම පබ්බජිං අනගාරියං.

4347. චරමානො'නුපුබ්බෙන ගඞ්ගාතීර මුපාගමිං,
තත්ථද්දසාසිං පථවිං ගඞ්ගාතීරෙ සමුන්නතං.

4336. මෙතෙම සත්සැත්තෑ කපක් දෙව්ලොව සිත් අලවා වසත්-තේ ය. දහස් වරක් සක්විතිරජ වත්තේ ය.

4337. සත්සැත්තෑ වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. (ලබන) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණින් වශයෙන් ගිණිය නොහැකිය.

4338. අටළොස් සිය වන (එක්දහස් අටසිය වන) කපෙහි පසැස් ඇත්තා වූ ශාක්‍යකුල ශ්‍රෙෂ්ඨ වූ ගෞතම බුදුරජ තෙමේ ගනඳුරු නසමින් පහළ වන්නේ ය.

4339. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද ව ධර්මයෙන් නිර්මිත කලාක් වැනි ඖරස බුද්ධපුත්‍රයෙක් ව සියලු ආස්‍රවයන් (ප්‍රහාණ පරිඥ වශයෙන්) දැන ආස්‍රව රහිත ව වසන්නේ ය." (කියා සී)

4340. යම් තැනෙක පටන් කොට මම බුදුරජුන්හට ඡත්‍රයක් දරමින් කුශල කර්මයක් කෙළෙම් ද, (එතැන් පටන් අද තෙක්) මේ අතරෙහි ශ්වෙතඡත්‍ර නො දරන ලද භවයක් නො දනිමි.

4341. මේ මාගේ පශ්චිම භවය යි. අන්තිම භවය දැන් පවතී. අදත් මට නිත්‍යකාලික ඡත්‍රධාරණය පවතී.

4342. තාදීගුණ ඇති අත්‍ථදස්සී බුදුරජුන්හට මා විසින් මැනැවින් කරණ ලද ඒ කර්මය ආශ්චර්‍ය්‍යයෙකි. සියලු ආස්‍රව ක්ෂීණ විය. දැන් නැවත ඉපදීමෙක් නැත.

4343. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

4344 බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සමීපයට මාගේ පැමිණීම යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4345. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මේ අයුරින් ආයුෂ්මත් එකඡත්තිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

එකඡත්තිය ස්ථවිරාපදානය දෙවැනි යි.

413. තිණසූලකඡදනිය ස්ථවිරාපදානය.

4346. මම එකල්හි ජාති ජරා මරණ සිහි කෙළෙමි. එකලාව ගිහිගෙන් නික්ම අනගාරික සඞ්ඛ්‍යාත සසුනෙහි පැවිදි වීමි.

4347. පිළිවෙළින් හැසිරෙන්නෙම් ගංතෙරට එළඹියෙමි. එහි ගංතෙ-රෙහි උස්ව ගිය පොළොවක් දිටිමි.

4348. අස්සමං තත්ථ මාපෙත්වා වසාමි අස්සමෙ අහං,
සුකතො චඞ්කමො මය්හං නානාදිජගණායුතො.

4349. මමුපෙන්ති ච විස්සත්ථා කූජන්ති ච මනොහරං,
රමමානො සහ තෙහි වසාමි අස්සමෙ අහං.

4350. මම අස්සමසාමන්තා මිගරාජා චතුක්කමො,
ආසයා අභිනික්ඛම්ම ගජ්ජි සො අසනී විය.

4351. නදිතෙ මිගරාජෙ ච හාසො මෙ උපපජ්ජථ,
මිගරාජං ගවෙසන්තො අද්දසං ලොකනායකං.

4352. දිස්වානහං දෙවදෙවං තිස්සං ලොකග්ගනායකං,
හට්ඨො හට්ඨෙන චිත්තෙන පූජයිං නාගකෙසරං.

4353. උග්ගච්ඡන්තංව සූරියං සාලරාජංව පුප්ඵිතං,
ඔසධිංව විරොචන්තං සන්ථවිං ලොකනායකං.

4354. තව ඤාණෙන සබ්බඤ්ඤු මොචෙසි’මං සදෙවකං,
තවං ආරාධයිත්වාන ජාතියා පරිමුච්චරෙ.

4355. අදස්සනෙන සබ්බඤ්ඤු බුද්ධානං සබ්බදස්සිනං,
පතන්ත්‍යවීචිනිරයං රාගදොසෙහි ඔත්ථුටා.[1]

4356. තව දස්සනමාගම්ම සබ්බඤ්ඤු ලොකනායක,
පමුච්චන්ති භවා සබ්බෙ ඵුසන්ති අමතං පදං.

4357. යදා බුද්ධා චක්ඛුමන්තො උප්පජ්ජන්ති පභඞ්කරා,
කිලෙසෙ ඣාපයිත්වාන ආලොකං දස්සයන්ති තෙ.

4358. කිත්තයිත්වාන සම්බුද්ධං තිස්සං ලොකග්ගනායකං,
හට්ඨො හට්ඨෙන චිත්තෙන තිණසූලං අපූජයිං.

4359. මම සඞ්කප්පමඤ්ඤාය තිස්සො ලොකග්ගනායකො,
සකාසනෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

4360. “යො මං පුප්ඵෙහි ඡාදෙසි පසන්නො සෙහි පාණිහි,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො.

4361. පඤ්චවීසතික්ඛත්තුං සො දෙවරජ්ජං කරිස්සති,
පඤ්චසත්තතික්ඛත්තුඤ්ච චක්කවත්තී භවිස්සති.

1. ඔත්ථටා, සයා.

4348. මම එහි අසපුවක් සාදා ගෙණ ඒ අසපුවෙහි වසමි. මැනැවින් කරණ ලද මාගේ අසපුව නොයෙක් පක්ෂිසමූහයාගෙන් යුක්තය.

4349. (ඒ පක්ෂීහු) විශ්වාස ඇත්තාහු මා වෙත එලඹෙත්. මන-හර ලෙස නාද කෙරෙත්. මම ඔවුන් සමග තුටු වෙමින් අසපුවෙහි වෙසෙමි.

4350. මාගේ අසපුව හාත්පස සිවුදිගින් යනු සමත් ඒ මෘගරාජ තෙම ගුහාවෙන් නික්ම හෙන (පුපුරන්නාක්) මෙන් ගර්ජනා කෙළේ ය.

4351. මෘගරාජයා ගර්ජනය කළ කල්හි මට හමියෙක් විය. මෘගරාජයා සොයනෙම් ලොකනායක වූ බුදුරජුන් දිටිමි.

4352. මම දෙවාතිදෙව වූ තිස්ස බුදුරජුන් දැක සතුටු වූයෙමි සතුටු සිතින් ම නාගකෙසර (= නාමල් රේණු) පිදීමි.

4353. උදාවන හිරු වැනි වූ පිපුනු උතුම් සල් රුකක් වැනි වූ බබලන ඔසධීතාරකාවක් වැනි වූ ලොකනායක බුදුරජුන්හට සතුති කෙළෙමි.

4354. සර්වඥයන් වහන්ස, ඔබ වහන්සේගේ ඥානයෙන් මේ දෙවි-යන් සහිත ලොකයා (සසරින්) මිදුවෙහි. ඔබවහන්සේ සතුටු කොට (ඔහු) මේ ජාති සංසාරයෙන් මිදෙත්.

4355. සර්වදර්ශී වූ සර්වඥ බුදුවරයන්ගේ නො දැකීමෙන් රාගද්වෙෂ-යන්ගෙන් පැතිරී ගිය සත්ත්වයෝ අවීචිනිරයෙහි වැටෙති.

4356. සර්වඥයන් වහන්ස, ලොකනායකයන් වහන්ස, ඔබ වහන්-සේගේ දර්ශනය නිසා සියල්ලෝ භවයෙන් මිදෙත්. අමෘත පදය වූ නිවන ස්පර්ශ කෙරෙත්.

4357. යම් කලෙක්හි පසැස් ඇති ආලොකවත් වූ බුදුවරයෝ ලොව උපදිත් ද. ඔහු කෙලෙස් දවා ආලොකය දක්වත්.

4358. මෙසේ ලොකාග්‍රනායක වූ තිස්ස බුදුරජුන්හට සතුති කොට සතුටු වූයෙම් සතුටු සිතින් බෝලිද් ද (මල්) පිදීමි.

4359. ලොකාග්‍රනායක වූ තිස්ස බුදුරජ තෙමේ මාගේ අදහස දැන සිය අසුනෙහි වැඩ හිඳ මේ ගාථාවන් වදාළේ ය.

4360. "යමෙක් තෙම පහන් සිතැත්තේ සියතින් ම මා මල්වලින් වැසී (පිදී)ද, මම හේ කවරෙක්දැ යි කියන්නෙමි. කියන්නා වූ මාගේ වචනය අසවු.

4361. හෙතෙම පස්විසිවරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය. පන්සැත්තෑ වරක් සක්විතිරජ වන්නේ ය.

4362. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං,
තස්ස කම්මස්ස නිස්සන්දො[1] පුප්ඵානං පූජනාය ච.[2]

4363. සීසං න්හාතො ච'හං පොසො පුප්ඵමාකඞ්ඛතෙ යදි,
පුඤ්ඤකම්මෙන සංයුත්තො[3] පුරතො පාතුභවිස්සති.

4364. යං යං ඉච්ඡති කාමෙහි තං තං පාතුභවිස්සති,
සංකප්පං පරිපූරෙත්වා නිබ්බායිස්සතනාසවො.”

(අට්ඨාරසමං භාණවාරං.)

4365. කිලෙසෙ ඣාපයිත්වාන සම්පජානො පතිස්සතො,
එකාසනෙ නිසීදිත්වා අරහත්තමපාපුණිං.

4366. චඞ්කමන්තො නිපජ්ජන්තො නිසින්නො උද වා ඨිතො,
බුද්ධසෙට්ඨං සරිත්වාන විහරාමි අහං සදා.

4367. චීවරෙ පිණ්ඩපාතෙ ච පච්චයෙ සයනාසනෙ,
තත්ථ මෙ ඌනතා නත්ථි බුද්ධපූජායිදං ඵලං.

4368. සො’ දනි පත්තො අමතං සන්තං පදමනුත්තරං,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

4369. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

4370. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4371. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4372. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තිණසූලකච්ඡදනියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

තිණසූලකච්ඡදනියත්ථෙරස්ස අපදානං තතියං.

414. මධුමංසදායකත්ථෙරාපදානං

4373. නගරෙ බන්ධුමතියා සූකරිකො අහොසහං,
උක්කොටකං රන්ධයිත්වා මධුමංසම්හි ඔකිරිං.

4374. සන්නිපාතං අහං ගන්ත්වා එකං පත්තං ගහෙසහං,
පූරයිත්වාන තං පත්තං භික්ඛුසඞ්ඝස්ස'දාසහං.

1. කම්මනිස්සන්දෙන, මජ්සං. 2. සො, ස්‍යා, PTS. 3. සංයුත්තං, මජ්සං.

4362. (ලබන) මහත් වූ ප්‍රදේශ රාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නො හැකිය. මේ පුෂ්ප පූජාවෙන් වූ ඒ කර්මයාගේ ඵලය යි.

4363. පුණ්‍යකර්මයෙන් යුක්ත වූ මේ පුරුෂ තෙමේ හිස නැවේ ඉදිත් මල් කැමති වේ නම් එය ඉදිරියෙහි පහළ වන්නේ ය.

4364. කාමවස්තුන්ගෙන් යමක් යමක් කැමති වේ ද, ඒ ඒ දැය පහළ වන්නේ ය. අදහස සම්පූර්ණ කොට ආස්‍රව රහිතව පිරිනිවන් පාන්නේ ද වන්නේ ය.

(අටළොස් වැනි බණවර යි.)

4365. කෙලෙස් දවා සම්‍යක් ප්‍රඥාවෙන් හා සිහියෙන් යුක්තවූයෙම් ඒ අසුනෙහි ම හිඳ රහත්බවට පැමිණියෙමි.

4366. මම හැම කල්හි සක්මන් කරමින් ද, නිදමින් ද, හිඳිමින් ද, යලි සිටිමින් ද බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේ ගැණ ම සිතා වසමි.

4367. චීවර පිණ්ඩපාත ගිලානප්‍රත්‍යය සයනාසන යන මේ සිවු පසයෙහි මට අඩුබවක් නැත. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4368. ඒ මම දූත් අමෘත වූ ශාන්ත වූ නිරුත්තර පදය වූ නිවනට පැමිණියෙම් වෙමි සියලු ආස්‍රවයන් ප්‍රහාණ කොට ආස්‍රව රහිතව වෙසෙමි.

4369. මෙයින් දෙයානූ වන කපෙහි යම් පුෂ්පපූජාවක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4370. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4371. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

4372. සිවුපිළිසිඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මේ අයුරින් ආයුෂමත් තිණසූලකඡදනිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යි.

තිණසූලකඡදනිය ස්ථවිරවදානය තෙවැනි යි.

414. මධුමංසදායක ස්ථවිරාවදානය

4373. මම බන්ධුමතී නගරයෙහි හූරුවැද්දෙක් වීමි. කැවුනු පපුමස් පිස ඒ මසෙහි මීපැණි වත් කෙළෙමි.

4374. මම භික්ෂූන් රැස් වන (ශාලාවට) ගොස් එක් පාත්‍රයක් ගතිමි. මම ඒ පාත්‍රය මසින් පුරා භික්ෂුසඞ්ඝයාට දුනිමි.

4375. යො'ත්‍ථ ථෙරතරො භික්ඛු නිය්‍යාදෙසි මමං තදා,
ඉමිනා පත්තපූරෙන ලභස්සු විපුලං සුඛං.

4376. ද්වෙසම්පත්තියො භුත්වා සුක්කමූලෙන චොදිතො,
පච්ඡිමෙ වත්තමානම්හි කිලෙසෙ ඣාපයිස්සති.

4377. තස්ස චිත්තං පසාදෙත්වා තාවතිංසං අගච්ඡහං,
තත්‍ථ භුත්වා පිවිත්වා ච ලභාමි විපුලං සුඛං.

4378. මණ්ඩපෙ රුක්ඛමූලෙ වා පුබ්බකම්මං අනුස්සරිං,
අන්නපානාභිවස්සො මෙ අභිවස්සති තාවදෙ.

4379. ඉදං පච්ඡිමකං මය්හං චරිමො වත්තතෙ භවො,
ඉධාපි අන්නපානං මෙ වස්සතෙ සබ්බකාලිකං.

4380. තෙනෙව මංසදානෙන[1] සන්ධාවිත්වා භවෙ අහං,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

4381. එකනවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි මධුදානස්සිදං ඵලං.

4382. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4383. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4384. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්‍ථං සුදං ආයස්මා **මධුමංසදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්‍ථාති.

මධුමංසදායකත්ථෙරස්ස අපදානං චතුත්‍ථං.

415. නාගපල්ලවකත්ථෙරාපදානං*

4385. නගරෙ **බන්ධුමතියා** රාජුය්‍යානෙ වසාමහං,
මම අස්සමසාමන්තා නිසීදි ලොකනායකො.

4386. නාගපල්ලවමාදාය බුද්ධස්ස අභිරොපයිං,
පසන්නචිත්තො සුමනො සුගතං අභිවාදයිං.

4387. එකනවුතෙ ඉතො කප්පෙ යං පල්ලවමපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

1. මධුදානෙන, මජ්සං. * නාගපල්ලවත්ථෙර, මජ්සං.

4375. යමෙක් මේ භික්ෂුපිරිසෙහි වෘද්ධතර ස්ථවිර වී ද, හේ මට පිත් දුන්නේ ය "පාත්‍රය පුරවා දුන් මේ දනින් මහත් සුව ලබාවා.

4376. මේ කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ (දිව්‍ය මනුෂ්‍ය) ද්විවිධ සම්පත් අනුභව කොට අන්තිම භවය පවත්නා කල්හි කෙලශයන් දවන්නේ ය" (කියායි.)

4377. මම එහි හිත පහදවා තව්තිසාවට (උත්පත්ති වශයෙන්) ගියෙමි. එහි (දිව්‍යබොජුන්) අනුභව කොට (දිව්‍යපැන්) පානය කොට මහත් වූ සුව ලබමි.

4378. මඩුවෙක්හි හෝ රුක්මුලක හෝ (හිඳ) පූජීකර්මය සිහි කෙලෙමි ද, එකෙණෙහි මට ආහාර පාන වැසි වසී.

4379. මේ මාගේ පශ්චිම භවය යි. අන්තිම භවය පවතී. මෙහි දු මට හැම කල්හි ආහාර පාන (වැසි) වසී.

4380. මම ඒ මාංසදානය කරණ කොට ගෙණ භවයෙහි සැරිසරු සියලු ආස්‍රවයන් ප්‍රහාණ කොට ආස්‍රව රහිතව වෙසෙමි.

4381. මෙයින් එක් අනූවන කපෙහි වූ එකල්හි යම් දනක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. මධුදානයාගේ මේ විපාක යි.

4382. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4383. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4384. සිවුපිළිසිඹියාවෝ ද අෂටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මේ අයුරින් ආයුෂමත් මධුමාංසදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේක් යී.

මධුමාංසදායක ස්ථවිරාපදානය සිවුවැනි යී.

415. නාගපලලවක ස්ථවිරාපදානය

4385. මම බන්ධුමතී නගරයෙහි රජඋයනෙහි වෙසෙමි. මාගේ අසපුව සමීපයෙහි ලොකනායක වූ බුදුරජහු වැඩහුන් සේක.

4386. මම නාදලු ගෙණ බුදුරජුන් පිදීමි. පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් තථාගතයන් වහන්සේට වැන්දෙමි.

4387. මෙයින් එක් අනූවන කපෙහි යම් නාදලු පූජාවක් කෙලෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4388. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4389. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4390. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා නාගපල්ලවකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

නාගපල්ලවකත්ථෙරස්ස අපදානං පඤ්චමං.

416. එකදීපියත්ථෙරාපදානං

4391. පරිනිබ්බුතම්හි[1] සුගතෙ සිද්ධත්ථෙ ලොකනායකෙ,
සදෙවමානුසා සබ්බෙ පූජෙන්ති දිපදුත්තමං.

4392. ආරොපිතෙ ච චිතකෙ සිද්ධත්ථෙ ලොකනායකෙ,
යථාසකෙන ථාමෙන චිතං පූජෙන්ති සත්ථුනො.

4393. අවිදූරෙ චිතකස්ස දීපමුජ්ජාලයිං අහං,
යාව උදෙති සූරියො දීපං මෙ තාව උජ්ජලි.

4394. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

4395. තත්ථ මෙ සුකතං ව්‍යම්හං එකදීපීති ඤායති,
දීපසතසහස්සානි ව්‍යම්හෙ පජ්ජලරෙ මම.

4396. උදයන්තොව සූරියො දෙහො මෙ ජොතතෙ සදා,
සබ්බභාහි සරීරස්ස ආලොකො හොති මෙ සදා.

4397. තිරොකුඩ්ඩං තිරොසෙලං සමතිග්ගය්හ පබ්බතං,
සමන්තා යොජනසතං පස්සාමි චක්ඛුනා අහං.

4398. සත්තසත්තතික්ඛත්තුඤ්ච දෙවලොකෙ රමිං අහං,
එකතිංසතික්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං.

4399. අට්ඨවීසතික්ඛත්තුඤ්ච චක්කවත්තී අහොසහං,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

4400. දෙවලොකා චවිත්වාන නිබ්බත්තිං මාතුකුච්ඡියං,
මාතුකුච්ඡිගතස්සාපි අක්ඛි මෙ න නිමීලති.

4401. ජාතියා චතුවස්සාහං පබ්බජිං අනගාරියං,
අඩ්ඪමාසෙ අසම්පත්තෙ අරහත්තමපාපුණිං.

1. පරිනිබ්බුතෙ, මජසං.

4388. ක්ලේශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්-රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි.

4389. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත පැමිණීම මට ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4390. සිවුපිළිසිඹියාවෝ ද, අෂ්ට විමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මේ අයුරින් ආයුෂ්මත් **නාගසමාලවක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් සි.

නාගසමාලවක ස්ථවිරාපදානය පස්වැනි සි.

416. එකදීපිය ස්ථවිරාපදානය

4391. ලෝකනායක වූ සිද්ධාර්ථ බුදුරජානන් වහන්සේ පිරිනිවි කල්හි සියලු දිව්‍යමනුෂ්‍යයෝ බුදුරජුන්හට පූජා කෙරෙත්.

4392. සිද්ධාර්ථ බුදුරජුන්ගේ (දෙහය) චිතකයට නැගූ කල්හි සියල්ලෝ තමන්ට හැකි පමණින් ශාස්තෘන් වහන්සේගේ චිතකය පුදත්.

4393. මම් ඒ චිතකයට නුදුරෙහි පහනක් දැල්වීමි. මාගේ පහන හිරු උදාවන තුරු ම දැල්වුනේ ය.

4394. මම මැනවින් කරණ ලද එම කර්ම්ය හෙතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද මිනිස් සිරුර හැර තව්තිසා දෙව්-ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

4395. එහි මට කරණ ලද (=මැවුනු) විමානය " එකදීපී " යි කියනු ලැබේ. මාගේ විමනෙහි දසදහසක් ප්‍රදීපයෝ දැල්වෙත්.

4396. හැම කල්හි මාගේ සිරුර උදාවන හිරු මෙන් බබලයි. මාගේ ශරීරප්‍රභා කරණ කොට ගෙණ හැම කල්හි ආලොකය වේ.

4397. මම පවුරු සරස ද, ගල් සරස ද, පර්වත ද සමන්තයෙන් විනිවිද සියැසින් හාත්පස යොදුන් සියයක් දකිමි.

4398. මම සත්සැත්තෑ වරක් දෙව්ලොවෙහි සිත් අලවා විසීමි. එක්තිස්වරක් දිව්‍යරාජ්‍යය කෙළෙමි.

4399. මම අටවිසි වරක් සක්විතිරජ වීමි (ලබන ලද) මහත් වූ ප්‍රදෙශ රාජ්‍යය ගණනින් වශයෙන් ගිණිය නො හැකි සි.

4400. දෙව්ලොවින් චුතව මවුකුසෙහි උපන්මි. මවුකුසට පැමිණියාවූ ද මාගේ ඇස් නො පිය වේ. (= ඇසිපිය නො වැටේ.)

4401. උත්පත්තියෙන් සිවුවස් වූ මම අනගාරයෙහි සඞ්ඛ්‍යාත සසුනෙහි පැවිදි වීමි. (පැවිදිව) අඩ මසක් පිරෙන්නට පෙර රහත්බවට පැමිණියෙමි.

4402. දිබ්බචක්ඛුං විසොධෙසිං භවා සබ්බෙ සමූහතා,
සබ්බෙ කිලෙසා සඤ්ඡින්නා එකදීපස්සිදං ඵලං.

4403. තිරොකුඩ්ඩං තිරොසෙලං පබ්බතඤ්චාපි කෙවලං,
සමතික්කමම පස්සාමි එකදීපස්සිදං ඵලං.

4404. විසමා මෙ සමා හොන්ති අන්ධකාරො න විජ්ජති,
නාහං පස්සාමි තිමිරං එකදීපස්සිදං ඵලං.

4405. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං දීපමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි දීපදානස්සිදං ඵලං.

4406. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4407. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4408. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං..

ඉත්ථං සුදං ආයස්මා එකදීපියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

එකදීපියත්ථෙරස්ස අපදානං ඡට්ඨං.

417. උච්ඡඞ්ගපුප්ඵියත්ථෙරාපදානං

4409. නගරෙ බන්ධුමතියා අහොසිං මාලිකො තදා,
උච්ඡඞ්ගං පූරයිත්වාන අගමං අන්තරාපණං.

4410. භගවා තම්හි සමයෙ භික්ඛුසඞ්ඝපුරක්ඛතො,
මහතා අනුභාවෙන නිය්‍යාති ලොකනායකො.

4411. දිස්වාන ලොකපජ්ජොතං විපස්සිං ලොකතාරණං,
පුප්ඵං පග්ගය්හ උච්ඡඞ්ගා බුද්ධසෙට්ඨං අපූජයිං.

4412. එකනවුතෙ ඉතො කප්පෙ යං පුප්ඵමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

4413. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4414. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4415. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා උච්ඡඞ්ගපුප්ඵියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

උච්ඡඞ්ගපුප්ඵියත්ථෙරස්ස අපදානං සත්තමං.

4402. දිවැස පිරිසිදු කෙළෙමි. සියලු භවයෝ නසන ලදහ. සියලු කෙලශයෝ සිඳින ලදහ. එක පහනක් පිදීමෙහි මේ විපාක යි.

4403. පවුරු සරස ද ගල් සරස ද හුදු පර්වතය ද, විනිවිද දකිමි. එක පහනක් පිදීමෙහි මේ විපාක යි.

4404. මට විෂමස්ථානයෝ සම වෙති. අඳුරක් නො මැත. මම සන්ධකාරයක් නො දකිමි. එක පහනක් පිදීමෙහි මේ විපාක යි.

4405. මෙයින් සිවු අනූවන කපෙහි වූ එකල්හි යම් පහනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දතිමි. ප්‍රදීපදානයාගේ මේ විපාක යි.

4406. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ අනාස්‍රව ව වෙසෙමි.

4407. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත පැමිණීම මට සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4408. සිවු පිළිසිඹියාවෝ ද, අෂට විමොක්ෂයෝ ද, ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මේ අයුරින් ආයුෂමත් එකදීපිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යී.

එකදීපිය ස්ථවිරාවදානය සවැනි යි.

417. උච්ඡඞ්ගපුෂ්පිය ස්ථවිරාවදානය

4409. මම එකල්හි බන්ධුමතී නගරයෙහි මල්කරුවෙක් වීමි. මල් උකුලක් (ඔඩොක්කුවක්) පුරවාගෙණ ඇතුළු වීථියට ගියෙමි.

4410. එසමයෙහි ලොකනායක වූ භාග්‍යවත් තෙමේ භික්‍ෂුසඞ්ඝයා විසින් පිරිවරන ලදුයේ මහත් වූ අනුභාවයෙන් මාගීයෙහි වඩියි.

4411. ලොව බබුළුවන්නා වූ ලෝවැස්සන් සසරින් එතෙර කරන්නා වූ විපස්සී බුදුරජුන් දැක ඔඩොක්කුවෙන් මල් ගෙණ පිදීමි.

4412. මෙයින් එක් අනූවන කපෙහි යම් පුෂපදානයක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දතිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4413. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. සියලු ආස්‍රවයෝ ක්‍ෂය වූහ. දැන් පුනර්භවයෙක් නැත.

4414. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත පැමිණීම මට සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4415. සිවුපිළිසිඹියාවෝ ද අෂටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මේ අයුරින් ආයුෂමත් උච්ඡඞ්ගපුෂ්පිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක් යී.

උච්ඡඞ්ගපුෂ්පිය ස්ථවිරාවදානය සත්වැනි යි.

418 යාගුදායකත්ථෙරාපදානං

4416. අතිථිං මෙ ගහෙත්වාන අගච්ඡිං ගාමකං තදා,
සම්පුණ්ණනදිකං දිස්වා සඞ්ඝාරාම මුපාගමිං.

4417. ආරඤ්ඤකා ධුතධරා ඣායිනො ලූඛචීවරා,
විවෙකාභිරතා ධීරා සඞ්ඝාරාමෙ වසන්ති තෙ.

4418. ගතී තෙසං උපච්ඡින්නා සුවිමුත්තාන තාදිනං,
පිණ්ඩාය තෙ න ගච්ඡන්ති ඔරුද්ධනදිතාය හි.

4419. පසන්නචිත්තො සුමනො වෙදජාතො කතඤ්ජලී,
තණ්ඩුලං මෙ ගහෙත්වාන යාගුදානමදාසහං.

4420. පඤ්චන්නං යාගුං දත්වාන පසන්නො සෙහි පාණිහි,
සකකම්මාභිරද්ධො'හං තාවතිංසමගච්ඡහං.

4421. මණිමයඤ්ච මෙ ව්‍යම්හං නිබ්බත්ති තිදසෙ ගණෙ,
නාරීගණෙහි සහිතො මොදාමි ව්‍යම්හමුත්තමෙ.

4422. තෙත්තිංසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජමකාරයිං,
තිංසක්ඛත්තුං චක්කවත්තිමහාරජ්ජමකාරයිං.

4423. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං,
දෙවලොකෙ මනුස්සෙ වා අනුභොත්වා යසං අහං.

4424. පච්ඡිමෙ භවෙ සම්පත්තෙ පබ්බජිං අනගාරියං,
සහ ඔරොපිතෙ කෙසෙ සබ්බං සම්පටිවිජ්ඣහං.

4425. ඛයතො වයතො වා පි සම්මසන්තො කලෙබරං,
පුරෙ සික්ඛාපදා දානා අරහත්ත මපාපුණිං.

4426. සුදින්නං මෙ දානවරං වාණිජ්ජං සුප්පයොජිතං,
තෙනෙව යාගුදානෙන පත්තො'මහි අචලං පදං.

4427. සොකං පරිද්දවං ව්‍යාධිං දරථං චිත්තතාපනං,
නාභිජානාමි උප්පන්නං යාගුදානස්සිදං ඵලං.

4428. යාගුං සඞ්ඝස්ස දත්වාන පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ,
පඤ්චානිසංසෙ අනුභොමි අහො යාගු සුයිට්ඨතා.

4429. අබ්‍යාධිතා රූපවතා ඛිප්පං ධම්මනිසන්තිතා,
ලාභිතා අන්නපානස්ස ආයු පඤ්චමකං මම.

418. යාගුදායක සථවිරාවදානය

4416. එකල්හි මම මංගෝපකරණ ද ගෙණ ගමකට ගියෙමි. පිරී ගිය නදිය දැක සඞ්ඝාරාමයකට එළඹියෙමි.

4417. ආරණ්‍යක වූ ද, ධුතාඞ්ගධාරී වූ ද, ධ්‍යාන කරන්නා වූ ද රූක්‍ෂචීවර දරන්නා වූ ද, විවෙකයෙහි ඇළුණු ඒ ප්‍රාඥයෝ සඞ්ඝාරාමයෙහි වෙසෙත්.

4418. මැනවින් කෙලෙසුන්ගෙන් මිදුනා වූ තාදීගුණ ඇති ඔවුන්ගේ ගමනාගමනය වැළකුනේ ය. (දිය පිරීමෙන්) ඇවිරුනු ගඟ ඇති බැවින් ඔහු පිඩු පිණිස නො යෙත්.

4419. මම පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් ප්‍රීතිමත් වූයෙම් බඳැඳිලි ඇත්තෙම් මාගේ සහල් ගෙණ කැඳ දනක් දුනිමි.

4420. මම පහන් සිතැත්තෙම් සියතින් ම පස් නමකට කැඳ දන් දී සවකීය කුශලකර්මය කරණ කොට ගෙණ පහන් වූයෙමි. (මරණින් මතු) තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

4421. මට තව්තිසා දෙව්ලොවෙහි මිණිමුවා විමනක් පහළ විය. ඒ උතුම් විමනෙහි දිව්‍යස්ත්‍රීසමූහයා සහිතව සතුටු වෙමි.

4422. තෙතිස් වරක් දෙවෙන්ද්‍රව දිව්‍යරාජ්‍යය කරවීමි. තිස්වරක් චක්‍රවර්තීව මහාරාජ්‍යය කරවීමි.

4423. (ලබන ලද) මහත් වූ ප්‍රදෙශ රාජ්‍යය ගණනින් ගිණිය නො හේ මම දෙව්ලොව ද මිනිස්ලොව ද යසස් අනුභව කොට–

4424. පශ්චිම භවය පැමිණි කල්හි අනගාරයවූ සඞ්ඛ්‍යාත සසුනෙහි පැවිදි වීමි. මම හිස කෙහෙ බෑ කෙණෙහි සියල්ල අවබොධ කෙළෙමි.

4425. සිරුර බය – වය වශයෙන් මෙනෙහි කරන්නෙම් සිකපද ගැණීමට පෙරාතුව ම රහත්බවට පැමිණියෙමි.

4426. මා විසින් උතුම් දනක් මැනවින් දෙන ලදී. වෙළෙඳාමක් මොනවට යොදන ලදි. කැඳ දන කරණකොට ගෙණ ම අචලපදය වූ නිවනට පැමිණියෙම් වෙමි.

4427. උපන්නා වූ ශොකයක් හෝ පරිදෙවයක් (= වැලපීමක්) හෝ ව්‍යාධියක් හෝ කල්‍යානනයක් හෝ චිත්තසන්තාපයක් නො දනිමි. කැඳ දනෙහි මේ විපාක යි.

4428. නිරුත්තර පුණ්‍යක්‍ෂෙත්‍ර වූ සඞ්ඝයාට කැඳ දන් දී අනුසස් පසක් ලබමි. කැඳ දන මැනවින් දෙන ලදී. ආශ්චර්‍ය්‍යයෙකි.

4429. මාගේ ලෙඩ නැති බව, රූමත් බව, වහා දහම් පිළිවිදුනා බව, ආහාරපාන (සුලභ ව) ලබන බව හා පස්වැනි අනුසස දීර්ඝායුෂ්ක බව ද වෙයි.

4430. යො කොචි වෙදං ජනයං සඞ්ඝෙ යාගුං දදෙය්‍ය සො,
ඉමානි පඤ්චඨානානි පතිගණ්හෙය්‍ය පණ්ඩිතො.*

4431. තිංස කප්පසහස්සම්හි යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි යාගුදානස්සිදං ඵලං.

4432. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4433. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4434. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **යාගුදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

යාගුදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.

419. පත්ථොදනදායකත්ථෙරාපදානං

4435 වනචාරී පුරෙ ආසිං සතතං වනකම්මිකො,
පත්ථොදනං ගහෙත්වාන කම්මන්තං අගමාසහං.

4436. තත්ථද්දසාසිං සම්බුද්ධං සයම්භුං අපරාජිතං,
වනා පිණ්ඩාය නික්ඛන්තං දිස්වා චිත්තං පසාදයිං.

4437. පරකම්මායනෙ යුත්තො පුඤ්ඤඤ්ච මෙ න විජ්ජති,
අයං පත්ථොදනො අත්ථි භොජයිස්සාමිමං[1] මුනිං.

4438. පත්ථොදනං ගහෙත්වාන සයම්භුස්ස අදාසහං,
මම නිජ්ඣායමානස්ස පරිභුඤ්ජි තදා මුනි.

4439. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

4440. ඡත්තිංසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජමකාරයිං,
තෙත්තිංසක්ඛත්තුං රාජා ච චක්කවත්තී අහොසහං.

4441. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං,
සුඛිතො යසවා හොමි පත්ථොදනස්සිදං ඵලං.

4442. භවාභවෙ සංසරන්තො ලභාමි අමිතං ධනං,
භොගෙ මෙ ඌනතා නත්ථි පත්ථොදනස්සිදං ඵලං.

---

* කරණීයං කතං සබ්බං භවා උග්ඝාටිතා මයා,
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.
සො අහං විචරිස්සාමි ගාමා ගාමං පුරා පුරං,
නමස්සමානො සම්බුද්ධං ධම්මස්ස ච සුධම්මතං - මජසං.

1. භොජයිස්සාමහං. සීමු.

4430. යමෙක් සතුට උපදවමින් සඞ්ඝයා කෙරෙහි කැඳ දෙන්නේ නම් ඒ නැණවත් තෙමේ මේ අනුසස් පස ලබන්නේ ය.

4431. එකල්හි මෙයින් කප්තිස්දහසකට පෙර යම් දනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. කැඳ දනෙහි මේ විපාක යි.

4432. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4433. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

4434. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ට විමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් යාගුදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

යාගුදායක ස්ථවිරාවදානය අටවැනි යි.

419. පත්‍ථොදනදායක ස්ථවිරාවදානය

4435. පෙර මම නිතර වනකම් කරණ වනයෙහි හැසිරෙන්නෙක් වීමි. (සහල්) පතක බතක් ගෙණ කර්මාන්තයට ගියෙමි.

4436. එහි දී සියල්ල තෙමේ ම අවබොධ කළා වූ පස්මරුන් දිනූ සම්බුදු රජුන් දිටිමි. වනයෙන් පිටු පිණිස නික්මෙන්නා වූ (උන්වහන්සේ) දැක සිත පැහැදවීමි.

4437. අනුන්ගේ බැලමෙහෙ කිරීමෙහි යෙදුනා වූ මට පිණක් ද නැත. මේ බත්පතක් ඇත. මෙය මම බුදුරජුන් වළඳවන්නෙමි.

4438. එකල්හි මම බත්පත ගෙණ බුදුරජුන්හට දුනිමි. මා සිතමින් බලා සිටියදී ම තථාගතයන් වහන්සේ වැළඳු සේක.

4439. මම මැනවින් කරණ ලද එම කර්මය හා චිත්තප්‍රණිධීන් කරණ කොට ගෙණ මිනිස්සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

4440. සතිස්වරක් ශක්‍රදෙවෙන්ද්‍ර වූයෙමි දිව්‍යරාජ්‍යය කරවීමි. තෙතිස් වරක් සක්විතිරජ වීමි.

4441. (ලබන ලද) මහත් වූ ප්‍රදෙශ රාජ්‍යය ගණනින් ගිණිය නො හෙයි. සුව ඇත්තෙම් යශස් ඇත්තෙම් ද වෙමි. පතක් පමණ බත් දන් දීමෙහි මේ විපාක යි.

4442. කුදුමහත් භවයෙහි සැරිසරමින් අපමණ ධනය ලබමි. මාගේ භොගසම්පත්තියෙහි අඩුබවෙක් නැත. බත්පතක් දීමෙහි මේ විපාක යි.

4443. නදීසොතපටිභාගා භොගා නිබ්බත්තරෙ මම,
පරිමෙතුං න සක්කොමි පත්ථොදනස්සිදං ඵලං.

4444. ඉමං ඛාද ඉමං භුඤ්ජ ඉමම්හි සයනෙ සය,
තෙනාහං සුඛිතො හොමි පත්ථොදනස්සිදං ඵලං.

4445. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි පත්ථොදනස්සිදං ඵලං.

4446. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4447. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4448. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පත්ථොදනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

පත්ථොදනදායකත්ථෙරස්ස අපදානං නවමං.

420. මඤ්චදායකත්ථෙරාපදානං

4449. පරිනිබ්බුතෙ කාරුණිකෙ සිද්ධත්ථෙ ලොකනායකෙ,
විත්ථාරිතෙ පාවචනෙ දෙවමානුසසක්කතෙ.

4450. චණ්ඩාලො ආසහං තත්ථ ආසන්දිපීඨකාරකො,
තෙන කම්මෙන ජීවාමි තෙන පොසෙමි දාරකෙ.

4451. ආසන්දිං සුකතං කත්වා පසන්නො සෙහි පාණිහි,
සයමෙවූපගන්ත්වාන භික්ඛුසඞ්ඝස්ස'දාසහං.

4452 තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

4453. දෙවලොකගතො සන්තො මොදාමි තිදසඞ්ගණෙ,[1]
සයනානි මහග්ඝානි නිබ්බත්තන්ති යදිච්ඡකං.

4454 පඤ්ඤාසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජමකාරයිං,
අසීතික්ඛත්තුං රාජා ච චක්කවත්ති අහොසහං.

1. තිදසෙ ගණෙ, මඡසං.

4443 මට ගඟදියදහර මෙන් භෝගසම්පත්තිහු නිපැදෙත්. පමණ කළ නො හැක්කෙමි. බත්පතක් දීමෙහි මේ විපාක යි.

4444. 'මෙය කව, මෙය වළඳව, මේ යහන්හි හොව' යි ඒ පැවරීමෙන් මම සුඛිත වෙමි. බත්පතක් දීමෙහි මේ විපාක යි.

4445. එකල්හි මෙයින් සිවුඅනූවන කප්හි යම් දනක් දුනිම් ද එයින් දුගතියක් නො දනිමි. බත්පතක් දීමෙහි මේ විපාක යි.

4446. මා විසින් කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකුමෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4447. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

4448. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසෙයින් ආයුෂමත් පඤ්චදීපදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේකි.

පඤ්චදීපදායක ස්ථවිරාවදානය නවවැනි යි.

420. මඤ්චදායක ස්ථවිරාවදානය

4449. කාරුණික වූ සිද්ධාර්ථ බුදුරජුන් පිරිනිවි කල්හි දෙව්මිනිසුන් විසින් සත්කාර කරණ ලද (උන්වහන්සේගේ) සසුන පැතිරී යන කල්හි,

4450. මම එහි දික්සහලාපුටු තනන්නා වූ සැඩොලෙක් වීමි. එම කර්මාන්තයෙන් ජීවත් වෙමි. එයින් අඹුදරු පොෂණය කරමි.

4451. මම පහන් වූයෙම් සියතින් ම දික්හගලා පුටුවක් මැනවින් කොට තමන් ම ගොස් භික්‍ෂුසඞ්ඝයාට දිනිමි.

4452. මැනවින් කරණ ලද කර්මය ද චිත්තප්‍රණිධීන් ද කරණකොට ගෙණ මම මිනිස්සිරුර හැර තව්තිසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

4453. දෙව්ලොව ගියෙම් තිදස්දෙව්ගණයෙහි සතුටු වෙමි. රිසි සේ මාහැගි සයනයෝ නිපැයෙත්.

4454. පණස් වරක් දෙවෙන්ද්‍ර වූයෙම් දිව්‍යරාජ්‍යය කරවීමි. අසූවරක් සක්විතිරජ වීමි.

4455. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං,
සුඛිතො යසවා හොමි මඤ්චදානිස්සිදං ඵලං.

4456. දෙවලොකා චවිත්වාන එමි වෙ මානුසං භවං,
මහාරහා සුසයනා සයමෙව භවන්ති මෙ.

4457. අයං පච්ඡිමකො මය්හං චරිමො වත්තතෙ භවො,
අජ්ජාපි සයනෙ කාලෙ[1] සයනං උපතිට්ඨති.

4458. චතුනවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි මඤ්චදානස්සිදං ඵලං.

4459. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4460. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4461. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා මඤ්චදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

මඤ්චදායකත්ථෙරස්ස අපදානං දසමං.

උද්දානං:

භද්දාලි එකඡත්තො ච තිණසූලො ච මංසදො,
නාගපල්ලවිකො දීපී උච්ඡඞ්ගී යාගුදායකො.
පත්ථොදනී මඤ්චදදො ගාථායො ගණිතා චිහ,
ද්වෙසතානි ච ගාථානං ගාථා චෙකා තදුත්තරිං.*

භද්දාලිවග්ගො ද්වාචත්තාළීසතිමො.

421. සකිංසම්මජ්ජකත්ථෙරාපදානං.

4462. විපස්සිනො භගවතො පාටලිං බොධිමුත්තමං,
දිස්වාව තං පාදපග්ගං තත්ථ චිත්තං පසාදයිං.

4463. සම්මජ්ජනිං ගහෙත්වාන බොධිං සම්මජ්ජි තාවදෙ,
සම්මජ්ජිත්වාන තං බොධිං අවන්දිං පාටලිං අහං.

4464. තත්ථ චිත්තං පසාදෙත්වා සිරෙ කත්වාන අඤ්ජලිං,
නමස්සමානො තං බොධිං ගච්ඡිං පටිකුටී[2] අහං.

4465. චාරිමග්ගෙන[3] ගච්ඡාමි සරන්තො බොධිමුත්තමං,
අජගරො මං පීළෙසි ඝොරරූපො මහාබලො.

1. සයනකාලෙ, ස්‍යා. 2. පටිකුටිං, මජසං. 3. තාදිමග්ගෙන, මජසං.

* අස්මිං වග්ගෙ දිස්සමානගාථානං
ගණනා එකසතචතුනවුතීති පඤ්ඤායති.

4455. (ලබන ලද) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණනින් ගිණිය නො හෙයි. සුඛිත වූයෙම් යශස් ඇත්තෙම් ද වෙමි. මඤ්චදායකයාගේ මේ විපාක යි.

4456. ඉදින් දෙව්ලොවින් ච්‍යුතව මිනිස් ලොවට එම් නම් මට මාහැඟි සයනයෝ තුමූ ම පහළ වෙත්.

4457. මේ මාගේ පශ්චිම වූ අන්තිම භවය පවතී. අදත් හෝනා කල්හි සයනයක් එළඹ සිටී.

4458. එකල්හි මෙයින් සිවු අනූවන කපෙහි යම් දනක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. මඤ්චදායකයාගේ මේ විපාක යි.

4459. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4460. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

4461 සිවුපිළිසැඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥාවෝ ද, සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙලෙසින් ආයුෂ්මත් **මඤ්චදායක** සථවිරයන් වහන්සේ මේ ගාථා වදාළ සේකි.

මඤ්චදායකසථවිරාවදානය දසවැනියි.

උද්දානය:

හඬුලි එකඡත්ත තිණසූල ද මංසද
නාගපල්ලවික දීපි උච්ඡඞ්ගී යාගුදායක
පත්‍ථොදනී මඤ්චදද දසවත් ය මෙහි දක් වූ
දෙසිය එක් ගයකින් එය ගිණුයේ.*

හඬුලිවර්ගය දෙසාළිස් වැනි යි

421. සකිංසම්මජ්ජක සථවිරාවදානය

4462. **විපස්සී** බුදුරජුන්ගේ උතුම් වූ පාටලී (=පළොල්) බොධි වෘක්ෂරාජයා දුක එහි සිත පැහැද වීමි.

4463. එකෙණෙහි මම මුස්න ගෙණ බෝ (මළුව) හැමැද්දෙමි. හැමැද ඒ පාටලී බෝධියට වැන්දෙමි.

4464. මම එහි සිත පහදවා හිසෙහි ඇඳිලි බැඳ ඒ බොධියට (ගෞරවයෙන්) නැමුනෙම් (ඉවත්ව) ගියෙමි.

4465. (මම) උතුම් බොධිය සිහිකෙරෙමින් අඩිපාරකින් යමි. (එහි දී) මහත් බල ඇති ඝොර රූප වූ පිඹුරෙක් මා පෙළී ය.

* මේ වර්ගයෙහි දක්වෙන ගාථා ගණන එක්සිය සිවු අනූවෙකි

4466. ආසන්නෙ මෙ කතං කම්මං ඵලෙන තොසයී මමං,
කළෙබරං[1] මෙ ගිලති දෙවලොකෙ රමාමහං.

4467. අනාවිලං මම චිත්තං විසුද්ධං පණ්ඩරං සදා,
සොකසල්ලං න ජානාමි චිත්තසන්තාපනං මම.

4468. කුට්ඨං ගණ්ඩො කිලාසො ච අපමාරො විතච්ඡිකා,
දද්දු කණ්ඩු ච මෙ නත්ථි ඵලං සම්මජ්ජනෙ ඉදං.[2]

4469. සොකො ච පරිදෙවො ච හදයෙ මෙ න විජ්ජති,
අභන්තං උජුකං චිත්තං ඵලං සම්මජ්ජනෙ ඉදං.

4470. සමාධීසු න සජ්ජාමි[3] විසදං හොති මානසං,
යං යං සමාධිමිච්ඡාමි සො සො සම්පජ්ජතෙ මම.[4]

4471. රජනීයෙ න රජ්ජාමි අථො දොසනියෙසු ච,[5]
මොහනීයෙ න මුය්හාමි ඵලං සම්මජ්ජනෙ ඉදං.

4472. එකනවුතෙ ඉතො[6] කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඵලං සම්මජ්ජනෙ ඉදං.

2473. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4474. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4475. පටිසම්භිදා චතස්සො විමොක්ඛා පි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සකිංසම්මජ්ජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

සකිංසම්මජ්ජකත්ථෙරස්ස අපදානං පඨමං.

422. එකදුස්සදායකත්ථෙරාපදානං

4476. නගරෙ හංසවතියා අහොසිං තිණහාරකො,
තිණහාරෙන ජීවාමි තෙන පොසෙමි දාරකෙ.

4477. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මාන පාරගූ,
තමන්ධකාරං නාසෙත්වා උප්පජ්ජි ලොකනායකො.

1. කළෙවරං, මඡසං. 2. සම්මජ්ජනාසිදං, මඡසං. 3. නමජ්ජාමි, මඡසං.
4. සම්පජ්ජයෙ, සීමු. සම්පජ්ජතෙ මමං, මඡසං. 5. දුස්සනියෙසු ච, මඡසං.
6. එකනවුතිතො, මඡසං.

4466. මරණාසන්නයෙහි මා විසින් කරණ ලද (බොධිපූජා) කර්මය විපාකයෙන් මා සතුටු කරවී ය. (පිඹුරා) මාගේ ශරීරය ගිලියි. මම දෙව්ලොව සිත් අලවා වසමි.

4467. මාගේ සිත හැමකල්හි නිශ්චල ය. පිරිසිදු ය. නිර්මල ය. ශොක-ශූලයක් හෙවත් ශොකයෙන් ඇතිවන පීඩාවක් නො දනිමි. මාගේ චිත්තසන්තාපයක් ද නො දනිමි.

4468. කුෂ්ට ය, ගණ්ඩ (=ගෙඩි) ය, කිලාස (=කැසිලි) ය. අපස්මාර (=මීමැස්මොර) ය, විතච්ඡිකා (සම ගැලවී යන කුෂ්ට) ය, දද්දු(=දද) ය, කණ්ඩු (=කැසුම්) ය යන මේ රොගයෝ මට නැත. මේ හැමදීමේ විපාක යි.

4469. ශොකය ද, පරිදෙව (=වැලපීම) ද මාගේ හෘදයෙහි (සිතෙහි) නැත. සිත භ්‍රාන්ත නො වූයේ (=නැති නො ගත්තේ) ඍජු ය. මෙය හැමදීමෙහි විපාක යි.

4470. සමාධීන්හි නො ලැගෙමි. සිත ප්‍රකට (=පැහැදිළි) ය. යම් යම් සමාධියක් කැමැත්තෙම් නම් ඒ ඒ සමාධිය මට සමෘද්ධ වේ.

4471. ඇලිය යුතු දෑයෙහි නො ඇලෙමි. යලි ද්වෙෂ කටයුතු දෑයෙහි (ද්වෙෂ නො කරමි). මුළා විය යුතු දෑයෙහි මුළා නො වෙමි. මෙය හැමදීමෙහි විපාක යි.

4472. එකල්හි, මෙයින් එක් අනූවන කපෙහි යම් කර්මයක් කෙලෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. හැමදීමෙහි මේ විපාක යි.

4473. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකුමෙන් බැඳුම් සිඳ අාස්‍රව රහිතව වෙසෙමි.

4474. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ ද, අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

4475. සිවුපිළිසැඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥාවෝ ද, සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසෙයින් ආයුෂමත් **සකිංසම්මජ්ජක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

සකිංසම්මජ්ජක ස්ථවිරාවදානය පළමුවැනි යි.

422. එකදුස්සදායක ස්ථවිරාවදානය

4476. මම **හංසවතී** නගරයෙහි තෘණහාරකයෙක් - තණවෙළෙන්දෙක් වීමි. තෘණ විකිණීමෙන් ජීවත් වෙමි. එයින් අඹුදරුවන් පොෂණය කරමි.

4477. සර්වධර්මයන්ගේ පරතෙරට ගිය ලොකනායක වූ **පදුමුත්තර** නම් බුදුරජ තෙම මොහාන්ධකාරය නසා ලොව පහළ විය.

4478. සකෙ සරෙ නිසීදිත්වා එවං චින්තෙසි තාවදෙ,
බුද්ධො ලොකෙ සමුප්පන්නො දෙය්‍යධම්මො න විජ්ජති.

4479. ඉදං මෙ සාටකං එකං නත්ථි මෙ කොචි දායකො,
දුක්ඛො නිරයසම්ඵස්සො රොපයිස්සාමි දක්ඛිණං.

4480. එවාහං චින්තයිත්වාන සකං චිත්තං පසාදයිං,
එකං දුස්සං ගහෙත්වාන බුද්ධසෙට්ඨස්සදාසහං.

4481. එකදුස්සං දදිත්වාන උක්කුට්ඨිං සම්පවත්තයිං,
යදි බුද්ධො තුවං වීර තාරෙහි මං මහාමුනි.

4482. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
මම දානං පකිත්තෙන්තො අකා මෙ අනුමොදනං:

4483. "ඉමිනා එකදුස්සෙන චෙතනාපණිධීහි ච,
කප්පසතසහස්සානි විනිපාතං න ගච්ඡසි.

4484. ඡත්තිංසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සසි,
තෙත්තිංසක්ඛත්තුං රාජා ච චක්කවත්ති භවිස්සසි.

4485. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං,
දෙවලොකෙ මනුස්සෙ වා සංසරන්තො තුවං භවෙ.

4486. රූපවා ගුණසම්පන්නො අනවක්කන්තදෙහවා,
අක්ඛොභං අමිතං දුස්සං ලභිස්සසි යදිච්ඡකං."

4487. ඉදං වත්වාන සම්බුද්ධො ජලජුත්තමනායකො,
නභං අබ්භුග්ගමී ධීරො හංසරාජා'ව අම්බරෙ.

4488. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
භොගෙ මෙ ඌනතා නත්ථි එකදුස්සස්සිදං ඵලං.

4489. පදුද්ධාරෙ පදුද්ධාරෙ දුස්සං නිබ්බත්තතෙ මම,
හෙට්ඨා දුස්සම්හි තිට්ඨාමි උපරිච්ඡදනං මම.

4490. චක්කවාළමුපාදාය සකානනං සපබ්බතං,
ඉච්ඡමානො චහං අජ්ජ දුස්සෙහච්ඡාදයෙය්‍ය තං.

4491. තෙනෙව එකදුස්සෙන සංසරන්තො භවාභවෙ,
සුවණ්ණවණ්ණො හුත්වාන සංසරාමි භවාභවෙ.

4478. එකෙණෙහි (මම) ස්වකීය ගෘහයෙහි හිඳ මෙසේ සිතීමි: බුදුරජතෙමේ ලොව පහළ විය. දෙය්‍යධර්මයක් (=දියයුතු දෙයක්) නැත.

4479. මේ මංගේ එක ම සාටක (=වස්ත්‍ර) ය යි. මට අනෙක් දෙන කෙනෙක් ද නැත. නිරයස්පර්ශය (= නිරයෙහි දැවීම) දුකය. දක්ෂිණාවක් (=දානමය පුණ්‍යබීජයක්) රෝපණය කරන්නෙමි යි.

4480. මම මෙසේ සිතා සිය සිත පැහැද වීමි. මම් එක ම වස්ත්‍රය ගෙණ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි.

4481. එක ම වස්ත්‍රය දී ප්‍රීතිඝොෂා පැවත් වීමි. "මහාමුනීන් වහන්ස, වීරයන් වහන්ස, ඉදින් ඔබ බුදුවරයෙක් නම් මා (සසරසයුරින්) එතෙර කරණු මැනව."

4482. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ පදුමුත්තර බුදුරජ තෙමේ මාගේ දානය පසසන්නේ මට අනුමෝදනා කෙළේ ය:

4483. "මේ එක ම වස්ත්‍රදානය හෙතු කොට ගෙණ ද, චිත්තප්‍රණිධීන් හෙතුකොට ගෙණ ද, කල්පලක්‍ෂයක් (ඔබ) දුගතියකට නොයේ.

4484. සතිස් වරක් දෙවෙන්‍ද්‍ර ව දිව්‍යරාජ්‍යය කරන්නෙහි ය. තෙතිස් වරක් සක්විතිරජ වන්නෙහි ය.

4485. (ලබන) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණනින් ගිණිය නො හෙයි. ඔබ දෙව්ලොව හෝ මිනිස්ලොව හෝ භවයෙහි සැරිසරන්නේ ය.

4486. රූමත් වූයේ ගුණවත් වූයේ අනුන් විසින් මැඩ පැවැත්විය නො හැකි දෙහයක් ඇත්තේ කැමැති පරිදි නිසල වූ අපමණ වූ වස්ත්‍ර ලබන්නෙහි ය."

4487. ප්‍රාඥ වූ පදුමුත්තර නම් වූ බුදුරජ තෙම මෙය වදරා අහසෙහි (යන) හස්රදකු මෙන් අහසට නැංගේ ය.

4488. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක උපදිම් ද, මාගේ භොගසම්පත්තියෙහි අඩුබවෙක් නැත. එක ම වස්ත්‍රදානයාගේ මේ විපාක යි.

4489. පියවරක් පියවරක් පාසා මට වස්ත්‍ර උපදී. වස්ත්‍ර යට සිටිමි. මට උඩුවියනක් වේ.

4490. මම අද කැමැති වන්නෙම් නම් සක්වළගල පටන් කොට වනයන් සහිත පර්වතයන් සහිත ඒ හැම තැන වස්ත්‍රයෙන් වසන්නෙමි.

4491. ඒ එක ම වස්ත්‍රදානය හෙතු කොට ගෙණ කුදුමහත් භවයන්හි සැරිසරන්නෙම් ස්වර්ණවර්ණ ව සැරිසරමි.

4492. විපාකං එකදුස්සස්ස නාජ්ඣගං කත්ථචික්ඛයං,
අයං මෙ අන්තිමා ජාති විපච්චති ඉධාපි මෙ.

4493. සතසහස්සෙ ඉතො කප්පෙ යං දුස්සමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි එකදුස්සස්සිදං ඵලං.

4494. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො’ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4495. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4496. පටිසම්භිදා චතස්සො විමොක්ඛා’පි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකදුස්සදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

එකදුස්සදායකත්ථෙරස්ස අපදානං දුතියං.

423. එකාසනදායකත්ථෙරාපදානං

4497. හිමවන්තස්ස අවිදූරෙ **ඝොසිතො** නාම පබ්බතො,
අස්සමො සුකතො මය්හං පණ්ණසාලා සුමාපිතා.

4498. **නාරදො** ඉති නාමෙන **කස්සපො** ඉති මං විදූ,
සුද්ධිමග්ගං ගවෙසන්තො වසාමි ගොසිතෙ තදා.

4499. **පදුමුත්තරො** නාම ජිනො සබ්බධම්මානපාරගූ,
විවෙකකාමො සම්බුද්ධො ආගච්ඡි අනිලඤ්ජසා.

4500. වනග්ගෙ ගච්ඡමානස්ස දිස්වා රංසිං මහෙසිනො,
කට්ඨමඤ්චං පඤ්ඤපෙත්වා අජිනඤ්ච අපත්ථරිං.

4501. ආසනං පඤ්ඤපෙත්වාන සිරෙ කත්වාන අඤ්ජලිං,
සොමනස්සං පවෙදෙත්වා ඉදං වචනමබ්‍රවිං:

4502. සල්ලකත්තො මහාවීර ආතුරානං තිකිච්ඡකො,
මමං රොගපරෙතස්ස තිකිච්ඡං දෙහි නායක.

4503. කල්ලත්ථිකා යෙ පස්සන්ති බුද්ධසෙට්ඨ තුවං මුනෙ,
ධුවත්ථසිද්ධිං පප්පොන්ති එතෙසං ජජ්ජරො භවො.

4492. එක ම වස්ත්‍රදානයාගේ විපාකය කිසිතැනෙක්හි ක්‍ෂයට නො පැමිණියේ ය. මේ මාගේ අන්තිම ජාතිය යි. මෙහි ද මට (එය) විපාක දෙයි.

4493. එකල්හි මෙයින් ලක්‍ෂයක් වන කපෙහි යම් වස්ත්‍රයක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. එක ම වස්ත්‍රදානයාගේ මේ විපාක යි.

4494. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකුමෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4495. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

4496. සිවුපිළිසැඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් **එකදුස්සදායක** ස්ථවිරයන් වහන්සෙ මේ ගාථාවන් වදාළ සේකි.

එකදුස්සදායක ස්ථවිරාවදානය දෙවැනි යි.

423. එකාසනදායක ස්ථවිරාවදානය

4497. හිමවතට නුදුරෙහි **ගොසිත** නම් පර්වතයක් විය. මට (එහි) අසපුවක් කරණ ලදි. පන්සලක් ද මවන ලදි.

4498. එකල්හි මම නමින් **නාරද** වෙමි. (ලෝවැස්සෝ) මා **කාශ්‍යප** යයි ද දනිති. නිර්වාණමාර්ගය සොයමින් ගොසිත පර්වතයෙහි වසමි.

4499. සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය **සුමෙධ** නම් බුදුරජ තෙමේ විවෙකසුව කැමැත්තේ අහසින් (එවනයට) වැඩියේ ය.

4500. වනග වඩිනා මහර්ෂි වූ බුදුරජානන් වහන්සේගේ රශ්මිය දැක දඬු ඇඳ පණවා අඳුන් දිවිසම ද අතුලෙමි.

4501. අසුන පණවා හිසෙහි ඇඳිලි බැඳ සොම්නස දත්වා මේ වචනය කීමි:

4502. මහාවීරයන් වහන්ස, (ඔබ) රොගීනට ප්‍රතිකාර කරණ ශල්‍ය වෛද්‍යවරයෙකි. (ලොක) නායකයන් වහන්ස, (සංසාර) රොගයෙන් ආතුර වූ මට බෙහෙදක් දෙනු මැනව.

4503. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්ස, මුනීන් වහන්ස, නිවන් කැමැත්තා වූ යම්කෙනෙක් තුමූ ඔබ වහන්සේ දකිත් ද එකාන්තයෙන් ඔහු අජර සිද්ධියට පැමිණෙත්. මොවුන්ගේ භවය දුරු වේ. (අවසන් වේ.)

4504. න මෙ දෙය්‍යං තව අත්ථි[1] පවත්තඵලභොජි'හං,
ඉදං මෙ ආසනං අත්ථි නිසීද කට්ඨමඤ්චකෙ.

4505. නිසීදි තත්ථ භගවා අසම්භීතො'ව[2] කෙසරී,
මුහුත්තං වීතිනාමෙත්වා ඉදං වචනමබ්‍රවි:

4506. "විස්සත්ථො[3] හොහි මා භායි ලද්ධො ජොතිරසො තයා,
යං තුය්හං පත්ථිතං සබ්බං පරිපූරිස්සතනාගතෙ.[4]

4507. න මොඝං තං කතං තුය්හං පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ,
සක්කා උද්ධරිතුං අත්තා යස්ස චිත්තං පණීහිතං.

4508. ඉමිනාසනදානෙන චෙතනාපණිධීහි ච,
කප්පසතසහස්සානි විනිපාතං න ගච්ඡසි.

4509. පඤ්ඤාසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සසි,
අසීතික්ඛත්තුං රාජා ච චක්කවත්ති භවිස්සසි.

4510. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං,
සබ්බත්ථ සුඛිතො හුත්වා සංසාරෙ සංසරිස්සසි."

4511. ඉදං වත්වාන සම්බුද්ධො ජලජුත්තමනායකො,
නභං අබ්භුග්ගමී ධීරො හංසරාජාව අම්බරෙ.

4512. හත්ථියානං අස්සයානං සරථං සන්දමානිකං,
ලභාමි සබ්බමෙවෙතං එකාසනස්සිදං ඵලං.

4513. කානනං පවිසිත්වාපි යදා ඉච්ඡාමි ආසනං,
මම සඞ්කප්පමඤ්ඤාය පල්ලඞ්කො උපතිට්ඨති.

4514. වාරිමජ්ඣගතො සන්තො යදා ඉච්ඡාමි ආසනං,
මම සඞ්කප්පමඤ්ඤාය පල්ලඞ්කො උපතිට්ඨති.

4515. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
පල්ලඞ්කසතසහස්සානි පරිවාරෙන්ති මං සදා.

4516. දුවෙ භවෙ සංසරාමි දෙවත්තෙ අථ මානුසෙ,
දුවෙ කුලෙ පජායාමි ඛත්තියෙ අථ බ්‍රාහ්මණෙ.

4517. එකාසනං දදිත්වාන පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ,
ධම්මපල්ලඞ්කමාදාය විහරාමි අනාසවො.

4518. සතසහස්සෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි එකාසනස්සිදං ඵලං.

1. න මෙ දෙය්‍යධම්මා අත්ථි, මජසං. 2. අඡම්භිතොව, මජසං.
3. විස්සට්ඨො, මජසං. 4. පරිපූරෙස්සති නාගතො, මජසං.
පරිපූරිස්සතාසනං, ස්‍යා.

4504. මම ස්වයංපතිත (ඉබේ ගසින් වැටුනු) ඵල අනුභව කරන්නෙක්මි. ඔබවහන්සේට පිදියයුතු දෙයක් මට නැත. මාගේ මේ අසුන ඇත. දඹුමැස්සෙහි වැඩ හිඳිනු මැනව.

4505. භාග්‍යවතුන් වහන්සේ නිර්භීත වූ සිංහරාජයකු මෙන් එහි වැඩහුන් සේක. මොහොතක් කල් ගෙවා මේ වචනය වදාළ සේක:

4506 "විශ්වාසය ඇත්තේ වව. බියපත් නො වෙව. තා විසින් ජෝතිරස මැණික ලබන ලදි. තා විසින් යමක් පතන ලද නම් ඒ සියල්ල අනාගතයෙහි සම්පූර්ණ වන්නේ ය.

4507. නිරුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍රයෙහි තා විසින් ඒ කරණ ලද පුණ්‍යකර්මය හිස් නො වේ: යම් අදහසක සිත පිහිටුවන ලද නම් ඒ අදහස තමා (සසර සයුරින්) ගොඩ ලන්නට සමත් වන්නේ ය.

4508. මේ ආසනදානය හෙතුකොට ගෙණ ද චිත්තප්‍රණිධියෙන් හෙතුකොට ගෙණ ද (ඔබ) සියක් කප්කල් මුළුල්ලෙහි දුගතියකට නො යෙහි ය.

4509. පණස්වරක් දෙවෙඳු ව දිව්‍යරාජ්‍යය කරන්නෙහි ය. අසූ වරක් සක්විතිරජ වන්නෙහි ය.

4510. (ලබන්නා වූ) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණනින් ගිණිය නො හැකිය. හැම තන්හි සුවපත් ව සසරෙහි හැසිරෙන්නෙහි ය'යි.

4511. පදුමුත්තර නම් වූ බුදුරජ තෙම මේ වචන කියා ආකාශයෙහි යන හස්රජකු මෙන් අහසට නැංගේ ය.

4512. හස්තියාන ය අශ්වයාන ය රථසහිත වූ සන්දමානික (පල්ලැක් කිය) යන මේ සියල්ල ලබමි. එකාසනදානයාගේ මේ විපාක යි.

4513. යම් කලෙක්හි වනයට පිවිස ද අසුනක් කැමති වෙම් නම් මාගේ අදහස දන පර්‍ය්‍යඞ්කයක් එළඹ සිටී.

4514. යම් කලෙක්හි ජලමධ්‍යයට ගියෙම් අසුනක් කැමති වෙම් නම් මාගේ අදහස දන පළඟක් එළඹ සිටී.

4515. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක උපදිම් ද ඒ සියලු කල්හි සියක් දහසක් පර්‍ය්‍යඞ්කයෝ මා පිරිවරත්.

4516. දිව්‍ය මනුෂ්‍ය දෙගතියෙහි සැරිසරමි. ක්‍ෂත්‍රියබ්‍රාහමණ දෙකුලෙහි ම උපදිමි.

4517. නිරුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍රයෙහි එක් අසුනක් පුදා දහම්පලඟ ගෙණ ආස්‍රව රහිතව වෙසෙමි.

4518. එකල්හි මෙයින් සියක් දහස් වන කපෙහි යම් දනක් දිනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. එකාසනදානයාගේ මේ විපාක යි.

4519. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4520. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4521. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **එකාසනදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

එකාසනදායකත්ථෙරස්ස අපදානං තතියං.

424. සත්තකදම්බපුප්ඵියත්ථෙරාපදානං

4522. හිමවන්තස්ස අවිදූරෙ **කදම්බො**[1] නාම පබ්බතො,
තස්මිං පබ්බතපස්සම්හි සත්ත බුද්ධා වසිංසු තෙ.

4523. කදම්බං පුප්ඵිතං දිස්වා පග්ගහෙත්වාන අඤ්ජලිං,
සත්ත මාලා ගහෙත්වාන පුඤ්ඤචිත්තෙන ඔකිරිං.

4524. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

4525. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

4526. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4527. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4528. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සත්තකදම්බපුප්ඵියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

සත්තකදම්බපුප්ඵියත්ථෙරස්ස අපදානං චතුත්ථං.

1. කුක්කුලො, මජසං.

4519. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4520. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

4521. සිවුපිළිසැඹියාවෝ ද, අෂ්ටවිමොක්‍ෂයෝ ද, ෂඩභිඥවෝ ද, සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසෙසින් ආයුෂමත් ඒකාසනදායක සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේකි.

ඒකාසනදායකසථවිරාවදානය තෙවැනි යි.

424. සත්තකදම්බපුප්ඵියසථවිරාවදානය

4522. හිමවතට නුදුරෙහි කදම්බ නම් පර්වතයෙකි. ඒ පර්වත-පාර්ශ්වයෙහි ඒ සත් (පසේ) බුදුවරයෝ ම වැඩ විසූහ.

4523. පිපුණු කොළොම් ගසක් දැක ඇඳිලි බැඳ මල්සතක් ගෙණ පුණ්‍යචිත්තයෙන් උඩට දැමීමි.

4524. මැනැවින් කරණ ලද එම කර්මය හෙතුකොට ගෙණ ද චිත්ත-ප්‍රණිධීන් හෙතුකොට ගෙණ ද මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්-ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

4525. එකල්හි, මෙසින් සිවු අනූවන කපෙහි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4526. මා විසින් කෙලශයෝ දවන ලදහ. හැම භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ අනාස්‍රව ව වෙසෙමි.

4527. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

4528. සිවුපිළිසැඹියාවෝ ද, අෂ්ටවිමොක්‍ෂයෝ ද, ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජනන් වහන්ගේ සසුන කරණ ලදි.

මෙසෙසින් ආයුෂමත් සත්තකදම්බපුප්ඵිය සථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේකි.

සත්තකදම්බපුප්ඵියසථවිරාවදානය සිවුවැනි යි.

425. කොරණ්ඩපුප්ඵියත්ථෙරාපදානං

4529. වනකම්මිකො පුරෙ ආසිං පිතුමාතුමතෙනහං,[1]
පසුමාරෙන ජීවාමි කුසලං මෙ න විජ්ජති.

4530. මම ආසයසාමන්තා තිස්සො ලොකග්ගනායකො,
පදානි තීණි දස්සෙසි අනුකම්පාය චක්ඛුමා.

4531. අක්කන්තෙ ච පදෙ දිස්වා තිස්සනාමස්ස සත්ථුනො,
හට්ඨො හට්ඨෙන චිත්තෙන පදෙ චිත්තං පසාදයිං.

4532. කොරණ්ඩං පුප්ඵිතං දිස්වා පාදපං ධරණීරුහං,
සකොටකං[2] ගහෙත්වාන පදසෙට්ඨං අපූජයිං.[3]

4533. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

4534. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
කොරණ්ඩවණ්ණකො යෙව සප්පභාසො භවාමහං.

4535. එකනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පදපූජායිදං ඵලං.

4536. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4537. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4538. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා කොරණ්ඩපුප්ඵියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

කොරණ්ඩපුප්ඵියත්ථෙරස්ස අපදානං පඤ්චමං.

426. ඝතමණ්ඩදායකත්ථෙරාපදානං

4539 සුචින්තිතං භගවන්තං ලොකජෙට්ඨං නරාසභං.
උපවිට්ඨං මහාරඤ්ඤං වාතාබාධෙන පීළිතං.
දිස්වා චිත්තං පසාදෙත්වා ඝතමණ්ඩං උපානයිං.

4540. කතත්තා ආචිතත්තා ච ගඞ්ගා භාගීරථී අයං,
මහාසමුද්දා චත්තාරො ඝතං සම්පජ්ජරෙ මම.

---

1. පිතුපෙතාමහෙනහං, සීමු. 2. සකොසකං, මජසං.
3. පදසෙට්ඨම්පූජයිං, මජසං.

425. කොරණ්ඩපුප්ඵියත්ථෙරාවදානය

4529 පෙර මම වනකාර්මිකයෙක් (-දඩයම් කරන්නෙක්) වීමි මම මවුපියන්ගේ අනුමතයෙන් සිවුපාවුන් මැරීමෙන් ජීවත් වෙමි. මට පිනෙක් නැත.

4530. මාගේ ගෙපැල සමීපයෙහි පසැස් ඇති ලොකාග්‍රනායක වූ **තිස්ස** බුදුරජ තෙමේ ලොකානුකම්පාවෙන් තුන් පියවරක් දැක්වී ය.

4531. තිස්ස නම් වූ බුදුරජුන් තැබූ පියවර දැක සතුටු වූයෙම් සතුටු සිතින් පිය සටහනෙහි සිත පැහැදවීමි.

4532. මම පිපීගිය කරඹු රුකක් දැක (එසින්) කිණිති සහිත මල්ගෙණ ශ්‍රෙෂ්ඨ පදලස පිදීමි.

4533. මැනැවින් කරණ ලද ඒ කර්මය කරණකොට ගෙණ ද චිත්ත ප්‍රණිධීන් කරණකොට ගෙණ ද මම මිනිස් සිරුර හැර තව්තිසාවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

4534. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක උපදිම් ද මම කරඹුමල් පැහැ ඇතියෙම් ම ප්‍රභා සහිතයෙම් වෙමි.

4535. මෙසින් දෙයානූවන කපෙහි වූ එකල්හි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පදපූජාවෙහි මේ විපාක සි.

4536. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිත ව වෙසෙමි.

4537. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4538 සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙසින් ආයුෂමත් **කොරණ්ඩපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මෙම ගාථාවන් වදාල සේකි.

කොරණ්ඩපුප්ඵියත්ථෙරාවදානය පස්වැනි සි.

426. සතමණ්ඩදායකත්ථෙරාවදානය

4539. (සිවුසස් දහම් පිළිබඳව) මැනැවින් සිතූ ලොක ජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ මහවනයට පිවිසියා වූ වාතාබාධයකින් පෙළුනා වූ බුදුරජුන් දැක සිත පහදවා (ඉතා පිරිසිදු) ගිතෙල් මණ්ඩයක් පිළිගැන්වීමි.

4540. (මෙම පුණ්‍ය කර්මය) කරණ ලද බැවින් රැස්කරණ ලද බැවින් මේ **භාගීරථී** නදිය ද සිවුමහ මුහුදු ද මට ගිතෙල් සපයති.

4541. අයං ච පඨවී ඝොරා අප්පමාණා අසඞ්ඛියා,
මම සඞ්කප්පමඤ්ඤාය භවතෙ මධුසක්කරා.

4542. චතුද්දීපා[1] ඉමෙ රුක්ඛා පාදපා ධරණීරුහා,
මම සඞ්කප්පමඤ්ඤාය කප්පරුක්ඛා භවන්ති තෙ.

4543. පඤ්ඤාසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජමකාරයිං,
එකපඤ්ඤාසක්ඛත්තුඤ්ච චක්කවත්ති අහොසහං,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

4544. චතුනවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඝතමණ්ඩස්සිදං ඵලං.

4545. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4546. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4547. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා ඝතමණ්ඩදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ඝතමණ්ඩදායකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.

427. එකධම්මසවණීයත්ථෙරාපදානං

4548. **පදුමුත්තරො** නාම ජිනො සබ්බධම්මානපාරගූ,
චතුසච්චං පකාසෙන්තො සන්තාරෙසි බහුං ජනං.

4549. අහං තෙන සමයෙන ජටිලො උග්ගතාපනො,
ධුනන්තො වාකචීරානි ගච්ඡාමි අම්බරෙ තදා.

4550. බුද්ධසෙට්ඨස්ස උපරි ගන්තුං න විසහාමහං,
පක්ඛීව සෙලමාසජ්ජ ගමනං න ලභාමහං.

4551. උදකෙ'වොක්කමිත්වාන එවං ගච්ඡාමි අම්බරෙ,
න මෙ ඉදං භූතපුබ්බං ඉරියාපථවිකොපනං.

4552. හන්දමෙතං ගවෙසිස්සං අප්පෙව'ත්ථං ලභෙය්‍යහං,
ඔරොහන්තො අන්තලික්ඛා සද්දමස්සොසි සත්ථුනො.

1. චාතුද්දීසා, සයා. චතුද්දීපා, මජසං.

4541. මේ ඝොර වූ අප්‍රමාණ වූ අසංඛ්‍ය වූ පෘථිවිය ද මාගේ අදහස දූත මීසකුරු බවට පත් වේ.

4542. සිවුමහදිවයිනෙහි පොළොවෙහි වැඩුනු මේ සියලු වෘක්ෂ පාදපයෝ (වෙත්ද) එ හැම මාගේ අදහස දූත කල්පවෘක්ෂයෝ වෙත්.

4543. මම පණස් වරක් දෙවෙන්ද්‍ර ව දිව්‍යරාජ්‍යය කරවීමි. එක් පණස් වරක් සක්විතිරජ වීමි. (ලබන ලද) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය මෙතෙකැයි ගණන් වශයෙන් ගිණිය නො හැකි ය.

4544. එකල්හි මෙයින් සිවූ අනූවන කපෙහි යම් (ගිතෙල්) දනක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ගිතෙල් මණ්ඩදානයාගේ මේ විපාක සි.

4545. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි.

4546. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

4547. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසෙයින් ආයුෂ්මත් සතමණ්ඩදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

සතමණ්ඩදායක ස්ථවිරාවදානය සවැනි සි.

427. එකධම්මසවණියස්ථවිරාවදානය

4548. සියලු ධර්මයන්හි පරතෙරට ගිය පදුමුත්තර නම් බුදුරජ තෙමේ සිවුසස් පවසමින් බොහෝ දෙනා (සසරසයුරින්) එතෙර කරවී ය.

4549. එසමයෙහි මම උග්‍රතපස් ඇති ජටාධරයෙක් (තවුසෙක්) වීමි. වැහැරිසිවුරු සලමින් අහසෙහි යමි.

4550. එකල්හි මම බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ (හිස) මතුයෙහි යන්නට නො සමත් වෙමි. මම ශෛලපර්වතයකට පැමිණ පක්ෂියකු මෙන් ගමන් නො ලබමි.

4551. (පෙර) දියෙහි මෙන් කිමිද මෙසේ අහසෙහි යමි. මාගේ මේ ඉරියාපථ විකොපනය (ඉරියවු වැරදීම) පෙර නො වූ විරූ ය.

4552. "එකාන්තයෙන් මෙය පිරික්සං බලන්නෙමි. අර්ථයක් ලබන්නෙම් නම් ඉතා යෙහෙකැ" යි (සිතා) අහසින් බසින්නෙම් බුදුරජුන්ගේ ශබ්දය ඇසීමි.

4553. සරෙන රජනීයෙන සවණීයෙන වග්ගුනා,
අනිච්චතං කථෙන්තස්ස තස්සෙව උග්ගහිං තදා.

4554. අනිච්චසඤ්ඤං උග්ගය්හ අගමාසිං මමස්සමං,
යාවතායුං වසිත්වාන තත්ථ කාලකතො අහං.

4555. චරිමෙ වත්තමානම්හි සද්ධම්මසවණං සරිං,
තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

4556. තිංසකප්පසහස්සානි දෙවලොකෙ රමිං අහං,
එකපඤ්ඤාසක්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං.

4557. එකවීසතික්ඛත්තුඤ්ච චක්කවත්ති අහොසහං,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

4558. අනුභොසිං[1] සකං පුඤ්ඤං සුඛිතොහං භවාභවෙ,
අනුස්සරාමි තං සඤ්ඤං සංසරන්තො භවාභවෙ,
න කොටිං පටිවිජ්ඣාමි නිබ්බානං අච්චුතං පදං.

4559. පිතු ගෙහෙ නිසීදිත්වා සමණො භාවිතින්ද්‍රියො,
කථයං[2] පරිදීපෙන්තො අනිච්චතමුදාහරි.

4560. අනිච්චා වත සංඛාරා උප්පාදවයධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති තෙසං වූපසමො සුඛො.

4561. සහ ගාථං සුණිත්වාන පුබ්බසඤ්ඤමනුස්සරිං,
එකාසනෙ නිසීදිත්වා අරහත්තමපාපුණිං.

4562. ජාතියා සත්තවස්සෙන අරහත්තමපාපුණිං,
උපසම්පාදයී බුද්ධො ධම්මසවණස්සිදං ඵලං.

4563. සතසහස්සෙ ඉතො කප්පෙ යං ධම්මමසුණිං තදා,
දුග්ගතිං නාභිජානාමි ධම්මසවණස්සිදං ඵලං.

4564. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4565. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1. අනුභොමි, මජ්සං. 2. කථංස, මජ්සං.

4553. එකල්හි සිත් ඇලවිය යුතු ශ්‍රවණීය වූ මනොඥ වූ ස්වරයෙන් අනිත්‍යතාව දෙසන්නා වූ (උන්වහන්සේගේ) ඒ ධර්මය ම උගතිමි.

4554. මම අනිත්‍ය සංඥව ඉගෙන මාගේ අසපුවට ගියෙමි. එහි දිවි ඇතිතාක් වැස කලුරිය කළෙම් වෙමි.

4555 අන්තිම අවස්ථාව පවත්නා කල්හි (-මරණාසන්නයෙහි) එම ධර්මශ්‍රවණමය පින සිහි කෙළෙමි. මැතැවින් කරණ ලද එම කර්මය කාරණ කොට ගෙණ ද, මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

4556. මම කල්ප තිස්දහසක් දෙව්ලොව සිත් අලවා විසීමි. එක් පණස් වරක් දිව්‍ය රාජ්‍යය ද කරවීමි.

4557. මම එක්විසිවරක් සක්විතිරජ වීමි. (ලබන ලද) ප්‍රදෙශ රාජ්‍යය මෙතෙකැයි ගණන් වශයෙන් ගිණිය නො හැකි ය.

4558. මම කුදු මහත් භවයෙහි සුඛිත වූයෙමි. සවකීය පුණ්‍ය (ඵල)ය අනුභව කෙළෙමි. (එසේ ම) කුදු මහත් භවයෙහි සැරිසරමින් එම (අනිත්‍ය) සංඥව සිහිකරමි. අච්‍යුත පද සඞ්ඛ්‍යාත නිර්වාණය නො පිළිවිදිමි.

4559. පියාගේ ගෘහයෙහි වැඩ හිඳ (එබන ලද ශ්‍රද්ධා වීර්‍ය්‍ය ආදී ඉන්ද්‍රියයන් ඇති බැවින්) භාවිතින්ද්‍රිය වූ ශ්‍රමණ (බුදුරජ) තෙම (සිව්සස්) දක්වමින් (දහම්) දෙසන්නේ (සංස්කාරයන්ගේ) අනිත්‍ය බව වදාළේ ය.

4560 "එකාන්තයෙන් සියලු සංස්කාරයෝ අනිත්‍යයහ උත්පත්තිය හා විනාශය සවභාව කොට ඇත්තාහ. ඇතිව නැති වෙත්. එම සංස්කාරයන්ගේ සන්හිඳීම සුවයෙකි" යි.

4561. ගාථාව ඇසීම හා සමගම පූර්ව (අනිත්‍ය) සංඥව සිහි කෙළෙමි එම අසුනෙහි ම හිඳ රහත් බවට පැමිණියෙමි

4562. උත්පත්තියෙන් සත්හැවිරිදි කල්හි රහත් බවට පැමිණියෙමි. බුදුරජ තෙම මා උපසපන් කරවීය. ධර්මශ්‍රවණයෙහි මේ විපාක යි.

4563. එකල්හි මෙසිත් සියක් දහස් වන කපෙහි යම් ධර්මයක් ඇසුයෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ධර්මශ්‍රවණයාගේ මේ විපාක යි.

4564. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි.

4565. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4566. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා එකධම්මසවණීයො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

එකධම්මසවණීයත්ථෙරස්ස අපදානං සත්තමං.

428. සුචින්තිතත්ථෙරාපදානං

4567. නගරෙ හංසවතියා අහොසිං කස්සකො තදා,
කසිකම්මෙන ජීවාමි තෙන පොසෙමි දාරකෙ.

4568. සුසම්පන්නං තදා ඛෙත්තං ධඤ්ඤං මෙ ඵලිතං[1] අහු,
පාකකාලෙ ච සම්පත්තෙ එවං චින්තෙසහං තදා.

4569. නච්ඡන්නං නප්පතිරූපං ජානන්තස්ස ගුණාගුණං,
යො'හං සඞ්ඝෙ අදත්වාන අග්ගං භුඤ්ජෙය්‍ය වෙ තදා.

4570. අයං බුද්ධො අසමසමො ද්වත්තිංසවරලක්ඛණො,
තතො පභාවිතො සඞ්ඝො පුඤ්ඤක්ඛෙත්තො අනුත්තරො

4571. තත්ථ දස්සාමහං දානං නවසස්සං පුරෙ පුරෙ,
එවාහං චින්තයිත්වාන හට්ඨො පීණිතමානසො.

4572. ඛෙත්තතො ධඤ්ඤමාහත්වා[2] සම්බුද්ධමුපසඞ්කමිං,
උපසඞ්කම්ම සම්බුද්ධං ලොකජෙට්ඨං නරාසභං,
වන්දිත්වා සත්ථුනො පාදෙ ඉමං වචනමබ්‍රවිං.

4573. නවසස්සං ච සම්පන්නං ආයාගො පි[3] ච ත්වං මුනෙ,
අනුකම්පමුපාදාය අධිවාසෙහි චක්ඛුම.

4574. පදුමුත්තරො ලොකවිදූ ආහුතීනං පටිග්ගහො,
මම සඞ්කප්පමඤ්ඤාය ඉමං[4] වචනමබ්‍රවි.

4575. "චත්තාරො ච පටිපන්නා චත්තාරො ච ඵලෙ ඨිතා,
එස සඞ්ඝො උජුභූතො පඤ්ඤාසීලසමාහිතො.

4576. යජන්තානං මනුස්සානං පුඤ්ඤපෙක්ඛාන පාණිනං,
කරොතොපධිකං පුඤ්ඤං සඞ්ඝෙ දින්නං මහප්ඵලං.

1. ඵලිතා, මජ්සං. 2. ධඤ්ඤමාහරිත්වා, සීමු.
3. ආයාගොසි, මජ්සං. ඉධහොසි, ස්‍යා. 4. ඉදං, මජ්සං.

4566. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් එකධම්මසවණීය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

එකධම්මසවණීය ස්ථවිරාපදානය සත්වැනි යි.

428. සුචින්තිතස්ථවිරාපදානය

4567. එකල්හි මම හංසවතී නගරයෙහි ගොවියෙක් වීමි. කෘෂිකර්මයෙන් ජීවත් වෙමි. එයින් අඹුදරුවන් පොෂණය කරමි.

4568. එකල්හි කෙත මැනැවින් සමෘද්ධ ය. මාගේ ධාන්‍යය ද එල දරිණි. ශස්‍ය පස්නා දවස් පැමිණි කල්හි මම මෙසේ සිතීමි:

4569. "යම් බඳු වූ මම ඉදින් අග්‍රශස්‍යය සඞ්ඝයාට නො දී වළඳන් නෙම් නම්, එකල්හි ගුණ - අගුණ දන්නා වූ මා වැනියනට එය නුසුදුසු ය. නො හොබනේ ය.

4670. මේ දෙතිස්මහපුරිස්ලකුණෙන් හෙබි අසමසම බුදුරජ තෙමේ ය. නිරුත්තර පුණ්‍යක්ෂෙත්‍ර වූ සඞ්ඝ තෙම එයින් (-එම බුදුරජුන් ගෙන්) ප්‍රභූත විය.

4571. මම පළමු පළමුව එම සඞ්ඝයා කෙරෙහි නවශස්‍යදානය දෙමි. මම මෙසේ සිතා සතුටු වූයෙම් පිනා ගිය සිත් ඇත්තෙම් ද (වීමි)

4572. කෙතින් ධාන්‍ය ගෙණවුත්, බුදුරජුන් වෙත එළඹියෙමි. නරශ්‍රේෂ්ඨ වූ ලොකජ්‍යෙෂ්ඨ වූ සම්බුදුරජුන් වෙත එළඹ ශාස්තෘන් වහන්සේගේ සිරිපා වැඳ මෙම වචනය කීමි:

4573. "නවශස්‍යය ද සමෘද්ධ විය. මුනීන්වහන්ස, දක්ෂිණාර්හයන් වහන්සේ ද ඔබ වෙහි ය. පසැස් ඇත්තානන් වහන්ස, අනුකම්පාව උපදවා මෙය ඉවසා වදාළ මැනව."

4574. ලොකයාගේ පූජාවන් පිළිගන්නා වූ පදුමුත්තර බුදුරජ තෙමේ මාගේ අදහස දැන මෙම වචනය කීය:

4575. ප්‍රතිපන්නයෝ (මාර්ගස්ථ) සිවු දෙනෙකි. (සොවන් ඈ සිවු) ඵලෙහි සිටියෝ සිවු දෙනෙකි. මේ ප්‍රඥාශීලයෙන් යුක් ඍජු භූත සඞ්ඝයා යි.

4576. පින් කැමැත්තා වූ භවසම්පත් දෙන ඖපධික පුණ්‍යකර්ම කරන්නා වූ දන් දෙන මිනිසුන්හට සඞ්ඝයා කෙරෙහි දෙන ලද්ද මහත්ඵල වේ.

4577\. තස්මිං සබ්බෙ පදාතබ්බං[1] නවසස්සං[2] තදෙතරං,
සඞ්ඝතො උද්දිසිත්වාන භික්ඛූ නෙත්වාන සංඝරං.
පටියත්තං ඝරෙ යන්තං[3] භික්ඛුසඞ්ඝස්ස දෙති තං."

4578\. සඞ්ඝතො උද්දිසිත්වාන භික්ඛූ නෙත්වානහං ඝරං,
යං ඝරෙ පටියත්තං මෙ භික්ඛුසඞ්ඝස්සදාසහං.

4579\. තෙන කම්මෙන සුකතෙන චෙතනා පණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

4580\. තත්ථ මෙ සුකතං ව්‍යම්හං සොවණ්ණං සපභස්සරං,
සට්ඨියොජනමුබ්බෙධං තිංසයොජනවිත්ථතං.

(එකූනවීසතිමං භාණවාරං.)

4581\. ආකිණ්ණං භවනං මය්හං නාරීගණසමාකුලං,
තත්ථ භුත්වා පිවිත්වා ච වසාමි තිදසෙ අහං.

4582\. සතානං තිණික්ඛත්තුං ච දෙවරජ්ජමකාරයිං,
සතානං පඤ්චක්ඛත්තුං ච චක්කවත්ති අහොසහං,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

4583 භවාභවෙ සංසරන්තො ලභාමි අමිතං ධනං,
භොගෙ මෙ ඌනතා නත්ථි නවසස්සස්සිදං ඵලං.

4584 හත්ථියානං අස්සයානං සිවිකං සන්දමානිකං,
ලභාමි සබ්බමෙවෙතං නවසස්සස්සිදං ඵලං.

4585\. නවවත්ථං නවඵලං නවග්ගරසභොජනං,
ලභාමි සබ්බමෙවෙතං නවසස්සස්සිදං ඵලං.

4586\. කොසෙය්‍යකම්බලියානි ඛොමකප්පාසිකානි ච,
ලභාමි සබ්බමෙවෙතං නවසස්සස්සිදං ඵලං.

4587\. දාසීගණං දාසගණං නාරියො ච අලඞ්කතා,
ලභාමි සබ්බමෙවෙතං නවසස්සස්සිදං ඵලං.

4588\. න මං සීතං වා උණ්හං වා පරිළාහො න විජ්ජති,
අථො චෙතසිකං දුක්ඛං හදයෙ මෙ න විජ්ජති.

4589\. ඉමං ඛාද ඉමං භුඤ්ජ ඉමම්හි සයනෙ සය,
ලභාමි සබ්බමෙවෙතං නවසස්සස්සිදං ඵලං.

1\. සබ්බෙස්ව දාතබ්බං, මජ්ඣ. සබ්බෙ ච දාතබ්බං ස්‍යා. PTS.
2\. නව සස්සං, මජ්ඣ. 3. සන්තං, මජ්ඣ.

4577. ඒ සඞ්ඝයා කෙරෙහි පිදිය යුතු වූ නවශස්‍ය ද එසේ ම එයින් අධික තවත් දෑය ද සඟුන් උදෙසා භික්ෂූන් සිය ගෙදොරට වැඩමවා (තමන් විසින්) ගෘහයෙහි යමක් පිළියෙල කරණ ලද නම් එය තෙපි භික්ෂුසඞ්ඝයාට දෙව.”

4578. මම සඟුන් උදෙසා භික්ෂූන් (සිය) ගෙදොරට වැඩමවා මා විසින් ගෘහයෙහි යමක් පිළියෙල කරණ ලද නම් (එය) භික්ෂු සඞ්ඝයාට දුනිමි.

4579. මැනවින් කරණ ලද එම කර්මය හෙතුකොට ගෙණ ද, චිත්ත-ප්‍රණිධීන් හෙතුකොට ගෙණ ද, මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්-ලොව (උත්පත්ති වශයෙන්) ගියෙමි.

4580. එහි මැනැවින් කරණ ලද මාගේ විමානය සවණ්ණවණ්ණ ය. ප්‍රභා සහිත ය. සැට යොදුන් උස් ය. තිස්යොදුන් පුළුල් ය.

(එකූන්විසිවැනි බණවර යි.)

4581. මාගේ භවනය ආකීර්ණ ය. දිව්‍යස්ත්‍රී සමූහයාගෙන් ගැවසී ගත්තේ ය. මම ඒ තිදසෙහි කා-බී වසමි.

4582. මම තුන්සිය වරක් දිව්‍යරාජ්‍යය කරවීමි. පන්සිය වරක් සක්විතිරජ වීමි. (ලබන ලද) ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නො හැකි ය.

4583. කුදුමහත් භවයෙහි සැරිසරන්නෙම් අපමණ ධනය ලබමි. මාගේ භොගයෙහි අඩු බවෙක් නැත. නවශස්‍යදානයාගේ මේ විපාක යි.

4584. හස්තියාන ය, අශ්වයාන ය, සිවිකා ය, පල්ලැක්කි ය, යන මේ සියල්ල ලබමි. නවශස්‍යදානයාගේ මේ විපාක යි.

4585. අභිනව වස්ත්‍ර ද අභිනව ඵල ද අභිනව වූ අග්‍රරසභොජන ද යන මේ සියල්ල ලබමි. නවශස්‍යදානයාගේ මේ විපාක යි.

4586. කොසෙය්‍ය ය, කම්බල ය, ඛොම (ඛොමු) ය, කප්පාසික (-කපු) ය, යන මේ සියලු වස්ත්‍රවිශෙෂ ලබමි. නවශස්‍යදානයාගේ මේ විපාක යි.

4587. දාසී සමූහයා ද, දාසසමූහයා ද, අබරණින් සරසන ලද ස්ත්‍රිහු ද යන මේ සියල්ල ලබමි. නවශස්‍යදානයාගේ මේ විපාක යි

4588. මට ශීතය හෝ උෂ්ණය හෝ දැවීමක් හෝ නැත. යලි මාගේ හෘදයයෙහි චෛතසික දුක්කුදු නැත.

4589. “මෙය කාව, මෙය අනුභව කරව, මෙම සයනයෙහි සැතපෙව” යන මේ (මිහිරි වචන) සියල්ල ම ලබමි. නවශස්‍යදානයාගේ මේ විපාක යි.

4590. අයං පච්ඡිමකො දානි චරිමො වත්තතෙ භවො,
අජ්ජාපි දෙය්‍යධම්මො[1] මෙ ඵලං තොසෙති සබ්බදා.

4591. නවසස්සං දදිත්වාන සඞ්ඝෙ ගණවරුත්තමෙ,
අට්ඨානිසංසෙ අනුභොමි කම්මානුච්ඡවිකෙ මම

4592 වණ්ණවා යසවා හොමි මහාභොගො අනීතිකො,
මහෙසක්ඛො[2] සදා හොමි අභෙජ්ජපරිසො සදා.

4593. සබ්බෙ මං අපචායන්ති යෙ කෙචි පථවිස්සිතා,
දෙය්‍යධම්මා ච යෙ කෙචි පුරෙ පුරෙ ලභාමහං.

4594. භික්ඛුසඞ්ඝස්ස වා මජ්ඣෙ බුද්ධසෙට්ඨස්ස සම්මුඛා,
සබ්බෙපි සමතික්කම්ම දෙන්ති මය්හෙව[3] දායකා.

4595. පඨමං නවසස්සං හි දත්වා සඞ්ඝෙ ගණුත්තමෙ,
ඉමානිසංසෙ අනුභොමි නවසස්සස්සිදං ඵලං.

4596. සතසහස්සෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි නවසස්සස්සිදං ඵලං.

4597. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4498. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4599. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං

ඉත්ථං සුදං ආයස්මා **සුචින්තිතො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

සුචින්තිතත්ථෙරස්ස අපදානං අට්ඨමං.

429. සොණ්ණකිඞ්කණියත්ථෙරාපදානං

4600. සද්ධාය අභිනික්ඛම්ම පබ්බජිං අනගාරියං,
වාකචීරධරො ආසිං තපොකම්මමපස්සිතො

4601. අත්ථදස්සී තු භගවා ලොකජෙට්ඨො නරාසභො,
උප්පජ්ජි තම්හි සමයෙ තාරයන්තො මහාජනං.

1. දෙය්‍යධම්මං, සීමු. 2. මහාපක්ඛො, ස්‍යා. 3. මමෙව, මජ්සං.

4590. මේ මාගේ (භවයෙහි) අවසානය යි. දූත් අන්තිම භවය පවතී. අද පවා මාගේ දෙයධර්මයෙහි ඵලය හැම කල් මා සතුටු කරයි.

4591 අති උතුම් සඞ්ඝසමූහයා කෙරෙහි තවශස්‍ය දී මාගේ ඒ කර්මයට සුදුසු වූ අනුසස් අටක් විඳිමි.

4592. මහත් භොගසම්පත් ඇත්තෙම්, යශස් ඇත්තෙම්, වර්ණවත් වූයෙම් වෙමි. හැම කල්හි මහත් වූ පිරිවර ඇත්තෙම් ද, නො බිඳිය හැකි පිරිස් ඇත්තෙම් ද වෙමි.

4593 පෘථිවිය ඇසුරු කළා වූ යමෙක් වෙත් නම් ඒ සියල්ලෝ මට ගරු බුහුමන් කෙරෙත්. යම්කිසි දෙය්‍යධර්මකෙනෙක් වෙත් නම් එය ද මම පළමු පළමු ලබමි.

4594. භික්ෂුසඞ්ඝ මැද හෝ බුදුරජුන් හමුවෙහි හෝ දායකයෝ සියල්ලන් ඉක්මවා මට ම දෙති.

4595 උතුම් සඞ්ඝසමූහයා කෙරෙහි පළමු කොට තවශස්‍ය දී මෙම අනුසස් ලබමි. තවශස්‍යදානයාගේ මේ විපාක යි.

4596. එකල්හි මෙයින් සියදහස් වන කපෙහි වූ යම් දනක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි තවශස්‍ය දානයාගේ මේ විපාක යි.

4597. මා විසින් කෙලශයෝ දවන ලදහ සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4598. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4599. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් සුවිනතික ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

සුවිනතිකස්ථවිරාවදානය අටවැනි යි.

429. සොවණ්ණකිඞ්කණියස්ථවිරාවදානය

4600. සැදැහැයෙන් (ගිහිගෙන්) නික්ම අනගාරික සඞ්ඛ්‍යාත සසුනෙහි පැවිදි වීමි. තපොකර්මයෙහි අපෙක්ෂිත වූයෙම් වැහැරි සිවුරු දරන්නෙම් වීමි.

4601. එසමයෙහි ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ අත්ථදස්සි භාග්‍යවත් තෙමේ මහාජනයා (සසර සයුරින්) තරණය කරමින් (ලොව) පහළ විය.

4602. බලඤ්ච වත මෙ ඛීණං ව්‍යාධිනා පරමෙන තු,
බුද්ධසෙට්ඨං සරිත්වාන පුලිනෙ ථූපමුත්තමං—

4603. කරිත්වා හට්ඨචිත්තෙනාහං සහත්ථෙන සමොකිරිං,
සොණ්ණකිඞ්කණිපුප්ඵානි උදග්ගමනසො අහං.

4604. සම්මුඛා විය සම්බුද්ධං ථූපං පරිචරිං අහං,
තෙන චෙතොපසාදෙන අත්ථදස්සිස්ස තාදිනො.

4605. දෙවලොකං ගතො සන්තො ලභාමි විපුලං සුඛං,
සුවණ්ණවණ්ණො තත්ථාසිං බුද්ධපූජායිදං ඵලං.

4606. අසීතිකොටියො මය්හං නාරියො සමලඞ්කතා,
සදා මය්හං උපට්ඨන්ති බුද්ධපූජායිදං ඵලං.

4607. සට්ඨිතුරියසහස්සානි භෙරියො පණවානි ච,
සඞ්ඛා ච දෙණ්ඩිමා[1] තත්ථ වග්ගූ නදන්ති[2] දුන්දුභී.

4608. චුල්ලාසීතිසහස්සානි හත්ථිනො සමලඞ්කතා,
තිධාපභින්නමාතඞ්ගා කුඤ්ජරා සට්ඨිහායනා—

4609. හෙමජාලාභිසඤ්ඡන්නා උපට්ඨානං කරොන්ති මෙ,
බලකායෙ ගජෙ චෙව ඌනතා මෙ න විජ්ජති.

4610. සොණ්ණකිඞ්කණිපුප්ඵානං විපාකං අනුභොමහං,
අට්ඨපඤ්ඤාසක්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං.

4611 එකසත්තතික්ඛත්තුඤ්ච චක්කවත්ති අහොසහං,
පථව්‍යාරජ්ජං එකසතං මහියා කාරයිං අහං.

4612. සොදානි පත්තො අමතං[3] අසඞ්ඛතං සුදුද්දසං,[4]
සංයොජනපරික්ඛීණො නත්ථිදානි පුනබ්භවො.

4613. අට්ඨාරසෙ කප්පසතෙ යං පුප්ඵමභිරොපයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

4614. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4615 ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4616. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා සොවණ්ණකිඞ්කණියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

සොවණ්ණකිඞ්කණියත්ථෙරස්ස අපදානං නවමං.

1. ඩිණ්ඩිමා, මජසං.
2. වග්ගුවජ්ජන්ති, මජසං.
3. අමතං පත්තො, මජසං.
4. ගම්භීරං දුද්දසං පදං, ස්‍යා.

4602. දුඞ් ව්‍යාධියකින් මාගේ බලය ද ඒකාන්තයෙන් ක්‍ෂය විය. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහි කොට වැලිතෙලෙහි උතුම් සැයක්-

4603. කොට මම සතුටු සිත් ඇත්තෙමි ඔද වැඩි සිතැත්තෙමි සියතින් රත් කිකිණි මල් විසිර වීමි. (-පිදීමි.)

4604 මම බුදුරජුන් හමුයෙහි මෙන් සැයට වතාවත් කෙළෙමි. තාදීගුණ ඇති අත්ථදස්සී බුදුරජුන්හට කරණ ලද එම චිත්තප්‍රසාදය හේතු කොට ගෙණ-

4605. දෙව්ලොවට ගියෙමි මහත් වූ සැප ලබමි. එහි සවණ්ණවණ්ණ වූයෙම් වෙමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4606 මට මනා අබරණින් සරසන ලද සත්‍රිනු අසූකෝටියකි. ඔනු තුමු හැම කල්හි මට උවටැන් කෙරෙත්. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4607. ගැටබෙර (ආදී) සැට දහසක් බෙර ද, සඞ්ඛයෝ ද, පණා බෙර ද යන හෙරීහු මනොඥ ලෙස නාද කෙරෙත්.

4608. සැට වයස් වූ ත්‍රිමදගලිත මාතඞ්ග හස්තිකුලයෙහි උපන් ඇත්තු ද මනා කොට සරසන ලද ඇත්තු ද අසූසාර දහසක් –

4609. රන්දැලින් මලින් ගැවසී ගත්තාහු මට උවටැන් කෙරෙත්. බලසෙනහෙහි ද ඇතුන්ගේ ද අඩුබවෙක් මට නැත.

4610 මම රත්කිකිණී මල් පිදීමෙහි විපාකය විඳිමි. අට පණස් වරක් දිව්‍යරාජ්‍යය කරවීමි.

4611. මම එක්සැත්තෑ වරක් සක්විතිරජ වීමි. මම මේ පෘථිවියෙහි එක්සිය වරක් පෘථිවිරාජ්‍යය ද කරවීමි.

4612. ඒ (මම) දැන් අසංස්කෘත වූ සුදුද්දස (-දැකීම අතිශයින් දුෂ්කර) වූ නිවනට පැමිණියෙමි වෙමි. සියලු සංයොජනයන් ක්‍ෂය කරණ ලදුයෙම් වෙමි. දැන් නැවත ඉපදීමෙක් නැත.

4613. මෙයින් අටලොස්සියවන කපින් පෙර යම් පුෂ්පපූජාවක් කෙළෙමි ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4614. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

4615. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4916. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් සොවණ්ණකිඞ්කණිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

සොවණ්ණකිඞ්කණියස්ථවිරාවදානය නවවැනි යි.

430. සොණ්ණකොන්තරිකත්ථෙරාපදානං

4617. මනොභාවනීයං බුද්ධං අත්තදන්තං සමාහිතං,
ඉරියමානං බ්‍රහ්මපථෙ චිත්තවූපසමෙ රතං.

4618. නිත්තිණ්ණොඝං සම්බුද්ධං ඣායිං ඣානරතං මුනිං,
උපවිට්ඨං සමාපන්නං ඉන්දීවරදලප්පභං.

4619. අලාබුනොදකං ගය්හ බුද්ධසෙට්ඨමුපාගමිං,
බුද්ධස්ස පාදෙ ධොවිත්වා අලාබුකමදාසහං.

4620. ආණාපෙසි ච සම්බුද්ධො පදුමුත්තරනායකො,
ඉමිනා දකමාහත්වා[1] පාදමූලෙ ඨපෙහි මෙ.

4621. සාධූති'හං පටිස්සුත්වා සත්ථුගාරවතාය ච,
දකං අලාබුනා'හිත්වා[2] බුද්ධසෙට්ඨමුපානයිං.

4622. අනුමොදි මහාවීරො චිත්තං නිබ්බාපයං මම,
ඉමිනා ලාබුදානෙන සඞ්කප්පො තෙ සමිජ්ඣතු.

4623. පණ්ණරසසු කප්පෙසු දෙවලොකෙ රමිං අහං,
තිංසතික්ඛත්තුං රාජා ච චක්කවත්තී අහොසහං.

4624. දිවා වා යදි වා රත්තිං චඞ්කමන්තස්ස තිට්ඨතො,
සොවණ්ණකොන්තරං ගය්හ තිට්ඨතෙ[3] පුරතො මම.

4625. බුද්ධස්ස ලාබුං දත්වාන[4] ලභාමි සොණ්ණකොන්තරං,
අප්පකම්පි කතං කාරං විපුලං හොති තාදිසු.

4626. සතසහස්සෙ ඉතො කප්පෙ යං ලාබුමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි අලාබුස්ස ඉදං ඵලං.

4627 කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4628. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4629. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා සොණ්ණකොන්තරිකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

සොණ්ණකොන්තරිකත්ථෙරස්ස අපදානං දසමං.

1. ඉමිනා දකමාහත්වා, සීමු. 2. අලාබුනාහිත්වා, සීමු. 3. තිට්ඨන්ති, සීමු 4. දත්වාන ලාබුං, මජ්සං.

430. සොණ්ණකොන්තරිකත්ථෙරාපදානය

4617. සම්භාවනීය වූ, ආත්මය (-සිත) දමනය කළා වූ, සන්හුන් වූ, ශ්‍රේෂ්ඨ ප්‍රතිපදාමාර්ගයෙහි ගමන් කරන්නා වූ චිත්තව්‍යුපශමයෙහි ඇළුනා වූ, සියල්ල අවබෝධ කළා වූ-

4618. තරණය කරණ ලද චතුරොඝ ඇති ධ්‍යාන කරන්නා වූ, ධ්‍යානයෙහි ඇළුනා වූ, මොනෙය්‍ය ගුණයන්ගෙන් යුතු වූ, වැඩහුන්නා වූ සමාධියට සමවැදුනා වූ උපුල් පෙති පැහැ ඇති, සම්බුදුරජුන් (දුටිමි.)

4619. දඬු ලබුකැටයකින් දිය ගෙණ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත එළඹියෙමි. බුදුරජුන්ගේ සිරිපා දෙවා මම ලබුකැටය දුනිමි.

4620. පදුමුත්තර බුදුරජ තෙමේ "මෙම ලබුකබලින් දිය ගෙනවුත් මාගේ පාමුල තබව"යි අණ කෙළේය.

4621. මම බුද්ධගෞරවයෙන් "යහපතැ" යි පිළිවදන් දී ලබුකබලින් දිය ගෙනවුත් බුද්ධශ්‍රෙෂ්ඨයන් වෙත එළවීමි.

4622. මහාවීර වූ බුදුරජ තෙමේ "මේ ලබුකැටය දීමෙන් තාගේ අදහස් සමෘද්ධ වේ වා" යි මාගේ සිත තිවමින් අනුමෝදනා කෙළේ ය.

4623. මම පසළොස් කපෙක් හි දෙව්ලොව සිත් අලවා විසීමි. එසේ ම තිස් වරක් සක්විති රජ වීමි.

4624. දවල්හි හෝ රෑයෙහි හෝ සක්මන් කරන්නා වූ ද, සිටිනා වූ ද, මාගේ ඉදිරියෙහි රන්කෙණ්ඩියක් ගෙණ (-කිසිවෙක්) සිටී.

4625. බුදුරජුන්හට ලබුකබලක් පුදා රන්කෙණ්ඩියක් ලබමි. තාදීගුණ ඇති උතුමන් කෙරෙහි සවල්ප වශයෙන් කරණ ලද පිණ ද මහත්ඵල වේ.

4626. එකල්හි මෙයින් සියක්දහස් වන කපෙහි යම් ලබු දනක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ලබු දනෙහි මේ විපාක යි.

4627. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි.

4628. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4629. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් සොණ්ණකොන්තරික ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

සොණ්ණකොන්තරික ස්ථවිරාපදානය දසවැනි යි.

උද්දානං:

සකිංසම්මජ්ජකො ථෙරො එකදුස්සී එකාසනී,
කදම්බකොරණ්ඩකදා[1] ඝතං සවණ්ණිකො[2] පි ච.

සුචින්තිතො කිඞ්කණිකො සොණ්ණකොන්තරිකො පි ච,
එකං ගාථාසතඤ්චෙව[3] එකසත්තතියිමෙව ච.

සකිංසම්මජ්ජකවග්ගො තෙචත්තාළීසමො.

431. එකවිහාරියත්ථෙරාපදානං

4630. ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො,
කස්සපො නාම ගොත්තෙන උප්පජ්ජි වදතං වරො.

4631. නිප්පපඤ්චො නිරාලම්බො ආකාසසමමානසො,
සුඤ්ඤතාබහුලො තාදී අනිමිත්තරතො වසී.

4632. අසඞ්ගචිත්තො නික්ලෙසො[4] අසංසට්ඨො කුලෙ ගණෙ,
මහාකාරුණිකො වීරො විනයොපායකොවිදො.

4633. උය්‍යුත්තො පරකිච්චෙසු විනයන්තො සදෙවකෙ,
නිබ්බානගමනං මග්ගං ගති[5] පඞ්කවිසොසනං.

4634. අමතං පරමස්සාදං[6] ජරාමච්චුනිවාරණං,
මහාපරිසමජ්ඣෙ සො නිසින්නො ලොකතාරණො[7].

4635. කරවීකරුතො[8] නාථො බ්‍රහ්මඝොසො තථාගතො,
උද්ධරන්තො මහාදුග්ගා විපන්නද්ධෙ[9] අනායකෙ,

4636. දෙසෙන්තො විරජං ධම්මං දිට්ඨො මෙ ලොකනායකො,
තස්ස ධම්මං සුණිත්වාන පබ්බජිං අනගාරියං.

4637. පබ්බජිත්වා තදා චාහං[10] චින්තෙන්තො ජිනසාසනං,
එකකොව වනෙ රම්මෙ වසිං සංසග්ගපීළිතො.

4638. සකායවූපකස්සා[11] මෙ හෙතුභූතො මහාභවි[12],
මනසො වූපකස්සස්ස[13] සංසග්ගභයදස්සිනො.

4639. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

1. කදම්බකොරණ්ඩකදෙ, මජසං. 2. ඝතසසවනිකොපිච, මජසං.
3. එකගාථා සතඤ්චහ, මජසං. 4. නිල්ලෙපො, සයා.
5. ගතිං, මජසං. 6. පරමස්සාසං, සීමු. 7. ලොකතාරකො, මජසං.
8. කරවීකරුදෙ, සයා. 9. විප්පපනට්ඨෙ, සීමු. මජසං. 10. පාහං, මජසං.
11. සකායවූපකාසො, මජසං. 2. මමාගමි, සයා. PTS.
13. වූපකාසස්ස, මජසං.

උද්දානය:

සකිංසම්මජ්ජක එකදුස්සි එකාසන
කදම්බකොරණ්ඩක ද ඝතමණ්ඩ සවණ්ණික ද
සුචින්තිත කිඞ්කිණික සොණ්ණකොන්තරිකැයි දස
එක්සිය එක්සැත්තෑ ගීයෙන් එය කියන ලදි.

සකිංසම්මජ්ජක වර්ගය තෙසාළිස් වැනියි.

431. එකවිහාරිය ස්ථවිරාපදානය

4630. මේ මහාභද්‍ර කල්පයෙහි බ්‍රාහ්මණ කුලයෙහි උපන් මහා යශස් ඇති, (ඇපි බුදු වම්හයි) කියනුවන් අතුරෙහි ශ්‍රෙෂ්ඨ වූ ගොත්‍රයෙන් කාශ්‍යප නම් වූ බුදුහු ලොවැ පහළ වූහ.

4631. (තෘෂ්ණාදි) ප්‍රපඤ්ච රහිත වූ ආලම්බන රහිත වූ ආකාශසම (නොගැටෙන) සිත් ඇති ශූන්‍යතා බහුල කොට ඇති (ලාභාලාභාදීයෙහි) තාදීගුණ ඇයි අනිමිත්තලක්ෂණ නිවනෙහි ඇලුනු වසඟකළ ඉඳුරන් ඇති-

4632. (රාගාදි විසින්) නො ඇලුනු සිත් ඇති කෙලෙස් රහිත වූ කුලයා කෙරෙහි ගණයා කෙරෙහි නො ඇලුනු මහත් කරුණා ඇති වීර වූ (සත්ත්වයන්) හික්මවන උපායෙහි නිපුණ වූ –

4633-34. පරවැඩෙහි උත්සුක වූ දෙවියන් සහිත ලෝකයා හික්මවන ලොකයා සසරින් එතෙර කරවන යම් බුදු කෙනෙක් මහ පිරිස් මැද වැඩ හුන්නාහු නිවන් ගමනට මාර්ගවූ පස්ගති නමැති කලල් වියලවන පරමාස්වාද වූ ජරාමරණ වළහන අමෘතය දැක්වූ සේක් ද,

4635 කොවුලන්ට බඳු නාද ඇති ලොකනාථ වූ බ්‍රහ්ම ඝොෂ ඇති තථාගත වූ ඒ බුදුහු (මාර්ගදෙශක) නායකයෙකු නැති (එහෙයින්ම) නට මාර්ග ඇති සත්ත්වයන් සංසාර මහාදුර්ගයෙන් නඟාලමින් –

4636. මාර්ග ධර්මය දෙසන ලොකනායක වූ බුදුහු මා විසින් දක්නා ලදහ. ඔබගේ දහම් අසා (මම) ශාසනයෙහි පැවිදි වීමි.

4637. එකල්හි ද මම පැවිදිව ගණ සසඟින් පෙළුනෙම් බුදුසසුන් සිතමින් එකලාව ම සිත්කලු වෙනෙහි වාසය කෙළෙමි.

4638. ගණසංසර්ගයෙහි බිය දක්නා සුළු වූ මාගේ සවකීය කාය විවෙකය චිත්තයාගේ විවෙකයට මහත් හෙතු වූයේ වී.

4639. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4640. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4641. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා එකවිහාරියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති

එකවිහාරියත්ථෙරස්ස අපදානං පඨමං.

432. එකසංඛියත්ථෙරාපදානං

4642. විපස්සිනො භගවතො මහාබොධිමහො අහු,
මහාජනා සමාගම්ම පූජෙන්ති බොධිමුත්තමං.

4643. න හි තං ඔරකං මඤ්ඤෙ බුද්ධසෙට්ඨො භවිස්සති,
යස්සායමෙදිසො[1] බොධි පූජනීයො[2] ච සත්ථුනො.

4644. තතො සඞ්ඛං ගහෙත්වාන බොධිරුක්ඛං උපට්ඨහිං,[3]
ධමෙන්තො සබ්බදිවසං අවන්දිං බොධිමුත්තමං.

4645. ආසන්නකෙ කතං කම්මං දෙවලොකං අපාපයි,
කළෙබරං මෙ පතිතං දෙවලොකෙ රමාමහං.

4646. සට්ඨිතුරියසහස්සානි තුට්ඨහට්ඨා පමොදිතා,
සදා මය්හං උපට්ඨන්ති බුද්ධපූජායිදං ඵලං

4647. එකසත්තතිමෙ කප්පෙ රාජා ආසිං සුදස්සනො,
චාතුරන්තො විජිතාවී ජම්බුසණ්ඩස්ස ඉස්සරො

4648. තතො අඞ්ගසතා තූරා[4] පරිවාරෙන්ති මං සදා,
අනුභොමි සකං කම්මං උපට්ඨානස්සිදං ඵලං.

4649. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
මාතුකුච්ඡිගතස්සාපි වජ්ජරෙ භෙරියො සදා.

4650. උපට්ඨිත්වා[5] සම්බුද්ධං අනුභොත්වාන[6] සම්පදා,
සිවං සුඛෙමං අමතං පත්තොම්හි අචලං පදං.

4651. එකනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

4652. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

---

1. යස්සායං ඊදිසා, මජසං. යස්සායමෙදිසා, සී.මු. 2. පූජනීයො, ස්‍යා. සීමු මජසං.
3. උපට්ඨහං, සී. 4. තූරියා, මජසං 5. උපට්ඨිත්වාන, මජස .
6. අනුභුත්වාන, මජසං.

4640. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණීම මට ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

4641. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසෙයින් ආයුෂ්මත් **එකවිහාරිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

එකවිහාරියස්ථවිරාවදානය පළමුවැනියි.

432. එකසඞ්ඛිය ස්ථවිරාවදානය

5642. **විපස්සී** බුදුරජුන්ගේ මහාබොධියට පූජාවක් විය. **මහජනයා** රැස්ව උතුම් බොධියට පූජා කෙරෙත්.

4643. යම් ශාස්තෘවරයකුගේ බොධිය ද මෙබඳු පූජනීය වස්තුවක් නම්, ඒ උතුමා ලාමක කෙනෙකැයි නො හඟිමි. බුද්ධශ්‍රේෂ්ඨයෙක් වන්නේ ය.

4644 ඉක්බිති සකක් ගෙණ බෝරුක වෙත එළඹියෙමි. මුළු දවසෙහි ම එය පිඹිමින් උතුම් බොධිය වැන්දෙමි.

5645. මරණාසන්න කල්හි කරණ ලද පුණ්‍යකර්මය මා දෙව්ලොවට පැමිණවිය. මාගේ සිරුර මැරී වැටිනි. මම දෙව්ලොව සිත් අලවා වසමි.

4646. තුටුපහටු වූ ප්‍රමුදිත වූ සැටදහසක් තූර්‍ය්‍ය (වාදකයෝ) හැම කල්හි මට උවටැන් කෙරෙත්. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4647. එක්සැත්තෑවන කපෙහි සිවුමහ දිවයින් හා සිව්සයුරු කෙළවර කොට ඇති පෘථිවියට අධිපති වූ සතුරු රජුන් ජයගත්තා සුලු වූ ජම්බුද්වීපයට අධිපති වූ **සුදස්සන** නම් (සක්විති) රජෙක් වීමි.

4648. එහි සප්තාඞ්ගික තූර්‍ය්‍යයෝ හැම කල්හි මා පිරිවරත්. ස්වකීය කර්මය අනුභව කරමි. (බොධි) උපස්ථානයාගේ මේ විපාක යි.

4649. දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක උපදිම් නම් මවුකුස පිළිසිඳ ගත්තා වූ ද (මට) හැම කල්හි හෙරීහු වයනු ලැබෙත්.

4650. සම්බුදුරජුන් වෙත එළඹ, සම්පත් අනුභව කොට අතිශයින් ක්ෂෙම වූ ශිව වූ අමෘත වූ අචලපදය වන නිවනට පැමිණියෙම් වෙමි.

4951 එකල්හි මෙයින් එක්අනූවන කපෙහි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

4652. මා විසින් කෙලශයෝ දවන ලදහ සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4653. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4654. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා එකසඞ්ඛියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

එකසඞ්ඛියත්ථෙරස්ස අපදානං දුතියං.

433 පාටිහීරසඤ්ඤකත්ථෙරාපදානං

4655. පදුමුත්තරො නාම ජිනො ආහුතීනං පටිග්ගහො,
වසීසතසහස්සෙහි නගරං පාවිසී තදා.

4656. නගරං පවිසන්තස්ස උපසන්තස්ස තාදිනො,
රතනානි පජ්ජොතිංසු[1] නිග්ඝොසො ආසි තාවදෙ.

4657. බුද්ධස්ස අනුභාවෙන භෙරී වජ්ජුමඝට්ටිතා,
සයං වීණා පවජ්ජන්ති බුද්ධස්ස විසතො[2] පුරං.

4658. බුද්ධසෙට්ඨං න පස්සාමි[3] පදුමුත්තරං මහාමුනිං,
පාටිහීරං ච පස්සිත්වා තත්ථ චිත්තං පසාදයිං.

4659. අහො බුද්ධො අහො ධම්මො අහො නො සත්ථුසම්පදා,
අචෙතනාපි තුරියා සයමෙව පවජ්ජරෙ.

4660. සතසහස්සෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධසඤ්ඤායිදං ඵලං.

4661. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4662. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4663. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා පාටිහීරසඤ්ඤකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

පාටිහීරසඤ්ඤකත්ථෙරස්ස අපදානං තතියං.

1. පතාදිංසු, PTS. 2. පවිසතො, මජ්සං. 3. නමස්සාමි, මජ්සං.

4653. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණීම මට සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

4654. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් එකාසනිකිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

එකාසනිකියස්ථවිරාවදානය දෙවැනියි.

433. පාටිහීරසඤ්ඤක ස්ථවිරාවදානය

4655. එකල්හි ලොකයාගේ පූජාවන් පිළිගැණීමට යොග්‍ය වූ **පදුමුත්තර** නම් බුදුරජ තෙමේ රහතුන් ලක්‍ෂයක් සමග නුවරට පිවිසියේ ය.

4656. තාදීගුණ ඇති උපශාන්ත වූ (උන්වහන්සේ) නගරයට පිවිසෙන කල්හි රත්නයෝ (තුමූ ම) බැබලුනාහු ය. එකෙණෙහි මහත් ඝොෂාවක් ද විය.

4657. නගරයට පිවිසෙන්නා වූ බුදුරජුන් ඉදිරියෙහි බුද්ධානුභාවයෙන් නො ගටන ලද භෙරීහු (තුමූ ම) ශබ්ද වූවාහු ය. වීණාවෝ තුමූ ම වැයෙත්.

4658. මහාමුනි වූ **පදුමුත්තර** නම් බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ නො දකිමි. ප්‍රාතිහාර්ය්‍යය දැක එහි සිත පැහැද වීමි.

4659. "බුදුරජ තෙම ආශ්චර්ය්‍ය ය. ධර්මය ආශ්චර්ය්‍ය ය. අපගේ ශාස්තෘසම්පත්තිය ද ආශ්චර්ය්‍ය ය. අචෙතන වූ තූර්ය්‍යයෝ පවා තුමූ ම වැයෙත්.

4660. එකල්හි මෙයින් සියදහස් වන කපෙහි යම් බුද්ධසංඥාවක් ලදුයෙම ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධසංඥාවෙහි මේ විපාක යි.

4661. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4662. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණීම මට සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

4663 සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් පාටිහීරසඤ්ඤක ස්ථවිරයන් වහන්සේ මෙම ගාථාවන් වදාළ සේකි.

පාටිහීරසඤ්ඤකස්ථවිරාවදානය තෙවැනියි.

434. ඤාණත්ථවිකත්ථෙරාපදානං

4664. කණිකාරංව ජලිතං දීපරුක්ඛංව ජොතිතං,
කඤ්චනංව විරොචන්තං අද්දසං දිපදුත්තමං.

4665. කමණ්ඩලුං ඨපෙත්වාන වාකචීරං ච කුණ්ඩිකං,
එකංසං අජිනං කත්වා බුද්ධසෙට්ඨං ථවිං අහං.

4666. තමන්ධකාරං විධමං මොහජාලසමාකුලං,
ඤාණාලොකං දස්සයිත්වා[1] නිත්තිණ්ණොසි මහාමුනි.

4667. සමුද්ධරසිමං ලොකං සබ්බාවන්තමනුත්තර[2],
ඤාණෙ තෙ උපමා නත්ථි යාවතා ජගතො ගති.[3]

4668. තෙන ඤාණෙන සබ්බඤ්ඤූ ඉති බුද්ධො පවුච්චති,
වන්දාමි තං මහාවීර සබ්බඤ්ඤුතමනාවරං.

4669. සතසහස්සෙ ඉතො[4] කප්පෙ බුද්ධසෙට්ඨං ථවිං අහං,
දුග්ගතිං නාභිජානාමි ඤාණත්ථවායිදං[5] ඵලං.

4670. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4671. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4672. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා ඤාණත්ථවිකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ඤාණත්ථවිකත්ථෙරස්ස අපදානං චතුත්ථං.

435. උච්ඡුඛණ්ඩිකත්ථෙරාපදානං

4673. නගරෙ බන්ධුමතියා ද්වාරපාලො අහොසහං,
අද්දසං විරජං බුද්ධං සබ්බධම්මාන පාරගුං

4674. උච්ඡුඛණ්ඩකමාදාය බුද්ධසෙට්ඨස්සදාසහං,
පසන්නචිත්තො සුමනො විපස්සිස්ස මහෙසිනො

4675. එකනවුතෙ ඉතො කප්පෙ යං උච්ඡුමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි උච්ඡුඛණ්ඩස්සිදං ඵලං

1. දස්සයිත්වාන, මජසං. 2 අනුත්තරං, සබ්බත්ථ. 3. යාවතා ච ගතොගති, PTS.
4. සතසහස්සිතො, මජසං 5. ඤාණථවනායිදං, සීමු..

434. ඤාණත්ථවිකස්ථවිරාවදානය

4664. කිණිහිරි රුකක් මෙන් දිලිසෙන, ප්‍රදීපවෘක්ෂයක් මෙන් බබලන සවර්ණයක් මෙන් රැස් පතුරුවන ද්විපදෝත්තම වූ බුදුරජුන් දුටිමි.

4665. මම කමණ්ඩලාව ද වැහැරිසිවුර ද කෙණ්ඩිය ද තබා අඳුන් දිවිසම එකස් කොට බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට සතුති කෙළෙමි.

4666. මහාමුනීන් වහන්ස, (ඔබ) මෝහජාලයෙන් අවුල් වූ ගණඳුර නසමින් ඥානාලෝකය දක්වා (සසර සයුරින්) එතර වූ සේක

4667. නිරුත්තර වූ තථාගතයන් වහන්ස, සියලු සත්ත්වයන් සහිත මේ ලෝකය (සසරින්) ගොඩ ලනු මැනව. ලෝකය යම්තාක් ද ඒතාක් ඔබවහන්සේගේ නුවණ විෂයෙහි උපමාවෙක් නැත.

4668. ඒ අනුපම ඥානයෙන් සර්වඥ වූ සේක් "බුද්ධ" යයි කියනු ලැබේ. මහාවීරයන් වහන්ස, ආවරණ රහිත වූ ඒ සර්වඥතාඥානය වඳිමි.

4669. මම මෙසින් සියදහස් වන කපෙහි බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට සතුති කෙළෙමි. (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. සර්වඥතාඥානයට පැසසීමෙහි මේ විපාක යි.

4670 මා විසින් කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4671. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4672. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් ඤාණත්ථවිකස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

ඤාණත්ථවිකස්ථවිරාවදානය සිව්වැනියි.

435. උච්ඡුඛණ්ඩිකස්ථවිරාවදානය

4673. මම බන්ධුමතී නගරයෙහි ද්වාරපාලක වීමි. (එකල්හි) නිර්මල වූ සියලු ධර්මයන්ගේ පරතෙරට ගියා වූ බුදුරජුන් දිටිමි.

4674. මම පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් මහර්ෂී වූ විපස්සී නම් බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේහට උක් කඩක් ගෙන දුනිමි.

4675. එකල්හි මෙසින් එක් අනූවන කපෙහි යම් උක් දනක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. උක්කඩක් දීමේ මේ විපාක යි.

4676. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4677. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4678. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා උච්ඡුඛණ්ඩිකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

උච්ඡුඛණ්ඩිකත්ථෙරස්ස අපදානං පඤ්චමං.

436 කලම්බදායකත්ථෙරාපදානං

4679. රොමසො නාම සම්බුද්ධො වසති පබ්බතන්තරෙ,
කලම්බං තස්ස පාදාසිං පසන්නො සෙහි පාණිහි

4680. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි කලම්බස්ස ඉදං ඵලං.

4681. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4682. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4683. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා කලම්බදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

කලම්බකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.

437. අම්බාටකදායකත්ථෙරාපදානං

4684. විපිනෙ බුද්ධං දිස්වාන සයම්භුං අපරාජිතං,
අම්බාටකං ගහෙත්වාන සයම්භුස්ස අදාසහං.

4685. එකතිංසෙ ඉතො කප්පෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඵලදානස්සිදං ඵලං.

4676. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි.

4677. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ ද අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4678. සිවුපිළිසැඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥාවෝ ද, සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් උච්ඡුඛණ්ඩික ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

උච්ඡුඛණ්ඩිකස්ථවිරාපදානය පස්වැනි යි.

436. කලම්බදායක ස්ථවිරාපදානය

4679 රොමස නම් (පසේ) බුදුන් වහන්සේ කඳු අතරෙහි වැඩ වසන සේක. පහන් වූයෙම් (මම) උන්වහන්සේට සියතින් විලපලා දුනිමි.

4680. එකල්හි මෙයින් සිවුඅනූවන කපෙහි යම් දනක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. විලපලා දනෙහි මේ විපාක යි.

4681. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි.

4682. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4683. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ට විමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් කලම්බදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

කලම්බදායකස්ථවිරාපදානය සවැනියි.

437. අම්බාටකදායක ස්ථවිරාපදානය

4684. මහවනයෙහි දී සියල්ල තෙමේ ම දත් පස් මරුන් දිනූ බුදුරජුන් දැක මම ඇඹරැල්ල (ගෙඩියක්) ගෙණ එම බුදුරජුන් හට දුනිමි.

4685. මෙයින් එක්තිස් වන කපෙහි වූ එකල්හි යම් ඵල දානයක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ඵලදානයාගේ මේ විපාක යි.

4686. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4687. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4688. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අම්බාටකදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

අම්බාටකදායකත්ථෙරස්ස අපදානං සත්තමං.

438. හරීතකදායකත්ථෙරාපදානං

4689. හරීතකං ආමලකං අම්බජම්බු විභීතකං,
කොලං භල්ලාතකං බිල්ලං සයමෙවාහරාමහං.

4690. දිස්වාන පබ්භාරගතං ඣායිං ඣානරතං මුනිං,
ආබාධෙන පපීළෙන්තං[1] අදුතියං මහාමුනිං.

4691. හරීතකං ගහෙත්වාන සයම්භුස්ස අදාසහං,
කතමත්තම්හි[2] භෙසජ්ජෙ ව්‍යාධි පස්සම්භි තාවදෙ.

4692. පහීනදරථො බුද්ධො අනුමොදනියං අකා[3],
භෙසජ්ජදානෙනිමිනා ව්‍යාධිවූපසමෙන ච.

4693. දෙවභූතො මනුස්සො වා ජාතො වා අඤ්ඤජාතියා,
සබ්බත්ථ සුඛිතො හොහි[4] මා ච තෙ ව්‍යාධි ආගමා.[5]

4694. ඉදං වත්වාන සම්බුද්ධො සයම්භූ අපරාජිතො,
නභං අබ්භුග්ගමි ධීරො හංසරාජාව අම්බරෙ.

4695 යතො හරීටකමදං[6] සයම්භුස්ස මහෙසිනො,
ඉමං ජාතිමුපාදාය ව්‍යාධි මෙ නුපපජ්ජථ.

4696 අයං පච්ඡිමකො මය්හං චරිමො වත්තතෙ භවො.
තිස්සො විජ්ජා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

1. ආපීළෙන්තං, මජසං.
2. ඛාදමත්තම්හි, මජසං.
3. අනුමොදමකාසි මෙ, මජසං
4. හොතු, මජසං.
5. ව්‍යාධිමාගමා, මජසං.
6 හරීතකං දින්නං, මජසං.

4686. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි.

4687. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

4688. සිවුපිළිසැඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥාවෝ ද, සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසේසිත් ආයුෂ්මත් **අම්බාටක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

අම්බාටක ස්ථවිරාවදානය සත්වැනියි.

438. හරීතකදායක ස්ථවිරාවදානය

4689. අරළු ද, නෙල්ලි ද, අඹ ද, ජම්බු ද, බුළු ද, ඩෙබර ද, බදුළු ද, බෙලි ද, මම තෙමේ ම රැස් කෙරෙමි.

4690. කඳු බෑවුමක වැඩ හුන් ධ්‍යාන කරන්නා වූ ධ්‍යානයෙහි ඇලුනා වූ ආබාධයකින් පෙළෙන්නා වූ (සමාන කොට තැකීමට) දෙවැන්නකු නැත්තා වූ බුදුරජුන් දැක,

4691. මම අරළු ගෙණ බුදුරජුන් හට දුනිමි. බෙහෙත් කළ කෙණෙහි රෝගය සන්සිඳුනේ ය.

4692. සන්සිඳුනා වූ (කාය) දරථය (කලාන්තය) ඇති බුදුරජ තෙම අනුමෝදනාවක් කළේය: "මෙම බෙහෙත් දන හෙතු කොට ගෙණ ද, රෝගව්‍යුපශමය හෙතුකොට ගෙණ ද,

4693. දෙව් වූයේ හෝ මිනිස් වූයේ හෝ අන් ජාතියක උපන්නේ හෝ ඒ සියලු තන්හි සුව ඇත්තෙක් වෙව. තොපට ව්‍යාධියෙක් නො පැමිණේවා."

4694. සියල්ල තෙමේ ම අවබොධ කළා වූ පස්මරුන් දිනූ සම්බුදුන් වහන්සේ මෙ වචන කියා අහසෙහි යන හස්රජකු මෙන් අහසට නැංගේය.

4695. යම් තැනක පටන් සියල්ල තෙමේ ම දත් බුදුරජුන් හට අරළු දුනිම් ද, (එතැන් පටන්) මේ ජාතිය දක්වා මට ව්‍යාධියෙක්හට නො ගත්තේ ය.

4696. මේ මාගේ (සසරෙහි) අවසානය යි. දූන් අන්තිම භවය පවතී. ත්‍රිවිද්‍යාවෝ සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

4697. චතුන්නවුතෙ ඉතො කප්පෙ භෙසජ්ජමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි භෙසජ්ජස්ස ඉදං ඵලං.

4698. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4699. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4700. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛා'පි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **හරීතකදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

හරීතකදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.

439. අම්බපිණ්ඩියත්ථෙරාපදානං

4701. හත්ථිරාජා තදා ආසිං ඊසාදන්තො උරූළ්හවා,
විචරන්තො බ්‍රහාරඤ්ඤෙ අද්දසං ලොකනායකං.

4702. අම්බපිණ්ඩිං[1] ගහෙත්වාන අදාසිං සත්ථුනො අහං,
පටිගණ්හි මහාවීරො සිද්ධත්ථො ලොකනායකො.

4703. මම නිජ්ඣායමානස්ස පරිභුඤ්ජි තදා ජිනො,
තත්ථ චිත්තං පසාදෙත්වා තුසිතං උපපජ්ජහං.

4704. තතො අහං චවිත්වාන චක්කවත්තී අහොසහං,
එතෙනෙව උපායෙන අනුභොත්වාන සම්පදා.

4705. පධානපහිතත්තොහං උපසන්තො නිරූපධි,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

4706. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඵලදානස්සිදං ඵලං.

4707. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

1. අම්බපිණ්ඩං, මජසං.

4697. මෙයින් අනූවන කපෙහි වූ එකල්හි යම් බෙහෙසත් දනක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බෙහෙත් දනෙහි මේ විපාක යි.

4698. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිතව වෙසෙමි.

4699. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන්වහන්සේගේ සසුන කරණ ලදී.

4700. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ට විමොක්ෂයෝ ද ෂඩභිඥවෝ සාක්ෂාත් කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් හරීතකදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

හරීතකදායක ස්ථවිරාපදානය අටවැනියි.

439. අම්බපිණ්ඩිය ස්ථවිරාපදානය

4701. එකල්හි මම රාජවාහන යොග්‍ය වූ උඩුකුරුව දික් ව වැඩුනු දළ ඇති ඇත් රජෙක් වීමි. මහ වෙනෙහි ඇවිදින්නෙම් ලොකනායක වූ බුදුරජුන් දිටිමි.

4702. මම අඹ ගෙඩියක් ගෙණ ශාස්තෘන් වහන්සේට දුනිමි. මහා වීර වූ සිද්ධාර්ථ බුදුරජානන් වහන්සේ එය පිළිගත් සේක.

4703. එකල්හි සර්වඥ තෙම මා බලා සිටිය දී එය වැළඳීය. මම විමනුම් නුවණින් එහි සිත පහදවා තුෂිත දිව්‍යලොකයෙහි උපනිමි.

4704. මම එයින් ච්‍යුත ව සක්විතිරජ වීමි. මේ ක්‍රමයෙන් ම සම්පත් අනුභව කොට,

4705. වඩනා ලද වීර්‍ය්‍යය ඇති මම උපශාන්ත වූයෙමි. උපධි රහිත වූයෙමි. සියලු ආශ්‍රවයන් ප්‍රහාණපරිඥ වශයෙන් දැන ආශ්‍රව රහිත ව වෙසෙමි.

4706. මෙයින් සිවුඅනූවන කපෙහි වූ එකල්හි යම් ඵලදානයක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ඵලදානයාගේ මේ විපාක යි.

4707. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිත ව වෙසෙමි.

4708. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4709. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛා පි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **අම්බපිණ්ඩියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

අම්බපිණ්ඩියත්ථෙරස්ස අපදානං නවමං.

440. ජම්බුඵලියත්ථෙරාපදානං

4710. පදුමුත්තරබුද්ධස්ස ලොකජෙට්ඨස්ස තාදිනො,
පිණ්ඩාය විචරන්තස්ස ධාරෙතො[1] උත්තමං යසං.

4711 අග්ගඵලං ගහෙත්වාන විප්පසන්නෙන චෙතසා,
දක්ඛිණෙය්‍යස්ස වීරස්ස අදාසිං සත්ථුනො අහං.

4712. තෙන කම්මෙන ද්විපදින්ද[2] ලොකජෙට්ඨ නරාසභ,
පත්තොම්හි අචලං ඨානං හිත්වා ජයපරාජයං.

4713. සතසහස්සෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි අග්ගදානස්සිදං ඵලං.

4714. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො ච බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4715. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4716. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛා පි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ජම්බුඵලියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ජම්බුඵලියත්ථෙරස්ස අපදානං දසමං.

උද්දානං:

ථෙරො එකවිහාරී ච සඞ්ඛිකො[3] පාටිහීරකො,
ථවිකො උච්ඡුඛණ්ඩී ච කලම්බම්බාටකප්පදා[4],
හරීතකම්බපිණ්ඩී ච ජම්බුදො[5] දසමො කති.
ඡළාසීති ච ගාථායො ගණිතායො විභාවිභි.

එකවිහාරිවග්ගො චතුත්තාළීසමො.

1. ධාරතො, මජසං. 2. ද්විපදින්ද, මජසං. 3. සඞ්ඛියො, මජසං.
4. කලම්බඅම්බාටකාදො, මජසං. 5. අම්බදො, මජසං.
* අම්බඵලියත්ථෙර අපදාන, මජසං

4708. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4709. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් අම්බපිණ්ඩිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

අම්බපිණ්ඩිය ස්ථවිරාවදානය නව වැනියි.

440. ජම්බුඵලිය ස්ථවිරාවදානය

4710. ලොකජ්‍යෙෂ්ඨ වූ තාදීගුණ ඇති පිඩුපිණීස හැසිරෙන්නා වූ උතුම් යශස්ධර වූ පදුමුත්තර බුදුරජුන් හට,

4711. මම අග්‍ර වූ (-පළමුවෙන් හැදුනු) දඹ ඵලයක් ගෙණ පහන් සිතින් දක්ෂිණාර්හ වූ වීර වූ ශාස්තෘන් වහන්සේට දුනිමි.

4712. ලොකජ්‍යෙෂ්ඨ නරශ්‍රෙෂ්ඨ ද්විපදෙත්තමයන් වහන්ස, මම ඒ කර්මය හෙතුකොටගෙණ ජය පරාජය හැර අචලස්ථානය වූ නිවනට පැමිණියෙමි වෙමි.

4713. එකල්හි මෙයින් සියදහස් වන කපෙහි වූ යම් දනක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. අග්‍රඵල දානයාගේ මේ විපාක යි.

4714. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

4715. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4716. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් ජම්බුඵලිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

ජම්බුඵලිය ස්ථවිරාවදානය දසවැනියි.

උද්දානය:

ඒකවිහාරී සඞ්ඛිය පාටිහීරක
ඵලික උච්ඡුඛණ්ඩි කළම්බ අම්බාටක ද,
හරීතක අම්බපිණ්ඩි ජම්බුද දැයි දසයෙකි.
සඅසූගයක් පඹුවන් මෙහි ගිණූ.

ඒකවිහාරිවග්ගය සූසාළිස් වැනියි.

441. විභීටකමිඤ්ජියත්ථෙරාපදානං

4717. කකුසන්ධො මහාවීරො සබ්බධම්මාන පාරගූ,
ගණම්හා වූපකට්ඨො සො අගමාසි වනන්තරං.

4718. බීජමිඤ්ජං ගහෙත්වාන ලතාය ආවුණිං අහං,
භගවා තම්හි සමයෙ ඣායතෙ පබ්බතන්තරෙ.

4719. දිස්වානහං දෙවදෙවං විප්පසන්නෙන චෙතසා,
දක්ඛිණෙය්‍යස්ස වීරස්ස බීජමිඤ්ජමදාසහං

4720. ඉමස්මිඤ්ඤෙව කප්පස්මිං[1] යං ඵලං අදදිං[2] තදා,
දුග්ගතිං නාභිජානාමි බීජමිඤ්ජස්සිදං ඵලං.

4721. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4722. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4723. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා විභීටකමිඤ්ජියො[3] ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

විභීටකමිඤ්ජියත්ථෙරස්ස අපදානං පඨමං.

442 කොලදායකත්ථෙරාපදානං

4724. අජිනෙන නිවත්ථොහං වාකචීරධරො තදා,
ඛාරිභාරං හරිත්වාන[4] කොලමාහරිමස්සමං.[5]

4725. තම්හි කාලෙ සිඛී බුද්ධො එකො අදුතියො අහු,
මමස්සමමුපාගඤ්ඡි[6] ජොතෙන්තො සබ්බකාලිකං.

4726. සකං චිත්තං පසාදෙත්වා වන්දිත්වාන ච සුබ්බතං,
උභො හත්ථෙහි පග්ගය්හ කොලං බුද්ධස්සදාසහං.

4727. එකතිංසෙ ඉතො කප්පෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි කොලදානස්සිදං ඵලං.

---

1. කප්පම්හි, මජසං. 2. මිඤ්ජමදදිං, මජසං. බිජමදදිං, ස්‍යා.
3. විභිතකමිඤ්ජියො, මජසං. 4. ඛාරියා පූරයිත්වාන, මජසං.
5. කොලංභාසිං මමස්සමං, මජසං. 6. මමස්සමමුපාගච්ඡි, සීමු.

441. විභීටකමිඤ්ජිය ස්ථවිරාවදානය

4717. සියලු ධර්මයන්ගේ පරතෙරට ගිය ඒ කකුසඳ බුදුරජ තෙමේ සමූහයා කෙරෙන් වෙන් වූයේ වනයට වැඩියේ ය.

4718. මම (බුළු) ඇට මද ගෙණ වැලක ඇවිනීමි. භාග්‍යවත් තෙම එසමයෙහි කඳු අතුරෙහි ධ්‍යාන කෙරෙයි.

4719. මම බුදුරජුන් දැක පැහැදි සිතින් වීර වූ දක්ෂිණාර්හ වූ බුදුරජුන් හට බුළු ඇට මද දුනිමි.

4720. මෙම කපෙහි වූ එකල්හි යම් ඵල දනක් දුනිම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුළු ඇට මද දීමෙහි මේ විපාකයි.

4721 මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4722. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සස්න කරණ ලදී.

4723. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සස්න කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් විභීටකමිඤ්ජිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේක්.

විභීටකමිඤ්ජිය ස්ථවිරාවදානය පළමුවැනියි.

442. කොලදායක ස්ථවිරාවදානය

4724. එකල්හි අඳුන් දිවිසම හැඳි මම වැහැරි සිවුරු දරුයෙමි පිරිකර කඳ ගෙණ අසපුවට ඩෙබර ගෙණාවෙමි.

4725. එසමයෙහි ශ්‍රෙෂ්ඨපුද්ගල වූ අසහාය පුද්ගල වූ සිඛී බුදුරජ තෙම ලොව පහළ විය. හැම කල්හි වූ දෑ දන්නා වූ (සර්වඥ තෙම) මාගේ අසපුවට එළඹියේ ය.

4726. මම බුදුරජුන් හට වැඳ සිය සිත පහදවා දෙහොතින් ඩෙබර (ඵලයක්) ගෙණ දුනිමි.

4727. මෙයින් එක්තිස්වන කපෙහි වූ එකල්හි යම් (ඩෙබර) ඵල දනයක් දුනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. ඩෙබරපල දනෙහි මේ විපාකයි.

4728. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4729. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං

4730. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කොලදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

කොලදායකත්ථෙරස්ස අපදානං දුතියං.

443. බිල්ලඵලියත්ථෙරාපදානං*

4731. චන්දභාගානදීතීරෙ අස්සමො සුකතො මම,
බිල්ලරුක්ඛම්හි[1] ආකිණ්ණො නානාදුමනිසෙවිතො.

4732. සුගන්ධං බෙලුවං දිස්වා බුද්ධසෙට්ඨමනුස්සරිං,
ඛාරිභාරං පූරයිත්වා තුට්ඨො සංවිග්ගමානසො.

4733 කකුසන්ධං උපාගම්ම බිල්ලපක්කමදාසහං,
පුඤ්ඤක්ඛෙත්තස්ස වීරස්ස විප්පසන්නෙන චෙතසා.

4734. ඉමස්මිංයෙව කප්පස්මිං යං ඵලං අදදිං[2] තදා,
දුග්ගතිං නාභිජානාමි ඵලදානස්සිදං ඵලං.

4735 කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො

4736. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4737. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **බිල්ලඵලියත්ථෙරො** ඉමා ගාථායො අභාසිත්ථාති.

බිල්ලඵලියත්ථෙරස්ස අපදානං තතියං.

---

1. බෙලුරුක්ඛම්හි, සීමු. බෙලුවරුක්ඛම්හි, ස්‍යා. 2. යං ඵලමදදිං, මජසං.
* බිලලියත්ථෙර අපදාන, මජසං.

4728. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4729. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4730. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙසින් ආයුෂමත් කොලදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

කොලදායකස්ථවිරාවදානය දෙවැනියි.

443. බිලලඵලිය ස්ථවිරාවදානය

4731. මා විසින් චන්ද්‍රභාගා නදීතීරයෙහි බෙලිගසින් ගැවසුනු නා නා වෘක්‍ෂයන්ගෙන් සෙවිනා ලද අසපුවක් මනාකොට කරණ ලදී.

4732. සුවඳැති බෙලි පලයක් දක බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිපත් කෙළෙමි. සතුටු වූයෙමි (ප්‍රීතියෙන්) ඉපිළෑ ගිය සිතැත්තේ කදක් බර පුරවා ගෙණ,

4733. කකුසඳ බුදුරජුන් වෙත එළඹ මම පුණ්‍යක්‍ෂෙත්‍ර වූ වීර වූ උන්වහන්සේට පැහැදි සිතින් ඉදුනු බෙලිගෙඩිය දුනිමි.

4734. මෙම කල්පයෙහි වූ එකල්හි යම් ඵලදානයක් දුනිම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. ඵලදානයාගේ මේ විපාකයි.

4735. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

4736. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4737. සිවුපිළිසැඹියාවෝ ද, අෂ්ටවිමොක්‍ෂයෝ ද, ෂඩභිඥාවෝ ද, සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙසින් ආයුෂමත් බිලලඵලිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

බිලලඵලිය ස්ථවිරාවදානය තෙවැනියි.

444. භල්ලාතකදායකත්ථෙරාපදානං*

4738. සුවණ්ණවණ්ණං සම්බුද්ධං ද්වත්තිංසවරලක්ඛණං,
පවනග්ගෙන[1] ගච්ඡන්තං සාලරාජංව ඵුල්ලිතං.

4739. තිණත්ථරං පඤ්ඤපෙත්වා බුද්ධසෙට්ඨමයාචහං,
අනුකම්පතු මං බුද්ධො භික්ඛමිච්ඡාමි දාතවෙ.

4740. අනුකම්පකො කාරුණිකො අත්ථදස්සී මහායසො,
මම සඞ්කප්පමඤ්ඤාය ඔරුහී මම අස්සමෙ.

4741. ඔරුහිත්වාන[2] සම්බුද්ධො නිසීදි පණ්ණසන්ථරෙ,
භල්ලාතකං ගහෙත්වාන බුද්ධසෙට්ඨස්සදාසහං.

4742. මම නිජ්ඣායමානස්ස පරිභුඤ්ජි තදා ජිනො,
තත්ථ චිත්තං පසාදෙත්වා අභිවන්දිං තදා ජිනං.

4743. අට්ඨාරසෙ කප්පසතෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඵලදානස්සිදං ඵලං.

4744. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4745. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4746. පටිසම්භිදා චතස්සො විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

භල්ලාතකදායකත්ථෙරස්ස අපදානං චතුත්ථං.

ඉත්ථං සුදං ආයස්මා භල්ලාතකදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

445. උත්තලිපුප්ඵියත්ථෙරාපදානං

4747. නිග්‍රොධෙ හරිතොභාසෙ සංවිරූළ්හම්හි පාදපෙ,
4947. මාගේ හිසෙහි වූ මැණික ගෙණ "මේ මිණ පිදීමෙහි විපාකය යහපත් වේවා" යි ලොකනායක වූ බුදුරජුන්හට පිදීමි.

4948. ලොකයාගේ පූජාවන් පිළිගැණීමට යොග්‍ය වූ ලොකවිදූ පදුමුත්තර ශාස්තෘන් වහන්සේ අහසෙහි සිටිසේක් මේ ගාථාව වදාළහ:

4949. "තාගේ ඒ අදහස සමෘද්ධ වේවා. මහත් වූ සැප ලබනෙහි වා. මෙ ම මැණික්පූජාවෙන් මහත් යශස් අනුභව කරව" කියා යි.

4950. භාග්‍යවත් වූ පදුමුත්තර නම් වූ බුද්ධශ්‍රෙෂ්ඨ තෙමේ මේ වචනය වදාරා වැඩියේ ය. යම් (ප්‍රාර්ථනාවෙක) සිත පිහිටුවන ලද ද,

4951. (ඒ හෙතුවෙන්) කල්පසැටක් දෙවෙන්ද්‍රව දිව්‍යරාජ්‍යය කරවීමි. තේසියක්වර සක්විතිරජ වීමි.

4952. දෙව් වූ පූර්වකර්මය සිහි කරන්නා වූ මට මා ආලොක-කරන්නා වූ මාගේ ම මැණික් පහළ වේ.

4953-4954. මාගේ පිරිවර වූ සයාසූදහසක් ස්ත්‍රීහු විසිතුරු වස්ත්‍රාභරණ ඇත්තාහු, පළඳින ලද මිණිකොඬොල් ඇත්තාහු, දිග ඇසිපිය ඇත්තාහු, සිනා සහිත වූවාහු, මනා තන ඇත්තාහු, සිහින් කටිප්‍රදෙශ ඇත්තාහු, නිතර මා පිරිවරත්. මණිපූජාවෙහි මේ විපාක යි.

4955. සොණ්ණමයා මණිමයා ලොහිතඞ්කමයා තථා,
හණ්ඩා මෙ සුකතා හොන්ති යදිච්ඡාය[1] පිළන්ධනා.

4956. කූටාගාරා ගුහා රම්මා සයනඤ්ච මහාරහං,
මම සඞ්කප්පමඤ්ඤාය නිබ්බත්තන්ති යදිච්ඡකං.

4957. ලාභා තෙසං සුලද්ධං ච යෙ ලභන්ති උපස්සුතිං,
පුඤ්ඤක්ඛෙත්තං මනුස්සානං ඔසධං සබ්බපාණිනං.

4958. මය්හම්පි සුකතං කම්මං යොහං අද්දක්ඛි[2] නායකං,
විනිපාතා පමුත්තොම්හි පත්තොම්හි අචලං පදං.

4959. යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
සමන්තා සත්තරතනා[3] ආලොකො හොති මෙ සදා.

4260. තායෙව මණිපූජාය අනුභොත්වාන සම්පදා,
ඤාණාලොකො මයා දිට්ඨො පත්තොම්හි අචලං පදං

4961. සතසහස්සෙ ඉතො කප්පෙ යං මණිං අභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි මණිපූජ යිදං ඵලං.

4962 කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4963. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4964. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා මණිපූජකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

මණිපූජකත්ථෙරස්ස අපදානං දුතියං.

473. උක්කාසතිකත්ථෙරාපදානං

4965. කොසිකො නාම භගවා චිත්තකූටෙ වසී තදා,
ඣායී ඣානරතො බුද්ධො විවෙකාභිරතො මුනි.

4966. අජ්ඣොගහෙත්වා[4] හිමවන්තං නාරිගණපුරක්ඛතො,
අද්දසං කොසිකං බුද්ධං පුණ්ණමාසෙව චන්දිමං.

1. යදිච්ඡන්ති, මජ්සං. 2. අද්දක්ඛී, මජ්සං. 3. දිවසඤ්චෙව රත්තිඤ්ච, මජ්සං.
4. අජ්ඣොගාහෙත්වා, මජ්සං.

4955. රුවන්මුවා වූ ද මිණිමුවා වූ ද එසේ ම පියුම්රාමිණිමුවා වූ ද මාගේ භාණ්ඩයෝ මැනැවින් කරණ ලද්දාහු වෙත්. පලඳනාවෝ කැමැති පරිදි වෙත්.

4956. රම්‍ය වූ කූටාගාර ද ගුහාවෝ ද මාහැඟි සයනාසන ද මාගේ අදහස් දැන කැමැති තාක් පහළ වෙත්.

4957. යමෙක් මිනිසුනට පිත්කෙත් වූ සම්සත්නට බෙහෙදක් වූ ධර්මශ්‍රවණය ලබත් නම් එය ඔවුනට ලාභයෙකි. මැනැවින් ලැබූ ලාභයෙකි.

4958. යම්බඳු වූ මම බුදුරජුන් දිටිම් ද, මා විසිනුදු මනා වූ කර්මයක් කරණ ලදී. එයින් දුගතියෙන් මිදුනෙම් වෙමි. අචලපදය වූ නිවනට ද පැමිණියෙම් වෙමි.

4959. දෙව් වූ හෝ මිනිස් වූ හෝ යම් යම් යොනියෙක උපදිම් ද, (ඒ) හැමකල්හි හාත්පස සත්රියනක් මාගේ ආලොකය වේ.

4960. එ ම මැණික්පූජාවෙන් සම්පත් අනුභව කොට මා විසින් ඥානාලොකය දක්නා ලදී. අචල වූ ශාන්තිපදයට පැමිණියෙම් වෙමි.

4961. මෙයින් සියක්දහස් වන කපෙහි යම් මැණික්පූජාවක් කෙළෙම් ද, එයින් දුගතියක් නො දනිමි මණිපූජාමෙහි මේ විපාක යි.

4962. මා විසින් කෙලසයෝ දවන ලදහ සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රවරහිතව වෙසෙමි.

4963. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4964. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් මණිපූජක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

මණිපූජක ස්ථවිරාවදානය දෙවැනි යි.

473. උක්කාසතිකස්ථවිරාවදානය

4965. එකල්හි මුනිගුණ යුතු වූ ධ්‍යාන කරන්නා වූ ධ්‍යානයෙහි ඇළුනා වූ භාග්‍යවත් වූ කොසික නම් (පසේ) බුදුරජ තෙමේ විවෙක සුවයෙහි ඇළුනේ චිත්‍රකූට පර්වතයෙහි වැඩ විසී ය.

4966. සත්‍රීසමූහයා විසින් පිරිවරණ ලදුව හිමවතට පිවිස පුර-පසළොස්වක් දිනයෙහි සඳු වැනි වූ කොසික බුදුරජුන් දිටිමි.

4967. උක්කාසතෙ ගහෙත්වාන පරිවාරෙසහං තදා,
සත්තරත්තින්දිවං ඨත්වා[1] අට්ඨමෙන අගච්ඡහං.

4968. වුට්ඨිතං කොසිකං බුද්ධං සයම්භුං අපරාජිතං,
පසන්නචිත්තො වන්දිත්වා එකං භික්ඛං අදාසහං.

4969 තෙන කම්මෙන දිපදින්ද ලොකජෙට්ඨ නරාසභ,
උප්පජ්ජිං තුසිතෙ කායෙ එකභික්ඛායිදං ඵලං.

4970. දිවසඤ්චෙව රත්තිඤ්ච ආලොකො හොති මෙ සදා,
සමන්තා යොජනසතං ඔභාසෙන ඵරාමහං.

4971. පඤ්චපඤ්ඤාසකප්පම්හි චක්කවත්ති අහොසහං,
චාතුරන්තො විජිතාවී ජම්බුසණ්ඩස්ස[2] ඉස්සරො,

4972. තදා මෙ නගරං ආසි ඉද්ධං ඵීතං සුනිම්මිතං,
තිංසයොජනමායාමං විත්ථාරෙන ච වීසති.

4973. සොභනං නාම නගරං විස්සකම්මෙන මාපිතං,
දසසද්දාවිවිත්තන්තං සම්මතාළසමාහිත .

4974. න තම්හි[3] නගරෙ අත්ථි වල්ලිකට්ඨං ච මත්තිකා,
සබ්බසොණ්ණමයං යේව ජොතතෙ නිච්චකාලිකං.

4975. චතුපාකාරපරික්ඛිත්තං තයො ආසුං මණීමයා,
වෙමජ්ඣෙ තාලපන්තී ච විස්සකම්මෙන මාපිතා,

4976. දසසහස්සා පොක්ඛරඤ්ඤො පදුමුප්පලඡාදිතා,
පුණ්ඩරීකෙහි[4] සඤ්ඡන්නා නානාගන්ධසමෙරිතා.

4977. චතුනවුතෙ ඉතො කප්පෙ යං උක්කං ධාරයිං අහං,
දුග්ගතිං නාභිජානාමි උක්කාධාරස්සිදං ඵලං.

4978. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4979. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1. බුද්ධො, සයා
2. ජම්බුමණ්ඩස්ස, සජසං.
3. තම්හි, මජසං.
4. පුණ්ඩරීකාදී, සයා.

4967 එකල්හි මම උල්කා (විලක්කු) සීයක් ගෙණ (උන්වහන්සේ) පිරිවැරීමි. මම රෑ දවල් සතක් (එහි) සිට අටවෙනි දිනයෙහි ගියෙමි.

4968. සමාධියෙන් නැගී සිටියා වූ පස්මරුන් දිනූ සියල්ල තෙමේ ම අවබොධ කරගත් කොසික බුදුරජුන් වැඳ පහන්සිත් ඇත්තෙම් මම එක් භික්ෂාවක් දුනිමි

4969. ද්විපදෝත්තමයානන් වහන්ස, ලොකජ්‍යෙෂ්ඨයානන් වහන්ස, නරශ්‍රෙෂ්ඨයානන් වහන්ස, එ ම කර්මය හෙතුකොට ගෙණ තුෂිත දෙව් ලොවැ උපනිමි. එක් භික්ෂාදානයෙහි මෙ විපාක යි.

4970. දිවාකල්හි ද රාත්‍රියෙහි ද හැම කල්හි මාගේ ආලොකය වෙයි. මම හාත්පස සියක්යොදුනක් ආලොකය විහිදුවමි.

4971. මම පස්පණස් කපක් සිවුමහසයුරු හා සිවුමහදිවයිනි කෙලවර කොට ඇති පෘථිවියට අධිපති වූ සතුරු රජුන් ජයගන්නා සුලු වූ (දඹදිව රාජධානි කොට ඇති බැවින් හෝ වෙසෙසින් එයට ඉසුරු බැවින් හෝ) ජම්බුද්වීපයට අධිපති වූ සක්විතිරජ වීමි.

4972. එකල්හි මට සමෘද්ධ වූ සමපත්තියෙන් පිරුණා වූ මැනැවින් නිමවන ලද තිස් යොදුන් දිගු විසි යොදුන් පුළුල් නගරයෙක් විය.

4973. ඒ සොභන නම් නුවර විශ්වකර්මයා විසින් මවන ලද්දේ විය. (එව- කව බොව) යනාදී දශවිධ ශබ්දයෙන් තොර නො විය. කසිතාලම් (ආදී තූර්‍ය්‍ය) නාදයෙන් ද යුක්ත විය.

4974. ඒ නගරයෙහි වැල් ද දර ද මැටි ද නැති. සියල්ල සවර්ණමය වූයේ ම හැම කල්හි බබලයි.

4975. ප්‍රාකාර සතරකිත් වට කරණ ලද්දේ විය. ඒ පවුරුහු මිණිමුවා වූහ. මැද පෙදෙසෙහි තාලපඞ්ක්තීහු ද විශ්වකර්මයා විසින් මවන ලදහ.

4976. පියුම්උපුලෙන් වැසුනු පඬෙරින් ගැවසී ගත් නොයෙක් සුවඳ වහනය වන්නා වූ පොකුණු දසදහසෙක් වූහ.

4977. මම මෙයින් සිවුඅනූ වන කපෙහි (බුදුනට) යම් උල්කාවක් දැරූයෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දතිමි. උල්කාධාරණයෙහි මේ විපාක යි.

4978. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

4979. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4980. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා උක්කාසතිකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

උක්කාසතිකථෙරස්ස අපදානං තතියං.

474. සුමනවීජනියත්ථෙරාපදානං

4981. විපස්සිනො භගවතො බොධියා පාදපුත්තමෙ,
සුමනාවීජනිං[1] ගය්හ අවීජිං බොධිමුත්තමං.

4982. එකනවුතෙ ඉතො කප්පෙ අවීජිං බොධිමුත්තමං,
දුග්ගතිං නාභිජානාමි වීජනාය ඉදං ඵලං.

4983. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4984. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4985. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා සුමනවීජනියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

සුමනවීජනියථෙරස්ස අපදානං චතුත්ථං.

475. කුම්මාසදායකත්ථෙරාපදානං

4986. එසනාය චරන්තස්ස විපස්සිස්ස මහෙසිනො,
රිත්තකං පත්තං දිස්වාන කුම්මාසං පූරයිං අහං.

4987. එකනවුතෙ ඉතො කප්පෙ යං භික්ඛමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි කුම්මාසස්ස ඉදං ඵලං.

4988. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4989. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1. සුමනොවීජනිං. මජ්සං.

4980. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් උක්කාසතික ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි

උක්කාසතික ස්ථවිරාවදානය තෙවැනි යි.

474. සුමනවීජනියස්ථවිරාවදානය

4981. විපස්සී බුදුරජුන්ගේ උතුම් බොධිවෘක්ෂය සමීපයෙහි සමන්මල් වීජනියක් ගෙණ මම ඒ උතුම් බෝධියට පවන් සැලීමි.

4982 මෙයින් එක්අනූ වන කපෙහි උතුම් බොධියට පවන් සැලූයෙමි ද, ඒ හෙතුවෙන් දුගතියක් නො දනිමි. පවන් සැලීමෙහි මේ විපාක යි.

4983. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

4984. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4985. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් සුමනවීජනිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

සුමනවීජනිය ස්ථවිරාවදානය සිවුවැනි යි.

475. කුම්මාසදායක ස්ථවිරාවදානය

4986. පිඬු පිණිස හැසිරෙන්නා වූ විපස්සී බුදුරජුන්ගේ හිස් පාත්‍රය දැක කොමුපිඬු පිරවීමි.

4987. මෙයින් එක් අනූ වන කපෙහි වූ එ කල්හි යම් භික්ෂාවක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. කුම්මාසදානයෙහි මේ විපාක යි.

4988. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිත ව වෙසෙමි.

4989. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4990. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කුම්මාසදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

කුම්මාසදායකත්ථෙරස්ස අපදානං පඤ්චමං.

476. කුසට්ඨදායකත්ථෙරාපදානං

4991. **කස්සපස්ස** භගවතො බ්‍රාහ්මණස්ස වුසීමතො,
පසන්නචිත්තො සුමනො කුසට්ඨකමදාසහං.

4992. ඉමස්මිං යෙව කප්පස්මිං කුසට්ඨකමදාසහං,
දුග්ගතිං නාභිජානාමි කුසට්ඨකස්සිදං ඵලං,

4993 කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4994. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4995. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කුසට්ඨදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

කුසට්ඨදායකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.

477 ගිරිපුන්නාගියත්ථෙරාපදානං

4996. **සොභිතො** නාම සම්බුද්ධො චිත්තකූටෙ වසී තදා,
ගහෙත්වා ගිරිපුන්නාගං සයම්භුමභිපූජයිං.

4997. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං බුද්ධමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

4998. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

4999. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

4990. සිවුපිළිසැඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් කුම්මාසදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

කුම්මාසදායක ස්ථවිරාපදානය පස්වැනි යි.

476. කුසට්ඨදායකස්ථවිරාපදානය

4991. වැස නිමවන ලද බඹසර ඇති බ්‍රාහ්මණවංශයෙහි වූ කාශ්‍යප බුදුරජුන් හට පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් ලහබත් අටක් දුනිමි.

4992. මේ කල්පයෙහි ම සලාකබත් අටක් දුනිමි. (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ලහබත් අට දීමෙහි මේ විපාක යි.

4993. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිත ව වෙසෙමි.

4994. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

4995. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් කුසට්ඨදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක.

කුසට්ඨදායක ස්ථවිරාපදානය සවැනි යි.

477. ගිරිපුන්නාගියස්ථවිරාපදානය

4996. එ කල්හි සොභිත නම් සම්බුදුරජ තෙම චිත්‍රකූට පර්වතයෙහි වැඩ විසී ය. මම ගිරිපුන්නාගපුෂ්පයක් ගෙණ බුදුරජුන් පිදීමි.

4997. මෙයින් සිවුඅනූ වන කපෙහි බුදුරජුන්හට යම් පූජාවක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකය යි.

4998. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිත ව වෙසෙමි.

4999. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5000. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා ගිරිපුන්නාගියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ගිරිපුන්නාගියත්ථෙරස්ස අපදානං සත්තමං.

478. වල්ලිකාරඵලදායකත්ථෙරාපදානං

5001. සුමනො නාම සම්බුද්ධො තක්කාරායං වසී තදා,
වල්ලිකාරඵලං ගය්හ සයම්භුස්ස අදාසහං.

5002. එකතිංසෙ ඉතො කප්පෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඵලදානස්සිදං ඵලං.

5003. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5004. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5005. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා වල්ලිකාරඵලදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

වල්ලිකාරඵලදායකත්ථෙරස්ස අපදානං අට්ඨමං.

479. පානධිදායකත්ථෙරාපදානං

5006. අනොමදස්සී භගවා ලොකජෙට්ඨො නරාසභො,
දිවාවිහාරා නික්ඛම්ම පඨමාරුහි චඞ්කමං.

5007. පානධිං සුකතං ගය්හ අද්ධානං පටිපජ්ජහං,
තත්ථද්දසාසිං සම්බුද්ධං පත්තිකං චාරුදස්සනං.

5008. සකං චිත්තං පසාදෙත්වා නීහරිත්වාන පානධිං,
පාදමූලෙ ඨපෙත්වාන ඉදං වචනමබ්‍රවිං.

5009. අභිරූහ මහාවීර සුගතින්ද විනායක,
ඉතො ඵලං ලභිස්සාමි යො මෙ අත්ථො සමිජ්ඣතු.

5000. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් ගිරිපුන්නාගිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

ගිරිපුන්නාගියස්ථවිරාවදානය සත්වැනි යි.

478. වලලිකාරඵලදායකස්ථවිරාවදානය

5001. එකල්හි සුමන නම් සම්බුදුරජ තෙම තකකාරා රාජධානියෙහි වැඩ විසී ය. මම සියල්ල දත් බුදුරජාණන් වහන්සේට වලලිකාර ඵලයක් ගෙන දුනිමි.

5002. මෙයින් එක්තිස් වන කපෙහි වූ එකල්හි යම් ඵලදානයක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. ඵලදානයාගේ මේ විපාකය යි.

5003. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

5004. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණීම මට සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

5005. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් වලලිකාරඵලදායකස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

වලලිකාරඵලදායක ස්ථවිරාවදානය අටවැනි යි.

479. පානධිදායකස්ථවිරාවදානය

5006. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ පසැස් ඇති අනොමදස්සී බුදුරජ තෙමේ දිවාවිහරණයෙන් නික්ම මාර්ගයට පිළිපන්නේ ය.

5007. මම මැනැවින් කරණ ලද පාවහන් (යුවලක්) ගෙණ මාර්ගයට පිළිපන්නෙමි. එහිදී මනොඥ වූ දර්ශන ඇති පාගමනින් වඩින්නා වූ සම්බුදුරජුන් දුටුයෙමි.

5008. සිය සිත පහදවා පාවහන් (යුවල) බැහැරට ගෙණ (බුදු-රජුන්ගේ) පාමුල තබා මේ වචනය කීමි:

5009 විනායකයාණන් වහන්ස, සුගතෙන්ද්‍රයාණන් වහන්ස, මහා-වීරයාණන් වහන්ස, (මේ පාවහන්යුවලට) නැංග මැනැව. මෙයින් යම් විපාකයක් ලබන්නෙම් ද, (ඉන්) මාගේ යම් අභිමතාර්ථයෙක් වේ නම් එය සමෘද්ධ වේවා.

5010. අනොමදස්සී භගවා ලොකජෙට්ඨො නරාසභො,
පානධිං අභිරුහිත්වා ඉදං වචනමබ්‍රවි:

5011. "යො පානධිං මෙ අදදා පසන්නො සෙහි පාණිභි,
තමහං කිත්තයිස්සාමි, සුණොථ මම භාසතො."

5012. බුද්ධස්ස ගිරමඤ්ඤාය සබ්බෙ දෙවා සමාගතා,
උදග්ගචිත්තා සුමනා වෙදජාතා කතඤ්ජලී.

5013. "පානධීනං පදානෙන සුඛිතොයං භවිස්සති,
පඤ්චපඤ්ඤාසක්ඛත්තුඤ්ච දෙවරජ්ජං කරිස්සති.

5014. සහස්සක්ඛත්තුං රාජා ච චක්කවත්තී භවිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

5015. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

5016. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො.

5017. දෙවලොකෙ මනුස්සෙ වා නිබ්බත්තිස්සති පුඤ්ඤවා,
දෙවයානපටිභාගං යානං පටිලභිස්සති".

5018. පාසාදා සිවිකා මය්හං[1] හත්ථිනො සමලඞ්කතා,
රථා වාජඤ්ඤසංයුත්තා සදා පාතුභවන්ති මෙ.

5019. අගාරා නික්ඛමන්තොපි රථෙන නික්ඛමිං අහං,
කෙසෙසු ඡිජ්ජමානෙසු අරහත්තමපාපුණිං.

5020. ලාභා මය්හං සුලද්ධං මෙ වාණිජ්ජං සුප්පයොජිතං,
දත්වාන පානධිං එකං පත්තොම්හි අචලං පදං.

5021. අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ යං පානධිමදාසහං,
දුග්ගතිං නාභිජානාමි පානධිස්ස ඉදං ඵලං.

5022. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5023. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5024. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **පානධිදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

පානධිදායකත්ථෙරස්ස අපදානං නවමං.

1. වය්හං, සීමු

5010. ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ අනොමදස්සී බුදුරජ තෙම මහත්සඟලෙහි නැඟ සිට මේ වචනය වදාළේ ය:

5011. "යමෙක් තෙම පහන් සිත් ඇත්තේ මට සියතින් ම මහත් සඟලක් දුන්නේ ද, ඔහු පිළිබඳ වූ ඒ විපාකය මම කියන්නෙමි. (එසේ) කියන්නා වූ මාගේ වචනය අසවු."

5012. බුදුරජානන් වහන්සේගේ හඬ අසා ඔදවැඩි සිත් ඇති සොම්නස් වූ ප්‍රීතිමත් වූ බඳැඳිලි ඇති සියලු දෙව්වරු රැස් වූහ.

5013. "මම තෙමේ මහත්සඟල පිදීම හෙතුකොටගෙන සුව ඇත්තෙක් වන්නේ ය. පස්පණස්වරක් දිව්‍යරාජ්‍යය කරන්නේ ය.

5014. දහස්වරක් සක්විතිරජ වන්නේ ය. ලබන්නා වූ මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් මෙ තෙකැයි ගිණිය නො හැකි ය.

5015. මෙයින් අපරිමෙය්‍ය වූ කල්පයෙහි ඔක්කාක කුලයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් වූ ශාස්තෘතෙමේ ලොව පහළවන්නේ ය.

5016. උන්වහන්සේගේ ධර්මය දායාද කොට ගත් ධර්මයෙන් නිර්මිත කළාක් මැනි වූ ඖරස බුද්ධපුත්‍ර වූ (මෙ තෙමේ) සියලු ආස්‍රවයන් (ප්‍රහාණපරිඥාවශයෙන්) දැන ආස්‍රවරහිත ව පිරිනිවන් පාන්නේ ය.

5017. පින්වත් වූ (මෙ තෙමේ) දෙව්ලොව හෝ මිනිස්ලොව හෝ උපදින්නේ නම් දිව්‍යයානයක් මැනි යානයක් ලබන්නේ ය."

5018 මාගේ ප්‍රාසාදයෝ ද සිවිකාවෝ ද මැනවින් සැරසූ ඇත්තු ද ආජානෙය අශ්වයන් යෙදූ රථ ද හැමකල්හි මට පහළ වෙත්.

5019. මම ගිහිගෙන් නික්මෙන්නෙමි ද රථයෙන් නික්මුනෙමි. කෙස් සිඳින (කිසකේ බාන) කල්හි රහත්බවට පැමිණියෙමි.

5020. මට ලාභයෝ ය. මවිසින් මොනොවට ලද ලාභය. මැනවින් යෙදූ වෙළඳමක් මැනි ය. එක මහත්සඟලක් දී අචලපදය වූ නිවණට පැමිණියෙම් වෙමි.

5021. මම මෙයින් අපරිමෙය්‍ය වූ කල්පයෙහි යම් මහත්සඟලක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පානධිදානයාගේ මේ විපාක යි.

5022 මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිත ව වෙසෙමි.

5023. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5024. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

පානධිදායකස්ථවිරාවදානය නවවැනි යි.

480. පුලිනචඞ්කමියත්ථෙරාපදානං

5025. මිගලුද්දො පුරෙ ආසිං අරඤ්ඤෙ කානනෙ අහං,
වාතමිගං ගවෙසන්තො චඞ්කමං අද්දසං අහං.

5026. උච්ඡඞ්ගා පුලිනං ගය්හ චඞ්කමං ඔකිරිං අහං,
පසන්නචිත්තො සුමනො සුගතස්ස සිරීමතො.

5027. එකතිංසෙ ඉතො කප්පෙ පුලිනං ඔකිරිං අහං,
දුග්ගතිං නාභිජානාමි පුලිනස්ස ඉදං ඵලං.

5028. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5029. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5030. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා පුලිනචඞ්කමියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

පුලිනචඞ්කමියත්ථෙරස්ස අපදානං දසමං.

උද්දානං:

නළමාලී මණිදදො උක්කාසතික-විජනී,
කුම්මාසො ච කුසට්ඨො ච ගිරිපුන්නාගියොපි ච.
වල්ලිකාරො පානධිදො අථො පුලිනචඞ්කමො,
ගාථායො පඤ්චනවුති ගණිතායො විභාවිභි.

නළමාලිවග්ගො අට්ඨචත්තාළීසමො.

481. පංසුකූලසඤ්ඤකත්ථෙරාපදානං

5031. තිස්සො නාමාසි භගවා සයම්භූ අග්ගපුග්ගලො,
පංසුකූලං ඨපෙත්වාන විහාරං පාවිසී ජිනො.

5032. විනතං ධනුමාදාය භක්ඛත්ථාය චරිං අහං,
මණ්ඩලග්ගං ගහෙත්වාන කානනං පාවිසිං අහං.

5033. තත්ථද්දසං පංසුකූලං දුමග්ගෙ ලග්ගිතං තදා,
චාපං තත්ථෙව නික්ඛිප්ප සිරෙ කත්වාන අඤ්ජලිං

480. පුලිනචඞ්කමියස්ථවිරාවදානය

5025. මම පෙර මහවෙනෙහි මුවවැද්දෙක් වීමි. වාතමෘගයකු සොයන්නෙම් මම සක්මනක් දුටුවෙමි.

5026. මම ඇකයෙන් (ඔඩොක්කුවෙන්) වැලි ගෙණ පහන් සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් ශ්‍රීමත් වූ බුදුරජුන්ගේ සක්මනෙහි ඉස්සෙමි.

5027. මෙයින් එක්තිස් වන කපෙහි මම යම් වැලිඉසීමක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පුලිනදානයාගේ මේ විපාක යි.

5028. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිත ව වෙසෙමි.

5029. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5030. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් පුලිනචඞ්කමිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේක.

පුලිනචඞ්කමියස්ථවිරාවදානය දසවැනි යි.

උද්දානය:

නලමාලිමණිදද උක්කාසතික වීජනී,
කුම්මාසකුසටඨ ගිරිපුන්නාගිය ද යළි.
විලලිකාරපානධි ද පුලිනචඞ්කම දස වේ.
ගාථාවන් විසින් ගිණූ ගී මෙහි පස් අනූවෙකි.

නලමාලිවර්ගය අටසාළිස්වැනි යි.

481. පංසුකූලසඤ්ඤකස්ථවිරාවදානය

5031. සියල්ල තමා ම දත් අග්‍රපුද්ගල වූ තිස්ස නම් බුදුවරයෙක් විය. (එම) සර්වඥ තෙමේ පවුල් (-පංසුකූල) සිවුරු තබා විහාරයට පිවිසියේ ය.

5032. මම නමත ලද දුන්න ගෙණ අහර පිණිස (වනයෙහි) හැසිරුනෙමි. කඩුව ද ගෙණ මම වනයට පිවිසියෙමි.

5033. එ කල්හි එහි ගසක් මුදුනෙහි එල්වන ලද පවුල් සිවුර දුටිමි. (දුක) දුන්න එහි ම තබා සිරසෙහි ඇඳිලි බැඳ –

5034. පසන්නචිත්තො සුමනො විපුලාය ච පීතියා,
බුද්ධසෙට්ඨං සරිත්වාන පංසුකූලං අවන්දහං.

5035. ද්වෙනවුතෙ ඉතො කප්පෙ පංසුකූලමවන්දහං,
දුග්ගතිං නාභිජානාමි වන්දනාය ඉදං ඵලං.

5036 කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5037. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5038. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා පංසුකූලසඤ්ඤකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

පංසුකූලසඤ්ඤකත්ථෙරස්ස අපදානං පඨමං.

482. බුද්ධසඤ්ඤකත්ථෙරාපදානං

5039. අජ්ඣායකො මන්තධරො තිණ්ණං වෙදාන පාරගූ,
ලක්ඛණෙ ඉතිහාසෙ ච සනිඝණ්ඩුසකෙටුභෙ.

5040. නදීසොතපටිභාගා සිස්සා ආයන්ති මෙ තදා,
තෙසාහං මන්තෙ වාචෙමි රත්තින්දිවමතන්දිතො.

5041 සිද්ධත්ථො නාම සම්බුද්ධො ලොකෙ උප්පජ්ජි තාවදෙ,
තමන්ධකාරං නාසෙත්වා ඤාණාලොකං පවත්තයී.

5042. මම අඤ්ඤතරො සිස්සො සිස්සානං සො කථෙසි මෙ,
සුත්වාන තෙ එතමත්ථං ආරොචෙසුං මමං තදා.

5043 "බුද්ධො ලොකෙ සමුප්පන්නො සබ්බඤ්ඤූ ලොකනායකො,
තස්සානුවත්තති ජනො ලාභො අම්හං න හෙස්සති."

5044 අධිච්චුප්පත්තිකා බුද්ධා චක්ඛුමන්තො මහායසා,
යන්නූනාහං බුද්ධසෙට්ඨං පස්සෙය්‍යං ලොකනායකං.

5045 අජිනං මෙ ගහෙත්වාන වාකචීරං කමණ්ඩලුං,
අස්සමා අභිනික්ඛම්ම සිස්සෙ ආමන්තයිං අහං.

5034. මම පහන්සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් මහත් වූ ප්‍රීතියෙන් බුද්ධශ්‍රෙෂ්ඨයන් සිහි කොට පාංශුකූලචීවරයට වැන්දෙමි.

5035. මම මෙයින් දෙයානූ වන කපෙහි පසුල්සිවුරට වැන්දෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. වන්‍දනාවෙහි මේ විපාක යි.

5036. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රවරහිත ව වෙසෙමි.

5037 බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5038. සිවුපිළිසැම්භියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන්වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් පංසුකූලසඤ්ඤක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේක.

පංසුකූලසඤ්ඤකස්ථවිරාපදානය පලමුවැනි යි.

482. බුද්ධසඤ්ඤකස්ථවිරාපදානය

5039. (මම) ලක්‍ෂණශාස්ත්‍රයෙහි ද ඉතිහාසයෙහි ද නිඝණ්ඩු සහිත වූ කවීන්ට හිත ක්‍රියාකල්පවිකල්පසඞ්ඛ්‍යාත කෙටුභශාස්ත්‍රයෙහි ද ත්‍රිවෙදයෙහි ද පරතෙරට ගිය මන්ත්‍ර හදාරන්නා වූ මන්ත්‍රධරයෙක් වීමි.

5040 ඒ කල්හි ගඟසැඩවතුරු මෙන් ශිෂ්‍යයෝ මා වෙත එති. දිවාරෑ දෙක්හි අතලස් වූයෙම් ඔවුනට මම මන්ත්‍ර හදාරවමි.

5041. ඒ කල්හි සිද්ධාර්ථ නම් සම්බුදුරජ තෙමේ ලොව පහල විය. (මොහ නමැති) ගනඳුර නසා ඥානාලොකය පැවැත්වී ය.

5042. මාගේ එක්තරා ශිෂ්‍යයෙක් විය. හෙතෙමේ මාගේ සෙසු සිසුනට මෙය කී ය. ඒ කල්හි ඔහු මෙය අසා මට සැල කලාහු ය. (කෙසේදයත්:)

5043. "සර්‍වඥ වූ ලොකනායක වූ බුදුරජ තෙමේ ලොව පහල විය. ජන තෙමේ උන්වහන්සේට අනුවර්‍තනය වේ. අපට ලාභයෙක් නො වන්නේ ය" (කියා යි).

5044. මහත් යශස් ඇති පසැස් ඇත්තා වූ බුදුවරයෝ (දිව්‍යබ්‍රහ්මාදි කිසිවකුන්ගේ උපදෙශහෙතුවිරහිත ව) ලොව පහලවන්නෝ වෙති. මම ලොකනායක වූ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ දකින්නෙම් නම් ඉතා යෙහෙකැයි (සිතීමි).

5045. සිතා මාගේ අඳුන්දිවිසම ද වැහැරිසිවුර ද, කමණ්ඩලාව (-පැන්කොණ්ඩිය) ද ගෙණ අසපුවෙන් නික්ම මම සිසුන් ඇමතීමි,

5046 "ඔදුම්බරිකපුප්ඵංව චන්දම්හි සසකං යථා,
වායසානං යථා ඛීරං දුල්ලභා ලොකනායකා[1]

5047. බුද්ධො ලොකම්හි උප්පන්නො මනුස්සත්තම්පි දුල්ලභං,
උභොසු විජ්ජමානෙසු සවණං ච සුදුල්ලභං.

5048 බුද්ධො ලොකෙ සමුප්පන්නො චක්ඛුං ලච්ඡාම නො භවං,
එථ සබ්බෙ ගමිස්සාම සම්මාසම්බුද්ධසන්තිකං."

5049. කමණ්ඩලුධරා සබ්බෙ ඛරාජිනනිවාසිනො,
තෙ ජටාභාරභරිතා නික්ඛමුං විපිනා තදා,

5050 යුගමත්තං පෙක්ඛමානා උත්තමත්ථගවෙසිනො,
ආසත්තිදොසරහිතා[2] අසම්භීතාව කෙසරී.

5051 අප්පකිච්චා අලොලුප්පා නිපකා සන්තවුත්තිනො,
උඤ්ඡාය චරමානා තෙ බුද්ධසෙට්ඨං උපාගමුං

5052 දියඩ්ඪයොජනෙ සෙසෙ ව්‍යාධි මෙ උපපජ්ජථ,
බුද්ධසෙට්ඨං සරිත්වාන තත්ථ කාලකතො අහං.

5053 චතුන්නවුතෙ ඉතො කප්පෙ යං සඤ්ඤමලභිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධසඤ්ඤායිදං[3] ඵලං

5054. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො

5055 ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5056 පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා බුද්ධසඤ්ඤකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති

බුද්ධසඤ්ඤකත්ථෙරස්ස අපදානං දුතියං.

1. දුල්ලභං ලොකනායකං, මජසං. 2. ආයත්ති නාගපොතාව, PTS.
3 බුද්ධසඤ්ඤසිදං, සබ්බත්ථ.

5046. "දිඹුල් මල් මෙන් ද, සඳෙහි සාවා මෙන් ද, කපුටන්ගේ කිරි මෙන් ද බුදුවරයෝ දුර්ලභයහ.

5047. බුදුරජ තෙමේ ලොව උපන්නේ ය. මිනිසත් බව ද දුලබ ය. මේ (බුද්ධොත්පාදය - මිනිසත්බව) දෙක ම ඇති කල්හි සද්ධර්ම ශ්‍රවණය අතිශයින් දුර්ලභ ය.

5048. බුදුරජ තෙමේ ලොව උපන්නේ ය. පින්වතුනි, අපගේ (දහම්) ඇස ලබමු. එවු, සියල්ලෝ ම සම්බුදුරජුන්ගේ සමීපයට යන්නෙමු".

5049. එ කල්හි සියල්ලෝ කමණ්ඩලා (-පැන්කෙණ්ඩි) දරන්නාහු කුර සහිත අඳුන්දිවිසම් හැන්දනු දළමඩුලු බරින් බර වූවාහු වනයෙන් නික්මුනාහු ය.

5050. වියදඬු පමණ දුර බලන්නාහු උත්තමාංගය වූ නිවණ සොයන්නාහු ඇලුම්දෙස් නැත්තාහු නිර්භය කෙශරසිංහයන් වැනි වූවාහු-

5051. සවල්පකෘත්‍ය ඇත්තාහු ලොල් නො වූවාහු ප්‍රඥා ඇත්තාහු සන්හුන් පැවතුම් ඇත්තාහු පිණ්ඩචරියාවෙහි හැසිරෙන්නාහු ඔහු බුද්ධ-ශ්‍රෙෂ්ඨයන් වහන්සේගේ සමීපයට එළඹියාහු ය.

5052. (එසේ එළඹෙන කල්හි) යොදුන් එකහමාරක් ශෙෂව ඇති කල්හි මට ව්‍යාධියෙක් උපන්නේ ය. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිපත් කොට එහි දී මම කලුරිය කෙළෙම් වෙමි.

5053. මෙයින් සිවුඅනූ වන කපෙහි වූ එ කල්හි යම් බුද්ධසංඥාවක් (බුදුන් පිළිබඳ හැඟීමක්) ලැබූයෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධසංඥාවෙහි මේ විපාක යි.

5054. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

5055. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

5056. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් බුද්ධසඤ්ඤක ස්ථවිරයන්වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

බුද්ධසඤ්ඤක ස්ථවිරාපදානය දෙවැනි යි.

483. භිසදායකත්ථෙරාපදානං

5057. ඔගය්හාහං පොක්ඛරණිං නානාකුඤ්ජරසෙවිතං,
උද්ධරාමි භිසං තත්ථ ඝාසහෙතු අහං තදා.

5058. භගවා තම්හි සමයෙ පදුමුත්තරසව්හයො,
රත්තම්බරධරො බුද්ධො ගච්ඡති අනිලඤ්ජසෙ.

5059. ධුනන්තො පංසුකූලානි සද්දමස්සොසහං තදා,
උද්ධං නිජ්ඣායමානොහං අද්දසං ලොකනායකං.

5060. තත්ථෙව ඨිතකො සන්තො ආයාචිං ලොකනායකං,
මධුං භිසෙහි සහිතං ඛීරං සප්පිං මුළාලිකං.[1]

5061. පටිග්ගණ්හාතු මෙ බුද්ධො අනුකම්පාය චක්ඛුමා,
තතො කාරුණිකො සත්ථා ඔරුහිත්වා මහායසො

5062. පටිග්ගණ්හි මමං භික්ඛං අනුකම්පාය චක්ඛුමා,
පටිග්ගහෙත්වා සම්බුද්ධො අකා මෙ අනුමොදනං.

5063. "සුඛී හොහි මහාපුඤ්ඤ, ගති තුය්හං සමිජ්ඣතු,
ඉමිනා භිසදානෙන ලභස්සු විපුලං සුඛං."

5064. ඉදං වත්වාන සම්බුද්ධො ජලජුත්තමනාමකො,
භික්ඛමාදාය සම්බුද්ධො අම්බරෙන'ගමා ජිනො.

5065. තතො භිසං ගහෙත්වාන ආගච්ඡිං මම අස්සමං,
භිසං රුක්ඛෙ ලග්ගෙත්වාන මම දානං අනුස්සරිං.

5066. මහාවාතො වුට්ඨහිත්වා සඤ්චාලෙසි වනං තදා,
ආකාසො අභිනාදිත්ථ අසනියා ඵලන්තියා.

5367. තතො මෙ අසනීපාතො මත්ථකෙ නිපතී තදා,
සොහං නිසින්නකො සන්තො තත්ථ කාලකතො අහුං.

5068. පුඤ්ඤකම්මෙන සංයුත්තො තුසිතං උපපජ්ජහං,
කළෙබරං මෙ පතිතං දෙවලොකෙ රමිං අහං.

9069. ඡළාසීතිසහස්සානි නාරියො සමලඞ්කතා,
සායපාතං උපට්ඨන්ති භිසදානස්සිදං ඵලං.

5070. මනුස්සයොනිමාගන්ත්වා සුඛිතො හොමහං සදා,
භොගෙ මෙ ඌනතා නත්ථි භිසදානස්සිදං ඵලං.

5071 අනුකම්පිතකො තෙන දෙවදෙවෙන තාදිනා,
සබ්බාසවපරික්ඛීණො නත්ථිදානි පුනබ්භවො.

---

1. මධුභිසෙහි සවති ඛීරසප්පිමුළාලිහි, මජ්සං. PTS.

483. භිසදායකසාළවිරාවදානය

5057. මම එකල්හි නොයෙක් හසුන් විසින් සෙවනා ලද පොකුණකට බැස සාදුක හෙතුකොට ගෙණ එහි නෙළුම්ල උදුරමි.

5058-5059. එ සමයෙහි (කසපිත්) රුදවූ මත් දරන්නා වූ භාග්‍යවත් වූ **පදුමුත්තර** නම් වූ බුදුරජ තෙමේ පසුල්සිවුරු කම්පා කරමින් අහස් මගෙහි වඩියි එ කල්හි මම (එම) ශබ්දය ඇසීමි. උඩ බලන්නා වූ මම ලොකනායක වූ බුදුරජුන් දිටිමි.

5060-5061. මම එහි ම සිටියෙම් බුදුරජුන්ගෙන් මෙසේ ඉල්ලීමි: "මාගේ නෙළුම්ල සහිත වූ මී ද කිරි ද ගිතෙල් ද නෙළුම්දූලි ද පසැස් ඇත්තා වූ බුදුරජ තෙමේ පිළිගනීවා. ඉක්බිති මහත් යශස් ඇති කාරුණික වූ ශාස්තෘ තෙමේ අහසින් බැස -

5062. පසැස් ඇති සර්ඥ තෙම මාගේ භික්ෂාව අනුකම්පාවෙන් පිළිගත්තේ ය. බුදුරජ තෙමේ එය පිළිගෙණ අනුමෝදනාවක් කෙළේ ය:

5063. "මහපින්ඇතියාණනි, සුවපත් වන්න. ඔබගේ ගතිය සමෘද්ධ වේවා, මේ නෙළුම්ලදන හෙතුකොට ගෙණ මහත් සැප ලබාවා."

5064. පස්මරුන් දිනූ පදුමුත්තර නම් සම්බුදුරජ තෙමේ මෙය වදරා භික්ෂාව ගෙණ අහසින් වැඩියේ ය.

5065. ඉක්බිති (මම) නෙළුම්ල ගෙණ මාගේ අසපුවට පැමිණියෙමි. නෙළුම්ල ගසෙක්හි එල්වා මාගේ දානය සිහිපත් කෙළෙමි.

5066. එ කල්හි මහාවාතයෙක් නැගී වනය කම්පා කෙළේ ය. සෙණ පුපුරණ කල්හි අහස ශබ්ද පැවැත්වී ය.

5067. එකල්හි සෙණපහරෙක් මාගේ හිසමතුයෙහි පතිත විය. එහි මම හුන්නෙම් ම කළුරිය කෙළෙමි.

5068. මම පින්කම හා යෙදුනෙම් තුසිදෙව්ලොවෙහි ඉපදුනෙමි. මාගේ සිරුර පතිත විය. මම දෙව්ලොවෙහි සිත් අලවා විසීමි.

5069. මැනවින් සැරසුණු සයාසුදහසක් සත්‍රීහු සවස ද උදෑසන ද මට උවටැන් කෙරෙත්.

5070. මම මිනිසත් බවට පැමිණ හැමකල්හි සුව ඇත්තෙම් වෙමි. මාගේ භොගයෙහි අඩුබවෙක් නැත. නෙළුම්ලදනෙහි මේ විපාක යි.

5071. තාදිගුණ ඇති ඒ දෙවාතිදෙවයන්වහන්සේ විසින් කරණ ලද අනුකම්පා ඇත්තෙම් සියලු ක්ෂය කල ආස්‍රව ඇත්තෙක් වීමි. දැන් නැවත ඉපදීමෙක් නැත.

5072. සතසහස්සෙ ඉතො කප්පෙ යං භික්ඛමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි භික්ඛදානස්සිදං ඵලං.

5073. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5074. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5075. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **භික්ඛදායකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

භික්ඛදායකත්ථෙරස්ස අපදානං තතියං.

484. ඤාණත්ථවිකත්ථෙරාපදානං

5076. දක්ඛිණෙ හිමවන්තස්ස සුකතො අස්සමො මම,
උත්තමත්ථං ගවෙසන්තො වසාමි විපිනෙ තදා.

5077. ලාභාලාභෙන සන්තුට්ඨො මූලෙන ච ඵලෙන ච,
අන්වෙසන්තො ආචරියං වසාමි එකකො අහං.

5078 සුමෙධො නාම සම්බුද්ධො ලොකෙ උප්පජ්ජි තාවදෙ,
චතුසච්චං පකාසෙති උද්ධරන්තො මහාජනං

5079. නාහං සුණොමි සම්බුද්ධං නපි මෙ කොචි භාසති,
අට්ඨවස්සෙ අතික්කන්තෙ අස්සොසිං ලොකනායකං.

5080. අග්ගිදාරුං නීහරිත්වා සම්මජ්ජිත්වාන අස්සමං,
ඛාරිභාරං ගහෙත්වාන නික්ඛමිං විපිනා අහං.

5081 එකරත්තිං වසන්තාහං ගාමෙසු නිගමෙසු ච,
අනුපුබ්බෙන චන්දවතිං තදාහං උපසඞ්කමිං.

5082. භගවා තම්හි සමයෙ සුමෙධො ලොකනායකො,
උද්ධරන්තො බහූ සත්තෙ දෙසෙති අමතං පදං

5083 ජනකායමතික්කම්ම වන්දිත්වා ජිනසාගරං,
එකංසං අජිනං කත්වා සන්ථවිං ලොකනායකං:

5084. "තුවං සත්ථා ච කෙතු ච ධජො යූපො ච පාණිනං,
පරායණො පතිට්ඨා ච දීපො ච දිපදුත්තමො.

(එකවීසතිමො භාණවාරො.)

5072. එකල්හි මෙයින් සියක් දහස්වන කපෙහි යම් භික්ෂාවක් දුනිම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. තෙළඹිලදනෙහි මේ විපාක යි.

5073. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5074. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5075. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ට විමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් භිසදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

භිසදායක ස්ථවිරාවදානය තෙවැනි යි.

484. ඤාණත්ථවිකස්ථවිරාවදානය

5076. හිමවතට දකුණෙහි මැනවින් කරණ ලද මගේ අසපුවෙක් විය. එකල්හි මම උත්තමාර්ථය සොයනෙම් වනයෙහි වෙසෙමි.

5077. ලාභ අලාභ දෙකින් ද මූලයෙන් ද ඵලයෙන් ද තුටුවූයෙම් මම ආචාර්යයකු සොයමින් හුදකලාව ම වෙසෙමි.

5078. එකල්හි සුමෙධ නම් සම්බුදුරජ තෙම ලොව් පහළ විය. මහජනයා සසරින් ගොඩ ලමින් චතුස්සත්‍යය ප්‍රකාශ කෙරෙයි.

5079. (මෙතෙක් කල්) මම සම්බුදුරජුන් ගැණ නො අසමි. කිසිවෙක් මට (එය) නො කියයි. අටවසක් ඉක්ම ගිය කල්හි බුදුරජුන් ගැණ ඇසීමි.

5080. මම ගිනි දර බැහැර කොට අසපුව හැමද පිරිකරකද ගෙණ වනයෙන් නික්ම ගියෙමි.

5081. එකල්හි මම ගම්හි නියම්ගම්හි එක්රැයක් වෙසෙමින් පිළිවෙළින් චන්‍ද්‍රවතී ගඟ වෙත එළඹියෙමි.

5082. එසමයෙහි භාග්‍යවත් වූ සුමෙධ නම් බුදුරජ තෙම බොහෝ සත්ත්වයන් (සසරින්) ගොඩලමින් අමෘතපදය (නිවන) දෙසයි.

5083. ජනසමූහයා ඉක්මවා ගොස් ගුණසයුරක් වූ ජිනෙන්‍ද්‍රයන් වැඳ අඳුන් දිවිසම එකස් කොට ගෙන බුදුරජුන්ට සතුති කෙළෙමි.

5084. "ද්විපදෝත්තම වූ මුඹ වහන්සේ සත්ත්වයනට ශාස්තෘ ද කෙතුව ද ධ්වජය ද යාගස්තම්භය ද පරායණය ද ප්‍රතිෂ්ඨාව ද ප්‍රදීපය ද වෙති.

(එක්විසිවැනි බණවර යි.)

5085. තෙපුඤ්ඤෙ දස්සනෙ වීරො තාරෙසි ජනතං තුවං,
තතොඤ්ඤෙ තාරකො ලොකෙ තවුත්තරිතරො මුනෙ

5086. සක්කා භවෙ කුසග්ගෙන පමෙතුං සාගරුත්තමො,
නත්වෙව තව සබ්බඤ්ඤු ඤාණං සක්කා පමෙතවෙ

5087. තුලාමණ්ඩලෙ ඨපෙත්වාන මහිං සක්කා ධරෙතවෙ,
නත්වෙව තව පඤ්ඤාය පමාණං අත්ථි චක්ඛුම.

5088. ආකාසො මිනිතුං සක්කා රජ්ජුයා අඞ්ගුලෙන වා,
නත්වෙව තව සබ්බඤ්ඤු සීලං සක්කා පමෙතවෙ..

5089. මහාසමුද්දෙ උදකං ආකාසො ච වසුන්ධරා,
පරිමෙය්‍යානි එතානි අප්පමෙය්‍යොසි චක්ඛුම."

5090. ඡහි ගාථාහි සබ්බඤ්ඤුං කිත්තයිත්වා මහායසං.
අඤ්ජලිං පග්ගහෙත්වාන තුණ්හී අට්ඨාසහං තදා.

5091. යං වදන්ති සුමෙධොති භූරිපඤ්ඤං සුමෙධසං,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

5092. "යො මෙ ඤාණං පකිත්තෙසි පසන්නො සෙන චෙතසා,
තමහං කිත්තයිස්සාමි සුණොථ මම භාසතො:

5093. සත්තසත්තති කප්පානි දෙවලොකෙ රමිස්සති,
සහස්සක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජං කරිස්සති.

5094. අනෙකසතක්ඛත්තුඤ්ච චක්කවත්තී භවිස්සති,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

5095. දෙවභූතො මනුස්සො වා පුඤ්ඤකම්මසමාහිතො,
අනූනමනසඞ්කප්පො තික්ඛපඤ්ඤො භවිස්සති.

5096. තිංසකප්පසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

5097. අගාරා අභිනික්ඛම්ම පබ්බජිස්සතකිඤ්චනො,
ජාතියා සත්තවස්සෙන අරහත්තං ඵුසිස්සති."

5085. චතුරාර්‍යසත්‍ය දර්ශනයෙහි නිපුණ බව ඇති වීර වූ මුඹ ජනසමූහයා සසරින් තැරවූ ය. මුනීන් වහන්ස, ලොව්හි මුඹවහන්සේට වඩා උසස් අනෙක් තරවන්නෙක් නැත.

5086. ඒකාන්තයෙන් මහසයුර කුස තණ අගින් පමණ කරන්නට හැකිවන්නේ ය. එහෙත් ඔබවහන්සේගේ සර්‍වඥතාඥානය ප්‍රමාණ කරන්නට නො හැක්කේ ම ය.

5087. පසැස් ඇත්තානන් වහන්ස, තරාදියෙහි තබා පොළොව දැරීමට (කිරාබැලීමට) හැකිවන්නේ ය. එහෙත් මුඹ වහන්සේගේ ප්‍රඥාවෙහි ප්‍රමාණයක් නැත්තේ ම ය.

5088. අහස රැහැණින් හෝ අඟුලින් මැනීමට හැකිවන්නේ ය. සර්‍වඥයන්වහන්ස, මුඹවහන්සේගේ සීලය පමණ කරන්නට නො හැක්කේ ම ය.

5089. මහසමුදුරෙහි දිය ද අහස ද පොළොව ද යන මොහු පමණ කළ හැක්කාහු වෙති. පසැස් ඇත්තානන් වහන්ස, මුඹ පමණ නො කට හැක්කේ වෙයි.''

5090. එකල්හි මම මහත් යශස් ඇති සර්‍වඥයන් වහන්සේට මෙසේ ගාථා සයකින් සතුති කොට ඇඳිලි බැඳගෙන නිශ්ශබ්දව සිටියෙමි.

5091. මහා ප්‍රඥා ඇති මනා නුවණ ඇති යමෙකුට සුමෙධ ය යි ලෝවැස්සෝ කියත් ද, (ඒ සුමෙධ බුදුරජහු) භික්ෂුසඞ්ඝයා මැද හිඳ මේ ගාථාවන් වදාළ සේක:

5092. ''යමෙක් ප්‍රසන්න වූයේ සියසිතින් මාගේ නුවණ පැසැසී ද, හේ කවරෙක්දැයි මම කියන්නෙමි. කියන්නා වූ මාගේ (වචනය) අසවු.

5093. හේ සත්සැත්තෑකපක් දෙව්ලොව සිත් අලවා වසන්නේ ය. දහස් වරක් දෙවෙන්ද්‍ර ව දිව්‍යරාජ්‍යය කරන්නේ ය.

5094. තේසියක් වර සක්විති රජ වන්නේය. (ලබන) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නො හැකි ය.

5095. මෙම කුශලකර්‍මයෙන් යුක්තවූයේ දෙවි වූයේ හෝ මිනිස් වූයේ අනූන වූ චින්තසඞ්කල්පනා ඇත්තේ පිහුණුපැන ඇත්තේ වන්නේ ය.

5096. (මෙයින්) තිස්දහස්වන කපෙහි ඔක්කාක කුලයෙහි උපදින්නාවූ නමින් ගෞතම නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.''

5097. (මෙ තෙම) ගිහිගෙන් නික්ම බන්ධන නැත්තේ පැවිදිවන්නේ ය. උත්පත්තියෙන් සත්හැවිරිදි කල්හි රහත්බව ලබන්නේ ය.

5098. යතො සරාමි අත්තානං යතො පත්තොස්මි සාසනං,
එත්ථන්තරෙ න ජානාමි චෙතනං අමනොරමං.

5099. සංසරිත්වා භවෙ සබ්බෙ සම්පත්තානුභවිං අහං,
භොගෙ මෙ ඌනතා නත්ථි ඵලං ඤාණස්ස ථොමනෙ.

5100. තිවග්ගී නිබ්බුතා මය්හං භවා සබ්බෙ සමූහතා,
සබ්බාසවා පරික්ඛීණා නත්ථිදානි පුනබ්භවො.

5101. තිංසකප්පසහස්සම්හි යං ඤාණමභිථොමයිං,
දුග්ගතිං නාභිජානාමි ඵලං ඤාණස්ස ථොමනෙ.

5102. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5103. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5104. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා ඤාණත්ථවිකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ඤාණත්ථවිකත්ථෙරස්ස අපදානං චතුත්ථං.

485. චන්දනමාලියත්ථෙරාපදානං

5105. පඤ්චකාමගුණෙ හිත්වා පියරූපෙ මනොරමෙ,
අසීතිකොටියො හිත්වා පබ්බජිං අනගාරියං.

5106. පබ්බජිත්වාන කායෙන පාපකම්මං විවජ්ජයිං,
වචීදුච්චරිතං හිත්වා නදීකූලෙ වසාමහං.

5107. එකකං මං විහරන්තං බුද්ධසෙට්ඨො උපාගමි,
නාහං ජානාමි බුද්ධොති අකාසිං පටිසන්ථරං.[1]

5108. කරිත්වා පටිසන්ථාරං නාමගොත්තමපුච්ඡහං,
දෙවතානු'සි ගන්ධබ්බො ආදු සක්කො පුරින්දදො.

5109. කො වා ත්වං කස්ස වා පුත්තො මහාබ්‍රහ්මා ඉධාගතො,
විරොචෙසි දිසා සබ්බා උදයං සූරියො යථා.

5110. සහස්සාරානි චක්කානි පාදෙ දිස්සන්ති මාරිස,
කො වා ත්වං කස්ස වා පුත්තො කථං ජානෙමු තං මයං.
නාමගොත්තං පවෙදෙහි සංසයං අපනෙහි මෙ.

1. පටිසන්ථාරං, මජසං.

5098. යම් තැනක පටන් තමන් ගැන සිතම් ද යම් තැනක පටන් සසුනට පැමිණියේ (-පැවිදිවූයේ) වෙම් ද මේ අතරතුර මනොඥ නො වූ සිතක් නො දනිමි.

5099. මම සියලු භවයෙහි හැසිර සම්පත් අනුභව කෙළෙමි. මාගේ භොගයෙහි අඩුබවෙක් නැත. සම්ඥතාඥනය පැසසීමෙහි මේ විපාක යි.

5100. මාගේ ත්‍රිවිධාග්නීහු නිවී ගියහ. සියලු භවයෝ නසන ලදහ. සියලු ආස්‍රවයෝ පරික්ෂීණයහ. දැන් පුනර්භවයෙක් නැත.

5101. (මෙයින්) තිස්දහස්වන කපෙහි යම් බුදු නුවණක් පැසසුයෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. සම්ඥතාඥනයට පැසසීමෙහි මේ විපාක යි.

5102. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5103. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5104. සිවුපිළිසැඹියාවෝ ද අෂට විමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් ඤාණසඤ්ඤික ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

ඤාණසඤ්ඤික ස්ථවිරාපදානය සිවුවැනි යි.

485. චන්දනමාලියස්ථවිරාපදානය

5105. ප්‍රියස්වරූප වූ මතරම් වූ පස්කම් ගුණ හැර අනුකෙලක් ධනය ද හැර පැවිද්දට පැමිණියෙමි.

5106. මම පැවිදිව කයින් පව්කම් දුරු කෙළෙමි. වාග්දුශචරිතය හැර ශාංඛවූරෙහි වෙසෙමි.

5107. හුදකලා ව වසන්නා වූ මා වෙත බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ එළඹි සේක. බුදුරජය යි මම නො දනිමි. පිළිසඳර කථා කෙළෙමි.

5108. මම පිළිසඳර කථා කොට නම්ගොත් විචාළෙමි: භවත් දෙවි වෙයි? නොහොත් පුරින්දද නම් වූ ශක්‍ර වෙයි?

5109. භවත් කවර හෝ වෙයි? කාගේ පුත්‍ර හෝ වෙයි? මහාබ්‍රහ්මයා මෙහි පැමිණියේ දෝ? උදාවන හිරු මෙන් සියලු දිගුන් බබුළුවයි.

5110. නිදුකාණෙනි (මුඹගේ) පාදයෙහි දහසක් දැවි ඇති චක්‍රයෝ පැණෙත්. භවත් කවර හෝ වෙයි? කවරෙකුගේ පුත්‍ර හෝ වෙයි? එය අපි කෙසේ දැනගනිමු ද? නම් ගොත් පවසනු මැනව. මාගේ සැක දුරු කරණු මැනව.

5111. "නමහි දෙවො න ගන්ධබ්බො නාපි සක්කො පුරින්දදො,
බ්‍රහ්මභාවො ච මෙ නත්ථි එතෙසං උත්තමො අහං.

5112. අතීතො විසයං තෙසං දලයිං කාමබන්ධනං.
සබ්බෙ කිලෙසෙ ඣාපෙත්වා පත්තො සම්බොධිමුත්තමං".

5113. තස්ස වාචං සුණිත්වාහං ඉදං වචනමබ්‍රවිං:
යදි බුද්ධොසි සබ්බඤ්ඤු නිසීද ත්වං මහාමුනි,
තමහං පූජයිස්සාමි දුක්ඛස්සන්තකරො තුවං.

5114. පත්ථරිත්වාජිනචම්මං අදාසිං සත්ථුනො අහං,
නිසීදි තත්ථ භගවා සීහොව ගිරිගබ්භරෙ.

5115. ඛිප්පං පබ්බතමාරුය්හ අම්බස්ස ඵලමග්ගහිං,
සාලකල්‍යාණිකං පුප්ඵං චන්දනං ච මහාරහං.

5116. ඛිප්පං පග්ගය්හ තං සබ්බං උපෙත්වා ලොකනායකං,
ඵලං බුද්ධස්ස දත්වාන සාලපුප්ඵමපූජයිං.

5117. චන්දනං අනුලිම්පිත්වා අවන්දිං සත්ථුනො අහං,
පසන්නචිත්තො සුමනො විපුලාය ච පීතියා.

5118 අජිනම්හි නිසීදිත්වා සුමෙධො ලොකනායකො,
මම කම්මං පකිත්තෙසි හාසයන්තො[1] මමං තදා:

5119. "ඉමිනා ඵලදානෙන ගන්ධමාලෙහි චූභයං,
පඤ්චවීසෙ කප්පසතෙ දෙවලොකෙ රමිස්සති.
අනූනමනසංකප්පො වසවත්තී භවිස්සති.

5120. ඡබ්බීසතිකප්පසතෙ මනුස්සත්තං ගමිස්සති.
භවිස්සති චක්කවත්තී චාතුරන්තො මහිද්ධිකො,

5121. වෙභාරං නාම නගරං විස්සකම්මෙන මාපිතං.
හෙස්සති සබ්බසොවණ්ණං නානාරතනභූසිතං,

5122. එතෙනෙව උපායෙන සංසරිස්සති සො භවෙ.
සබ්බත්ථ පූජිතො හුත්වා දෙවත්තෙ අථ මානුසෙ.
පච්ඡිමෙ[2] භවෙ සම්පත්තෙ බ්‍රහ්මබන්ධු භවිස්සති.

5123 අගාරා අභිනික්ඛම්ම අනගාරී භවිස්සති,
අභිඤ්ඤාපාරගූ හුත්වා නිබ්බායිස්සතිනාසවො."

5124. ඉදං වත්වාන සම්බුද්ධො සුමෙධො ලොකනායකො,
මම නිජ්ඣායමානස්ස පක්කාමි අනිලඤ්ජසෙ

1. හාසයන්තො, මජ්සං. 2. පච්ඡිම භවෙ, සීමු.
3. නිබ්බායිස්සතිනාසවො මජ්සං.

5111. "මම දෙව් නො වෙමි. ගන්ධර්ව ද නො වෙමි. පුරින්ද නම් ශක්‍ර ද නො වෙමි. මට බ්‍රහ්මත්වයෙක් ද නැත. ඔවුනතුරෙන් මම උතුම් වෙමි.

5112. ඔවුන්ගේ විෂයය ඉක්ම වූයෙම් වෙමි. කාමබන්ධන ප්‍රදාලනය කෙළෙමි. සියලු කෙලෙසුන් දවා උතුම් වූ සම්‍යක්සම්බෝධියට පැමිණියෙම් වෙමි." (යි බුදුහු වදාළහ.)

5113. මම උන්වහන්සේගේ වචනය අසා මෙම වචනය කීමි: ඉදින් භවත් සර්වඥ බුද්ධයෙහි නම්, මහාමුනි, මැඩහිඳිනු මැනව. මම මුබ පුදන්නෙමි. භවත් දුක් කෙළවර කරන්නේ වෙහි ය.

5114. මම අඳුන්දිව්සම අතුරා ශාස්තෘන් වහන්සේට දුනිමි. භාග්‍යවතුන් වහන්සේ ගිරිගුහායෙකැ සිංහයකු මෙන් එහි වැඩහුන් සේක.

5115. වහා පර්වතයට නැග අඹකැණක් ගතිමි. සල්කලණමල් ද මාහැඟි සඳුන් ද –

5116. ඒ සියල්ල වහා ගෙණ ලෝකනායකයන් වහන්සේ වෙත එළඹ බුදුරජුන් හට අඹ එල දී සල්මල් පිදීමි.

5117. මම පහන් සිත් ඇත්තෙමි සොම්නස් වූයෙම මහත් වූ ප්‍රීතියෙන් සඳුන් අලෙව් කොට බුදුරජානන් වහන්සේ වැන්දෙමි.

5118. එකල්හි සුමෙධ බුදුරජ තෙමේ අඳුන්දිව්සමෙහි වැඩ හිඳ මා තුටු කරමින් මාගේ කර්මය පැවසී ය:

5119. "ගඳ මල් දෙවගය සහිත මෙම අඹපල දීම හෙතු කොට ගෙණ එක්සියවිසිපස් කපක් දෙව් ලොවෙහි සිත් අලවා වසන්නේ ය. සම්පූර්ණ වූ චින්තාසඞ්කල්පනා ඇති වශවර්ති දෙවියෙක් ද වන්නේ ය.

5120. එක්සියසවිසිකපක් මිනිසත්බවට යන්නේ ය. සිවුසයුරැ හා සිවුමහදිවයින් කෙළවර කොට ඇති පෘථිවියට අධිපති වූ මහත් සෘද්ධි ඇති සක්විතිරජෙක් වන්නේ ය.

5121. විශ්වකර්මයා විසින් මවන ලද වෙභාර නම් නගරයෙක් ද වන්නේය. නන් රුවනින් සරසන ලද එය සර්ව ස්වර්ණමය වන්නේය.

5122. හෙතෙම මේ ක්‍රමයෙන් ම භවයෙහි සැරිසරන්නේ ය. දිවඅත්බැව්හි ද යළි මිනිසත්බැව්හි ද සියලු තන්හි පූජිත ව පශ්චිමභවය පැමිණි කල්හි බ්‍රාහ්මණයෙක් වන්නේ ය.

5123. ගිහිගෙන් නික්ම පැවිදි වන්නේ ය. අභිඥාවන්හි පරතෙරට ගියේ ආස්‍රව රහිත ව පිරිනිවන් පාන්නේ ය."

5124. ලෝකනායක වූ සුමෙධ බුදුරජ තෙම මෙය වදාරා මා බලා සිවිය දී ම අහස්මගෙහි වැඩියේ ය.

5125. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

5126. තුසිතාතො[1] චවිත්වාන නිබ්බත්තිං මාතුකුච්ඡියං,
භොගෙ මෙ ඌනතා නත්ථි යම්හි ගබ්භෙ වසාමහං.

5127. මාතුකුච්ඡිගතෙ මය්හං[2] අන්නං[3] පානඤ්ච භොජනං,
මාතුයා මම ඡන්දෙන නිබ්බත්තති යදිච්ඡකං.

5128. ජාතියා පඤ්චවස්සෙන පබ්බජිං අනගාරියං,
ඔරොපිතම්හි කෙසම්හි අරහත්තමපාපුණිං.

5129. පුබ්බකම්මං ගවෙසන්තො ඔරෙන නාද්දසං අහං,
තිංසකප්පසහස්සම්හි මම කම්මං අනුස්සරිං.

5130. නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම,
තව සාසනමාගම්ම පත්තොම්හි අචලං පදං.

5131. තිංසකප්පසහස්සම්හි යං බුද්ධමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

5132. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5133. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5134. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා චන්දනමාලියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

චන්දනමාලියත්ථෙරස්ස අපදානං පඤ්චමං.

486. ධාතුපූජකත්ථෙරාපදානං

5135 නිබ්බුතෙ ලොකනාථම්හි සිද්ධත්ථෙ ලොකනායකෙ,
මම ඤාතී සමානෙත්වා ධාතුපූජං අකාසහං.

5136. චතුන්නවුතෙ ඉතො කප්පෙ යං ධාතුමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි ධාතුපූජායිදං ඵලං.

5137. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො’ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5138. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1. තුසිතතො, මජසං. 2. මයි, මජසං. 3. අන්නා, මජසං.

5125. මැනැවින් කළ ඒ කර්මහෙතුයෙන් ද චිත්තප්‍රණිධිහෙතුයෙන් ද මම මිනිස්සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්තිවශයෙන්) ගියෙමි.

5126. තුෂිතදිව්‍යලොකයෙන් ච්‍යුතව මවුකුසෙහි උපනිමි. මම යම් මවුගැබක වෙසෙම් ද, එකල්හි මාගේ භොගයෙහි ද අඩුබවෙක් නැත.

5127. මා මවුකුසෙහි පිළිසඳගත් කල්හි මාගේ අදහසට අනුව මවුට කැමති තාක් ආහාර පාන භොජන ද පහළ වේ.

5128. උත්පත්තියෙන් පස්හැවිරිදි කල්හි සසුනෙහි පැවිදි වීමි. (පැවිද්ද සඳහා) හිසකේ බෑ කල්හි රහත්බවට පැමිණියෙමි.

5129. පූර්වකර්මය පිරික්සන්නෙම් මම (එය) ලමුසේ නො දිටිමි. තිස්දහස්කපෙහි මාගේ කර්මය සිහි කෙළෙමි.

5130. පුරුෂ ශ්‍රෙෂ්ඨයන් වහන්ස, මුඹ වහන්සේට නමස්කාර වේවා. පුරුෂොත්තමයන් වහන්ස මුඹ වහන්සේට නමස්කාර වේවා. මුඹ වහන්සේගේ සසුන් පැමිණ අචලපදය වූ නිවන ලැබුයෙමි.

5131. තිස්දහස්කපෙහි යම් බුදු කෙනෙකුන් සකසා පිදූයෙම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5132. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5133. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

5134. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන්වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් චන්දනමාලිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

චන්දනමාලියස්ථවිරාපදානය පස්වැනියි.

486. ධාතුපූජකස්ථවිරාපදානය

5135. ලොකනායක වූ සිද්ධාර්ථ බුදුරජුන් පිරිනිවි කල්හි මම මාගේ ඥාතීන් රැස්කොට ධාතුපූජාවක් කෙළෙමි.

5136. මෙයින් සිවුඅනූවන කපෙහි යම් ධාතුපූජාවක් කෙළෙම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. ධාතුපූජාවෙහි මේ විපාක යි.

5137. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5138. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

5139. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ධාතුපූජකො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ධාතුපූජකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.

487. පුලිනුප්පාදකත්ථෙරාපදානං

5140. පබ්බතෙ හිමවන්තම්හි දෙවලො නාම තාපසො,
තත්ථ මෙ චඞ්කමො ආසි අමනුස්සෙහි මාපිතො.

5141. ජටාභාරෙන[1] භරිතො කමණ්ඩලුධරො සදා,
උත්තමත්ථං ගවෙසන්තො පවනා අභිනික්ඛමිං.[2]

5142. චුල්ලාසීතිසහස්සානි සිස්සා මය්හං උපට්ඨහුං,
සකකම්මාභිපසුතා වසන්ති පවනෙ[3] සදා.

5143. අස්සමා අභිනික්ඛම්ම අකං පුලිනචෙතියං,
නානාපුප්ඵං සමානෙත්වා තං චෙතියමපූජයිං.

5144. තත්ථ චිත්තං පසාදෙත්වා අස්සමං පවිසාමහං,
සබ්බෙ සිස්සා සමාගන්ත්වා එතමත්ථමපුච්ඡු මං[4].

5145. "පුලිනෙන කතෙ ථූපෙ[5] යං ත්වං දෙවං[6] නමස්සසි,
මයම්පි ඤාතුමිච්ඡාම පුට්ඨො ආචික්ඛ නො තුවං"

5146. නිද්දිට්ඨා නො[7] මන්තපදෙ චක්ඛුමන්තො මහායස,
තෙ ඛො අහං නමස්සාමි බුද්ධසෙට්ඨෙ මහායසෙ.

5147. "කීදිසා තෙ මහාවීරා සබ්බඤ්ඤූ ලොකනායකා,
කථං වණ්ණා කථං සීලා කීදිසා තෙ මහායසා?"

5148. බාත්තිංසලක්ඛණා බුද්ධා චත්තාරීසද්විජාපි ච,
නෙත්තා ගොපඛුමා තෙසං ජිඤ්ජුකාඵලසන්නිභා.

5149. ගච්ඡමානා ච තෙ බුද්ධා යුගමත්තංව[8] පෙක්ඛරෙ,
න තෙසං ජාණු නදති සන්ධිසද්දො න සුය්‍යති.

5150. ගච්ඡමානා ච සුගතා උද්ධරන්තාව ගච්ඡරෙ,
පඨමං දක්ඛිණං පාදං බුද්ධානං එස ධම්මතා.

5151. අසම්භීතා ච තෙ බුද්ධා මිගරාජාව කෙසරී,
නෙවුක්කංසෙන්ති අත්තානං නො ච වම්භෙන්ති පාණිනං.

1. ජටාභාරස්ස, සයා, 2. විපිනා නික්ඛමිං තදා, මජ්ඣසං. 3. විපිනෙ, මජ්ඣසං.
4. එතමත්ථං පුච්ඡිංසු මං, මජ්ඣසං. 5. කතො ථූපො, මජ්ඣසං. 6. දෙව, මජ්ඣසං.
7. නිද්දිට්ඨානු, මජ්ඣසං. දිට්ඨානො වො, සයා. 8. යුගමත්තඤ්ච, මජ්ඣසං.

5139. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ට විමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් ධාතුපූජක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

ධාතුපූජකස්ථවිරාවදානය සමාප්තයි.

487. පුලිනුප්පාදක ස්ථවිරාවදානය

5140. හිමවත් පව්වෙහි දෙවල නම් තවුසෙක් විය. එහි මාගේ සක්මන අමනුෂ්‍යයන් විසින් මවන ලද.

5141. එකල්හි දළමඬලින් බර වූ කමඬලා (=පැන්කෙණ්ඩි) දරන්නා වූ මම උත්තමාර්ථය සොයමින් වනයෙන් නික්මුනෙමි.

5142. එකල්හි මට අසූහාරදහසක් ශිෂ්‍යයෝ උවටැන් කළාහු ය. (ඔහු) සිය කම්හි යෙදුනාහු වෙනෙහි වෙසෙත්.

5143. අසපුවෙන් නික්ම වැලිසෑයක් කෙළෙමි. නොයෙක් මල් රැස් කොට එම සෑය පිදීමි.

5144. මම එහි සිත පහදවා අසපුවට පිවිසෙමි. සියලු ශිෂ්‍යයෝ රැස්ව මාගෙන් මෙ කරුණ විචාළාහු ය:

5145. "භවත් වැල්ලෙන් කළ සෑයෙහි යම් දෙවියකුට නමස්කාර කෙරෙහිද එ දෙවියා අපිදු දන ගණු කැමැත්තෙමු. අප විසින් විචාරණ ලද භවත් අපට කියනු මැනව".

5146. අපගේ මන්ත්‍රපදයෙහි දක්වන ලද මහත් යශස් ඇති බුදුවරු වෙති. මම ඒ මහත් යශස් ඇති බුද්ධශ්‍රෙෂ්ඨයන් නමදිමි.

5147. "ඒ මහාවීර වූ සර්වඥ වූ ලොකනායකවරයෝ කෙබඳු වෙත් ද, කෙසේ වූ සටහන් ඇත්තෝ වෙත් ද, කෙසේ වූ සවභාව ඇත්තෝ වෙත් ද, ඒ මහත් යශස් ඇත්තෝ කෙබඳු වෙත් ද?"

5148. බුදුවරයෝ දෙතිස් (මහපුරිස්) ලකුණු ඇත්තෝ ය. සාලිසක් දත් ඇත්තෝ ය. උන්වහන්සේගේ ගොපක්ෂමාකාර නෙත්‍රයෝ හුනිද පලවත්හ.

5149. ඒ බුදුවරයෝ ගමන් කරන්නාහු වියදඩු පමණ ම දුර බලති. උන්වහන්සේගේ දණ හඬ නො නගයි. (අත්පා හි) සන්ධි ශබ්දයක් නො ඇසෙයි.

5150. ගමන් කරන්නා වූ බුදුවරයෝ පළමු කොට දකුණුපය පෙරට තබමින් යෙත්. මේ බුදුවරයන්ගේ ධර්මතායි.

5151. ඒ බුදුවරයෝ කෙසරසිංහරාජයන් මෙන් නිර්භීතයෝ ය. තමන් උසස් කොට නො දක්වත්. ප්‍රාණීන් (=මෙරමා) හෙළා නො දකිත්.

5152. මානාවමානතො මුත්තා සමා සබ්බසු පාණිසු,
අනත්තුක්කංසකා බුද්ධා බුද්ධානං එස ධම්මතා.

5153. උප්පජ්ජන්තා ච සම්බුද්ධා ආලොකං දස්සයන්ති තෙ,
ඡප්පකාරං පකම්පෙන්ති කෙවලං වසුධං ඉමං.

5154. පස්සන්ති නිරයං චෙතෙ නිබ්බාති නිරයො තදා,
පවස්සති මහාමෙඝො බුද්ධානං එස ධම්මතා.

5155. ඊදිසා තෙ මහානාගා අතුල්‍යා[1] ච මහායසා,
වණ්ණතො අනතික්කන්තා අප්පමෙය්‍යා තථාගතා.

5156. අනුමොදිංසු මෙ වාක්‍යං සබ්බෙ සිස්සා සගාරවා,
තථා ච පටිපජ්ජිංසු යථාසත්ති[2] යථාබලං.

5157. පතිපූජෙන්ති පුලිනං සකකම්මාභිලාසිනො,
සද්දහන්තා මමං[3] වාක්‍යං බුද්ධත්තගතමානසං.

5158. තදා චවිත්වා තුසිතා දෙවපුත්තො මහායසො,
උප්පජ්ජි මාතුකුච්ඡිස්මිං[4] දසසහස්සී පකම්පථ.[5]

5159. අස්සමස්සාවිදූරම්හි චඞ්කමම්හි ඨිතො අහං,
සබ්බ සිස්සා සමාගන්ත්වා ආගච්ඡුං මම සන්තිකං.[6]

5160. උසභො’ව මහී නදති මිගරාජා’ව කූජති,
සුංසුමාරො’ව[7] සලති කිං විපාකො භවිස්සති.

5161. “යං පකිත්තෙන්ති සම්බුද්ධං සිකතාථූපසන්තිකෙ,
සො දානි භගවා සත්ථා මාතුකුච්ඡිමුපාගමි.”

5162. තෙසං ධම්මකථං කත්වා කිත්තයිත්වා මහාමුනිං,
උය්‍යොජෙත්වා සකෙ සිස්සෙ පල්ලඞ්කං ආභුජිං අහං.

5163. බලඤ්ච වත මෙ ඛීණං ව්‍යාධිතො[8] පරමෙනහං,[9]
බුද්ධසෙට්ඨං සරිත්වාන තත්ථ කාලකතො[10] අහං.

5164. සබ්බෙ සිස්සා සමාගන්ත්වා අකංසු චිතකං තදා,
කලෙබරං ච මෙ ගය්හ චිතකං අභිරොපයුං.

5165. චිතකං පරිවාරෙත්වා සීසෙ කත්වාන අඤ්ජලිං,
සොකසල්ලපරෙතා තෙ විකන්දිංසු[11] සමාගතා.

1. අතුලා, මජ්සං. 2. යථාසත්තිං, සීමු. 3. මම, මජ්සං.
4. මාතුකුච්ඡිම්හි, මජ්සං. 5. කම්පථ, මජ්සං.
6. මම සන්තිකෙ, මජ්සං. 7. සුසුමාරොව, මජ්සං.
8. බ්‍යාධිතා, මජ්සං. 9. පරමෙන තං, මජ්සං. 10. කාලඞ්කතො, මජ්සං.
11. විකඤ්දිංසු, මජ්සං.

5152. බුදුවරයෝ මාන අවමාන දෙකින් මිදුනාහු සව්සතුන් කෙරෙහි සම සිත් ඇත්තෝ ය. තමන් හුවා නො දක්වන්නෝ ය. මේ බුදුවරයන්ගේ ධර්මතායි.

5153. උපදින්නා වූ ඒ බුදුවරයෝ ආලොකය දක්වත්. මේ මුළු පොළොව ආකාර සයකින් කමපා කෙරෙත්.

5154. ඒ බුදුවරයෝ නිරය ද දකිත්. එකල්හි නිරය නිවී යෙයි. මහවැසි වසියි. මේ බුදුවරයන්ගේ ධර්මතා යි.

5155. අතුල්‍ය (=අසම) වූ මහත් යශස් ඇති අතිශ්‍රෙෂ්ඨ වූ ඒ බුදුවරයෝ රූපකාය සම්පත්තියෙන් නොඉක්මවනු හැක්කෝ ය. තථාගතවරයෝ අප්‍රමෙය ගුණ ඇත්තෝ ය.

5156. සියලු ශිෂ්‍යයෝ මාගේ වචනය ගෞරව සහිතුව සතුටින් පිළිගත්තාහු ය. වචනයට අනුව ශක්ති පමණින් බල පමණින් පිළිපැද්දාහු ය.

5157. සවකීය කර්මාභිලාෂී වූ (ඔහු) මාගේ වචනය අදහන්නාහු බුදු-බවට නැමී ගිය සිත් ඇත්තාහු වැලිසෑය පුදත්.

5158. එකල්හි මහත් යශස් ඇති (බෝසත්) දිව්‍යපුත්‍ර තෙමේ තුෂිත දිව්‍යලොකයෙන් ච්‍යුතව මවුකුසැ උපන්නේ ය. දසදහසක් ලෝදු කම්පිත විය.

5159. මම අසපුවට නුදුරෙහි සක්මනෙහි සිටියෙම් වෙමි. සියලු ශිෂ්‍යයෝ රැස්ව මාගේ සමීපයට පැමිණියාහු ය.

5160. "(පැමිණ) පෘථිවිය වෘෂභයකු මෙන් නාද කෙරෙයි. සිංහයකු මෙන් ශබ්ද පවත්වයි. සුංසුමාර නම් ජලචර ව්‍යාඝ්‍රමත්ස්‍යයකු සේ සැලෙයි. කවර විපාකයෙක් වන්නේදැ?" යි (ඇසූහ).

5161. "වාලුකාස්තූපය සමීපයෙහි යම් බුදුවරයකු කීර්තනය කෙරෙම් ද ඒ භාග්‍යවත් ශාස්තෘ තෙමේ දැන් මවුකුසට එළඹියේ ය."

5162. මම ඔවුනට ධර්මකථා කියා මහාමුනි වූ බුදුරජුන්හට පසසා සිය සිසුන් යවා පලඟ බැඳ ගතිමි.

5163. මාගේ (ශරීර) බලය ද එකැතින් ක්ෂීණ විය. බලවත් ව්‍යාධියකින් මම් පෙළුනෙම් වෙමි. මම බුද්ධශ්‍රෙෂ්ඨයන්වහන්සේ සිහිපත් කොට එහි කලුරිය කෙළෙමි.

5164. එකල්හි සියලු ශිෂ්‍යයෝ රැස්ව චිතකයක් කළාහු ය. මාගේ දෙහය ගෙණ සෑයට නැංවූහ.

5165. හිසැ ඇඳිලි බැඳ සෑය පිරිවරා රැස්වූ ඔහු සෝහුලින් පෙළුනාහු හැඬූහ.

5166. තෙසං ලාලප්පමානානං අගමාසිං චිත්තනාතිකං[1],
"අහං ආචරියො තුම්හං මා සොචිත්ථ සුමෙධසා.

5167. සදත්ථෙ වායමෙය්‍යාථ රත්තින්දිවමතන්දිතා,
මා වො පමත්තා අහුවත්ථ[2] ඛණො වො පටිපාදිතො"

5168. සකෙ සිස්සෙනුසාසිත්වා දෙවලොකං පුනාගමිං,
අට්ඨාරස ච කප්පානි දෙවලොකෙ රමිං අහං.

5169. සතානං පඤ්චක්ඛත්තුඤ්ච චක්කවත්ති අහොසහං,
අනෙකසතක්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං.

5170. අවසෙසෙසු කප්පෙසු වොකිණ්ණං[3] සංසරිං අහං,
දුග්ගතිං නාභිජානාමි පුලිනපූජායිදං ඵලං[4].

5171. යථා කොමුදිකෙ මාසෙ බහූ පුප්ඵන්ති පාදපා,
තථෙවාහම්පි සමයෙ පුප්ඵිතොම්හි මහෙසිනා

5172. විරියමෙම ධුරධොරය්හං යොගක්ඛෙමාධිවාහනං,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5173. සතසහස්සෙ ඉතො කප්පෙ යං බුද්ධමභිකිත්තයිං,
දුග්ගතිං නාභිජානාමි කිත්තනාය ඉදං ඵලං.

5174. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5175. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5176. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං

ඉත්ථං සුදං ආයස්මා පුලිනුප්පාදකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

පුලිනුප්පාදකත්ථෙරස්ස අපදානං සමත්තං.

488. තරණියත්ථෙරාපදානං

5177. අත්ථදස්සී තු භගවා සයම්භූ ලොකනායකො,
විනතානදියා තීරං උපගච්ඡි තථාගතො.

5178. උදකා අභිනික්ඛම්ම කච්ඡපො වාරිගොචරො,
බුද්ධං තාරෙතුකාමොහං උපෙසිං ලොකනායකං.

1. අගමිං චිත්තකං තදා, මජසං 2 අහුවත්ථ, මජසං, 3 වොකිණ්ණො, මජසං
4 උප්පාදස්ස ඉදං ඵලං, මජසං.

5166 – 5167. ඔවුන් විලාප කියමින් හඬද්දී චිතකය සමීපයට ගියෙමි. "මම තොපගේ ආචාර්‍ය්‍ය වෙමි. ශොක නො කරවු. මතානුවණින් යුතුව දිවරු දෙක්හි අනලස් වූවාහු සවාර්‍ථයෙහි උත්සාහ වඩවු. තෙපි ප්‍රමාදී වූවෝ නො වවු. තොපට (අෂ්ටදුෂ්ටක්ෂණ විනිර්මුක්ත බුද්ධොත්පාද) ක්ෂණය සැපයී ඇත."

5168. (මෙසේ) සිය සිසුනට අනුශාසනා කොට යළි දෙව්ලෙවට ගියෙමි. මම අටළොස්කපක් දෙව්ලොව සිත් අලවා විසීමි.

5169. මම පන්සියවරක් සක්විති රජ වීමි. තේසියක්වර දිව්‍යරාජ්‍යය කෙළෙමි.

5170. මම සෙසු කල්පයන්හි (දෙව්මිනිස් දෙගතියෙහි) ව්‍යතිමිශ්‍ර වශයෙන් සැරිසැරීමි. දුගතියක් නො දනිමි. වැලිසෑ පිදීමෙහි මේ විපාක යි.

5171. යම්සේ ඉල් මාසයෙහි (සරත් කල්හි) බොහෝ වෘක්ෂයෝ පිපෙත් ද, එසේ ම මම ද සුදුසු කල්හි මහර්ෂි වූ බුදුරජුන් විසින් පුබුදුවන ලදුයෙම් වෙමි.

5172. යොගක්ෂෙම සඞ්ඛ්‍යාත නිවණ දක්වා ම ගෙන යන මාගේ ධූරවාහක (ගව) යා වීර්‍ය්‍යය යි. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

5173. මෙයින් සියක් දහස්වන කපෙහි බුදුරජුන්හට යම් පැසසීමක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධ ගුණ කීර්තනයෙහි මේ විපාකය යි.

5174. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5175. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් සඵපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

5176. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් පුලිනුප්පාදක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

පුලිනුප්පාදක ස්ථවිරාවදානය සත්වැනියි.

488. තරණීය ස්ථවිරාවදානය

5177. සියල්ල තෙමේ ම අවබොධ කළා වූ ලොකනායක වූ භාග්‍ය-වත් වූ අත්ථදස්සී බුදුරජ තෙමේ විනතා නදීතීරයට වැඩියේ ය.

5178. (එකල මම) ජලයෙහි හැසිරෙන්නා වූ කැසුබුවෙක් වීමි. බුදුරජුන් ගනිත් තර වනු කැමති මම ලොකනායකයන් වහන්සේ වෙත එළඹියෙමි. (එළඹ මෙසේ කීමි:)

5179. අභිරූහතු මං බුද්ධො අත්ථදස්සී මහාමුනි,
අහං තං තාරයිස්සාමි දුක්ඛස්සන්තකරො තුවං.

5180. මම සඞ්කප්පමඤ්ඤාය අත්ථදස්සී මහායසො,
ආරූහිත්වාන[1] මෙ පිට්ඨිං අට්ඨාසි ලොකනායකො

5181. යතො සරාමි අත්තානං යතො පත්තොස්මි විඤ්ඤුතං,
සුඛං මෙ තාදිසං නත්ථි ඵුට්ඨෙ පාදතලෙ යථා.

5182. උත්තරිත්වාන සම්බුද්ධො අත්ථදස්සී මහායසො,
නදීතීරම්හි ඨත්වාන ඉමා ගාථා අභාසථ:

5183. "යාවතා වත්තතෙ චිත්තං ගඞ්ගාසොතං තරාමහං,
අයඤ්ච කච්ඡපො රාජා තාරෙසි මම පඤ්ඤවා.

5184. ඉමිනා බුද්ධතරණෙන මෙත්තචිත්තවතාය ච,
අට්ඨාරසෙ කප්පසතෙ දෙවලොකෙ රමිස්සති.

5185. දෙවලොකා ඉධාගන්ත්වා සුක්කමූලෙන චොදිතො,
එකාසනෙ නිසීදිත්වා කඞ්ඛාසොතං තරිස්සති."

5186. යථාපි භද්දකෙ ඛෙත්තෙ බීජමප්පම්පි රොපිතං,
සම්මාධාරෙ පවච්ඡන්තෙ[2] ඵලං තොසෙති කස්සකං.

5187. තථෙවිදං බුද්ධඛෙත්තං සම්මාසම්බුද්ධදෙසිතං,
සම්මාධාරෙ පවච්ඡන්තෙ ඵලං මං තොසයිස්සති.

5188. පධානපහිතත්තොම්හි උපසන්තො නිරූපධි,
සබ්බාසවෙ පරිඤ්ඤාය විහරාමි අනාසවො.

5189. අට්ඨාරසෙ කප්පසතෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි තරණාය ඉදං ඵලං.

5190. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5191. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1. අභිරූහිත්වා, මජ්ඣං. 2. පවස්සන්තෙ, සීමු.

5179. “මහාමුනි වූ බුදුරජ තෙමේ මාගේ පිටට නඟීවා. ඒ මුඹ මම තරණය කරන්නෙමි. (මුඹ) ලොකයාගේ දුක් කෙළවර කරන්නේ වෙහි ය” (කියා යි).

5180 මහත් යශස් ඇති අත්ථදස්සී බුදුරජාණෝ මාගේ අදහස දැන මාගේ පිට්ට නැඟී සිටිසේක.

5181. යම් තැනක පටන් කොට තමා සිහි කෙරෙම් ද, යම් තැනක පටන් කොට නැණවත් බවට පැමිණියෙම් වෙම් ද, එතෙක් (මුඹ වහන්සේගේ) පාදතලය සපශී වූ කෙණෙහි ඇති වූ ඒ සුවය යම්සේ නම් එබඳු සුවයක් මට නැත.

5182. මහත් යශස් ඇති අත්ථදස්සී බුදුරජ තෙම එතර වී ගංතෙර සිට මේ ගාථාවන් වදාළේය:

5183 “මම ගඟ සැඩපහර තරණය කෙරෙමැයි යම්තාක් (මා තුළ) සිත පවතී ද, එකෙණෙහි පැණවත් මේ කැසුබුරජ තෙම මා තැරවීය.

5184. මේ බුදුන් (ගඟින්) තැරවීම හේතු කොට ගෙණ ද, මෙත් සිත් ඇතිබව හේතු කොට ගෙන ද, අටළොස්සියකපක් දෙව්ලොව සිත් අලවා වසන්නේ ය.

5185. කුශලමූලයෙන් මෙහෙයන ලදුයේ දෙව්ලොවින් මෙහි පැමිණ හුනස්නෙහි ම සැක නමැති සැඩපහර තරණය කරන්නේ ය”.

5186. සරු කෙතක රොපණය කරණ ලද සඵල්ප වූ ද බිජුවට මැනැවින් වැසි වස්නා කල්හි ශස්‍යඵලය ගොවියා තුටු කරයි ද,

5187. එසේ ම සම්බුදුරජුන් විසින් දෙසන ලද මේ බුද්ධක්‍ෂෙත්‍රය (දහම්) වැසි මැනැවින් වස්නා කල්හි පුණ්‍යඵලය මා තුටු කරන්නේ ය.

5188. ප්‍රධන් වීයර්‍යයෙහි මෙහෙයන ලද සිත් ඇත්තෙම් වෙම්. උපශාන්ත වූයෙම් උපධිරහිත වූයෙම් සියලු ආස්‍රවයන් (ප්‍රහාණපරිඥාවශයෙන්) දැන ආස්‍රවරහිතව වෙසෙමි.

5189. එකල්හි අටළොස් සියවන කපෙහි යම් කර්මයක් කෙළෙම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. (බුදුරජුන්) තරණය කරවීමෙහි මේ විපාකය යි.

5190. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

5191. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

5192. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **තරණීයො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

තරණීයත්ථෙරස්ස අපදානං අට්ඨමං.

489. ධම්මරුචිත්ථෙරාපදානං*

5193. යදා දීපඞ්කරො බුද්ධො සුමෙධං ව්‍යාකරී ජිනො,
"අපරිමෙය්‍යෙ ඉතො කප්පෙ අයං බුද්ධො භවිස්සති.

5194. ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති,
පිතා සුද්ධොදනො නාම අයං හෙස්සති ගොතමො.

5195. පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරිකං,
අස්සත්ථමූලෙ සම්බුද්ධො බුජ්ඣිස්සති මහායසො.

5196 උපතිස්සො කොලිතො ච අග්ගා හෙස්සන්ති සාවකා,
ආනන්දො නාමුපට්ඨාකො[1] උපට්ඨිස්සතිමං ජිනං.

5197. ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා,
චිත්තො ආළවකො චෙව අග්ගා හෙස්සන්තුපාසකා.

5198. ඛුජ්ජුත්තරා නන්දමාතා අග්ගා හෙස්සන්තුපාසිකා,
බොධි ඉමස්ස වීරස්ස අස්සත්ථොති පවුච්චති."

5199. ඉදං සුත්වාන වචනං අසමස්ස මහෙසිනො,
ආමොදිතා නරමරූ නමස්සන්ති කතඤ්ජලී.

5200. තදාහං මාණවො ආසිං මෙඝො නාම සුසික්ඛිතො,
සුත්වා ව්‍යාකරණං සෙට්ඨං සුමෙධස්ස මහාමුනෙ.-

5201. සංවිස්සත්ථො භවිත්වාන සුමෙධෙ කරුණාසයෙ[2],
පබ්බජන්තං ච තං වීරං සහාව අනුපබ්බජිං.

5202. සංවුතො පාතිමොක්ඛස්මිං ඉන්ද්‍රියෙසු ච පඤ්චසු,
සුද්ධාජීවො සතො වීරො ජිනසාසනකාරකො.

5203. එවං විහරමානොහං පාපමිත්තෙන කෙනචි,
නියොජිතො අනාචාරෙ සුමග්ගා පරිධංසිතො.

5204. විතක්කවසිකො හුත්වා සාසනාතො[3] අපක්කමිං,
පච්ඡා තෙන කුමිත්තෙන පයුත්තො මාතුඝාතනං.

---

* ධම්මරුචියත්ථෙරාපදාන, මජ්සං. 1. ආනන්දො නාම නාමෙන, සීමු.
2. කරුණාලයෙ, සයා. 3. සාසනතො, මජ්සං.

5192. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් **තරණීය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

තරණීයස්ථවිරාවදානය අටවැනි යි.

489. ධම්මරුචි ස්ථවිරාවදානය

5193. යම් කලෙක්හි පස්මරුන් දිනූ **දීපඞ්කර** බුදුරජ තෙම **සුමෙධ** තවුසාහට මෙය (විවරණවශයෙන්) ප්‍රකාශ කෙළේ ද: "මින් අප්‍රමෙය වූ කල්පයෙහි මෙතෙම බුදු වන්නේ ය.

5194. එකල්හි මොහුගේ ජනකමාතාව **මායා** නම් වන්නී ය. පියතෙම **සුද්ධොදන** නම් වන්නේ ය. මෙතෙම **ගෞතම** නම් වන්නේ ය.

5195. වීර්‍ය්‍යී වඩා දුෂ්කරක්‍රියා කොට ඇසතුබෝරුක් මුල්හි දී මහත් යශස් ඇති මෙ තෙම සම්‍යක්සම්බුද්ධ වන්නේ ය.

5196. **උපතිස්ස** ද **කොලිත** ද අග්‍රශ්‍රාවකයෝ වන්නාහු ය. මේ බුදුරජුන්හට **ආනන්ද** නම් උපස්ථායක තෙමේ උවටැන් කරන්නේ ය.

5197. **ඛෙමා** ද **උත්පලවර්ණා** ද අග්‍රශ්‍රාවිකාවෝ වන්නාහු ය. **චිත්ත** ද **ආලවක** ද අග්‍රොපාසකයෝ වන්නාහු ය.

5198. **ඛුජ්ජුත්තරා** ද **නන්දමාතා** ද අග්‍රොපාසිකාවෝ වන්නාහු ය. මේ වීරයන් වහන්සේගේ බොධිය 'ඇසතු' ය යි කියනු ලැබේ."

5199. අසම වූ මහර්ෂීන් වහන්සේගේ මේ වචනය අසා සතුටු වූ දෙව්මිනිස්සු බඳිලි ඇත්තාහු නමස්කාර කෙරෙත්.

5200 - 5201. එකල්හි මම සුශික්ෂිත වූ **මෙඝ** නම් මාණවකයෙක් වීමි. සුමෙධ විවරණය අසා කරුණා ඇති මනා නුවණ ඇති මහාමුනි කෙරෙහි විශ්වාස ඇතියෙම් පැවිදි වන්නා වූ ඒ (සුමෙධ) වීරයන් අනුව එක්ව ම පැවිදි වීමි.

5202. ප්‍රාතිමොක්ෂ සංවරයෙහි ද පඤ්චවිධ ඉන්ද්‍රියසංවරයෙහි ද සංවෘත වූයෙම් පිරිසිදු ආජීව ඇතියෙම් සිහියෙන් යුතු වූයෙම් බුදුසසුන කරන්නා වූ වීරයෙක් වූයෙම්-

5203. මෙසේ වාස කරන්නා වූ මම කිසියම් පාපමිත්‍රයෙකු විසින් අනාචාරයෙහි යොදවන ලද්දෙම් සුමඟින් ගිලිහුනෙම්-

5204. විතර්කයට වසඟ වූයෙම් සසුනෙන් බැහැර වීමි. පසුව ඒ පාපමිත්‍රයා විසින් මාතෘඝාතනයෙහි යොදවන ලද්දෙම්. -

5205. අකරිං ආනන්තරියං ඝාතයිං දුට්ඨමානසො,
තතො චුතො මහාවීචිං උපපන්නො සුදාරුණං.

5206 විනිපාතගතො සන්තො සංසරිං දුක්ඛිතො චිරං,
න පුනො අද්දසං වීරං සුමෙධං නරපුඞ්ගවං.

5207. අස්මිං කප්පෙ සමුද්දම්හි මච්ඡො ආසිං තිමිඞ්ගලො,
දිස්වානං සාගරෙ නාවං ගොචරත්ථමුපාගමිං.

5208. දිස්වා මං වාණිජා භීතා බුද්ධසෙට්ඨමනුස්සරුං.
ගොතමොති මහාඝොසං සුත්වා තෙහි උදීරිතං,

5209. පුබ්බසඤ්ඤං සරිත්වාන තතො කාලකතො[1] අහං,
සාවත්ථියං කුලෙ ඉද්ධෙ ජාතො බ්‍රාහ්මණජාතියං.

5210. ආසිං ධම්මරුචි නාම සබ්බපාපජිගුච්ඡකො,
දිස්වානං ලොකපජ්ජොතං ජාතියා සත්තවස්සිකො.

5211. මහාජෙතවනං ගන්ත්වා පබ්බජිං අනගාරියං,
උපෙමි බුද්ධං තික්ඛත්තුං රත්තියා දිවසස්ස ච.

5212. තදා දිස්වා මුනී ආහ චිරං ධම්මරුචීති මං,
තතොහං අවචං බුද්ධං පුබ්බකම්මපභාවිතං:

5213. "සුචිරං සතපුඤ්ඤලක්ඛණං පතිපුබ්බෙන විසුද්ධපච්චයං
අහමජ්ජ සුපෙක්ඛනං වත තව පස්සාමි නිරූපමවිග්ගහං[2]

5214. සුචිරං විහතත්තමො තයා සුචිරක්ඛෙන නදී විසොසිතා
සුචිරං අමලං විසොධිතං නයනං ඤාණමයං මහාමුනෙ.

5215. චිරකාලං සමඞ්ගිතො[3] තයා න විනට්ඨො[4] පුනරන්තරං චිරං,
පුනරජ්ජ සමාගතො තයා න හි නස්සන්ති කතානි ගොතම."

5216. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5217. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5218. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා ධම්මරුචිත්ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ධම්මරුචිත්ථෙරස්ස අපදානං නවමං.

---

1. කාලඞ්කතො, මජසං. 2. නිරූපමං විග්ගහං, මජසං. නිරූපමග්ගහං. සීමු.
3. චිරකාල සමඞ්ගිතො, මජසං. චිරකාලං සමාගතො, PTS.
4. අවිනට්ඨො, මජසං.

5205. ආනන්තර්යයක් කෙළෙමි. දුෂ්ට සිත් ඇත්තෙම් මව මැරීමි. ඒ අත්බැවින් චුතවූයෙම් ඉතා දරුණු මහා අවීචි නරකයෙහි උපන්නේ වෙමි.

5206. දුගතියට ගියෙම් බොහෝ කලක් දුඃඛිත ව හැසිරුණෙමි. නැවත නරශ්‍රෙෂ්ඨ වූ සුමෙධ වීරයා නො දිටිමි.

5207. මෙම කල්පයෙහි සමුද්‍රයෙහි තිමිඞ්ගල නම් මත්ස්‍යයෙක් වීමි. සයුරෙහි නැවක් දැක ගොදුරු පිණිස (ඒ නැව ගිලගණු පිණිස) වෙතට ගියෙමි.

5208. මා දැක බියපත් වූ වෙළෙන්දෝ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහි කළාහු ය. ඔවුන් විසින් කියන ලද 'ගොතම' යන මහා ඝොෂය අසා-

5209. පූර්ව (දීපඞ්කර විවරණ) සංඥාව සිහි කොට මම එඅත්බැවින් කලුරිය කෙළෙමි. සැවැත් නුවර ආඪ්‍ය වූ කුලයෙක බ්‍රාහ්මණ ජාතියෙහි උපන්මි.

5210. ධර්මරුචි නම් වූ යෙමි. සියලු පව් පිළිකුල් කරන්නෙක් වූ, උත්පත්තියෙන් සත් හැවිරිදි වූ මම ලොව බබුළුවන්නා වූ බුදුරජුන් දැක,

5211. දෙව්රම් මහ වෙහෙරට ගොස් සස්නෙහි පැවිදි වීමි. රෑ දෙවෙහි තෙවිටක් බුදුරජුන් වෙත එළඹෙමි.

5212. එකල්හි මුනි තෙම මා බොහෝ කලෙකින් දැක 'ධම්මරුචි'ය යි වදාළේ ය. ඉක්බිති මම පූර්වකර්මයෙන් ප්‍රභාවිත වූ බුදුරජුන්හට (මෙසේ) කීමි:

5213. "සියපින් ලකුණු ඇති, පෙර දිවකුරුපාමුල්හි පරිපූර්ණ (පාරමී) ප්‍රත්‍යයසම්භාර ඇති, සුන්දරදර්ශන ඇති, අනුපමශරීර ඇති ඔබ වහන්සේ ඉතා බොහෝ කලෙකින් අද මම ඒකාන්තයෙන් දක්මි.

5214. මහා මුනීන්ද්‍රයන් වහන්ස, ඔබ වහන්සේ විසින් බොහෝ කලෙකින් මොහඳුර වෙසෙසින් නසන ලද. පවිත්‍රධර්මගොපන විසින් තෘෂ්ණා නදිය වියළන ලදු. බොහෝ කලෙකින් ඥනමය වූ දිවැස ඔබවහන්සේ විසින් ලබන ලදි.

5215. ගෞතමයන් වහන්ස, බොහෝ කලක් ඔබ වහන්සේ සමග එක්වූයෙම් නො නටුයෙම් වීමි. යළි (ඔබ වහන්සේගෙන් වෙන්වීමේ) අතරතුර බොහෝ කලෙක. නැවත මම අදඔබ වහන්සේ සමග එක්වූයෙම් (සමග වසනෙම්) වෙමි. (ඔබ වහන්සේ සමග) කළ (සමාගමාදි) කර්ම (ස්කන්ධපරිනිර්වාණය තෙක්) නොනසිත් මැයි."

5216. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

5217. බුදුරජානන් වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

5218. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන්වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙසින් ආයුෂ්මත් ධම්මරුචි ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

ධම්මරුචිස්ථවිරාපදානය නව වැනි යි.

490. සාලමණ්ඩපියත්ථෙරාපදානං

5219. අජ්ඣොගහෙත්වා සාලවනං සුකතො අස්සමො මම,
සාලපුප්ඵෙහි සඤ්ඡන්නො වසාමි විපිනෙ තදා.

5220. පියදස්සී ච භගවා සයම්භූ අග්ගපුග්ගලො,
විවෙකකාමො සම්බුද්ධො සාලවනමුපාගමි.

5221. අස්සමා අභිනික්ඛම්ම පවනං අගමාසහං,
මූලඵලං ගවෙසන්තො ආහිණ්ඩාමි වනෙ තදා.

5222. තත්ථද්දසාසිං සම්බුද්ධං පියදස්සිං මහායසං,
සුනිසින්නං සමාපන්නං විරොචන්තං මහාවනෙ.

5223. චතුදණ්ඩෙ ඨපෙත්වාන බුද්ධස්ස උපරී අහං.
මණ්ඩපං සුකතං කත්වා සාලපුප්ඵෙහි ඡාදයිං.

5224. සත්තාහං ධාරයිත්වාන මණ්ඩපං සාලඡාදිතං,
තත්ථ චිත්තං පසාදෙත්වා බුද්ධසෙට්ඨං අවන්දහං.[1]

5225. භගවා තම්හි සමයෙ වුට්ඨහිත්වා සමාධිතො,
යුගමත්තං පෙක්ඛමානො නිසීදි පුරිසුත්තමො.

5226 සාවකො වරුණො නාම පියදස්සිස්ස සත්ථුනො,
වසීසතසහස්සෙහි උපගච්ඡි විනායකං.

5227. පියදස්සී ච භගවා ලොකජෙට්ඨො නරාසභො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා සිතං පාතුකරී ජිනො.

5228. අනුරුද්ධො උපට්ඨාකො පියදස්සිස්ස සත්ථුනො,
එකංසං චීවරං කත්වා අපුච්ඡිත්ථ මහාමුනිං:

5229. කො නු ඛො භගවා හෙතු සිතකම්මස්ස සත්ථුනො,
කාරණෙ විජ්ජමානම්හි සත්ථා පාතුකරෙ සිතං.

5230. "සත්තාහං පුප්ඵඡදනං[2] යො මෙ ධාරෙසි මාණවො,
තස්ස කම්මං සරිත්වාන සිතං පාතුකරිං අහං.

5231. ඔකාසාහං[3] න පස්සාමි යත්ථ[4] පුඤ්ඤං විපච්චති,
දෙවලොකෙ මනුස්සෙ වා ඔකාසො ච[5] න සම්මති.

5232. දෙවලොකෙ වසන්තස්ස පුඤ්ඤකම්මසමඞ්ගිනො,
යාවතා පරිසා තස්ස සාලච්ඡන්නා භවිස්සති.

5233. තත්ථ දිබ්බෙහි නච්චෙහි ගීතෙහි වාදිතෙහි ච,
රමිස්සති සදා සන්තො පුඤ්ඤකම්මසමාහිතො.

1. බුද්ධසෙට්ඨමවන්දහං, මජසං. 2 සාලච්ඡදනං, මජසං.
3. අනොකාසං මජසං 4. යං තං, සයා. PTS. 5. ඔකාසො ව, මජසං.

490. සාලමණ්ඩපිය ස්ථවිරාපදානය

5219. සල්වනයට පිවිස මා විසින් අසපුවක් මැනැවින් කරණ ලදි. එකල්හි සල්මලින් ගැවසීගත්තෙම් ඒ වනයෙහි වෙසෙමි.

5220. සියල්ල තෙමේ ම අවබොධ කළා වූ භාග්‍යවත් පියදස්සී සම්බුදුරජහු විවෙකසැප කැමැත්තේ සල්වනයට එළඹි සේක.

5221. එකල්හි මම අසපුවෙන් නික්ම වනයට ගියෙමි. මුල් හා ඵල සොයමින් වනයෙහි ඇවිදිමි.

5222 ඒ මහවෙනෙහි මනාසේ වැඩහුන්නා වූ සමාධියට සමවන් බබලන්නා වූ මහත් යශස් ඇති පියදස්සි සම්බුදුරජුන් දිටිමි.

5223. මම මුදුනෙන් එකට බැඳි දඬුසතරක් තබා බුදුරජුන් මතුයෙහි සෙවෙනි පිණිස මනා මඩුවක් කොට සල්මලින් වැසීමි.

5224. මම සල්මලින් වැසූ මණ්ඩපය සතියක් දරා එහි සිත පහදවා බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට වැන්දෙමි.

5225. පුරුෂොත්තම වූ භාග්‍යවතුන් වහන්සේ සමාධියෙන් නැගිට වියදඬු පමණ දුර බලමින් වැඩ හුන්සේක.

5226. පියදස්සි බුදුරජුන්ගේ වරුණ නම් ශ්‍රාවක තෙමේ ලක්ෂයක් රහතුන් සමග බුදුරජුන් වෙත එළඹියේ ය.

5227. පස්මරුන් දිනූ ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ පියදස්සී භාග්‍යවතුන් වහන්සේත් බික්සඝන මැද හිඳ සිනා පහළ කළසේක.

5228. පියදස්සී බුදුරජුන්ගේ අනුරුද්ධ නම් උපස්ථායක තෙමේ සිවුර එකස් කොට බුදුරජුන් මෙසේ විචාළේ ය:

5229. "භාග්‍යවතුන් වහන්ස, ශාස්තෘන් වහන්සේගේ සිනා පහළ කිරීමට හෙතු කිම? ශාස්තෘ තෙමේ කරුණක් ඇති කල්හි ම සිනා පහළ කරන්නේ ය

5230. "යම් මාණවකයෙක් සතියක් මුළුල්ලෙහි මට මල් සෙවෙනියක් දැරී ද ඔහුගේ ඒ කර්මය සිහි කොට මම සිනා පහළ කෙළෙමි.

5231. යම් තැනක ඒ පිණ විපාක දේ නම් අවකාශයක් (එයට ඉඩ ඇතිට තැනක් මම නො දකිමි. දෙව්ලොවැ හෝ මිනිස් ලොවැ හෝ හෝ ඇති අවකාශය නො සෑහේ.

5232. පුණ්‍යකර්මයෙන් යුක්ත වූ දෙව්ලොව වසන ඔහුගේ සියලු පිරිස සල්සෙවෙනියෙන් වැසුනා වන්නේ ය.

5233. හේ පුණ්‍යකර්මවිපාකය සමග යෙදුනේ එහි දිව්‍යමය වූ නෘත්‍ය-ගීත-වාදිතයෙන් ද හැම කල්හි සිත් අලවා වසන්නේ ය.

5234. යාවතා පරිසා තස්ස ගන්ධගන්ධී භවිස්සති,
සාලස්ස පුප්ඵවස්සො ච පවස්සිස්සති තාවදෙ.

5235 තතො චුතොයං මනුජො මානුසං ආගමිස්සති,
ඉධාපි සාලච්ඡදනං සබ්බකාලං ධරීයති

5236. ඉධ නච්චඤ්ච ගීතඤ්ච සම්මතාලසමාහිතං,
පරිවාරෙස්සන්තිමං නිච්චං බුද්ධපූජායිදං ඵලං.

5237. උග්ගච්ඡන්තෙ ච සූරියෙ සාලවස්සං පවස්සති,
පුඤ්ඤකම්මෙන සංයුත්තං වස්සතෙ සබ්බකාලිකං.

5238. අට්ඨාරසෙ කප්පසතෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන[1] සත්ථා ලොකෙ භවිස්සති.

5239. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො.

5240. ධම්මං අභිසමෙන්තස්ස සාලච්ඡදනං භවිස්සති,
චිතකෙ ඣායමානස්ස ඡදනං තත්ථ හෙස්සති."

5241. විපාකං කිත්තයිත්වාන පියදස්සීමහාමුනි,
පරිසාය ධම්මං දෙසෙසි තප්පයන්තො ධම්මවුට්ඨියා.

5242. තිංසකප්පානි දෙවෙසු දෙවරජ්ජමකාරයිං,
සට්ඨි ච සත්තක්ඛත්තුඤ්ච චක්කවත්ති අහොසහං.

5243. දෙවලොකා ඉධාගන්ත්වා ලභාමි විපුලං සුඛං,
ඉධාපි සාලච්ඡදනං හෙස්සති සබ්බකාලිකං.

5244. මහාමුනිං තොසයිත්වා ගොතමං සක්‍යපුඞ්ගවං,
පත්තොම්හි අචලං ඨානං හිත්වා ජයපරාජයං.

5245. අට්ඨාරසෙ කප්පසතෙ යං බුද්ධමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

5246. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5247. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5248. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **සාලමණ්ඩපියො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

සාලමණ්ඩපියත්ථෙරස්ස අපදානං දසමං.

1. ගොත්තෙන, මජසං.

5234. ඔහුගේ සියලු පිරිස සුගන්ධයෙන් සුගන්ධවත් වූයේ වන්නේ ය. එකෙණෙහි සල්මල් වැසි ද වස්නේ ය.

5235. මෙ මිනිස් තෙම දෙව්ලොවින් චුතව මිනිසත් බවට පැමිණෙන්නේ නම් මෙ මිනිස්ලොව්හි ද හැමකල්හි ම සල්මල් සෙවෙනියක් දරන්නේ ය.

5236. මෙහි කසිතාලම් යුත් නැටුම් ද, ගැයුම් ද ඔහු නිතර පිරිවරන්නාහු ය. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5237. හිරු උදාවන කල්හි සල්මල්වැසි වසී. පුණ්‍යකර්මයෙන් සංයුක්ත වූ ඔහට හැමකල් (එවැසි) වසී.

5238. අටළොස්සියවනකපෙහි ඔක්කාකකුලයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් වූ ශාස්තෘ තෙමේ ලොව් පහළවන්නේ ය.

5239. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් ම නිර්මිත කල්‍යාණ් වැනි වූ ඖරස බුද්ධපුත්‍ර වූයේ සියලු ආස්‍රවයන් (ප්‍රහාණපරිඥා වශයෙන්) දැන ආස්‍රව රහිතව පිරිනිවන් පාන්නේ ය.

5240. ධර්මය අවබොධ කරන්නා වූ මොහුට සල්මල් සෙවෙනි ක් වන්නේ ය. පිරිනිවීමෙන් පසු චිතකය දැවෙන කල්හි ද සෙවෙනියක් එහි වන්නේ ය.''

5241. මහාමුනි වූ පියදස්සී බුදුරජ තෙමේ පුණ්‍යකර්ම විපාකය වදුරා දහම් වැස්සෙන් සතහමින් පිරිසට දහම් දෙසී ය.

5242. මම දෙවියන් අතුරෙහි තිස්කපක් දිව්‍යරාජ්‍යය කරවීමි. සත් සැටවරක් සක්විතිරජ වීමි.

5243. දෙව්ලොවින් මෙහි පැමිණ මහත් වූ සැප ලබමි. මෙහි ද සර්වකාලික වූ සල්මල්සෙවෙනියෙක් වන්නේ ය.

5244. ශාක්‍යකුලශ්‍රෙෂ්ඨ වූ ගෞතම බුදුරජුන් තුටු කොට ජය පරාජය හැරලා අචලසප්තය වූ නිවණට පැමිණියෙමි වෙමි.

5245. අටළොස්සිය වන කපෙහි යම් බුද්ධපූජාවක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5246. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5247. බුදුරජානන් වහන්සේ වෙත මාගේ පැමිණීම සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

5248. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසෙයින් සාලමණ්ඩපිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

සාලමණ්ඩපියස්ථවිරාපදානය දසවැනියි.

උද්දානං:

පංසුකූල බුද්ධසඤ්ඤී භිසදො ඤාණකිත්තකො
චන්දනී ධාතුපූජී ච පුලිනුප්පාදකො පිච
තරණො ධම්මරුචිකො සාලමණ්ඩපියො තථා
ගාථාසතානි ද්වෙ හොන්ති[1] ඌනවීසති එව ච.

පංසුකූලවග්ගො එකූනපඤ්ඤාසමො.

491. තිකිණ්ඩිපුප්ඵියත්ථෙරාපදානං

5249. කණිකාරංව ජොතන්තං නිසින්නං පබ්බතන්තරෙ,
අද්දසං විරජං බුද්ධං විපස්සිං ලොකනායකං.

5250. තීණි කිණ්ඩිපුප්ඵානි පග්ගය්හ අභිරොපයිං,
සම්බුද්ධමභිපූජෙත්වා ගච්ඡාමි දක්ඛිණාමුඛො.

5251. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

5252. එකනවුතෙ ඉතො කප්පෙ යං බුද්ධමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

5253. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5254. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5255. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා තිකිණ්ඩිපුප්ඵියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

තිකිණ්ඩිපුප්ඵියත්ථෙරස්ස අපදානං පඨමං.

492. පංසුකූලපූජකත්ථෙරාපදානං

5256 හිමවන්තස්ස අවිදූරෙ උදඞ්ගණො නාම පබ්බතො,
තත්ථද්දසං පංසුකූලං දුමග්ගම්හි විලම්බිතං.

5257. තීණි කිණ්ඩිපුප්ඵානි ඔචිනිත්වානහං තදා,
හට්ඨො හට්ඨෙන චිත්තෙන පංසුකූලං අපූජයිං.

5258. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

1. සතානි ද්වෙ හොන්ති ගාථා, මජසං.

උද්දානය:-

පංසුකූල බුද්ධසඤ්ඤී භිසද ඤාණකිත්තික,
චන්දනී ධාතුපූජී ය පුලිනුප්පාදක සහ
තරණ ධම්මරුචික සාලමණ්ඩපිය මෙදසෙන්
දෙගාසිය උනුවිසි මෙම වග සපිරුනේ වේ.

පංසුකූල වග්ගය එකුන්පණස් වැනියි.

491. තිකිඞ්කණිපුප්ඵියසථවිරාවදානය

5249. කිණිකිරිරුකක් මෙන් බබලන්නා වූ, කඳු අතරෙහි වැඩ හුන්නා වූ, ලොකනායක වූ, කෙලෙස්රජස් විරහිත **විපස්සී** බුදුරජුන් දිටිමි.

5250. කිඞ්කණිපුෂ්ප තුණක් ගෙණ එ බුදුරජුන්හට පිදීමි. සම්බුදු රජුන් පුදා දකුණුදිගට මුහුණ ලා ගෙමි.

5251. මම මැනවින් කරණ ලද එම කර්මය හේතු කොට ගෙණ ද, චිත්තප්‍රණිධීන් හේතු කොට ගෙණ ද මිනිස්සිරුර හැරපියා තව්තිසා දෙව් ලොවට උත්පත්තිවශයෙන් ගියෙමි.

5252. මෙයින් එක් අනූවනකපෙහි යම් බුද්ධපූජාවක් කෙළෙම් ද, ඒ හේතුවෙන් දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5253. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

5254. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

5255. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් **තිකිඞ්කණිපුප්ඵිය** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාලසේකි.

තිකිඞ්කණිපුප්ඵියසථවිරාවදානය පළමුවැනියි.

492. පංසුකූලපූජකසථවිරාවදානය

5256. හිමවතට නුදුරෙහි උදඞ්ගණ නම් පර්වතයෙක් විය. එහි ගස්මුදුනක එල්වන ලද පංසුකූලචීවරය දිටිමි.

5257. එකල්හි මම කිඞ්කණී මල් තුණක් නෙලා ගෙණ සතුටු වූයෙම් සතුටු සිතින් ම ඒ පාංශුකූල චීවරය පිදීමි.

5258. මැනැවින් කරණ ලද එම කර්මය හේතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හේතු කොට ගෙණ ද මිනිස් සිරුර හැර තව්තිසා දෙව්-ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

5259. එකනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පූජෙත්වා අරහද්ධජං.

5260. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5261. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5262. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා පංසුකූලපූජකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

පංසුකූලපූජකත්ථෙරස්ස අපදානං දුතියං.

493. කොරණ්ඩපුප්ඵියත්ථෙරාපදානං

5263. වනකම්මිකො පුරෙ ආසිං පිතුපිතාමහෙනහං[1],
පසුමාරෙන ජීවාමි කුසලං මෙ න විජ්ජති.

5264. මම ආසයසාමන්තා තිස්සො ලොකග්ගනායකො,
තීණි පදානි[2] දස්සෙසි අනුකම්පාය චක්ඛුමා.

5265. අක්කන්තෙ ච පදෙ දිස්වා තිස්සනාමස්ස සත්ථුනො,
හට්ඨො හට්ඨෙන චිත්තෙන පදෙ චිත්තං පසාදයිං.

5266. කොරණ්ඩං පුප්ඵිතං දිස්වා පාදපං ධරණීරුහං,
සකොසකං ගහෙත්වාන පදසෙට්ඨමපූජයිං[3].

5267. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

5268 යං යං යොනුපපජ්ජාමි දෙවත්තං අථ මානුසං,
කොරණ්ඩකච්ඡවී[4] හොමි සප්පභාසො[5] භවාමහං.

5269. ද්වෙනවුතෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි පදපූජායිදං ඵලං.

5270 කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

---

1 පිතුමාතුමතෙනහං, මජසං.
2 පදානි තීණි, මජසං.
3. පදසෙට්ඨං අපූජයිං, සිමු.
4 කොරණ්ඩකච්ඡවි, මජසං.
5. සුප්පභාසො, මජසං.

5259 මෙයින් එක් අනූවන කපෙහි එකල යම් කර්මයක් කෙළෙම් ද, අර්හත්ධ්වජය පුදූ (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි.

5260. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැදුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

5261. බුදුරජානන් වහන්සේ ලවත මාගේ පැමිණීම එකාන්තයෙන් ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5262 සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් පංසුකූලපූජක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

පංසුකූලපූජක ස්ථවිරාවදානය දෙවැනියි.

493. කොරණ්ඩපුප්ඵිය ස්ථවිරාවදානය

5263. පෙර මම පියමුතුන් පරපුරෙන් වනයෙහි දඩයම් කරනුයෙහිම් වීමි. සිවුපා සතුන් මැරීමෙන් ජීවත් වෙමි. මට කුශලයෙක් නැත.

5264 මාගේ අසපුව අබියෙස පසැස් ඇති ලොකාග්‍රනායක වූ තිස්ස බුදුරජ තෙමේ අනුකම්පායෙන් පියවරතුනක් දැක්වී ය.

5265. තිස්ස බුදුරජුන් දැක්වූ පියසටහන් දැක සතුටු වූයෙමි සතුටු සිතින් පියවර සටහනෙහි සිත පැහැද වීමි.

5266. පිපී ගිය කරඬුගසක් දැක කොපු සහිත මල් ගෙණ ශ්‍රේෂ්ඨ ශ්‍රීපාදලාඤ්ඡනය පිදීමි.

5267. මම මැනැවින් කරණ ලද එම කර්මය හේතු කොට ගෙණ ද, චිත්තප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද මිනිස්සිරුර හැර තව්තිසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

5268. මම දිව්‍ය වූ හෝ මනුෂ්‍ය වූ හෝ යම් යම් යොනියක උපදිම් ද ප්‍රභා සහිත වූ කොරණ්ඩපුෂ්පවර්ණ වූ සිවි ඇත්තෙම් වෙමි.

5269. මෙයින් දෙයානූවනකපෙහි එකල යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. පාසටහන් පිදීමෙහි මේ විපාක යි.

5270. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැදුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි

5271. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5272. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා කොරණ්ඩපුප්ඵියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

කොරණ්ඩපුප්ඵියත්ථෙරස්ස අපදානං තතියං.

494. කිංසුකපුප්ඵියත්ථෙරාපදානං

5273. කිංසුකං පුප්ඵිතං දිස්වා පග්ගහෙත්වාන අඤ්ජලිං,
බුද්ධසෙට්ඨං සරිත්වාන ආකාසෙ අභිපූජයිං.

5274. තෙන කම්මෙන සුකතෙන චෙතනා පණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

5275. එකතිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

5276. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5277 ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5278 පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා කිංසුකපුප්ඵියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

කිංසුකපුප්ඵියත්ථෙරස්ස අපදානං චතුත්ථං.

495. උපඩ්ඪදුස්සදායකත්ථෙරාපදානං

5279. පදුමුත්තරස්ස භගවතො සුජාතො නාම සාවකො,
පංසුකූලං ගවෙසන්තො සංකාරෙ චරතී[1] තදා,

5280. නගරෙ හංසවතියා පරෙසං භතකො අහං,
උපඩ්ඪදුස්සං දත්වාන සිරසා අභිවාදයිං.

5281. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

1. චරතෙ, මජසං.

5271. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5272. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් කොරණ්ඩපුප්ඵිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

කොරණ්ඩපුප්ඵියස්ථවිරාවදානය තෙවැනියි.

494. කිංසුකපුප්ඵියස්ථවිරාවදානය

5273. පිපී ගිය කැලගසක් දැක ඇඳිලි බැඳගෙණ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ සිහිපත් කොට අහසෙහි (තිබියදීම මල්) පිදීමි.

5274. මම මැනැවින් කරණ ලද එම කර්‍මය හේතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හේතු කොට ගෙණ ද, මිනිස්සිරුර හැර තව්තිසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

5275. එකල්හි මෙයින් එක්තිස්වන කපෙහි යම් කර්‍මයක් කෙළෙම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5276. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රවරහිත ව වෙසෙමි.

5277. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5278. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් කිංසුකපුප්ඵිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

කිංසුකපුප්ඵිය ස්ථවිරාවදානය සිවුවැනියි.

495. උපඩ්ඪදුස්සදායකස්ථවිරාවදානය

5279. එකල්හි පදුමුත්තර බුදුරජානන් වහන්සේගේ සුජාත නම් ශ්‍රාවක තෙමේ පාංශුකූල (සිවුරු සඳහා) රෙදි කඩ සොයමින් කසල ඇති තන්හි හැසිරෙයි.

5280. මම හංසවතී නගරයෙහි පරහට (මෙහෙ කරණ) බැලයෙක් වූ යෙමි උන්වහන්සේට අඩවතක් (රෙදිකැබැල්ලක්) දී හිස නමා වන්දෙමි.

5281. මම මැනැවින් කරණ ලද එම කර්‍මය හේතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හේතු කොට ගෙණ ද මිනිස් සිරුර හැර තව්තිසා දෙව්-ලොවට උත්පත්තිවශයෙන් ගියෙමි.

5282. තෙත්තිංසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජමකාරයිං,
සත්තසත්තතික්ඛත්තුඤ්ච චක්කවත්තී අහොසහං.

5283. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං,
උපඩ්ඪදුස්සදානෙන මොදාමි අකුතොභයො.

5284. ඉච්ඡමානො චහං අජ්ජ සකානනං සපබ්බතං,
ඛොමදුස්සෙහි ඡාදෙය්‍යං අඩ්ඪදුස්සස්සිදං ඵලං.

5285. සතසහස්සෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි අඩ්ඪදුස්සස්සිදං ඵලං.

5286. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5287. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5288. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා උපඩ්ඪදුස්සදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

උපඩ්ඪදුස්සදායකත්ථෙරස්ස අපදානං පඤ්චමං.

496. ඝතමණ්ඩදායකත්ථෙරාපදානං

5289. සුචින්තිතං භගවන්තං ලොකජෙට්ඨං නරාසභං,
උපවිට්ඨං මහාරඤ්ඤං[1] වාතාබාධෙන පීළිතං.
දිස්වා චිත්තං පසාදෙත්වා ඝතමණ්ඩං උපානයිං.[2]

5290. කතත්තා ආචිතත්තා ච[3] ගඞ්ගා භාගීරථී[4] අයං,
මහාසමුද්දා චත්තාරො ඝතං සම්පජ්ජරෙ මම.

5291. අයං ච පඨවී ඝොරා අප්පමාණා අසංඛියා,
මම සඞ්කප්පමඤ්ඤාය භවතෙ මධුසක්ඛරා.[5]

5292. චාතුද්දීපා ඉමෙ රුක්ඛා පාදපා ධරණීරුහා,
මම සඞ්කප්පමඤ්ඤාය කප්පරුක්ඛා භවන්ති තෙ.

5293. පඤ්ඤාසක්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජමකාරයිං,
එකපඤ්ඤාසක්ඛත්තුඤ්ච චක්කවත්තී අහොසහං.
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

5294. ඡන්නවුතෙ ඉතො[6] කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඝතමණ්ඩස්සිදං ඵලං.

1. මහාවීරං, සීමු. 2. ඝතමණ්ඩමුපානයිං, මජසං. 3. උපචිතත්තා ච, ස්‍යා.
4. භාගීරසී, සීමු. 5. මධුසක්කරා, මජසං. 6. චතුන්නවුතිතො, මජසං.

5282 මම තෙතිස් වරක් දෙවෙත්ද්‍රව දිව්‍යරාජ්‍යය කරවීමි. සත් සැත්තෑ වරක් සක්විති රජ වීමි

5283. (ලබන ලද) මහත් ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නො හැකිය. අබිවසත්‍රදානයෙන් අකුතොභය (භය විරහිත) වූයෙම් සතුටු වෙමි.

5284. මම අද කැමති වන්නෙම් නම් වන පර්වත සහිත වූ (සියලු පෙදෙස) කොමු පිළියෙන් වසන්නෙමි. අඩවක් දනෙහි මේ විපාක යි.

5285. එකල්හි මෙයින් සියක් දහස්වන කපෙහි යම් දනක් දුනිම් ද ඒ හෙතුවෙන් දුගතියක් නො දනිමි. රෙදි කඩක් දීමෙහි මේ විපාක යි.

5286. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

5287. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

5288. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් උපඩ්ඪදුස්සදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

උපඩ්ඪදුස්සදායක ස්ථවිරාපදානය පස්වැනියි.

496. ඝතමණ්ඩදායක ස්ථවිරාපදානය

5289. මනා සිතුම් ඇති ලොකජ්‍යෙෂ්ඨ වූ නරශ්‍රෙෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේ වාතාබාධයකින් පීඩිතව මහවෙනෙහි වැඩහුන්නහු දැක සිත පහදවා පිරිසිදු ගිතෙල් සුහක් පිළිගැන් වීමි.

5290. (මෙම පුණ්‍යකර්මය) කළ බැවින් ද ආයුහිත බැවින් ද මේ භාගීරථී ගඟ ද සිවුමහසමුදුර ද මට ගිතෙල් සපයති.

5291. අප්‍රමාණ වූ අසඞ්ඛ්‍ය වූ මේ මහත් පෘථිවිය ද මාගේ අදහස දැන මී සකුරු (බවට පත්) වේ.

5292. සිවුමහ දිවයිනට අයත් මේ වෘක්‍ෂසමූහයෝ ද මාගේ අදහස දැන කල්පවෘක්‍ෂයෝ වෙති.

5293. පණස්වරක් දෙවෙන්ද්‍රව දිව්‍යරාජ්‍යය කෙළෙමි. මම එක්පණස් වරක් සක්විති රජ වීමි. (ලබන ලද) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නො හැකි ය.

5294. මෙයින් සානූවන කපෙහි වූ එකල්හි යම් (ගිතෙල්) දනක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පිරිසිදු ගිතෙල් දනෙහි මේ විපාක යි.

5295. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5296. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5297. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා සතමණ්ඩදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

සතමණ්ඩදායකත්ථෙරස්ස අපදානං ඡට්ඨං.

497. උදකදායකත්ථෙරාපදානං

5298. පදුමුත්තරබුද්ධස්ස භික්ඛුසඞ්ඝෙ අනුත්තරෙ,
පසන්නචිත්තො සුමනො පානීයඝටමපූජයිං[1].

5929. පබ්බතග්ගෙ දුමග්ගෙ වා ආකාසෙ වාථ භූමියං,
යදා පානීයමිච්ඡාමි ඛිප්පං නිබ්බත්තතෙ මම.

5300. සතසහස්සෙ ඉතො කප්පෙ යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි දකදානස්සිදං[2] ඵලං.

5301. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5302. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5303. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා උදකදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

උදකදායකත්ථෙරස්ස අපදානං සත්තමං.

498. පුලිනථූපියත්ථෙරාපදානං

5304. හිමවන්තස්ස අවිදූරෙ යමකො නාම පබ්බතො,
අස්සමො සුකතො මය්හං පණ්ණසාලා සුමාපිතා.

5305. නාරදො නාම නාමෙන ජටිලො උග්ගතාපනො,
චතුද්දසසහස්සානි සිස්සා පරිචරන්ති මං.

1. පානීයඝටමපූරයිං, මජසං. 2. සතමණ්ඩස්සිදං, සීමු.

5295. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

5296. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5297. සිවුපිළිසැඹියාවෝ ද, අෂ්ටවිමොක්‍ෂයෝ ද, ෂඩභිඥාවෝ ද, සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් සතමණ්ඩදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

සතමණ්ඩදායක ස්ථවිරාවදානය සවැනියි.

497. උදකදායක ස්ථවිරාවදානය

5298. **පදුමුත්තර** බුදුරජුන්ගේ අනුත්තර වූ භික්‍ෂුසංඝයා කෙරෙහි පහන්සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් පැන්කළයක් පිදීමි.

5299. පර්වත මුදුනෙහි වේවයි ගස් මුදුනෙහි වේවයි අහසෙහි වේවයි පොළොවෙහි වේවයි යම් කලෙක පැන් කැමති වෙම් නම් වහා මට (එය) පහළ වේ.

5300. එකල්හි මෙයින් සියක්දහස් වන කපෙහි යම් (පැන්) දනක් දුනිම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. පැන් දීමෙහි මේ විපාක යි.

5301. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිත ව වෙසෙමි.

5302. බුදුරජානන් වහන්සේ වෙත පැමිණීම මට ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5303. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් **උදකදායක** ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

උදකදායක ස්ථවිරාවදානය සත්වැනියි.

498. පුලිනථූපියස්ථවිරාවදානය

5304. හිමවතට නුදුරෙහි යමක නම් පර්වතයෙක් විය. (එහි) මාගේ අසපුව මැනැවින් කරණ ලද්දකි. පන්සැල ද මොනොවට නිර්මිත ය.

5305. මම නමින් නාරද නම් වූ උග්‍ර තපස් ඇති ජටිලයෙක් වෙමි. තුදුස්දහසක් ශිෂ්‍යයෝ මා පිරිවරත්.

5206. පටිසල්ලීනකො සන්තො එවං චින්තෙසහං තදා:
සබ්බො ජනො මං පූජෙති නාහං පූජෙමි කිඤ්චනං.

5307. න මෙ ඔවාදකො අත්ථි වත්තා කොචි න විජ්ජති,
අනාචරියුපජ්ඣායො වනෙ වාසං උපෙමහං.

5303. උපාසමානො යමහං ගරුචිත්තං උපට්ඨහෙ,
සො මෙ ආචරියො නත්ථි වනවාසො නිරත්ථකො.

5309. ආයාගමෙම ගවෙසිස්සං ගරුං භාවනියං තථා,
සාවස්සයො වසිස්සාමි න කොචි ගරහිස්සති.

5301. උත්තානකූලා නදිකා සුපතිත්ථා මනොරමා,
සුසුද්ධපුලිනාකිණ්ණා අවිදූරෙ මමස්සමං.

5311. නදිං අමරිකං නාම උපගන්ත්වානහං තදා,
සංවඩ්ඪයිත්වා පුලිනං අකං පුලිනචෙතියං.

5312. යෙ තෙ අහෙසුං සම්බුද්ධා භවන්තකරණා මුනී,
තෙසං එතාදිසො ථූපො තන්නිමිත්තං කරොමහං.

5313. කරිත්වා පුලිනං[1] ථූපං සොවණ්ණං මාපයිං අහං,
සොණ්ණකිඞ්ඛණිපුප්ඵානං[2] සහස්සෙ තීණි පූජයිං.

5314. සායං පාතං නමස්සාමි වෙදජාතො කතඤ්ජලී,
සම්මුඛා විය සම්බුද්ධං වන්දිං පුලිනචෙතියං.

5315. යදා කිලෙසා ජායන්ති විතක්කා ගෙහනිස්සිතා,
සරාමි සුගතං[3] ථූපං පච්චවෙක්ඛාමි තාවදෙ.

5316. උපනිස්සාය විහරං සත්ථවාහං විනායකං,
කිලෙසෙ සංවසෙය්‍යාසි න යුත්තං තව මාරිස.

5317. සහ ආවජ්ජිතෙ ථූපෙ ගාරවං හොති මෙ තදා,
කුවිතක්කෙ විනොදෙමි[4] නාගො තුත්තට්ටිතො යථා.

5318. එවං විහරමානං මං මච්චුරාජාභිමද්දථ,
තත්ථ කාලකතො[5] සන්තො බ්‍රහ්මලොකං අගච්ඡහං.[6]

5319. යාවතායුං වසිත්වාන තිදසෙ උපපජ්ජහං,
අසීතික්ඛත්තුං දෙවින්දො දෙවරජ්ජමකාරයිං.

5320. සතානං තීණික්ඛත්තුඤ්ච චක්කවත්ති අහොසහං,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

1. පුලිනෙ, සී මු. ස්‍යා. PTS. 2. සොණ්ණකිඞ්ඛණිපුප්ඵානි, මජ්සං.
3. සුකතං, මජ්සං. 4. විනොදෙසිං, මජ්සං. 5. කාලඞ්කතො, මජ්සං.
6 බ්‍රහ්මලොකම්ගච්ඡහං, මජ්සං.

5306. මම එකල්හි විවේකීව හුන්නෙම් මෙසේ සිතීමි. සියලු ජන තෙමේ මා පුදයි. මම කිසිවකු නො පුදමි.

5307. මට ඔවා දෙන්නෙක් නැත කරුණු නො කරණු කියන්නෙක් නැත. මම ආචාර්ය - උපාධ්‍යාය විරහිතව වනවාසයට පැමිණෙමි.

5308. මම යමෙකු උපාසනා (ඇසුරු) කරන්නෙම් ගුරුසිත උපදවන්නෙම් ද මට එබඳු ගුරුවරයෙක් නැත. වනයෙහි විසීම නිරර්ථක ය.

5309. (මම) මපිසින් පූජ්‍ය වූ එසේ ම ගරුභාවනීය වූ උතුමකු සොයන්නෙමි. (එබඳු උතුමකු) ඇසුරු කරන්නෙක්ව වසනෙමි. කිසිවෙක් මට නො ගරහන්නේ ය.

5310. නො ගැඹුරු ඉවුරු ඇති මනා තොට ඇති සුද්ධසුදු වැලිතලාවෙන් ගැවසීගත් කුඩා ගඟක් මාගේ අසපුවට නුදුරෙහි විය.

5311. එකල්හි මම අමරිකා නම් වූ එ නදියට එළඹ වැලි එකතුකොට පුලිනචෛත්‍යයක් (වැලිසෑයක්) කෙළෙමි.

5312. භවය කෙළවර කරන්නා වූ යම් ඒ සම්බුදු මුනිවරු වූහු නම් මෙබඳු වූ සෑය උන්වහන්සේ උදෙසා ය. මෙය මම උන්වහන්සේ අරමුණු කොට කරමි.

5313. වැලි සෑයක් කොට මම (ඉර්ධියෙන්) රන් නිපදවීමි. (එයින් සෑදූ) රන් කිකිණිමල් තුන් දහසක් පූජා කෙළෙමි.

5314. හටගත් ප්‍රීති ඇත්තෙම් බැඳිලි ඇත්තෙම් උදය සවස නමදිමි. සම්බුදුන් හමුයෙහිදී මෙන් පුලින චෛත්‍යය වැන්දෙමි.

5315. යම් කලෙක්හි කාමනිඃශ්‍රිත වූ විතර්කයෝ හටගනිත් ද, එකෙණෙහි සම්බුද්ධස්තූපය සිහි කරමි. (මෙසේ ද) ප්‍රත්‍යවේක්ෂා කරමි:

5316. "නිදුකාණෙනි, සාර්ථවාහක වූ විනායක වූ බුදුරජුන් (සිතින්) ඇසුරු කොට වසනේ කෙලෙස් සමග වසනෙහි නම් ඔබට (එය) නුසුදුසුය."

5317. එකල්හි සෑය සිහිකළ කෙණෙහි මාගේ සිත්හි බුද්ධ ගෞරවය ඇති වේ. තොත්‍රයෙන් (කණමුල හනින යවුලෙන්) පෙළන ලද ඇතකු මෙන් මිථ්‍යා විතර්කයන් දුරු කෙරෙමි.

5318. මෙසේ වසන මා මෘත්‍යුරාජයා මැඩලීය. මම එහි කළුරිය කලෙම් බඹලොව ගියෙමි.

5319. එහි දිවි ඇති තාක් වසා මම තව්තිසා දෙව්ලොවහි උපන්මි. අසූවරක් දෙවේන්ද්‍රව දිව්‍යරාජ්‍යය කෙළෙමි.

5320. මම තෙසියක් වර සක්විති රජ වීමි. මහත් ප්‍රදේශරාජ්‍යය ගණනින් ගිණිය නො හැකිය.

5321 තෙසං කිඞ්කණිපුප්ඵානං[1] විපාකං අනුභොමහං,
ධාතිසතසහස්සානි පරිවාරෙන්ති මං භවෙ.

5322. ථූපස්ස පරිචිණ්ණත්තා රජොජල්ලං න ලිම්පති,
ගත්තෙ සෙදා න මුච්චන්ති සප්පභාසො[2] භවාමහං.

5323. අහො මෙ සුකතො ථූපො සුදිට්ඨාමරිකා නදී,
ථූපං කත්වාන පුලිනං[3] පත්තොම්හි අචලං පදං.

5324. කුසලං කත්තුකාමෙන ජන්තුනා සාරගාහිනා,
නත්ථි ඛෙත්තං අඛෙත්තං වා පටිපත්තීව සාධකා[4].

5325. යථාපි බලවා පොසො අණ්ණවං තරිතුස්සහෙ,
පරිත්තං කට්ඨමාදාය පක්ඛන්දෙය්‍ය මහාසරං:

5326. ඉමාහං කට්ඨං නිස්සාය තරිස්සාමි මහොදධිං,
උස්සාහෙන ච විරියෙන තරෙය්‍ය උදධිං නරො.

5327. තථෙව මෙ කතං කම්මං පරිත්තං ථොකකඤ්ච යං,
තං කම්මං උපනිස්සාය සංසාරං සමතික්කමිං.

5328. පච්ඡිමෙ භවෙ සම්පත්තෙ සුක්කමූලෙන චොදිතො,
සාවත්ථියං පුරෙ ජාතො මහාසාලෙ සුඅඩ්ඪකෙ.

5329. සද්ධා මාතාපිතා මය්හං බුද්ධස්ස සරණං ගතා,
උභො දිට්ඨපදා එතෙ අනුවත්තන්ති සාසනං.

5330. බොධිපපටිකං ගය්හ සොණ්ණථූපං අකාරයුං,
සායංපාතං නමස්සන්ති සක්‍යපුත්තස්ස සම්මුඛා.

5331. උපොසථම්හි දිවසෙ සොණ්ණථූපං විනීහරුං,
බුද්ධස්ස වණ්ණං කිත්තෙන්තා තියාමං වීතිනාමයුං.

5332. සහ දිස්වානහං ථූපං සරිං පුලිනචෙතියං,
එකාසනෙ නිසීදිත්වා අරහත්තමපාපුණිං.

(ද්වාවීසතිමං භාණවාරං.)

5333. ගවෙසමානො තං වීරං ධම්මසෙනාපතිද්දසං,
අගාරා නික්ඛමිත්වාන පබ්බජිං තස්ස සන්තිකෙ.

5334. ජාතියා සත්තවස්සෙන අරහත්තමපාපුණිං,
උපසම්පාදයී බුද්ධො ගුණමඤ්ඤාය චක්ඛුමා

1 සොණ්ණකිඞ්කණිපුප්ඵානං, මජ්සං. 2. සුප්පභාසො, මජ්සං.
3. පුලිනෙ, සීමු. 4 සාරිතා, PTS. සාරතා, සයා.

5321. මම ඒ තිඞකණිපුෂ්පයන්ගේ විපාකය අනුභව කරමි. භවයෙහි සියදහසක් කිරිමවුවරු මා පිරිවරත්.

5322. සෑය පිළිදගුම් කළ බැවින් සිරුරෙහි රජස් දූලි නො වැකේ. ගත ඩහ නො වැගිරෙයි. මම ප්‍රභා සහිතයෙම් වෙමි.

5323. ආශ්වය්‍යයකි, මා විසින් මැනැවින් කරණ ලද සෑයකි. අමරිකා-නදිය ද මැනැවින් දක්නා ලදි. වැලිසෑය කොට අචල පදය වූ නිවනට පැමිණියෙම් වෙමි.

5324 කුසල් කරණු කැමැත්තා වූ (නිර්වාණ) සාරය සොයන්නා වූ සත්ත්වයා විසින් 'මෙය ක්ෂෙත්‍ර ය, මෙය නො ක්ෂෙත්‍ර ය'යි (වෙන් කොට ගත යුක්තෙක්) නැත. ප්‍රතිපත්ති තොමෝ ම අර්ථසාධක වන්නී ය.

5325 - 5326. බලවත් පුරුෂයෙක් තෙම සාගරය තරණය කරන්නට උත්සාහ කරන්නේ. කුඩා දඬුකඩක් ගෙන මහසයුරට පණින්නේ නම් "මම මේ දඬුකඩ නිසා මහසයුර තරණය කරන්නෙමි"යි උත්සාහයෙන් ද වීර්‍ය්‍යයෙන් ද එ මිනිස් තෙම සයුරතරණය කරන්නේ යම්සේ ද-

5327. එසේ ම මා විසින් යම් කර්මයක් කරණ ලද නම් එය ඉතා කුඩා ය. (එහෙත්) ඒ කර්මය නිසා සසර ඉක්ම වීමි.

5328. ඒ කුශලමූලයෙන් මෙහෙයන ලදුයෙම් අන්තිම භවය පැමිණි කල සැවැත් නුවර ආඪ්‍ය වූ මහාසාර කුලයක උපන්නෙම් වෙමි.

5329. මාගේ මවුපියෝ සැදැහැත්තෝ ය. බුදුරජුන් සරණ ගියෝය. මේ දෙදෙන ම දක්නා ලද නිර්වාණ පදය ඇත්තෝ ය. ශාසනයට අනුව පවතිත්.

5330. (ඔහු) බොධියෙන් (ගිලිහුනු) පොතු ගෙණ රන්සෑයක් කරවූහ. ශාක්‍යපුත්‍ර බුදුරජුන් හමුවෙහි මෙන් උදේ සවස නමස්කාර කෙරෙත්.

5331. පොහෝ දිනයෙහි සුවර්ණස්තූපය බැහැරට ගත්හ බුදුරජුන්ගේ ගුණ කියමින් තුන්යම් රැය ගෙවූහ.

5332. මම (සුවර්ණ) ස්තූපය දැක එකෙණෙහි ම පුලිනචෛත්‍යය (අතීතයෙහි මවිසින් කළ වැලිසෑය) සිහි කෙළෙමි. එ අස්නෙහි ම හිඳ රහත්බවට පැමිණියෙමි.

(දෙවිසිවන බණවරයි.)

5333. එ වීරයන් (බුදුරජුන්) සොයනෙම් ධර්මසෙනාපතීන් (සැරියුත් තෙරුන් වහන්සේ) දිටිමි. ගිහිගෙන් නික්ම උන්වහන්සේ වෙත පැවිදිවීමි.

5334. උත්පත්තියෙන් සත්හැවිරිදි කල්හි රහත් බවට පැමිණියෙමි. පසැස් ඇති බුදුරජානන්වහන්සේ ගුණ දැන මා උපසපත් කරවූසේක.

5336. දූරකෙනෙව සන්තෙන කිරියං තිට්ඨිතං මයා,
කතං මෙ කරණීයජ්ජ සක්‍යපුත්තස්ස සාසනෙ.

5337. සබ්බවෙරභයාතීතො සබ්බසඞ්ගාතිගො ඉසි,
සාවකො තෙ මහාවීර සොණ්ණපුප්ඵස්සිදං ඵලං.

5338. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො’ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5339. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5340. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා පුලිනථූපියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

පුලිනථූපියත්ථෙරස්ස අපදානං අට්ඨමං.

499. නළකුටිදායකත්ථෙරාපදානං

5341 හිමවන්තස්ස අවිදූරෙ හාරිතො නාම පබ්බතො,
සයම්භූ නාරදො නාම රුක්ඛමූලෙ වසී තදා.

5342. නළාගාරං කරිත්වාන තිණෙන ඡාදයිං අහං,
චඞ්කමං සොධයිත්වාන සයම්භුස්ස අදාසහං.

5343. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

5344. තත්ථ මෙ සුකතං ව්‍යම්හං නළකුටිකාය නිම්මිතං,
සට්ඨියොජනමුබ්බෙධං තිංසයොජනවිත්ථතං.

5345. චතුද්දසසු කප්පෙසු දෙවලොකෙ රමිං අහං,
එකසත්තතික්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං.

5346. චතුත්තිංසක්ඛත්තුඤ්ච චක්කවත්තී අහොසහං,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං.

5347. ධම්මපාසාදමාරුය්හ සබ්බාකාරවරූපමං,
යදිච්ඡකාහං විහරෙ සක්‍යපුත්තස්ස සාසනෙ.

5336. ළදරු වූ ම මා විසින් (නිවන් සඳහා) කටයුතු නිම කරණ ලදි. ශාක්‍යපුත්‍ර වූ බුදුරජුන්ගේ සසුනෙහි කටයුතු දූය අද මා විසින් කරණ ලදි.

5337. මහාවීර වූ ස්වාමීන් වහන්ස, මම සියලු වෛර හා භය ඉක්මවූයෙම් වෙමි. සියලු කෙලෙශසඞ්ගයන් ඉක්මවා ගියෙම් වෙමි. මුඹවහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි. සුවර්ණපුෂ්පපූජාවෙහි මේ විපාක යි.

5338. මා විසින් කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

5339. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

5340. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසෙයින් ආයුෂ්මත් පුලිනථූපියස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

පුලිනථූපිය ස්ථවිරාවදානය අටවැනියි.

499. නළකුටිදායක ස්ථවිරාවදානය

5341. හිමවතට නුදුරෙහි හාරිත නම් පර්වතයෙක් විය. එකල්හි සියල්ල තෙමේ ම දත් නාරද බුදුරජ තෙම රුක්මුලක වැඩ විසී ය.

5342. මම නළකුටියක් කොට තණපතින් සෙවෙනි කෙළෙමි. මම සක්මණ ද පිරිසිදු කරවා බුදුරජුන්හට දුනිමි.

5343. මැනැවින් කරණ ලද එ කර්මය හෙතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද මම මිනිස්සිරුර හැරපියා තව්තිසා දෙව්ලොවට ගියෙමි.

5344. එහි (දෙව්ලොව) මැනැවින් කරණ ලද නළකිළියෙන් නිර්මිත වූ මාගේ විමානය සැට යොදුනක් උස ය. තිස් යොදුනක් පුළුල් ය.

5345. මම තුදුස් කපක් දෙව්ලොව සිත් අලවා විසීමි. එක්සැත්තෑ වරක් දිව්‍යරාජ්‍යය කරවීමි.

5346. මම සූතිස්වරක් සක්විතිරජ වීමි. (ලැබූ) මහත් ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නො හැකි ය.

5347. මම සියලු ආකාරයෙන් උතුම් උපමා ඇති ධර්මනැමැති ප්‍රාසාදයට නැගී ශාක්‍යපුත්‍ර වූ බුදුරජුන්ගේ සසුනෙහි රුචියේ වෙසෙමි.

5348. එකතිංසෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි නළකුටියා ඉදං ඵලං.

5349. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5350. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5351. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා නළකුටිදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

නළකුටිදායකත්ථෙරස්ස අපදානං නවමං.

500. පියාලඵලදායකත්ථෙරාපදානං

5352. මිගලුද්දො පුරෙ ආසි විපිනෙ විචරං තදා,
අද්දසං විරජං බුද්ධං සබ්බධම්මානපාරගුං.

5353. පියාලඵලමාදාය බුද්ධසෙට්ඨස්සදාසහං,
පුඤ්ඤක්ඛෙත්තස්ස වීරස්ස පසන්නො සෙහි පාණිහි.

5354. එකතිංසෙ ඉතො කප්පෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඵලදානස්සිදං ඵලං.

5355. කිලෙසා ඣාපිතා මය්හං භාවා සබ්බෙ සමූහතා,
නාගො ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5356. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5357. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා පියාලඵලදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

පියාලඵලදායකත්ථෙරස්ස අපදානං දසමං.

තිකිණ්ණිපුප්ඵියවග්ගො පඤ්ඤාසමො.

5348. එකල්හි මෙයින් එක්තිස්වන කපෙහි යම් කර්‍මයක් කෙළෙම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. නළකුටියෙහි මේ විපාක යි.

5349. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5350 බුදුරජාතන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5351. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ට විමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් නළකුටිදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේක.

නළකුටිදායක ස්ථවිරවදානය නවවැනියි.

500. පියාලඵලදායක ස්ථවිරාවදානය

5352. පෙර මම මුවවැද්දෙක් වීමි. එකල්හි වනයෙහි හැසිරෙන්නෙම් සියලු ධර්‍මයන්ගේ පරතෙරට ගිය කෙලෙස්රජස් විරහිත බුදුරජුන් දිටිමි.

5353. මම පියල් ගෙඩියක් ගෙණ පහන් වූයෙම් සියතින් ම පින්කෙත් වූ වීර වූ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට දුනිමි.

5354. එකල්හි මෙයින් එක්තිස්වන කපෙහි යම් පියාල ඵලයක් දුනිම් ද (ඒ හේතුවෙන්) දුගතියක් නො දනිමි. ඵලදානයාගේ මේ විපාකයි.

5355. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5356. බුදුරජානන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5357. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ට විමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන්වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් පියාලඵලදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාලසේකි.

පියාලඵලදායක ස්ථවිරවදානය දසවැනියි.

තිකිඩ්ඩකණ්ණිපුප්ඵිය වග්ගය පණස් වැනියි.

උද්දානං:

කිඞ්කණි පංසුකූලඤ්ච කොරණ්ඩමථ කිංසුකං
උපඩ්ඪදුස්සී ඝතදො උදකං ථූපකාරකො
නළාගාරී ච නවමො පියාලඵලදායකො.
සතං එකං ච ගාථානං නවකඤ්ච තදුත්තරිං.

අථ වග්ගුද්දානං:

මෙත්තෙය්‍යවග්ගො භද්දාලි සකිංසම්මජ්ජකො පි ච
එකවිහාරී වීභීටකී ජගතී සාලපුප්ඵියො
නළාගාරං පංසුකූලං කිඞ්කණිපුප්ඵියො තථා.
අසීති ද්වෙ ච ගාථායො චතුද්දසසතානි ච.

මෙත්තෙය්‍යවග්ගදසකං.

පඤ්චමං සතකං සමත්තං.

501. තිකණිකාරපුප්ඵියත්ථෙරාපදානං

5358. සුමෙධො නාම සම්බුද්ධො බාත්තිංසවරලක්ඛණො,
විවෙකකාමො භගවා හිමවන්තමුපාගමි.[1]

5359. අජ්ඣොගාහෙත්වා හිමවන්තං අග්ගො කාරුණිකො මුනි,
පල්ලඞ්කං ආභුජිත්වාන නිසීදි පුරිසුත්තමො.

5360. විජ්ජාධරෙ තදා ආසිං අන්තලික්ඛචරො අහං,
තිසූලං සුකතං ගය්හ ගච්ඡාමි අම්බරෙ තදා.

5361. පබ්බතග්ගෙ යථා අග්ගි පුණ්ණමාසීව[2] චන්දිමා,
වනෙ ඔභාසතෙ බුද්ධො සාලරාජාව ඵුල්ලිතො.

5362. වනග්ගා නික්ඛමිත්වාන බුද්ධරංසී විධාවරෙ,[3]
නළග්ගිවණ්ණසඞ්කාසා දිස්වා චිත්තං පසාදයිං.

5363. විචිනං අද්දසං පුප්ඵං කණිකාරං දෙවගන්ධිකං,
තීණි පුප්ඵානි ආදාය බුද්ධසෙට්ඨං අපූජයිං.

5364. බුද්ධස්ස ආනුභාවෙන තීණි පුප්ඵානි මෙ තදා,
උද්ධවණ්ටා අධොපත්තා ඡායං කුබ්බන්ති සත්ථුනො.

5365. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

1. මුපාගමිං, මජසං. 2. පුණ්ණමායෙව, මජසං. 3. බුද්ධරංසීවිධාවරෙ, මජසං.

උද්දානය:

කිඞ්කණි පංසුකූල කොරණ්ඩ හා කිංසුක.
උපඩ්ඪදුස්සි ඝතද උදක ථූපකාරක
නලාගාරි නව වන පියාලඑලදායක
නවතුරු සිය ගයෙකින් මේ එක කියා තිබ්යේ.

වග්ගුද්දානය:

මෙත්තෙය්‍ය වග්ග භද්දාලි සකිං සම්මජ්ජක සහ
එක විහාරි විභීතක ජගතී සාල පුප්ඵිය
නලමාලි පංසුකූල කිඞ්කණි පුප්ඵියයයි දස
මෙහි ගී එක් දහස් සිවුසිය දෙඅසූවෙකි.

මෙත්තෙය්‍ය වග්ග දශකයයි.

පස්වම ශතකය සමාප්ත සි.

501. තිකණ්ණිකාරපුප්ඵිය ස්ථවිරාවදානය

5358. දෙතිස් මහ පුරිස් ලකුණින් යුත් සම්ඳු වූ සුමෙධ නම් භාග්‍යවතුන් වහන්සේ විවේක සැප කැමැත්තෝ හිමවතට එළඹිසේක.

5359. පුරුෂොත්තම වූ අග්‍රකාරුණික වූ බුදුරජහු හිමවතට පිවිස පලක් බැඳ වැඩ හුන්සේ ක.

5360. එකල්හි මම අහසෙහි හැසිරෙන විද්‍යාධරයෙක් වීමි. මැනවින් කරනලද ත්‍රිශූලායුධයක් ගෙණ අහසෙහි යමි.

5361. කඳුමුදුනෙක්හි වූ ගින්නක් මෙන් ද පූර්ණරුස් සඳුමෙන් ද පිපි ගියසල් රුකක් මෙන් ද බුදුරජතෙම වනයෙහි බබලයි.

5362. වනයින් නික්ම බුදුරැස් පැතිරෙත්. නලවෙනෙහි ඇවිලගත් ගින්නක් මෙන් (බබලන රශ්මීන්) දැක සිත පැහැද වීමි.

5363. (ඒ මේ අත) සොයන්නෙම් දෙව් සුවඳ ඇති කිණිහිරි මල් දුටිමි. මල්තුණක් ගෙණ බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ පිදීමි.

5364 එකල්හි මාගේ ඒ මල්තුණ බුදුරජාණන් වහන්සේගේ අනුභාව-යෙන් නැටි උඩුකුරුව පෙති යටිකුරුව බුදුරජුන්හට සෙවන කෙරෙති.

5365. මැනැවින් කරණ ලද එම කර්මය හේතු කොට ගෙණ ද චිත්ත ප්‍රණිධින් හේතු කොට ගෙණ ද මිනිස්සිරුර හැර මම තව්තිසා දෙව් ලොවට ගියෙමි.

5366. තත්ථ මෙ සුකතං ව්‍යම්හං කණිකාරීති ඤායති,
සට්ඨියොජනමුබ්බෙධං තිංසයොජනවිත්ථතං.

5367. සහස්සකණ්ඩං සතභෙණ්ඩු ධජාලු හරිතාමයං,
සතසහස්සනිය්‍යූහා ව්‍යම්හෙ පාතුභවිංසු මෙ.

5368. සොණ්ණමයා මණිමයා ලොහිතඞ්කමයාපි ච,
ඵලිකාපි ච පල්ලඞ්කා යෙනිච්ඡකා යදිච්ඡකා[1].

5369. මහාරහඤ්ච සයනං තූලිකාවිකතීයුතං,
උද්දලොමික[2] එකන්තං බිම්බොහනසමායුතං.

5370. භවනා නික්ඛමිත්වාන චරන්තො දෙවචාරිකං,
යදා ඉච්ඡාමි ගමනං දෙවසඞ්ඝපුරක්ඛතො.

5371. පුප්ඵස්ස හෙට්ඨා තිට්ඨාමි උපරිච්ඡදනං මම,
සමන්තා යොජනසතං කණිකාරෙහි ඡාදිතං.

3572. සට්ඨිතුරියසහස්සානි සායං පාතං උපට්ඨහුං,
පරිවාරෙන්ති මං නිච්චං රත්තින්දිවමතන්දිතා.

5373. තත්ථ නච්චෙහි ගීතෙහි තාලෙහි වාදිතෙහි ච,
රමාමි ඛිඩ්ඩාරතියා මොදාමි කාමකාමහං[3].

5374. තත්ථ භුත්වා පිවිත්වා ච මොදාමි තිදසෙ තදා,
නාරීගණෙහි සහිතො මොදාමි ව්‍යම්හමුත්තමෙ.

5375. සතානං පඤ්චක්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං,
සතානං තීණික්ඛත්තුඤ්ච චක්කවත්තී අහොසහං,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං

5376. භවාභවෙ සංසරන්තො මහාභොගං ලභාමහං,
භොගෙ මෙ ඌනතා නත්ථි බුද්ධපූජායිදං ඵලං.

5377. දුවෙ භවෙ සංසරාමි දෙවත්තෙ අථ මානුසෙ,
අඤ්ඤං ගතිං න ජානාමි බුද්ධපූජායිදං ඵලං.

5378. දුවෙ කුලෙ පජායාමි ඛත්තියෙ චාපි බ්‍රාහ්මණෙ,
නීචෙ කුලෙ න ජායාමි බුද්ධපූජායිදං ඵලං.

1. යෙනිච්ඡකා යදිච්ඡකං, සයා. 2. උද්ධලොමිකා, සීමු මජ්සං. 3. කාමකාමිහං, මජ්සං.

5366. එහි මැනැවින් කරණ ලද මාගේ විමානය 'කණිකාරි' යයි දන්නා ලැබේ (එය) සැට යොදුන් උසය. තිස් යොදුන් පුළුලු ය.

5367. දහසක් භාග ඇත්තේ ය. සියක් ගොලාකාර ගෙමුදුන් ඇත්තේ ය. ධජයන්ගෙන් යුක්තය. නිල්වන් ය මාගේ විමනෙහි සියදහසක් නිර්යූහ (ප්‍රමුඛශාලා) පහළ විය.

5368. එහි කැමැති තැනක කැමැති තාක් රත්මුවා මිණිමුවා පියුම්රා මිණිමුවා, පිළිමිණිමුවා පර්‍යඞ්කයෝ වෙත්.

5369. පුලුන් බිහි ඇ යුත් දෙදුවලු එක්දුවලු ඇතිරි හා, බිම්බෝහන යුත් මාහැඟි සයන ද ඇත.

5370. යම් කලෙක්හි භවනයෙන් නික්ම දිව්‍යසමූහයා විසින් පිරිවරන ලදුයෙම් දිව්‍යචාරිකාවෙහි හැසිරෙමින් යනු කැමැත්තෙම් ද,

5371. (එකල්හි) මල් යට සිටිමි. මාගේ මස්තකයෙහි හාත්පස සියක් යොදුන් වියන කිණිහිරිමලින් වසන ලද්දකි.

5372. සැට දහසක් තූර්‍ය්‍ය වාදකයෝ උදය සවස උවැටන් කළාහුය. (ඔහු) රැඳුවල් අනලස්ව නිරතුරු මා පිරිවරත්.

5373. එහි නෘත්‍යයෙන්, ගීතයෙන්, තාලයෙන්, වාදිතයෙන්, ක්‍රීඩා-රතියෙන් සිත් අලවා වසමි. මම කාමසම්පත් කැමැත්තෙම් සතුටු වෙමි.

5374. එකල්හි ඒ තිදසෙහි අනුභව කොට පානය කොට මුදිත වෙමි. උතුම් විමනෙහි ස්ත්‍රීගණයා සමග සතුටු වෙමි.

5375. මම පන්සියවරක් දෙව්රජය කරවීමි. තුන්සියවරක් සක්විති රජ වීමි. ලැබූ මහත් ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නො හැකිය.

5376 කුදුමහත් භවයෙහි හැසිරෙන්නෙම් මම මහත් භොගසම්පත් ලබමි. මාගේ භොගසම්පත්තියෙහි අඩුවෙක් නැත. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5377. දිවඅත්බව්හි ද යළි මිනිසත්බව්හි ද – දෙඅත් බව්හි සැරිසරමි. අන් ගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයි.

5378. ක්ෂත්කුලෙහි ද බමුණුකුලෙහි ද – මේ දෙකුලෙහි උපදිමි හීනකුලයක නූපදිමි. බුද්ධපූජාවෙහි මේ විපාකයි.

5379. හත්ථියානං අස්සයානං සිවිකං සන්දමානිකං,
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

5380. දාසිගණං දාසගණං නාරියො සමලඞ්කතා,
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

5381. කොසෙය්‍යකම්බලියානි ඛොමකප්පාසිකානි ච,
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

5382. නවවත්ථං නවඵලං නවග්ගරසභොජනං,
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

5383. ඉමං ඛාද ඉමං භුඤ්ජ ඉමම්හි සයනෙ සය
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

5384. සබ්බත්ථ පූජිතො හොමි යසො අබ්භුග්ගතො මම,
මහාපක්ඛො සදා හොමි අභෙජ්ජපරිසො සදා,
ඤාතීනං උත්තමො හොමි බුද්ධපූජායිදං ඵලං.

5385. සීතං උණ්හං න ජානාමි පරිළාහො න විජ්ජති,
අථො චෙතසිකං දුක්ඛං හදයෙ මෙ න විජ්ජති.

5386. සුවණ්ණවණ්ණො හුත්වාන සංසරාමි භවාභවෙ,
වෙවණ්ණියං න ජානාමි බුද්ධපූජායිදං ඵලං.

5387. දෙවලොකා චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
සාවත්ථියං පුරෙ ජාතො මහාසාලෙ සුඅඩ්ඪකෙ,

5388. පඤ්චකාමගුණෙ හිත්වා පබ්බජිං අනගාරියං,
ජාතියා සත්තවස්සොහං අරහත්තමපාපුණිං.

3389. උපසම්පාදයි බුද්ධො ගුණමඤ්ඤාය චක්ඛුමා,
තරුණො පූජනීයොහං බුද්ධපූජායිදං ඵලං.

5390. දිබ්බචක්ඛු විසුද්ධං මෙ සමාධිකුසලො අහං,
අභිඤ්ඤාපාරමිප්පත්තො බුද්ධපූජායිදං ඵලං.

5391. පටිසම්භිදා අනුප්පත්තො ඉද්ධිපාදෙසු කොවිදො,
ධම්මෙසු පාරමිප්පත්තො බුද්ධපූජායිදං ඵලං.

5392. තිංසකප්පසහස්සම්හි යං බුද්ධමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

5393. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5394. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,[1]
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1. මම බුද්ධස්ස සන්තිකෙ මජසං.

5379. හස්තියාන ද අශ්වයාන ද සිවිකා ද ස්‍යන්දන රථ ද මේ සියල්ල ම ලබමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5380. දසිසමූහයා ද දසසමූහයා ද මැනැවින් සරසන ලද සත්‍රීන් ද, මේ සියල්ල ලබමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5381. කොසෙයය ද කම්බිලි ද ඛොමු හා කපුපිළි ද, මේ සියල්ල ලබමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5382. නව වස්ත්‍ර ද නවඵලද අභිනව අග්‍ර්‍ය භෝජන ද, මේ සියල්ල ලබමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5383. 'මෙය කව, මෙය අනුභව කරව, මෙම සයනයෙහි සයනය කරව' යන මේ සියල්ල ලබමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5384. හැම තන්හි පුදන ලදුයෙම් වෙමි. මාගේ කීර්තිය උස්ව පැන නංගේ ය. හැම කල්හි මහත් වූ පක්‍ෂ (සමූහ) ඇත්තෙම් වෙමි. හැම කල්හි නො බෙදුනු පිරිස ඇත්තෙම් ද වෙමි. නෑයනට උතුම් වෙමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5385. ශීත, උෂ්ණ නො දනිමි. පරිඩාහ (දැවිලි) නැත. වැළි මාගේ සිත්හි චෛතසික දුකෙක් නැත.

5386. භවයෙන් භවයෙහි සුවණ්ණවර්ණව සැරිසරමි. විවර්ණ බවක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5387. කුශලමූලයෙන් මෙහෙයන ලදුයෙම් දෙව්ලොවින් ච්‍යුතව සැවත් පුරයෙහි ඉතා ආඪ්‍ය වූ මහාසාරකුලයක උපන්නෙමි.

5388. පස්කම්ගුණ හැර සස්නෙහි පැවිදි වීමි. උපතින් සත්හැවිරිදි වූ මම රහත්බවට පැමිණියෙමි.

5389. පසැස් ඇති බුදුරජ තෙම ගුණ දැන (මා) උපසම්පදා කරවී ය. මම තරුණ වූ පිදිය යුත්තෙක් වෙමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5390. මාගේ දිව්‍යැස පිරිසිදු ය. මම සමාධියෙහි දක්‍ෂයෙමි. අභිඥාවන්හි කෙළ පැමිණියෙම් වෙමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5391. පැමිණි ප්‍රතිසම්භිදා ඇත්තෙම් වෙමි. ඍද්ධිපාදයන්හි දක්‍ෂවූයෙම් වෙමි. ධර්මයන්හි කෙළ පැමිණියෙම් වෙමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5392. තිස්දහස්වන කපෙහි යම් බුදු කෙනෙකු පිදූයෙම් ද, ඒ හෙතුයෙන් දුගතියක් නො ම දනිමි. බුද්ධපූජාවෙහි මේ ඵලයයි.

5393. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5394. බුදුරජාණන් මහත්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

5395. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා තිකණ්ණිකාරපුප්ඵියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

තිකණ්ණිකාරපුප්ඵියත්ථෙරස්ස අපදානං පඨමං.

502. එකපත්තදායකත්ථෙරාපදානං

5396. නගරෙ හංසවතියා කුම්භකාරො අහොසහං,
අද්දසං විරජං බුද්ධං ඔඝතිණ්ණමනාසවං.

5397. සුකතං මත්තිකාපත්තං බුද්ධසෙට්ඨස්ස'දාසහං,
පත්තං දත්වා භගවතො උජුභූතස්ස තාදිනො.

5398. භවෙ නිබ්බත්තමානොහං සොණ්ණථාලෙ ලභාමහං,
රූපිමයෙ ච සොවණ්ණෙ තට්ටිකෙ ච මණීමයෙ.

5399. පාතියො පරිභුඤ්ජාමි පුඤ්ඤකම්මස්සිදං ඵලං,
යසානඤ්ච ධනානඤ්ච[1] පත්තභූතො[2] ච හොමහං.

5400. යථාපි භද්දකෙ ඛෙත්තෙ බීජමප්පම්පි රොපිතං,
සම්මා ධාරෙ[3] පවෙච්ඡන්තෙ ඵලං තොසෙති කස්සකං.

5597. ඒ මට අනිකුදු ගුණයෙක් ඇති වෙයි: කුදුමහත් භවයෙහි නො අඩු වූ භොගසම්පත් ඇත්තේ වේ. පත්කසල බැහැර කිරීමෙහි මේ විපාකයකි.

5598. ඒ මට අනිකුදු ගුණයෙක් වෙයි: කුදුමහත් භවයෙහි ගින්නෙන් රජුන්ගෙන් සොරුන්ගෙන් හෝ දියෙන් බියෙක් නො වේ.

5599. ඒ මට අනිකුදු ගුණයෙක් වෙයි: කුදුමහත් භවයෙහි දාසිදස්සෝ සිතැඟි අනුව පවත්නා අනුවරයෝ වෙති.

5600. යම් පමණ ආයු ඇති කලෙක මිනිසත් බැව්හි උපදී ද ඒ ආයු ඇතිතාක් එයින් නො පිරිහේ. සිටු නේ ම වේ.

5601. ඇතුලත වූවෝ ද පිටත්හි හැසිරෙන්නෝ ද නිගම්වැස්සෝ ද, රට වැසියන් සහිත වූ මේ සියල්ලෝ අභිවෘද්ධිය කැමති වූවාහු සුව කැමති වූවාහු අනුයුක්ත වූවෝ වෙත්.

5602. මම භොග ඇත්තෙම් ද යශස් ඇත් තෙමේ ද ශ්‍රීමත් වූ යෙම් ද ඥාති පක්ෂ ඇත්තෙම් ද වෙමි. භවයෙහි හැම ලෙසින් පහවූ භයසන්ත්‍රාස ඇත්තේ වෙමි.

5603. හැම කල්හි දෙවියෝ ද, මනුෂ්‍යයෝ ද, අසුරයෝ ද, ගන්ධර්වයෝ ද, යක්ෂරකුසෝ ද යන මේ සියල්ලෝ භවයෙහි හැසිරෙන්නා වූ මාගේ ආරක්ෂාව කෙරෙත්.

5604. දෙව්ලොවෙහි ද මිනිස් ලොවෙහි ද යන මේ දෙලෙව්හි ම යශස් අනුභව කොට අවසන්හි අනුත්තර ශාන්තිය වූ නිවනට පැමිණියෙම් වෙමි.

5605. යම් පුරුෂයෙක් තෙම සම්බුදුරජුන් උදෙසා හෝ එම ශාසනෘන් වහන්සේගේ බොධිය උදෙසා හෝ පිත් රැස් කරන්නේ නම් ඔහට කුමක් නම් දුර්ලභද?

5606. මාර්ගයෙහි හා ඵලයෙහි ද (දීඝ - මධ්‍යම ආදී) නිකායයෙහි ද ධ්‍යානාභිඥ ගුණයන්හි ද අන් අයට වඩා අධික (ඥාන) ලාභියෙක් ව ආස්‍රව රහිතව පිරිනිවන් පාමි.

5607. පුරේ’හං බොධියා පත්තං ඡඩ්ඩෙත්වා හට්ඨමානසො,
ඉමෙහි වීසතකෙහි සමඞ්ගී හොමි සබ්බදා.

5608. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො’ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5609. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5610 පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා බොධිසම්මජ්ජකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

බොධිසම්මජ්ජකත්ථෙරස්ස අපදානං අට්ඨමං.

529. ආමණ්ඩඵලදායකත්ථෙරාපදානං

5611. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මානපාරගූ,
වුට්ඨහිත්වා සමාධිම්හා චඞ්කමි ලොකනායකො.

5612. ඛාරිභාරං ගහෙත්වාන ආහරන්තො ඵලං තදා,
අද්දසං විරජං බුද්ධං චඞ්කමන්තං මහාමුනිං.

5613. පසන්නචිත්තො සුමනො සිරෙ කත්වාන අඤ්ජලිං,
සම්බුද්ධං අභිවාදෙත්වා ආමණ්ඩමදදිං ඵලං.

5614 සතසහස්සෙ ඉතො කප්පෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ආමණ්ඩස්ස ඉදං ඵලං.

5615. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො’ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5616. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5617. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතා බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා ආමණ්ඩඵලදායකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ආමණ්ඩඵලදායකත්ථෙරස්ස අපදානං නවමං.

5607. පෙර මම තුටු සිත් ඇත්තේ බෝසැමළුයෙහි හුනු පත් බැහැර කොට හැමකල්හි මෙම අඞ්ග විස්සෙන් යුක්ත වෙමි.

5608. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5609. බුදුරජානන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

5610. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ට විමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසෙසින් ආයුෂමත් බොධිසම්මජ්ජක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

බොධිසම්මජ්ජකස්ථවිරාවදානය අටවැනියි.

529. ආමණ්ඩඵලදායක ස්ථවිරාවදානය

5611. සියලු දහම්හි නෙරපත් පස්මරුන් දිනූ ලොකනායක වූ පදුමුත්තර බුදුරජානන් වහන්සේ සමාධියෙන් නැගී සක්මන් කළ සේක.

5612. එකල්හි (මම) පිරිකරකද ගෙණ ඵල (තෙලා) ගෙණ එන්නෙම් කෙලෙස්රජස් විරහිත මහාමුනි වූ සක්මණෙහි යෙදෙන්නා වූ බුදුරජුන් දුටිමි.

5613. පහන්සිත් ඇත්තෙම් සොම්නස් වූයෙම් හිසෙහි ඇඳිලි බැඳ සම්බුදුරජුන් වැඳ ආමණ්ඩ[1] ඵලයක් දුනිමි.

5614. මෙයින් සියක් දහස්වන කපෙහි වූ එකල්හි යම් ඵලදානයක් දුනිම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නොදනිමි. ආමණ්ඩ පලදනෙහි මේ විපාක යි.

5615. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5616. බුදුරජානන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

5617. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් ආමණ්ඩඵලදායක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

ආමණ්ඩඵලදායක ස්ථවිරාවදානය නව වැනියි.

1. මස් කොමඩු? එරබු?

530. සුගන්ධත්ථෙරාපදානං

5617. ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො,
කස්සපො නාම ගොත්තෙන[1] උප්පජ්ජි වදතංවරො.

5618. අනුබ්‍යඤ්ජනසම්පන්නො[2] බත්තිංසවරලක්ඛණො,
බ්‍යාමප්පභාපරිවුතො රංසිජාලසමොසටො[3].

5619. අස්සාසෙතා යථා චන්දො සූරියොව පභඞ්කරො,
නිබ්බාපෙතා යථා මෙඝො සාගරො'ව ගුණාකරො.

5620. ධරණීරිව සීලෙන හිමවා'ව සමාධිනා,
ආකාසො විය පඤ්ඤාය අසඞ්ගො අනිලො යථා.

5621. ස කදාචි මහාවීරො පරිසාසු විසාරදො,
සච්චානි සම්පකාසෙසි උද්ධරන්තො මහාජනං.

5622. තදාහි බාරාණසියං සෙට්ඨිපුත්තො මහායසො,
ආසහං ධනධඤ්ඤස්ස පහූතස්ස පහූ තදා[4].

5623. ජඞ්ඝාවිහාරං විචරං මිගදායමුපෙච්චහං,
අද්දසං විරජං බුද්ධං දෙසෙන්තං අමතං පදං.

5624. විස්සට්ඨකන්තවචනං[5] කරවීකසමස්සරං,
හංසරුදනිනිග්ඝොසං[6] විඤ්ඤාපෙන්තං මහාජනං.

5525. දිස්වා දෙවාතිදෙවං තං සුත්වා ච[7] මධුරං ගිරං,
පහායානප්පකෙ[8] භොගෙ පබ්බජිං අනගාරියං.

5226. එවං පබ්බජිතො චාහං න චිරෙන බහුස්සුතො,
අහොසිං ධම්මකථිකො විචිත්තපටිභාණවා.

5627. මහාපරිසමජ්ඣෙහං හට්ඨචිත්තො පුනප්පුනං,
වණ්ණයිං හෙමවණ්ණස්ස වණ්ණං වණ්ණවිසාරදො

5628. එස ඛීණාසවො බුද්ධො අනීඝො ඡින්නසංසයො,
සබ්බකම්මක්ඛයං පත්තො විමුත්තොපධිසංඛයෙ.

5629. එස සො භගවා බුද්ධො එස සීහො අනුත්තරෙ,
සදෙවකස්ස ලොකස්ස බ්‍රහ්මචක්කප්පවත්තකො

---

1. නාමෙන, සීමු. 2. අනුබ්‍යඤ්ජනසම්පන්නො, මජ්ඣං.
3. රංසිජාලසමොත්ථටො, මජ්ඣං. 4. බහූතදා, මජ්ඣං.
5. විඤ්ඤට්ඨකන්තවචනං, මජ්ඣං. 6. හංසරුතෙහි නිග්ඝොසං, මජ්ඣං. හංසදුන්දුභිනිග්ඝොසං, ස්‍යා. PTS.
7. සුත්වාච, මජ්ඣං. 8. පහායනප්පකෙ, මජ්ඣං.

530. සුගන්ධථෙරාපදානය

5617 - 5618. මෙම භද්‍රකල්පයෙහි බ්‍රාහ්මණවංශයෙහි වූ මහත් යශස් ඇති අපි බුදුවරුම්හයි කියන්නවුත් අතුරෙත් ශ්‍රෙෂ්ඨ වූ (අසූවක්) අනුව්‍යඤ්ජනයන්ගෙන් යුක්ත වූ දෙතිස්මහ පුරිස් ලකුණු ඇති ව්‍යාමප්‍රභා (බඹයක් පමණ ඈතට විහිදෙන) ආලෝකයෙන් පරිවෘතවූ රැස් සමූහයෙන් ගැවසී ගත් ගොත්‍රයෙන් කාශ්‍යප නම් බුදුරජ තෙමේ ලොව පහළ විය.

5619. (බුදුරජ තෙම) සඳු මෙන් අස්වස් කරන්නෙක. හිරු මෙන් ප්‍රභා කරන්නෙක. වැහිවලාවක් මෙන් (කෙලෙස් ගිනි) නිවන් නෙක. සයුර මෙන් ගුණ (මැණික්) ආකරයෙක.

5620. සීලයෙන් මහපොළොව මෙනි. සමාධියෙන් හිමව් පව්ව මෙනි. ප්‍රඥාවෙන් අහස මෙනි. සුළඟ මෙන් නො ඇලෙන්නේ වේ.

5621. පිරිස් හමුවෙහි විශාරද වූ ඒ මහාවීර වූ බුදුරජනු නිසියම් දිනෙක මහාජනයා (සසරසයුරින්) ගොඩලමින් (සිවු) සස් දෙසූ සේක.

5622. එකල්හි මම බරණැස්නුවර සමෘද්ධ වූ ධනධාන්‍යයනට ප්‍රභූ වූ මහත් යශස් ඇති සිටුපුතෙක් වීමි.

5623 - 5624. මම ජඞ්ඝා විහරණය කරන්නෙම් මිගදාය නම් වූ මුවන් වසන වනයට එළඹ අමාපදය (-නිර්වාණධර්මය) දෙසන්නා වූ කෙලෙස් රජස් විරහිත වූ විහිද යන මනොඥ වචන ඇති කුරවී කෙවිල් හඬට බඳු හඬ ඇති හංසධ්වනියට බඳු ධ්වනි ඇති මහාජනයාට දහම් අවබොධ කරවන්නා වූ බුදුරජුන් දුටිමි.

5625. දෙවාතිදෙව වූ ඒ බුදුරජුන් දැක හිඟිරිවචන ද අසා අපමණ වූ භොගසමපත් හැර දමා අනගාරයයි සඞ්ඛ්‍යාත පැවිද්දට පැමිණියෙමි.

5626. මෙසේ පැවිදි වූ මම නො බෝ කලකින් ම බහුශ්‍රැත වූ ධර්ම කථික වූ විසිතුරු ප්‍රතිභා ඇත්තෙක් වීමි.

5627. මම මහපිරිස් මැදෙහි සතුටු සිත් ඇත්තෙම් ගුණවැණිමෙහි විශාරද වූයෙම් සවණ්වණ්ණ වූ බුදුරජුන්ගේ ගුණ නැවත නැවත වණ්නා කෙලෙමි.

5628. තෙල බුදුරජාණන් වහන්සේ ක්ෂය කළ ආස්‍රවයන් ඇති සේක. උවදුරු රහිතසේක. දුරුකල සැක ඇතිසේක. සියලු කර්මයන්ගේ ක්ෂයට පත්වූ සේක. උපධිසඞ්ඛ්‍යාත පඤ්චස්කන්ධයෙහි වූ දුකින් මිදුනු සේක.

5629. මේ ඒ භාග්‍යවත් වූ බුදුරජ තෙමේ ය. මේ අනුත්තර වූ පුරුෂසිංහ තෙමේ ය. දෙවියන් සහිත ලොකයාට බ්‍රහ්මචක්‍රය පවත්වන්නා වෙයි.

5630. දන්තො දමෙතා සන්තො ච සමෙතා නිබ්බුතො ඉසි,
නිබ්බාපෙතා ච අස්සත්ථො අස්සාසෙතා මහාජනං.

5631. වීරො සූරො ච ධීරො ච[1] පඤ්ඤො කාරුණිකො වසී,
විජිතාවී ච ස ජිනො අප්පගබ්බො අනාලයො.

5632. අනෙජො අචලො ධීමා අමොහො අසමො මුනි,
ධොරය්හො උසභො නාගො සීහො සක්කො ගරූසුපි.

5633. විරාගො විමලො බ්‍රහ්මා වාදිසූරො රණඤ්ජහො,
අඛිලො ච විසල්ලො ච අසමො සංයතො[2] සුචි.

5634. බ්‍රාහ්මණො සමණො නාථො භිසක්කො සල්ලකත්තකො,
යොධො බුද්ධො සුසතො සුතො[3] අචලො මුදිතොදිතො.[4]

5635. ධාතා ධතා ච හන්තා ච[5] කත්තා නෙතා පකාසිතා,
සම්පහංසිතා භෙත්තා ච ඡෙත්තා සොතා පසංසිතා.

5636. අඛිලො ච විසල්ලො ච අනීඝො අකථංකථී,
අනෙජො විරජො බන්තා[6] ගන්තා[7] වත්තා පකාසිතා[8]

5637. තාරෙතා අත්ථකාරෙතා කාරෙතා සම්පදාලිතා[9],
පාපෙතා සහිතා කන්තා හන්තා ආතාපී තාපසො[10].

1. විසොකො, මජ්සං. 2. වුසභො, සයා, පයතො, PTS.
3. සුතාසුතො, මජ්සං. 4. සිතො, මජ්සං. 5. සන්තිච, මජ්සං.
6. සන්තා, මජ්සං. 7. ගන්ධා, මජ්සං. 8. පසංසිතා, මජ්සං.
9. සම්පදාරිතා, මජ්සං. 10. තාපිතා ච විසොසිතා, සයා.

5630. මහර්ෂි වූ බුදුරජ (තෙමේ) දැමුනේ මහාජනයා ද දමනය කරන්නේ ය. (තෙමේ) ශාන්ත වූයේ මහාජනයා ද ශාන්ත කරන්නේ ය. (තෙමේ කෙලෙස් ගින්නෙන්) නිවුනේ මහාජනයා ද නිවන්නේ ය. තෙමෙ අස්වැසුනේ මහාජනයා ද අස්වසන්නේ ය.

5631. ඒ බුදුරජ තෙම වීරය, ශූරය, නැණවත්ය, පැණවත්ය, කාරුණිකය, පඤ්චවශිතායෙන් යුක්තය, දිනූ කෙලෙස් ඇත්තේ කාවිසියෙහි හල දළකම් ඇතියේය. දිනනසුලුය. ආලය (-ආශා) නැතියේය.

5632. සම්බුද්ධ තෙම තෘෂ්ණාව නැතියේය. නිශ්චලය, නුවණැතියේය, මෝහය නැතියේය, (සමකොට දක්මට අනිකකු නොමැති බැවින්) අසමය, ධුර උසුලන්නේය, (උතුම් බැවින්) වෘෂභය, (පව්නැති බැවින්) නාගය, (ශ්‍රෙෂ්ඨ බැවින්) සිංහය, ගුරුන් අතුරෙහිදු ශක්‍ය ය.

5633. රාගය නැත්තේය. නිර්මලය, ශ්‍රෙෂ්ඨය, වාදීන් අතුරෙහි ශූරය, පව් දුරු කෙළේය, (සිත්හි රාගාදි කිළුටු නැති බැවින්) අඛිල ය, (පහ වූ රාගාදී හුල් ඇති බැවින්) විසල්ල ය. (ලෙව්හි සමාන කිරීමට අනිකෙකු නො මැති බැවින්) අසම ය, චක්ෂුරාදී ඉන්ද්‍රියයන් (සංවෘත බැවින්) සන්හුන්ය, පිරිසිදුය.

5634. (බැහැර කරණ ලද පව් ඇති බැවින්) බ්‍රාහ්මණය. ශමනය කරණ ලද පව් ඇති බැවින් ශ්‍රමණය. (අනාථයනට පිහිට වන බැවින් නාථය. (කෙලෙස් ලෙඩට) වෛද්‍යය. (රාගාදී හුල් උදුරන) ශල්‍ය වෛද්‍යය. (කෙලෙස් සතුරන් ජය ගන්නා) යොධය. (සිවුසස් දත් බැවින්) බුද්ධය. ප්‍රකටය. (දමනය කළයුත්තන් දමනය කරණ බැවින්) සාරථිය. නිශ්චලය. මුදිතාවෙන් යුතුය. උත්ගතය.

5635. තෘප්තය. (මහාකරුණා ආදී ගුණ) දන්නේය. (කෙලෙස් සතුරන්) නැසූයේ ය. (ශාන්තිය) කරන්නේ ය. (නිවන්මගට පමුණුවන්නේ ය. (අමාදහම්) දෙසන්නේ ය. (සව්වන්) සතුටු කරන්නේ ය. (සසරසක දැවි) බිඳින්නේය. කෙලෙස් බැඳුම් සිඳිනේ ය. (විනෙයජනයන්ගේ කථා භවාග්‍රයෙහි සිට නමුදු) අසන්නේ ය. (මනා ප්‍රතිපත්ති ඇතියකට) පසසන්නෙක.

5636. (රාගාදි කිලිටි නැති බැවින්) අඛිල ය. (පහවූ රාගාදී හුල් ඇති බැවින්) විසල්ල ය. උවදුරු රහිත ය. සැක රහිත ය. තෘෂ්ණාවිරහිත ය. කෙලෙස් රජස් රහිත ය ඉවසන්නේ ය. නිවන්මග යන්නේ ය. (මග - නොමග මේයයි) කියන්නේ ය. (හිතාහිත මේ යයි) පවසන්නේ ය.

5637. (සත්ත්වයන් සසරින්) එතෙර ලන්නේ ය. අභිවෘද්ධිකාරක ය. (නිවන් සිදු) කරන්නේය. (කෙලෙස්නමැති ගල්කුළු) පලන්නේ ය. (සත්ත්වයන් නිවණට) පමුණුවන්නේ ය. දුටුවන් සිත් ගන්නේ ය. (කෙලෙස්සතුරන්) නසන්නේ ය. (කෙලෙස් තවන) වීර්‍ය්‍යය ඇත්තේ ය. තපොගුණ යුක්ත ය.

5638. සමචිත්තො[1] සමසමො අසමායො දයාසයො,[2]
අච්ඡෙරසත්තා[3] අකුහො කතාවී ඉසිසත්තමො.

5639. නිත්තිණ්ණකඞ්ඛො නිම්මානො අප්පමෙය්‍යො අනූපමො,
සබ්බවාක්‍යපථාතීතො සච්චඤෙය්‍යන්තගූ[4] ජිනො.

5640. සත්තසාරවරෙ[5] තස්මිං පසාදෙ අමතාවහෙ,
තස්මා බුද්ධෙ ච ධම්මෙ ච සංඝෙ සද්ධා මහිද්ධිකා.[6]

5641. ගුණෙහි එවමාදීහි තිලොකසරණුත්තමං,
වණ්ණෙන්තො පරිසාමජ්ඣෙ අකං[7] ධම්මකථං අහං.

5642. තතො චුතොහං[8] තුසිතෙ අනුභොත්වා මහාසුඛං,
තතො චුතො මනුස්සෙසු ජාතො හොමි සුගන්ධිකො.

5643. නිස්සාසො මුඛගන්ධො ච දෙහගන්ධො තථෙව මෙ,
සෙදගන්ධො ච සතතං සබ්බගන්ධො'තිසෙති' මෙ.[9]

5644. මුඛගන්ධො සදා මය්හං පදුමුප්පලචම්පකො[10],
ආදිසන්තො[11] සදා වාති සරීරෙ ච තථෙව මෙ,

5645. ගුණත්ථවස්ස සබ්බං තං ඵලං තු[12] පරමබ්භුතං,
එකග්ගමනසා සබ්බෙ වණ්ණයිස්සං[13] සුණාථ මෙ.

5646. ගුණං බුද්ධස්ස වත්වාන හිතාය ජනසන්ධිනු[14],
සුඛිතො[15] හොමි සබ්බත්ථ සද්ධාධිසමායුතො[16]

5647. යසස්සී සුඛිතො කන්තො ජුතිමා පියදස්සනො,
වත්තා අපරිභූතො ච නිද්දොසො පඤ්ඤවා තථා.

5648. ඛීණෙ ආයුසි[17] නිබ්බානං සුලභං බුද්ධභත්තිනො,
තෙසං හෙතුං පවක්ඛාමි තං සුණාථ යථාතථං.

5649. සන්තං යසං භගවතො විධිනා අභිවාදයං,
යත්ථ තත්ථුපපන්නොපි යසස්සී තෙන හොමහං

1. සමචිට්ඨිතො, ස්‍යා 2. දයාලයො, මජ්ස. 3. අච්ඡෙරමත්තා, ස්‍යා
4. සබ්බනෙය්‍යන්තිකො, ස්‍යා 5. සතරංසිවරෙ, ස්‍යා.
6. මහත්ථිකා, මජ්සං 7. කථිං, ස්‍යා. 8. චුතාහං, මජ්සං.
9. සබ්බගන්ධාව හොති මෙ, මජ්ස. 10. පදුමුප්පලචම්පකො, මජ්සං.
11. පරිසන්තො, මජ්ස. අතිකාන්තො, ස්‍යා. අතිසන්තො, PTS
12. ඵලන්තං, ස්‍යා. 13. භාසිතස්ස, ස්‍යා. 14. හිතාය ච තසදිසං, මජ්සං.
15. සුචිතො, ස්‍යා. 16. සංඝස.ධිරසමායුතො, මජ්ස. 17. පාවුසි, ස්‍යා.

5638. (සතුරු මිතුරු මැදහත් සතුරුන් කෙරෙහිත්) සම සිත් ඇත්තේය. (අසම වූ බුදුවරයනට පමණක් සමානවන බැවින්) අසමසමය. මේ සමානය සි දක්වීමට අතිකෙකු නොමැති බැවින්ය අසහායය. දයා ගුණයට නිවාසස්ථානය. ආශ්චර්යවත් සත්වය. නොයෙක් ගුණ රහිතය. සම්ඥානාඥනය. සඳහා කටයුතු නැත් දුය කෙළේ වේ. බුද්ධර්ෂීන් අතුරෙහි සත් වන බැවින් ඉසිසත්තමය.

5639. දුරුකල සැක ඇතියේය. මාන රහිතය. පමණ කල නො හැකි ගුණ ඇතියේය. උපමා විෂයය ඉක්මවූයේය. වර්ණනාවිෂය ඉක්මවූයේය. සත්‍යධර්මයාගේ හා දතයුතු සකලධර්මයන්ගේ පරතෙරට ගියේය. පස්මරුන් දිනූයේ වේ.

5640. සත්ත්වයන් අතුරෙහි උතුම් හරය වූ මේ බුදුරජුන් කෙරෙහි ප්‍රසාදය අමාසුව එළවන්නේ වෙයි. එහෙයින් බුද්ධ රත්නය කෙරෙහි ද ධර්මරත්නය කෙරෙහි ද සඞ්ඝරත්නය කෙරෙහි ද වූ ශ්‍රද්ධා තොමෝ මහත් වූ සෘද්ධි ඇති කරන්නී ය.

5641. මම මේ ආදී ගුණ විසින් තුන්ලොවට උතුම් පිළිසරණ වූ බුදුරජුන් වර්ණනය කරමින් පිරිස්මැද ධර්මකථාවක් කෙළෙමි.

5642. මම එයින් චුතවූයේ තුෂිතයෙහි මහත් සැප අනුභව කොට ඉන් චුතවූයේ මිනිසත්බැව්හි උපන්නේ සුවඳවත් වූයේ වෙමි.

5643. මාගේ පිටතට හෙළන වාතය ද මුඛගන්ධය ද ශරීරගන්ධය ද එසේ ම මාගේ ඛහදියගඳ ද හැම කල්හි සියලු සුවඳ ඉක්මවා පවතී.

5644. හැමකල්හි මාගේ මුවසුවඳ පියුම් උපුල් සපුමල් සුවඳ (මේ යයි) පෙන්වමින් හමයි. මාගේ සිරුරු සුවඳ ද එසේය.

5645. බුද්ධ ගුණකීර්තනයාගේ ඒ සියලු විපාක අතිශය විස්මය ජනකය. එය වර්ණනය කරන්නෙමි සියල්ලෝ එකග සිත් ඇත්තෝ ව මාගේ (ඒ වචනය) අසවූ.

5646. ජනයා එක්වන තැන්හි ඉතාසිහින් මධුර සවරඩවනි යුක්ත වූයේ (-මිහිරිහඬ ඇත්තෙම්) බුදුගුණ කියා හැම තන්හි සුව ඇතියෙම් වෙමි.

5647. යශස් ඇත්තෙමි, සුව ඇත්තෙමි, මනහර වූයෙමි, ප්‍රභාවත් වූයෙමි ප්‍රිය දකුම් ඇතියෙමි එසේ ම (සොඳුරුවදන්) බණන සුලුයෙමි, (අනුන්ගේ ධනයෙන්) අපරිපොෂිතයෙමි, නිදෙස් වූයෙමි, පැණවත් වූයෙමි ද වෙමි

5648. ආයුෂ ගෙවී ගිය කල්හි බුද්ධභක්ති ඇතියනට නිවන පහසුවෙන් ලැබෙන්නේ වේ. ඔවුන්ගේ (නිවන් සුලභ බවට) හෙතුව කියමි. එය තත්වූ පරිදි අසවූ:

5649. මම භාග්‍යවතුන් වහන්සේගේ ශාන්ත වූ යශසට ඒකාන්ත වූ පරිදි අභිවාදනය කරන්නෙමි ඒ හේතුකොට ගෙන යම් ඒ තැනක උපදෙමි ද, යශස් ඇත්තෙමි වෙමි.

5650. දුක්ඛස්සන්තකරං බුද්ධං ධම්මං සන්තමසඞ්ඛතං,
වණ්ණයං සුඛදො ආසිං සත්තානං සුඛිතො තතො.

5651. ගුණං වදන්තො බුද්ධස්ස බුද්ධපීතිසමායුතො,
සකන්තිං පරකන්තිඤ්ච ජනයිං තෙන කන්තිමා.

5652. ජනොඝෙ[1] තිත්ථකාකිණ්ණෙ[2] අභිභුය්‍ය කුතිත්ථියෙ,
ගුණං වදන්තො ජොතෙසිං නායකං ජුතිමා තතො.

5653. පියකාරී ජනස්සාපි සම්බුද්ධස්ස ගුණං වදං,
සරදෙව සසඞ්කාහං තෙනාසිං[3] පියදස්සනො.

5654. යථාසත්තිවසෙනාහං සබ්බවාචාහි සන්ථවිං,
සුගතං තෙන වාගීසො විචිත්තපටිභාණවා.

5655. යෙ බාලා විමතිප්පත්තා පරිභොන්ති මහාමුනිං,
නිග්ගණ්හිං තෙ සධම්මෙන පරිභූතො න තෙනහං[4].

5656. බුද්ධවණ්ණෙන[5] සත්තානං කිලෙසෙ අපනෙසහං,
නික්කිලෙසමනො හොමි තස්ස කම්මස්ස වාහසා.

5657. සොතූනං බුද්ධිමජනිං[6] බුද්ධානුස්සතිදෙසකො,
තෙනාහමාසිං[7] සප්පඤ්ඤො නිපුණත්ථවිපස්සකො.

5658. සබ්බාසවපරික්ඛීණො තිණ්ණසංසාරසාගරො,
සිඛීව අනුපාදානො පාපුණිස්සාමි නිබ්බුතිං.

5659. ඉමස්මිං යෙව කප්පස්මිං යමහං සන්ථවිං ජිනං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධවණ්ණස්සිදං ඵලං.

5660. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5661. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5662. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා සුගන්ධො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

සුගන්ධත්ථෙරස්ස අපදානං දසමං.

---

1. ජීනො තෙ, මජසං. 2. තිත්ථිකාකිණ්ණෙ, මජසං, 3. ථොමෙසිං, ස්‍යා.
4. පරිභූතෙන තෙනහං, ස්‍යා. 5. බුද්ධවණ්ණෙනි, සීමු.
6. වුඩ්ඪිමජනිං, මජසං. 7. තෙනාපි වාසිං, ස්‍යා.

5650. දුක් කෙළවර කරන්නා වූ බුදුරජුන් ද ශාන්ත වූ අසංස්කෘත ධර්මය ද, වර්ණනා කරන්නෙම් සෙසු සත්නට ද සුව දෙන්නෙක් වීමි ඒ හෙතුවෙන් සුව ඇත්තෙක් වීමි.

5651. බුද්ධාලම්බන ප්‍රීතියෙන් යුක්ත වූයෙම් බුදුරජුන්ගේ ගුණ කියනෙම් සවකීය සිත්හි කැමැත්ත ද මෙරමාගේ සිත්හි කැමැත්ත ද ඇති කෙළෙම්. ඒ හෙතුවෙන් සිත් අලවන ගති ඇති කෙනෙක් වීමි.

5652. තීර්ථකයන් විසින් හැරවී ගත් ජනසමූහයා කෙරෙහි මිථ්‍යාතීර්ථකයන් මැඩ පවත්වා ගුණ කියමින් බුදුරජුන් බැබළ වීමි. ඒ හෙතුවෙන් පැහැපත් කෙනෙක් වීමි

5653. මම සම්බුදුරජුන්ගේ ගුණ කියනෙම් ඒ හෙතුවෙන් සරසඳ මෙන් ජනයාහට ප්‍රියඞ්කර ගති ඇත්තෙම් ප්‍රිය දකුම් ඇත්තෙම් වීමි.

5654. මම ශක්තිපමණින් බුදුරජුන්හට සියලු වචනයෙන් ස්තුති කෙළෙම්. ඒ හෙතුවෙන් වාගීශ්වර වීමි. විසිතුරු වූ වැටහෙන නුවණ ඇත්තෙම් ද වීමි.

5655. විමතියට පත් යම් බාලකෙනෙක් මහාමුනි වූ බුදුරජුන්හට පරිභව කෙරෙත් නම් ඔවුනට කරුණු සහිතව නිග්‍රහ කෙළෙම්. ඒ හෙතුවෙන් මම පරිභව නො ලද්දෙම් වීමි.

5656. මම බුදුගුණ වැණීමෙන් සත්ත්වයන්ගේ කෙලෙස් දුරු කෙළෙම්. එම කර්මයාගේ බලයෙන් නිකෙලෙස් සිත් ඇත්තෙම් වෙමි.

5657. බුදුගුණ සිහි කොට දෙසන්නෙම් අසනවුන්ට නුවණ ඉපදවීමි. එහෙයින් මම ප්‍රාඥ වූයෙම් සියුම් වූ අරුත් දක්නෙම් වීමි.

5658. සියලු ආස්‍රවයන් ක්ෂය කරණ ලදුයෙම් තරණය කරණලද සසරසයුරු ඇත්තෙම් උපාදාන (-දර) රහිත ගින්නක් මෙන් පිරිනිවනට පැමිණෙන්නෙමි.

5659. මම ඒ කල්පයෙහි ම බුදුරජුන්හට යම් ස්තුතියක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුදුගුණ වැණීමෙහි මේ විපාක යි.

5660. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිත ව වෙසෙමි.

5661. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

5662. සිව්පිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසෙයින් ආයුෂමත් සුගන්ධසථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

සුගන්ධසථවිරාපදානය දසවැනියි.

උද්දානං:

තිණදො මඤ්චදො චෙව සරණබ්භඤ්ජනප්පදො,
සුපටො දණ්ඩදායී ච නෙලපූජී තථෙව ච,
බොධිසම්මජ්ජකාමෙණ්ඩො[1] සුගන්ධො දසමො දිජො.[2]
ගාථාසතං සතෙවීසං ගණිතං වෙත්ථ සබ්බසො.

තිණදායකවග්ගො තෙපඤ්ඤාසමො.

531. මහාකච්චානත්ථෙරාපදානං

5663. පදුමුත්තරො නාම ජිනො අනෙජො අජිතඤ්ජයො,
සතසහස්සෙ කප්පානං ඉතො උප්පජ්ජි නායකො.

5664. වීරො කමලපත්තක්ඛො සසඞ්කවිමලානනො,
කනකාචලසඞ්කාසො[3] රවිදිත්තිසමප්පභො.

5665. සත්තනෙත්තමනොහාරී වරලක්ඛණභූසිතො,
සබ්බවාක්‍යපථාතීතො මනුජාමරසක්කතො.

5666. සම්බුද්ධො බොධයං සත්තෙ වාගීසො මධුරස්සරො,
කරුණානිබද්ධ[4] සන්තානො පරිසාසු විසාරදො.

5667. දෙසෙති මධුරං ධම්මං චතුසච්චූපසංහිතං,
නිමුග්ගෙ මොහපඞ්කම්හි සමුද්ධරති පාණිනො

5668. තදා එකචරො හුත්වා තාපසො හිමවාලයො,
නභසා මානුසං ලොකං ගච්ඡන්තො ජිනමද්දසං.

5669. උපෙච්ච සන්තිකං තස්ස අස්සොසිං ධම්මදෙසනං,
වණ්ණයන්තස්ස වීරස්ස සාවකස්ස මහාගුණං.

5670. සංඛිත්තෙන මයා වුත්තං විත්ථාරෙන පකාසයං,
පරිසං මඤ්ච තොසෙති යථා කච්චායනො අයං.

5671. නාහං එවං විධං කඤ්චි[5] අඤ්ඤං පස්සාමි සාවකං,
තස්මාතදග්ගෙ[6] එසග්ගො එවං ධාරෙථ භික්ඛවො.

5672. තදාහං විම්හිතො හුත්වා සුත්වා වාක්‍යං මනොරමං,
හිමවන්තා ගමිත්වාන ආහත්වා[7] පුප්ඵසඤ්චයං.

5673. පූජෙත්වා ලොකසරණං තං ඨානං අභිපත්ථයිං,
තදා මමාසයං ඤත්වා ව්‍යාකාසි සරණඤ්ජහො.

---

1. බොධිසම්මජ්ජකො මණ්ඩො. මජ්සං. 2. තිච, මජ්සං.
3. කඤ්චනකාචලසඞ්කාසො, සයා 4. නිබන්ධ, සබ්බත්ථ.
5. නාහං එ-මිධෙකච්චං, මජ්සං.
6. තස්මිංතදග්ගෙ, සීමු. තස්මාතදග්ගෙ ඨපෙමි, ථෙරගාථට්ඨකථා. 7. ආහිත්වා,

උද්දානය:

තිණද මඤ්චද සරණ අබ්භඤ්ජන දායක
සුපට දණ්ඩද තෙල පූජ බොධිසම්මජ්ජක
ආමණ්ඩඵලදායක සුගන්ධද්වජ දසමය.
එක්සිය තෙවිසියයෙක් හැමසේ මෙහි ගිණුයේ.

තෘණදායකවර්ගය තෙපණස් වැනියි.

531. මහාකච්චානසථවිරාවදානය

5663. මෙසින් කල්පලක්ෂයකින් මතුයෙහි නොපැරද විය හැකි මර-රුපුනුදු ජය ගත්තා වූ තෘෂ්ණා රහිත වූ ලොකනායක වූ පදුමුත්තර නම් බුදුරජ තෙමේ ලොව පහළ විය.

5664. විරවූ පියුම්පතක් බඳු ඇස් ඇති සඳු බඳු පිරිසිදු මුහුණක් ඇති කනකපර්වතයක් මෙන් බබලන්නා වූ හිරුරැස් බඳු පැහැ ඇති-

5665. සත්ත්වයන්ගේ නෙත් සිත් පැහැර ගන්නා වූ උතුම් (දෙතිස් මහපුරිස්) ලකුණින් අලඞ්කෘත වූ සියලු (වර්ණනාතමක) කථාමාර්ගය ඉක්ම වූ දෙව්මිනිසුන් විසින් සත්කාර කරණ ලද්ද වූ-

5666. වාගීශ්වර වූ මධුරස්වර ඇත්තා වූ කරුණාවෙන් බැඳුනු සිත් ඇත්තා වූ (සිවු) පිරිස්හි විශාරද (-බියරහිත) වූ සම්මා සම්බුදුරජ තෙමේ සත්ත්වයනට (දහම්) අවබොධ කරවමින්-

5667. සිවුසස් සමග යෙදුනු මිහිරි දහම් දෙසයි. මොහ නමැති මඩෙහි ගැළුනු සත්ත්වයන් (එයින්) නගා ලයි.

5668. එකල්හි හිමවත වාසස්ථාන කොට ඇති එකලාව හැසිරෙන තවුසකු වූ (මම) අහසින් මිනිස්ලොවට යන්නෙම් බුදුරජුන් දිටිමි.

5669. උන්වහන්සේ වෙත එළඹ ශ්‍රාවකයකුගේ මහත් වූ ගුණය පසසන වීරයන් වහන්සේගේ දහම් දෙසුම ඇසීමි.

5670. "මවිසින් සංක්ෂිප්ත කොට දෙසන ලද්ද විස්තර වශයෙන් පවසමින් මේ කච්චායන තෙමේ පිරිස ද මා ද යම්සේ තුටුකෙරේ ද,

5671. මෙබඳු වූ අන්කිසි ශ්‍රාවකයකු මම නො දකිමි. මහණෙනි, එහෙයින් මෙ කරුණෙහි මෙතෙම අග්‍ර යයි. මෙසේ දරවු."

5672. එකල්හි මම ඒ මනොඥවචනය අසා විස්මිතව හිමවතට ගොස් මල්රුසක් ගෙනවුත්-

5673. ලොවට පිහිට වූ බුදුරජුන්හට පුදා එ ම තනතුර පැතීමි. කෙලෙසුන් දුරු කළ ඒ බුදුරජ තෙමේ එකල්හි මාගේ අදහස දැන (මෙසේ) පැවසී ය:

5673. “පස්සෙත්වා ඉසිවරං නිද්ධන්තකනකත්තචං,
උද්ධග්ගලොමං පීණංසං අචලං පඤ්ජලිං ඨිතං.

5674. හාසස්සුපුණ්ණනයනං[1] බුද්ධවණ්ණගතාසයං,
ධම්මංව පියගහවරං[2] අමතාසිත්තසන්නිභං.

5675. කච්චානස්ස ගුණං සුත්වා තං ඨානං පත්ථයං ඨිතො,
අනාගතම්හි අද්ධානෙ ගොතමස්ස මහාමුනෙ.

5676. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
කච්චානො නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො.

5677. බහුස්සුතො මහාඤාණී අධිප්පායවිදූ මුනෙ,
පාපුණිස්සති තං ඨානං යථායං ව්‍යාකතො මයා.

5678. සතසහස්සෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

5679. දුවෙ භවෙ සංසරාමි දෙවත්තෙ අථ මානුසෙ,
අඤ්ඤං ගතිං න ගච්ඡාමි බුද්ධපූජායිදං ඵලං.

5680. දුවෙ කුලෙ පජායාමි ඛත්තියෙ අථ බ්‍රාහ්මණෙ,
නීචෙ කුලෙ න ජායාමි බුද්ධපූජායිදං ඵලං.

5681. පච්ඡිමෙ ච[3] භවෙ දානි ජාතො උජ්ජෙනියා පුරෙ,[4]
පජ්ජොතස්ස ච චණ්ඩස්ස පුරොහිතදිජාතිනො.[5]

5682. පුත්තො තිරිටිවච්ඡස්ස[6] නිපුණො වෙදපාරගූ.
මාතා ච චන්දිමා නාම කච්චානොහං වරත්තචො.

5683. වීමංසත්ථං බුද්ධස්ස භූමිපාලෙන පෙසිතො,
දිස්වා මොක්ඛපුරද්වාරං නායකං ගුණසඤ්චයං.

5684. සුත්වා ච විමලං වාක්‍යං ගතිපඞ්කවිසොසනං,
පාපුණිං අමතං සන්තං සෙසෙහි සහ සත්තහි.[7]

5685. අධිප්පායවිදූ ජාතො සුගතස්ස මහාමුනෙ,[8]
ඨපිතො එතදග්ගෙ ච සුසමිද්ධමනොරථො.

5686. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

1. හාසං සුපුණ්ණනයනං, මජ්සං.
2. ධම්මජංඋග්ගහදයං, මජ්සං. ධම්මපටිග්ගහවරං, සෑං. 3. පච්ඡිමෙ ච, මජ්සං.
4. උජ්ජෙනියං පුරෙ, මජ්සං. 5. පුරොහිතදිජාධිකො, මජ්සං.
6. තිදිවවච්ඡස්ස, ථෙරගාථට්ඨකථා. තිරීටිවච්ඡස්ස, මජ්සං.
7. සෙසෙහි සහ පඤ්චහි, සීමු; ථෙරගාථට්ඨකථා. “සෙසෙහි සහ සත්තහි” ඉති මනොරථපූරණී ආදිඅට්ඨකථාසු සදිසං සමෙති.
8. මහාමතෙ, මජ්සං.

5673 – 5674. පිරිසිදු කළ සුවර්ණයක් බඳු පැහැපත් සිවි ඇති, අග් උඩු කැරුව ගිය ලොම් ඇති, පිරුණු (මසින් වැසුනු) උරහිස් ඇති, නිශ්චල ව බඳැඳිලි ව සිටියා වූ, සතුටුකඳුලින් පිරී ගිය ඇස් ඇති, බුදුගුණ වැණුමෙහි පෙලඹුනු සිත් ඇති, අමායෙන් ඉසින ලද්දක් බඳු මූර්තිමත් ධර්මය වැනි උතුම් සිරුරක් ඇති මේ සෘෂිවරයා බලවු.

5675. (මෙ තෙම) කච්චානයන්ගේ ගුණ අසා ඒ තනතුර පතමින් සිටියේ ය. ගෞතමමහාමුනීන්‍ද්‍රයන් වහන්සේගේ (සසුන පවත්නා) අනාගත කාලයෙහි-

5676. ඒ ම බුදුරජුන්ගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් ම නිර්මිත කළාක් වැනි වූ ඖරසපුත්‍ර වූ නමින් කච්චාන නම් වූ බුද්ධශ්‍රාවකයෙක් වන්නේ ය.

5677. යම් සේ මා විසින් මෙය පවසන ලද නම් එසේ ම (අනාගත යෙහි) බහුශ්‍රැතයෙක් ව මහනුවණැත්තෙක් ව, බුදුරජුන්ගේ අදහස් දත්තෙක් ව ඒ ම තනතුරට පැමිණෙන්නේ ය" (කියායි).

5678. එකල්හි මෙයින් සියක්දහස්වන කපෙහි යම් කර්මයක් කෙළෙම් ද (ඒ හෙතුවෙන්) දුගයතීක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5679. දෙව්අත්බැව්හි ද මිනිස්අත් බැව්හි ද යන දෙ අත්බැව්හි සැරි සරමි. අන් ගතියකට නො යමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5680. කැත් කුලයෙහි ද යලි බමුණුකුලයෙහි ද යන දෙකුලයෙහි උපදිමි. නීචකුලයෙහි නො උපදිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5681 – 5682. දූන් පශ්චිම වූම භවයෙහි උදෙනි නගරයෙහි උපන්නෙම් වෙමි. චණ්ඩප්‍රද්‍යොත රජුගේ තිරීටවච්ඡ (නම්) පුරොහිත බමුණුගේ පුත්‍ර වූයෙම් සියුම් නුවණැත්තෙම් වෙදයෙහි පරතෙරට ගියෙම් වීමි. මවු තොමෝ චන්‍ද්‍රිමා නම් වූවා ය. මනා සිවිපැහැ ඇති මම කච්චාන නම් වෙමි.

5683. බුදුරජුන් විමසනු පිණිස රජු විසින් යවන ලදුයෙම් ගුණ-සමූහය වූ ලොකනායක වූ බුදුරජුන් ද මොක්පුර දොරටුව ද දැක-

5684. (සසර) ගති නමැති මඩ වියලවන්නා වූ නිර්මල (බුද්ධ) වචනය ද අසා (මා කැටුව ගිය) සෙසුසත් දෙනා සමග ශාන්ත වූ අමෘතයට (=නිවනට) පැමිණියෙමි.

5685. මහාමුනි වූ බුදුරජුන්ගේ අදහස් දත්තෙක් වීමි. මැනැවින් සමෘද්ධ වූ මනොරථ ඇත්තෙම් එතදග්‍රස්ථානයෙහි තබනලද්දෙම් ද වීමි.

5686. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5687. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5688. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා මහාකච්චානො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

මහාකච්චානත්ථෙරස්ස අපදානං පඨමං.

532. වක්කලිත්ථෙරාපදානං

5689. ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො,
අනොමනාමො අමිතො නාමෙන පදුමුත්තරො.

5690. පදුමාකාරවදනො පදුමාමලසුච්ඡවී,
ලොකෙනානුපලිත්තොව තොයෙන පදුමං යථා.

5691. වීරො පදුමපත්තක්ඛො කන්තො ච පදුමං යථා,
පදුමුත්තරගන්ධො ච[1] තස්මා සො පදුමුත්තරො.

5992. ලොකජෙට්ඨො ච නිම්මානො අන්ධානං නයනූපමො,
සන්තවෙසො ගුණනිධි කරුණාමතිසාගරො.

5693. ස කදාචි මහාවීරො බ්‍රහ්මාසුරසුරච්චිතො,
සදෙවමනුජාකිණ්ණො[2] ජනමජ්ඣෙ අනුත්තමො.[3]

5694. වදනෙන සුගන්ධෙන මධුරෙන රුතෙන ච,
රඤ්ජයං පරිසං සබ්බං සන්ථවී සාවකං සකං.

5695. "සද්ධාධිමුත්තො සුමති මම දස්සනලාලසො,[4]
නත්ථි එතාදිසො අඤ්ඤො යථායං භික්ඛු වක්කලි".

5696. තදාහං හංසවතියං නගරෙ බ්‍රාහ්මණත්‍රජො,
හුත්වා සුත්වා ච තං වාක්‍යං තං ඨානමභිරොචයිං.

5697. සසාවකං තං විමලං නිමන්තෙත්වා තථාගතං,
සත්තාහං භොජයිත්වාන දුස්සෙහච්ඡාදයිං තදා.

5698. නිපච්ච සිරසා තස්ස අනන්තගුණසාගරෙ,
නිමුග්ගො පීතිසම්පුණ්ණො ඉදං වචනමබ්‍රවිං:

---

1 පදුමුත්තරගන්ධොව, මජ්සං. 2 සදෙවමනුජාකිණ්ණෙ, මජ්සං.
3 ජිනුත්තමො, මජ්සං. 4. දස්සනාසාලයො, සයා.

5687. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

5688. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ට විමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජාණන්වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් මහාකච්චාන ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක.

මහාකච්චාන ස්ථවිරාවදානය පළමු වැනියි.

532. වක්කලිත්ථෙරාවදානය

5689. මෙයින් සියක් දහස්වන කපෙහි ලොකනායක වූ අලාමක වූ නම් ඇති අපමණ ගුණ ඇති නමින් පදුමුත්තර වූ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූසේක.

5690. උන්වහන්සේ පියුම්කට බඳු මුහුණු ඇත්තාහ. පියුමක් සේ නිමල මනා සිවි ඇත්තාහ. ජලය හා (නො ගැවෙන) පියුම මෙන් ලොකය හා නො ම ගැටෙත්තාහ.

5691. වීරයහ. පියුම්පෙති බඳු ඇස් ඇත්තාහ. පියුමක් මෙන් කාන්තයහ. උතුම් පියුම් සුවඳ බඳු සුවඳ ඇත්තාහ. එබැවින් උන්වහන්සේ පදුමුත්තර නම් වනසේක.

5692 – 5693. ලොකජ්‍යෙෂ්ඨ වූ මාන රහිතවූ අන්ධයනට ඇසක් වැනි වූ ශාන්ත වෙශ ඇති ගුණනිධාන වූ කුළුණු නැණ සයුරෙක් වූ බඹ අසුර සුරන් විසින් පුදන ලද දෙවියන් සහිත මිනිසුන් විසින් පිරිවරණ ලද අති උත්තම වූ ඒ මහාවීර වූ බුදුරජාණෝ තිසියම් දිනෙක ජනමධ්‍යයෙහි–

5694. සුවඳවත් මුවින් මියුරු වූ හඬින් සියලු පිරිස් රඳවමින් සියසච්චකු (මෙසේ) වැණු සේක:

5695. "ශ්‍රද්ධා සැදැහැ ඇති මනා නුවණැති මා දක්නෙමෙහි ලොල් වූ මේ වක්කලි භික්‍ෂුතම බඳු අන් භික්‍ෂුතමක් නැත" කීයා යි.

5696. එකල්හි මම හංසවතී නගරයෙහි බ්‍රාහ්මණපුත්‍රයෙක් ව (බුදු-රජුන්ගේ) ඒ වචනය අසා ඒ තනතුර රුචි කෙළෙමි.

5697. එකල්හි ශ්‍රාවකසඞ්ඝයා සහිත ඒ නිමල බුදුරජුන් පවරා සතියක් (බොජුන්) වළඳවා (චීවර) වස්ත්‍රයෙන් හැඳවීමි.

5698 උන්වහන්සේගේ අනන්ත වූ ගුණසයුරෙහි සිරසින් නෙව ගිළුනෙම් ප්‍රීතියෙන් සම්පූර්ණ වූයෙම් මෙ වදන් කීමි:

5699. “යො සො තයා සන්ථවිතො ඉතො සත්තමකෙ'හනි,[1]
භික්ඛු සද්ධාවතං අග්ගො තාදිසො හොමහං මුනෙ.”

5700. එවං වුත්තෙ මහාවීරො අනාවරණදස්සනො,
ඉමං වාක්‍යං උදීරෙසි පරිසායං[2] මහාමුනි:

5701. “පස්සථෙතං මාණවකං පීතමට්ඨනිවාසනං,
හෙමයඤ්ඤොපවීතඞ්ගං[3] ජනනෙත්තමනොහරං.

5702. එසො අනාගතද්ධානෙ ගොතමස්ස මහෙසිනො,
අග්ගො සද්ධාධිමුත්තානං සාවකොයං භවිස්සති.

5703. දෙවභූතො මනුස්සො වා සබ්බසන්තාපවජ්ජිතො,
සබ්බභොගපරිබ්බූළ්හො සුඛිතො සංසරිස්සති.

5704. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන[4] සත්ථා ලොකෙ භවිස්සති.

5705. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
වක්කලි නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො.

5706. තෙන කම්මවිසෙසෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

5707. සබ්බත්ථ සුඛිතො හුත්වා සංසරන්තො භවාභවෙ,
සාවත්ථියං පුරෙ ජාතො කුලෙ අඤ්ඤතරෙ අහං.

5708. නොනීතසුඛුමාලං මං ජාතපල්ලවකොමලං,
මන්දං උත්තානසයනං පිසාචීභයතජ්ජිතා.[5]

5709. පාදමූලෙ මහෙසිස්ස සායෙසුං දීනමානසා,
‘ඉමං දදාම තෙ නාථ සරණං හොහි නායක.’

5710. තදා පටිග්ගහී සො මං භීතානං සරණො මුනි,
ජාලිනා සඞ්ඛලඞ්කෙන[6] මුදුකොමලපාණිනා.

5711. තදාප්පභූති තෙනාහං අරක්ඛෙය්‍යෙන රක්ඛිතො,
සබ්බවෙරවිනිම්මුත්තො[7] සුඛෙන පරිවඩ්ඪිතො.

5712. සුගතෙන විනාභූතො උක්කණ්ඨාමි මුහුත්තකං,
ජාතියා සත්තවස්සොහං පබ්බජිං අනගාරියං.

1. ඉතො සත්තමකෙ මුනි, මජසං. ඉතො සද්ධාධිමුත්තො ඉති, ස්‍යා.
2. පරිසාය, මජසං. 3. හෙමයඤ්ඤොපචිතඞ්ගං, මජසං.
4. ගොත්තෙන, මජසං. 5. පිසාචභයතජ්ජිතා, සීමු. මජසං.
6. ජාලිනාචක්කඞ්කිතෙන, මජසං.
7. සබ්බාපදාවිනිම්මුත්තො, ථෙරගාථට්ඨකථා, සබ්බබ්‍යාධිවිනිම්මුත්තො, ස්‍යා
සබ්බුපද්දවිනිම්මුත්තො, PTS

5699. "මුනීන් වහන්ස, මෙයින් සත්වැනි දිනයෙහි යම් ඒ භික්ෂුනමක් සැදැහැතියනට අග්‍රය යි මුබ වහන්සේ විසින් පසස්නා ලද ද, මම ද එබන්දෙක් වෙමි" යි (කියා යි).

5700. මෙසේ කී කල්හි මහාවීර වූ අනාවරණඥානදර්ශික ඇති බුදුරජහු පිරිස්හි මෙම වචනය වදාළහ:

5701. "රත්වත් පුනනුලක් දැරූ සිරුරු ඇති ජනයාගේ නෙත් සිත් ගන්නා වූ, කසාවත් හඳනා වූ මේ මානවකයා බලවූ.

5702. මෙතෙම මතුකාලයෙහි ගෞතම බුදුරජුන්ගේ සද්ධාධිමුක්ත (බලවත් සැදැ ඇති) යනට අග්‍ර වූ ශ්‍රාවකයා වන්නේ ය.

5703 දෙවි වූයේ හෝ මිනිස් වූයේ හෝ සියලු තැවුලින් බැහැර වූයේ හැම භොගසමපත්තීන්ගෙන් ආඪ්‍ය ව සුවපත් වූයේ සසර සැරිසරන්නේ ය.

5704. මෙයින් සියක් දහස්වන කපෙහි ඔක්කාක කුලයෙහි උපදනා වූ නමින් ගෞතම වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

5705. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිත වූවාක් වැනි වූ ඖරස වූ නමින් වක්කලි නම් වූ ශාස්තෘශ්‍රාවකයෙක් වන්නේ ය."

5706 මම ඒ කර්ම විශෙෂය හෙතුකොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද මිනිස්සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

5707 මම සියලු තන්හි සුව ඇත්තෙම් කුඳුමහත් භවයෙහි සැරිසරනෙම් සැවැත් නුවර එක්තරා කුලයක උපන්නෙම් වෙමි.

5708 - 5709. වෙඩරු මෙන් සිවුමැලි වූ අසෝකදළු මෙන් මොලොක් වූ ළදරු උඩුකුරු ව නෝනා මා පිසාචියක් බියෙන් තැතිගැන්වීය. දුක්පත් සිත් ඇතිදෙමාපියෝ "නාථයන් වහන්ස, මුබවහන්සේට මුන් දෙමු. නායකයන් වහන්ස, පිහිට වනු මැනැවැ" යි මහර්ෂි වූ බුදුරජුන්ගේ පාමුල මා හොවා ලූහ.

5710. එකල්හි බිය පත් වූවනට පිහිට වූ ඒ බුදුරජ තෙම ජාලාඞ්ගුලි ඇති සක්ලකුණුසුත් මෘදුකොමලහස්තයෙන් මා පිළිගත්තේ ය.

5711. මම එතැන් පටන් අරක්ෂෙයය වූ (කිසිවකු විසින් නො රැකිය යුතු) ඒ බුදුහු විසින් රැකුණෙම් සියලු පසමිතුරන්ගෙන් මිදුනෙම් සුවයෙන් වැඩුනෙමි.

5712. මොහොතකුදු බුදුරජුන්ගෙන් වෙන් වූයෙම් උකටලී වෙමි. උත්පත්තියෙන් සත්හැවිරිදි වූ මම අනගාර්‍ය සඞ්ඛ්‍යාත පැවිද්දට වන්මි.

5713. සබ්බපාරමිසම්භූතං ලක්ඛීනිලයනං පරං,[1]
රූපං සබ්බසුභාකිණ්ණං අතිත්තො පිහයාමහං[2].

5714 බුද්ධරූපරතං[3] ඤත්වා තදා ඔවදි මං ජිනො,
"අලං වක්කලි කිං රූපෙ රමසෙ බාලනන්දිතෙ.

5715. යො හි පස්සති සද්ධම්මං සො මං පස්සති පණ්ඩිතො,
අපස්සමානො සද්ධම්මං මං පස්සම්පි න පස්සති.

5716. අනන්තාදීනවො කායො විසරුක්ඛසමූපමො,
ආවාසො සබ්බරොගානං පුඤ්ජො දුක්ඛස්ස කෙවලො.

5717. නිබ්බින්දිය තතො රූපෙ ඛන්ධානං උදයබ්බයං,
පස්ස සබ්බකිලෙසානං සුඛෙනන්තං ගමිස්සසි."

5718. එවං තෙනානුසිට්ඨොහං නායකෙන හිතෙසිනා,
ගිජ්ඣකූටං සමාරුය්හ ඣායාමි ගිරිකන්දරෙ.

5719. ඨිතො පබ්බතපාදම්හි මමාහ සො මහාමුනි,[4]
වක්කලී'ති ජිනො වාචං තං සුත්වා මුදිතො අහං.

5720. පක්ඛන්දිං සෙලපබ්භාරෙ අනෙකසතපොරිසෙ,
තදා බුද්ධානුභාවෙන සුඛෙන'ව මහිං ගතො.

5721. පුනොපි[5] ධම්මං දෙසෙසි[6] ඛන්ධානං උදයබ්බයං,
තමහං ධම්මමඤ්ඤාය අරහත්තමපාපුණිං.

5722. සුමහාපරිසාමජ්ඣෙ[7] තදා මං මරණන්තගො[8],
අග්ගං සද්ධාධිමුත්තානං පඤ්ඤපෙසි මහාමති.

5723. සතසහස්සෙ ඉතො කප්පෙ යං කම්මමකරිං තදා,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

5724. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5725. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

1. නීලක්ඛිනයනං වරං, මජසං. 2. විහරාමහං, මජසං.
3. බුද්ධං රූපරතං, සීමු. බුද්ධරූපරතිං, මජසං. 4. අස්සාසයි මහාමුනි, මජසං.
5. පුනාපි, සීමු. සජා. 6. දෙසෙති, මජසං.
7. සුමහාපරිසමජ්ඣෙ, මජසං. 8. චරණන්තගො, මජසං.

5713 මම සියලු පාරමිතාබලයෙන් හටගත්තා වූ උතුම් වූ ලක්‍ෂ්මියට (-සම්පත්තියට) වාසස්ථාන වූ සියලු ශුභ (-වණ්ණසණ්ඨාන) යන්ගෙන් ගැවසී ගත් (බුදුරජුන්ගේ) රූපය (දක්මෙහි) තෘප්ත (සෑහීමට පත්) නො වූයෙම් ආසා කෙරෙමි.

5714. එකල්හි බුද්ධරූපයෙහි ඇලුනු මා දැක 'වක්කලිය, කම් නැත. බාලයන් තුටුවන්නා වූ රූපයෙහි කිම ඇලෙහි දැ'යි කෙලෙස් දිනූ බුදුරජාතන් වහන්සේ මට අවවාද කළසේක.

5715. යමෙක් සදහම් දක්නේ වේ ද, ඒ පණ්ඩිත තෙමේ මා දකී. සදහම් නො දක්නේ මා දක්නේ නමුදු නො දක්නේ ම ය.

5716. රූ කය අප්‍රමාණ වූ දෙස් ඇත්තකි. විෂවෘක්‍ෂයකට බඳු උපමා ඇත්තකි. සියලු රෝගයකට නිවාසස්ථානයකි. හුදු දුඃඛපිණ්ඩයකි.

5717. එබැවින් රූපයෙහි කලකිරී සකන්ධයන්ගේ උදය - ව්‍යයය (-ඇතිවීම - නැතිවීම) බලව. එයින් සියලු කෙලෙසුන්ගේ අන්තයට සුවසේ පැමිණෙන්නෙහි ය.

5718. හිතෛෂී වූ ඒ ලොකනායකයන් වහන්සේ විසින් මෙසේ අනුශාසනා කරණ ලද මම ගිජුකුළුපව්වට නැගී ගිරිකඳුරෙහි බුද්ධරූප දර්ශන වියොගයෙන් (මැරෙන්නට) සිතමි.

5719 - 5720. ඒ පස්මරුන් දිනූ බුදුරජාතන්වහන්සේ කඳුබෑවුමෙහි සිටියහු 'වක්කලි' ය සි මට ඇමතූසේක. මම ඒ වචනය අසා තුටු වූයෙම් නොයෙක් සියගණන් පුරිස්පමණින් ගැඹුරු වූ ප්‍රපාත ප්‍රපාතයට පැන්නෙමි. එකල්හි බුද්ධානුභාවයෙන් සුවසේ ම පොළොවෙහි පිහිටියෙම් වෙමි.

5721. (බුදුරජ තෙම) නැවතත් සකන්ධයන්ගේ උදය - ව්‍යය පිළිබඳ දහම් දෙසී ය. මම එදහම් දැන රහත්බවට පැමිණියෙමි.

5722. එකල්හි මරණාන්තය වූ නිවනට පැමිණි මහා ප්‍රාඥයන් වහන්සේ ශ්‍රද්ධාධිමුක්තික (බලවත් සැදැහැ ඇති) යනට මා අග්‍ර කොට ඉමහත් පිරිස් මැද පණවා වදාළ සේක.

5723 එකල්හි මෙයින් සියක්දහස් වන කපෙහි යම් කර්මයක් කෙළෙම් ද, (ඒ හෙතුවෙන්) දුගතියක් නො දනිමි. බුද්ධපූජාවෙහි මේ විපාක යි.

5724. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රවරහිතව වෙසෙමි.

5725. බුදුරජාතන් වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන් සහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාතන් වහන්සේගේ සසුන කරණ ලදී.

5726. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා වක්කලිත්ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති

වක්කලිත්ථෙරස්ස අපදානං දුතියං.

533. මහාකප්පිනත්ථෙරාපදානං

5727. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මානපාරගූ,
උදිතො ජගදාකාසෙ[1] රවීව සරදම්බරෙ.

5728. වචනාභාය බොධෙති වෙනෙය්‍යපදුමානි සො,
කිලෙසපඞ්කං සොසෙති මතිරංසීහි නායකො.

5729. තිත්ථියානං යසො හන්ති ඛජ්ජොතාභා යථා රවි,
සච්චත්ථාභං පකාසෙති රතනංව දිවාකරො.

5730. ගුණානං ආයතිභූතො රතනානංව සාගරො,
පජ්ජුන්නොරිව භූතානි ධම්මමෙඝෙන වස්සති.

5731. අක්ඛදස්සො තදා ආසිං නගරෙ හංසවතියෙ,
උපෙච්ච ධම්මමස්සොසිං ජලපුත්තරනාමිනො.

5732. ඔවාදකස්ස භික්ඛූනං සාවකස්ස කතාවිනො,
ගුණං පකාසයන්තස්ස තොසයන්තස්ස[2] මෙ මනං.

5733. සුත්වා පතීතො සුමනො නිමන්තෙත්වා තථාගතං,
සසිස්සං භොජයිත්වාන තං ඨානමභිපත්ථයිං.

5734. තදාහාසි මහාභාගො[3] හංසදුන්දුභිසුස්සරො,[4]
පස්සථෙතං මහාමත්තං විනිච්ඡයවිසාරදං.

5735. මංපාදමූලෙ පතිතං[5] සමුග්ගතතනූරුහං,
ජීමූතවණ්ණං පීණංසං පසන්නනයනානනං.

5736. පරිවාරෙන මහතා රඤ්ඤයං තං[6] මහායසං,
එසො කතාපිනො ඨානං පත්ථෙති මුදිතාසයො.

5737. ඉමිනා පිණ්ඩපාතෙන[7] චෙතනාපණිධීහි ච,[8]
කප්පසතසහස්සානි නුප්පජ්ජති දුග්ගතිං.

5738. දෙවෙසු දෙවසොභග්ගං මනුස්සෙසු මහන්තතං,
අනුභොත්වාවසෙසෙන[9] නිබ්බානං පාපුණිස්සති.

---

1. අජටාකාසෙ, මජසං. ජලදාකාසෙ, PTS. 2. තප්පයන්තස්ස, මජසං.
3. තදා හංසසම්භාගො, මජසං.
4. හංසදුන්දුභිනිස්සරෙං, ථෙරගාථට්ඨකථා; හංසදුන්දුභිනිස්සනො, මජසං.
5. පතිතං පාදමූලෙ මෙ, මජසං. 6. රඤ්ඤයන්තං, සීමු. රාජයුත්තං, මජසං.
7. පණිපාතෙන, මජසං. 8. චාගෙන පණිධීහි ච, මජසං.
9. අනුභොත්වාන සෙසෙන, මජසං.

5726. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් චක්කලිස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

චක්කලි ස්ථවිරාපදානය දෙවැනියි.

533. මහාකප්පින ස්ථවිරාපදානය

5727. සියලු දහම්හි තෙරපත් ඒ පදුමුත්තර නම් බුදුරජ තෙමේ සරදාකාශයෙහි සූර්‍ය්‍යයා සෙයින් ලොකය නමැති අහසෙහි උදා විය. ඒ ලොකනායක තෙමේ-

5728. වචන නමැති රශ්මියෙන් විනේජන නමැති පියුම් පුබුදු-වයි. නුවණ නමැති රැසින් කෙලෙස් නමැති මඩ වියළයි.

5729. හිරු කෙදෝකිම්පැහැ (තසත්තාක්) සේ තීර්ථකයන්ගේ යශස් නසයි. සූර්‍ය්‍යතෙමේ රත්නයන් ප්‍රකට කරන්නාක් මෙන් සත්‍යාර්ථප්‍රභාව ප්‍රකට කෙරෙයි.

5730. රත්නයනට සයුර මෙන් ගුණයනට රැස්වන තැන් (ආකරයක්) වේ. වැහිවලාවක් මෙන් ලොකයා දහම්වැස්සෙන් තෙමයි.

5731 - 5732. මම එකල්හි හංසවතී නගරයෙහි නීතිවිශාරද වූ ආචාර්‍ය්‍යවරයෙක් වීමි. භික්‍ෂූනට ඔවා දෙනවුන් අතුරෙන් අගතැන්පත් කෘතකෘත්‍ය වූ ශ්‍රාවකයකුගේ ගුණ පවසන්නා වූ මාගේ සිත තුටු කරණ පියුම්තුරා බුදුරජුන්ගේ ධර්මය එහි පැමිණ ඇසීමි.

5733. ධර්මය අසා සතුටු වූයෙම් සොම්නස් වූයෙම්, ශිෂ්‍යයන් සහිත වූ තථාගතයන් පවරා (බොජුන්) වළදවා මම ද එ ම තනතුර පැතීමි.

5734 - 5735. "එකල්හි හස් බෙරහඬට බඳු මනා සවර ඇති මහත් භාග්‍ය ඇති බුදුරජ තෙමේ පැවසී ය: මැනැවින් තැගුනු ඌර්ධ්වාග්‍රරොම ඇති මාගේ පාමුල වැටුනා වූ, මෙසවණී වූ, පිරිපුන් උරහිස් ඇති, පැහැදි ඇස් හා මුහුණ ඇති මේ මහාමාත්‍රයා බලවු.

5736. මහ පිරිවරින් ඒ මහා යශස් බබුළුවන ප්‍රමුදිත සිත් ඇති මෙ තෙම කතාවී වූ ඒ ශ්‍රාවකයාගේ තනතුර පතයි.

5737. මේ පිණ්ඩපාතදානය කරණ කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් කරණ කොට ගෙණ ද කල්පලක්‍ෂයක් දුගතියක නූපදී යි.

5738. දෙවියන් අතුරෙහි දිව්‍යමය සෞභාග්‍යය ද, මිනිසුන් අතුරෙහි මහත්බව ද අනුභව කොට ඒ කර්මාවශෙෂයෙන් නිවනට පැමිණේ යයි වදාළේය.

5739. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො.
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

5740. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
කප්පිනො නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො.

5741. තතොහං සුකතං කාරං කත්වාන ජිනසාසනෙ,
ජහිත්වා මානුසං දෙහං තුසිතං අගමාසහං.

5742. දෙවමානුසරජ්ජානි සතසො අනුසාසිය,
බාරාණසියමාසන්නෙ ජාතො කොනියජාතියං.

5743. සහස්සපරිවාරෙන[1] සපජාපතිකො අහං,
පඤ්ච පච්චෙකබුද්ධානං සතානි සමුපට්ඨහිං.

5744. තෙමාසං භොජයිත්වාන පච්ඡා'දම්හ තිචීවරං,
තතො චුතා මයං සබ්බෙ අහුම්හ තිදසූපගා.

5745. පුනො සබ්බෙ මනුස්සත්තං ආගම්මහ[2] තතො චුතා,
කුක්කුටම්හි පුරෙ ජාතා හිමවන්තස්ස පස්සතො.

5746. කප්පිනො නාමහං ආසිං රාජපුත්තො මහායසො,
සෙසාමච්චකුලෙ ජාතා මමෙව පරිවාරයුං.

5747. මහාරජ්ජසුඛං පත්තො සබ්බකාමසමිද්ධිමා,
වාණිජෙහි සමක්ඛාතං බුද්ධුප්පාදමහං සුණිං.

5748. "බුද්ධො ලොකෙ සමුප්පන්නො අසමො එකපුග්ගලො,
සො පකාසෙති සද්ධම්මං අමතං සුඛමුත්තමං.

5749. සුයුත්තා තස්ස සිස්සා ච සුමුත්තා ච අනාසවා,"
සුත්වා තෙසං සුවචනං සක්කරිත්වාන වාණිජෙ.

5750. පහාය රජ්ජං සාමච්චො නික්ඛමිං බුද්ධමාමකො,
නදිං දිස්වා මහාචන්දං පූරිතං සමතිත්තිකං.

5751. අප්පතිට්ඨං අනාලම්බං දුත්තරං සීඝවාහිනිං,
ගුණං සරිත්වා බුද්ධස්ස සොත්ථිනා සමතික්කමිං.

5752 භවසොතං සචෙ බුද්ධො තිණ්ණො ලොකන්තගූ විදූ,
එතෙන සච්චවජ්ජෙන ගමනං මෙ සමිජ්ඣතු.

1. සතසහස්සපරිවාරො, සයා. 2. අගම්මහ, මජ්ඣං.

5739 මෙයින් සියක්දහස්වන කපෙහි ඔක්කාකකුලයෙහි උපදනා වූ ගොත්‍රයෙන් ගෞතම නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

5740. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිතකළාක් බඳු වූ ඖරස පුත්‍ර වූ නමින් කප්පින නම් වූ ශාස්තෘශ්‍රාවකයෙක් වන්නේ ය (කී.ශා සි).

5741. ඉක්බිති මම සර්වඥශාසනයෙහි මෙම මහා පින්කම කොට මිනිස් සිරුර හැර තුෂිත දෙව්ලොවට (උත්පත්තිවශයෙන්) ගියෙමි.

5742. දැහැමින් සෙමින් සියක්වර දිව්‍යමනුෂ්‍යරාජ්‍යයන් අනුශාසනය කොට බරණැස සමීපයෙහි පේශකාරකුලයෙහි උපන්නෙම් වෙමි.

5743. භාර්‍යාව සහිත වූ මම දහසක් පිරිවර සමග පන්සියයක් පසේබුදුවරයනට උවැටැන් කෙළෙමි.

5744. තෙමසක් වළඳවා පසුව තුන් සිවුරු දුනිමු. අපි සියල්ලෝ එයින් ච්‍යුතව තව්තිසා දෙව්ලොවට ගියෝ වූමු

5745. යළි එයින් සැව මිනිසත් බවට පැමිණියෙමු. හිමවත්පව් පසෙක වූ කුක්කුට පුරයෙහි උපන්නමෝ වූමු.

5746. මම මහත්යශස් ඇති කප්පින නම් රාජපුත්‍රයෙක් වීමි. සෙස්සෝ ඇමතිකුලයෙහි උපන්නාහු මා මැ පිරිවැරූහ.

5747. සියලු කාමසුඛයෙන් සමෘද්ධ වූ මම මහරජසුවයට පැමිණියේ වෙළෙඳුන් විසින් කියන ලද බුදුඋපත ඇසීමි:

5748. "අසම වූ අසහාය පුද්ගල වූ බුදුරජ තෙම ලොව පහළ වීය. හෙතෙම උතුම් වූ අමාසුව (දෙන) සදහම් දෙසයි.

5749. උන්වහන්සේගේ ශිෂ්‍යයෝ ද මැනැවින් (ඒ ධර්මයෙහි) යෙදුනෝ ය. ආශ්‍රවයන් කෙරෙන් මැනැවින් මිදුනෝ ය" කියා සි. ඔවුන්ගේ මේ භද්‍රවචන අසා ඒ වෙළෙඳුන්හට සත්කාර කොට-

5750. රාජ්‍යය හැර ලා ඇමතියන් සහිතව බුද්ධමාමක වූයෙම් (තථාගතයන් දක්නට) නික්මුනෙමි. මුවවිට දක්වා පිරුණා වූ චන්ද්‍රභාගා මහානදිය දුක-

5751. (එහි වැටුනු අයට කිසිදු පිහිටක් නො මැති බැවින්) ප්‍රතිෂ්ඨා විරහිත වූ (එල්බ ගැනීමට කිසිවක් නැති බැවින්) නිරාලම්බ වූ, තරණය කිරීම දුෂ්කර වූ, ශීඝ්‍රව ගලා බස්නා වූ (චන්ද්‍රභාගා නදිය) බුදුරජුන්ගේ ගුණ සිහිකොට සුවසේ තරණය කෙළෙමි.

5752. ලොකයෙහි අනන්තයට ගියා වූ සියල්ල දන්නා වූ සර්වඥ තෙමේ ඉදින් භව සැඩපහර තරණය කෙළේ නම් ඒ සත්‍යවචනය කාරණ කොට ගෙණ මාගේ ගමන සමෘද්ධ වේ වා.

5753 යදි සන්තිගමො මග්ගො මොක්ඛො චච්චන්තිකං[1] සුඛං,
එතෙන සච්චවජ්ජෙන ගම්මතං මෙ සමිජ්ඣතු.

5754. සඞ්ඛ්‍යා වෙ තිණ්ණකන්තාරො පුඤ්ඤක්ඛෙත්තො අනුත්තරො,
එතෙන සච්චවජ්ජෙන ගම්මතං මෙ සමිජ්ඣතු.

5755 සහ කතෙ සච්චවරෙ මග්ගා අපගතං ජලං,
තතො සුඛෙන උත්තිණ්ණො නදීතීරෙ මනොරමෙ

5756 නිසින්නං අද්දසං බුද්ධං උදෙන්තංව පභඞ්කරං,
ජලන්තං හෙමසෙලංව දීපරුක්ඛංව ජොතිතං.

5757. සසී ව[2] තාරාසහිතං සාවකෙහි පුරක්ඛතං,
වාසවං විය වස්සන්තං දෙසනාජලදං තදා[3]

5758. වන්දිත්වාන සහාමච්චො එකමන්තං උපාවිසිං[4]
තතො නො ආසයං[5] ඤත්වා බුද්ධො ධම්මමදෙසයි.

5759. සුත්වාන ධම්මං විමලං අවොචුම්හ මයං ජිනං,
පබ්බාජෙහි මහාවීර නිබ්බින්නාම්හ[6] මයං භවෙ

5760. ස්වාක්ඛාතො[7] භික්ඛවෙ ධම්මො දුක්ඛන්තකරණාය වො,
චරථ බ්‍රහ්මචරියං ඉච්චාහ මුනි සත්තමො.

5761. සහ වාචාය සබ්බෙපි භික්ඛුවෙසධරා මයං,
අහුම්හ උපසම්පන්නා සොතාපන්නා ච සාසනෙ.

5762. තතො ජෙතවනං ගන්ත්වා අනුසාසි විනායකො,
අනුසිට්ඨො ජිනෙනාහං අරහත්තමපාපුණිං.

5763. තතො භික්ඛුසහස්සං[8] තං අනුසාසිං අහං තදා,
මමානුසාසනකරා තෙපි ආසුං අනාසවා.

5764. ජිනො තස්මිං ගුණෙ තුට්ඨො එතදග්ගෙ ඨපෙසි මං,
භික්ඛු ඔවාදකානග්ගො කප්පිනොති මහාජනෙ.

5765. සතසහස්සෙ කතං කම්මං ඵලං දස්සෙසි මෙ ඉධ,
සුමුත්තො සරවෙගොව කිලෙසෙ ඣාපයි[9] මම.

1. මොක්ඛදං සන්තිකං, ස්‍යා. 2. සසී ච, මජ්සං.
3. දෙසනාජලදන්තරං, මජ්සං. දෙවෙනජලදන්තරං, ස්‍යා. PTS
4. එකමන්තමුපාවිසිං, මජ්සං 5. තතොසජ්ඣාසයං, ස්‍යා
6. නිබ්බින්නාමහ, මජ්සං. 7. ස්වක්ඛාතො, මජ්සං.
8 තතොභික්ඛුසහස්සානි, මජ්සං. 9. ඣාපයිං, මජ්සං.

5753. ඉදින් මාගීය නිවන කරා යන සුළු වේ නම්, මොක්ෂය ද අත්‍යන්තසුඛ වේ නම්, ඒ සත්‍යවචනය කරණ කොට ගෙණ මාගේ ගමන සමෘද්ධ වේවා.

5754. ඉදින් ආයුෂ්මත් සඞ්ඝ තෙමේ තරණය කරණ ලද භවකාන්තාරය ඇත්තේ වේ ද, නිරුත්තර වූ පුණ්‍යක්ෂෙත්‍රය වේ ද, ඒ සත්‍යවචනය කරණ කොට ගෙන මාගේ ගමන සමෘද්ධ වේවා යි සත්‍යක්‍රියා කෙළෙමි.

5755. මේ උතුම් වූ සත්‍යක්‍රියාව කළ කෙණෙහි මාගීයෙන් ජලය ඉවත් විය. ඉක්බිති සුවසේ (ගඟින්) එතෙර වූයෙමි මනරම් වූ ගඞ්ගා තීරයෙහි-

5756-5757. උදාවන හිරු වැනි, දිලිසෙන හිමාලයපර්වතය වැනි, බබලන ප්‍රදීපවෘක්ෂයක් වැනි වූ, තරු සහිත වූ සඳු මෙන් ශ්‍රාවකයන් විසින් පිරිවරන ලද, එකල්හි වර්ෂා කරණ මේඝයක් මෙන් දෙශනා ජලදායක වූ වැඩහුන් බුදුරජුන් දිටිමි.

5758. මම ඇමතියන් සහිතව (බුදුරජුන්) වැඳ එකත් පසෙක හුනිමි. ඉක්බිති බුදුරජ තෙමේ අපගේ අදහස් දැන දහම් දෙසී ය.

5759. අපි නිර්මල වූ ධර්මය අසා බුදුරජුන්හට මෙසේ කීමු. "මහා-වීරයන් වහන්ස අපි භවයෙහි කලකිරුනෝ වෙමු. පැවිදි කරවනු මැනවැ" යි.

5760. "මහණෙනි, ධර්මය (මැනවින් දෙසනලද බැවින්) ස්වාඛ්‍යාතය. තොපගේ දුක් කෙළවර කිරීම පිණිස බඹසර හැසිරෙව්"යි (විපස්සී බුදුරජුන් පටන් මේ බුදුරජුන් තෙක් ගිණීමෙන්) සත්වැනි වූ (ගෞතම) මුනිතෙම වදාළේ ය.

5761. එම වචනය හා සමග ම අපි සියල්ලෝ භික්ෂුවෙශ ධරන්නමෝ සසුනෙහි උපසපන් වූ සෝවන් වූ පැවිද්දෝ වූමු.

5762. ඉක්බිති බුදුරජතෙම දෙව්රම් වෙහෙරට ගොස් අනුශාසනා කෙළේ ය. බුදුරජුන් විසින් අනුශාසනා කරණලද මම රහත්බවට පැමිණියෙමි.

5763. ඉක්බිති (මාගේ පිරිවර වූ) ඒ භික්ෂූන් දහසට මම අනු-ශාසනා කෙළෙමි. එකල්හි මාගේ අනුශාසනය කරන්නා වූ ඔහුදු ආස්‍රව රහිතයෝ (රහත්හු) වූහු.

5764. එම ගුණයෙහි සතුටු වූ බුදුරජහු මහාජනයා ඉදිරියෙහි කප්පින තෙමේ භික්ෂූනට ඔවා දෙන්නවුන් අතුරෙන් අග්‍රය යි මා එතදග්‍ර-ස්ථානයෙහි තැබූහ.

5765. මෙයින් සියදහස් වන කපෙහි මා විසින් කරණලද කර්මය මෙහි දී විපාක දැක්වී ය. (දුන්නෙන්) මැනවින් මිදුනු හීවෙගයක් මෙන් (එම කර්මඵලය) මාගේ කෙළෙසුන් දැවී ය.

5766. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො ච බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5767. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5768. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා මහාකප්පිනො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

මහාකප්පිනත්ථෙරස්ස අපදානං තතියං.

534. දබ්බත්ථෙරාපදානං

5769. පදුමුත්තරො නාම ජිනො සබ්බලොකවිදූ මුනි,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි චක්ඛුමා.

5770. ඔවාදකො විඤ්ඤාපකො තාරකො සබ්බපාණිනං,
දෙසනාකුසලො බුද්ධො තාරෙසි ජනතං බහුං.

5711. අනුකම්පකො කාරුණිකො හිතෙසී සබ්බපාණිනං,
සම්පත්තෙ තිත්ථියෙ සබ්බෙ පඤ්චසීලෙ පතිට්ඨපි[1]

5772. එවං නිරාකුලං ආසි සුඤ්ඤතං[2] තිත්ථියෙහි ච,
විචිත්තං අරහන්තෙහි වසීභූතෙහි තාදිහි.

5773. රතනානට්ඨපඤ්ඤාස[3] උග්ගතො සො මහාමුනි,
කඤ්චනග්ඝියසඞ්කාසො බත්තිංසවරලක්ඛණො.

5774 වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ,
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

5775. තදාහං හංසවතියං සෙට්ඨිපුත්තො මහායසො,
උපෙත්වා ලොකපජ්ජොතං අස්සොසිං ධම්මදෙසනං.

5776. සෙනාසනානි භික්ඛූනං පඤ්ඤපෙන්තං සසාවකං,
කිත්තයන්තස්ස වචනං සුණිත්වා මුදිතො අහං.

5777. අධිකාරං සසඞ්ඝස්ස කත්වා තස්ස මහෙසිනො,
නිපච්ච සිරසා පාදෙ තං ඨානමභිපත්ථයිං.

---

1. පතිට්ඨසි, සයා.
2. සුඤ්ඤකං සයා.
3. පඤ්ඤාසං, මජසං.

5766. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

5767. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

5768. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් මහාකප්පින ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

මහාකප්පිනස්ථවිරාපදානය නොවැනියි.

534. දබ්බස්ථවිරාපදානය

5769. මෙයින් සියක් දහස්වන කපෙහි පසැස් ඇත්තා වූ සව්ලෝ දත්, පස්මරුන් දිනූ පදුමුත්තර නම් මුනීන්ද්‍රයන් වහන්සේ උපන් සේක.

5770. සව්සත්නට ඔවා දෙන්නා වූ දහම් අවබොධ කරවන්නා වූ (ඔවුන් සසරින්) එතෙර කරන්නා වූ දෙශනාවෙහි දක්‍ෂ වූ බුදුරජාණන් වහන්සේ බොහෝ ජනසමූහයා (සසරින්) තැරූවූසේක.

5771. සව්සත්නට අනුකම්පා කරන්නා වූ කාරුණික වූ හිත කැමති (බුදුරජ) වෙත පැමිණි සියලු තීර්ථකයන් පන්සිල්හි පිහිට වූ සේක.

5772. එකල මෙසේ තීර්ථකයන්ගෙන් හිස් වූයේ නිරවුල් වූයේ (සස්න) තාදීගුණ ඇති වශීභූත වූ රහතුන්ගෙන් විසිතුරු වී ය.

5773. එමුනි රජ තෙමේ අටපණස්රියන් උස් වූයේ රන් ඇගෑයක් මෙන් බබලන්නේ ය. දෙතිස්මහපුරිස් ලකුණු ඇත්තේ ය.

5774 එකල්හි (සත්නට) වර්ෂලක්‍ෂයක් ආයු වෙයි. ඒතාක් වැඩහුන් ඒ සර්වඥතෙම බොහෝ ජනසමූහයා සසරින් එතර කෙළේ ය.

5775. එකල්හි මම හංසවතී නගරයෙහි මහත් යශස් ඇති සිටු පුත්‍රයෙක් වූයෙමි ලෝපහන් වූ බුදුරජුන් වෙත එළඹ දම්දෙසුම් ඇසීමි.

5776. භික්‍ෂූනට සෙනසුන් පනවන්නා වූ සිය සව්වකු පසසන උන්වහන්සේගේ වචනය අසා සතුටු වූ මම –

5777. සඞ්ඝයා සහිත වූ ඒ බුදුරජුන්හට (දන්දීම් ආදි) අධිකාර කොට (උන්වහන්සේගේ) පාමුල සිරසින් වැටී එම තනතුර පැතීමි.

5778. තදා හාසි[1] මහාවීරො මම කම්මං පකිත්තයං,
යො සඞ්ඝමභොජෙසි සත්තාහං ලොකනායකං.

5779. සොයං කමලපත්තක්ඛො සීහංසො කනකත්තචො,
මම පාදමූලෙ නිපති[2] පත්ථයං ඨානමුත්තමං.

5780. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන[3] සත්ථා ලොකෙ භවිස්සති.

5781. සාවකො තස්ස බුද්ධස්ස දබ්බො නාමෙන විස්සුතො,
සෙනාසනපඤ්ඤාපකො අග්ගො හෙස්සති'යං[4] තදා.

5782. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

5783. සතානං තීණික්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං,
සතානං පඤ්චක්ඛත්තුඤ්ච චක්කවත්ති අහොසහං.

5784. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං,
සබ්බත්ථ සුඛිතො ආසිං තස්ස කම්මස්ස වාහසා.

5785. එකනවුතෙ ඉතො කප්පෙ විපස්සී නාම නායකො,
උප්පජ්ජි චාරුනයනො[5] සබ්බධම්මවිපස්සකො.

5786. දුට්ඨචිත්තො උපවදිං සාවකං තස්ස තාදිනො,
සබ්බාසවපරික්ඛීණං සුද්ධොති ච විජානිය.

5787. තස්සෙව නරවීරස්ස සාවකානං මහෙසිනං,
සලාකං පග්ගහෙත්වාන[6] ඛීරොදනමදාසහං.

5788. ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො,
කස්සපො නාම නාමෙන උප්පජ්ජි වදතං වරො.

5789. සාසනං ජොතයිත්වා සො අභිභුය්‍ය කුතිත්ථියෙ,
වෙනෙය්‍යෙ[7] විනයිත්වාන නිබ්බුතො සො සසාවකො.

5790. සසිස්සෙ නිබ්බුතෙ නාථෙ අත්ථමෙන්තම්හි[8] සාසනෙ,
දෙවා කන්දිංසු සංවිග්ගා මුත්තකෙසා රුදම්මුඛා.

1. තදාහාස, සීමු. මජ්සං. 2. පතිතො, PTS. 3. ගොත්තෙන, මජ්සං.
4. හෙස්සතයං, සීමු. 5. චාරුදස්සනො, මජ්සං.
6. සලාකඤ්ච ගහෙත්වාන, මජ්සං. 7. විනෙය්‍යෙ, මජ්සං.
8. අත්ථඞ්ගතම්හි, ථෙරගාථාට්ඨකථා.

5778. එකල්හි මහාවීර වූ බුදුරජතෙමේ මාගේ පුණ්‍යකර්මය පසසමින් මෙසේ කීය. "යමෙක් සඞ්ඝයා සහිත බුද්ධරජුන් සතියක් වැළඳ වී ද,

5779. (හෙළ) පියුම්පත් බඳු ඇස් ඇති, සීහාංස (සිංහයකුගේ මෙන් පිරුණු උරහිස්) ඇති, රන්වන් වූ සිවි ඇති ඒ මේ සිටුපුත්තෙම උතුම් තනතුරක් පතමින් මාගේ පාමුල වැටුනේ ද,

5780. මෙයින් සියක් දහස්වන කපින් මතුයෙහි ඔක්කාකකුලයෙහි උපදනා වූ නමින් ගෞතම නම් වූ බුදුරජතෙමේ ලොව පහළවන්නේ ය.

5781. එකල්හි මෙතෙම එම බුදුරජුන්ගේ දඹබ නමින් ප්‍රසිද්ධ වූ, සෙනසුන් පනවන අගසව් වන්නේ ය" කියා යි.

5782. මැනවින් කරණලද ඒ කර්මයෙන් ද, චිත්තප්‍රණිධියෙන් ද මම මිනිස් සිරුර හැර තව්තිසාවට (උත්පත්තිවශයෙන්) ගියෙමි.

5783. මම තෙසිය වරක් දිව්‍යරාජ්‍යය කරවීමි. පන්සිය වරක් සක්විති රජ වීමි.

5784. (කරනලද) මහත් ප්‍රදෙශරාජ්‍යය ගණනින් ගිණිය නොහේ. එම කර්මයාගේ බලයෙන් හැමතන්හි සුව ඇත්තෙම් වීමි.

5785. මෙයින් යට එක් අනූවන කපෙහි, මනොඥ ඇස් ඇති සියලු ධර්මයන් මැනැවින් දක්නා වූ විපස්සී නම් බුදුරජතෙම ලොව පහලවිය.

5786. තාදිගුණ ඇති ඒ බුදුරජුන්ගේ සියලු ආශ්‍රවයන් ක්‍ෂය කළ ශ්‍රාවකයකුට 'ශුද්ධයෙකැ'යි දැන ම දුෂ්ටසිත් ඇත්තෙම් නින්දා කෙළෙමි.

5787. මම තරවීර වූ එම බුදුරජුන්ගේ ම මහර්ෂි (-රහත්) සව්වනට සලාකයක් ගෙණ කිරිබතක් දුනිමි.

5788. මේ භද්‍රකල්පයෙහි බ්‍රහ්මබන්ධු (බ්‍රාහ්මණ කුලයෙහි) වූ මහත් යශස් ඇති වාදීන් අතුරෙන් ශ්‍රෙෂ්ඨ වූ නමින් කාශ්‍යප නම් වූ බුදුරජ-තෙමේ ලොව පහල විය.

5789. ශ්‍රාවකයන් සහිත වූ උන්වහන්සේ මිසදිටුතීර්ථකයන් මැඩ සපුන බබුලුවා වෛනෙය (-හික්මවියයුතු) ජනයන් හික්මවා පිරිනිවන් පෑ සේක.

5790. බුදුරජහු ද ශිෂ්‍යයන් ද පිරිනිවි පසු සපුන අසනයට (පිරිහීමට) යන කල්හි සංවෙගයට පත් දෙවියෝ මුදුලු කෙස් ඇත්තාහු, වලප්නා මුහුනු ඇත්තාහු හැඬූහ:

5791. "නිබ්බායිස්සති ධම්මක්ඛා න පස්සිස්සාම සුබ්බතෙ,
න සුණිස්සාම සද්ධම්මං අහො නො අප්පපුඤ්ඤතා."

5792. තදායං පඨවී[1] සබ්බා අචලා සාචලා' චලී[2],
සාගරො ච සසොකොව විනදී කරුණං ගිරං.

5793. චතුද්දිසා දුන්දුභියො නාදයිංසු අමානුසා,
සමන්තතො අසනියො ඵලිංසු[3] ච භයාවහා.

5794. උක්කා පතිංසු නභසා ධූමකෙතු ච' දිස්සථ,[4]
සබ්බත්ථලජසත්තා ච[5] රවිංසු කරුණං මිගා.

5795. උප්පාතෙ[6] දාරුණෙ දිස්වා සාසනත්ථඞ්ගමසූචකෙ,
සංවිග්ගා භික්ඛවො සත්ත චින්තයිම්හ මයං තදා.

5796. සාසනෙන විනාම්හාකං ජීවිතෙන අලං මයං,
පවිසිත්වා මහාරඤ්ඤං යුඤ්ජාම ජිනසාසනෙ[7].

5797. අද්දසුම්හ[8] තදාරඤ්ඤෙ උබ්බිද්ධං සෙලමුත්තමං,
නිස්සෙණියා තමාරුය්හ නිස්සෙණිං පාතයිම්හසෙ.

5798. තදා ඔවදි නො ථෙරො බුද්ධුප්පාදො සුදුල්ලභො,
සද්ධා ච දුල්ලභා[9] ලද්ධා ථොකං සෙසඤ්ච[10] සාසනං.

5799. නිපතන්ති ඛණාතීතා අනන්තෙ දුක්ඛසාගරෙ,
තස්මා පයොගො කත්තබ්බො යාව ඨාති මුනෙ මතං.[11]

5800. අරහා ආසි සො ථෙරො අනාගාමී තදානුගො,
සුසීලා ඉතරෙ යුත්තා දෙවලොකං අගම්හසෙ.

5801. නිබ්බුතො තිණ්ණසංසාරො සුද්ධාවාසෙ ච එකකො,
අහං ච පුක්කුසාතී ච සභියො බාහියො තථා.

5802. කුමාරකස්සපො චෙව තත්ථ තත්ථූපගා මයං,
සංසාරබන්ධනා මුත්තා ගොතමෙනානුකම්පිතා.

5803. මල්ලෙසු කුසිනාරායං ජාතො ගබ්භෙව මෙ සතො,
මතා මාතා චිතාරූළ්හා තතො නිප්පතිතො අහං.

5804. පතිතො දබ්බපුඤ්ජම්හි තතො දබ්බොති විස්සුතො,
බ්‍රහ්මචාරීබලෙනාහං විමුත්තො සත්තවස්සිකො.

---

1. පඨවි, මජ්සං. 2. චලාචලා, මජ්සං. පුලාපුලී, ස්‍යා. 3. පතිංසු, සීමු.
4. දිස්සති, මජ්සං. 5. සධූමා ජාලවට්ටා ච, මජ්සං. 6. උප්පාදෙ, මජ්සං.
7. සාසනං, මජ්සං. 8. අද්දසම්හ, මජ්සං. සීමු. 9. සද්ධාති දුල්ලභා, මජ්සං.
10. ථොකසෙසඤ්චි, සීමු. 11. යාව තිට්ඨති සාසනං, ස්‍යා. ථෙරගාථට්ඨකථා
12. පක්කුසාති ච, මජ්සං.

5791 "දහම් ඇස නිවී යන්නේ ය. මිනාවුන ඇති (ශ්‍රාවක) යන් නො දක්නෙමු. සදහම් නො අසන්නෙමු. අහෝ! අපගේ පින් මඳ බව යි".

5792. එකල්හි මේ නිශ්චල වූ සියලු පෘථිවි තොමෝ සසල ව කම්පා වූවා ය. සයුර ද සොක සහිත වූවකු මෙන් දුක් හඬින් හැඬී ය.

5793. සිවුදිගෙහි වූ දිව්‍ය හෙරීහු නාද කළහ. හාත්පස භයජනක වූ අසනීහු (-හෙණ) පුපුළහ.

5794. අහසින් උල්කා හිත. ධූමකෙතුහු ද පැණුනාහ. ගොඩ උපදින සියලු සත්ත්වයෝ ද මෘගයෝ ද බැගෑ හඬ හැඬූහ.

5795. සස්න බැසයනු හඟවන දරුණු උත්පාත (-භූතවිකාරයන්) දැක සංවිග්න (සැලුනා) වූ අපි භික්ෂූහු සත්නමක් එකල මෙසේ සිතුම්හ:

5796. "සසුනෙන් තොර වූ අපගේ ජීවිතයෙන් කම් නැත. අපි මහ වනයට පිවිස බුදුසසුනෙහි යෙදෙමු" ය (කියා යි).

5797. එකල්හි අරණෙහි උස් වූ උතුම් පර්වතයක් දුටිමු. හිණිමගකින් ඒ පර්වතයට නැගී හිණිමග බිම හෙළීමු.

5798. එකල්හි සඞ්ඝස්ථවිරතෙමේ අපට අවවාද කෙළේ ය: බුද්ධෝත්පාදය අතිශයින් දුර්ලභය. දුර්ලභ වූ ශ්‍රද්ධා ද ලබන ලදී. සස්න ද ස්වල්පයක් ශෙෂව ඇත.

5799. අෂ්ටදුෂ්ටක්ෂණවිනිර්මුක්ත මේ උතුම් මොහොත ඉක්මවූවෝ අනන්ත වූ දුක් සයුරෙහි වැටෙත්. එහෙයින් සම්බුද්ධමතය (-බුදු සසුන) පවතිත් ම එහි යොග කළයුතුයි.

5800. ඒ (ඔවා දුන්) සඞ්විර තෙමේ රහත් විය. උත්වහන්සේ අනුව ගිය (දෙවැන්නා) අනාගාමී විය. එහි යෙදුනු සෙසු සිල්වත් වූ අපි (ඉන් සැව) දෙව්ලොව ගියෙමු.

5801 – 5802. (අනාගාමී වූ භික්ෂුතෙම) හුදකලාව ශුද්ධාවාසයෙහි තිණු සසර ඇත්තේ (රහත්ව) පිරිනිවියේ ය. මම ද පුක්කුසාති ද එසේ ම සභිය ද බාහිය ද කුමාරකස්සප දූයි අපි ඒ ඒ තන්හි උත්පත්ති වශයෙන් ගියාහු ගෞතම බුදුරජුන් විසින් අනුකම්පා කරණලද්දහු සසරබැඳුමෙන් මිදුනෝ වීමු.

5803. මම මල්ල රට කුසිනාරායෙහි උපන්මි. මා ගැබැවත් ම මවු මළා ය. ඈ චිතකයට නංවන ලදු. එයින් මම ගිලිහී වැටුනෙමි.

5804. කුසතණ පඳුරෙක්හි වැටුනෙමි ඒ හෙතුවෙන් දබ්බ යයි ප්‍රකට වීමි. බඹසැරිබලයෙන් මම සත්හැවිරිදි වූයෙමි (සසරින්) මිදුනෙමි.

5805. ඛීරොදනප්ඵලෙනාහං පඤ්චඞ්ගෙහුපාගතො,
ඛීණාසවොපවාදෙන පාපෙහි බහුචොදිතො.

5806. උභො පුඤ්ඤඤ්ච පාපඤ්ච වීතිවත්තොම්හි' දානහං,[1]
පත්වාන පරමං සන්තිං විහරාමි අනාසවො.

5807. සෙනාසනං පඤ්ඤපෙසිං හාසයිත්වාන සුබ්බතෙ,
ජිනො තස්මිං ගුණෙ තුට්ඨො එතදග්ගෙ ඨපෙසි මං.

5808. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5809. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5810. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං

ඉත්ථං සුදං ආයස්මා **දබ්බො මල්ලපුත්තො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

දබ්බමල්ලපුත්තත්ථෙරස්ස අපදානං චතුත්ථං.

535. කුමාරකස්සපත්ථෙරාපදානං

5811. ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො,
සබ්බලොකහිතො වීරො **පදුමුත්තර**නාමකො.

5812. තදාහං බ්‍රාහ්මණො හුත්වා විස්සුතො වෙදපාරගූ,
දිවාවිහාරං විචරං අද්දසං ලොකනායකං.

5813. චතුසච්චං පකාසෙන්තං බොධයන්තං සදෙවකං,
විචිත්තකථිකානග්ගං වණ්ණයන්තං මහාජනෙ.

5814. තදා මුදිතචිත්තොහං නිමන්තෙත්වා තථාගතං,
නානාරත්තෙහි වත්ථෙහි අලඞ්කත්වාන මණ්ඩපං.

5815. නානාරතනපජ්ජොතං සසඞ්ඝං භොජයිං තහිං,
භොජයිත්වාන සත්තාහං නානග්ගරසභොජනං.

5816. නානාවණ්ණෙහි[2] පුප්ඵෙහි පූජයිත්වා සසාවකං,
නිපච්ච පාදමූලම්හි තං ඨානං පත්ථයිං අහං.

1. දානිහං, මජ්ඣං. 2. නානාචිත්තෙහි, මජ්ඣං.

5805. මම කිරිබත් දන්දීමේ විපාකයෙන් (ආයු - වර්ණ - සැප - බල - ප්‍රඥා යන) අඞ්ග පසකින් යුක්ත වූයෙමි. රහතුන් වහන්සේ කෙනකුන්ට නින්දා කිරීම හේතුකොට ගෙණ බොහෝ පාපීන් විසින් චෝදිත වූයෙමි.

5806. දැන් මම පින් ද පව් ද දෙක ම ඉක්ම වූයෙම් වෙමි. ආස්‍රව රහිත වූයෙම් පරමශාන්තියට පැමිණ වෙසෙමි.

5807. මනා ව්‍රත ඇති භික්ෂූන් තුටු කොට සෙනසුන් පැණවීමි. ඒ ගුණයෙහි තුටු වූ බුදුරජහු මා (සෙනසුන් පණවන භික්ෂූන් අතුරෙන් අග්‍රයයි) එතදග්‍රස්ථානයෙහි තැබූ සේක.

5808. මා විසින් කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

5809. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදි.

5810. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් දබ්බමල්ලපුත්ත ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

දබ්බමල්ලපුත්ත ස්ථවිරාපදානය සිවුවැනියි.

535. කුමාරකස්සපස්ථවිරාපදානය

5811. මෙයින් ලක්ෂයක් වන කල්පෙහි සියලු ලොවට හිත වූ වීර වූ පදුමුත්තර නම් ලොකනායක (-බුදුරජ) තෙමේ ලොව පහළ විය.

5812 - 5813. එකල්හි මම වේදයෙහි පරතෙරට ගිය බමුණෙක් ව ප්‍රකට වූයෙමි දිවාවිහරණය කරතෙම් සිවුසස් දෙසන්නා වූ දෙවියන් සහිත ලොකයාට දහම් අවබොධ කරවන්නා වූ මහජනයා ඉදිරියෙහි විචිත්‍ර කථික යනට අගතැන්පත් සව්වකු වර්ණනය කරන්නා වූ ලොකනායකයන් වහන්සේ දිටිමි.

5814 - 5815. එකල්හි ප්‍රමුදිත සිත් ඇති මම තථාගතයන් වහන්සේ පවරා නත්රුවනින් බබලන මඩුවක් නොයෙක් පැහැයෙන් රඳු වතින් සරසා එහි සඞ්ඝයා සහිත බුදුරජුන් වැළඳවීමි. සතියක් මුළුල්ලෙහි නොයෙක් අගරස බොජුනෙන් වළඳවා -

5816. නත්වත් මලින් ශ්‍රාවකසඞ්ඝයා සහිත බුදුරජුන් පුදා පාමුල වැද හෙව මම එම තනතුර පැතීමි.

5817. තදා මුනිවරො ආහ කරුණෙකරසාසයො,[1]
පස්සෙතං දිජවරං පදුමානතලොචනං.

5818. පීතිපාමොජ්ජබහුලං සමුග්ගතතනූරුහං,
හාසාභිතවිසාලක්ඛං[2] මම සාසනලාලසං.

5119. මම පාදමූලෙ පතිතං[3] එකාවත්ත සුමානසං,
එස පත්ථෙති තං ඨානං විචිත්තකථිකත්තනං[4].

5820. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

5821. තස්ස ධම්මෙසු දායාදෙ ඔරසො ධම්මනිම්මිතො,
කුමාරකස්සපො නාම හෙස්සති සත්ථුසාවකො.

5822. විචිත්තපුප්ඵදුස්සානං රතනානං ච වාහසා,
විචිත්තකථිකානං සො අග්ගතං පාපුණිස්සති.

5823. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

5824. පරිබ්භමං භවාකාසෙ[5] රඞ්ගමජ්ඣෙ නටො යථා,[6]
සාඛාමිගත්‍රජො හුත්වා මිගියා කුච්ඡිමොක්කමිං.

5825. තදා මයි කුච්ඡිගතෙ වජ්ඣවාරෙ උපට්ඨිතෙ,
සාඛෙන චත්තා මෙ මාතා නිග්‍රොධං සරණං ගතා.

5826. තෙන සා මිගරාජෙන මරණා පරිමොචිතා,
පරිච්චජිත්වා සං පාණං[7] මමෙවං ඔවදී තදා.

5827. නිග්‍රොධමෙව සෙවෙය්‍ය න සාඛමුපසංවසෙ,
නිග්‍රොධස්මිං මතං සෙය්‍යො යං චෙ සාඛමහි[8] ජීවිතං.

5828. තෙනානුසිට්ඨො[9] මිගයූථපෙන අහං ච මාතා ච තථෙතරෙ ච,
ආගම්ම රම්මං තුසිතාධිවාසං ගතා පවාසං සඝරං යථෙව.

5829. පුනො කස්සපවීරස්ස අත්ථමෙන්තම්හි සාසනෙ,
ආරුය්හ සෙලසිඛරං යුඤ්ජිත්වා ජිනසාසනං.

---

1. කරුණාකරුණාලයො, සං. කාරුණාකරසාසයො, ථෙරගාථට්ඨකථා.
2. හාසම්භිතවිසාලක්ඛං, මජ්සං. සීමු. හාසාභිකං, ථෙරගාථට්ඨකථා
3. පතිතං පාදමූලෙ මෙ, මජ්සං. 4. විචිත්තකථිකත්ථදං, සීමු. 5. භවාභවෙ, මජ්සං.
6. රඞ්ගමජ්ඣෙ යථා නටො, ථෙරගාථට්ඨකථා, රඞ්ගමජ්ඣිතානටො යථා, සීමු. මජ්සං.
7. සපාණං, මජ්සං. 8. සාඛෑමි, මජ්සං. 9. තෙනානුසිට්ඨා, මජ්සං.

5817 – 5818 – 5819. එකල්හි කරුණා රසයට එක ම නිධාන වූ බුදුරජතෙම (මෙසේ) වදාළේ ය: ''පිලුම්කට බඳු මුහුණු හා ඇස් ඇත්තා වූ ප්‍රීතිප්‍රාමෝද්‍ය බහුල වූ (එසින්) නැගුනු ලොම් ඇති, හර්ෂයෙන් දැල්වුනු විශාල ඇස් ඇති, මාගේ සසුනෙහි ඇලුම් ඇති, මාගේ පාමුල වැටුනා වූ, එක ම අරමුණට හැරුනු මනා සිත් ඇති මේ බමුණහු බලවු. මෙතෙම විචිත්‍රකථිකත්වය වූ ඒ මේ තනතුර පතයි.

5820. මෙයින් සියක්දහස් වන කපෙහි ඔක්කාක කුලයෙහි උපත ලබන ගොත්‍රයෙන් ගෞතම නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

5821. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනි වූ ඖරසපුත්‍ර වූ කුමාරකාශ්‍යප නම් ශාස්තෘශ්‍රාවකයෙක් වන්නේ ය.

5822. (පුදනලද) විචිත්‍ර පුෂ්පවස්ත්‍රයන්ගේ ද, රත්නයන්ගේ ද බලයෙන් නෙතෙම විචිත්‍රකථික භික්ෂූන් අතුරෙන් අග්‍ර බවට පැමිණෙන්නේ ය'' (කියායි.)

5823. මම මැනැවින් කරණලද ඒ කර්මය හේතුකොට ගෙණ ද චිත්ත ප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද මිනිස්සිරුර හැර තව්තිසාවට උත්පත්ති වශයෙන් ගියෙමි.

5824. රඟ මැද නළුවකු මෙන් භව නමැති අහසෙහි පරිභ්‍රමණය කරමින් ශාඛා නම් මුවාගේ පුත්‍ර ව මුවදෙනගේ කුස පිළිසඳ ගතිමි.

5825. එසඳ මා කුස පිළිසඳගත් කල්හි (මවගේ) මරණයට වාරය එළඹ සිටියේ ය. ශාඛාමුවා විසින් අත්හල මාගේ මව්තොමෝ න්‍යග්‍රොධ මුවරජු පිහිට කොට ගියා ය.

5826. එකල්හි ඒ න්‍යග්‍රොධ මුවරජු විසින් සවකීය ප්‍රාණය පරිත්‍යාග කොට මරණයෙන් මුදා ලූ ඕ තොමෝ මට මෙසේ අවවාද කළා ය:

5827. ''න්‍යග්‍රොධ මුවරජු ම සෙවනය කරව, ශාඛා මුවා සමග වාස නො කරව. න්‍යග්‍රොධ කෙරෙහි වැස මිය යෑම ශාඛා වෙත වැවෙත ජීවිතයට වඩා උතුම් ය''.

5828. ඒ න්‍යග්‍රොධ මුවරජු විසින් අනුශාසනය කරණලද මම ද, මව් ද එසේ ම සෙස්සෝ ද, දුරරටක සිටියකු සියගෙට එන්නාක් මෙන් රම්‍ය වූ තුෂිතදෙව්ලොව විසුමට ගියෝ වෙමු.

5829. යළි කාශ්‍යප බුදුරජුන්ගේ සසුන පිරිහී යන කල්හි ගලක් මුදුනට නැගී ජිනසාසනයෙහි ප්‍රතිපත්තීන් යෙදී–

5830. ඉදානහං[1] රාජගහෙ ජාතො සෙට්ඨිකුලෙ අහු,[2]
ආපන්නසත්තා[3] මෙ මාතා පබ්බජි අනගාරියං.

5831. සගබ්භං තං විදිත්වාන දෙවදත්තමුපානයුං,
සො අවොච විනාසෙථ පාපිකං භික්ඛුනිං ඉමං.

5832. ඉදානිපි මුනින්දෙන ජිනෙන අනුකම්පිතා,
සුඛිනී අජ්ජ මය්හං මාතා භික්ඛුනුපස්සයෙ.

5833. තං විදිත්වා මහීපාලො කොසලො මං අපොසයි,
කුමාරපරිහාරෙන නාමෙනාහඤ්ච කස්සපො.

5834. මහාකස්සපමාගම්ම අහං කුමාරකස්සපො,
වම්මිකසදිසං කායං සුත්වා බුද්ධෙන දෙසිතං.

5835. තතො චිත්තං විමුච්චි මෙ අනුපාදාය සබ්බසො,
පායාසිං දමයිත්වාහං එතදග්ගං අපාපුණිං.

5836. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5837. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5838. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා කුමාරකස්සපො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

කුමාරකස්සපත්ථෙරස්ස අපදානං පඤ්චමං.

චතුවීසතිමං භාණවාරං.

536. බාහියත්ථෙරාපදානං

5839. ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො,
මහප්පභො තිලොකග්ගො නාමෙන පදුමුත්තරො.

5840. ඛිප්පාභිඤ්ඤස්ස භික්ඛුස්ස ගුණං කිත්තයතො මුනෙ,
සුත්වා උදග්ගචිත්තොහං කාරං කත්වා මහෙසිනො-

1. ඉදානාහං මජ්ඣං. 2. අහුං, මජ්ඣං. 3. ආපන්නගබ්භා, සීමු.

5830. දූන් මම රජගහනුවර සිටුකුලයක උපනෙම් වෙමි. ගැබිනි වූ (එ බැව් නො දත්) මාගේ මව් තෙමෝ අනගාරික සඞ්ඛ්‍යාත පැවිද්දට පැමිණියා ය.

5831. ගැබ් සහිත බව දූන (භික්ෂුණීහු) ඇය දෙව්දත් තෙරුන් වෙත පැමිණවූහ. ඒ දෙව්දත් තෙමේ "මෙ පව්ටු භික්ෂුණිය (සිවුරු හැරවීමෙන්) නසවුයි කී ය.

5832. දූනුදු මුනීන්ද්‍ර වූ බුදුරජුන් විසින් අනුකම්පා කරණලද මාගේ මවු තොමෝ සුඛිත වූවා භික්ෂුණී ආශ්‍රමයෙහි මා ප්‍රසූත කළා ය.

5833. කොසොල් රජ තෙමේ එය දූන මා කුමරපෙරහරින් පෝෂණය කළේ ය. මම නමින් කාශ්‍යප නම් වූයෙමි.

5834 මහාකාශ්‍යප තෙරුන් නිසා මම කුමාරකාශ්‍යප ය යි ප්‍රසිද්ධ වීමි. කය තුඹසකට සම කොට බුදුරජුන් විසින් දෙසන ලද්ද (වම්මික-සූත්‍රය) අසා-

5835. එයින් මාගේ සිත උපාදාන රහිත ව හැම ලෙසින් ආස්‍රවයන් කෙරෙන් මිදුනේ ය. මම පායාසි (රජු) දමනය කොට (චිත්‍රකථික භික්ෂුන් අතුරෙන්) එතදග්‍රස්ථානයට පැමිණියෙමි.

5836 මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැදුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

5837. බුදුරජානන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

5838. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී

මෙසෙයින් ආයුෂ්මත් කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාල සේක.

කුමාරකාශ්‍යපස්ථවිරාවදානය පස්වැනියි.

සූවිසි වැනි බණවරයි.

536. බාහියස්ථවිරාවදානය

5839. මෙයින් සියක්දහස් වන කපෙහි මහත් ප්‍රභා ඇති, තිලොවට අග්‍ර වූ නමින් පදුමුත්තර නම් බුදුරජතෙම ලොව පහළ විය.

5840. (එකෙණෙහි දහම් අවබොධ කළ බැවින්) ක්ෂිප්‍රාභිඥ වූ භික්ෂුනමකගේ ගුණය පසසන බුදුරජුන්ගේ (දෙශනාව) අසා ඔද වැඩි සිත් ඇති මම මහර්ෂි වූ එ බුදුරජුන්හට අධිකාර කොට. -

5841. දත්වා සත්තාහිකං දානං සසිස්සස්ස මුනෙ අහං,
අභිවාදිය සම්බුද්ධං තං ඨානං පත්ථයිං තදා.

5842. තතො මං ව්‍යාකරී[1] බුද්ධො එතං පස්සථ බ්‍රාහ්මණං,
පතිතං පාදමූලෙ මෙ පසන්නනයනානනං[2].

5843. හෙමයඤ්ඤුපවීතඞ්ගං අවදාතතනුත්තචං,
පලම්බබිම්බතම්බොට්ඨං සිතතිණ්හසමං ද්විජං[3]

5844. ගුණත්ථම්බහුතරං[4] සමුග්ගතතනූරුහං,
ගුණොඝායතනීභූතං පීතිසම්ඵුල්ලිතානනං

5845. එසො පත්ථයතෙ ඨානං ඛිප්පාභිඤ්ඤස්ස භික්ඛුනො,
අනාගතෙ මහාවීරො ගොතමො නාම හෙස්සති.

5846. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
බාහියො නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො.

5847. තදාභිතුට්ඨො[5] වුට්ඨාය යාවජීවං මහාමුනෙ,
කාරං කත්වා චුතො සග්ගං අගං සභවනං යථා.

5848. දෙවභූතො මනුස්සො වා සුඛිතො තස්ස කම්මුනො,
වාහසා සංසරිත්වාන සම්පත්තිං අනුභොසහං[6].

5849. පුතො[7] කස්සප වීරස්ස අත්ථමෙතම්හි සාසනෙ,
ආරුය්හ සෙලසිඛරං යුඤ්ජිත්වා ජිනසාසනං.

5850. විසුද්ධසීලා සප්පඤ්ඤා ජිනසාසනකාරකා,
තතො චුතා පඤ්චජනා දෙවලොකං අගම්හසෙ.

5851. තතොහං බාහියො ජාතො භාරුකච්ඡෙ පුරුත්තමෙ,
තතො නාවාය පක්ඛන්තො[8] සාගරං අප්පසිද්ධියං.[9]

5852. තතො නාවා අභිජ්ජිත්ථ ගන්ත්වාන කතිපාහකං,
තදා භිංසනකෙ[10] ඝොරෙ පතිතො මකරාකරෙ.

5853. තදාහං වායමිත්වාන සන්තරිත්වා මහොදධිං.
සුප්පාර[11]පට්ටනවරං සම්පත්තො මන්දමෙධිකො.[12]

5854. දාරුචීරං නිවාසෙත්වා ගාමං පිණ්ඩාය පාවිසිං,
තදාහ සො ජනො තුට්ඨො අරහායමිධාගතො.

1. ඛ්‍යාකරි, මජ්සං. 2. චරියං පච්චවෙක්ඛණං, මජ්සං.
3. සෙතතිණ්හසමං දිජං, මජ්සං. 4. ගුණථාමබහුතරං, මජ්සං.
5. තදාභිතුට්ඨො, මජ්සං. 6. අනුභොමහං, මජ්සං. 7. පුත, මජ්සං.
8. පක්ඛන්දෙ, මජ්සං. පක්කන්තෙතො, PTS. 9. අප්පසිද්ධිකං, සීමු.
10. භිංසනකෙ, මජ්සං. 11. සුප්පාද, මජ්සං. 12. මන්දමෙධිතො, මජ්සං.

5841. එකල්හි මම සිසුන් සහිත බුදුරජුන්හට සතියක් මුළුල්ලෙහි දන් දී සම්බුරජුන් වැඳ එම තනතුර පැතීමි.

5842 - 5843 - 5844. ඉක්බිති බුදුරජතෙම මට මෙසේ පැවසී ය: "මාගේ පාමුල වැටුනා වූ පහන් වූ ඇස් හා මුහුණු ඇති, පූනනුල් සහිත කය ඇති, සුදු සිරුරු සිවි පැහැ ඇති, එල්බෙන බිඹුපල වැනි රතු දෙතොල් ඇති, සුදු තියුණු සම දත් ඇති, ඉබොහෝ වූ ගුණ බල ඇති, මැනැවින් නැගී ගිය ලොම් ඇති, ගුණෞඝයට ආයතන වූ ප්‍රීතියෙන් මැනැවින් පුබුදු වූ මුහුණු ඇති මෙ බමුණහු බලවු.

5845. මෙතෙම ක්ෂිප්‍රාභිඥ වූ භික්ෂුහුගේ එම තනතුර පතයි. අනාගතයෙහි මහාවීර වූ ගෞතම නම් බුදුරජතෙම ලොව පහළවන්නේ ය.

5846. උන්වහසේගේ ධර්මයට දායාද වූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනි වූ ඖරස පුත්‍ර වූ නමින් බාහිය නම් වූ ශාස්තෘශ්‍රාවකයෙක් වන්නේ ය."

5847. එකල්හි ඉතා තුටුවූයෙම් නැගිට දිවි ඇති තාක් බුදුරජුන්හට සත්කාර කොට ඉන් ච්‍යුත වූයෙම් සිය ගෙට යන්නාක් මෙන් සවර්ගයට ගියෙමි.

5848. මම ඒ කර්මයාගේ බලයෙන් දෙවි වූයෙම් හෝ මිනිස් වූයෙම් හෝ සුඛිත වූයෙම් සැරිසරමින් සම්පත් අනුභව කෙළෙමි.

5849. යළි කාශ්‍යප බුදුරජානන් වහන්සේගේ සසුන පිරිහී යන කල්හි ගල මුදුනට නැගී බුදුසසුනෙහි යෙදී –

5850. පිරිසිදු සිල් ඇති ප්‍රඥයෙන් යුතු වූ බුදුසසුන් කරන්නා වූ අපි පස්දෙනෙක් එයින් ච්‍යුත වූවාහු දෙව්ලොවට උත්පත්තිවශයෙන් ගියෙමු.

5851. ඉක්බිති භාරුකච්ඡ නම් උතුම් නගරයෙහි උපන්නෙම් බාහිය නමැත්තෙම් වීමි. එයින් නැව් නැගී අභි සිද්ධි රහිත (අභි සිද්ධි සංශය ඇති) සයුරට පිවිසියෙමි.

5852. ඉක්බිති කිහිප දිනක් ගොස් නැව බිඳුනේ ය. එකල්හි දැහි මුවර (ආදී චණ්ඩ මත්ස්‍ය) යනට ආකර වූ ගොරබිරම් සයුරෙහි වැටුනෙමි.

5853. එකල්හි මම මහසයුර තරණය කොට වැර දරා (වෙහෙස හෙතු කොට ගෙණ) මඳ වූ වැටහීම් නුවණ ඇත්තෙම් සුප්පාරක පටුනට පැමිණියෙමි.

5854. දැරුවීර (කෙවත් දරපතුරු වසත්‍රයක් මෙන් ගොතා) හැඳ ගමට පිඩු පිණිස ගියෙමි. එකල්හි ඒ ජනතෙමේ තුටු වූයේ මේ රහත් කෙනෙක් මෙහි පැමිණියහයි කී ය.

5855. ඉමං අඤ්ඤෙන පානෙන වත්ථෙන සයනෙන ච,
භෙසජ්ජෙන ච සක්කත්වා හෙස්සාම සුඛිතා මයං.

5856 පච්චයානං තදා ලාභී තෙහි සක්කතපූජිතො,
අරහා'හන්ති සංකප්පං උප්පාදෙසිං අයොනිසො.

5857. තතො මෙ චිත්තමඤ්ඤාය චොදයී පුබ්බදෙවතා,
න ත්වං උපායමග්ගඤ්ඤූ කුතො ත්වං අරහා භවෙ.

5858. චොදිතො තාය සංවිග්ගො තදාහං පරිපුච්ඡිසං,
කෙ වා එතෙ කුහිං ලොකෙ අරහන්තො නරුත්තමා.

5859 සාවත්ථියං කොසලමන්දිරෙ ජිනො පහූතපඤ්ඤො වරභූරිමෙධසො
සො සක්‍යපුත්තො අරහා අනාසවො දෙසෙති ධම්මං
අරහත්තපත්තියා.

5860 තදස්ස සුත්වා වචනං සුපීණිතො
නිධිංව ලද්ධා කපණො'තිවිම්හිතො,
උදග්ගචිත්තො අරහන්තමුත්තමං[1]
සුදස්සනං දට්ඨු මනන්තගොචරං.

5861. තදා තතො නික්ඛමිතූන සත්වරං[2]
කදා ජිනං පස්සාමි විමලානනං
උපෙච්ච රම්මං විජිතව්හයං වනං
දිජෙ අපුච්ඡිං කුහිං ලොකනන්දනො.

5862. තතො අවොචුං නරදෙවවන්දිතො
පුරං පවිට්ඨො අසනෙසනාසයො[3]
සවෙ හි[4] ඛිප්පං මුනිදස්සනුස්සුකො
උපෙච්ච වන්දාහි තමග්ගපුග්ගලං.

5863. තතොහං තුවටං ගන්ත්වා සාවත්ථිපුරමුත්තමං,
විචරන්තං තමද්දක්ඛිං පිණ්ඩත්ථමපිහාගිධං[5].

5864 පත්තපාණිං අලොලක්ඛං භාජයන්තං වියාමතං[6],
සිරීනිලයසඞ්කාසං රවිදිත්තිහරානනං.

5865. තං සමෙච්ච නිපච්චාහං ඉදං වචනමබ්‍රවිං,
කුපථෙ විප්පනට්ඨස්ස සරණං හොහි ගොතම.

5866. පාණසන්තාරණත්ථාය පිණ්ඩාය විචරාමහං,
න තෙ ධම්මකථාකාලො ඉච්චාහ මුනිසත්තමො.

1. අරහත්තමුත්තමං, මජසං. 2. නික්ඛමිත්වාන සත්වරො, මජසං.
3. අසනෙසනාය සො, මජසං. 4. සසොච, මජසං පවෙච්ඡසි, ස්‍යා.
5. පිණ්ඩත්ථං අපිහාගිධං, මජසං ජොතයන්තං ඉධාමතං. ස්‍යා.
6. පාචයන්තංපීතාකරං, මජසං.

5855. අපි මොහුට ආහාරයෙන් ද, පානයෙන් ද, වස්ත්‍රයෙන් ද, සයනයෙන් ද, බෙහෙදින් ද සත්කාර කොට සුඛිත වෙමු.

5856. එකල්හි ප්‍රත්‍යයලාභී වූයෙම් ඒ ගම්වැසියන් විසින් සත්කාර පූජාකරණලදුයෙම් 'මම රහතෙක්මි' යි නුනුවණින් අදහසක් ඉපදවීමි.

5857. ඉක්බිති පෙර එක්ව මහණදම් පුරමින් සිට බඹලොව උපන් අනාගාමී බ්‍රහ්මදෙවතාවෙක් මාගේ සිත දැන "තෝ (නිර්වාණගාමී) උපාය මාර්ගය දන්නෙක් නො වෙහි ය. තෝ කවරහෙයකින් රහතෙක් වෙහි දැ"යි චෝදනා කෙළේ ය.

5858. ඔහු විසින් චෝදනා කරණලද මම කලකිරුනෙම් එකල්හි ඔහුගෙන් විචාළෙමි: මේ රහත්හු නම් කවරහු වෙත් ද? ඒ නරෝත්තම වූ රහත්හු ලොකයෙහි කොහි වෙසෙත් ද? (කියා යි.)

5859. සැවැත්නුවර කොසොල් මැදුරෙහි සම්පූර්ණ වූ ප්‍රඥා ඇති උතුම් වූ මහනුවණැති ආස්‍රව රහිත වූ රහත් වූ ඒ ශාක්‍යපුත්‍ර වූ බුදුරජ-තෙමේ රහත්බවට පැමිණීම පිණිස දහම් දෙසයි.

5860. එකල්හි ඔහුගේ වචනය අසා නිධානයක් ලැබ දුගියකු මෙන් අතිශයින් පිණාගියෙම් ඉතා විස්මයපත් වූයෙම් ඔදවැඩි සිත් ඇත්තෙම් අතිශයින් දැකුම්කලු වූ අනන්ත වූ (සත්ත්ව සංස්කාර අවකාශ ලොකයන්) විෂයයෙහි විනිවිද ගිය නුවණ ඇති අග්‍රී වූ උතුම් වූ බුදුරජුන් දැකීමට-

5861. එකල්හි ඉන් වහා නික්ම පිරිසිදු මුහුණක් ඇති බුදුරජුන් කවදා දකිම්දැ' යි රම්‍ය වූ විජිත නම් වනයට එළඹ 'ලොකනන්දන වූ බුදුරජුන් කොහි දැ' යි බමුණන්ගෙන් විචාළෙමි.

5862. ඉක්බිති ඔහු මෙසේ කීහ. "දෙවි මිනිසුන් විසින් වඳින ලද්දා වූ බුදුරජ තෙම පිඩු සිඟීමෙහි අදහස් ඇත්තේ නගරයට පිවිසියේ ය. ඉදින් බුදුරජුන් දැකීමෙහි උත්සාහවත් වූයෙහි නම් වහා එළඹ ඒ අග්‍රපුද්ගල වූ බුදුරජුන් වඳුව."

5863. ඉක්බිති මම වහා උතුම් වූ සැවැත්නුවරට ගොස් ඉච්ඡා ගෙධ විරහිත ව පිඩු පිණිස හැසිරෙන්නා වූ ඒ බුදුරජුන් දිටිමි.

5864. (ද්වාත්‍රිංශද්වර අශීත්‍යනුව්‍යඤ්ජන) ශ්‍රීයගේ නිවාසස්ථානය වැනි, සූර්‍ය්‍යයාගේ දීප්තියට බඳු (දීප්තිමත්) මුහුණු ඇති, නිසසල ඇස් ඇති, අමා බෙදන්නකු මෙන් පාත්‍රය ගත් අත් ඇති-

5865. එම බුදුරජුන් වෙත එළඹ මම පාමුල වැටී 'ගෞතමයන් වහන්ස, උවදුරු සහිත මාර්ගයෙහි මුළා වී නටුවහුට පිහිට වනු මැනැවැ'යි මෙ වදන් කීමි.

5866 "මම සත්ත්වයන් (සසරසයුරින්) එතෙර කිරීම පිණිස පිඬු පිණිස හැසිරෙමි. තට ධර්මකථාවට කාලය නො වේ" ය යි මුනිශ්‍රෙෂ්ඨ වූ බුදුරජ තෙමේ වදාළේ ය.

5867. තදා පුනප්පුනං බුද්ධං ආයාචිං ධම්මලාලසො,
සො මෙ ධම්මමදෙසෙසි ගම්භීරං සුදුද්දසං පදං.

5868. තස්ස ධම්මං සුණිත්වාන පාපුණිං ආසවක්ඛයං,
පරික්ඛීණායුකො සන්තො අහො සත්ථා'නුකම්පකො.

5869. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5870. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5871. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

5872 එවං ථෙරො වියාකාසි බාහියො දාරුචීරියො,
සඞ්කාරකූටෙ පතිතො භූතාවිට්ඨාය ගාවියා.

5873. අත්තානො පුබ්බචරිතං[1] කිත්තයිත්වා මහාමති,
පරිනිබ්බායි සො වීරො[2] සාවත්ථියං පුරුත්තමෙ.

5874 නගරා නික්ඛමන්තො තං දිස්වාන ඉසිසත්තමො,
දාරුචීරධරං ධීරං බාහියං බාහිතාගමං

5875. භූමියං පතිතං දන්තං ඉන්දකෙතුංව[3] පාතිතං,
ගතායුසං ගතක්ලෙසං[4] ජිනසාසනකාරකං.

5876. තතො ආමන්තයී සත්ථා සාවකෙ සාසනෙ රතෙ,
"ගණ්හථ නෙත්වා[5] ඣාපෙථ තනුං සබ්‍රහ්මචාරිනො.

5877. ථූපං කරොථ පූජෙථ නිබ්බුතො සො මහාමති,
ඛිප්පාභිඤ්ඤානමෙසග්ගො සාවකො මෙ වචොකරො.

5878. සහස්සම්පි චෙ ගාථා අනත්ථපදසංහිතා,
එකං ගාථාපදං සෙය්‍යො යං සුත්වා උපසම්මති.

5879. යත්ථ ආපො ච පඨවී[6] තෙජො වායො න ගාධති,
න තත්ථ සුක්කා ජොතන්ති ආදිච්චො නප්පකාසති,
න තත්ථ චන්දිමා භාති තමො තත්ථ න විජ්ජති.

1. පුබ්බචරියං, මජ්සං.
2. ථෙරො, මජ්සං. ධීරො, ස්‍යා.
3. ඉන්දකෙතුව, මජ්සං.
4. ගතායුං සුක්ඛකිලෙසං, මජ්සං.
5. ඣත්වා, ස්‍යා. PTS.
6. පථවිං, මජ්සං.

5867. එකල්හි දහම්හි ලොල් වූයෙම් නැවත නැවතත් බුදුරජුන් අයැදිම්. ඒ බුදුරජතෙම ගැඹුරු වූ ශූන්‍යත (නිර්වාණ) පදය වූ ධර්මය මට දෙසී ය.

5868. (මම) පිරිහුනු ආයු ඇත්තෙම් උන්වහන්සේගේ ධර්මය අසා ආශ්‍රවක්‍ෂය වූ නිවණට පැමිණියෙමි. (අසරණයනට) අනුකම්පා කරන්නා වූ ශාස්තෲන් වහන්සේ ආශ්චර්‍ය්‍යී සේක් මැ යි.

5869. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

5870. බුදුරජානන් වහන්සේ වෙත මාගේ පැමිණීම ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5871. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්‍ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්‍ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5872. භූතාවිෂ්ට වූ දෙනක විසින් (පහර දීමෙන්) කසලගොඩක වැටුනු බාහිය දාරුචීරිය තෙමේ මෙසේ (තමාගේ චරිතය පිළිබඳ තොරතුරු) පැවසී ය.

5873. මහනුවණැති ඒ වීර වූ දාරුචීරිය තෙමේ උතුම් සැවැත්පුරයෙහි දී තමාගේ පෙර සිරිත පවසා පිරිනිවන් පෑවේ ය.

5874-75. නුවරින් නික්මෙන්නා වූ (විපස්සී බුදුරජුන් පටන් ගිණුකල) සත්වැනි සාමි වූ ගෞතම බුදුරජ තෙමේ "දූවපතුරු ගොතා කළ වතක් දරන්නා වූ නැණවත් වූ බැහැර කරණලද භවාගමනය ඇති, බිම වැටුනා වූ දැමුනා වූ හෙළතලද ඉදුණුකෙහෙලියක් මෙන් අවසන් වූ ආයු ඇති, ඉක්ම ගිය කෙලෙස් ඇති, බුද්ධශාසනකාරක වූ ඒ බාහිය තෙරුන් දැක-

5876. ඉක්බිති ශාස්තෘ තෙමේ සසුනෙහි නිරත ශ්‍රාවකයන් ඇමතුය. (අමතා) "මේ සබ්‍රහ්මචාරීහුගේ සිරුර ගණිවු. ගෙණ ගොස් ආදාහනය කරවු.

5877. සෑයක් කරවු. (ඒ සෑයට ද) පුදවු. ඒ මහනුවණැත්තේ පරිනිවන් පෑවේ ය. මාගේ වචනය කරන්නා වූ හෙවත් සුවච වූ මේ ශ්‍රාවක තෙමේ වහා දහම් පිළිවිදුනා භික්‍ෂූන් අතුරෙන් අග්‍ර ය.

5878. ඉදින් අර්ථ විරහිත පදයෙන් යුක්ත වූ ගාථාවෝ දහසෙක් නමුදු උතුම් නො වෙති. යම් ගාථාවක් අසා (පුද්ගල තෙමේ) සන්-හිඳේ ද, එබඳු එක ගාථාපදය නමුදු ශ්‍රෙෂ්ඨ ය.

5879. යම් තැනෙක්හි ආපොධාතුව ද, පෘථිවිධාතුව ද, තෙජොධාතුව ද, වායොධාතුව ද නො ගටා නම් එ නිවනෙහි ශුකලප්‍රභා ඇති ඔසධීතාරකාදීහු නො බබලති. හිරු නො පෑනේ. එහි සඳ නො බබලයි. එහි අඳුර නැත.

5880. යදා ච අත්තනා වෙදි මුනි මොනෙන බ්‍රාහ්මණො,
අථ රූපා අරූපා ච සුඛදුක්ඛා විමුච්චති.
ඉච්චෙවං අභණී නාථො තිලොකසරණො මුනි.

ඉත්ථං සුදං ආයස්මා බාහියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

බාහියත්ථෙරස්ස අපදානං ඡට්ඨං.

537. කොට්ඨිතත්ථෙරාපදානං

5881. පදුමුත්තරො නාම ජිනො සබ්බලොකවිදූ මුනි,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි චක්ඛුමා.

5882. ඔවාදකො විඤ්ඤාපකො තාරකො සබ්බපාණිනං,
දෙසනාකුසලො බුද්ධො තාරෙසි ජනතං බහුං.

5883. අනුකම්පකො කාරුණිකො හිතෙසී සබ්බපාණිනං,
සම්පත්තෙ තිත්ථියෙ සබ්බෙ පඤ්චසීලෙ පතිට්ඨපි.[1]

5884. එවං නිරාකුලං ආසි සුඤ්ඤකං තිත්ථියෙහි ච,
විචිත්තං අරහන්තෙහි වසීභූතෙහි තාදිහි.

5885. රතනානට්ඨපඤ්ඤාසං උග්ගතො සො මහාමුනි,
කඤ්චනග්ඝියසඞ්කාසො බාත්තිංසවරලක්ඛණො.

5886. වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ,
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

5887. තදාහං හංසවතියං බ්‍රාහ්මණො වෙදපාරගූ,
උපෙච්චා සත්තසාරග්ගං[2] අස්සොසිං ධම්මදෙසනං.

5888. තදා සො සාවකං වීරො පභින්නමතිගොචරං,
අත්ථෙ ධම්මෙ ච නෙරුත්තෙ[3] පටිභානෙ ච කොවිදං.

5889. ඨපෙසි එතදග්ගම්හි තං සුත්වා මුදිතො අහං,
සසාවකං ජිනවරං සත්තාහං භොජයිං තදා.

5890. දුස්සෙහච්ඡාදයිත්වාන සසිස්සං බුද්ධිසාගරං,
නිපච්ච පාදමූලම්හි තං ඨානං පත්ථයිං අහං.

5891. තතො අවොච ලොකග්ගො පස්සථෙතං දිජුත්තමං,
විනතං පාදමූලෙ මෙ කමලොදරසප්පභං.

1. පතිට්ඨයී, ථෙරගාථට්ඨකථා.
2. උපෙච්ච සබ්බලොකග්ගං, මජ්ඣං. 3. අත්ථෙ ධම්මෙ නිරුත්තෙ ච, මජ්ඣං.

5880. යම් කලෙක්හි (බහා තබනලද පව් ඇති බැවින්) බ්‍රාහමණ ය යි ද, මොනෙය්‍ය ගුණයෙන් යුත් බැවින් මුනි ය යි ද තෙමේ ම (තමා) දන ගත්තේ නම් එකල්හි හේ රූපභවයෙන් ද අරූපභවයෙන් ද සුවදුකින් දෙකින් ද, මිදේ'' ය යි මෙසේ තිලොවට පිළිසරණ වූ (අනාථයනට) නාථ වූ බුදුරජ තෙම වදාළේ ය.

මෙසෙයින් ආයුෂමත් බාහිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

බාහිය ස්ථවිරාවදානය සවැනියි.

537. කොට්ඨිතස්ථවිරාවදානය

5881. පසැස් ඇති සියලු ලොකයන් (තත් වූ පරිදි) දන ගත්තා වූ පස්මරුන් දිනූ පදුමුත්තර නම් බුදුරජ තෙමේ මෙයින් (පෙර) සියක් දහස්වන කපෙහි ලොව පහළ වී ය.

5882. සව් සත්නට ඔවා දෙන්නා වූ, දහම් පිළිවිදුවන්නා වූ, (සත්ත්වයන් සසරින්) එතෙර කරන්නා වූ, දෙශනාවෙහි දක්‍ෂ වූ බුදුරජ තෙම බොහෝ ජනසමූහයා සසරින් එතෙර කරවී ය.

5883. සව්සත්නට අනුකම්පා කරන්නා වූ කාරුණික වූ වැඩ කැමැත්තා වූ (එ බුදුරජ තෙම) පැමිණි සියලු තීර්ථකයන් පන්සිල්හි පිහිට වී ය.

5884. මෙසේ (ඒ කාලය) තීර්ථකයන්ගෙන් හිස් වූ, නිරවුල් වූ, තාදිගුණ ඇති (පඤ්ච වශිතායෙන්) වශීභූත වූ රහතුන්ගෙන් විසිතුරු වූවක් වීය.

5885. ඒ බුදුරජතෙම අටපණස්රියනක් උස ය. රන්ඇඟැයක් වැන්න. දෙතිස් මහපුරිස් ලකුණු ඇත්තේ ය.

5886. එකල්හි ලක්‍ෂයක් හවුරුද්දට ආයු වෙයි. එපමණ කල් වැඩහුන්නා වූ ඒ සර්‍වඥතෙම බොහෝ ජනසමූහයා සසරින් එතෙර කෙළේ ය.

5887. එකල්හි මම හංසවතී නගරයෙහි වෙදයෙහි පරතෙරට ගිය බමුණෙක් වූයෙම් බුදුරජුන් වෙත එළඹ දම්දෙසුම ඇසීමි.

5888. එකල්හි ඒ වීර වූ බුදුරජතෙමේ අර්ථයෙහි ද ධර්මයෙහි ද නිරුක්තියෙහි ද ප්‍රතිභානයෙහි ද දක්‍ෂ වූ ප්‍රභෙදගත ප්‍රතිසම්භිදාඥාන ඇති ශ්‍රාවකයකු-

5889. එතදග්‍රස්ථානයෙහි තැබී ය. එය අසා ප්‍රමුදිත වූ මම එකල්හි ශ්‍රාවකයන් සහිත උතුම් වූ බුදුරජුන් සතියක් වැළඳවීමි.

5890. මම බුද්ධිසාගර වූ බුදුරජුන් ශිෂ්‍යයන් සහිතව වස්ත්‍රයෙන් (-සිවුරින්) හඳවා පාමුලෙහි වැටී එම තනතුර පැතීමි.

5891. ඉක්බිති ලොකාග්‍ර වූ බුදුරජ තෙම මෙසේ වදාළේ ය. "මාගේ පාමුල නැමුනා වූ පියුම්ගැබකට බඳු පැහැ ඇති මේ උතුම් බමුණා දෙස බලවු.

5892. බුද්ධසෙට්ඨස්ස භික්ඛුස්ස[1] ඨානං පත්ථයතෙ අයං,
තාය සද්ධාය චාගෙන ධම්මස්ස සවණෙන[2] ච.

5893. සබ්බත්ථ සුඛිතො හුත්වා සංසරිත්වා භවාභවෙ,
අනාගතම්හි අද්ධානෙ ලච්ඡතෙ තං මනොරථං.

5894. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන[3] සත්ථා ලොකෙ භවිස්සති.

5895. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
කොට්ඨිතො නාම නාමෙන හෙස්සති සත්ථු සාවකො.

5896. තං සුත්වා මුදිතො හුත්වා යාවජීවං තදා ජිනං,
මෙත්තචිත්තො පරිචරිං සතො පඤ්ඤාසමාහිතො.

5897. තෙන කම්මවිපාකෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

5898. සතානං තීණික්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං,
සතානං පඤ්චක්ඛත්තුඤ්ච චක්කවත්ති අහොසහං.

5899. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං,
සබ්බත්ථ සුඛිතො ආසිං තස්ස කම්මස්ස වාහසා.

5900. ද්වෙ භවෙ සංසරාමි දෙවත්තෙ අථ මානුසෙ,
අඤ්ඤං ගතිං න ගච්ඡාමි සුචිණ්ණස්ස ඉදං ඵලං.

5901. ද්වෙ කුලෙ පජායාමි ඛත්තියෙ අථ බ්‍රාහ්මණෙ,
නීචෙ කුලෙ න ජායාමි සුචිණ්ණස්ස ඉදං ඵලං.

5902. පච්ඡිමභවෙ[4] සම්පත්තෙ බ්‍රහ්මබන්ධු අහොසහං,
සාවත්ථියං විප්පකුලෙ පච්චාජාතො මහද්ධනෙ.

5903. මාතා චන්දවතී නාම පිතා මෙ අස්සලායනො,
යදා මෙ පිතරං බුද්ධො විනයී සබ්බසුද්ධියා.

5904. තදා පසන්නො සුගතෙ පබ්බජිං අනගාරියං,
මොග්ගල්ලානො ආචරියො උපජ්ඣා[5] සාරිසම්භවො.

1. සෙට්ඨං බුද්ධස්ස භික්ඛුස්ස, සයා.
2. තෙන ධම්මස්සවනෙන, සීමු. සද්ධම්මස්සවනෙන, මජ්සං.
3. ගොත්තෙන, මජ්සං. 4. පච්ඡිමෙ භවෙ, මජ්සං.
5. උපජ්ඣා, මජ්සං.

5892. මෙතෙම සිවුපිළිසැඹියාවත් දත් ශ්‍රේෂ්ඨ වූ භික්ෂුහුගේ තනතුර පතයි. (මොහු තුළ ඇති) එම ශ්‍රද්ධාවෙන් ද ත්‍යාගයෙන් ද, දහම් ඇසුමෙන් ද,

5893. සියලු තන්හි සුව ඇත්තේ ව කුදුමහත් භවයෙහි සැරිසරා මතුකාලයෙහි එම මනොරථය ලබන්නේ ය.

5894. මෙයින් ලක්ෂයක් වන කපෙහි ඔක්කාක කුලයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

5895. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ, ධර්මයෙන් නිර්මිත කළාක් වැනි වූ, ඖරස පුත්‍ර වූ, නමින් කොට්ඨිත නම් වූ ශාස්තෘශ්‍රාවකයෙක් වන්නේ ය.”

5896. එකල්හි එය අසා සතුටු වූයෙම් දිවිහිමියෙන් මෙත් සිත් ඇත්තෙම් ස්මෘති ඇත්තෙම් ප්‍රඥාවෙන් යුක්ත වූයෙම් බුදුරජුනට (වතාවත් කිරීම් වශයෙන්) පරිචරණය කෙළෙම්.

5897. මම ඒ කර්මවිපාකය හෙතුකොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද මිනිස්කය හැර තව්තිසාවට උත්පත්ති වශයෙන් ගියෙමි.

5898. මම තෙසියවරක් දිව්‍යරාජ්‍යය කරවීමි. පන්සියවරක් සක්විතිරජ වීමි.

5899. (ලබනලද) මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් ගිණිය නො හැකි ය. එම කර්මයාගේ බලයෙන් සියලු තන්හි සුඛිත වූයෙමි.

5900. දෙව් අත් බැව්හි ද මිනිස් අත් බැව්හි ද (යන) දෙඅත් බැව්හි සැරිසරමි. අනික් ගතියකට නො යමි. මේ රැස්කරණලද පුණ්‍යකර්මයාගේ විපාක යි.

5901. කැත්කුලයෙහි ද යළි බමුණුකුලයෙහි ද යන දෙකුලයෙහි උපදිමි. නීච කුලයෙහි නො උපදිමි. මේ රැස්කරණලද පුණ්‍යකර්මයාගේ විපාක යි.

5902. මම පශ්චිම භවය පැමිණි කල්හි බමුණෙක් වීමි. සැවැත් නුවර මහත් ධන ඇති බමුණු කුලයක උපන්මි.

5903. මාගේ මවු තොමෝ චන්ද්‍රවතී නම් වූවා ය. පියතෙම අස්සලායන නම් විය. යම් කලෙක්හි බුදුරජතෙම මාගේ පියා සම්ශුද්ධියෙහි හෙවත් රහත් බවට පැමිණවීමෙන් හික්මවී ද,

5904. එකල්හි බුදුරජුන් කෙරෙහි පහන් වූයෙම් අනගාර්ය සඞ්ඛ්‍යාත පැවිද්දට පැමිණියෙමි. මෞද්ගල්‍යායන තෙමේ ආචාර්ය විය. ශාරීපුත්‍ර තෙමේ උපාධ්‍යාය විය.

5905. කෙසෙසු ඡිජ්ජමානෙසු දිට්ඨි ඡින්නා සමූලිකා,
නිවාසෙන්තො[1] ච කාසාවං අරහත්තමපාපුණිං.

5906. අත්ථධම්මනිරුත්තීසු පටිභානෙ ච මෙ මති,
පභින්නා තෙන ලොකග්ගො එතදග්ගෙ ඨපෙසි මං.

5907. අසන්දිද්ධං වියාකාසිං උපතිස්සෙන පුච්ඡිතො,
පටිසම්භිදාසු තෙනාහං අග්ගො සම්බුද්ධසාසනෙ.

5908. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5909 ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං

5910. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා මහාකොට්ඨිතො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

මහාකොට්ඨිතත්ථෙරස්ස අපදානං සමත්තං.

538. උරුවෙලකස්සපත්ථෙරාපදානං

5911. පදුමුත්තරො නාම ජිනො සබ්බලොකවිදූ මුනි,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි චක්ඛුමා.

5912. ඔවාදකො විඤ්ඤාපකො තාරකො සබ්බපාණිනං,
දෙසනාකුසලො බුද්ධො තාරෙසි ජනතං බහුං.

5913. අනුකම්පකො කාරුණිකො හිතෙසී සබ්බපාණිනං,
සම්පත්තෙ තිත්ථියෙ සබ්බෙ පඤ්චසීලෙ පතිට්ඨපි.[2]

5914. එවං නිරාකුලං ආසි සුඤ්ඤකං තිත්ථියෙහි ච,
විචිත්තං අරහන්තෙහි වසීභූතෙහි තාදිහි.

5915 රතනානට්ඨපඤ්ඤාසං උග්ගතො සො මහාමුනි,
කඤ්චනග්ඝියසඞ්කාසො බාත්තිංසවරලක්ඛණො.

---

1. නිවාසයන්තො, සීමු. 2. පතිට්ඨයි, සීමු. ථෙරගාථට්ඨකථා.

5905. හිසකේ කපන කල්හි (සක්කාය) දිට්ඨි තොමෝ සහමුලින් සිඳිනා. යළි කසාවත් හඳනේ රහත්බවට පැමිණියෙමි.

5906. මාගේ සමෘද්ධි තොමෝ අර්ථ ධර්ම නිරුක්තීන්හි ද ප්‍රතිභානයෙහි ද වෙන වෙන ම පිහිටි ගිය බැවින් ප්‍රභේදගත විය. එහෙයින් ලොව්ගපත් බුදුරජතෙම (පිළිසැඹියා පතුවන් අතුරෙන්) මා එතදග්‍රස්ථානයෙහි තැබී ය.

5907. **උපතිස්සයන් (- ශාරිපුත්‍රයන්)** විසින් ප්‍රතිසම්භිදාවන් විෂයයෙහි ප්‍රශ්න විචාරණ ලදුයෙමි නිසැක ව විසඳා පැවසීමි. එහෙයින් මම සම්බුදුසසුනෙහි පිළිසැඹියා පතුවනට අග්‍ර වූ යෙමි වෙමි.

5908. මා විසින් කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිත ව වෙසෙමි.

5909. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

5910. සිව්පිළිසැඹියාවෝ ද අෂ්ට විමෝක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

මහාකොට්ඨිත ස්ථවිරාවදානය සත්වැනි යි.

538. උරුවෙලකස්සපස්ථවිරාවදානය

5911. පසැස් ඇත්තා වූ සියලු ලොකයන් තත් වූ පරිදි දැනගත්තා වූ පස්මරුන් ජයගත්තා වූ පදුමුත්තර නම් බුදුරජතෙමේ මෙයින් ලක්ෂයක් මත කල්පයෙහි ලොව පහළ විය.

5912. සව්සත්නට ඔවා දෙන්නා වූ දහම් පිළිවිදුවන්නා වූ (සත්ත්වයන්) සසරින් එතෙර කරන්නා වූ දෙශනාවෙහි දක්ෂ වූ බුදුරජ තෙම බොහෝ ජනසමූහයා සසරින් එතෙර කරවී ය.

5913. සව්සත්නට අනුකම්පා කරන්නා වූ කාරුණික වූ හිත කැමැත්තා වූ ඒ බුදුරජ තෙම පැමිණි සියලු තීර්ථකයන් පන්සිල්හි පිහිට විය.

5914. මෙසේ ඒ කාලය තීර්ථකයන්ගෙන් හිස් වූ නිරවුල් වූ, තාදී ගුණ ඇති පක්‍ෂවවශිතායෙන් වශීභූත වූ රහතුන්ගෙන් විසිතුරු වූවක් විය.

5915. ඒ බුදුරජතෙම අටපණස්රියණක් උස ය. රත්ඇඟැයක් වැන්න. දෙතිස්මහපුරිස් ලකුණු ඇත්තේ ය.

5916. වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ,
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

5917. තදාහං හංසවතියං බ්‍රාහ්මණො සාධුසම්මතො,
උපෙච්ච ලොකපජ්ජොතං අස්සොසිං ධම්මදෙසනං.

5918. තදා මහාපරිසතිං මහාපුරිසසාවකං,
ඨපෙන්තං එතදග්ගම්හි සුත්වාන මුදිතො අහං.

5919. මහතා පරිවාරෙන නිමන්තෙත්වා මහාජිනං,
බ්‍රාහ්මණානං සහස්සෙන සහ දානමදාසහං.

5920. මහාදානං දදිත්වාන අභිවාදිය නායකං,
එකමන්තෙ[1] ඨිතො හට්ඨො ඉදං වචනමබ්‍රවිං:

5921. තයි සද්ධාය මෙ වීර අධිකාරගුණෙන ච,
පරිසා මහතී හොතු නිබ්බත්තස්ස තහිං තහිං.

5922. තදා අවොච පරිසං ගජගජ්ජිතසුස්සරො,
කරවීකරුතො සත්ථා එතං පස්සථ බ්‍රාහ්මණං.

5923. හෙමවණ්ණං මහාබාහුං කමලානනලොචනං,
උද්ධග්ගතනුජං[2] හට්ඨං සද්ධාවන්තං[3] ගුණෙ මම.

5924. එස පත්ථයතෙ ඨානං[4] සීහඝොසස්ස භික්ඛුනො,
අනාගතම්හි අද්ධානෙ ලච්ඡතෙ තං මනොරථං.

5925. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම ගොත්තෙන සත්ථා ලොකෙ භවිස්සති.

5926. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
කස්සපො නාම නාමෙන[5] හෙස්සති සත්ථු සාවකො.

5927. ඉතො ද්වෙනවුතෙ කප්පෙ අහු සත්ථා අනුත්තරො,
අනූපමො අසදිසො ඵුස්සො ලොකග්ගනායකො.

5928. සො ච සබ්බං තමං හන්ත්වා විජටෙත්වා මහාජටං,
වස්සතෙ අමතං වුට්ඨිං තප්පයන්තො සදෙවකං.

5929. තදා හි බාරාණසියං රාජපුත්තා අහුම්හසෙ,
භාතරොම්හ තයො සබ්බෙ සංවිස්සත්ථා ච[6] රාජිනො.

---

1. එකමන්තං, මජසං. 2. උදග්ගතනුජ, මජසං. 3. සද්ධවන්ත , මජසං.
4. පත්ථයි තං ඨානං, සං. 5 ගොත්තෙන, මජස. 6. සංවිසට්ඨාව, මජසං.

5916. එකල්හි ලක්‍ෂයක් හවුරුද්දට ආයු වෙයි. එපමණ කල් වැඩහුන්නා වූ ඒ සර්‍වඥතෙම බොහෝ ජනසමූහයා සසරින් එතෙර කෙළේ ය.

5917. එකල්හි මම හංසවතී නගරයෙහි සාධුසම්මත වූ බ්‍රාහ්මණයෙක් වූයෙමි බුදුරජුන් වෙත එළඹ දම්දෙසුම ඇසීමි.

5918. එකල්හි මම (මහපිරිස් ඇතියනට අග්‍රය යි) එතදග්‍රස්ථානයෙහි තබන්නා වූ මහපිරිස් ඇති බුද්ධශ්‍රාවකයකු දැක සතුටු වූයෙමි.

5919. බමුණන් දහසක් සහිත වූ මම මහපිරිවරින් බුදුරජුන් පවරා දන් දුනිමි.

5920. මහදන් දී බුදුරජුන් වැඳ සතුටු වූයෙම් එකත්පසෙක සිටියෙම් මේ වචනය කීමි:

5921. "වීරයන් වහන්ස මා විසින් ඔබ වහන්සේ කෙරෙහි සැදැහැයෙන් කරණලද පූජාසත්කාර සඞ්ඛ්‍යාත අධිකාර ගුණ හෙතු කොටගෙණ ඒ ඒ තන්හි උපදින්නා වූ මට මහත් වූ පිරිස ඇති වේවා.

5922 – 5923. එකල්හි මෙඝගර්ජිතයකට බඳු මනා වූ ගම්භීර ස්වර ඇති කුරවිකෙවිල්හඬකට බඳු ස්වර ඇති ශාස්තෘ තෙමේ පිරිස අමතා මෙසේ කී ය: "ස්වර්‍ණවර්‍ණ වූ මහාබාහු ඇති, පියුම්කට බඳු මුහුණ හා ඇස් ඇති, ඌර්ධ්වාග්‍රරෝම ඇති, ප්‍රීතිමත් වූ මාගේ ගුණයෙහි සැදැහැවත් වූ මෙ බමුණු දෙස බලවු.

5924. මෙතෙම මහපිරිස් ඇත්තවුනට අගතැන්පත් වූ ශ්‍රෙෂ්ඨ ඝොෂ ඇත්තා වූ නොහොත් සිංහඝොෂ නම් වූ භික්‍ෂුහුගේ ඒ තනතුර පතයි. මතුකාලයෙහි ඔහුගේ ඒ චිත්තාභිලාෂය සමෘද්ධ වන්නේ ය.

5925. මෙයින් සියක් දහස් වන කපෙහි ඔක්කාක කුලයෙහි උප-දින්නා වූ, ගොත්‍රයෙන් ගෞතම නම් වූ ශාස්තෘ තෙම ලොව පහළ වන්නේ ය.

5926. උන්වහන්සේගේ ධර්‍මයෙහි දායාද වූ ධර්‍මයෙන් නිර්මිත කළාක් වැනි වූ ඖරස පුත්‍ර වූ නමින් කාශ්‍යප නම් වූ ශාස්තෘශ්‍රාවකයෙක් වන්නේ ය" කියා සි.

5927. මෙයින් පෙර දෙයානුවක කපෙහි ලොකයෙහි ශ්‍රෙෂ්ඨ නායකයාණන් වූ මෙබඳුයයි කීමට උපමාවක් නැත්තා වූ සමානය යි දක්වීමට කෙනෙකු නැත්තා වූ ඵුස්ස බුදුරජතෙම ලොව පහළ විය.

5928. ඒ බුදුරජ තෙමේ ද සියලු මොහො අඳුරු තසා මහත් වූ තෘෂ්ණා අවුල නිරවුල් කොට දෙවියන් සහිත ලොකයා පිණවමින් දහම් අමාවැසි වස්වයි.

5929. එකල්හි අපි බරණැස්නුවර රාජපුත්‍රයෝ වීමු. එසේ ම අපි තිදෙනෙ ඔවුනොවුනට සොහොයුරු වීමු. අපි සියලුදෙන රජුගේ විශ්වාසයෝ ද වීමු.

5930. වීරඞ්ගරූපා බලිනො සඞ්ගාමෙ අපරාජිතා,
තදා කුපිතපච්චන්තො අම්හෙ ආහ මහීපති.

5931. එථ ගන්ත්වාන පච්චන්තං සොධෙත්වා අටවීබලං,
ඛෙමං මෙ විජිතං කත්වා පුනරෙථා ති[1] භාසථ.

5932. තතො මයං අවොචුම්හ යදි දෙය්‍යාසි නායකං,
උපට්ඨානාය අම්හාකං සාධයිස්සාම වො තතො.

5933. තතො මයං ලද්ධවරා භූමිපාලෙන පෙසිතා,
නික්ඛිත්තසත්ථං පච්චන්තං කත්වා පුනරුපෙච්ච තං.

5934. යාචිත්වා සත්ථුපට්ඨානං රාජානං ලොකනායකං,
මුනිවීරං ලභිත්වාන යාවජීවං යජිම්හ තං.

5935. මහග්ඝානි ච වත්ථානි පණීතානි රසානි ච,
සෙනාසනානි රම්මානි භෙසජ්ජානි හිතානි ච.

5936. දත්වා සසංඝස්ස මුනෙ[2] ධම්මෙනුප්පාදිතානි නො,
සීලවන්තො කාරුණිකා භාවනායුත්තමානසා.

5937. සදා[3] පරිචරිත්වාන මෙත්තචිත්තෙන නායකං,
නිබ්බුතෙ තම්හි ලොකග්ගෙ පූජං කත්වා යථාබලං.

5938. තතො චුතා සන්තුසිතං ගතා තත්ථ මහාසුඛං,
අනුභූතා මයං සබ්බෙ බුද්ධපූජායිදං ඵලං.

5939. මායාකාරො යථා රඞ්ගෙ[4] දස්සෙති විකතී බහූ,[5]
තථා භවෙ භමන්තොහං විදෙහාධිපතී අහුං.

5940 ගුණාචෙලස්ස වාක්‍යෙන මිච්ඡාදිට්ඨිගතාසයො,
නරකම්මග්ගමාරූළ්හො රුජාය[6] මම ධීතුයා.

5941. ඔවාදං නාදියිත්වාන බ්‍රහ්මුනා නාරදෙනහං,
බහුධා සාසිතො[7] සන්තො දිට්ඨිං හිත්වාන පාපිකං.

5942. පූරයිත්වා විසෙසෙන දසකම්මපථානහං,
හිත්වාන දෙහමගමිං සග්ගං සභවනං යථා.

5943 පච්ඡිමභවෙ සම්පත්තෙ[8] බ්‍රහ්මබන්ධු අහොසහං,
බාරාණසියං ඵීතායං ජාතො විප්පමහාකුලෙ.

5944. මච්චුව්‍යාධිජරාභීතො ජහිත්වාන මහාධනං,[9]
නිබ්බානං පදමෙසන්තො ජටිලෙසු පරිබ්බජිං.

1 පුනදෙථාති, මජසං. 2. සසඞ්ඝමුනිනො, මජසං. 3. සද්ධා, මජසං
4. ලද්ධො, සසා. PTS. 5. විකතිං බහු, මජසං
6. රුචාය, මජසං. රූපාස ථෙරගාථට්ඨකථා 7. සංසිතො, මජසං.
8. පච්ඡිමෙ භවෙ සම්පත්තෙ, මජසං. 9. ඔගාහෙත්වා මහාවනං, මජසං.

5930. එකල්හි කිපුනු පසල්දනව් ඇති රජතෙම රූසපුවෙන් දිව්‍යපුත්‍රයන් සමාන ශරීර ඇති නොහොත් වීරමය (වීර්‍යයෙන් ම කරණ ලද) ශරීර ඇත්තා වූ බලවත් වූ යුද්ධයෙහි පරාජය නො වූ අප (අමතා) මෙසේ කී ය:

5931. "දරුවෙනි, එවූ ගොස් පසල්දනව්හි වල් සොර බල සොඩා මාගේ රට නිර්භය කොට පෙරළා එවූ යි කී ය.

5932. ඉක්බිති අපි මෙසේ කීමු: "ඉදින් ලොකනායක වූ බුදුරජුන් උවටැන් කිරීම සඳහා අපට දෙන්නෙහි නම් ඒ හෙතුයෙන් තොපගේ සතුරන් ගන්නෙමු"ය කියා යි.

5933 - 5934. ඉක්බිති ලබන ලද වර ඇති අපි රජුවිසින් මෙහෙයන ලද්දමෝ කුපිත වූ පසල්දනව්ව බහා තබන ලද අවි ඇත්තක් කොට (සෙමෙහි තබා) පෙරළා අවුත් රජුගෙන් එම බුද්ධොපස්ථානය අයැද ලොකනායක වූ ඒ බුදුරජුන් ලැබ දිවි ඇතිතාක් පූජා පැවැත්වීමු.

5935 - 5936 - 5937. දැහැමින් උපයන ලද මාහැඟි වස්ත්‍ර ද ප්‍රණීත රසයන් ද මනරම් සෙනසුන් ද, හිත බෙහෙත් ද සබ්සයා සහිත බුදුරජුන්හට දී සිල්වත් වූවාහු කාරුණික වූවාහු භාවනාවෙහි යෙදු සිත් ඇත්තාහු හැම කල්හි මෙත්සිතින් යුතු ව ලොකනායක වූ බුදුරජුන්හට පරිවරණය (=වතාවත්) කොට ඒ බුදුරජුන් පිරිනිවි කල්හි ද හැකි පමණින් පූජා කොට-

5938. අපි සියල්ලෝ එයින් සැව තුසිත දෙව්ලොවට ගියාහු එහි මහත් වූ සැප අනුභව කළම්හ. මේ බුද්ධපූජාවෙහි විපාක යි.

5939. යම්සේ මායාකාරයෙක් රඟමඬලෙහි බොහෝ විසුලු දක්වා ද, එසේ ම භවයෙහි සැරිසරන්නා වූ මම විදෙහ රටෙහි අධිපතියා වීමි.

5940 - 5941. ගුණ නම් අචෙලකයාගේ වචනයෙන් මිසදිටු බව්හි ගිය සිත් ඇත්තෙම් වැරදි මගට පිළිපන්නෙම් රුජා නම් වූ මාගේ දුවගේ අවවාදය නො පිළිගෙණ නාරද බ්‍රහ්මයා විසින් නොයෙක් අයුරින් අනුසාසිත වූයෙම් පවිටු මිසදිටුබව හැර-

5942. මම වෙසෙසින් දශකර්‍මපථයන් පුරා මිනිස් සිරුර හැර සිය ගෙදරට යන්නාක් මෙන් සවර්ගයට ගියෙමි.

5943. පශ්චිමභවය පැමිණි කල්හි මම බ්‍රාහ්මණයෙක් වීමි. සමෘද්ධ වූ බාරාණසී නගරයෙහි බමුණු මහසල්කුලෙහි උපන්නෙමි.

5944. මරණය ව්‍යාධිය ජරාව යන මෙයින් බිය වූයෙම් මහත් වූ ධනය හැර නිර්වාණපදය සොයන්නෙම් (ජටාධර තවුසන් වූ) ජටිලයන් කෙරෙහි පැවිදි වීමි.

5945. තදා ද්වෙ භාතරො මය්හං පබ්බජිංසු මයා සහ,
උරුවෙලායං මාපෙත්වා අස්සමං නිවසිං අහං.

5946. කස්සපො නාම ගොත්තෙන උරුවෙලනිවාසිකො[1],
තතො මෙ ආසි පඤ්ඤත්ති උරුවෙලකස්සපො ඉති.

5947. නදීසකාසෙ භාතා මෙ නදීකස්සපඅව්හයො,
ආසී සකාසනාමෙන ගයාය ගයකස්සපො.[2]

5948. ද්වෙ සතානි කනිට්ඨස්ස තීණි මජ්ඣස්ස භාතුනො,
මම පඤ්චසතානූනා සිස්සා සබ්බෙ මමානුගා.

5949. තදා උපෙච්ච මං බුද්ධො කත්වා නානාවිධානි මෙ,[3]
පාටිහීරානි ලොකග්ගො විනෙසි නරසාරථි.

5950. සහස්සපරිවාරෙන අහොසිං එහිභික්ඛුකො,
තෙහෙව සහ සබ්බෙහි අරහත්තමපාපුණිං.

5951. තෙ චෙවඤ්ඤෙ ච බහවො සිස්සා මං පරිවාරයුං,
සාසිතුං ච සමත්ථොහං තතො මං ඉසිසත්තමො.

5952. මහාපරිසභාවස්මිං එතදග්ගෙ ඨපෙසි මං,
අහො බුද්ධෙ කතං කාරං සඵලං මෙ අජායථ.

5953. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5954. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5955. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා උරුවෙලකස්සපො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

උරුවෙලකස්සපත්ථෙරස්ස අපදානං අට්ඨමං.

539. රාධත්ථෙරාපදානං

5956. පදුමුත්තරො නාම ජිනො සබ්බලොකවිදූ මුනි,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි චක්ඛුමා.

5957. ඔවාදකො විඤ්ඤාපකො තාරකො සබ්බපාණිනං,
දෙසනාකුසලො බුද්ධො තාරෙසි ජනතං බහුං.

---

1. උරුවෙලාය නිවසිං, ස්‍යා. 2. ගයායං ගයාකස්සපො, මජ්ඣං.
3. කත්වාන විවිධානි මෙ, මජ්ඣං.

5945. එකල්හි මාගේ දෙබෑයෝ මා සමග පැවිදි වූහ. මම උරුවෙලායෙහි අසපුවක් ඉදිකොට එහි විසීමි.

5946. උරුවෙලායෙහි වසන්නා වූ මම ගෙත්‍රයෙන් කාශ්‍යප නම් විමි. එහෙයින් මට උරුවෙලකාස්සප යන ප්‍රඥප්තිය විය.

5947 මාගේ සොහොයුරු තෙමේ ගඞ්ගානදිය සමීපයෙහි විසූ බැවින් නදීකාශ්‍යප නම් විය. ගයාවෙහි විසූ කාශ්‍යප තෙමේ සමීපනාමයෙන් ගයාකාශ්‍යප නම් විය.

5948 කණිටු බෑ කාශ්‍යපට දෙසියක් ද මැදිබෑ නදී කාශ්‍යපට තුන්සියක් ද, මට නො අඩු වූ පන්සියක් දැයි (දහසක් වූ) සියලු ශිෂ්‍යයෝ මා අනුව ගියාහු ය.

5949. එකල්හි පුරිසදම්මසාරථි වූ ලොකාග්‍ර වූ බුදුරජ තෙමේ මාගේ සමීපයට එළඹ නන්වැදෑරුම් ප්‍රාතිහාර්‍ය්‍යයන් කොට මා හික්මවී ය.

5950. මම දහසක් පිරිවර සහිත ව එහිභික්ෂුභාවයෙන් පැවිදි වීමි. ඒ සියලුදෙනා සමග ම රහත්බවට පැමිණියෙමි.

5951. ඒ ශිෂ්‍යයෝ ද අතික් බොහෝදෙන ද මා පිරිවැරූහ. මම ඔවුනට අනුශාසනා කිරීමට සමර්ථ වෙමි. ඉක්බිති විපස්සි බුදුරජුන් පටන් ගිණුකල සත්වැනි වූ බැවින් සෘෂිසත්තම වූ ගෞතම බුදුරජ තෙමේ-

5952. මහපිරිස් ඇති බැවිහි මා එතදග්‍රස්ථානයෙහි තැබී ය. ආශ්චර්‍ය්‍යයෙකි. බුදුරජුන් කෙරෙහි කරණලද සත්කාරය සඵල විය.

5953 මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඈත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

5954. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

5955. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන්වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙසින් ආයුෂමත් උරුවෙලකාස්සප ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

උරුවෙලකාශ්‍යප ස්ථවිරාපදානය අට වැනි යි.

539. රාධ ස්ථවිරාපදානය

5956. පසැස් ඇත්තා වූ සියළු ලොකයන් තත් වූ පරිදි දැනගත්තා වූ මොනෙය්‍යගුණ ඇති පදුමුත්තර නම් බුදුරජ තෙමේ මෙයින් පෙර සියක්දහස් වන කපෙහි ලොව පහළ විය.

5957. සව්සත්නට ඔවා දෙන්නා වූ දහම් පිළිවිදුවන්නා වූ සත්වයන් සසරින් එතෙර කරන්නා වූ දෙශනාවෙහි දක්ෂ වූ බුදුරජ තෙමේ බොහෝ ජනසමූහයා සසරින් එතෙර කරවී ය.

5958. අනුකම්පකො කාරුණිකො හිතෙසී සබ්බපාණිනං,
සම්පත්තෙ තිත්ථියෙ සබ්බෙ පඤ්චසීලෙ පතිට්ඨපි.

5959. එවං නිරාකුලං ආසි සුඤ්ඤකං[1] තිත්ථියෙහි ච,
විචිත්තං අරහන්තෙහි වසීභූතෙහි තාදිහි.

5960. රතනානට්ඨපඤ්ඤාසං උග්ගතො සො මහාමුනි,
කඤ්චනග්ඝියසඞ්කාසො බත්තිංසවරලක්ඛණො.

5961. වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ,
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

5962. තදාහං හංසවතියං බ්‍රාහ්මණො මන්තපාරගූ,
උපෙච්ච තං නරවරං අස්සොසිං ධම්මදෙසනං.

5963. පඤ්ඤපෙන්තං මහාවීරං පරිසාසු විසාරදං,
පටිභානෙය්‍යකං භික්ඛුං එතදග්ගෙ විනායකං.

5964. තදාහං කාරං කත්වාන සසඞ්ඝෙ ලොකනායකෙ,
නිපච්ච සිරසා පාදෙ තං ඨානමභිපත්ථයිං.

5965. තතො මං භගවා ආහ සිඞ්ගීනික්ඛසමප්පභො,
සරෙන රජනීයෙන කිලෙසමලහාරිනා.

5966. “සුඛී භවස්සු දීඝායු සිජ්ඣතං[2] පණිධී තව,
සසඞ්ඝෙ මෙ කතං කාරං අතිව විපුලං තයා.

5967. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

5968. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
රාධොති නාමධෙය්‍යෙන හෙස්සති සත්ථුසාවකො.

5969. ස තෙ හෙතුගුණෙ තුට්ඨො සක්‍යපුත්තො නරාසභො,
පටිභානෙය්‍යකානග්ගං පඤ්ඤපෙස්සති නායකො.”

5970. තං සුත්වා මුදිතො හුත්වා යාවජීවං තදා ජිනං,
මෙත්තචිත්තො පරිචරිං සතො පඤ්ඤාසමාහිතො.

5971. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

1. සුඤ්ඤතං, මජ්සං. 2. සිජ්ඣතු, මජ්සං

5958. සබ්සත්නට අනුකම්පා කරන්නා වූ කාරුණික වූ හිත කැමැත්තා වූ ඒ බුදුරජතෙම පැමිණි සියලු තීර්ථකයන් පත්සිල්හි පිහිටු වීය.

5959. මෙසේ ඒ කාලය තීර්ථකයන්ගෙන් හිස් වූ, නිරවුල් වූ තාදී-ගුණ ඇති පඤ්චවශිතාවන්ගෙන් වශීභූත වූ රහතුන්ගෙන් විසිතුරු වූවක් වීය.

5960. ඒ බුදුරජතෙම අටපණස් රියනක් උස ය. රන්අැගෑයක් මෙන් බබළුන්නේ ය. දෙතිස්මහපුරිස් ලකුණු ඇත්තේ ය.

5961. එකල්හි වර්ෂලක්ෂයක් ආයුෂ වෙයි. එපමණ කල් වැඩ සිටිමින් ඒ සර්වඥතෙම බොහෝ ජනසමූහයා සසරින් එතෙර කෙළේ ය.

5962. එකල්හි මම හංසවතී නගරයෙහි වෙද මන්ත්‍රයන්හි තෙරපත් බමුණෙක් වූයෙමි ඒ බුදුරජුන් වෙත එළඹ දම් දෙසුම ඇසීමි.

5963. පටිභාණෙයාක (-වැටහීම් ඇති) භික්ෂුනමක් එතදග්‍රස්ථානයෙහි තබන්නා වූ පිරිස්හි විශාරද වූ, විශිෂ්ට නායකත්වය ඇති, මහාවීරයන් වහන්සේ දැක,

5964. එකල්හි මම සඞ්ඝයා සහිත ලෝකනායකයන් වහන්සේ කෙරෙහි අධිකාර කොට සිරසින් හෙව වැඳ ඒ තනතුර පැතීමි.

5965. ඉක්බිති සිංහ සවණ්තිෂ්කායකට බඳු පැහැ ඇති භාග්‍යවත් තෙමේ කෙලෙස් මල හරනා වූ සිත් රැඳවිය යුතු මිහිරි ස්වරයෙන් මට (මෙසේ) වදාළේය:

5966. "සුවපත් වේවා. දීර්ඝායුෂ්ක වේවා. තාගේ පැතුම සිදුවේවා. සඞ්ඝයා සහිත වූ මා කෙරෙහි තා විසින් කරණ ලද සත්කාරය අනුසස් වසයෙන් අති මහත් ය.

5967. මෙයින් මතු සියක්දහස් වන කපෙහි ඔක්කාක කුලයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් වූ ශාස්තෘ තෙම ලොව පහළ වන්නේ ය.

5968. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනි වූ ඖරස පුත්‍ර වූ රාධ යන නමින් යුත් ශාස්තෘශ්‍රාවකයෙක් වන්නේ ය.

5969. තොපගේ හෙතුසම්පත්තියෙහි හා ගුණයෙහි තුටු වූ ශාක්‍ය පුත්‍ර වූ නරශ්‍රෙෂ්ඨ වූ ඒ බුදුරජතෙම පටිභාණෙයාක භික්ෂූන් අතුරෙන් අග්‍රස්ථානයෙහි තබන්නේ ය" යි.

5970. එකල්හි එය අසා සතුටු වූයෙමි මෙත්සිත් ඇත්තෙමි සිහියෙන් යුක්ත වූයෙමි ප්‍රඥාවත් වූයෙමි දිවි ඇති තාක් බුදුරජුන්හට පරිවරණය කෙළෙමි.

5971. මැනැවින් කරණලද එම කර්ම හෙතු කොට ගෙණ ද චිත්ත ප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද මම මිනිස්සිරුර හැර තව්තිසා දෙව්ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

5972 සතානං තීණික්ඛත්තුං ච දෙවරජ්ජමකාරයිං,
සතානං පඤ්චක්ඛත්තුං ච චක්කවත්තී අහොසහං.

5973. පදෙසරජ්ජං විපුලං ගණනාතො අසංඛියං,
සබ්බත්ථ සුඛිතො ආසිං තස්ස කම්මස්ස වාහසා

5974. පච්ඡිමභවෙ සම්පත්තෙ ගිරිබ්බජපුරුත්තමෙ,
ජාතො විප්පකුලෙ'හිද්ධෙ පිකලච්ඡාදනාසනෙ.

5975 කටච්ඡුභික්ඛා පාදාසිං සාරිපුත්තස්ස තාදිනො,
යදා ජිණ්ණො ච වුද්ධො ච තදා'රාමමුපාගමිං.

5976 පබ්බාජෙන්ති න මං කෙචි[1] ජිණ්ණං දුබ්බලථාමකං,
තෙන දීනො විවණ්ණඞ්ගො සොකී[2] වාසිං තදා අහං.

5977. දිස්වා මහාකාරුණිකො මමාහ සො මහාමුනී[3],
කිමත්ථං පුත්ත සොකට්ටො බ්‍රෑහි තෙ චිත්තජං රුජං.

5978. පබ්බජ්ජං න ලභෙ වීර ස්වාක්ඛාතෙ තව සාසනෙ,
තෙන සොකෙන දීනොස්මි සරණං හොහි නායක.

5979 තදා භික්ඛූ සමානෙත්වා ආපුච්ඡි මුනි සත්තමො,
ඉමස්ස අධිකාරං යෙ සරන්ති ව්‍යාහරන්තු තෙ

5980. සාරිපුත්තො තදාවොච කාරමස්ස සරාමහං,
කටච්ඡුභික්ඛං දාපෙසි පිණ්ඩාය චරතො මම.

5981. සාධු සාධු කතඤ්ඤූසි සාරිපුත්ත ඉමං තුවං,
පබ්බාජෙහි දිජං වුද්ධං හෙස්සතාජානියො අයං.

5982. තතො අලත්ථං පබ්බජ්ජං කම්මවාචොපසම්පදං,
න චිරෙනෙව කාලෙන පාපුණිං ආසවක්ඛයං.

5983. සක්කච්චා මුනිනො වාක්‍යං සුණොමි මුදිතො යතො,
පටිභානෙය්‍යකානග්ගං තතො මං ඨපයී ජිනො.

1. පබ්බජන්ති න මං කොචි, මජ්ස. 2 සොකො, මජ්සං
3 මමමාහ මහාමුනි, මජ්සං.

5972. මම තෙසියවරක් දිව්‍යරාජ්‍යය කරවීමි. පන්සිය වරක් සක්විති රජ වීමි.

5973. කරණලද මහත් වූ ප්‍රදෙශරාජ්‍යය ගණන් වශයෙන් මෙතෙකැයි ගිණිය නො හැකි ය. ඒ කර්මයාගේ බලයෙන් සියලු තන්හි සුව ඇත්තෙම් වීමි

5974. පශ්චිමභවය පැමිණි කල්හි උතුම් වූ ගිරිව්‍රජ නගරයෙහි දුලීභ වූ වස්ත්‍ර ද ආහාර ද ඇති සමෘද්ධ නො වූ බමුණු කුලයක උපන්නෙමි.

5975. තාදීගුණ ඇති සැරියුත් තෙරුන්හට හැන්දක් පමණ වූ පිණ්ඩ දානය දුනිමි. යම් කලෙක්හි මම ජීර්ණ වූයෙම් ද, වෘද්ධ වූයෙම් ද, එකල්හි ආරාමයට එළඹියෙමි.

5976. එකල්හි ජීර්ණ වූ දුර්වල ව ගිය බල ඇති මා කිසිවෙක් පැවිදි නො කරත්. එහෙයින් මම බැගෑපත් වූයෙම් දුර්වර්ණ සිරුරු ඇත්තෙම් ශොකී වූයෙම් ද වීමි.

5977. මහාකාරුණික වූ බුදුරජතෙම මා දැක මෙසේ වදාළේ ය: “පුත, කුමක් පිණිස සොවින් ආතුර වූයෙහි ද, ඔබගේ සිතෙහි හටගත් පිදුම (චිත්තපීඩාව) කුමක්දැයි කියනු මැනැවැ” යි.

5978. “වීරයන් වහන්ස, ස්වාඛ්‍යාත වූ ඔබවහන්සේගේ සසුනෙහි පැවිද්ද නො ලබන්නෙම් ඒ ශොකය හෙතු කොට ගෙණ බැගෑපත් වූයෙම් වෙමි. ලොකනායකයන් වහන්ස, මට පිහිට වනු මැනැවැ”යි රාධ කීය.

5979. එකල්හි විපස්සී බුදුරජුන් පටන් සත්වැනි වූ ගෞතම බුදුරජ තෙමේ භික්ෂූන් කැඳවා යම් කෙනෙක් මොහුගේ කිසියම් උපකාරයක් සිහිකෙරෙත් නම් ඔහු ඒ උපකාරය පවසත්ව යි වදාළේ ය.

5980. එකල්හි සැරියුත් තෙමේ මෙසේ කීය: “ඔහුගේ උපකාරයක් මම සිහි කරමි. (දිනක්) පිඬු පිණිස හැසිරෙන්නා වූ මට හේ හැන්දක් පමණ පිඬු දෙවී ය” කියා යි.

5981. සාධු, සාධු, ශාරිපුත්‍රයෙනි, ඔබ කළගුණ දන්නාව. මේ වෘද්ධ බ්‍රාහ්මණයා පැවිදි කරන්න. මෙතෙම ශ්‍රෙෂ්ඨයෙක් වන්නේ ය යි වදාළේ ය.

5982. ඉක්බිති පැවිද්ද ද, කර්මවාචා උපසම්පත්තිය ද ලැබීමි. නො බෝ කලකින් ම ආස්‍රවක්‍ෂයට (=නිවනට) පැමිණියෙමි.

5983 යම් විටෙක බුදුරජුන්ගේ වචනය මුදිත වූයෙම් සකසා අසම් ද එවිට බුදුරජතෙම මා පටිභානෙය්‍යක භික්ෂූන් අතුරෙන් අග්‍රය යි (අගතන්හි) තැබී ය.

5984. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

5985. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

5986. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා රාධො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

රාධත්ථෙරස්ස අපදානං නවමං.

540. මොඝරාජත්ථෙරාපදානං*

5987. පදුමුත්තරො නාම ජිනො සබ්බලොකවිදූ මුනි,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි චක්ඛුමා.

5988. ඔවාදකො විඤ්ඤාපකො තාරකො සබ්බපාණිනං,
දෙසනාකුසලො බුද්ධො තාරෙසි ජනතං බහුං.

5989. අනුකම්පකො කාරුණිකො හිතෙසී සබ්බපාණිනං,
සම්පත්තෙ තිත්ථියෙ සබ්බෙ පඤ්චසීලෙ පතිට්ඨපි.

5990. එවං නිරාකුලං ආසි සුඤ්ඤතං තිත්ථියෙහි ච,
විචිත්තං අරහන්තෙහි වසීභූතෙහි තාදිහි.

5991. රතනානට්ඨපඤ්ඤාසං උග්ගතො සො මහාමුනි,
කඤ්චනග්ඝිය සඞ්කාසො බත්තිංසවරලක්ඛණො.[1]

5992. වස්සසතසහස්සානි ආයු විජ්ජති තාවදෙ,
තාවතා තිට්ඨමානො සො තාරෙසි ජනතං බහුං.

5993. තදාහං හංසවතියං කුලෙ අඤ්ඤතරෙ අහුං,
පරකම්මායනෙ යුත්තො නත්ථි මෙ කිඤ්චි සංධනං.

5994. පටික්කමනසාලායං වසන්තො කතභූමියං,
අග්ගිමුජ්ජාලයිං තත්ථ දළ්හං කණ්හාසි සා[2] මහී.

5995. තදා පරිසතිං නාථො චතුසච්චප්පකාසකො,
සාවකං සම්පකිත්තෙසි ලූඛචීවරධාරකං.

* චතුත්ථවග්ගෙ අඤ්ඤං මොඝරාජාපදානං විජ්ජති. ථෙරගාථට්ඨකථායං තමෙව උද්ධරිත්වා දස්සිතං.

2. දළ්හං කණ්හ සියා, සීමු. දළ්හකණ්හා සියා, සයා.

1. බාත්තිංසවරලක්ඛණො, මජසං

5984. මා විසින් කෙලෙසයෝ දවන ලදහ සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

5985. බුදුරජනන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

5986. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජනන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් රාධ ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

රාධස්ථවිරාවදානය නවවැනියි.

540. මොඝරාජ ස්ථවිරාවදානය

5987. පසැස් ඇත්තා වූ සියලු ලොකයන් නත් වූ පරිදි දන්නාවූ පස්මරුන් ජයගත්තා වූ මොනෙය්‍යගුණ ඇති පදුමුත්තර නම් බුදු-රජ තෙමේ මෙයින් පෙර සියක්දහස් වන කපෙහි ලොව පහළ විය.

5988. සව්සත්නට ඔවා දෙන්නා වූ, දහම් පිළිවිදුවන්නා වූ සත්ත්වයන් සසරින් එතෙර කරන්නා වූ දෙශනාවෙහි දක්ෂ වූ බුදුරජතෙමේ බොහෝ ජනසමූහයා සසරින් එතෙර කරවී ය.

5989. සව්සත්නට අනුකම්පා කරන්නා වූ, කාරුණික වූ, හිත කැමැත්තා වූ ඒ බුදුරජ තෙම පැමිණි සියළු තීර්ථකයන් පන්සිල්හි පිහිටුවී විය.

5990. මෙසේ (ඒ කාලය) තීර්ථකයන්ගෙන් හිස් වූ, නිරවුල් වූ, තාදිගුණ ඇති (පඤ්ච වශිතාවන්ගෙන්) වශීභූත වූ රහතුන්ගෙන් විසිතුරු වූවක් වී ය.

5991. ඒ බුදුරජතෙම අටපණස්රියනක් උස ය. රත්ඇගෑයක් මෙන් බබලන්නේ ය. දෙතිස්මහපුරිස්ලකුණු ඇත්තේ ය.

5992. එකල්හි වර්ෂලක්ෂයක් ආයුෂ වෙයි. එ පමණ කල් වැඩසිටිමින් මේ සර්වඥතෙම බොහෝ ජනසමූහයා (සසරින්) එතෙර කෙළේ ය.

5993. එකල්හි මම හංසවතී නගරයෙහි එක්තරා කුලයක උපනිමි. අනුන්ගේ බැලමෙහෙ කිරීමෙහි යෙදුනේ වෙමි. මට කිසිදු ස්වකීය ධනයක් නැත.

5994. ආසන ශාලාවෙහි පිරියම් නො කළ බිම්හි වසන්නෙම් එහි ගිනි දල්වීමි. ඒ පොළොව දුඹිසේ කළු වී ය

5995. එකල්හි සිවුසස් පවසන්නා වූ බුදුරජතෙමේ පිරිස් මැදෙහි රළු සිවුරු දරන්නා වූ ස්ව්වකු පැසසී ය.

5996. තස්ස තමහි ගුණෙ තුට්ඨො පණිපච්ච[1] තථාගතං.
ලූඛචීවරධාරග්ගං පත්ථෙසිං ඨානමුත්තමං.

5997. තදා අවොච භගවා සාවකො පදුමුත්තරො,
පස්සථෙතං පුරිසකං කුචෙලං තනුදෙහකං.

5998. පීතිපසන්නවදනං සද්ධාධනසමන්විතං,
උද්ධග්ගතනුජං හට්ඨං අචලං සාලපිණ්ඩිකං[2].

5999. එසො පත්ථෙති තං ඨානං සච්චසෙනස්ස භික්ඛුනො,
ලූඛචීවරධාරිස්ස තස්ස වණ්ණගතාසයො.[3]

6000. තං සුත්වා මුදිතො හුත්වා නිපච්ච සිරසා ජිනං,
යාවජීවං සුභං කම්මං කරිත්වා ජිනසාසනෙ

6001. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසූපගො අහං.

6002. පටික්කමනසාලායං භූමිදහකකම්මුනා,
සමිසහස්සං නිරයෙ අදය්හං වෙදනට්ටිතො

6003. තෙන කම්මාවසෙසෙන පඤ්චජාතිසතානහං,
මනුස්සො කුලජො හුත්වා ජාතියා ලක්ඛණඞ්කිතො.

6004. පඤ්චජාතිසතානෙව කුට්ඨරොගසමප්පිතො,
මහාදුක්ඛං අනුභවිං තස්ස කම්මස්ස වාහසා.

6005. ඉමස්මිං භද්දකෙ කප්පෙ උපරිට්ඨං යසස්සිනං,
පිණ්ඩපාතෙන තප්පෙසිං පසන්නමානසො අහං.

6006. තෙන කම්මවිසෙසෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

6007. පච්ඡිමභවෙ සම්පත්තෙ අජායිං ඛත්තියෙ කුලෙ,
පිතුනො අච්චයෙනාහං මහාරජ්ජසමප්පිතො

6008. කුට්ඨරොගාභිභූතොහං න රතිං න සුඛං ලභෙ,
මොඝා රජ්ජසුඛං[4] යස්මා මොඝරාජා තතො අහං.

6009. කායස්ස දොසං දිස්වාන පබ්බජිං අනගාරියං,
බාවරිස්ස දිජග්ගස්ස සිස්සත්තං අජ්ඣුපාගමිං.

6010. මහතා පරිවාරෙන උපෙච්ච නරනායකං,
අපුච්ඡිං නිපුණං පඤ්හං තං වීරං වාදිසූදනං.

1 පතිපජ්ජ, සයා
2. සාලපිණ්ඩිතං, මජසං
3. වණ්ණසිතාසයො, මජසං.
4. රජ්ජං සුඛං, මජසං.

5996. මම ඔහුගේ ඒ ගුණයෙහි සතුටු වූයෙම් තථාගතයන් නැමී වැඳ රූක්ෂචීවරධාරී භික්ෂූන් අතුරෙන් අග්‍ර වූ උතුම් තනතුර පැතීමි.

5997 - 5998 - 5999. එකල්හි පදුමුත්තර බුදුරජ තෙමේ සව්වනට මෙසේ වදාළේ ය: 'වැරහැලි වූ වස්ත්‍ර ඇති, සිහින් සිරුරු ඇති මෙපුරිස් බලවු. ප්‍රීතියෙන් පැහැදුනු මුහුණු ඇති, ශ්‍රද්ධාධනයෙන් යුත්, ඌර්ධ්වාග්‍ර වූ රොම ඇති, සතුටු වූ, නිශ්චල වූ, සාලපිණ්ඩ ඇති මෙතෙම රූක්ෂචීවර ධාරී වූ **සත්‍යසෙන** නම් භික්ෂුහුගේ ඒ වර්ණයට (ආකාරයට) ඇදීගිය සිත් ඇත්තේ ඒ තනතුර පතා' යි

6000. එය අසා තුටු වූයෙම් හිස නමා බුදුරජුන් වැඳ බුදුසසුන්හි දිවි ඇති තාක් යහපත් වූ කම් කොට -

6001. මම මැනැවින් කරණලද එම කර්මය හෙතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හෙතුකොට ගෙණ ද මිනිස්සිරුර හැර තව්තිසා දෙව් ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙම් වෙමි.

6002. ආසනශාලාවෙහි බිම දැවීමේ කර්මය හෙතු කොට ගෙණ දුක් වේදනාවෙන් පීඩිත වූයෙම් සම සහස්‍රවර්ෂයක් (=අවුරුදු දහසක්) නිරයෙහි දැවුනෙමි.

6003. මම ශෙෂ වූ ඒ කර්මයෙන් පන්සියයක් ජාතීන්හි කුලවත් මිනිසෙක් ව උපතින් ම සිරුරෙහි ලප ඇත්තෙක් වීමි.

6004. පන්සියයක් ම ජාතීන්හි කුෂ්ටරොගයෙන් ආතුර වූයෙම් ඒ කර්මයාගේ බලයෙන් මහත් දුක් වින්දෙමි.

6005. පැහැදි සිත් ඇති මම මේ භද්‍රකල්පයෙහි යසස් ඇති **උපරිට්ඨ** (පසේ බුදුරජුන්) පිණ්ඩපාතයෙන් තර්පණය කෙළෙමි.

6006. ඒ විශෙෂ කර්මය හෙතු කොට ගෙණ ද චිත්තප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද, මම මිනිස්සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

6007. පශ්චිම භවය පැමිණි කල්හි කැත්කුලෙහි උපනිමි. පියාගේ ඇවෑමෙන් මම මහරජයට පැමිණියෙම් වෙමි.

6008. මම කුෂ්ටරොගයෙන් මැඩුනෙම් ආස්වාදයක් සුවයක් නො ලබමි. යම් හෙයකින් මගේ රජසුවය හිස් වූවක් විද එහෙයින් මම **මොඝරාජ** නම් වීමි

6009. ශරීරයාගේ දෙස් දැක පැවිද්දට පැමිණියෙමි. **බාවාරි** නම් ශ්‍රෙෂ්ඨ බ්‍රාහ්මණයාගේ ශිෂ්‍යයකු බවට පැමිණියෙමි.

6010. මහත් වූ පිරිවර සහිතව බුදුරජුන් වෙත එළඹ වාදීන් මඩින්නා වූ ඒ වීරයන් වහන්සේගෙන් සියුම් ප්‍රශ්නයක් විචාළෙමි.

6011. අයං ලොකො පරො ලොකො බ්‍රහ්මලොකො සදෙවකො,
දිට්ඨිං[1] තෙ නාභිජානාති[2] ගොතමස්ස යසස්සිනො.

6012. එවාභික්කන්තදස්සාවිං අත්ථි පඤ්හෙන ආගමං,
කථං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති.

6013. සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු මොඝරාජ සදා සතො,
අත්තානුදිට්ඨිං ඌහච්ච එවං මච්චුතරො සියා.

6014. එවං ලොකං අවෙක්ඛන්තං මච්චුරාජා න පස්සති,
ඉති මං අභණී බුද්ධො සබ්බරොගතිකිච්ඡකො.

6015. සහ ගාථාවසානෙන කෙසමස්සුවිවජ්ජිතො,
කාසාවවත්ථවසනො ආසිං භික්ඛු තථාරහා.

6016. සංඝිකෙසු විහාරෙසු න වසිං රොගපීළිතො,
මා විහාරො පදුස්සීති වාතරොගෙහි පීළිතො.[3]

6017. සංකාරකූටා ආහිත්වා[4] සුසානා රථිකාහි ච,
තතො සංඝාටිකං කත්වා ධාරයිං ලූඛචීවරං.

6018. මහාභිසක්කො තස්මිං මෙ ගුණෙ තුට්ඨො විනායකො,
ලූඛචීවරධාරීනං එතදග්ගෙ ඨපෙසි මං.

6019 පුඤ්ඤපාපපරික්ඛීණො සබ්බරොගවිවජ්ජිතො,
සිඛීව අනුපාදානො නිබ්බායිස්සමනාසවො.

6020. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6021. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6022. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා මොඝරාජත්ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

මොඝරාජත්ථෙරස්ස අපදානං දසමං.

කච්චානවග්ගො චතුපඤ්ඤාසමො.

---

1. දිට්ඨිං තෙ, මජසං දිට්ඨං තෙ, PTS. සීමු.
2 නාභිජානාමි, සීමු. මජසං. සභා.
3. ව.ච.යාභිසුපීළිතො, සභා. PTS.
4. ආහත්වා, සීමු.

6011 මේ මිනිස් ලෝ වැසියා ද එසින් අන් ලෝවැසියා ද දෙවියන් සහිත බඹ ලෝ වැසියා ද යසස්වී වූ ගෞතම ගොත්‍ර ඇති මුඹවහන්සේගේ දෘෂ්ටිය නො දනී.

6012. මෙසේ පරමදර්ශී වූ සඞ්ඝයන් කරා ප්‍රශ්න හෙතුයෙන් අර්ථි වැ ආයෙමි. ලොව කෙසේ බලන්නාහු මෘත්‍යුරාජ තෙමේ නො දකී ද?

6013 – 6014. "මොඝරාජ, හැමකල්හි සිහි ඇත්තේ සත්කායදෘෂ්ටිය නැති කොට (වසඟයෙහි නො පවත්නා බැවින් හෝ සංස්කාරයන්ගේ අසාර බැවින්) ශූන්‍ය (=හිස්) වූවක් ලෙස ලොකය දෙස බලනු මැනැව. මෙසේ (විදසුන් නැණින්) ලොව බලන්නේ මාරයා ඉක්ම යන්නේ වේය" යි සියලු සසර රොගයනට වෛද්‍යවරයා වූ බුදුරජතෙම මට මෙසේ වදාළේ ය

6015. ගාථාව දෙසා අවසන් වත්ම කෙස් රැවුල් විරහිත වූයෙමි කසාවත් හැඳුනෙම් එබඳු වූ රහත් භික්ෂුනමක් වීමි.

6016. (කුෂ්ට) රොගයෙන් පෙළුනා වූ මම වාතරොගයකිනුදු පීඩිත වූයෙමි "විහාරය කිලිටි නො වේවා" යි සඞ්ඝික විහාරයන්හි නො විසීමි.

6017. කසලගොඩින් ද, සොහොනින් ද, වීදිවලින් ද රෙදිකැබලි ගෙනවුත් එසින් සඟල සිවුරක් කොට රුක්ෂචීවරයක් දැරීමි.

6018. මාගේ ඒ ගුණයෙහි සතුටු වූ සසරලෙඩට අග්‍රවෛද්‍ය වූ ලොකනායක බුදුරජතෙමේ මා රූක්ෂචීවරධාරීන් අතුරෙන් ආග්‍රය යි එතදග්‍රස්ථානයෙහි තැබී ය.

6019. ක්ෂීණවූ පුණ්‍යපාප ඇත්තෙම් සියලු රොගයන්ගෙන් වෙන් වූයෙම් දර නො මැති ගින්නක් මෙන් ආස්‍රව රහිත ව පිරිනිවන් පාන්නෙමි.

6020. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

6021. බුදුරජාන්න් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් භද්‍ර විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

6022. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් මොඝරාජ ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

මොඝරාජ ස්ථවිරාපදානය දසවැනියි.

උද්දානං:

කච්චානො වක්කලී ථෙරො මහාකප්පිනසව්හයො
දබ්බො කුමාරනාමො ච බාහියො කොට්ඨිතො වසී
උරුවෙලකස්සපො රාධො මොඝරාජා ච පණ්ඩිතො
තීණි ගාථාසතානෙත්ථ ඡාසට්ඨි චෙව පිණ්ඩිතා

541. ලකුණ්ටකභද්දියත්ථෙරාපදානං

6023. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මෙසු චක්ඛුමා,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

6024. තදාහං හංසවතියං සෙට්ඨිපුත්තො මහාධනො,
ජඞ්ඝාවිහාරං විචරං සංඝාරාමමගච්ඡහං[1].

6025. තදා සො ලොකපජ්ජොතො ධම්මං දෙසෙසි නායකො,
මඤ්ජුස්සරානං පවරං සාවකං අභිකිත්තයී.

6026. තං සුත්වා මුදිතො හුත්වා කාරං කත්වා මහෙසිනො,
වන්දිත්වා සත්ථුනො පාදෙ තං ඨානමභිපත්ථයිං.

6027. තදා බුද්ධො වියාකාසි සංඝමජ්ඣෙ විනායකො,
අනාගතම්හි අද්ධානෙ ලච්ඡසෙ තං මනොරථං.

6028. සතසහස්සෙ ඉතො[2] කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති

6029. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
භද්දියො නාම නාමෙන හෙස්සති සත්ථු සාවකො.

6030. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

6031. ඡානවුතෙ[3] ඉතො කප්පෙ ඵුස්සො උප්පජ්ජි නායකො,
දුරාසදො දුප්පසහො සබ්බලොකුත්තමො ජිනො.

6032. චරණෙන ච සම්පන්නො බ්‍රහා උජු පතාපවා,
හිතෙසී සබ්බපාණීනං[4] බහුං[5] මොචෙසි බන්ධනා.

1 සඞ්ඝාරාමං අගච්ඡහං, මජසං. 2 සතසහස්සිතො, මජසං.
3. දෙවනවුතෙ, මජසං. 4. සබ්බසත්තානං, මජසං. 5. බහූ, මජසං.

උද්දානය:

කච්චාන, වක්කලි ථෙර, මහා කප්පින නම් දූරු,
දබ්බ, කුමාරකස්සප, බාහිය, වසී කොට්ඨිත,
උරුවෙලකස්සප, රාධ, පණ්ඩිත මොඝරාජ ද,
තෙසිය දෙසැටගයෙක් මෙම වග පිඬු වී ඇත.

කච්චාන වර්ගය සිවුපණස් වැනියි

541. ලකුණ්ටකභද්දියස්ථවිරාපදානය

6023. මෙයින් පෙර සියක් දහස්වන කපෙහි සියළු ධර්මයෙහි විෂය (විනිවිද දක්නා) ඇස් ඇත්තා වූ ලොකනායක වූ පදුමුත්තර නම් බුදුරජතෙමේ ලොව පහළ විය.

6024. එකල්හි මම හංසවතී නගරයෙහි මහත් ධන ඇති සිටුපුතෙක් වීමි. ඒ මම ජඞ්ඝාවිහාරයෙහි (සක්මණෙහි) හැසිරෙන්නෙම් සඞ්ඝාරාමයට ගියෙමි.

6025. එකල්හි ලොවට පහත් වූ ලොකනායක ඒ බුදුරජ තෙම දහම් දෙසී ය. මධුරස්වර ඇතියවුන් අතුරෙන් අග්‍ර වූ ශ්‍රාවකයකු පැසසී ය.

6026. එය අසා සතුටු වූයෙම් මහර්ෂි වූ බුදුරජුන්හට සත්කාර කොට ඒ ශාස්තෘන් වහන්සේගේ සිරිපා වැඳ ඒ තනතුර පැතීමි.

6027. එකල්හි ශ්‍රෙෂ්ඨ නායක වූ බුදුරජතෙම සඞ්ඝයා මධ්‍යයෙහි දී "මතුකාලයෙහි තෙල මනොරථය සමෘද්ධ වන්නේ ය" යි ප්‍රකාශ කෙළේ ය:

6028. මෙයින් මතු සියක්දහස්වන කපෙහි ඔක්කාක කුලයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් වූ ශාස්තෘතෙමේ ලොව පහළ වන්නේ ය.

6029. උන් වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිත කලාක් වැනි වූ ඖරස පුත්‍ර වූ නමින් භද්දිය නම් වූ ශාස්තෘශ්‍රාවකයෙක් වන්නේ ය

6030. මැනැවින් කරණලද ඒ කර්මය හෙතු කොට ගෙණ ද, චිත්ත ප්‍රණිධීන් හෙතුකොට ගෙණ ද, මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව් ලොවට උත්පත්තිවශයෙන් ගියෙමි.

6031-6032. මෙයින් පෙර දෙයානූවන කපෙහි ගුණයෙන් කිසිවකුටත් ගැටිය නො හෙන්නා වූ, මැඩලිය නො හෙන්නා වූ, සව්ලෝ මුදුන් වූ පස්මරුන් ජයගත්තා වූ (පසළොස්) මරණධර්මයන්ගෙන් ශූන්‍ය වූ, මහත් වූ සෘජු ප්‍රතාපගුණ ඇති ඵුස්ස නම් බුදුරජතෙමේ ලොව පහළ වී ය. සව්සත්නට හිත කැමැත්තා වූ ඒ බුදුරජ තෙම බොහෝ ජනයා සසර බැඳුමෙන් මිදී ය.

6033. නන්දාරාමවනෙ තස්ස අහොසිං ඵුස්සකොකිලො,[1]
ගන්ධකුටිසමාසන්නෙ අම්බරුක්ඛෙ වසාමහං.

6034. තදා පිණ්ඩාය ගච්ඡන්තං දක්ඛිණෙය්‍යං ජිනුත්තමං,
දිස්වා චිත්තං පසාදෙත්වා මඤ්ජුනාදෙන කූජහං.[2]

6035. රාජුය්‍යානං තදා ගන්ත්වා සුපක්කං කනකත්තචං,
අම්බපිණ්ඩිං[3] ගහෙත්වාන සම්බුද්ධස්සොපනාමයිං.

6036. තදා මෙ චිත්තමඤ්ඤාය මහාකාරුණිකො ජිනො,
උපට්ඨාකස්ස හත්ථතො පත්තං පග්ගණ්හි නායකො.

6037. අදාසිං තුට්ඨචිත්තො’හං[4] අම්බපිණ්ඩිං මහාමුනෙ,
පත්තෙ පක්ඛිප්ප පක්ඛෙහඤ්ජලිං කත්වාන මඤ්ජුනා

6038. සරෙන රජනීයෙන සවණීයෙන වග්ගුනා,
වස්සන්තො බුද්ධපූජත්ථං නීළං[5] ගන්ත්වා නිපජ්ජහං.

6039. තදා මුදිතචිත්තං මං බුද්ධපෙමගතාසයං,
සකුණග්ඝි උපාගන්ත්වා ඝාතයී දුට්ඨමානසො.

6040. තතො චුතොහං තුසිතෙ අනුභොත්වා මහාසුඛං,
මනුස්සයොනිමාගච්ඡිං තස්ස කම්මස්ස වාහසා.

6041. ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො,
කස්සපො නාම ගොත්තෙන උප්පජ්ජි වදතංවරො.

6042. සාසනං ජොතයිත්වා සො අභිභුය්‍ය කුතිත්ථියෙ,
විනයිත්වාන වෙනෙය්‍යෙ නිබ්බුතො සො සසාවකො.

6043. නිබ්බුතෙ තම්හි ලොකග්ගෙ පසන්නා ජනතා බහු,
පූජනත්ථාය බුද්ධස්ස ථූපං කුබ්බන්ති සත්ථුනො.

6044. සත්තයොජනිකං ථූපං සත්තරතනභූසිතං,
කරිස්සාම මහෙසිස්ස ඉච්චෙවං මන්තයන්ති තෙ.

6045. කිකිනො කාසිරාජස්ස තදා සෙනාය නායකො,
හුත්වාහං අප්පමාණස්ස පමාණං චෙතියෙ වදිං.

6046. තදා තෙ මම වාක්‍යෙන චෙතියං යොජනුග්ගතං,
අකංසු නරවීරස්ස නානාරතනභූසිතං.

6047. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

---

1. පුස්සකොකිලො, සයා. 2. මඤ්ජුනාභිනිකූජහං, මජසං.
3. අම්බපිණ්ඩං, මජසං. 4. හට්ඨචිත්තොහං, මජසං. 5. නිඩ්ඩං, සයා PTS.

6033. උත්වහන්සේගේ නන්දාරාම නම් රාජෝද්‍යානයෙහි ඵුස්ස නම් වූ කෝකිලයෙක් වීමි. ඒ මම ගඳකිලිය අබියස අඹරුකෙක්හි වසමි.

6034. එකල්හි මම පිඬුපිණිස වඩනා වූ දක්ෂිණාර්හ වූ බුදුරජුන් දුටු සිත පහදවා මිහිරි නදින් හැඬීමි.

6035. එකල්හි රජඋයනට ගොස් රත්වන් වූ පිට සිවි ඇති මොනොවට ඉදුනු අඹගෙඩියක් ගෙණ සම්බුදුරජුන්හට පිරිණැමීමි.

6036. එකල්හි ලොකනායක වූ මහාකාරුණික වූ බුදුරජතෙම මාගේ අදහස දැන උපස්ථායකයා අතින් පාත්‍රය ගත්තේ ය.

6037 – 6038. මම සතුටු සිත් ඇත්තෙම් අඹගෙඩිය බුදුරජුන්හට දුනිමි. එය පාත්‍රයෙහි බහා පියාපතින් ඇඳිලි බැඳ සිත් අලවන්නා වූ මනොඥ වූ මිහිරි වූ ශ්‍රවණීය වූ ස්වරයෙන් බුදුපුද පිණිස හඬලමින් මම කැදැල්ලට ගොස් හොත්තෙමි.

6039. එකල්හි බුද්ධාලම්බනප්‍රීතිසහගත සිත් ඇති ප්‍රමුදිත වූ මා වෙත දුෂ්ට සිත් ඇති උකුස්සෙක් පැමිණ මා නැසී ය.

6040. මම එසිත් සැව ඒ කර්මයාගේ බලයෙන් තුෂිත දෙව්ලොව මහත් සැප අනුභව කොට මිනිසත් බවට පැමිණියෙමි.

6041. මෙම මහාභද්‍රකල්පයෙහි බ්‍රාහ්මණ වංශයෙහි වූ මහත් යශස් ඇති, වාදීන් අතුරෙන් ශ්‍රේෂ්ඨ වූ ගොත්‍රයෙන් කාශ්‍යප නම් වූ බුදුරජතෙම ලොව පහළ විය.

6042. උත්වහන්සේ සසුන බබුළුවා මිථ්‍යාතීර්ථකයන් මැඩ විනෙය-ජනයන් හික්මවා ශ්‍රාවකයන් සහිත වූ ඒ බුදුරජානන්වහන්සේ පිරිනිවි සේක.

6043. උත්වහන්සේ පිරිනිවි කල්හි පැහැදුනා වූ බොහෝ දෙන ඒ ශාස්තෘ වූ බුදුරජානන් වහන්සේට පූජා පිණිස සෑයක් කරවත්.

6044. මහර්ෂි වූ බුදුරජුන්හට සත්රුවනින් අලඞ්කෘත වූ සත්යොදුන් සෑයක් කරන්නෙමු' යි මෙසේ ඔහු මන්ත්‍රණය කරත්.

6045. එකල්හි මම කිකිනම් කාසිරජුගේ සෙනාවෙහි නායක ව චෛත්‍යයෙහි ප්‍රමාණය අප්‍රමාණ (විශාල) බව කීමි.

6046. එකල්හි මාගේ වචනය නිසා ඔහු බුදුරජුන්ගේ චෛත්‍යය (සත් යොදුනක් නොව) යොදුනක් උසට නොයෙක් රත්නයෙන් අලඞ්කාර කොට කළාහුය.

6047. මැනැවින් කරණලද ඒ ධර්මය හෙතු කොට ගෙණ ද, චිත්ත ප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද, මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්-ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

6048. පච්ඡිමෙ ච භවෙ' දානි ජාතො සෙට්ඨිකුලෙ අහං,
සාවත්ථියං පුරවරෙ ඉද්ධෙ ඵීතෙ මහද්ධනෙ.

6049. පුරප්පවෙසෙ සුගතං දිස්වා විම්හිතමානසො,
පබ්බජිත්වාන න චිරං අරහත්තමපාපුණිං.

6050. චෙතියස්ස පමාණං යං අකරිං තෙන කම්මුනා,
ලකුණ්ටකසරීරොහං ජාතො පරිභවාරහො.

6051. සරෙන මධුරෙනාහං පූජෙත්වා ඉසිසත්තමං,
මඤ්ජුස්සරානං භික්ඛූනං අග්ගත්තමනුපාපුණිං.

6052. ඵලදානෙන බුද්ධස්ස ගුණානුස්සරණෙන ච,
සාමඤ්ඤඵලසම්පන්නො විහරාමි අනාසවො.

6053. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොʼව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6054. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6055. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා ලකුණ්ටකභද්දියො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ලකුණ්ටකභද්දියත්ථෙරස්ස අපදානං පඨමං.

512. කඞ්ඛාරෙවතත්ථෙරාපදානං

6056. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මෙසු චක්ඛුමා,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

6057. සීහහනු බ්‍රහ්මගිරො හංසදුන්දුභිනිස්සරො[1],
නාගවික්කන්තගමනො චන්දසූරාධිකප්පභො[2].

6058. මහාමතී මහාවීරො මහාඣායී මහාබලො,[3]
මහාකාරුණිකො නාථො මහාතමපනූදනො[4].

1. හංසදුන්දුභිනිස්සනො, මජසං. - නිස්සාවනො, සයා. - නිස්සවනො, PTS
2. චන්දසූරාදිකප්පභො, මජසං. 3. මහාගති, සයා. මහාහිතො, PTS.
4. මහාතමවිධංසනො, සයා මහාතමනිසූදනො, PTS.

6048. මම දැන් මේ පශ්චිම භවය පැමිණි කල්හි සැවැත් පුරවරයෙහි සමෘද්ධ වූ පිරුණා වූ මහත් ධන ඇති සිටුකුලයෙක උපන්නෙමි.

6049 නුවරදෙර බුදුරජුන් දැක විස්මය පත් සිත් ඇත්තෙම් පැවිදිව නොබෝ කලකින්ම රහත් බවට පැමිණියෙමි.

6050. චෛත්‍යයාගේ (විශාලත්වය අඩු කොට) යම් ප්‍රමාණයක් කෙළෙම් ද, ඒ කර්මය හෙතුකොට ගෙණ මම නිකුවට සුදුසු වූ මිටි සිරුරු ඇත්තෙම් වීමි.

6051. මම මධුර ස්වරයෙන් බුදුරජුන් පුදා මධුරස්වර ඇති භික්ෂූන් අතුරෙන් අගතැන්පත් බවට පැමිණියෙමි.

6052. බුදුරජුන්හට අඹපල දීමෙන් ද බුදුගුණ සිහිකිරීමෙන් ද (මාර්ගඵල සඞ්ඛ්‍යාත) ශ්‍රාමණ්‍ය ඵලයන්ගෙන් යුක්ත වූයෙමි ආශ්‍රව රහිත ව වෙසෙමි.

6053. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිත ව වෙසෙමි.

6054. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

6055 සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් ලකුණ්ටකභද්දිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක.

ලකුණ්ටකභද්දියස්ථවිරාවදානය පළමුවැනියි.

542. කඞ්ඛාරේවත ස්ථවිරාවදානය

6056. මෙයින් සියක් දහස්වන කපෙහි සියලු ධර්මයන් විෂයයෙහි (විනිවිද දක්නා සුලු) නුවණැස් ඇති ලොකනායක වූ පදුමුත්තර බුදුරජ තෙමේ ලොව පහළ විය.

6057. (ඒ සර්වඥ තෙම) සිංහයකුගේ හණු බඳු පිරුණු හණු ඇත්තේ ය. (අෂ්ටාඞ්ගසමුපෙත) බ්‍රහ්මස්වර ඇත්තේ ය. හස්බෙර හඬ බඳු හඬ ඇත්තේය. හස්තියෙකුගේ ගමනට බඳු ගමන් ඇත්තේය. සඳහිරු පැහැයට අධික වූ පැහැ ඇත්තේ ය.

6058. මහනුවණැත්තේ ය. මහාවීර්‍ය ඇත්තේ ය. මහත් වූ ධ්‍යාන ඇත්තේ ය. මහත් බල ඇත්තේ ය. මහා කරුණා ඇත්තේ ය. අනාථ-යනට නාථ ය. මහත් වූ මොහඳුර නසන්නේ ය.

6059. සකඤ්ච තිලොකග්ගො වෙනෙය්‍යෙ විනයං බහු,[1]
ධම්මං දෙසෙසි සම්බුද්ධො සත්තාසයවිදූ මුනි.

6060. ඣායිං ඣානරතං වීරං උපසන්තං අනාවිලං,
වණ්ණයන්තො පරිසතිං තොසෙසි[2] ජනතං ජිනො.

6061. තදාහං හංසවතියං බ්‍රාහ්මණො වෙදපාරගූ,
ධම්මං සුත්වාන මුදිතො තං ඨානමභිපත්ථයිං.

6062. තදා ජිනො වියාකාසි සඞ්ඝමජ්ඣෙ විනායකො,
මුදිතො හොහි ත්වං බ්‍රහ්මෙ ලච්ඡසෙ තං මනොරථං.

6063. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති

6064. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
රෙවතො නාම නාමෙන හෙස්සසි[3] සත්ථුසාවකො.

6065. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

6066. පච්ඡිමෙ ච භවෙ දානි ජාතොහං කොලියෙ පුරෙ,
ඛත්තියෙ කුලසම්පන්නෙ ඉද්ධෙ ඵීතෙ මහද්ධනෙ.

6067. යදා කපිලවත්ථුස්මිං බුද්ධො ධම්මමදෙසයි,
තදා පසන්නො සුගතෙ පබ්බජිං අනගාරියං.

6068. කඞ්ඛා මෙ බහුලා ආසි කප්පාකප්පෙ තහිං තහිං,
සබ්බං තං විනයී බුද්ධො දෙසෙත්වා ධම්මමුත්තමං.

6069. තතොහං තිණ්ණසංසාරො සදා ඣානසුඛෙ රතො,
විහරාමි තදා බුද්ධො මං දිස්වා එතදබ්‍රවි:

6070. යා කාචි කඞ්ඛා ඉධ වා හුරං වා,
සකවෙදියා වා පරවෙදියා වා;
යෙ ඣායිනො තා පජහන්ති සබ්බා
ආතාපිනො බ්‍රහ්මචරියං චරන්තා.

1. බහුං, මජසං. 2. තොසෙති, ස්‍යා. PTS. 3. හෙස්සති, මජසං.

6059. සත්ත්වයන්ගේ ආශයානුශය දන්නා වූ, තිලොවට අග්‍ර වූ මොනෙය්‍ය ගුණයුත් ඒ සම්බුදු රජතෙම කිසි කලෙක්හි බොහෝ වෛනෙය ජනයන් තික්මවමින් දහම් දෙසී ය.

6060 ඒ බුදුරජතෙමේ ධ්‍යාන කරණසුලු වූ ධ්‍යානයෙහි ඇලුනා වූ උපශාන්ත වූ නො කැලඹුනා වූ වීර වූ ශ්‍රාවකයෙකු පිරිස් මැදදී (ධ්‍යාන-කරන්නවුනට අග්‍ර ය යි.) වර්ණනා කරමින් ජනසමූහයා සතුටු කරවී ය.

6061. එකල්හි මම හංසවතී නගරයෙහි වෙදයෙහි තෙරපත් බමුණෙක් වීමි. ඒ ධර්මය අසා සතුටු වූයෙමි එකී තනතුර පැතීමි.

6062. එකල්හි විශිෂ්ට නායක වූ බුදුරජ තෙමේ සඟමැද (මෙසේ) පැවසී ය: "බමුණ, තුටු වනු මැනව. ඒ චිත්තාභිලාෂය (සමෘද්ධව) ලබ-නෙහි ය.

6063. මෙයින් මතු සියදහස් වන කපෙහි ඔක්කාක කුලයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

6064. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිත කලාක් වැනි වූ ඖරස පුත්‍ර වූ නමින් රේවත නම් වූ ශාස්තෘශ්‍රාවකයෙක් වන්නේ ය.

6065. මැනවින් කරණ ලද ඒ කර්මය හෙතු කොට ගෙණ ද චිත්ත ප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද, මම මිනිස් සිරුර හැර තව්තිසාවට උත්පත්ති වශයෙන් ගියෙමි.

6066. මම දූත් පශ්චිමභවය පැමිණි කල්හි කොලිය නගරයෙහි කුලවත් වූ සමෘද්ධ වූ සම්පූර්ණ වූ මහත් ධන ඇති ක්‍ෂත්‍රියවංශයෙහි උපන්මි.

6067. යම් කලෙක්හි (ගෞතම) බුදුරජතෙමේ කපිලවාස්තුනගර-යෙහි දහම් දෙසී ද, එකල්හි බුදුරජුන් කෙරෙහි පැහැදුනෙම් අනගාරිය සඞ්ඛ්‍යාත පැවිද්දට පැමිණියෙමි.

6068. ඒ ඒ තන්හි දී කැප - නො කැප දූයෙහි මාගේ සැකය බහුල විය. බුදුරජහු උතුම් දහම් දෙසා ඒ (වැරදිඅදහස්) සියල්ල නැති කළසේක.

.6069 ඉක්බිති මම තරණය කරණ ලද සසර සයුරු ඇත්තෙම් හැම කල්හි දූහැන්සුවයෙහි ඇලුනෙම් වෙසෙමි. එකල්හි බුදුරජහු මා දූක මෙය වදාළසේක:

6070. ධ්‍යාන කරන්නා වූ කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්ත වූ බඹ සරෙහි හැසිරෙන්නා වූ යම් කෙනෙක් වෙත් නම් (ඔහු) මෙලෙව්හි හෝ පරලෙව්හි හෝ යම්කිසි සැකයක් වේ ද, ඒ සියල්ල සිය දූනුමෙන් හෝ මෙරමා දූනුමෙන් හෝ දුරු කෙරෙත්.

6071. සතසහස්සෙ කතං කම්මං ඵලං දස්සෙසි මෙ ඉධ,
සුමුත්තො සරවෙගොව කිලෙසෙ ඣාපයී[1] මම.

6072. තතො ඣානරතං දිස්වා බුද්ධො ලොකන්තගූ මුනි,
ඣායීනං භික්ඛූනං අග්ගො පඤ්ඤපෙසි[2] මහාමති

6073. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6074. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6075. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා කඞ්ඛාරෙවතො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

කඞ්ඛාරෙවතත්ථෙරස්ස අපදානං දුතියං.

543. සීවලිත්ථෙරාපදානං

6076. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මෙසු චක්ඛුමා,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

6077. සීලං තස්ස අසඞ්ඛෙය්‍යං සමාධි වජිරූපමො,
අසඞ්ඛෙය්‍යං ඤාණවරං විමුත්ති ච අනූපමා.

6078. මනුජාමරනාගානං බ්‍රහ්මානං ච සමාගමෙ,
සමණබ්‍රාහ්මණාකිණ්ණෙ ධම්මං දෙසෙසි නායකො.

6079. සසාවකං මහාලාභිං පුඤ්ඤවන්තං ජුතින්ධරං,
ඨපෙසි එතදග්ගම්හි පරිසාසු විසාරදෙ.

6080. තදාහං ඛත්තියො ආසිං නගරෙ හංසවතියෙ,
සුත්වා ජිනස්ස තං වාක්‍යං සාවකස්ස ගුණං බහුං.

6081. නිමන්තයිත්වා සත්තාහං භොජයිත්වා සසාවකං,
මහාදානං දදිත්වාන තං ඨානමභිපත්ථයිං.

6082. තදා මං විනතං පාදෙ දිස්වාන පුරිසාසභො,
සුස්සරෙන මහාවීරො ඉදං වචනමබ්‍රවී:

1. ඣාපයිං, මජසං. 2. පඤ්ඤපෙති, මජසං.

6071. මෙයින් සියක්දහස් වන කපෙහි කරණ ලද මාගේ කර්මය මෙහි දී විපාක දක්වී ය. දුන්නෙන් මනාව මිදීගිය හීසැරයක් මෙන් මාගේ කෙලෙස් දැවී ය.

6072. ඉක්බිති ලෝකාන්තයට ගිය මෞනෙය්‍ය ගුණ යුත් මහනුවණැති බුදුරජ තෙම ධ්‍යානයෙහි ඇලුනා වූ මා දැක ධ්‍යාන කරන්නා වූ භික්ෂූන් අතුරෙන් අග්‍ර යයි (අග්‍රස්ථානයෙහි) තැබී ය.

6073. මා විසින් ක්ලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිත ව වෙසෙමි.

6074. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

6075. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් කඞ්ඛාරෙවත ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

කඞ්ඛාරෙවත ස්ථවිරාපදානය දෙවැනි යි.

543. සීවලිස්ථවිරාපදානය

6076. මෙයින් සියක්දහස් වන කපෙහි ලෝකනායක වූ සියලු ධර්මයන්හි (විනිවිද දක්නා සුලු) නුවණැස් ඇති පදුමුත්තර නම් බුදුරජ තෙම ලොව පහළ විය.

6077. උන්වහන්සේගේ ශීලය සංඛ්‍යා රහිත ය. සමාධිය (බිඳිය නොහැකි බැවින්) වජ්‍රයක් (දියමන්තියක්) මෙනි. උතුම් වූ ඥානය ද පමණ කළ නො හැකි ය. විමුක්තිය ද උපමා රහිත ය

6078. ලෝකනායක වූ බුදුරජ තෙම මහණ බමුණන්ගෙන් ගැවසී ගත් මිනිස් දෙව් නා බඹ යන මොවුන්ගේ සමාගමයෙහි දහම් දෙසී ය.

6079. පිරිස්හි විශාරද වූ බුදුරජ තෙමේ පින්වත් වූ පුණ්‍යශොභා ඇති මහත් ලාභ ලබන්නා වූ සිය සව්වකු අග්‍රස්ථානයෙහි තැබී ය.

6080. එකල්හි මම හංසවතී නගරයෙහි ක්ෂත්‍රියයෙක් වීමි. (එකී) ශ්‍රාවකයාගේ බොහෝ ගුණ (පවසන) බුදුරජුන්ගේ ඒ වචනය අසා –

6081. ශ්‍රාවකයන් සහිත බුදුරජුන් පවරා සතියක් වළඳවා මහදන් දී එම තනතුර පැතීමි.

6082. එකල්හි පුරුෂශ්‍රෙෂ්ඨ වූ මහාවිර වූ (බුදුරජ තෙම) පාමුල වැඳගෙණ නැමුනා වූ මා දැක මිහිරි ස්වරයෙන් මෙම වචනය කී ය:

6083. තතො ජිනස්ස වචනං සොතුකාමා මහාජනා,
දෙවදානවගන්ධබ්බා බ්‍රහ්මානො ච මහිද්ධිකා.

6084. සමණබ්‍රාහ්මණා චෙව නමස්සිංසු කතඤ්ජලී,
නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම.

6085. ඛත්තියෙන මහාදානං දින්නං සත්තාහිකං හි වො,[1]
සොතුකාමා ඵලං තස්ස ව්‍යාකරොහි මහාමුනෙ.

6086. තතො අවොච භගවා සුණාථ මම භාසිතං,
අප්පමෙය්‍යම්හි බුද්ධම්හි සඞ්ඝම්හි සුප්පතිට්ඨිතා.[2]

6087. දක්ඛිණා තාය කො වත්තා අප්පමෙය්‍යඵලා හි සා,
අපිචෙස මහාභොගො ඨානං පත්ථෙති උත්තමං.

6088. ලාභී විපුලලාභානං යථා භික්ඛු සුදස්සනො,
තථාහම්පි භවෙය්‍යන්ති ලච්ඡතෙතං අනාගතෙ.

6089. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

6090. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
සීවලි නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො.

6091. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසූපගො අහං.

6092. එකනවුතෙ ඉතො කප්පෙ විපස්සී ලොකනායකො,
උප්පජ්ජි චාරුනයනො[3] සබ්බධම්මවිපස්සකො.

6093. තදාහං බන්ධුමතියං කුලස්සඤ්ඤතරස්ස ච,
දයිතො පත්ථිතො චෙව[4] ආසිං කම්මන්තව්‍යාවටො[5].

6094. තදා අඤ්ඤතරො පූගො විපස්සිස්ස මහෙසිනො,
පරිවෙසං අකාරෙසි[6] මහන්තමතිවිස්සුතං.

6095. නිට්ඨිතෙ ච මහාදානෙ දදුං[7] ඛජ්ජකසංහිතං[8],
නවං දධිං මධුං චෙව විචිනං නෙව අද්දස[9].

6096. තදාහං තං ගහෙත්වාන නවං දධිං මධුම්පි ච,
කම්මස්සාමිඝරං ගච්ඡිං තමෙසන්තා මමද්දසුං.

1. සත්තාහිකාධිකා, ස්‍යා. සත්තාහිකම්පි වො, මජ්සං. 2. පතිට්ඨිතා, මජ්සං.
3. චාරුදස්සනො, මජ්සං. 4. පසීතො චෙව, මජ්සං.
5. චාවටො, මජ්සං. 6. අකාරයි. 7. දදුං, මජ්සං.
8. ඛජ්ජකසඤ්ඤිතං, මජ්සං. 9. අද්දසුං, මජ්සං.

6083. ඉක්බිති බුදුරජුන්ගේ වචනය අසනු කැමැති මහජනයා ද, දිව්‍යාසුරගන්ධර්වයෝ ද, මහත්සෘද්ධි ඇති බ්‍රහ්මයෝ ද, –

6084. මහණබමුණෝ ද කරණලද ඇඳිලි ඇත්තාහු පුරුෂශ්‍රෙෂ්ඨයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා; පුරුෂොත්තමයාණන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේව යි වැන්දාහු ය.

6085. ඔබවහන්සේට සතියක් මුළුල්ලෙහි මේ ක්‍ෂත්‍රියයා විසින් මහාදානයක් දෙනලදි. මහාමුනීන්වහන්ස ඔහුගේ කර්මවිපාකය අසනු කැමැත්තෝ වෙමු. පවසනු මැනවැ'' යි කීහ.

6086 – 6087. ඉක්බිති භාග්‍යවත් තෙමේ (මෙසේ) වදාළේ ය: "මාගේ වචනය අසවු. දක්‍ෂිණා තොමෝ අපමණ වූ ගුණ ඇති බුදුරජුන් කෙරෙහි ද, සඞ්ඝයා කෙරෙහි ද. මැනැවින් පිහිටියා ය. ඒ දක්‍ෂිණාවගේ (විපාකය) පවසන්නේ කවරෙක් ද? ඕතොමෝ අප්‍රමෙය වූ විපාක ඇත්තී ය. එතෙකුදු වුවත් මේ මහාභාග්‍ය ඇති ක්‍ෂත්‍රිය තෙමේ උතුම් තනතුරක් පතයි.

6088. මහත්ලාභ ඇතියවුන් අතුරෙන් අග්‍රලාභී වූ සුදර්ශන භික්‍ෂු තෙමේ යම්සේ ද, මම ද එසේ ම වෙම්වා (යනු ඔහුගේ පැතුමයි). මතුකාලයෙහි මෙ තනතුර (හෙතෙම) ලබන්නේ ය.

6089. මෙයින් මතු සියක්දහස් වන කපෙහි ඔක්කාකකුලයෙහි උපදින්නා වූ, නමින් ගෞතම නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

6090. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනි වූ, ඖරසපුත්‍ර වූ නමින් සිවලි නම් ශාස්තෘ ශ්‍රාවකයෙක් වන්නේ ය.''

6091. මැනැවින් කරණ ලද ඒ කර්මය හෙතු කොට ගෙණ ද, චිත්ත ප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද, මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්ති වශයෙන්) එළඹියෙම් වෙමි.

6092. මෙයින් එක් අනූවන කපෙහි මනොඥ ඇස් ඇති සියලු දතයුතු ධර්මයන් වෙසෙසින් දක්නාසුලු වූ, ලොකනායක වූ විපස්සී බුදුරජ තෙමේ ලොව පහළ විය.

6093. එකල්හි මම බන්ධුමතී නගරයෙහි එක්තරා කුලයෙක (නෑයන් විසින් කරණ ලද) දයාව ඇත්තා වූ (දෙමාපියන් විසින්) ප්‍රාර්ථනා කොට ලබන ලද්දා වූ පුතෙක් ව කර්මාන්තයන්හි ව්‍යාපෘත විමි.

6094. එකල්හි එක්තරා උපාසක සමූහයක් විපස්සී බුදුරජුන් හට ඉතා ප්‍රකට වූ මහදනක් පැවැත්වී ය.

6096. මහදන් නිම් කල්හි ද බාද්‍ය වගී දෙන්නේ අළුත් දිහි ද මී ද සොයමින් තො ම දිට.

6096. එකල්හි මම ඒ අළුත් දී හා කැටිමී ද ගෙණ කර්මාන්තස්වාමියාගේ ගෙට ගියෙමි. ඒ අළුත් දී හා කැටිමී සොයන්නාහු මා දුටුවාහු ය.

6097. සහස්සම්පි දත්වාන තාලහිංසු ච තං ධුවං,
තතොහං එවා චින්තෙසිං නෙතං හෙස්සති ඔරකං.

6098 යථා ඉමෙ ජනා සබ්බෙ සක්කරොන්ති තථාගතං.
අහම්පි කාරං කස්සාමි සසඞ්ඝෙ ලොකනායකෙ.

6099. තදහමෙවං චින්තෙත්වා දධිං මධුඤ්ච එකතො,
මද්දිත්වා ලොකනාථස්ස සසඞ්ඝස්ස අදාසහං.

6100. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගච්ඡහං.

6101. පුනාහං බාරාණසියං රාජා හුත්වා මහායසො,
සත්තුකස්ස තදා රුට්ඨො[1] ද්වාරරොධං අකාරයිං.

6102. තදා සපත්තිනො[2] රුද්ධා සත්තාහං[3] රක්ඛිතා අහුං,
තතො තස්ස විපාකෙන පපතිං[4] නිරයං භුසං.

6103. පච්ඡිමෙ ච භවෙ දානි ජාතොහං කොලියෙ පුරෙ,
සුප්පවාසා ච මෙ මාතා මහාලිලිච්ඡවී පිතා.

6104. ඛත්තියෙ පුඤ්ඤකම්මෙන ද්වාරරොධස්ස වාහසා,
සත්තවස්සානි නිවසිං මාතුකුච්ඡිම්හි දුක්ඛිතො.

6105. සත්තාහං ද්වාරමූළ්හොහං මහාදුක්ඛසමප්පිතො,
මාතා මෙ ඡන්දදානෙන එවමාසි සුදුක්ඛිතා

6106 සුවත්ථිතොහං නික්ඛන්තො බුද්ධෙන අනුකම්පිතො,
නික්ඛන්තදිවසෙයෙව පබ්බජිං අනගාරියං.

6107. උපජ්ඣා[5] සාරිපුත්තො මෙ මොග්ගල්ලානො මහිද්ධිකො,
කෙසෙ ඔරොපයන්තො මෙ අනුසාසි මහාමති.

6108. කෙසෙසු ඡිජ්ජමානෙසු අරහත්තමපාපුණිං,
දෙවා නාගා මනුස්සා ච පච්චයෙ උපනෙන්ති මෙ.

6109. පදුමුත්තරනාථඤ්ච විපස්සිඤ්ච විනායකං,
යං පූජයිං පමුදිතො පච්චයෙහි විසෙසතො.

1. දුට්ඨො, මජසං.
2 තපස්සිනො, මජසං.
3. එකාහං, සබ්බත්ථ
4. පාපතිං, මජසං. පාපිට්ඨං, ස්‍යා.
5. උපජ්ඣො, සීමු.

6097. දහසකුදු දී මගෙන් ඉල්වා ඒ දෙක ඔව්හු නො ලැබූවාහු ය. එයින් ''මෙය අල්පවූවක් නො වන්නේ ය''යි මම සිතීමි.

6098. යම්සේ මේ සියලු ජනයෝ තථාගතයන් වහන්සේට සත්කාර කෙරෙත් ද, මම ද ශ්‍රාවක සඞ්ඝයා සහිත වූ ලොකනායක බුදුරජුන් කෙරෙහි සත්කාරයක් කරන්නෙමි යි සිතීමි.

6099. එකල්හි මම මෙසේ සිතා දී ද මී ද එකට යොදා සඞ්ඝයා සහිත වූ ලොකනාථයන් වහන්සේට දුනිමි.

6100. මැනැවින් කරණ ලද ඒ කර්මය හෙතු කොට ගෙණ ද, චිත්ත ප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව් ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

6101. මම නැවත බරණැස් නුවර මහත් යස පිරිවර ඇති රජෙක් ව එකල්හි සතුරු රජකුට කිපියෙමි නුවරින් පිට විය නො හැකි සේ දොර වස්වා ලීමි.

6102. එකල අවුරණලද සතුරෝ සත්දිනක් (සිරකොට) රක්නා ලද්දහු ය. ඒ කර්මයාගේ විපාකය කරණ කොට ගෙන දුඛ වූ නිරය දුකට වැටුනෙමි.

6103. මම දූත් අන්තිමජාතියෙහි කොලියනගරයෙහි උපන්නෙම් වෙමි. මාගේ මවු තොමෝ සුප්පවාසා (රජමෙහෙසිය) ය. පියතෙම මහාලි ලිච්ඡවි රජ තෙමේ ය.

6104. කුශලකර්මබලයෙන් ක්ෂත්කුලයෙහි (උපන්මි). නුවර දොර වැස්වූ අකුශලකර්මබලයෙන් සත්හවුරුද්දක් මවුකුසෙහි දුක්ඛිතව විසීමි.

6105. මම සතියක් මූඪගර්භ ව මහදුකින් යුක්ත වීමි. මාගේ මවු-තොමෝ (නුවර දොර වැසීමට) කැමැත්ත දීම හෙතු කොට ගෙණ මෙසේ අතිශයින් තටගත් දුක් ඇතී වූ ය.

6106. බුදුරජුන් විසින් අනුකම්පා කරණ ලද මම නිදුකින් (මව් කුසින්) නික්මුනෙමි. (සතියකට පසු ගිහිගෙන්) නික්මුනු දවස්හි ම අනනාරිය සඞ්ඛ්‍යාත පැවිද්දට වන්මි.

6107. මහනුවණැති ශාරීපුත්‍ර තෙමේ මාගේ උපාධ්‍යාය විය. මහත් සෘද්ධි ඇති මෞද්ගල්‍යායන තෙමේ මාගේ හිසකේ බාමින් අනුශාසනා කෙළේ ය.

6108. හිසකේ බාන කල්හි ම (-ඝරගෙහි දී ම) රහත් බවට පැමිණීයෙමි. දෙවියෝ ද, නාගයෝ ද, මනුෂ්‍යයෝ ද, මට සිව්පස එළවත්.

6109. පදුමුත්තර බුදුරජුන් ද, විපස්සී බුදුරජුන් ද යම් හෙයෙකින් ප්‍රමුදිත වූයෙම් සිව්පසණයන් වෙසෙසින් පිදුයෙම් නම්,

6110. තතො තෙසං විසෙසෙන[1] කම්මානං විපුලුත්තමං,
ලාභං ලභාමි සබ්බත්ථ වනෙ ගාමෙ ජලෙ ථලෙ.

6111. රෙවතං දස්සනත්ථාය යදා යාති විනායකො,
තිංසභික්ඛුසහස්සෙහි සහ ලොකග්ගනායකො.

6112. තදා දෙවොපනීතෙහි මමත්ථාය මහාමති,
පච්චයෙහි මහාවීරො සසඞ්ඝො ලොකනායකො.

6113. උපට්ඨිතො මයා බුද්ධො ගන්ත්වා රෙවතමද්දස,
තතො ජෙතවනං ගන්ත්වා එතදග්ගෙ ඨපෙසි මං.

6114. ලාභීනං සීවලී අග්ගො මම සිස්සෙසු භික්ඛවො,
සබ්බලොකහිතො සත්ථා කිත්තයී පරිසාසු මං.

6115. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6116. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6117. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා සීවලි ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

සීවලිත්ථෙරස්ස අපදානං තතියං.

514. වඞ්ගීසත්ථෙරාපදානං

6118. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මෙසු චක්ඛුමා,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

6119. යථාපි සාගරෙ ඌමි ගගනෙ විය තාරකා,
එවං පාවචනං තස්ස අරහන්තෙහි චිත්තිතං.

6120. ස දෙවාසුරනාගෙහි මනුජෙහි පුරක්ඛතො,
සමණබ්‍රාහ්මණාකිණ්ණෙ ජනමජ්ඣෙ ජිනුත්තමො.

6121. පභාහි අනුරඤ්ජන්තො[2] ලොකං[3] ලොකන්තගූ ජිනො,
වචනෙන විබොධෙන්තො වෙනෙය්‍යපදුමානි සො.

1. විපාකෙන, සීමු. 2. අනුරඤ්ජෙන්තො, මජ්සං.
3. ලොකෙ, මජ්සං.

6110. ඒ හෙතුවෙන් ඒ කුශලකර්මයන්ගේ විශෙෂයෙන් වනයෙහි ද, ගමෙහි ද, දියෙහි ද, ගොඩබිම්හි දූසි හැමතන්හි උතුම් සිවුපසය මහත්සේ ලබමි.

6111. යම් කලෙක්හි ලොකාග්‍රනායක වූ බුදුරජ තෙම තිස්දහසක් භික්ෂූන් සමඟ රෙවත තෙරණුවන් දකින පිණිස වඩී ද,

6112 - 6113 - 6114. එකල්හි මාගේ ප්‍රයෝජනය පිණිස දෙවියන් විසින් එළවන ලද සිව්පසයෙන් මහත් ප්‍රඥ ඇත්තා වූ, මහත් වීර්‍ය්‍ය ඇති සඞ්ඝයා සහිත වූ, තුන්ලොවට නායක වූ බුදුරජ තෙම මා විසින් උවටැන් කරණ ලද්දේ එහි වැඩ රෙවත තෙරුන් දිටි ය. ඉන්පසු දෙව්රමට වැඩ, “මහණෙනි, මාගේ සිසුන් අතුරෙහි සීවලී තෙමේ ලාභීන් හට අග්‍ර ය”යි මා ලාභීන් අතුරෙහි එතදග්‍රස්ථානයෙහි තැබී ය. සව් ලොවට හිත වූ ශාස්තෘ තෙමේ පිරිස් මැද දී මට පැසසීය.

6115. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිතව වෙසෙමි.

6116. බුදුරජානන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි

6117. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන්වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසේසිත් ආයුෂ්මත් සීවලී ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

සීවලී ස්ථවිරාවදානය නවැනි යි.

544. වඞ්ගීස ස්ථවිරාවදානය

6118. මෙයින් සියක්දහස් වන කපෙහි ලොකනායක වූ සියලු ධර්‍මයන්හි විනිවිද දක්නාසුලු නුවණැස් ඇති පදුමුත්තර නම් බුදුරජ තෙම ලොව පහළ විය.

6119. සයුරෙහි රළ, අහසෙහි තරු යම් සේ විසිතුරු ද එසේ ම උන්වහන්සේගේ සසුන රහතුන්ගෙන් විසිතුරු විය.

6120. ඒ ජනොත්තම වූ බුදුරජතෙම දිව්‍යඅසුරනාගමනුෂ්‍ය යන මොවුන් විසින් පිරිවරණ ලදුයේ මහණ බමුණන්ගෙන් ගැවසීගත් ජනයා මැද-

6121. (භවොත්පත්තිය දුරුකිරීමෙන්) ලොකාන්තයට ගිය ඒ බුද්ධ-දිවාකර තෙමේ ප්‍රභාවෙන් ලොව රඳවමින් වෛනෙයජන නමැති පියුම් වවන නමැති රැසින් පොබයමින් -

6122. වෙසාරජ්ජෙහි සම්පන්නො චතූහි පුරිසුත්තමො,
පහීනභයසාරජ්ජො ඛෙමප්පත්තො විසාරදො.

6123. ආසභං පවරං ඨානං බුද්ධභූමිං ච කෙවලං,
පටිජානාති ලොකග්ගො නත්ථි සඤ්චොදකො ක්වචි.

6124. සීහනාදමසම්භීතං නදතො තස්ස තාදිනො,
දෙවො නරො වා බ්‍රහ්මා වා පටිවත්තා න විජ්ජති.

6125. දෙසෙන්තො පවරං ධම්මං සන්තාරෙන්තො සදෙවකං,
ධම්මචක්කං පවත්තෙති පරිසාසු විසාරදො.

6126. පටිභානවතං අග්ගං සාවකං සාධුසම්මතං,
ගුණං බහුං පකිත්තෙත්වා එතදග්ගෙ ඨපෙසි තං.

6127. තදාහං හංසවතියං බ්‍රාහ්මණො සාධුසම්මතො,
සබ්බවෙදවිදූ ජාතො වඞ්ගීසො[1] වාදිසූදනො.

6128. උපෙච්ච තං මහාවීරං සුත්වා තං ධම්මදෙසනං,
පීතිවරං පටිලභිං සාවකස්ස ගුණෙ රතො.

6129. නිමන්තයිත්වා[2] සුගතං සසඞ්ඝං ලොකනන්දනං,
සත්තාහං භොජයිත්වාහං දුස්සෙහච්ඡාදයිං තදා.

6130. නිපච්ච සිරසා පාදෙ කතොකාසො කතඤ්ජලී,
එකමන්තං ඨිතො හට්ඨො සන්ථවිං ජිනමුත්තමං:

6131. "නමො තෙ වාදිසද්දූල[3] නමො තෙ පුරිසුත්තම,[4]
නමො තෙ සබ්බලොකග්ග නමො තෙ අභයඞ්කර.

6132. නමො තෙ මාරමථන නමො තෙ දිට්ඨිසූදන,
නමො තෙ සන්තිසුඛද නමො තෙ සරණඞ්කර.

6133. අනාථානං භවං නාථො භීතානං අභයප්පදො,
විස්සාමභූමි[4] සන්තානං සරණං සරණෙසිනං.

1. වංගීසො, සීමු. 2 නිමන්තෙත්වාව, මජ්සං. 3. වාදිමද්දන, මජ්සං.
4. ඉසිසත්තම, මජ්සං. 5. විස්සාසං භූමි, සසා. විස්සාසභූමි, PTS.

6122. චතුර්වෛශාරද්‍යයන්ගෙන් යුක්ත වූ දුරු කරණ ලද බිය හා ඇලුම් ඇති, (ක්ෂෙම යයි කියන ලද) නිවණට පැමිණි විශාරද වූ පුරුෂෝත්තම වූ -

6123. ලොකනායක වූ බුදුරජ තෙමේ උතුම් ආසභස්ථානය ද කෙවල (අනන්‍යසාධාරණ) බුද්ධත්වය ද තමා තුළ ඇතැයි ප්‍රතිඥා කෙරෙයි. ඔබට එය නැතැයි චොදනා කරණ කිසි චොදකයෙක් නැත.

6124. මෙසේ අභීතසිංහනාද කරණ කම්පා නැති උන්වහන්සේට ප්‍රතිවක්තෘව (විරුද්ධ ව) කියන දෙවියෙක් මනිසෙක් හෝ බඹෙක් නැත.

6125. උතුම් දහම් දෙසමින්, දෙවියන් සහිත ලොකයා (සසරින්) එතෙර කරමින් පිරිස් මැද විශාරද ව දම්සක් පවත්වයි.

6126. ඒ බුදුරජ තෙම ප්‍රතිභානවත් (වැටහීම ඇති) භික්ෂූන් අතුරෙන් අග්‍ර වූ සාධුසම්මත ශ්‍රාවකයකු බොහෝ ගුණ පවසා එතදග්‍රස්ථානයෙහි තැබී ය.

6127. එකල මම හංසවතී නගරයෙහි උපන්නෙම් සාධුසම්මත වූ, සියලු වෙදයන් දන්නා වූ, වාගීශ වූ, වාදීන් මැඩලන බමුණෙක් වූයෙමි -

6128. ඒ මහාවීර වූ බුදුරජුන් වෙත එළඹ ඒ දම්දෙසුම අසා ශ්‍රාවක-යන්ගේ ගුණයෙහි ඇලුනෙම් උතුම් ප්‍රීතිය ලැබීමි.

6129. එකල්හි මම සඞ්ඝයා සහිත වූ ලොකනන්‍දන වූ බුදුරජුන් පවරා සතියක් වළඳවා වස්ත්‍රයෙන් හැඳවීමි. හඳිනා (පොරෝනා සිවුරු පිණිස පිළි පිදීමි.)

6130. හිසින් පාමුල හෙව ලබන ලද අවකාශ ඇත්තෙම් බදැඳිලි ඇත්තෙම් සතුටු වූයෙම් එකත් පසෙක සිටියෙම් උතුම් වූ බුදුරජුන්හට (මෙසේ) ස්තුති කෙළෙමි.

6131. “වාදීශාර්දූලයන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා. පුරුෂොත්තමයාණන් වහන්ස ඔබවහන්සේට නමස්කාර වේවා. මුළුලොවට අග වූ උතුමානන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා. අභය (දනය) කරන්නා වූ උත්තමයානන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා.

6132. මාරබල මර්දනය කරණුවන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා. දෙසැටමිසදිටු මඩින උතුමානන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා. ශාන්තිසුඛදායකයානන් වහන්ස, ඔබවහන්සේට නමස්කාර වේවා. සත්ලොවට පිහිට කරණ උතුමානන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා.

6133. පින්වත් තෙමේ අනාථයනට පිහිට ය. බියවූවනට අභය දායක ය. ශ්‍රාන්ත (-විඩා) වූවනට විශ්‍රාමභූමි ය. පිහිට සොයන සත්නට පිළිසරණෙක් ය.

6134. එවමාදීනි සම්බුද්ධං සන්ථවිත්වා මහාගුණං,
අවොචං වාදිසූරස්ස[1] ගතිං පප්පොමි භික්ඛුනො.

6135. තදා අවොච භගවා අනන්තපටිභානවා,
යො සො බුද්ධං අභොජෙසි සත්තාහං සහ සාවකං.

6136. ගුණං ච මෙ පකිත්තෙසි පසන්නො සෙහි පාණිහි,
එසො පත්ථයතෙ ඨානං වාදිසූරස්ස භික්ඛුනො.

6137. අනාගතම්හි අද්ධානෙ ලච්ඡතෙ තං මනොරථං,
දෙවමානුසසම්පත්තිං අනුභොත්වා අනප්පකං.

6138. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

6139. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
වඞ්ගීසො නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො.

6140. තං සුත්වා මුදිතො හුත්වා යාවජීවං තදා ජිනං,
පච්චයෙහි උපට්ඨාසිං මෙත්තචිත්තො තථාගතං.

6141. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තුසිතං[2] අගමාසහං.

6142. පච්ඡිමෙ ච භවෙදානි පරිබ්බාජකුලෙ[3] අහං,
පච්චාජාතො යදා ආසිං ජාතියා සත්තවස්සිකො.

6143. සබ්බවෙදවිදූ ජාතො වාදසත්ථවිසාරදො,
වාදිස්සරො චිත්තකථී පරවාදප්පමද්දනො.

6144. වඞ්ග ජාතො'ති වඞ්ගීසො වචනෙ ඉස්සරොති වා,
වඞ්ගීසො ඉති මෙ නාමං අභවී ලොකසම්මතං.

6145. යදාහං විඤ්ඤුතං පත්තො ඨිතො පඨමයොබ්බනෙ,
තදා රාජගහෙ රම්මෙ සාරිපුත්තමථද්දසං[4].

පඤ්චවීසතිමං භාණවාරං.

6146. පිණ්ඩාය විචරන්තං තං පත්තපාණිං සුසංවුතං,
අලොලක්ඛිං මිතභාණිං යුගමත්තනිරික්ඛකං.[5]

1. වාදිසුද්දස්ස, මජ්සං.
2. තාවතිංසං, ස්‍යා.
3. ජාතො විප්පකුලෙ, මජ්සං.
4. සාරිපුත්තමහද්දසං, මජ්සං; ච අද්දසං, ස්‍යා.
5. නිදක්ඛිතං, මජ්සං.

6134. මේ ආදි නයින් මහත් වූ ගුණ ඇති සම්බුදු රජුන් හට පසසා "වාදීශූර වූ (ප්‍රතිභානවත්) භික්ෂුහුගේ තනතුරට පැමිණෙම්"යි කීමි.

6135 - 6136. එකල්හි අනන්ත වූ වැටහීම් ඇති භාග්‍යවත් තෙමේ (මෙසේ) වදාළේ යː ඒ යමෙක් තෙම පහන් වූයේ ශ්‍රාවකයන් සහිත වූ බුදුරජුන් සතියක් සියතින් වැළඳවී ද, (ඒ සම්බුද්ධ වූ) මාගේ ගුණ පැවසී ද, මේ තෙම වාදීශූර වූ (ඒ ප්‍රතිභානවත්) භික්ෂුහුගේ තනතුර පතයි.

6137. නො අඩු වූ දෙව් - මිනිස් සැප අනුභව කොට මතු කාල-යෙහි (ඔහුගේ) ඒ මනොරථය ලබන්නේ ය.

6438. මෙයින් (මතු) සියක් දහස් වන කපෙහි ඔක්කාකකුලයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

6139. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් ම නිර්මිත කළංක් වැනි, ඖරසපුත්‍ර වූ නමින් **වඞ්ගීස** නම් වූ ශාස්තෘශ්‍රාවකයෙක් වන්නේ ය" (කියායි)

6140. එකල්හි එය අසා සතුටු වූයේ මෙත් සිතැත්තේ දිවි ඇති තාක් තථාගත වූ බුදුරජුන්හට (සිවු) පසයෙන් උවටැන් කෙළෙමි.

6141. මම මැනැවින් කරණ ලද ඒ කර්මය හෙතු කොට ගෙණ ද, චිත්තප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද, මිනිස් සිරුර හැර තුසිත දෙව් ලොවට උත්පත්ති වශයෙන් ගියෙමි.

6142. මම දැන් මේ අන්තිමජාතියෙහි පිරිවැජිකුලයෙහි උපනෙමි උපතින් සත්හැවිරිදි වූයෙම් වීමි.

6143. සියලු වේද දන්නෙක් වූයෙමි වාදශාස්ත්‍රයෙහි විශාරද වූයෙමි වාදීන්හට ශ්‍රෙෂ්ඨ වූයෙමි චිත්‍රකථික වූයෙමි විරුද්ධවාදීන් මඩනාසුලු වූයෙමි.

6144. "වඞ්ගරටෙහි උපන්නේ නු"යි වඞ්ගීස ය, නොහොත් "වචන-යෙහි අධිපති නු' යි වඞ්ගීස ය යි මාගේ නාමය ලොකසම්මත විය.

6145. යම් කලෙක්හි මම දනුමැති බවට පැමිණියෙම් පළමු යොවුනෙහි සිටියෙම් වෙම් ද, එකල්හි රම්‍ය වූ රජගහනුවරදී සැරියුත් තෙරුන් දිටිමි.

පස්විසි වැනි බණවර යි.

6146. පිඩු පිණිස හැසිරෙන්නා වූ පාත්‍රය ගත් අත් ඇති සන්හුන් වූ ලොල් නො වූ නිශ්චල ඇස් ඇති පමණ දත කථා කරන්නා වූ වියදඬු පමණ දුර බලන්නා වූ -

6147. තං දිස්වා විම්හිතො හුත්වා අවොචං මනනුවජ්ජවං[1].
ඛණිකං ඨානරචිතං[2] චිත්තං ගාථාපදං අහං.

6148 ආචික්ඛි සො මෙ සත්ථාරං සම්බුද්ධං ලොකනායකං,
තදා සො පණ්ඩිතො වීරො උත්තරං[3] සමවොච මෙ.

6149. විරාගසංහිතං වාක්‍යං කත්වා දුද්දසමුත්තමං,
විචිත්තපටිභානෙහි තොසිතො තෙන තාදිනා,
නිපච්ච සිරසා පාදෙ පබ්බාජෙහීති මං බ්‍රවිං.

6150. තතො මං ස මහාපඤ්ඤො බුද්ධසෙට්ඨමුපානයි,
නිපච්ච සිරසා පාදෙ නිසීදිං සත්ථු සන්තිකෙ.

6151. මමාහ වදතං සෙට්ඨො කච්චි වඞ්ගීස ජානසි,[4]
කිඤ්චි සිප්පන්ති තස්සාහං ජානාමි ති ච අබ්‍රවිං.[5]

6152 මතසීසං වනච්ඡුද්ධං අපි බාරසවස්සිකං,
තව විජ්ජාවිසෙසෙන සචෙ සක්කොසි හාසය.[6]

6153. ආමාති මෙ පටිඤ්ඤාතෙ තීණි සීසානි දස්සයි.
නිරය නර දෙවෙසු උපපන්නෙ අවාචයිං.

6154. තදා පච්චෙකබුද්ධස්ස[7] සිරං දස්සෙසි නායකො,
තතොහං විහතාරම්භො පබ්බජ්ජං සමයාචිසං.

6155. පබ්බජිත්වාන සුගතං සත්ථවාමි තහිං තහිං,
තතො මං කබ්බවිත්තොති[8] උජ්ඣායන්තීහ භික්ඛවො.

6156. තතො විමංසනත්ථං මෙ ආහ බුද්ධො විනායකො,
තක්කිතා පනිමා ගාථා ඨානසො පටිභන්ති වා

6157. න කබ්බවිත්තොහං වීර ඨානසො පටිභන්ති මං,[9]
තෙන හි දනි වඞ්ගීස ඨානසො සත්ථවාහි මං.

1. මමනුවජ්ජං, මජසං. 2. ඛණිකාරංචනිචිතං, මජසං.
3. උත්තරිං, මජසං. 4. සච්චං වඞ්ගීස කච්චිංනා, ස්‍යා. 5. බ්‍රවිං, මජසං.
6. වාචය, මජසං. 7. ඛීණාසවස්සච, මජසං.
8. කම්විත්තොති, ස්‍යා. PTS. 9. තං, මජසං.

6147. ඒ සැරියුත් තෙරුන් දුටු මම හටගත් විස්මය ඇත්තෙම් සිතට සුදුසු වූ, එකෙණෙහි වැටහුනා වූ එතන්හි දීම රචිත වූ විචිත්‍ර වූ ගාථාපදයක් කීමි.

6148. එකල්හි ඒ වීර වූ පණ්ඩිත ශාරිපුත්‍ර තෙමේ මට ලොකනායක වූ ශාසතෘ වූ සම්බුදු රජුන් ගැණ කී ය. මට පිළිතුරු ද කී ය.

6149. තාදී ගුණ ඇති එම සැරියුත් තෙරුන් විසින් තෘෂ්ණා නිඃශ්‍රිත නො වූ බැවින් විරාගසංහිත වූ දුදුස හෙවත් අවබොධයට දුෂ්කර වූ උතුම් වූ වාක්‍යයක් කොට විසිතුරු ප්‍රතිභානයෙන් සතුටු කරණ ලද මම (උන්වහන්සේගේ) පාමුල සිරසින් නැමී (වැඳ) ''මා පැවිදි කල මැනවැ''යි කීමි.

6150. ඉක්බිති ඒ මහාප්‍රාඥ වූ ශාරීපුත්‍රසථවිර තෙමේ මා බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත පැමිණවී ය. පාමුල සිරසින් නැමී (වැඳ) ශාසතෘන් වහන්සේගේ සමීපයෙහි හුනිමි.

6151. කථා කරන්නවුන් අතුරෙන් ශ්‍රෙෂ්ඨ වූ බුදුරජ තෙම 'වඞ්ගීස කිම' කිසියම් ශිල්පයක් දනිහි දැ'යි මා ඇසී ය. මම උන්වහන්සේට දනිමි යි කීමි.

6152. වනයෙහි බැහැර ලූ දොළොස් හවුරුදු ඉක්ම ගිය මළ හිස්කබලක් (දක්වා) තාගේ විද්‍යාවිශෙෂයෙන් (මේ හිස් කබල අයත් තැනැත්තා කොහි උපන්නේ දැ යි) ඉදින් හැකි වෙහි නම් කියවයි වදාළහ.

6153. එසේ ය යි මා පිළිණ කල කල්හි හිස්කබල් තුණක් දැක්වී ය. නරකය මිනිස්ලොව දෙව්ලොව යන මේ තන්හි උපන්නවුන් කීමි.

6154. එකල්හි ලොකනායක වූ බුදුරජ තෙමේ පසේබුදුවරයකුගේ හිස්කබලක් දැක්වී ය. ඉක්බිති මම උන්වහන්සේ උපන් තැන කිය නො හැකි බැවින් තවුවා වූ විද්‍යාරම්භ ඇත්තෙම් පැවිද්ද ඉල්වීමි.

6155. පැවිදි ව බුදුරජුන්හට ඒ ඒ තන්හි දී සතුති කරමි. එහෙයින් මෙහි භික්ෂූහු මට කවි බැඳීම සැපත කොට ඇත්තේ ය යි දොස් පහළ කෙරෙත්.

6156. ඉක්බිති විශිෂ්ට නායක වූ බුදුරජ තෙම විමසනු සඳහා මට මෙසේ වදාළේ ය: මේ ගාථාවෝ (කල් ඇතිව) සිතා මතා නොතන ලද්දාහු ද, නොහොත් කෙණෙහි වටහත් දැ? (කියා යි)

6157. වීරයන් වහන්ස, මම කවි බැඳීම සැපත කොට ඇත්තෙක් නො වෙමි. ඒ කවි එකෙණෙහි මට වටහත් ය යි කීමි. වඞ්ගීස, එසේ වී නම් දැන් සිටිවන ම මට සතුති කරව යි බුදුරජ තෙම වදාළේ ය.

6158. තදාහං සන්ථවිං වීරං ගාථාහි ඉසිසත්තමං,
ඨානසො මෙ තදා තුට්ඨො ජිනො අග්ගෙ ඨපෙසි මං.

6159. පටිභානෙන චිත්තෙන අඤ්ඤෙ සමතිමඤ්ඤහං,
පෙසලෙ තෙන සංවිග්ගො අරහත්තමපාපුණිං.

6160. පටිභානවතං අග්ගො අඤ්ඤො කොචි න විජ්ජති,
යථායං භික්ඛු වඞ්ගීසො එවං ධාරෙථ භික්ඛවො.

6161. සතසහස්සෙ කතං කම්මං ඵලං දස්සෙසි මෙ ඉධ,
සුමුත්තො සරවෙගොව කිලෙසෙ ඣාපයිං අහං[1].

6162. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6163. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6164. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **වඞ්ගීසො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

වඞ්ගීසත්ථෙරස්ස අපදානං චතුත්ථං.

545. නන්දකත්ථෙරාපදානං

6165. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මෙසු චක්ඛුමා,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

6166. හිතාය සබ්බසත්තානං සුඛාය වදතං වරො,
අත්ථාය පුරිසාජඤ්ඤො පටිපන්නො සදෙවකෙ.

6167. යසග්ගප්පත්තො සිරිමා කිත්තිවණ්ණභතො[2] ජිනො,
පූජිතො සබ්බලොකස්ස දිසාසබ්බාසු විස්සුතො.

6168. උත්තිණ්ණවිචිකිච්ඡො සො වීතිවත්තකථංකථො,
පරිපුණ්ණමනසංකප්පො පත්තො සම්බොධිමුත්තමං.

---

1. ඣාපයිං මම, සීමු. 2. කිත්තිවණ්ණභටො, ස්‍යා.

6158. එකල්හි මම සෘෂි සප්තම වූ බුදුරජුන්හට කෙණෙහි ම ගාථායෙන් ස්තුති කෙළෙමි. එකල්හි තුටු වූ බුදුරජතෙම මා (ප්‍රතිභානවත් භික්ෂූන් අතුරෙන්) අග්‍රස්ථානයෙහි තැබී ය.

6159 මම (ක්‍ෂණික) බුද්ධියෙන් අන්‍ය ප්‍රියශීල භික්ෂූන් ඉක්ම වීමි. එයින් උත්සාහ වත්වූයෙම් රහත්බවට පැමිණියෙමි.

6160 මෙම වඞ්ගීස භික්ෂු වැනි වහා වැටහීම් ඇත්තවුන් අතුරෙන් අග්‍ර වූ අන්කිසිවෙක් නැති. මහණෙනි, එසේ දරවූ.

6161. මෙයින් පෙර සියක් දහස්වන කපෙහි කරණ ලද කර්මය මෙහි දී මට විපාක දුන්වී ය. මම මිදුණු හීසැරයක් බඳු වූයෙම් කෙලෙසුන් දැවීමි.

6162. මා විසින් කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිත ව වෙසෙමි.

6163. බුදුරජානන් වහන්සේ වෙත මාගේ පැමිණීම සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

6164. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් වඞ්ගීස ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

වඞ්ගීසස්ථවිරාවදානය සිව්වැනියි.

545. නන්දකස්ථවිරාවදානය

6165. මෙයින් පෙර සියක් දහස්වන කපෙහි ලෝකනායක වූ සියලු ධර්මයන් විනිවිද දක්නා සුළු නුවණැස් ඇති පදුමුත්තර බුදුරජතෙම ලොව පහළ විය

6166. වාදීවර වූ පුරුෂශ්‍රෙෂ්ඨ වූ බුදුරජතෙම දෙවියන් සහිත ලොකයෙහි සව්සත්නට හිත පිණිස සුව පිණිස වැඩ පිණිස පිළිපන්නේ ය.

6167. යසසින් අගතැන් පැමිණියා වූ ශ්‍රී (-සම්පත්) ඇත්තා වූ කීර්තිඝොෂ ඇති බුදුරජ තෙම සියලු ලෝකයා විසින් පුදන ලද්දේ සව්දිගුන්හි ප්‍රකට විය.

6168. ඉක්ම වූ සැකඇති, පරිපූර්ණ වූ චිත්ත සඞ්කල්පඇති උන්වහන්සේ උතුම් සම්‍යක් සම්බොධියට පැමිණිසේක.

6169. අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා නරුත්තමො,
අනක්ඛාතඤ්ච අක්ඛාසි අසඤ්ජාතං ච සඤ්ජනී.

6170. මග්ගඤ්ඤූ සො මග්ගවිදූ[1] මග්ගක්ඛායී නරාසභො,
මග්ගස්ස කුසලො සත්ථා සාරථීනං වරුත්තමො.

6171. තදා මහාකාරුණිකො ධම්මං දෙසෙති[2] නායකො,
නිමුග්ගෙ මොහපඞ්කම්හි[3] සමුද්ධරති පාණිනො[4].

6172. භික්ඛුනීනං ඔවදනෙ සාවකං සෙට්ඨසම්මතං,
වණ්ණයං එතදග්ගම්හි පඤ්ඤපෙසි මහාමුනි.

6173. තං සුත්වාහං පමුදිතො නිමන්තෙත්වා තථාගතං,
භොජයිත්වා සසඞ්ඝං තං පත්ථයිං ඨානමුත්තමං.

6174. තදා පමුදිතො නාථො මං අවොච මහාඉසි,
සුඛී භවස්සු දීඝායු[5] ලච්ඡසෙ තං මනොරථං.

6175 සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති

6176. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
නන්දකො නාම නාමෙන හෙස්සති සත්ථුසාවකො.

6177. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච.
ජහිත්වා මානුසං දෙහං තාවතිංසූපගො අහං.

6178. පච්ඡිමෙ ච භවෙ'දානි ජාතො සෙට්ඨිකුලෙ අහං,
සාවත්ථියං පුරවරෙ[6] ඉද්ධෙ ඵීතෙ මහද්ධනෙ.

6179 පුරප්පවෙසෙ සුගතං දිස්වා විම්හිතමානසො,
ජෙතාරාමපටිග්ගාහෙ පබ්බජිං අනගාරියං.

6180. න චිරෙනෙව කාලෙන අරහත්තමපාපුණිං,
තතොහං තිණ්ණසංසාරො සාසිතො සබ්බදස්සිනා.

1. මග්ගඤ්ඤූ මග්ගවිදූ ච, මජසං. 2 දෙසෙසි, මජසං.
3. කාමපඞ්කම්හි, මජසං. 4. පාණිනෙ, මජසං. 5. දීඝාවු, මජසං.
6. පුරෙ වරෙ, මජසං.

6169. නූපන් මාර්ගය උපදවන්නා වූ මිනිස්නට උතුම් වූ ඒ බුදුරජතෙම (පෙර කිසිවකු විසින්) නො බිණුවක් (-චතුරාර්යසත්‍යය) ද බිණී ය. නො හටගත් (ඵලසමාපත්තීන් ද) හට ගැන්වී ය.

6170. නිවන් මග පිළිවිදි, නිවන් මග දැනගත්, නිවන් මග පවසන්නා වූ, නිවන් මඟෙහි දක්ෂ වූ, (දෙවිමිනිස්නට) අනුශාසනා කරන්නා වූ, පුරිසදම්ම සාරථි ගුණ ඇතියවුන් අතුරෙන් අතිඋතුම්, නරශ්‍රේෂ්ඨ වූ, ලෝකනායක වූ-

6171. මහාකරුණා ඇත්තා වූ බුදුරජතෙම එකල්හි දහම් දෙසයි. මෝහමඩෙහි ගැලුනු සත්ත්වයන් (එයින්) ගොඩලයි.

6172. ඒ මහාමුනි තෙම භික්ෂුණීන්හට ඔවා දීමෙහි අග්‍රයයි සම්මත වූ ශ්‍රාවකයකු පසසමින් එතදග්‍රස්ථානයෙහි තැබී ය.

6173. එය අසා සතුටු වූ මම බුදුරජුන් පවරා සඞ්ඝයා සහිත ව වළඳවා ඒ උතුම් තනතුර පැතීමි.

6174. එකල්හි ප්‍රමුදිත වූ මහර්ෂි වූ සර්වඥ තෙම මට මෙසේ කීය: සුව ඇත්තේ වේවා. දිගාසිරි ඇත්තේ වේවා. ඒ මනදෙළ (සපුරා) ලබන්නේ ය.

6175. මෙයින් සියක් දහස්වන කපෙහි ඔක්කාකකුලයෙහි උපදින්නා වූ නමින් ගෞතම නම් ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

6176. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිත කළාක් වැනි වූ ඖරස පුත්‍ර වූ නමින් නන්දක නම් වූ ශාස්තෘ-ශ්‍රාවකයෙක් වන්නේ ය (කියා සි).

6177. මැනැවින් කරණලද ඒ කර්මය හෙතු කොට ගෙණ ද චිත්ත ප්‍රණිධීන් හෙතු කොට ගෙණ ද මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්-ලොවට උත්පත්තිවශයෙන් ගියෙමි.

6178. දැන් පශ්චිමභවය පැමිණි කල්හි මම සමෘද්ධ වූ (සම්පත්තීන්) පිරුණා වූ මහත් ධන ඇති උතුම් වූ සැවැත් නුවර සිටුකුලයක උපන්නෙම් වෙමි.

6179. නගරයට පිවිසෙන කල්හි බුදුරජුන් දැක විස්මිත වූ සිත් ඇත්තෙම් ජේතවනාරාමය පිළිගැණීමෙහි දී (අනගාර්‍ය සඞ්ඛ්‍යාත) පැවිද්දට වත්මි.

6180. නො බෝ කලකින් ම රහත්බවට පැමිණියෙම් වෙමි. එහෙයින් සර්වදර්ශී වූ බුදුරජුන් විසින් අනුශාසනා කරණලද මම තරණය කළ සසර ඇත්තෙම් වෙමි.

6181. භික්ඛුනීනං ධම්මකථං පරිපුච්ඡා කරිං අහං,
සාසිතා තා මයා සබ්බා අහවිංසු අනාසවා.

6182. සතානි පඤ්චනූනානි තදා තුට්ඨො මහාහිතො,
භික්ඛුනීනං ඔවදතං අග්ගට්ඨානෙ ඨපෙසි මං.

6183. සතසහස්සෙ කතං කම්මං ඵලං දස්සෙසි මෙ ඉධ,
සුමුත්තො සරවෙගොව කිලෙසෙ ඣාපයිං අහං.

6184. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6165. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6186. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා නන්දකො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

නන්දකත්ථෙරස්ස අපදානං පඤ්චමං.

546. කාළුදායිත්ථෙරාපදානං

6187. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මෙසු චක්ඛුමා,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

6188. නායකානං වරො සත්ථා ගුණාගුණවිදූ ජිනො,
කතඤ්ඤූ කතවෙදී ච තිත්ථෙ යොජෙති පාණිනො[2]

6189. සබ්බඤ්ඤුතෙන ඤාණෙන තුලයිත්වා දයාසයො,
දෙසෙති පවරං ධම්මං අනන්තගුණසඤ්චයො.

6190. ස කදාචි මහාවීරො අනන්තජනසංසදි[3],
දෙසෙති මධුරං ධම්මං චතුසච්චූපසංහිතං.

6191. සුත්වාන තං ධම්මවරං ආදිමජ්ඣන්තසොභනං,
පාණසතසහස්සානං ධම්මාභිසමයො අහු.

1. ඣාපයිං මම, සීමු. 2. පාණිනො, මජ්සං.
3. අනන්තජනසංසරි, මජ්සං. අනන්තජනසංසුධි, ස්‍යා. අනන්තජනතංසරි, PTS.

6181 - 6182. මම භික්ෂුණීන්හට ධර්මකථා ද පටිපුච්ඡා (-විචාරීම) ද කෙළෙමි. මා විසින් අනුශාසනය කරණ ලද ඒ සියලු භික්ෂුණීහු නො අඩු වූ පන්සියක් රහත් මෙහෙණියෝ වූහ. එකල්හි තුටු වූ බුදුරජතෙම භික්ෂුණීන්හට ඔවා දෙන්නවුන් අතුරෙන් මා අගතන්හි තැබී ය.

6183. මෙයින් පෙර සියක් දහස්වන කපෙහි කරණලද කර්මය මෙහි දී මට විපාක දුන්වීය. මම මිදුණු හීසැරයක් බඳු වූයෙමි කෙලෙසුන් දුවී මි.

6184. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රවරහිත ව වෙසෙමි.

6185. බුදුරජාණන් වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන් ස්වාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

6186 සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් නන්දක ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

නන්දකස්ථවිරාවදානය පස්වැනියි.

546. කාළුදායිස්ථවිරාවදානය

6187. මෙයින් සියක් දහස්වන කපෙහි ලොකනායක වූ සියලු ධර්මයන්හි විනිවිද දක්නා නුවණැස් ඇති පදුමුත්තර බුදුරජ තෙම ලොව පහළ විය.

6188. නායකයන් අතුරෙහි උතුම් වූ ගුණ - අගුණ දූය මේ මේ ය යි දන්නා වූ (දෙවිමිනිසුන්හට) ශාස්තෘ වූ කෙලෙහිගුණ දන්නා වූ කෙලෙහි ගුණ නැවත නැවත සිහි කරන්නා වූ බුදුරජ තෙම සත්ත්වයන් තීර්ථයෙහි (නිවන්මඟෙහි) යොදයි.

6189. අනන්තගුණ පිණ්ඩයක් බඳු වූ දයාවට වාසස්ථාන වූ (ඒ සර්වඥ තෙම) සියල්ල දන්නා නුවණින් (තරාදියකින් මෙන්) සත්ත්වයන්ගේ ආශයානුසය (චරිතාධිමුක්තීන්) විමසා බලා උතුම් වූ ධර්මය දෙසයි.

6190. ඒ මහාවීර වූ බුදුරජ තෙම කිසි කලෙක්හි අනන්තජනයා ගෙන් යුත් සබමැද සිව්සස් දහම් සහිත වූ මිහිරි ධර්මය දෙශනා කරයි.

6191. ආදි මධ්‍ය පර්‍යවසාන කල්‍යාණ වූ ඒ උතුම් ධර්මය අසා සියක් දහසක් ප්‍රාණීන්හට ධර්මාවබොධය විය.

6192. නින්නාදිතා තදා භූමී ගජ්ජිංසු ච පයොධරා,
සාධුකාරං පවත්තෙතුං[1] දෙවබ්‍රහ්මනරාසුරා.

6193. අහො කාරුණිකො සත්ථා අහො සද්ධම්මදෙසනා,
අහො භවසමුද්දම්හි නිමුග්ගෙ උද්ධරී ජිනො.

6194. එවං පවෙදජාතෙසු[2] සනරාමරබ්‍රහ්මසු,
කුලප්පසාදකානග්ගං සාවකං වණ්ණයී ජිනො.

6195. තදාහං හංසවතියං ජාතොමච්චකුලෙ අහුං,
පාසාදිකො දස්සනීයො පහූතධනධඤ්ඤවා.

6196. හංසාරාම මුපෙච්චාහං වන්දිත්වා තං තථාගතං,
සුණිත්වා මධුරං ධම්මං කාරං කත්වා ච තාදිනො.

6197. නිපච්ච පාදමූලෙහං ඉමං වචනමබ්‍රවිං,
කුලප්පසාදකානග්ගො යො තයා සන්ථුතො[3] මුනෙ.

6198. තාදිසො හොමහං වීර[4] බුද්ධසෙට්ඨස්ස සාසනෙ,
තදා මහාකාරුණිකො සිඤ්චන්තො’වාමතෙන මං.-

6199. ආහ මං පුත්ත උත්තිට්ඨ ලච්ඡසෙ තං මනොරථං,
කථං නාම ජිනෙ කාරං කත්වාන විඵලො සියා.

6200. සතසහස්සෙ ඉතො කප්පෙ ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන සත්ථා ලොකෙ භවිස්සති.

6201. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
උදායී නාම නාමෙන හෙස්සති සත්ථු සාවකො.

6202. තං සුත්වා මුදිතො හුත්වා යාවජීවං තදා ජිනං,
මෙත්තචිත්තො පරිචරිං පච්චයෙහි විනායකං.

6203. තෙන කම්මවිපාකෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

6204. පච්ඡිමෙ ච භවෙ’දානි රම්මෙ කාපිලවත්ථවෙ,
ජාතො මහාමච්චකුලෙ සුද්ධොදනමහීපතෙ.

6205. යදා අජායි සිද්ධත්ථො රම්මෙ ලුම්බිනිකානනෙ,
හිතාය සබ්බලොකස්ස සුඛාය ච නරාසභො.

1. පවත්තිංසු, මජසං. 2. සංවෙගජාතෙසු, සීමු.
3. යො තව සාසනෙ, සයා 4. තාදිසොහං මහාවීර, සයා.

6192. එකල්හි පෘථිවි තොමෝ මහත් නාද පැවැත්වූ ය. මෙඝයෝ ගර්ජනය කළාහු ය. දෙව් බඹ මිනිස් අසුර යන මොහු සාධුනාද පැවැත් වූහ.

6193. කාරුණික වූ ශාස්තෘ තෙමේ ආශ්චර්යයෙකි. සදහම් දෙසුම ද ආශ්චර්යයකි. සම්බුද්ධතෙම භවසයුරෙහි ගිලුනවුන් ගොඩනැගී ය. ආශ්චර්යයෙකි.

6194. මෙසේ දෙව්බඹුන් සහිත වූ මිනිසුන් ප්‍රීතියෙන් ඇලලී ගිය කල්හි බුදුරජතෙම කුලපහදවනුවන් අතුරෙන් අග්‍රය යි ශ්‍රාවකයකු පැසසී ය.

6195. එකල්හි මම හංසවතී නගරයෙහි ඇමතිකුලයක උපනෙම් දුටුවන් පහදවන්නා වූ, දකුම්කලු වූ, සමෘද්ධ වූ ධනධාන්‍ය ඇති කෙනෙක් වීමි.

6196. මම හංසාරාමයට එළඹ ඒ බුදුරජුන්හට වැඳ මිහිරි දහම අසා තාදීගුණ ඇති ඒ බුදුරජුන්හට සත්කාර කොට –

6197 – 6198 – 6199. මම උන්වහන්සේගේ පාමුල වැඳ වැටී මේ වදන් කීමි: "මුනීන්ද්‍රයන් වහන්ස, ඔබ වහන්සේ විසින් කුලපහදවනුවන් අතුරෙන් අග්‍රය යි යම් ශ්‍රාවකයෙක් තෙම පසසනලද ද, වීරයන් වහන්ස, මම ද ශ්‍රෙෂ්ඨ වූ බුදුවරයකුගේ සසුනෙහි එබඳු (කුලප්පසාදක භික්ෂූන් අතුරෙන් අග්‍ර වූ) ශ්‍රාවකයෙක් වෙම්වා" යි කීමි. එකල්හි මහා කාරුණික වූ බුදුරජ තෙමේ මට අමා ඉසින්නාක් මෙන් "පුතණුවෙනි, නැගිටුව. ඒ මනදෙළ ලබනෙහි ය. බුදුවරයකු කෙරෙහි සත්කාරයක් කොට කෙසේ නම් නිෂ්ඵල වන්නේ දැයි" මට වදාළේ ය.

6200. මෙයින් මතු සියක් දහස්වන කපෙහි ඔක්කාකකුලයෙහි උපදනා වූ නමින් ගෞතම නම් වූ ශාස්තෘ තෙමේ ලොව පහළ වන්නේ ය.

6201. උන්වහන්සේගේ ධර්මයෙහි දායාද වූ ධර්මයෙන් නිර්මිත කළාක් බඳු වූ ඖරස පුත්‍ර වූ, නමින් උදායී නම් වූ ශාස්තෘ ශ්‍රාවකයෙක් වන්නේය යි ද වදාළේ ය.

6202. එකල්හි එය අසා සතුටු වූයෙම් මෙත් සිත් ඇත්තෙම් විශිෂ්ටනායක වූ බුදුරජුන්හට සිවුපසයෙන් උවටැන් කෙළෙමි.

6203. ඒ කර්මවිපාකය හේතුකොට ගෙණ ද, චිත්තප්‍රණිධියත් හේතු කොට ගෙණ ද මම මිනිස්සිරුර හැර තව්තිසා දෙව්ලොවට (උත්පත්ති- වශයෙන්) ගියෙමි.

6204. දැන් මේ අන්තිම භවයෙහි රම්‍ය වූ කපිලවාස්තු නගරයෙහි සුද්ධොදන මිහිපතිහුගේ මහඇමතිකුලයෙහි උපන්නේ වෙමි.

6205. යම් කලෙක්හි නරශ්‍රෙෂ්ඨ වූ සිද්ධාර්ථ බෝසත් තෙමේ සව්- ලොවට හිතපිණිස ද සුව පිණිස ද රම්‍ය වූ ලුම්බිනී සල්උයනෙහි දී (මව් කුසින්) බිහි වී ද,

6206. තදෙව අහං ජාතො සහ තෙනෙව වඩ්ඪිතො,
පියො සහායො දයිතො වියත්තො නීතිකොවිදෙ.

6207. එකූනතිංසො වයසා නික්ඛන්තො පබ්බජී සො,[1]
ඡබ්බස්සං වීතිනාමෙත්වා බුද්ධො ආසි විනායකො.

6208. ජෙත්වා සසෙනකං මාරං ඛෙපයිත්වාන ආසවෙ,
භවණ්ණවං තරිත්වාන ආසි බුද්ධො සදෙවකෙ.[2]

6209. ඉසිව්හයං ගමිත්වාන[3] විනෙත්වා පඤ්චවග්ගියෙ,
තතො විනෙසි භගවා ගන්ත්වා ගන්ත්වා තහිං තහිං.

6210. වෙනෙය්‍යෙ විනයන්තො සො සංගණ්හන්තො සදෙවකං,
උපෙච්ච මාගධගිරිං[4] විහරිත්ථ තදා ජිනො.

6211. තදා සුද්ධොදනෙනාහං භූමිපාලෙන පෙසිතො,
ගන්ත්වා දිස්වා දසබලං පබ්බජිත්වා'රහා අහුං.

6212. තදා මහෙසිං යාචිත්වා පාපයිං කපිලව්හයං,
තතො පුරහං ගන්ත්වාන පසාදෙසිං මහාකුලං.

6213. ජිනො තස්මිං ගුණෙ තුට්ඨො මං මහාපරිසාය සො,[5]
කුලප්පසාදකානග්ගං පඤ්ඤපෙසි විනායකො.

6214. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6215. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6216. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා කාළුදායි ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

කාළුදායිත්ථෙරස්ස අපදානං ඡට්ඨං.

547. අභයත්ථෙරාපදානං

6217. පදුමුත්තරො නාම ජිනො සබ්බධම්මෙසු චක්ඛුමා,
ඉතො සතසහස්සම්හි කප්පෙ උප්පජ්ජි නායකො.

6218. සරණගමනෙ කඤ්චි[6] නිවෙසෙති තථාගතො,
කඤ්චි සීලෙ නිවෙසෙති දසකම්මපථුත්තමෙ.

1. නික්ඛමිත්වා අගාරතො, මජ්සං. 2. බුද්ධො ආසි සදෙවකෙ, මජ්සං.
3. ඉසිව්හයං පතනං ගන්ත්වා, ස්‍යා. 4. මගධෙ ගිරිං, මජ්සං. මඛගලාගිරිං. PTS.
5. මමාහ පුරිසාසභො ස්‍යා. PTS. 6. කිඤ්චි, මජ්සං.

6206. එදවස් ම මම ද උපනෙමි ඒ බෝසත් සිදුහතුන් සමග ම වැඩුණෙමි (ඔහුට) ප්‍රිය වූ දයාවත් වූ, ව්‍යක්ත වූ, නීතිදක්ෂ වූ සහාය-යෙක් වීමි.

6207. වයසින් එකුන්තිස් හැවිරිදි වූ ඒ (සිදුහත්) බෝසත් තෙමේ ගිහිගෙන් නික්මුනේ පැවිදි විය. (දුෂ්කරක්‍රියා වෙහි යෙදීමෙන්) සවසක් ගෙවා විශිෂ්ටනායක වූ බුදුවරයෙක් විය.

6208. (ඒ සිදුහත් තෙම) සේනා සහිත වූ මාරයා ජයගෙණ ආස්‍රව-ක්ෂය කොට භවසයුර තරණය කොට දෙවියන් සහිත ලොකයෙහි බුදු විය.

6209. ඉසිපතනයට ගොස් පඤ්චවර්ගීය භික්ෂූන් හික්මවා ඉක්බිති භාග්‍යවත් තෙමේ ඒ ඒ තන්හි ගොස් විනෙයජනයන් හික්ම විය.

6210. හික්ම වියයුතු ජනයන් හික්මවන්නා වූ ඒ බුදුරජ තෙම දෙවියන් සහිත ලොකයාට සඞ්ග්‍රහ කරමින් මගධපතීනයට හෙවත් රජ-ගහනුවරට එළඹ එකල එහි විසී ය

6211. එකල්හි සුදෙවුන් රජතුමන් විසින් යවන ලද මම ගොස් බුදුරජුන් දැක පැවිදි ව රහත් වීමි.

6212. එකල්හි බුදුරජුන් ඇයැද කපිලවාස්තු නගරයට පැමිණවීමි. උන්වහන්සේ එහි වැඩමවීමට පෙරාතුව ම මම ගොස් (සුද්ධොදන) මහ රජකුලය පැහැදවීමි.

6213. ඒ ගුණයෙහි සතුටු වූ විශිෂ්ට නායක වූ ඒ (ගෞතම) බුදුරජ තෙම මහපිරිස් මැද මා කුල පහදවනුවන්ගෙන් අග්‍රස්ථානයෙහි තැබී ය.

6214. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රවරහිත ව වෙසෙමි.

6215. බුදුරජානන් වහන්සේ වෙත මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

6216. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

මෙසෙයින් ආයුෂමත් කාළුදායිස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

කාළුදායි ස්ථවිරාපදානය සවැනියි.

547. අභයස්ථවිරාපදානය

6217. මෙයින් ලක්ෂයක් කල්පයෙහි පදුමුත්තර නම් ලොකනායක වූ සියලු ධර්මයන්හි (විනිවිද දක්නා සුළු) නුවණැස් ඇති පදුමුත්තර බුදුරජ තෙම ලොව පහළ විය.

6218. ඒ තථාගත තෙම කිසිවකු සරණගමනයෙහි පිහිටු වයි. කිසිවකු ශීලයෙහි ද උතුම් වූ දශ (කුශල) කර්මපථයෙහි ද පිහිටුවයි.

6219. දෙති කස්සචි සො වීරො සාමඤ්ඤඵලමුත්තමං,
සමාපත්ති තථා අට්ඨ තිස්සො විජ්ජා පවෙච්ඡති.[1]

6220. ඡළභිඤ්ඤාසු යොජෙති කඤ්චි සත්තං නරුත්තමො,
දෙති කස්සචි සො නාථො චතස්සො පටිසම්භිදා.

6221. බොධනෙය්‍යං පජං දිස්වා අසඞ්ඛෙය්‍යෙ පි යොජනෙ,[2]
ඛණෙන උපගන්ත්වාන විනෙති නරසාරථී.

6222. තදාහං හංසවතියං අහොසිං බ්‍රාහ්මණත්‍රජො,
පාරගූ සබ්බවෙදානං වෙය්‍යාකරණසම්මතො.

6223. නිරුත්තියා ච කුසලො නිඝණ්ටුම්හි විසාරදො,
පදකො කෙටුභවිදූ ඡන්දොවිචිතිකොවිදො.

6224. ජඞ්ඝාවිහාරං විචරං හංසාරාමමුපෙච්චහං,
අද්දසං වදතං සෙට්ඨං[3] මහාජනපුරක්ඛතං.

6225. දෙසෙන්තං විරජං ධම්මං පච්චනීකමතී අහං,
උපෙත්වා තස්ස වාක්‍යානි සුත්වාන විමලාකතං.[4]

6226. ව්‍යාහටං[5] පුනරුත්තං වා අපත්ථං වා නිරත්ථකං,
නාද්දසං තස්ස මුනිනො තතො පබ්බජිතො අහං.

6227. න චිරෙනෙව කාලෙන සබ්බසත්ථවිසාරදො,
නිපුණො බුද්ධවචනෙ අහොසිං ගණිසම්මතො.

6228. තදා චතස්සො ගාථායො ගන්ථයිත්වා සුව්‍යඤ්ජනා,
සන්ථවිත්වා තිලොකග්ගං දෙසයිස්සං දිනෙ දිනෙ.

6229. චිරන්තොසි මහාවීර සංසාරෙ සභයෙ වසං,
කරුණාය න නිබ්බාසි තතො කාරුණිකො මුනි.

6230. පුථුජ්ජනොව යො සන්තො න කිලෙසවසො අහු,
සම්පජානො සතියුත්තො තස්මා එසො අචින්තියො.

1. පවච්ඡති, මජසං. 2. අසඞ්ඛෙය්‍යම්පි යොජනං, මජසං.
3. වරදං සෙට්ඨං, මජසං. පවරං සෙට්ඨං, ස්‍යා 4. වාක්‍යාතං, මජසං.
5 ව්‍යාහතං, මජසං.

6219. ඒ බුද්ධවීර තෙමේ කිසිවකුට උතුම් වූ (සෝවාන්ආදි වූ සතර) ශ්‍රාමණ්‍යඵලය දෙයි. එසේ ම ත්‍රිවිද්‍යාවන් ද අෂ්ටසමාපත්තීන් ද දෙයි.

6220. නරෝත්තම වූ බුදුරජ තෙම කිසියම් සත්ත්වයෙකුන් ෂඩභිඥාවන්හි යොදවයි. අනාථයනට (පිහිට වන බැවින්) නාථ වූ තථාගත තෙමේ කිසිවෙකුට සිව් පිළිසැඹියාවන් දෙයි.

6221. දමනය කළයුතු නරයන් හික්මවන බැවින් නරසාරථි වූ බුදුරජතෙම නොගිණිය හැකි යොදුන් දුර සිටියා වූ ද ධර්මාවබෝධයට සුදුසු සත්ත්වසමූහය දැක මොහොතකින් එහි එළඹ උන් හික්මවයි.

6222 - 6223. එකල්හි මම හංසවතී නගරයෙහි සියලු වේදයන්ගේ පරතෙරට ගියා වූ ව්‍යාකරණ සඞ්ඛ්‍යාත ශබ්දශාස්ත්‍රයෙහි විශාරදයෙකැයි සම්මත වූ (ශබ්දාර්ථයන් නිවැරදි ලෙස ගැණුමට උගන්වන) නිරුක්ති-ශාස්ත්‍රයෙහි දක්ෂ වූ (ශබ්දාභිධානයන් දැන ගැණුමට උගන්වන) නිඝණ්ඩු-ශාස්ත්‍රයෙහි විශාරද වූ (ව්‍යාකරණයෙහි ආදිම අවස්ථාව ලෙස සැලකෙන නාමාදි) පදයන් දන්නා වූ (කාව්‍යකරණයෙහි දී කවීන්හට උපකාර වන අලඞ්කාරාදිය ඇතුළත් ක්‍රියාකල්ප විකල්පය යි කියන ලද) කෙටුභ-ශාස්ත්‍රය දන්නා වූ (අක්ෂරයන්ගේ නියමය දක්වෙන ඡන්දස් වෙන් කොට දැනගැණීමට උගන්වන) ඡන්දෝවිචිති වේදාඞ්ගයෙහි ද දක්ෂ වූ බ්‍රාහ්මණ පුත්‍රයෙක් වීමි.

6224 - 6225 - 6226. මම ජඞ්ඝාවිහාරයෙහි යෙදෙමින් හෙවත් ශරීර ව්‍යායාම පිණිස ඇවිදිමින් හංස රාමයට එළඹ, මහාජනයා විසින් පිරිවරන ලද්දවූ වාදීන් අතුරෙන් ශ්‍රේෂ්ඨවූ නිර්මල ධර්මය දෙශනා කරන්නා වූ බුදුරජුන් දිටිමි. විරුද්ධ මතධාරී වූ මම සමීපයට එළඹ උන් වහන්සේගේ නිර්මල වූ වචන අසා ඒ බුදුරජුන්ගේ වැරදි ලෙස යොදන ලද්ද වූ හෝ පුන පුනා කියන ලද්ද වූ හෝ අපාර්ථ වූ හෝ නිරර්ථක වූ හෝ (වචනයක්) මම නො දිටිමි. එහෙයින් මම පැවිදි වීමි.

6227. නො බෝ කලකින් ම ශාස්ත්‍ර විශාරද වූයෙම් බුද්ධවචනයෙහි දක්ෂ වූයෙම් ගණයා පරිහරණයට සුදුසුය යි සම්මත වූයෙම් හෙවත් ස්ථවිර වූයෙම් වීමි.

6228. එකල්හි මම බුදුරජුන්හට පසසා අක්ෂර වත් වූ සිවුගයක් ගොතා දිනපතා කියනෙමි. කෙසේද යත්:

6229. මහාවීරයන් වහන්ස, මුබ බිය සහිත වූ සසරෙහි වෙසෙමින් එහි විරතවූයේ වෙහි ය. කරුණායෙන් ම පිරිනිවන් නො පෑ ය. එහෙයින් බුදුරජ තෙම කාරුණිකය.

6230. යමෙක් පුහුදුන්ව සිටියදී පවා කෙලෙශ වසඟ නො වූයේ ද, සම්‍යක්ප්‍රඥාවෙන් හා සමාධියෙන් යුක්තවූයේ වේ ද, එහෙයින් මෙතෙම නො සිතිය හැකි ගුණ ඇත්තේ ය.

6231. දුබ්බලානි කිලෙසානි යස්සාසයගතානිමෙ,
ඤාණග්ගිපරිදඩ්ඪානි න බීජිංසු තදබ්භුතං[1].

6232. යො සබ්බලොකස්ස ගරු ලොකො යස්ස තථා ගරු,
තථාපි ලොකාචරියො ලොකො තස්සානුවත්තකො.

6233. එවමාදීහි සම්බුද්ධං කිත්තයං ධම්මදෙසනං,
යාවජීවං කරිත්වාන ගතො සග්ගං තතො චුතො.

6234. සතසහස්සෙ ඉතො කප්පෙ යං බුද්ධමභිකිත්තයිං,
දුග්ගතිං නාභිජානාමි කිත්තනාය ඉදං ඵලං.

6235. දෙවලොකෙ මහාරජ්ජං රජ්ජං පාදෙසිකං ච යං,[2]
චක්කවත්තිමහාරජ්ජං බහුසො'නුභවිං අහං.

6236. දුවෙ භවෙ පජායාමි දෙවත්තෙ අථ මානුසෙ,
අඤ්ඤං ගතිං න ජානාමි කිත්තනාය ඉදං ඵලං.

6237. දුවෙ කුලෙ පජායාමි ඛත්තියෙ අථ බ්‍රාහ්මණෙ,
නීචෙ කුලෙ න ජායාමි කිත්තනාය ඉදං ඵලං.

6238. පච්ඡිමෙ ච භවෙ' දානි ගිරිබ්බජපුරුත්තමෙ,
රඤ්ඤොහං බිම්බිසාරස්ස පුත්තො නාමෙන චාභයො.

6239 පාපමිත්තවසං ගන්ත්වා නිගණ්ඨෙන විමොහිතො,
පෙසිතො නාතපුත්තෙන[3] බුද්ධසෙට්ඨං උපෙච්චහං.

6240. පුච්ඡිත්වා නිපුණං පඤ්හං සුත්වා ව්‍යාකරණුත්තමං,
පබ්බජිත්වාන නචිරං අරහත්තමපාපුණිං.

6241. කිත්තයිත්වා ජිනවරං කිත්තිතො හොමි සබ්බදා,
සුගන්ධදෙහවදනො ආසිං සුඛසමප්පිතො.

6242. තික්ඛ හාසු ලහුපඤ්ඤො[4] මහාපඤ්ඤො තථෙවහං,
විචිත්තපටිභානො ච තස්ස කම්මස්ස වාහසා.

6243. අභිත්ථවිත්වා පදුමුත්තරබ්‍යං[4]
පසන්නචිත්තො අසමං සයම්භුං,
න ගච්ඡි කප්පානි අපායභූමිං
සතං සහස්සානි ඵලෙන තස්ස.

6244 කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

1. තමබ්භුතං, මජ්සං.
2. පාදෙසිං කඤ්චනග්ඝියං, මජ්සං. 3. නාටපුත්තෙන, සීමු.
4. තික්ඛහාසලහුපඤ්ඤො, මජ්සං. 5. පදුමුත්තරාභං, මජ්සං.

6231. යමෙකුගේ සිත්හි වූ මෙම දුසිල කෙලෙශයෝ ඥානාග්නියෙන් දවනලද්දාහු ශෙෂ නො වූවාහු ද, එය විසමයෙකි.

6232. යම් බුදුවරයෙක් තෙම සියලු ලොකයාහට යම් සේ ගුරු ද, ඒ බුදුරජුන්හට ලොකයා ද එසේ ම ගරු ය. එසේ ම උන්වහන්සේ ලොකාචාර්ය්‍ය ය. ලොකයා උන්වහන්සේ අනුගමනය කරන්නේ වේ.

6233. මේ ආදීන් සම්බුදුරජුන්ට පසසමින් දිවි ඇති තාක් ධර්ම දෙශනා කොට ඉන් ච්‍යුත වූයෙම් ස්වර්ගගත වීමි.

6234. මෙසිත් කල්ප ලක්‍ෂයකින් යට බුදුරජුන්හට යම් පැසසුමක් කෙලෙම් ද, ඒ හේතුවෙන් දුගතියක් නො දනිමි. (බුදුරජුන් හට) පැසසීමෙහි මේ විපාක යි.

6235. මම දෙව්ලොවෙහි මහාරාජ්‍යය ද, ප්‍රාදෙශික වූ යම් රාජ්‍ය-යෙක් වේ නම් එය ද චක්‍රවර්තිමහාරාජ්‍යය ද බොහෙවින් අනුභව කෙළෙමි

6236. දෙව් අත්බැව්හි ද යළි මිනිස් අත්බැව්හි ද යන දෙඅත් බැව්හි උපදිමි. ඉන් පිටත් අතික් ගතියක් නො දනිමි. බුදුරජුන්ගේ ගුණකීර්තනයෙහි මේ විපාක යි.

6237. කැත් බමුණු යන දෙකුලෙහි උපදිමි. පහත් කුලයෙහි නො උපදිමි. බුදුරජුන්ගේ ගුණකීර්තනයෙහි මේ විපාක යි.

6238. මම දැන් මේ පශ්චිම භවය පැමිණි කල්හි උතුම් වූ ගිරිව්‍රජ (=රජගහ) නගරයෙහි බිම්සරරජුගේ නමින් අභය නම් වූ පුත්‍රයෙක් වීමි.

6239. පාපමිත්‍රවශයට ගොස් මුළා කරණ ලදුයෙම් නිගණ්ඨ නාතපුත්‍රයා විසින් මෙහෙයන ලද්දා වූ මම බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙත එළඹ,

6240. නිවටුන් විසින් පුහුණු කරණලද ප්‍රශ්නයක් විචාරා බුදුරජුන්ගේ උතුම් වූ (ඒ ප්‍රශ්න) විසඳීම අසා පැවිදි ව නො බෝ කලකින් ම රහත්බවට පැමිණියෙමි.

6241. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේට පසසා හැමකල්හි පසස්නා ලදුයෙම් වෙමි. සුවඳවත් වූ සිරුරු හා මුව ඇත්තෙම් සැපයෙන් ආඪ්‍යයෙක් වීමි.

6242. මම ඒ කර්මයාගේ බලයෙන් තීක්‍ෂ්ණප්‍රඥා ද හාසුප්‍රඥා ද මහාප්‍රඥා ද වූයෙම් විසිතුරු වැටහීම් ඇත්තෙම් ද වීමි.

6243. පහන් සිත් ඇත්තෙම් අසම වූ සර්‍වඥ වූ පදුමුත්තර නම් බුදුරජුන්හට පසසා ඒ කුශලකර්මයාගේ විපාකයෙන් කල්පලක්‍ෂයක් අපායභූමියට (උත්පත්ති වශයෙන්) නො ගියෙමි.

6244. මා විසින් කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජෙකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිත ව වෙසෙමි.

6245. සවාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6246. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා අභයත්ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

අභයත්ථෙරස්ස අපදානං සත්තමං.

548. ලොමසකඞ්ගියත්ථෙරාපදානං

6247 ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො,
කස්සපො නාම නාමෙන[1] උප්පජ්ජි වදතං වරො.

6248. තදාහං චන්දනො චෙව පබ්බජිත්වාන සාසනෙ,
ආපාණකොටිකං ධම්මං පූරයිත්වාන සාසනෙ-

6249. තතො චුතා සන්තුසිතං උපපන්නා උභො මයං.
තත්ථ දිබ්බෙහි නච්චෙහි ගීතෙහි වාදිතෙහි ච-

6250. රූපාදිදසහඞ්ගෙහි අභිභොත්වාන සෙසකෙ,
යාවතායුං වසිත්වාන අනුභොත්වා මහාසුඛං-

6251. තතො චවිත්වා තිදසං චන්දනො උපපජ්ජථ,
අහං කපිලවත්ථුස්මිං අහොසිං[2] සාකියත්‍රජො.

6252. යදා උදායිථෙරෙන අජ්ඣිට්ඨො ලොකනායකො,
අනුකම්පිය සක්‍යානං උපෙසි කපිලව්හයං.

6253. තදාතිමානිනො සක්‍යා න බුද්ධස්ස ගුණඤ්ඤුනො,
පණමන්ති න සම්බුද්ධං ජාතිත්ථද්ධා අනාදරා.

6254. තෙසං සඞ්කප්පමඤ්ඤාය ආකාසෙ චඞ්කමී ජිනො,
පජ්ජුන්නො විය වස්සිත්ථ පජ්ජලිත්ථ යථා සිඛී.

6255. දස්සෙත්වා රූපමතුලං පුන අන්තරධායථ,
එකොපි හුත්වා බහුධා අහොසි පුනරෙකකො.

6256. අන්ධකාරං පකාසං ච දස්සයිත්වා අනෙකධා,
පාටිහිරං[3] කරිත්වාන විනයී ඤාතකෙ මුනි.

1. ගොත්තෙන, මජ්සං. 2 අජායිං, මජ්සං. 3. පාටිහෙරං, මජ්සං.

6245. බුදුරජාණන් වහන්සේ වෙත පැමිණීම මට එකාන්තයෙන්, ස්වාගතය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

6246. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේයින් ආයුෂ්මත් අභය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

අභය ස්ථවිරාපදානය සත්වැනියි.

548. ලොමසකඞ්ගිය ස්ථවිරාපදානය

6247. මේ මහාභද්‍රකල්පයෙහි බ්‍රාහ්මණවංශික වූ මහත් යශස් ඇති නමින් කාශ්‍යප නම් වූ බුදුරජතෙම ලොව පහළ විය.

6248. එකල්හි මම ද (මාගේ සහාය වූ) චන්‍දන තෙමේ ද සසුනෙහි පැවිදි ව ජීවිතාන්තය දක්වා සස්නෙහි පිළිවෙත්දම් පුරා –

6249. අපි දෙදෙන ම ඉන් සැව සන්තුෂිතයෙහි උපන්නමෝ එහි දිව්‍යමය වූ නෘත්‍ය ගීතවාදිතයෙන් ද,

6250. රූපාදි දශවිධ අඞ්ගයෙන් ද සෙස්සන් අභිභවනය කොට මහත් සම්පත් අනුභව කොට දිවි ඇති තාක් වැස,

6251. ඉන් සැව චන්‍දන තෙමේ තිදස්පුර දෙවියෙක් ව උපන්නේ ය. මම කපිලවාස්තු නගරයෙහි ශාක්‍යපුත්‍රයෙක් වීමි.

6252. යම් කලෙක්හි උදායි ස්ථවිරයන් විසින් අයැදනාලද බුදුරජ තෙම ශාක්‍යයන්හට අනුකම්පා කොට කපිලවාස්තු නගරයට වැඩියේ ද,

6253. එකල්හි බුදුරජුන්ගේ ගුණ නො දන්නා අතිශය මානවත් වූ ජාතිමානයෙන් තද වූ, ආදර විරහිත වූ ශාක්‍යයෝ සම්බුදුරජුන්හට නො වඳිත්.

6254. ඔවුන්ගේ අදහස දැනගත් බුදුරජතෙම අහසෙහි සක්මන් කළේ ය. මේඝය සෙයින් වැස්සීය. ගින්න සෙයින් දිලිසුනේ ය.

6255. අසමාන වූ (උන්වහන්සේගේ) රූපය දක්වා නැවත අතුරු දහන් විය. (පළමුවෙන්) එකෙක්ව (පෙනී) නැවත බොහෝ දෙනා (ලෙස පෙනෙන්නට) විය.

6256. අඳුර ද එළිය ද නොයෙක් අයුරින් දක්වා ප්‍රාතිහාර්ය කොට බුදුරජ තෙම දෙතින් හික්ම වි ය.

6257. චාතුද්දීපො මහාමෙඝො තාවදෙ සම්පවස්සථ,[1]
තදා හි ජාතකං බුද්ධො වෙස්සන්තරමදෙසයි.

6258. තදා තෙ ඛත්තියා සබ්බෙ නිහන්ත්වා ජාතිජං මදං,
උපෙසුං සරණං බුද්ධං – ආහ සුද්ධොදනො තදා:

6259. ඉදං තතියං තව භූරිපඤ්ඤ
පාදානි වන්දාමි සමන්තචක්ඛු,
යදා'භිජාතො පථවිං[2] පකම්පයි
යදා ච තං නජ්ජහි ජම්බුඡායා.

6260. තදා බුද්ධානුභාවං තං දිස්වා විම්හිතමානසො,
පබ්බජිත්වාන තත්ථෙව නිවසිං මාතුපූජකො.

6261. චන්දනො දෙවපුත්තො මං උපගන්ත්වාන'පුච්ඡථ,
භද්දෙකරත්තස්ස තදා සංඛෙපවිත්ථාරනයං[3].

6262. චොදිතොහං තදා තෙන උපෙච්ච නරනායකං,
භද්දෙකරත්තං සුත්වාන සංවිග්ගො වනමාමකො.

6263. තදා මාතරමාපුච්ඡිං[4] වනෙ වච්ඡාමි එකකො,
සුඛුමාලොති මෙ මාතා වාරයී තං තදා'වචං:

6264. දබ්බං කුසං[5] පොටකිලං උසීරං මුඤ්ජබබ්බජං[6],
උරසා පනුදිස්සාමි විවෙකමනුබ්‍රෑහයං.

6265. තදා වනං පවිට්ඨොහං සරිත්වා ජිනසාසනං,
භද්දෙකරත්තඔවාදං අරහත්තමපාපුණිං.

6266. අතීතං නන්වාගමෙය්‍ය නප්පටිකංඛෙ අනාගතං,
යදතීතං පහීනං තං අප්පත්තඤ්ච අනාගතං.

6267. පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති,
අසංහීරං අසංකුප්පං තං විද්වා අනුබ්‍රෑහයෙ.

1. තාවදෙව පවස්සථ, මජසං.
2. පඨවිං, මජසං.
3. සඞ්ඛිපවිත්ථාරං නයං, මජසං.
4. තදමාතරමපුච්ඡිං, මජසං
5. ඝනං, මජසං.
6. මුඤ්ජපබ්බජං, මජසං.

6257. එකෙණෙහි චාතුද්දීපික මහාමේඝයෙක් වර්ෂණය කළේය. එකල්හි බුදුරජ තෙම වෙස්සන්තරජාතකය දෙසී ය.

6258. එකල්හි ඒ සියලු ක්‍ෂත්‍රියයෝ ජාතිමානයෙන් හටගත් මදය නැතිකොට බුදුරජුන් සරණ ගියාහු ය. එකල්හි ශුද්ධෝදන රජතෙම මෙසේ කීය:

6259. මහත් ප්‍රඥා ඇති බැවින් භූරිපඤ්ඤ නම් වූ (සර්වඥතාඥාන-යෙන් යුත් බැවින්) සමන්තචක්ඛු නම් වූ බුදුරජාණන් වහන්ස, ඔබ වහන්සේගේ සිරිපා වඳිමි. මේ තෙවන වැඳුම යි. යම් කලෙක්හි විශිෂ්ට ජන්ම ඇත්තේ පෘථිවිය කම්පා කෙළේ ද, (ඒ අසිත තවුස් හමුවෙහි දී මාගේ පළමු වැඳුම විය. (එසේ ම) යම් කලෙක්හි වප්මඟුලැ පළමු සමවතින් පලක් බැඳ හුන් ඔබ දඹරුක්සෙවන නො හැරී ද, එහිදී මාගේ දෙවෙනි වැඳුම විය.

6260. එකල්හි ඒ බුද්ධානුභාවය දැක විස්මය පත් සිත් ඇත්තේ මව පුදන්නා වූ මම පැවිදිව එහි (ගෙහි)ම විසීමි.

6261. එකල්හි චන්දන දිව්‍යපුත්‍ර තෙමේ මා වෙත එළඹ භද්දෙක-රත්ත සූත්‍රය පිළිබඳ සංක්ෂිප්ත ක්‍රමය හා විස්තාර ක්‍රමය විචාළේ ය.

6262. එකල්හි ඒ දිව්‍යපුත්‍රයා විසින් මෙහෙයන ලද මම බුදුරජුන් වෙත එළඹ භද්දෙකරත්ත සූත්‍රය අසා කලකිරුණේ වනයෙහි විසීමට කැමැති වීමි.

6263. එකල්හි හුදෙකලාව වනයෙහි වසන්නෙමැයි මවගෙන් (කැමැත්ත) විචාළෙමි. මාගේ මවුතොමෝ (මා) සිව්මැළිය යි එය වැලකුවා ය. එකල්හි (මම මවට) මෙසේ කීමි:

6264. හිඳීම් සිටීම් සක්මන් කිරීම් යන ත්‍රිවිධ ඉරියව්වෙන් භාවනා වඩමින් දබ්භ නම් වූ කුසතණ ද, වැළක් හෙවත් කාශ නම් තෘණ ද, සැමැත්ත ද, මුදුතණ හා බබුස්තණ ද ලයින් ඉවත් කරන්නෙමි (ඒ මත නො හෝනේ) වෙමි යි කියා යි.

6265 එකල්හි වනයට පිවිසි මම බුද්ධානුශාසනය වූ භද්දෙකරත්ත අවවාදය සිහිකොට රහත්බවට පැමිණියෙමි.

6266. අතීත වූ පස්කඳ ගැන (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් සිතමින්) ඒ අනුව නො යන්නේ ය. අනාගත වූ පස්කඳ (තෘෂ්ණා දෘෂ්ටිවශයෙන් සිතමින්) නො පතන්නේ ය. යම් අතීතයක් වූයේ නම් එය ගෙවී ගියේ ය. යම් අනාගතයක් වන්නේ නම් එය නො පැමිණියේ ය.

6267. යමෙක් තෙම වර්තමාන වූ (පඤ්චස්කන්ධ) ධර්මයන් පිළිබඳව සිතට ඇතිවන අදහස් ඒ ඒ තන්හි දී ම (අනිත්‍යාදි වශයෙන්) විදසුන් නුවණින් දකී ද, එබඳු නුවණැත්තේ (රාගාදීයෙන්) නො හැකුළුනු කොට (එසේ ම රාගාදියෙන්) නො හැසුණු කොට ඒ විදර්ශනාව භාවනා වශයෙන් වඩන්නේ ය.

6268. අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ,
න හි නො සඞ්ගරං තෙන මහාසෙනෙන මච්චුනා.

6269. එවං විහරමානාපි[1] අහොරත්තමතන්දිතං,
තං වෙ භද්දෙකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනී.

6270. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6271. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6272. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ලොමසකඞ්ගියො**[2] ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ලොමසකඞ්ගියත්ථෙරස්ස අපදානං අට්ඨමං.

549. වනවච්ඡත්ථෙරාපදානං

6273. ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො,
කස්සපො නාම නාමෙන[3] උප්පජ්ජි වදතං වරො.

6274. තදාහං පබ්බජිත්වාන තස්ස බුද්ධස්ස සාසනෙ,
යාවජීවා චරිත්වාන බ්‍රහ්මචරියං තතො චුතො.

6275. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

6276. තතො චුතො අරඤ්ඤම්හි කපොතො ආසහං තහිං,
වසතෙ ගුණසම්පන්නො භික්ඛු ඣානරතො සදා–

6277. මෙත්තචිත්තො කාරුණිකො සදා පමුදිතානනො,
උපෙක්ඛකො මහාවීරො අප්පමඤ්ඤාසු කොවිදො.

6278. විනීවරණසඞ්කප්පො සබ්බසත්තහිතාසයෙ,
විස්සත්ථො[4] නචිරෙනාසිං තස්මිං සුගතසාවකෙ.

6279. උපෙච්ච පාදමූලම්හි නිසින්නස්ස තදා ස මෙ,[5]
කදාචි ආමිසං දෙති ධම්මං දෙසෙති චෙකදා.

1. විහාරිං ආතාපී, මජ්ඣං. 2. ලොමසංඛියො, සෘා.
3. ගොත්තෙන, මජ්ඣං. 4. විසට්ඨො, මජ්ඣං. 5. තදස්සමෙ, මජ්ඣං.

6268. අද අද ම වීර්‍ය්‍යය කළ යුතු ය. මරණය හෙටදැයි කවරෙක් දන්නේ ද? (ගිනි විස අවි ආදී මරණයට කාරණ වන නොයෙක් හේතු නමැති) මහසෙනග ඇති මරණය හෙවත් මාරයා සමග (මිත්‍ර සන්ථව වශයෙන් හෝ අල්ලස් දීම් වශයෙන් හෝ බලසෙන් මැඩලීම් වශයෙන් හෝ) අපගේ ගිවිසුමෙක් නැත

6269. මෙසේ වසන්නා වූ, වීර්‍ය්‍යවත් වූ, දිවා රෑ දෙක්හි අනලස් වූ හේ ඒකාන්තයෙන් භද්‍රෙකරාත්‍රය යි ශාන්ත වූ බුදුරජ තෙම වදාරයි.

6270. මා විසින් කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

6271. බුදුරජානන් වහන්සේ වෙත මාගේ පැමිණීම ඒකාන්තයෙන් යහපත් විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදි.

6272. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් ලොමසකඞ්ගිය ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේක.

ලොමසකඞ්ගිය ස්ථවිරාවදානය අටවැනියි.

549. වනවච්ඡස්ථවිරාවදානය

6273. මෙම භද්‍රකල්පයෙහි බ්‍රාහ්මණ වංශයෙහි වූ මහත් යශස් ඇති වූ නමින් කාශ්‍යප නම් වූ බුදුරජ තෙම ලොව පහළවිය.

6274. එකල්හි මම ඒ බුදුරජුන්ගේ සසුනෙහි පැවිදිව දිවි ඇතිතාක් බඹසර හැසිර ඉන් සැව–

6275. මැනවින් කරණ ලද ඒ කර්මය හේතුකොට ගෙණ ද, චිත්ත ප්‍රණිධීන් හේතුකොට ගෙණ ද, මම මිනිස්සිරුර හැර තව්තිසා දෙව්-ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

6276 - 6277. එයින් ච්‍යුත වූයෙමි මම අරණෙහි පරවියෙක් වීමි. හැමකල්හි ධ්‍යානයෙහි ඇලුනා වූ (අභිඥ) ගුණයන්ගෙන් යුක්ත වූ මෙත් සිත් ඇති, කාරුණික වූ, නිතරම පුබුදු වූ මුහුණු ඇති, උපෙක්ෂාවෙන් යුක්ත වූ, මහත් වීර්‍ය්‍ය ඇති, (මෛත්‍රා කරුණා මුදිතා උපෙක්ඛා සඞ්ඛ්‍යාත) අප්‍රාමාණ්‍යාලම්බනයන්හි දක්ෂ වූ, භික්ෂුනමක් ඒ වනයෙහි වසයි.

6278. කෙලෙසුන්ගෙන් නො ඇවුරුණු සිත් ඇති සව්සත්නට හිත වූ අදහස් ඇති, ඒ බුද්ධශ්‍රාවකයන් වහන්සේ කෙරෙහි නොබෝ කලකින් ම විශ්වාසී වූයෙමි වෙමි.

6279. එකල්හි ඒ තවුස් තෙම වෙත එළඹ පාමුල හුන් මට කිසි දිනක ආමිසය (අහර) දෙයි. කිසි දිනක දහම් දෙසයි.

6280 තදා විපුලපෙමෙන උපාසිත්වා ජිනත්‍රජං,
තතො චුතො ගතො සග්ගං පවාසා[1] සඝරං යථා.

6281. සග්ගා චුතො මනුස්සෙසු නිබ්බත්තො පුඤ්ඤකම්මුනා,
අගාරං ඡඩ්ඩයිත්වාන පබ්බජිං ලහුසො අහං.

6282. සමණො තාපසො විප්පො පරිබ්බාජො තථෙවහං,
හුත්වා වාසිං අරඤ්ඤම්හි අනෙකසතසො අහං.

6283. පච්ඡිමෙ ච භවෙ දානි රම්මෙ කාපිලවත්ථවෙ[2],
වච්ඡගොත්තො දිජො[3] තස්ස ජායාය අහමොක්කමිං.

6284. මාතු මෙ දොහළො ආසි තිරොකුච්ඡිගතස්ස මෙ,
ජායමානසමීපම්හි වනවාසාය නිච්ඡයො.

6285. තතො මෙ අජනී මාතා රමණීයෙ වනන්තරෙ,
ගබ්භතො නික්ඛමන්තං මං කාසායෙන පටිග්ගහුං.

6286. තතො කුමාරො සිද්ධත්ථො ජාතො සක්‍යකුලද්ධජො,
තස්ස මිත්තො පියො ආසිං සංවිස්සත්ථො සුමානියො.

6287. සත්තසාරෙ'භිනික්ඛන්තෙ ඔහාය විපුලං යසං,
අහම්පි පබ්බජිත්වාන හිමවන්තමුපාගමිං.

6288. වනාලයං භාවනීයං කස්සපං ධුතවාදකං[4],
දිස්වා සුත්වා ජිනුප්පාදං උපෙසිං නරසාරථිං.

6289. සො මෙ ධම්මමදෙසෙසි සබ්බත්ථං සම්පකාසයං,
තතොහං පබ්බජිත්වාන වනමෙව පුනාගමිං[5].

6290. තත්ථාප්පමත්තො[6] විහරං ඡළභිඤ්ඤා අඵස්සයිං[7],
අහො සුලද්ධලාභොම්හි සුමිත්තෙනානුකම්පිතො.

6291. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගො'ව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6292. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6293. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **වනවච්ඡො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

වනවච්ඡත්ථෙරස්ස අපදානං නවමං.

---

1. පවාසො, මජසං. 2. කපිලවත්ථවෙ, මජසං. 3. දිජො, මජසං.
4. ධුතවාදිකං, මජසං. 5. පුනාගමං, මජසං. 6. තත්ථප්පමත්තො, සිමු.
7. අපස්සයිං, ස්‍යා.

6280. එකල්හි මහත් වූ ප්‍රෙමයෙන් ඒ බුද්ධශ්‍රාවකයන් ඇසුරු කොට එයින් චුත වූයෙමි. විප්‍රවාසයෙන් (රටින් බැහැර ගොස් සිට) සිය ගෙට යන්නකු මෙන් සවර්ගයට ගියෙම් වෙමි.

6281. සවර්ගයෙන් ච්‍යුතව පුණ්‍යකර්ම බලයෙන් මිනිසත් බැව්හි උපන්නා වූ මම ගිහිගෙය හැර වහා පැවිදි වීමි.

6282. එසේ ම මම අචේලකයක් වර ශ්‍රමණයෙක් ද තාපසයෙක් ද, බ්‍රාහ්මණයෙක් ද, පරිව්‍රාජකයෙක් ද වී අරණෙහි විසීමි.

6283 දැන් මේ අන්තිම ජාතියෙහි, රම්‍ය වූ කපිලවාස්තු නගරයෙහි වච්ඡගොත්ත නම් බ්‍රාහ්මණයෙක් විය. මම ඔහුගේ භාර්යාවගේ කුසෙහි පිළිසිඳ ගතිමි.

6284. මව්කුසෙහි පිළිසිඳගත් කල්හි මාගේ මව ප්‍රසූතිය ළංවත්ම වනයෙහි විසීමේ තීරණය වූ දොළ ඇත්තී වූ ය.

6285. ඉක්බිති මාගේ මව්තොමෝ සින්කලු වනයෙහි දී මා ප්‍රසූත කළා ය. මව්කුසින් නික්මෙන්නා වූ මා කසාවතකින් පිළිගත්හ.

6286. ඉක්බිති ශාක්‍යවංශයට ධජයක් වැනි වූ සිදුහත් කුමර තෙමේ උපන්නේ ය. මම ඔහුගේ ඉතා විශ්වාස වූ අතිශයින් බුහුමන් කරණ ප්‍රියමිත්‍රයා වීමි.

6287. මහත් වූ සම්පත් හැර දමා බෝසතුන් ගිහිගෙන් නික්මුනු කල්හි මම ද පැවිදිව හිමවතට එළඹියෙමි.

6288. වනවාසී වූ ගරුකටයුතු වූ ධූතවාදී වූ (මහ) කසුප් තෙරුන් දැක බුද්ධොත්පාදය ගැණ අසා තථාගතයන් වහන්සේ වෙත එළඹියෙමි.

6289. ඒ සර්වඥ තෙම සියලු අර්ථයන් ප්‍රකට කරමින් මට දහම් දෙසී ය. ඉක්බිති මම පැවිදිව යළි වනයට ම ගියෙමි.

6290. නො පමා වූයෙම් එහි වෙසෙමින් ෂඩභිඥාවන් ලැබීමි. කලණ මිතුරු (මහකසුප්) තෙරුන් විසින් අනුකම්පා කරණලදුයෙම් උත්තමලාභය ලදුයෙමි වෙමි. ආශ්චර්යයෙකි.

6291. මා විසින් කෙලශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇත්රජකු මෙන් බැඳුම් සිඳ ආස්‍රව රහිතව වෙසෙමි.

6292. බුදුරජානන් වහන්සේ වෙත මාගේ පැමිණීම සවාගත විය. ත්‍රිවිද්‍යාවෝ අනුප්‍රාප්තයහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

6293. සිවුපිළිසැඹියාවෝ ද අෂ්ටවිමොක්ෂයෝ ද ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණ ලදහ. බුදුරජානන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසෙයින් ආයුෂමත් වනවච්ඡ ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළ සේකි.

වනවච්ඡස්ථවිරාවදානය නව වැනියි.

550. චූළසුගන්ධත්ථෙරාපදානං

6294. ඉමම්හි භද්දකෙ කප්පෙ බ්‍රහ්මබන්ධු මහායසො,
කස්සපො නාම නාමෙන[1] උප්පජ්ජි වදතං වරො.

6295. අනුව්‍යඤ්ජනසම්පන්නො බත්තිංසවරලක්ඛණො[2],
බ්‍යාමප්පභාපරිවුතො රංසිජාලසමොත්ථතො[3].

6296. අස්සාසෙතා යථා චන්දො සූරියොව පභඞ්කරො,
නිබ්බාපෙතා යථා මෙඝො සාගරොව ගුණාකරො.

6297. ධරණීරිව සීලෙන හිමවාව සමාධිනා,
ආකාසො විය පඤ්ඤාය අසඞ්ගො අනිලො යථා.

6298. තදාහං බාරාණසියං උප්පන්නො මහාකුලෙ,
පහූතධනධඤ්ඤස්මිං නානාරතනසඤ්චයෙ.

6299. මහතා පරිවාරෙන නිසින්නං ලොකනායකං,
උපෙච්ච ධම්මමස්සොසිං අමතංව මනොහරං.

6300. බත්තිංසලක්ඛණධරො[4] සනක්ඛත්තොව චන්දිමා,
අනුව්‍යඤ්ජනසම්පන්නො සාලරාජාව ඵුල්ලිතො.

6301. රංසිජාලපරික්ඛිත්තො දිත්තොව කනකාචලො,
බ්‍යාමප්පභාපරිවුතො සරස්මීව දිවාකරො.

6302. සොණ්ණානනො ජිනවරො සමණීව[5] සිලුච්චයො,
කරුණාපුණ්ණහදයො ගුණෙන විය සාගරො.

6303. ලොකවිස්සුතකිත්ති ච සිනෙරුව නගුත්තමො,
යසසා විත්ථතො වීරො ආකාසසදිසො මුනි.

6304. අසඞ්ගචිත්තො සබ්බත්ථ අනිලො විය නායකො,
පතිට්ඨා සබ්බභූතානං මහීව මුනි සත්තමො.

6305. අනුපලිත්තො ලොකෙන තොයෙන පදුමං යථා,
කුවාදගච්ඡදහනො අග්ගික්ඛන්ධොව සොභති[6].

6306. අගදො විය සබ්බත්ථ කිලෙසවිසනාසකො,
ගන්ධමාදනසෙලොව ගුණගන්ධවිභූසිතො.

6307. ගුණානං ආකරො වීරො රතනානංව සාගරො,
සින්ධූව වනරාජීනං කිලෙසමලහාරකො.

1. ගොත්තෙන, මජසං.
2. බාත්තිංසවරලක්ඛණො, මජසං.
3. සමොත්ථටො, මජසං.
4. ද්වත්තිංසලක්ඛණධරො, මජසං.
5. රමණීව, සයා.
6. සොභසි, මජසං. සොඬසි, සයා.

550. චූළසුගන්ධසත්ථිරාවදානය

6294 – 6295 – 6296 – 6297. මෙම භද්‍රකල්පයෙහි බ්‍රාහ්මණවංශයෙහි වූ මහත් යශස් ඇති, වාදීන්හට අග්‍රවූ දෙතිස් මහපුරිස් ලකුණු ඇති, අසූවක් අනුව්‍යඤ්ජනයන්ගෙන් යුක්ත වූ, ව්‍යාමප්‍රභායෙන් පරිවෘත රැස්සමූහයෙන් ගැවසී ගත්තා වූ, සඳු මෙන් (ලෝවැස්සන්) අස්වසන්නා වූ හිරු මෙන් පැහැ විහිදෙන්නා වූ වැහිවලාවක් මෙන් (සත්ත්වයන්ගේ ගිමන්) නිවන්නා වූ, සයුර මෙන් ගුණයට ආකරයක් වූ ශීලයෙන් මහපොළොව වැනි වූ, සමාධියෙන් හිමවත්පව් වැනි වූ ප්‍රඥාවෙන් අහස වැනි වූ සුලඟ මෙන් නො ඇලෙන්නා වූ, නමින් කාශ්‍යප නම් වූ බුදුරජ තෙම ලොව පහළ විය.

6298. එකල්හි මම බරණැස් නුවර සමෘද්ධ වූ ධන ධාන්‍ය ඇති විවිධ රත්න සමූහ ඇති මහාකුලයක උපතිමි.

6299. මහත් වූ පිරිවර සහිතව වැඩහුන්නා වූ බුදුරජුන් වෙත එළඹ අමෘතය මෙන් මනොඥ වූ ධර්මය ඇසීමි.

6300. තාරකා සහිත වූ සඳු මෙන් දෙතිස් මහ පුරිස්ලකුණු දරන්නා වූ, අසූඅනුව්‍යඤ්ජනයන් ගෙන් යුක්ත වූ, පිපුනු සල්රුකක් බඳු වූ-

6301. රැස් සමූහයෙන් වට කරණලද දීප්තිමත් සවර්ණපර්වතයක් වැනි වූ, ව්‍යාමප්‍රභා රශ්මියෙන් පරිවෘත සරා හිරු වැනි වූ-

6302. රන්වන් වතැති, මණි පර්වතයක් බඳු, (පස්මරුන් දිනූ බැවින්) ජිනවර වූ, පූර්ණිමාදයක් ඇත්තා වූ, ගුණයෙන් සයුර වැනි වූ-

6303. ලොකයෙහි ප්‍රකට කීර්ති ඇත්තා වූ, සිනෙරු පර්වතරාජයා වැනි වූ, යසසින් පතළා වූ, වීර වූ, ආකාශය සදෘශ වූ, (මෞනෙය්‍ය ගුණ යුක්ත බැවින්) මුනි වූ-

6304. වාතය මෙන් සියලු තන්හි නො ඇලෙන සිත් ඇති, (නිවන් මගට පමුණුවන බැවින්) නායක වූ; මහපොළොව මෙන් සව්සත්නට පිහිට වූ සත්තම මුනි -

6305. ජලයෙන් නො තැවරුන පියුම මෙන් ලොකය හා නො තැවරුනා වූ, මිථ්‍යාවාද නමැති පැලැටි දවන ගිනිකඳක් මෙන් (ඒ කසුප් බුදුරජතෙම) බබලයි.

6306. ඒ බුදුරජ තෙම සියලු තන්හි කෙලෙස් විස නසන්නා වූ බෙහෙදක් මෙනි. ගුණ සුවඳින් සරසන ලද්දා වූ ගන්ධමාදන පර්වතය මෙනි.

6307. ඒ වීර වූ බුදුරජතෙම රත්නයනට සයුර මෙන් ගුණයනට ආකරයකි. වනරාජීන්ගේ (කසල සොඳ හරණා වූ) සින්ධුනදිය මෙන් කෙලෙස්මල හරණේ වෙයි.

6308. විජයීව මහායොධො මාරසෙනප්පමද්දනො[1],
චක්කවත්තීව සො රාජා බොජ්ඣඞ්ගරතනිස්සරො.

6309. මහාභිසක්කසඞ්කාසො දොසව්‍යාධිතිකිච්ඡකො,
සල්ලකත්තො යථා සෙට්ඨො[2] දිට්ඨිගණ්ඩවිඵාලකො.

6310. සො තදා ලොකපජ්ජොතො සනරාමරසක්කතො,
පරිසාසු නරාදිච්චො ධම්මං දෙසයතෙ ජිනො.

6311. දානං දත්වා මහාභොගො සීලෙන සුගතූපගො,
භාවනාය ච නිබ්බාති ඉච්චෙවමනුසාසථ.

6312. දෙසනං තං මහස්සාදං ආදිමජ්ඣන්තසොභනං,
සුණන්ති පරිසා සබ්බා අමතංව මහාරසං.

6313. සුත්වා සුමධුරං ධම්මං පසන්නො ජිනසාසනෙ,
සුගතං සරණං ගන්ත්වා යාවජීවං නමස්සහං.

6314. මුනිනො ගන්ධකුටියා ඔපුඤ්ජෙසිං[3] තදා මහිං,
චතුජ්ජාතෙන ගන්ධෙන මාසෙ අට්ඨදිනෙස්වහං.

6315. පණිධාය සුගන්ධත්තං සරීරස්ස දුගන්ධිනො[4],
තදා ජිනො වියාකාසි සුගන්ධතනුලාභිතං.

6316. යො යං ගන්ධකුටිභූමිං ගන්ධෙනොපුඤ්ජතෙ'සකිං,
තෙන කම්මවිපාකෙන උප්පන්නො තහිං තහිං.

6317. සුගන්ධදෙහො සබ්බත්ථ භවිස්සති අයං නරො,
ගුණගන්ධයුතො[5] හුත්වා නිබ්බායිස්සතනාසවො.

6318. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

6319. පච්ඡිමෙ ච භවෙ දානි ජාතො විප්පකුලෙ අහං,
ගබ්භෙ මෙ වසතො මාතා දෙහෙනාසි සුගන්ධිකා[6].

6320. යදා ච මාතුකුච්ඡිම්හා නික්ඛමාමි තදා පුරී[7],
සාවත්ථී සබ්බගන්ධෙහි වාසිතා විය වායථ.

6321. පුප්ඵවස්සං ච සුරභි දිබ්බගන්ධමනොරමං,
ධූපානි ච මහග්ඝානි උපවායිංසු තාවදෙ.

6322. දෙවා ච සබ්බගන්ධෙහි ධූපපුප්ඵෙහි තං ඝරං,
වාසයිංසු සුගන්ධෙන යස්මිං ජාතො අහං ඝරෙ.

---

1. මාරසෙනාවමද්දනො, මජසං 2. වෙජ්ජො, මජසං.
3. උබ්බට්ටෙසිං, ස්‍යා. 4. සරීරවිස්සගන්ධිනො, මජසං. විගන්ධිනො, සීමු.
5. ගුණගන්ධයුත්තො, මජසං. 6. සුගන්ධිතා, මජසං.
7. පුරං, මජසං.

6308. සතුරන් දිනන සුළු මහායෝධයකු මෙන් මරසෙනග මඩනේ වෙයි. එසේ ම ඒ බුදුරජතෙම (සත්රුවනට ඉසුරු වූ) සක්විති රජකු මෙන් බොධ්‍යඞ්ග නමැති රත්නයනට අධිපතියෙකි.

6309. (කෙලශ) දෙෂ නමැති ව්‍යාධියට පිළියම් කරන්නා වූ මහා-වෛද්‍යවරයකු මෙනි. (මිථ්‍යා) දෘෂ්ටි නමැති ගඩය සිඳුනා වූ ශ්‍රෙෂ්ඨ ශල්‍යවෛද්‍යවරයකු වැනි ය.

6310. එකල්හි දෙවිමිනිසුන් ගරු කරණ ලද ලොව බබුළුවන්නා වූ මිනිස්නට හිරු වූ ඒ බුදුරජතෙම පිරිස්මැද දහම් දෙසයි.

6311. "දන් දී මහත් භොග සම්පත් ඇත්තෙක් වන්නේ ය. සීලය හෙතු කොට ගෙණ සුගතියට (උත්පත්ති වශයෙන්) යන්නෙක් වන්නේය. භාවනා වෙන් (කෙලෙස්පිරිනිවනින්) පිරිනිවන්පාන්නේය"යි මෙසේ අනුශාසනාකෙළේ ය.

6312. මහත් ආස්වාද ජනක වූ හෙවත් රසවත් වූ, ආදි මධ්‍ය පර්‍යවසාන කල්‍යාණ වූ එ දහම් දෙසුම සියලු පිරිස මහත් රසවත් අමෘතයක් මෙන් අසත්.

6313. ඉමිහිරි දහම අසා බුදුසසුන්හි පැහැදුනෙම් මම බුදුරජුන් සරණ කොට ගොස් දිවි ඇතිතාක් (සරණගතයෙක් ව) නමස්කාර කෙළෙමි.

6314 – 6315. එකල්හි මම දුර්ගන්ධ ශරීරයාගේ සුගන්ධභාවය පතා බුදුරජුන්ගේ ගඳකිළියෙහි පොළොව මසකට අටදිනක් සිව්ද්‍රගඳින් පිරිබඩගැන්වීමි. එකල්හි මට සුවඳවත් සිරුරක් ලැබෙන බව බුදුරජතෙම වදාළේය:

6316. 'යමෙක් මේ ගඳකිළිබිම නොයෙක්වර සුවඳ ගල්වා ද ඒ කර්මවිපාකය හේතු කොට ගෙණ ඒ ඒ තන්හි උපන්නේ–

6317. හැම තන්හි මේ මිනිස්තෙම සුගන්ධ දෙහ ඇත්තෙක් වන්නේය. ගුණසුවඳින් යුතු වූයේ ආස්‍රව රහිතව පිරිනිවන් පාන්නේ ය. (කියායි.)

6318. මැනැවින් කරණලද ඒ කර්මය හෙතුකොට ගෙණ ද, චිත්ත ප්‍රණිධියින් හෙතුකොට ගෙණ ද, මම මිනිස් සිරුර හැර තව්තිසා දෙව්-ලොවට (උත්පත්ති වශයෙන්) ගියෙමි.

6319 දැන් (මේ) අන්තිම ජාතියෙහි මම බමුණු කුලයෙහි උපන්නෙමි. මා මවු කුසෙහි වසත් ම මාගේ මවුතොමෝ සිරුරින් සුවඳවත් වූ ය.

6320. යම් කලෙක්හි මවුකුසින් නික්මෙම් ද, එකල්හි සැවැත්නුවර හැම සුවඳින් සවනලද්දක් මෙන් සුවඳ හැමි ය.

6321. මනරම් වූ සුමිහිරි දිව්‍යමය සුවඳ ඇති මල්වැසි ද වට. මාහැඟි සුගන්ධධූමයෝ ද එකෙණෙහි හමා ගියහ.

6322. යම් ගෘහයක මම උපනෙම් ද, දෙවියෝ ඒ ගෘහය සියලු සුවඳ දුම් හා මල් සුවඳින් සුවඳ කැවූහ.

6323. යදා ච තරුණො භද්‍රො පඨමෙ යොබ්බනෙ ඨිතො,
තදා සෙලං[1] සපරිසං විනෙත්වා නරසාරථි-

6324. තෙහි සබ්බෙහි සහිතො[2] සාවත්ථිපුරමාගතො,
තදා බුද්ධානුභාවං තං දිස්වා පබ්බජිතො අහං.

6325. සීලං සමාධිං පඤ්ඤඤ්ච[3] විමුත්තිඤ්ච අනුත්තරං,
භාවෙත්වා චතුරො ධම්මෙ පාපුණිං ආසවක්ඛයං.

6326 යදා පබ්බජිතො චාහං යදා ච අරහා අහුං,
නිබ්බායිස්සං යදා චාහං ගන්ධවස්සො තදා අහු.

6327. සරීරගන්ධො ච සදා'තිසෙති මෙ
මහාරහං චන්දනචම්පකුප්පලං,
තථෙව ගන්ධෙ ඉතරෙ ච සබ්බසො
පසය්හ වායාමි ගතො තහිං[4] තහිං.

6328. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6329 ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6330 පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනන්ති.

ඉත්ථං සුදං ආයස්මා චූළසුගන්ධො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

චූළසුගන්ධත්ථෙරස්ස අපදානං දසමං.

භද්දියවග්ගො පඤ්චපඤ්ඤාසමො.

උද්දානං:-

භද්දියො රෙවතො ථෙරො මහාලාභී ච සීවලී
වඞ්ගීසො නන්දකො චෙව කාළුදායි තථාභයො
ලොමසො වනවච්ඡො ච සුගන්ධො දසමො කතො[5].
තීණි ගාථාසතා තත්‍ථ සොළස[6] ච තදුත්තරිං.

අථ වග්ගුද්දානං:-

කණිකාරවහයො වග්ගො ඵලදෙ තිණදායකො,
කච්චානො භද්දියො වග්ගො ගාථායො ගණිතා ඉමා.
නවගාථා සතානීහ චතුරාසීති එව ච.
සපඤ්ඤාසා පඤ්චසතා[7] අපදානා පකාසිතා.
සහ උද්දානගාථාහි ඡසහස්සානි හොන්තිමා,
ද්වෙ සතානි ච ගාථානං අට්ඨාරස තදුත්තරිං.

1. සෙසං, ස්‍යා. 2 පරිවුතො, මජසං. 3. සීලංසමාධිපඤ්ඤඤ්ච, මජසං.
4. යහිං, ස්‍යා. 5, සුගන්ධො චෙවදසමෙ, මජසං.
6. සොළසාච තදුත්තරි, මජසං. 7. සපඤ්ඤාසං පඤ්චසතං, මජසං.

6323. යම් කලෙක්හි (මම) භද්‍ර වූ ප්‍රථම යෞවනයෙහි සිටි තරුණයෙක් වූයෙම් ද එකල්හි බුදුරජතෙම පිරිස් සහිත වූ සෙල බ්‍රාහ්මණයා හික්මවා–

6324. ඒ සියල්ලන් සමග සැවැත් පුරයට පැමිණියේය. එකල්හි මම ඒ බුද්ධානුභාවය දැක පැවිදිවූයෙම් –

6325. අනුත්තර වූ සීලය ද, සමාධිය ද, ප්‍රඥාව ද, විමුක්තිය ද, යන සතර දහමුත් වඩා ආශ්‍රවක්ෂයසඞ්ඛ්‍යාත නිවනට පැමිණියෙමි.

6326 මම යම් කලෙක්හි පැවිදිවූයේ වෙම් ද, යම් කලෙක්හි රහත් වූයෙම් වෙම් ද, එසේ ම යම් කලෙක්හි පිරිනිවන් පානෙම් ද, ඒ (සියලු) කල්හි සුගන්ධ වෂීා පැවැත්තාහ.

6327. මාහැඟි වූ සඳුන් සපු උපුල් මල් සුවඳ මිශ්‍රව මාගේ ශරීරගන්ධය හැම කල්හි හමයි. එසේ ම ඒ ඒ තන්හි ගියෙම් සෙසු සුගන්ධයන් මැඩ ශරීරසුගන්ධය වහනය කරමි.

6328. මාගේ කෙලෙශයෝ දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. ඇතකු මෙන් බැඳුම් සිඳ ආශ්‍රව රහිත ව වෙසෙමි.

6329. බුද්ධශ්‍රේෂ්ඨයන් වහන්සේගේ සමීපයට මාගේ පැමිණීම එකාන්තයෙන් යහපත් වී ය. ත්‍රිවිද්‍යාවෝ ලබන ලදහ. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය කරණලදී

6330 සිවුපිළිසැඹියාවෝ ද, අෂ්ටවිමොක්ෂයෝ ද, ෂඩභිඥාවෝ ද සාක්ෂාත් කරණලදහ. බුදුරජාණන් වහන්සේගේ සසුන කරණ ලදී.

මෙසේ මේ අයුරින් ආයුෂ්මත් චූලසුගන්ධ ස්ථවිරයන් වහන්සේ මේ ගාථාවන් වදාළසේක.

චූලසුගන්ධ ස්ථවිරාපදානය දසවැනියි.

භද්දිය වර්ගය පස්පණස් වැනියි.

උද්දානය:

භද්දිය රේවත සහ මහාලාභී සීවලී
වඞ්ගීස නන්දක කාළුදායි අභය ද,
ලෝමස වනවච්ඡ – දසම වූ සුගන්ධය.
මෙහි ගී තෙ සියෙකි වැඩියෙන් ගී සොළොසෙකි

ඇලි, වර්ගෝද්දානය:

කණිකාර නම් වග ඵලද තිණදායක,
කච්චාන භද්දිය වග.
මෙහි ගිණූ ගී නවසිය සූ අසූවෙක.
අපදාන පන්සිය පණසක් මෙහි කියන ලදහ.
උද්දානගාථා සමග ගාථා සදහසෙක් වෙති
ඉන් වැඩි ගාථා දෙසිය අටළොසකි.

551. යසත්ථෙරාපදානං

6331. මහාසමුද්දං ඔගය්හ[1] භවනං මෙ සුනිම්මිතං,
සුනිම්මිතා පොක්ඛරණී චක්කවාකූපකූජිතා.

6332. මන්දාලකෙහි[2] සඤ්ඡන්නා පදුමුප්පලකෙහි ච,
නදී ච සන්දතෙ තත්ථ සුපතිත්ථා මනොරමා.

6333. මච්ඡකච්ඡපසඤ්ඡන්නා නානාදිජසමාකුලා[3],
මයූරකොඤ්චාභිරුදා කොකිලාදීහි[4] වග්ගුහි

6334. පාරෙවතා රවිහංසා චක්කවාකා නදීචරා,
දින්දිභා[5] සාලිකා චෙත්ථ පම්පකා ජීවංජීවකා.

6335. හංසා කොඤ්චාභිනදිතා කොසියා පිඞ්ගලා බහූ,
සත්තරතනසම්පන්නා මණිමුත්තිකවාලිකා[6].

6336. සබ්බෙ සොණ්ණමයා රුක්ඛා නානාගන්ධසමෙරිතා,
උජ්ජොතෙන්ති දිවාරත්තිං භවනං සබ්බකාලිකං.

6337 සට්ඨිතූරියසහස්සානි සායං පාතො පවජ්ජරෙ,
සොළසිත්ථිසහස්සානි පරිවාරෙන්ති මං සදා.

6338 අභිනික්ඛම්ම භවනා සුමෙධං ලොකනායකං,
පසන්නචිත්තො සුමනො වන්දයිං තං මහායසං

6339. සම්බුද්ධං අභිවාදෙත්වා සසඞ්ඝං තං නිමන්තයිං,
අධිවාසෙසි සො ධීරො සුමෙධො ලොකනායකො.

6340. මම ධම්මකථං කත්වා උය්යොජෙසි මහාමුනි,
සම්බුද්ධං අභිවාදෙත්වා භවනං මෙ උපාගමිං.

6341. ආමන්තයිං පරිජනං සබ්බෙ සන්නිපතුං තදා,
පුබ්බණ්හසමයං බුද්ධො භවනං ආගමිස්සති.

6342. ලාභා අම්හං සුලද්ධා නො යෙ වසාම තවන්තිකෙ,
මයම්පි බුද්ධසෙට්ඨස්ස පූජයිස්සාම සත්ථුනො

6343. අන්නං පානං පට්ඨපෙත්වා කාලං ආරොචයිං අහං,
වසීසතසහස්සෙහි උපෙසි ලොකනායකො.

6344. පඤ්චඞ්ගිකෙහි තූරියෙහි පච්චුග්ගමමකාසහං,
සබ්බසොණ්ණමයෙ පීඨෙ නිසීදි පුරිසුත්තමො.

6345. උපරිච්ඡදනං ආසි සබ්බසොණ්ණමයං තදා,
වීජනීයො පවායන්ති භික්ඛුසඞ්ඝං අනුත්තරං.

1. ඔග්ගය්හ, මජ්සං. 2 මන්දාරකෙහි, මජ්සං.
3. නානාදිජසමොත්ථටා, මජ්සං, නානාමිගසමොත්ථටා, සයා.
4. කොකිලාදීහි, මජ්සං. 5. තිත්තිරා, මජ්සං.
6. මණිමුත්තවාලිකා, මජ්සං.

551. යසසඵවිරාවදානය

6331 - 32 - 33. මහසමුදුර අබියස මාගේ භවනය සුනිර්මිතය. හෙල්මැල්ලෙන් හා පදෙමාතපලයෙන් ගැවසීගත් සක්වාරැව් ඇති පොකුණක් සුනිර්මිත වෙයි. ඒ පෙදෙසෙහි සිත්කලු මනා තොට ඇති මස්කැසුබුවත්ගෙන් ගැවසීගත් මුළුදුත් නානාවිහගගණා ඇති නදියක් ගලා බස්නීය. මොණර කොස්වාලිහිණි කොවුල් ආදී පක්ෂීන්ගේ මනරම් නදින් එපෙදෙස දෙඩමලුය.

6334 පරෙවි රවිහංස සක්වාලිහිණි නදීචර දියකිරල සැලලිහිණි හුනපුපුළු (ජීව – ජීව අනුකරණයෙන් හඬලන) ජීවංජීවක යන මොහු එහි බොහෝ වූහ.

6335 – 36. එහි රැව්දෙන හංසයෝ ද කොස්වාලිහිණියෝ ද මහමුහුනෝ ද පිඩගලයෝ ද යන මේ පක්ෂීහු බොහෝ වූහ. සත්රුවනින් යුත් මිණිමුතු සහිත වැලි ද නොයෙක් සුවඳ හමන හැම රන්මුවා රුක් ද එ භවන දිව රෑ හැම්කල් බබුලුවත්.

6337. සැටදහසක් තූර්යීයෝ සවස්හි ද උදයෙහි ද වැයෙත්. සොළොස්දහසක් ස්ත්‍රීහු හැම කල්හි මා පිරිවරත්.

6338. මම භවනයෙන් නික්ම පහන්සිත් ඇත්තෙම් සොම්නස් ඇත්තෙම් මහත් යශස් ඇති ලොකනායක වූ ඒ සුමෙධ බුදුරජුන් වැන්දෙමි.

6339. සම්බුදුරජුන් වැඳ සඞ්ඝයා සහිත ඒ බුදුරජුන් නිමන්ත්‍රණය කෙළෙමි. (මාගේ නිමන්ත්‍රණය) ලොකනායක වූ ප්‍රාඥ වූ ඒ බුදුරජ තෙමේ ඉවසී ය.

6340. බුදුරජ තෙමේ මට ධර්මකථාවක් කොට (මා කුසල්හි යෙදවී ය. ඒ සම්බුදුරජුන් වැඳ මාගේ භවනයට එළඹියෙමි.

6341. පෙරවරු කල්හි බුදුරජානන් වහන්සේ මාගේ භවනයට වඩිනසේක් යයි පිරිවරජනයා ඇමතීමි. එකල්හි සියල්ලෝ රැස්වූහ.

6342. 'යම් හෙයකින් ඔබ සමීපයෙහි වෙසෙමු ද එ අපට මනා ලැබීමකි. යහපත් ලාභයෙකි. අපිදු ශාස්තෘ වූ බුදුරජුන්හට පූජාවක් කරන්නෙමු'සි ඔහු කීහු.

6343. මම ආහාර පාන පිළියෙල කොට තබා කාලය දැන්වීමි. ලොකනායක වූ බුදුරජතෙමේ රහතුන් සියක්දහසක් සමග වැඩියේ ය.

6344. මම පසඟතුරු සහිත ව පෙරගමන් කෙළෙමි. පුරුෂොත්තම වූ බුදුරජතෙමේ ගනරන්මුවා පළඟෙහි වැඩහුන්නේ ය.

6345. එකල්හි සියල්ල රුවන්මුවා වූ උඩුවියනක් විය. උතුම් බික් සඟනට විජනීහු පවත් සලත්.

6346 පහූතෙනන්නපානෙන[1] භික්ඛුසඞ්ඝං අතප්පයිං,
පච්චෙකදුස්සයුගලෙ භික්ඛුසඞ්ඝස්සදාසහං.

6347. යං වදන්ති සුමෙධොති[2] ආහුතීනං පටිග්ගහො,
භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා ඉමා ගාථා අභාසථ:

6348. “යො මං අන්නෙන පානෙන සබ්බෙ ඉමෙ ච තප්පයි,
තමහං කිත්තයිස්සාමි සුණාථ මම භාසතො:

6349 අට්ඨාරසෙ කප්පසතෙ දෙවලොකෙ රමිස්සති,
සහස්සක්ඛත්තුං රාජායං චක්කවත්ති භවිස්සති.

6350. උපගච්ඡති යං යොනිං දෙවත්තං අථමානුසං,
සබ්බසොවණ්ණමයං තස්ස ඡදනං ධාරයිස්සති.

6351. තිංසකප්පසහස්සම්හි ඔක්කාකකුලසම්භවො,
ගොතමො නාම නාමෙන[3] සත්ථා ලොකෙ භවිස්සති

6352. තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො,
සබ්බාසවෙ පරිඤ්ඤාය නිබ්බායිස්සතනාසවො.

6353. භික්ඛුසඞ්ඝෙ නිසීදිත්වා සීහනාදං නදිස්සති,
චිතකෙ ඡත්තං ධාරෙන්ති හෙට්ඨා ඡත්තම්හි ඩය්හථ.”

6354. සාමඤ්ඤං මෙ අනුප්පත්තං කිලෙසා ඣාපිතා මයා,
මණ්ඩපෙ රුක්ඛමූලෙ වා සන්තාසො මෙ න විජ්ජති.

6355. තිංස කප්පසහස්සම්හි යං දානමදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි සබ්බදානස්සිදං ඵලං.

6356. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6357. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස[4] සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6358 පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා යසො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති

යසත්ථෙරස්සාපදානං පඨමං.

1. පහූතෙ අන්නපානෙන, මජසං. 2. සුමෙධා යො, මජසං.
3. ගොත්තෙන, මජසං. 4 මම බුද්ධස්ස, මජසං.

6346. මම බොහෝ ආහාරපානයෙන් භික්සඝන සැතැප්වීමි. වෙන වෙන මැ දුහුල් සඟළ බැගින් භික්සඝනට දිනිමි.

6347. සුමෙධ යයි යම් කෙනෙකුන් ගෙණ කියත් ද ආහුනෙය (-පූජා) පිළිගන්නා ඒ බුදුහු භික්සඝන මැද වැඩහිඳ මේ ගාථා වදළහ:

6348. "යමෙක් ආහාරපානයෙන් මා හා මේ සියල්ලන් (භික්ෂූන්) හා සැතැප්වී ද, ඔහු කීර්තන කෙරෙමි (-කියමි). එසේ කියන මා බස් අසවු.

6349. මෙ අටළොස්කප්සියයක් මුළුල්ලෙහි දෙව්ලොව ඉඳුරන් පින-වන්නේ ය, දහසක් වර සක්විතිරජ වන්නේ ය.

6350. උපත් විසින් දෙව්බව ය යළි මිනිස්බව ය යන යම් ගතියකට එළැඹෙන්නේ ද, ඔහට සියල්ල රන්මුවා වූ සෙවෙනියක් ධරන්නේ ය.

6351. තිස්දහස් වන කප්හි ඔක්කාවස් කුලැ උපත් ඇති වැ නමින් ගෞතම නම් ශාස්තෲහු ලොවැ පහළ වන්නාහ.

6352. (මෙ) ඔබ දහමට දායාද (-හිමි) වූ ධර්මයෙන් නිර්මිත වූ ඖරස ශ්‍රාවකයෙක් වැ සියලු ආසුවයන් (පහානපරිඤ්ඤ විසින්) පිරිසිඳ දැනැ ආසුව රහිත වැ (ස්කන්ධ පරිනිර්වාණයෙන්) පිරිනිවෙන්නේ ය.

6353. (පිරිනිවීමට පෙර) භික්සඝන මැද හිඳ අභීතනාද කරන්නේ ය, (පිරිනිවීමෙන් පසු සැදැහැ ඇත්තෝ) චිතකයෙහි ඡත්‍රයක් ධරන්නාහ. (හෙ) ඡත්‍රය යට දැවෙන්නේ යි''.

6354. මට ශ්‍රාමණ්‍ය (-රහත් ඵල) ය පිළිවෙළින් පැමිණියේ ය, මා විසින් කෙලෙස් දවනලද, මණ්ඩපයෙහි හෝ රුක්මුලැ හෝ මට සන්ත්‍රාස-යෙක් නැති.

6355. එකලැ තිස්දහස්වනකප්හි යම් දනක් දිනිම් ද, (එ පිනෙන්) දුගතිය නො දනිමි, මෙ වූකලි සියල්ල දීමේ විපාකයි.

6356. මා විසින් කෙලෙස්හු දවන ලදහ, සියලු භවයෝ නසන ලදහ, බැඳුම් සිඳ හැසිරෙන ඇත්රජකු සෙයින් ආසුව රහිතවූයෙම් වාස කෙරෙමි.

6357. බුද්ධශ්‍රෙෂ්ඨයන් වෙතැ මාගේ එළැඹීම එකැතින් මනා වියැ, ත්‍රිවිද්‍යා අනුප්‍රාප්ත යැ, බුදුසසුන් කරණ ලද.

6358. සිවු පිළිසිඹියා ද, මෙ අෂ්ටවිමොක්ෂ ද, ෂඩ් අභිඥා ද සාක්-ෂාත්කෘත යැ, බුදුසසුන් කරණ ලදී.

මෙසේ ආයුෂ්මත් යස ස්ථවිරයන්වහන්සේ මේ ගාථා වදළාහ.

පළමුවැනි යසස්ථවිරාවදන යි.

552. නදීකස්සපත්ථෙරාපදානං

6359. **පදුමුත්තරස්ස** භගවතො ලොකජෙට්ඨස්ස තාදිනො
පිණ්ඩචාරං චරන්තස්ස වාරතො උත්තමං යසං,
අග්ගඵලං ගහෙත්වාන අදාසිං සත්ථුනො අහං.

6360. තෙන කම්මෙන දෙවින්දො ලොකජෙට්ඨො නරාසභො,
සම්පත්තොම්හි අචලං ඨානං හිත්වා ජයපරාජයං.

6361. සතසහස්සිතො කප්පෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි අග්ගදානස්සිදං ඵලං.

6362. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6363. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6364. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨිමෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **නදීකස්සපො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

නදීකස්සපත්ථෙරාපදානං දුතියං.

553. ගයාකස්සපත්ථෙරාපදානං

6365. අජිනචම්මවත්ථොහං[1] ඛාරිභාරධරො තදා,
ඛාරිකං හාරයිත්වාන කොලං අහාසිමස්සමං.

6366. භගවා තස්මිං[2] සමයෙ එකො අදුතියො ජිනො,
මමස්සමං උපාගඤ්ඡි[3] ජොතෙන්තො සබ්බකාලිකං.

6367. සකං චිත්තං පසාදෙත්වා අභිවාදෙත්වාන සුබ්බතං,
උභොහත්ථෙහි පග්ගය්හ කොලං බුද්ධස්ස'දාස'හං.

6368. එකත්තිංසෙ ඉතො කප්පෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි කොලදානස්සිදං ඵලං.

---

1. අජිනවත්ථං නිවත්ථොහං- සී
2. තම්හි- මජ්සං
3. උපාගච්ඡි- මජ්සං

552. නදීකාශ්‍යප ස්ථවිරාවදානය

6359. ලොවට දෙටු වූ තාදී (-අටලෝ දහමින් නො සැලෙන) ගුණ ඇති පිණ්ඩචය්‍යායෙහි හැසිරෙන ශාස්තෘ වූ පියුමතුරා බුදුරජාණන් වහන්සේට, මම උතුම් වූ අග්‍රඵලයක් රැගෙණ එළැඹි වාරයෙහි දිනිමි.

6360. ඒ කුශලධර්මයෙන් ලොකජ්‍යෙෂ්ඨ වූ නරොත්තම වූ දෙවෙන්ද්‍ර වීමි, ජයපරාජය හැරපියා අචලස්ථානයට පැමිණියෙම් වෙමි.

6361. මෙයින් සුවහස් වන කප්හි යම් ඵලයක් (පියුමතුරා බුදුනට) දිනිම් ද දුගතිය නො හඳුනමි, මේ අග්‍රදානයාගේ ඵලයි.

6362. මා විසින් කෙලෙස්හු දවන ලදහ, සියලු භවයෝ නසන ලදහ, බැඳුම් සිඳපියා සරණ ඇත්රජකු සෙයින් ආස්‍රව රහිත වූයෙම් වාස කෙරෙමි.

6363. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙතැ එළැඹීම මට එකැතින් යහපත් වියැ, ත්‍රිවිද්‍යා අනුප්‍රාප්තවූවා, බුදුසසුන් කරණ ලද.

6364. සිවුපිළිසිඹියා ද, මේ අෂ්ටවිමොක්ෂ ද, ෂඩ් අභිඥා ද, පසක් කරන ලද, බුදුසසුන් කරන ලදී.

මෙසේ ආයුෂ්මත් නදීකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ මේ ගාථා වදළාහ.

දෙවැනි නදීකාශ්‍යපස්ථවිරාවදාන යි.

553. ගයාකාශ්‍යප ස්ථවිරාවදානය

6365. අඳුන්දිවිසම් වස්ත්‍ර කොට ඇති, පිරිකර කඳ දරන මම කඳ උසුලා ගෙන අසපුවට ඩෙබරපල ගෙණ ආයෙමි.

6366. එ සමයෙහි හැමකල්හි ලොව බබුළුවන ජිනෙන්ද්‍ර වූ භාග්‍යවතුන්වහන්සේ එකලා වූසේක් දෙවැන්නකු නැති වැ මාගේ අසපුවට එළැඹිසේක.

6367. මම සිය සිත පහදවා ගෙණ මනාව්‍රත ඇති ඔබ වැඳ ඩෙබරපල දෙඅතින් ගෙණ බුදුරදුනට දිනිමි.

6368. එකලැ එනම් මෙයින් එක්තිස්වන කප්හි යම් ඵලයක් බුදුනට දිනිම් ද, දුගතිය නො හඳුනමි. මේ ඩෙබරපල දානයාගේ විපාක යි.

6369. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6370. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6371. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨි'මෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **ගයාකස්සපො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

ගයාකස්සපත්ථෙරස්සාපදානං තතියං.

554. කිම්බිලත්ථෙරාපදානං

6372. නිබ්බුතෙ කකුසන්ධස්මිං[2] බ්‍රාහ්මණස්මිං[3] වුසීමති,
ගහෙත්වා සලලං මාලං මණ්ඩපං කාරයිං අහං.

6373. තාවතිංසං ගතො සන්තො ලභිම්හ ව්‍යම්හමුත්තමං,
අඤ්ඤෙ දෙවෙ'තිරොචාමි පුඤ්ඤකම්මස්සිදං ඵලං.

6374. දිවා වා යදි වා රත්තිං චඞ්කමන්තො ඨිතො චහං,
ඡන්නො සලලපුප්ඵෙහි පුඤ්ඤකම්මස්සිදං ඵලං.

6375. ඉමස්මිං යෙව කප්පම්හි යං බුද්ධමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිද ඵලං.

6376. කිලෙසා ඣාපිතා මය්හං භවා සබ්බෙ සමූහතා,
නාගොව බන්ධනං ඡෙත්වා විහරාමි අනාසවො.

6377. ස්වාගතං වත මෙ ආසි බුද්ධසෙට්ඨස්ස සන්තිකෙ,
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං.

6378. පටිසම්භිදා චතස්සො ච විමොක්ඛාපි ච අට්ඨි'මෙ,
ඡළභිඤ්ඤා සච්ඡිකතා කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා **කිම්බිලො** ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

කිම්බිලත්ථෙරාපදානං චතුත්ථං.

---

1. කිමිල- මජසං.
2. කකුසන්ධම්හි- මජසං.
3. බ්‍රාහ්මණම්හි- මජසං.

6369. මා විසින් කෙලෙස්හු දවන ලදහ, සියලු භවයෝ උපුටාහරණ ලදහ, බැඳුම් සිඳ සරණ ඇත්රජකු සෙයින් ආස්‍රව නැතියෙම් වාස කෙරෙමි.

6370. මාහට, බුද්ධශ්‍රෙෂ්ඨයන්වහන්සේ වෙතැ එකාන්‍තයෙන් මනා එළැඹීමෙක් විය, ත්‍රිවිද්‍යා අනුප්‍රාප්ත යැ, බුදුසසුන් කරණ ලද.

6371. සිවුපිළිසිඹියා ද, මේ අෂ්ටවිමොක්ෂ ද, ෂඩ්අභිඥා ද, සාක්ෂාත්කෘත යැ, බුදුසසුන් කරණ ලදී.

මෙසේ ආයුෂ්මත් ගයාකාශ්‍යප ස්ථවිරයන්වහන්සේ මේ ගාථා වදළාහ.

තෙවැනි ගයාකාශ්‍යප ස්ථවිරාවදන යි.

554. කිම්බිල ස්ථවිරාවදානය

6372. විසූ බඹසර ඇති බාහිතපාපී වූ කකුසඳ බුදුරදුන් පිරිනිවි කල්හි (ඔබ උදෙසා) මම හොරදඬුයෙන් මණ්ඩපමාලයක් කරවීමි.

6373. (මිනිස් බැවින් සැවැ) තව්තිසා දෙව්ලොවට (උපත් විසින්) ගියෙම් උතුම් පහයක් ලදිමි, සෙසු දෙවියන් ඉක්මැ බබළමි, පින්කම්හි මේ විපාක යි.

6374. දවලෙහි හෝ ඉදින් රැහි හෝ මම සක්මන් කරනුයෙම් ද, සිටියෙම් ද සලලපුෂ්පයෙන් වැසුණේ වෙමි. මෙ වූකලි පින්කම්හි ඵල යි.

6375. මෙ කප්හි මැ යම් බුදුකෙනෙකුන් පිදූයෙම් ද, දුගතිය නො හඳුනමි. මෙ බුද්ධපූජායෙහි ඵල යි.

6376. මා විසින් කෙලෙස්හු දවන ලදහ. සියලු භවයෝ නසන ලදහ. බැඳුම් සිඳ හැසිරෙන ඇත්රජෙකු සෙයින් ආස්‍රව නැතියෙම් වෙසෙමි.

6377. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙතැ එකැතින් මාගේ මනා එළැඹීමෙක් වියැ, ත්‍රිවිද්‍යාවෝ පිළිවෙළින් එළැඹියහ, බුදුසසුන් කරණ ලද.

6378. සිවුපිළිසිඹියා ද, මේ අෂ්ටවිමොක්ෂ ද, ෂඩ්අභිඥා ද, සාක්ෂාත් කෘත යැ, බුදුවදන් කරණ ලදී.

මෙසේ ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන් වහන්සේ මේ ගාථා වදළාහ.

සතරවැනි කිම්බිලස්ථවිරාවදන යි.

555. වජ්ජිපුත්තත්ථෙරාපදානං

6379. සහස්සරංසී භගවා සයම්භූ අපරාජිතො,
විවෙකා වුට්ඨහිත්වාන ගොචරායාභිනික්ඛමි.

6380. ඵලහත්ථො අහං දිස්වා උපගඤ්ඡිං[1] නරාසභං,
පසන්නචිත්තො සුමනො සවණ්ටං අදදිං ඵලං.

6381. චතුනවුතිතො[2] කප්පෙ යං ඵලං අදදිං තදා,
දුග්ගතිං නාභිජානාමි ඵලදානස්සිදං ඵලං.

6382. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- විහරාමි අනාසවො.

6383. ස්වාගතං වත මෙ ආසි -පෙ- කතං බුද්ධස්ස සාසනං.

6384. පටිසම්භිදා චතස්සො ච -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා වජ්ජිපුත්තො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

වජ්ජිපුත්තත්ථෙරස්සාපදානං පඤ්චමං.

556. උත්තරත්ථෙරාපදානං

6385. සුමෙධො නාම සම්බුද්ධො බත්තිංස[3] වරලක්ඛණො,
විවෙකකාමො භගවා හිමවන්තමුපාගමි.

6386. අජ්ඣොගාහෙත්වා හිමවන්තං අග්ගො කාරුණිකො මුනි,
පල්ලඞ්කං ආභුජිත්වාන නිසීදි පුරිසුත්තමො.

6387. විජ්ජාධරො[4] තදා ආසිං අන්තලික්ඛචරො අහං,
තිසූලං සුගතං ගය්හ ගච්ඡාමි අම්බරෙ තදා.

6388. පබ්බතග්ගෙ යථා අග්ගි පුණ්ණමායෙව චන්දිමා,
වනං ඔභාසතෙ බුද්ධො සාලරාජාව ඵුල්ලිතො.

6389. වනග්ගා නික්ඛමිත්වාන බුද්ධරංසී විධාවරෙ,[5]
නළග්ගිවණ්ණසඞ්කාසා[6] දිස්වා චිත්තං පසාදයිං.

6390. විචිනං අද්දසං පුප්ඵං කණිකාරං දෙවගන්ධිකං,
තීණි පුප්ඵානි ආදාය බුද්ධසෙට්ඨමපූජයිං.

---

1. උපගච්ඡිං - මජසං
2. චතුන්නවුතිතො - මජසං
3. බාත්තිංස - මජසං
4. විජ්ජධරො - මජසං.
5. අභිධාවරෙ - මජසං
6. නළග්ගිවනසඞ්කාසං - සීමු

555. වජ්ජිපුත්ත ස්ථවිරාවදානය

6379. සවයම්භූ වූ අපරාජිත වූ සහසුරශ්මි වූ (සිද්ධාත්‍ථ) භාග්‍යවතුන් වහන්සේ විවෙකයෙන් (-ඵලසමවතින්) නැගී සිට පිඬු පිණිස නික්මුණු සේක.

6380. අත්හි ඵල ඇති මම නරශ්‍රෙෂ්ඨයන් දක වෙතැ ගියෙමි. (ගොස්) පහන් සිත් ඇතියෙම් සුමනස් වූයෙම් තුවටුව (-නැට්ට) සහිත ඵලයක් දිනිමි.

6381. එකල්හි එනම්, මෙයින් සූඅනූවන කප්හි යම් ඵලයක් (බුදුරදුනට) දිනිම් ද, දුගතිය නො දනිමි. මේ ඵලදනයාගේ විපාකයි.

6382. මා විසින් කෙලෙස් දවන ලද ... ආසුව නැතියෙම් වෙසෙමි.

6383. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙතැ එළැඹීම මට එකාන්තයෙන් ස්වාගත වියැ ... බුදුසසුන් කරණ ලද.

6384. සිවුපිළිසිඹියා ද ... බුදුසසුන් කරණ ලදී.

මෙසේ ආයුෂ්මත් වජ්ජිපුත්ත ස්ථවිරයන් වහන්සේ මේ ගාථා වදළාහ.

පස්වැනි වජ්ජිපුත්ත ස්ථවිරාවදන යි.

556. උත්තර ස්ථවිරාවදානය

6385. දෙතිස්මහපුරිස් ලකුණෙන් හෙබි භාග්‍යවත් වූ සුමෙධ නම් සම්බුදුරජානන් වහන්සේ විවෙක කැමැතිසේක් හිමවතට එළැඹි සේක.

6386. අග්‍ර වූ කාරුණික වූ පුරුෂොත්තම වූ මුනීන්ද්‍රයන්වහන්සේ හිමවතට පිවිස ගෙණ පළක් බැඳ වැඩහුන් සේකි.

6387. එසමයෙහි මම් අහස්හි හැසිරෙන විද්‍යාධරයෙක් වීමි, එකලැ ත්‍රිශූලයක් රැගෙණ අහසින් යමි.

6388. පවුඅග්හි ගින්නක් සෙයින්, පුන්පොහෝ දිනැ සඳ සෙයින්, සුපිපි සල්රුකක් සෙයින් බුදුහු වනය හොබවති.

6389. බුදුරැස් වනයින් නික් මැ (ඔබමොබ) දුවයි, හුණගින්නක් වන් එරැස් දැක (මම) සිත පහදවාලිමි.

6390. (පුදනට නිස්සක්) සොයනුයෙම් දෙව්සුවඳවහන කිණිහිරිමලක් දිටිමි. මල් තුණක් (නෙලා) ගෙණ (එයින්) බුදුරදුන් පිදීමි.

6391. බුද්ධස්ස ආනුභාවෙන තීණි පුප්ඵානි මෙ තද,
උද්ධවණ්ටා[1] අධොපත්තා ඡායං කුබ්බන්ති සත්ථුනො.

6392. තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං තාවතිංසමගච්ඡහං.

6393. තත්ථ මෙ සුකතං ව්‍යම්හං[2] කණිකාරීති[3] ඤායතෙ[4],
සට්ඨියොජනමුබ්බෙධං තිංසයොජනවිත්ථතං.

6394. සහස්සකණ්ඩං සතභෙණ්ඩු ධජාලු හරිතාමයං,
සතසහස්සනිය්‍යූහා[5] ව්‍යම්හෙ පාතුරහංසු[6] මෙ.

6395. සොවණ්ණමයා මණිමයා ලොහිතඞ්කමයා'පි ච,
ඵලිකා'පි ච පල්ලඞ්කා යෙනිච්ඡකා යදිච්ඡකා.

6396. මහාරහඤ්ච සයනං තූලිකාවිකතීයුතං,
උද්ධලොමිඤ්ච එකන්තං බිම්බොහනසමායුතං.

6397. භවනා නික්ඛමිත්වාන චරන්තො දෙවචාරිකං,
යද ඉච්ඡාමි[7] ගමනං දෙවසඞ්ඝපුරක්ඛතො.

6398. පුප්ඵස්ස හෙට්ඨා තිට්ඨාමි උපරිච්ඡදනං මම,
සමන්තා යොජනසතං කණිකාරෙහි ඡාදිතං.

6399. සට්ඨිතුරියසහස්සානි සායං පාතං උපට්ඨහුං,
පරිවාරෙන්ති මං නිච්චං රත්තින්දිවමතන්දිතා.

6400. තත්ථ නච්චෙහි ගීතෙහි තාළෙහි[8] වාදිතෙහි ච,
රමාමි ඛිඩ්ඩාරතියා මොදමි කාමකාමහං.

6401. තත්ථ භුත්වා පිවිත්වා ච මොදමි තිදසෙ පුරෙ,
නාරිගණෙහි සහිතො මොදමි ව්‍යම්හමුත්තමෙ.

6402. සතානං පඤ්චක්ඛත්තුඤ්ච දෙවරජ්ජමකාරයිං,
සතානං තිණික්ඛත්තුඤ්ච චක්කවත්ති අහොස'හං,
පදෙසරජ්ජං විපුලං ගණනාතො අසඞ්ඛියං.

1. උද්ධං වණ්ටා - මජ්ඣසං.
2. බ්‍යම්හං - මජ්ඣසං.
3. කණිකාරොති - සී
4. ඤායති - මජ්ඣසං.
5. සතසහස්සානි බ්‍යූහානි - සී
6. පාතුභවිංසු - මජ්ඣසං.
7. යථා ගච්ඡාමි - සී
යථා ඉච්ඡාමි - මජ්ඣසං.
8. තාලෙහි - මජ්ඣසං.

6391. එවිට මා විසින් පිදූ ඒ මල් තුණ බුදුරදුන්ගේ ආනුභාවයෙන් උඩුහුරු තුවටු ඇති වැ යටිහුරු පත් ඇති වැ ශාස්තෘන් වහන්සේට සෙවන කෙරෙයි.

6392. මැනැවින් කළ ඒ පුණ්‍යකර්මයෙන් ද, චෙතනාප්‍රණිධියෙන් ද මිනිස්කය හැරපියා උපත් විසින් තව්තිසා දෙව්ලොවට ගියෙමි.

6393. එහි මට මැනැවින් කරණ ලද විමනෙක් වෙයි. (එ විමන) කණිකාර නමින් දක්නා ලැබෙයි. (එ) සැටයොදුන් උස් ය, තිස් යොදුන් පුළුල් ය.

6394. දහසක් භාග ඇත්තේ ය, සියයක් ගොලාකාර ගෙමුදුන් ඇත, ධවජ බහුල ය, රන්මුවා ය, මාගේ විමන්හි සියක් දහසක් දවාර පහළ විය.

6395. (එහි) රිසිතැනෙක රිසිතාක් රන්මුවා මිණිමුවා පියුම්රාමිණිමුවා පිළිමිණිමුවා පර්ය්‍යඞ්කයෝ වෙති.

6396. පුලුන් බිහි ඈ යුත් උඩුහුරු ලොම් ඇති එක්දවලු ඇතිරි හා කන්වයින් (බිම්බොහන) යුත් මාඇඟි ශයන ද ඇති.

6397. භවනින් නික් මැ දෙවචාරිකා සරණුයෙම් යම් විටෙක ගමන් රිසියෙම් ද, දෙවගණයා විසින් පෙරටු කරණ ලදුයෙම් -

6398. මල් යටැ සිටිම්, මා මතුයෙහි (පුෂ්පමය) ඡදනයෙක් වෙයි, (එ) අවට සියක්යොත්නෙකැ කිණිහිරිමලින් වැසුණු ඡදනයෙකි.

6399. සැටදහසක් තූර්‍ය්‍යවාදකයෝ උදය - සවස උවටැන් කළහ, දිවාරෑ අනලස් වැ මා පිරිවරත්.

6400. එහි නැටුමෙන්, ගැයුමෙන්, තාළයෙන් හා වැයුමෙන් ඉඳුරන් පිනවමි. මම් රූපාදිකාමසම්පත් රිසියෙනුයෙම් කෙළිදෙළෙන් සතුටු වෙමි.

6401. එකල්හි එ දෙව්ලොවැ අනුභවකොට පානයකොට (කමින්-බොමින්) මුදිත වෙමි, උතුම් විමනෙහි අප්සරාගණයා සමග සතුටු වෙමි.

6402. මම් පන්සියක් වර දෙව්රජය කරවීමි, . තුන්සියක් වර සක්විති රජ වීමි, මහත් වූ පෙදෙස්රජය ගණන් විසින් සඞ්ඛ්‍යා රහිත යැ.

6403. භවෙ භවෙ සංසරන්තො මහාභොගං ලභාමහං,
භොගෙ මෙ ඌනතා නත්ථි බුද්ධපූජායිදං ඵලං.

6404. දුවෙ භවෙ සංසරාමි[1] දෙවත්තෙ අථ මානුසෙ,
අඤ්ඤං ගතිං න ජානාමි බුද්ධපූජායිදං ඵලං.

6405. දුවෙ කුලෙ පජායාමි ඛත්තියෙ චාපි බ්‍රාහ්මණෙ,
නීචෙ කුලෙ න ජානාමි බුද්ධපූජායිදං ඵලං.

6406. හත්ථියානං අස්සයානං සිවිකං සන්දමානිකං,
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

6407. දසිගණං දාසගණං නාරියො සමලඞ්කතා,
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

6408. කොසෙය්‍යා කම්බලියානි ඛොමකප්පාසිකානි ච,
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

6409. නවවත්ථං නවඵලං නවග්ගරසභොජනං,
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

6410. ඉමං ඛාද ඉමං භුඤ්ජ ඉමස්මිං[2] සයනෙ සය,
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

6411. සබ්බත්ථ පූජිතො හොමි යසො අච්චුග්ගතො මම,
මහාපක්ඛො සදා හොමි අභෙජ්ජපරිසො සදා.

6412. සීතං උණ්හං න ජානාමි පරිලාහො න විජ්ජති,
අථො චෙතසිකං දුක්ඛං හදයෙ මෙ න විජ්ජති.

6413. සුවණ්ණවණ්ණො හුත්වාන සංසරාමි භවාභවෙ,
වෙවණ්ණියං න ජානාමි බුද්ධපූජායිදං ඵලං.

6414. දෙවලොකා චවිත්වාන සුක්කමූලෙන චොදිතො,
සාවත්ථියං පුරෙ ජාතො මහාසාලෙසු අඩ්ඪකෙ.

6415. පඤ්චකාමගුණෙ හිත්වා පබ්බජිං අනගාරියං,
ජාතියා සත්තවස්සා'හං අරහත්තමපාපුණිං.

1. යත්ථ පච්ඡා පජායාමි – සීමු. 2. ඉමම්හි – මජ්සං,

6403. කුදුමහත් බෙවෙහි හැසිරෙන මම මහත් භොග ලබමි, මාගේ භොගසම්පත්හි උනුබවෙක් නැති. මෙ වූකලී බුද්ධපූජායෙහි විපාක යි.

6404. දෙව්බව යැ යළි මිනිස්බව යැ යන දෙඅත්බව්හි හැසිරෙමි, අන්ගතියක් (-අත්බවක්) නො දනිමි. මෙ බුද්ධපූජායෙහි විපාක යි.

6405. කැත්කුලය, බමුණුකුලය යන දෙකුලෙහි උපදිමි, පහත් කුල නො දනිමි. මෙ බුද්ධපූජායෙහි විපාක යි.

6406. ඇත්යාන, අස්යාන, සිවිකා හා රිය හා යන තෙල සියල්ල ලබමි. මෙ වනාහි බුද්ධපූජායෙහි විපාක යි.

6407. දැස්ගණයා, දස්ගණයා හා මොනොවට සරහන ලද ඉතිරි ගණයා යන තෙල සියල්ල ලබමි. මෙ බුද්ධපූජායෙහි විපාක යි.

6408. තිහිරිපිළී යැ, ලොමුපිළීයැ, කොමුපිළීයැ, කපුපිළීයැ යන තෙල සියල්ල ලබමි. මෙ බුද්ධපූජායෙහි විපාක යි.

6409. නවවත් යැ, නවඵල යැ, සුමිහිරි නවබොජුන් යැ යන තෙල සියල්ල ලබමි. මෙ බුද්ධපූජායෙහි විපාක යි.

6410. මෙය කව, මෙය අනුභව කර, මෙ යහන්හි සයනය කර යන තෙල සියල්ල ලබමි. මෙ බුද්ධපූජායෙහි ඵල යි.

6411. හැමතන්හි පුදන ලද වෙමි, මාගේ යශස් ඉතා උස් වැ පැන නැගිණ, හැම කල්හි මහ පිරිස් ඇතියෙම් වෙමි, හැම කල්හි නො බිඳියැ හැකි පිරිස් ඇත්තෙම් ද වෙමි, නෑයනට උතුම් වෙමි. මෙ බුද්ධපූජායෙහි ඵල යි.

6412. සිහිල උණුසුම නො දනිමි, දහයෙක් නැත, යළි චෛතසික දුඃඛයෙක් මා ළෙහි කැල මැ නැති.

6413. රන්වන් වැ කුදු-මහත් බෙවෙහි සරමි, විවර්ණ බවක් නො දනිමි. මෙ බුද්ධපූජායෙහි ඵල යි.

6414. දෙව්ලොවින් සැවැ කුශලමූලයෙන් චොදනා කරණ ලදුයෙම් සැවැත් නුවර මහාසාරකුලයන් අතර ආඪ්‍ය කුලයෙකැ උපන්මි.

6415. පස්කම්ගුණ හැරපියා (බුදු) සසුන්හි පැවිදි වීමි, උපතින් සත් හැවිරිදි වූ මම රහත්බවට පැමිණියෙමි.

6416. උපසම්පාදයී[1] බුද්ධො ගුණමඤ්ඤාය චක්ඛුමා,
තරුණො පූජනීයො'හං බුද්ධපූජායිදං ඵලං.

6417. දිබ්බචක්ඛු විසුද්ධං මෙ සමාධිකුසලො අහං,
අභිඤ්ඤාපාරමිප්පත්තො බුද්ධපූජායිදං ඵලං.

6418. පටිසම්භිද අනුප්පත්තො ඉද්ධිපාදෙසු කොවිදෙ,
ධම්මෙසු පාරමිප්පත්තො බුද්ධපූජායිදං ඵලං.

6419. තිංසකප්පසහස්සම්හි යං බුද්ධමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.

6420. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- විහරාමි අනාසවො.

6421. ස්වාගතං වත මෙ ආසි -පෙ- කතං බුද්ධස්ස සාසනං.

6422. පටිසම්භිදා චතස්සො ච -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා උත්තරො ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

උත්තරථෙරස්සාපදානං ඡට්ඨං.

557. අපරඋත්තරත්ථෙරාපදානං.

6423. නිබ්බුතෙ ලොකනාථම්හි සිද්ධත්ථෙ ලොකනායකෙ,
මම ඤාතී සමානෙත්වා ධාතුපූජං අකාස'හං.

6424. චතුනවුතිතො කප්පෙ යං ධාතුමභිපූජයිං,
දුග්ගතිං නාභිජානාමි ධාතුපූජායිදං ඵලං.

6425. කිලෙසා ඣාපිතා මය්හං -පෙ- විහරාමි අනාසවො.

6426. ස්වාගතං වත මෙ ආසි -පෙ- කතං බුද්ධස්ස සාසනං.

6427. පටිසම්භිදා චතස්සො ච -පෙ- කතං බුද්ධස්ස සාසනං.

ඉත්ථං සුදං ආයස්මා අපරඋත්තරත්ථෙරො ඉමා ගාථායො අභාසිත්ථාති.

අපරස්ස උත්තරත්ථෙරස්සාපදානං සත්තමං.

---

1. උපසම්පදයි - මජසං.

6416. පසැස් ඇති බුදුහු ගුණ දැන (මා) උපසපන් කළහ, තරුණ වූ මම පූජාර්හ වීමි. මෙ බුද්ධපූජායෙහි ඵල යි.

6417. මට දිවැස විශුද්ධ විය, මම සමාධියෙහි දක්ෂයෙමි, අභිඥාපාරයට පැමිණියෙමි. මෙ බුද්ධපූජායෙහි ඵල යි.

6418. (සිවු) පිළිසිඹියාවනට පිළිවෙළින් පැමිණියෙම් වෙමි, ඍද්ධි පාදයන්හි දක්ෂ වෙමි, ලොව්තුරු දහම්හි පාරයට පැමිණියෙමි. මෙ බුද්ධ පූජායෙහි විපාක යි.

6419. යම්හෙයෙකින් තිස්දහස්වන කප්හි බුදුරදුන් පිදුයෙම් ද, (එහෙයින්) දුගතිය නො හඳුනම් මෙ බුද්ධපූජායෙහි විපාක යි.

6420. කෙලෙස්හු මා විසින් දවන ලදහ,... අනාස්‍රව වැ වාස කෙරෙමි.

6421. බුද්ධශ්‍රෙෂ්ඨයන් වෙතැ එළැඹීමෙන් මට එකාන්තයෙන් යහපතෙක් විය... බුදුසසුන් කරණ ලද.

6422. සිවුපිළිසිඹියා ද... බුදුසසුන් කරණ ලදී.

මෙසේ ආයුෂ්මත් උත්තර තෙරණුවෝ මේ ගාථා වදළාහ.

සවැනි උත්තරස්ථවිරාවදන යි.

557. අපරඋත්තර ස්ථවිරාවදානය

6423. ලොකනාථ වූ සිදධාත්‍ථ ලොකනායකයන් වහන්සෙ පිරිනිවී කල්හි මම මාගෙ නෑයන් කැඳවාගෙණ ධාතුපූජා කෙළෙමි.

6424. මෙයින් සූ අනූවන කප්හි යම් ධාතුපූජාවක් කෙළෙම් ද, (එයින්) දුගතිය නො හඳුනමි, මෙ ධාතුපූජායෙහි විපාක යි.

6425. මා විසින් කෙලෙස්හු දවන ලදහ ... ආස්‍රව රහිත වැ වාස කෙරෙමි.

6426. බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ වෙතැ එකැතින් මාගේ මනා පැමිණීමෙක් විය... බුදුවදන් කරණ ලද.

6427. සිවුපිළිසිඹියා ද... බුදුසසුන් කරණ ලදී.

මෙසෙයින් ආයුෂ්මත් අපරඋත්තර ස්ථවිරයන් වහන්සේ මේ ගාථා වදළාහ.

සත්වැනි අපරඋත්තර ස්ථවිරාවදන යි.

558. භද්දජිත්ථෙරාපදානං

6428. ඔගය්හ යං පොක්ඛරණිං නානාකුඤ්ජරසෙවිතං,
උද්ධරාමි භිසං තත්ථ ඝාසහෙතු අහං තදා.

6429. භගවා තම්හි[1] සමයෙ පදුමුත්තරසව්හයො,
රත්තම්බරධරො බුද්ධො ගච්ඡතෙ අනිලඤ්ජසෙ.

6430. ධුනන්තො පංසුකූලානි සද්දං අස්සොස'හං තදා,
උද්ධං නිජ්ඣායමානො'හං අද්දසං ලොකනායකං.

6431. තත්ථෙව ඨිතකො සන්තො ආයාචිං ලොකනායකං,
"මධුං භිසෙහි සහිතං ඛීරං සප්පිං මුළාලිකං,
පතිගණ්හාතු[2] මෙ බුද්ධො අනුකම්පාය චක්ඛුමා."

6432. තතො කාරුණිකො සත්ථා ඔරොහිත්වා මහායසො,
පතිගණ්හි[3] මම භික්ඛං අනුකම්පාය චක්ඛුමා,
පටිග්ගහෙත්වා සම්බුද්ධො අකා මෙ අනුමොදනං.

6433. "සුඛී හොතු මහාපුඤ්ඤ ගති තුය්හං සමිජ්ඣතු,
ඉමිනා භිසදානෙන ලභස්සු විපුලං සුඛං".

6434. ඉදං වත්වාන සම්බුද්ධො ජලජුත්තමනාමකො,
භික්ඛමාදාය සම්බුද්ධො ආකාසෙනා'ගමා ජිනො.

6435. තතො භිසං ගහෙත්වාන ආගඤ්ජිං[4] මම අස්සමං,
භිසං රුක්ඛෙ ලග්ගෙත්වාන මම දානං අනුස්සරිං.

6436. මහාවාතො උට්ඨහිත්වා සඤ්චාලෙසි වනං තදා,
ආකාසො අභිනාදිත්ථ අසනී ච ඵලී තදා.

6437. තතො මෙ අසනීපාතො මත්ථකෙ නිපතී තදා,
සොහං නිසින්නකො සන්තො තත්ථ කාලකතො[5] අහං.

6438. පුඤ්ඤකම්මෙන සංයුත්තො තුසිතං උපපජ්ජ'හං,
කලෙවරං මෙ පතිතං දෙවලොකෙ රමා'මහං.

6439. ඡළාසීති[6] සහස්සානි නාරියො සමලඞ්කතා,
සායං පාතං උපට්ඨහන්ති භිසදානස්සිදං ඵලං.

---

1. තස්මිං – සිමු.
2. පටිගගණ්හාතු – මඡසං
3. පටිගගණ්හි – මඡසං
4. ආගච්ඡිං – මඡසං,
5. කාලඞ්කතො – මඡසං
6. ඡලසීති – මඡසං.

558. භද්දජි ස්ථවිරාවදානය

6428. බොහෝ ඇතුන් විසින් සෙවුනා ලද යම් පොකුණකට බැස-ගෙණ එකල්හි මම ක්ෂුද හෙතුයෙන් එහි නෙළුම්ල උදුරන්නෙම්ද,

6429-30. එසමයෙහි පදුමුත්තර නමැති භාග්‍යවත් සම්බුදුරජාණන් වහන්සේ රතුවත් (-සිවුරු) ධරණ සේක් පවුල් සිවුරු සලවමින් අහස්හි වඩනාසේක. එකලැ මම (වඩනා එ) හඬ ඇසීමි. මම උඩු ගුවන බලනුයෙම් ලොකනායකයන් වහන්සේ දිටිමි.

6431. එහි මැ සිටියෙම් ලොකනායකයන් වහන්සේ අයැදීමි: "චක්ෂුර්මත් බුදුරජානන් වහන්සේ මට අනුකම්පා පිණිස නෙළුම්ල සහිත වූ මී-කිරි-ගිතෙල්-නෙළුම්දලි පිළිගන්නාසේක්ව"යි.

6432. ඉක්බිති මහායශස් ඇති කාරුණික වූ ශාස්තෲන් වහන්සේ (අහසින්) බැස මාගේ භික්ෂාව පිළිගත් සේක, චක්ෂුර්මත් සම්බුද්ධ-යන් වහන්සේ (භික්ෂාව) පිළිගෙණ මට අනුමෝදනා කළසේකි:

6433. "මහපිනැත්ත, (භවත්) සුව ඇත්තෙක් වේවා! තොප ගති සමෘද්ධ වේවා! මෙ නෙළුම්ල දනින් (-තෙපි) මහත් සුව ලබන්නහුවා".

6434. සම්බුද්ධ වූ පදුමුත්තර නම් ජිනෙන්ද්‍රයන් වහන්සේ මෙය වදරා භික්ෂාව රැගෙණ අහසින් වැඩිසේකි.

6435. නෙළුම්ල රැගෙණ එතැනින් මාගේ අසපුවට ආයෙමි, නෙළුම්ල රුකෙකැ එල්වා තබා මාගේ දනය පුන පුනා සිහි කෙළෙමි.

6436. එවිට මහහුළඟෙක් නැඟි වනය සොල්වාලීයැ, අහස ද ගුගුළේ යැ, හෙණ ද පිපිරිණි.

